මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා http://pitaka.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# අංගුත්තර නිකාය

# 2

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.
http://pitaka.lk

# අනුශාසක මණ්ඩලය

පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

පින්වත්තේ සද්ධර්මාකර පරිවෙණාධිපති ශ්‍රී විසුද්ධාචාර්ය ධර්මකීර්ති ශ්‍රී පෝහද්දරමුල්ලේ ඤාණානන්දාභිධාන අමරපුර සිරි සද්ධම්මවංස නිකායේ මහා නායක ස්ථවිරයන්වහන්සේ

අම්බලම්ගොඩ මහා විහාරස්ථ විද්‍යාලෝක විද්‍යාලයාධිපති ශ්‍රී සද්ධර්මභාරතීශ්වර පණ්ඩිතාචාර්ය විලේගොඩ ශ්‍රී ධර්මානන්ද මහාස්ථවිරපාදයන් වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොම්බේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොම්බේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සෝමාලෝක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනෝදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දෝදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්ය්‍ය ආර්‍ය්‍යරත්න රේරුකාන මහතා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

# අංගුත්තර නිකාය

# 2

ධර්මවිනය උගත් පණ්ඩිත

**මහාස්ථවිරයන් වහන්සේලාගේ**

ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**

**ඒ. පී. ද සොයිසා මහතා**

**විසින්**

**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**

**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1955
දෙවැනි මුද්‍රණය - 2013

**ත්‍රිපිටකය**

**අංගුත්තර නිකාය 2**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැඟීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත් යොමු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැඟීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය

කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මග පෙන්වූ මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඥාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මග පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2013 ජූලි

# සංඥාපනය

සූත්‍ර පිටකයේ හතරවෙනි නිකායවූ අංගුත්තර නිකාය නිපාත එකොළහකින් යුක්තයි. එක අඞ්ගයකින් යුත් ධර්ම පළමුවෙනි නිපාතයෙහිද, අඞ්ග දෙකකින් යුතු ධර්ම දෙවෙනි නිපාතයෙහිද යනාදී වශයෙන් ඒ ඒ නිපාත වෙන්කර තිබේ. පළමුවන සංඝායනාවේදී මේ නිකාය ආරක්ෂා කිරීමට භාරවූයේ අනුරුද්ධ මහ රහතුන්වහන්සේටය. මේ පොතට අංගුත්තර නිකායේ 4 නිපාතයද 5 නිපාතයේ 3 පණ්ණාසකයේ අවසානය දක්වාද ඇතුල් කළෙමි.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම් වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, ශාසන ආලයෙන් ආචාර්ය ආයසීරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයසීරත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, පණ්ඩිත පින්කන්දේ පඤ්ඤාවාස ස්ථවිරයන් වහන්සේද, පැල්මඩුල්ලේ ශ්‍රී සද්ධම්මොදය පිරිවෙනාධිපති පණ්ඩිත කේ. පඤ්ඤාරාම ස්ථවිරයන් වහන්සේද, ඩී. එන්. ඒ. මුදලිගේ මහතාද, ඇල්. ජී. පෙරේරා මහතාද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

26 - 8 - 55.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

$x$

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන

පිට

චතුක්ක නිපාතය 467
පළමුවෙනි පණ්ණාසකය 467
1 භණ්ඩගාම වර්ගය 467
2 චර වර්ගය 482
3 උරුවෙල වර්ගය 491
4 චක්ක වර්ගය 507
5 රොහිතස්ස වර්ගය 522
දෙවෙනි පණ්ණාසකය 534
6 පුඤ්ඤාභිසන්ද වර්ගය 534
7 පත්ත කම්ම වර්ගය 545
8 අපණ්ණක වර්ගය 558
9 මචල වර්ගය 566
10 අසුර වර්ගය 576
තුන්වෙනි පණ්ණාසකය 589
11 වලාහක වර්ගය 589
12 කෙසී වර්ගය 601
13 භය වර්ගය 613
14 පුද්ගල වර්ගය 628
15 ආභා වර්ගය 634
සතරවෙනි පණ්ණාසකය 636
16 ඉන්ද්‍රිය වර්ගය 636
17 පටිපදා වර්ගය 645
18 සඤ්චෙතනිය වර්ගය 656
19 යොදාජීව වර්ගය 671
20 මහා වග්ග වර්ගය 688
පස්වෙනි පණ්ණාසකය 725
21 සප්පුරිස වර්ගය 725
22 පරිසාසෝභන වර්ගය 735

| | | |
|---|---|---|
| 23 | දුච්චරිත වර්ගය | 738 |
| 24 | කම්ම වර්ගය | 740 |
| 25 | ආපත්ති භය වර්ගය | 747 |
| 26 | අභිඤ්ඤා වර්ගය | 755 |
| 27 | කම්මපථ වර්ගය | 761 |
| 28 | රාග පෙය්‍යාල වර්ගය | 764 |
| පඤ්චක නිපාතය | | 766 |
| පළමුවෙනි පණ්ණාසකය | | 766 |
| 1 | සේඛ බල වර්ගය | 766 |
| 2 | බාල වර්ගය | 774 |
| 3 | පඤ්චංගික වර්ගය | 778 |
| 4 | සුමනා වර්ගය | 795 |
| 5 | මුණ්ඩ රාජ වර්ගය | 810 |
| දෙවෙනි පණ්ණාසකය | | 829 |
| 6 | නීවරණ වර්ගය | 829 |
| 7 | සඤ්ඤා වර්ගය | 847 |
| 8 | යොධාජීව වර්ගය | 850 |
| 9 | ථෙර වර්ගය | 876 |
| 10 | කකුධ වර්ගය | 884 |
| තුන්වෙනි පණ්ණාසකය | | 891 |
| 11 | ඵාසු විහාර වර්ගය | 891 |
| 12 | අන්ධක වින්ද වර්ගය | 900 |
| 13 | ගිලාන වර්ගය | 905 |
| 14 | රාජ වර්ගය | 910 |
| 15 | තිකණ්ටකී වර්ගය | 925 |

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# අංගුත්තර නිකාය.

## චතුක්ක නිපාතය

### පළමුවෙනි පණ්ණාසකය.

### 1. භණ්ඩගාම වර්ගය.

1. භණ්ඩගාම (හෝ) අනුබොධ සූත්‍රයː- 1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ වැදෑරට භණ්ඩ ග්‍රාමයෙහි වාසය කරණසේක. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. ඒ භික්ෂූහු 'පින්වතුන් වහන්සැයි' භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

2. භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි ධර්ම සතරක් නොදැනීමෙන් ප්‍රතිවෙධ නොකිරීමෙන්, මෙසේ මාද තොපද මේ දීර්ඝ කාලය (සසර) දුවන ලදී. හැසිරෙන ලදී. කවර ධර්ම සතරක්ද යත්?

3. "මහණෙනි ආර්ය ශීලය නොදැනීමෙන් ප්‍රතිවෙධ නොකිරීමෙන් මෙසේ මාද තොපද මේ දීර්ඝ කාලය සසර දුවන ලදී. හැසිරෙන ලදී. මහණෙනි ආර්ය සමාධිය නොදැනීමෙන් ප්‍රතිවෙධ නොකිරීමෙන් මෙසේ මාද තොපද මේ දීර්ඝ කාලය සසර දුවන ලදී. හැසිරෙන ලදී. මහණෙනි, ආර්ය ප්‍රඥාව නොදැනීමෙන් ප්‍රතිවෙධ නොකිරීමෙන් මෙසේ මාද තොපද මේ දීර්ඝ කාලය සසර දුවන ලදී. හැසිරෙන ලදී. මහණෙනි ආර්ය විමුක්තිය නොදැනීමෙන් ප්‍රතිවේධ නොකිරීමෙන්, මෙසේ මාද තොපද මේ දීර්ඝ කාලය සසර දුවන ලදී. හැසිරෙන ලදී.

4. "ඒ ආර්ය ශීලය මා විසින් දැනගන්නා ලදී. ප්‍රතිවෙධ කරණ ලදී. ආර්ය සමාධිය මා විසින් දැනගන්නා ලදී. ප්‍රතිවෙධ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

කරණ ලදී. ආර්ය ප්‍රඥාව මා විසින් දැනගන්නා ලදී. ප්‍රතිවෙධ කරණ ලදී. ආර්ය විමුක්තිය (අර්හත්ඵලය) මා විසින් දැනගන්නා ලදී. ප්‍රතිවෙධ කරණ ලදී. භව තෘෂ්ණාව මුලින්ම සිඳින ලදී. භව නෙත්තිය (භව රැහැන) ක්‍ෂය විය. දැන් පුනර්භවයක් නැතැයි වදාළසේක. භාග්‍යවතුන් වහන්සේ මෙය දෙසා මෙසේත් වදාළසේක.

5. "ලොකොත්තරවූ ශීලයද සමාධියද ප්‍රඥාවද අර්හත් ඵලයද යන මේ ධර්මයෝ යසස් ඇත්තාවූ ගෞතමයන් වහන්සේ විසින් දැනගන්නා ලදී. මෙසේ බුදුරජානන් වහන්සේ විසින් විශිෂ්ට ඥානයෙන් දැන භික්ෂූන්ට ධර්මය දෙසනා කරණ ලදී. පසැස් ඇති වෘත්ත දුඃඛය කෙළවර කළ ශාස්තෲන් වහන්සේ ක්ලෙශ පරිනිර්වාණයෙන් පිරිනිවිසේක."

2. **පපතිත සූත්‍රයඃ-** 1. "මහණෙනි, ධර්ම සතරකින් යුක්තවූ තැනැත්තේ මේ ධර්ම විනයෙන් චුතවූයේ වේ. කවර කරුණු සතරකින්ද යත්?

2. "මහණෙනි, ආර්ය ශීලයෙන් යුක්ත නුවූයේ මේ ධර්ම විනයෙන් චුතවූයේ වෙයි. මහණෙනි, ආර්ය සමාධියෙන් යුක්ත නුවූයේ මේ ධර්ම විනයෙන් චුතවූයේ වෙයි. මහණෙනි, ආර්ය ප්‍රඥාවෙන් යුක්ත නුවූයේ මේ ධර්ම විනයෙන් චුතවූයේ වෙයි. මහණෙනි, ආර්ය විමුක්තියෙන් (අර්හත් ඵලයෙන්) යුක්ත නුවූයේ මේ ධර්ම විනයෙන් චුතවූයේ වෙයි.

3. "මහණෙනි, මේ ධර්ම සතරින් යුක්ත නුවූයේ මේ ධර්ම විනයෙන් වැටුනේය, චුතවූයේය'යි කියනු ලැබේ.

4. 'මහණෙනි, ධර්ම සතරකින් යුක්තවූයේ මේ ධර්ම විනයෙන් නොවැටුනේ යයි කියනු ලැබේ. කවර සතර දෙනෙකුගෙන්ද යත්?

5. "මහණෙනි, ආර්ය ශීලයෙන් යුක්තවූයේ මේ ධර්ම විනයෙන් නොවැටුනේ වෙයි. මහණෙනි ආර්ය සමාධියෙන් යුක්තවූයේ මේ ධර්ම විනයෙන් නොවැටුනේ වෙයි, මහණෙනි, ආර්ය ප්‍රඥාවෙන් යුක්තවූයේ මේ ධර්ම විනයෙන් නොවැටුනේ

වෙයි. මහණෙනි, අර්හත් ඵලයෙන් යුක්තවූයේ මේ ධර්ම විනයෙන් නොවැටුනේ වෙයි.

6. "මහණෙනි, මේ ධර්ම සතරින් යුක්තවූයේ මේ ධර්ම විනයෙන් නොවැටුනේ යයි කියනු ලැබේ.

7. "(යම් කෙනෙක්) චුතවූවාහුද වැටුණාහුද (ඔව්හු) වැටෙත්, රාගයෙහි ගිජුවූවාහු නැවත (දුකට) එන්නාහුය, කළයුත්ත කළාවූ ඇලුම් කටයුතු ගුණයන්හි ඇලුනාහු සැපයෙන් සැපය ලබන ලද්දාහ."

3. **පළමුවැනි බත උපහත සූත්‍රයː-** 1. "මහණෙනි, කරුණු සතරකින් යුක්තවූ අව්‍යක්තවූ අසත්පුරිසවූ බාලයා සිඳින ලද, නසන ලද, ගුණ ඇති තමන් පරිහරණය කරයි. දොස් සහිත වූයේද වෙයි නුවණැත්තන් විසින් කරණ උපවාද සහිත වෙයි. බොහෝ පව්ද රැස්කරයි. කවර නම් කරුණු සතරකින්ද යත්.

2. "නොදැන පරීක්ෂා නොකොට ගුණ නොකිව යුත්තාගේ ගුණ කියයි. නොදැන පරීක්ෂා නොකොට ගුණ කිවයුත්තාගේ අගුණ කියයි. නොදැන පරීක්ෂා නොකොට නොපැහැදිය යුතු තැන පහදියි. නොදැන පරීක්ෂා නොකොට පැහැදිය යුතු තැන නොපහදියි.

3. "මහණෙනි මේ කරුණු සතරින් යුක්තවූ අව්‍යක්ත වූ අසත්පුරුෂ වූ බාලයා සිඳින ලද නසන ලද ගුණ ඇති තමන් පරිහරණය කරයි, දොස් සහිත වූයේද වෙයි. නුවණැත්තන් විසින් කරණ උපවාද සහිත වෙයි. බොහෝ පව්ද රැස්කරයි"

4. "මහණෙනි, කරුණු සතරකින් යුක්තවූ පණ්ඩිතවූ ව්‍යක්තවූ සත්පුරුෂයා නොසිඳින ලද නොනසන ලද ගුණ ඇති තමන් පරිහරණය කරයි. දොස් රහිතවූයේද වෙයි. නුවණැත්තන් විසින් කරණ උපවාදද රහිතවෙයි. බොහෝ පින්ද රැස් කරයි. කවර කරුණු සතරකින්ද යත්?

5. දැන පරීක්ෂාකොට නුගුණ කිවයුත්තාගේ නුගුණ කියයි. දැන පරීක්ෂාකොට ගුණ කිවයුත්තාගේ ගුණ කියයි. දැන පරීක්ෂාකොට නොපැහැදිය යුතු තැන නොපහදයි. දැන පරීක්ෂාකොට පැහැදිය යුතු තැන පහදියි.

6. "මහණෙනි, මේ ධර්ම සතරින් යුක්ත ව්‍යක්ත සත් පුරුෂ පණ්ඩිතයා, නොසිඳින ලද නොනසන ලද ගුණ ඇති තමන් පරිහරණය කරයි. දොස් රහිතවූයේද වෙයි. නුවණැත්තන් විසින් කරණ ලද උපවාද රහිතද වෙයි. බොහෝ පින්ද රැස් කරයි.

7. "යමෙක් නින්දා කටයුත්තෙකුට ප්‍රශංසා කරයිද? යමෙක් ප්‍රශංසාවට සුදුසු ද ඔහුට නින්දා කෙරේද? හෙතෙම මුවින් පාපයක් රැස් කරයි. ඒ පාපයෙන් සැපයක් නොවිඳී. දාදු ක්‍රීඩා ආදියෙන් යම් ධනයත් සමග තමන්ගේ විනාශය වේද විනාශය ස්වල්ප එකකි. යම්කිසි කෙනෙක් සත්පුරුෂයන් කෙරෙහි සිත නොපහදවයිද, එයම අතිශයින් මහත් විනාශය වෙයි. වචනයද සිතද පාපයට යොදා යමෙක් ආර්යයන්ට ගරහන්නේද ඔහු නිරබ්බුද* ගණනින් එක්ලක්ෂ සතිසක් සහ අබ්බුද ගණනින් පසක්ද, නිරයෙහි පැසෙයි."

4. **දෙවෙනි ඛත උපහත සූත්‍රය:-** 1. "මහණෙනි, සතර දෙනෙකු කෙරෙහි වරදවා පිළිපදින අව්‍යක්ත අසත්පුරුෂ බාලයා සිඳින ලද නසන ලද ගුණ ඇති ආත්මය පරිහරණය කරයි. දොස් සහිතවූයේද වෙයි. නුවණැත්තන් විසින් උපවාද කරන්නේද වෙයි. බොහෝ පවුද රැස්කරයි. කවර සතර දෙනෙකු කෙරෙහිද?

2. "මහණෙනි, මව කෙරෙහි නිසිසේ නොපිළිපදින අව්‍යක්ත අසත්පුරුෂ බාලයා සිඳින ලද නසන ලද ගුණ ඇති ආත්මය පරිහරණය කරයි. දොස් සහිතවූයේද වෙයි. නුවණැත්තන් විසින් උපවාද කරන්නේද වෙයි. බොහෝ පව්ද රැස් කරයි.

3. "මහණෙනි පියා කෙරෙහි නිසිසේ පිළිනොපදින අව්‍යක්ත අසත්පුරුෂ බාලයා සිඳින ලද නසන ලද ගුණ ඇති ආත්මය පරිහරණය කරයි. දොස් සහිතවූයේද වෙයි. නුවණැත්තන් විසින් උපවාද කරන්නේද වෙයි. බොහෝ පව්ද රැස් කරයි.

* 'අබ්බුද නිරබ්බුද' ගණන් විශෙෂයකි.

**4.** "මහණෙනි, තථාගතයන් වහන්සේ කෙරෙහි නිසිසේ පිළිනොපදින අව්‍යක්ත අසත්පුරුෂ බාලයා සිඳින ලද නසන ලද ගුණ ඇති ආත්මය පරිහරණය කරයි. දොස් සහිතවූයේද වෙයි. නුවණැත්තන් විසින් උපවාද කරන්නේද වෙයි. බොහෝ පව්ද රැස් කරයි.

**5.** "මහණෙනි, තථාගත ශ්‍රාවකයන් කෙරෙහි නිසිසේ පිළිනොපදින අව්‍යක්ත අසත්පුරුෂ බාලයා සිඳින ලද නසන ලද ගුණ ඇති ආත්මය පරිහරණය කරයි. දොස් සහිතවූයේද වෙයි. නුවණැත්තන් විසින් උපවාද කරන්නේද වෙයි. බොහෝ පව්ද රැස් කරයි.

**6.** "මහණෙනි, සතරදෙනෙකු කෙරෙහි මනාකොට පිළිපදින ව්‍යක්ත සත්පුරුෂ පණ්ඩිත තෙම නොසිඳින ලද නොනසන ලද ගුණ ඇති තමන් පරිහරණය කරයි. දොස් රහිතවූයේද වෙයි. නුවණැත්තන් විසින් කරණ ලද උපවාද රහිත වෙයි. බොහෝ පින්ද රැස් කරයි. කවර සතර දෙනෙකු කෙරෙහිද යත්.

**7.** "මහණෙනි, මව කෙරෙහි නිසිසේ පිළිපදින ව්‍යක්ත සත්පුරුෂ පණ්ඩිත තෙම නොසිඳින ලද නොනසන ලද ගුණ ඇති තමන් පරිහරණය කරයි. දොස් රහිතවූයේද වෙයි. නුවණැත්තන් විසින් කරණලද උපවාද රහිත වෙයි. බොහෝ පින්ද රැස් කරයි.

**8.** "මහණෙනි, පියා කෙරෙහි මනාව පිළිපදින ව්‍යක්ත සත්පුරුෂ පණ්ඩිත තෙම නොසිඳින ලද නොනසන ලද ගුණ ඇති තමන් පරිහරණය කරයි. දොස් රහිතවූයේද වෙයි. නුවණැත්තන් විසින් කරණ ලද උපවාද රහිත වෙයි. බොහෝ පින්ද රැස් කරයි.

**9.** "මහණෙනි, තථාගතයන් වහන්සේ කෙරෙහි මනාව පිළිපදින ව්‍යක්ත සත්පුරුෂ පණ්ඩිත තෙම නොසිඳින ලද නොනසන ලද ගුණ ඇති තමන් පරිහරණය කරයි. දොස් රහිතවූයේද වෙයි. නුවණැත්තන් විසින් කරණ ලද උපවාද රහිත වෙයි. බොහෝ පින්ද රැස් කරයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

10. "මහණෙනි, තථාගත ශ්‍රාවකයන් කෙරෙහි මනාව පිළිපදින ව්‍යක්ත සත්පුරුෂ පණ්ඩිත තෙම නොසිඳින ලද නොනසන ලද ගුණ ඇති තමන් පරිහරණය කරයි. දොස් රහිත වූයේද වෙයි නුවණැත්තන් විසින් කරණ ලද උපවාද රහිත වෙයි. බොහෝ පින්ද රැස් කරයි.

11. "මව කෙරෙහිද පියා කෙරෙහිද තථාගත සම්බුද්ධයන් වහන්සේ කෙරෙහිද තවද උන්වහන්සේගේ ශ්‍රාවකයන් කෙරෙහිද යමෙක් අයහපත්සේ පිළිපදීද, එබඳු ඒ මනුෂ්‍යයා බොහෝ පව් රැස් කරයි. මවුපියන් කෙරෙහි ඒ අධර්ම හැසිරීමෙන් පණ්ඩිතයෝ ඔහුට ගරහත්. පරලොව අපායටද යයි. මව කෙරෙහිද පියා කෙරෙහිද තථාගත බුදුන් කෙරෙහිද නොහොත් උන්වහන්සේගේ ශ්‍රාවකයන් කෙරෙහිද යමෙක් මනාව පිළිපදීද, එබඳු ඒ මනුෂ්‍ය තෙම බොහෝ පින්ද රැස් කරයි. මවුපියන් කෙරෙහි ඒ ධර්මචර්යාවෙන් පණ්ඩිතයෝ ඔහුට මෙලොවම ප්‍රශංසා කරයි. පරලොව ස්වර්ගයෙහි ප්‍රීති වෙයි."

**5. අනුසොතගාමී සූත්‍රයː-** 1. "මහණෙනි, ලොකයෙහි මේ පුද්ගලයන් සතර දෙනෙක් ඇත්තාහ. විද්‍යමාන වෙත්. ඒ කවර සතර දෙනෙක්ද යත්?

2. "කෙලෙස් ජල පහරට අනුව යන පුද්ගලයාය, කෙලෙස් ජල පහරේ උඩු අතට යන පුද්ගලයාය. කෙලෙස් ජල පහරෙහි නැවතී සිටින පුද්ගලයාය. කෙලෙස් ජල පහරින් එතෙරවූ පරතෙරට ගිය නිවණ නැමැති ගොඩ සිටි උතුම් පුද්ගලයාය යන සතරදෙනයි.

3. "මහණෙනි, ජල පාරට අනුව යන පුද්ගලයා කවරේද? මහණෙනි මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් කාමයන් සෙවනය කරයිද, පව්කම් රැස් කරයිද, මහණෙනි මේ අනුසොතගාමී පුද්ගලයායයි කියනු ලැබේ.

4. "මහණෙනි, උඩුඅතට යන පුද්ගලයා කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් කාමයන් නොසෙවුනේද, පව්කම් නොකරයිද, දුකින් දොම්නසින් කඳුළු

පිරුණු මුහුණින් අඬමින් නමුත් පරිපූර්ණ බ්‍රහ්මචර්යයෙහි හැසිරේද, මහණෙනි, මේ උඩු අතට යන පුද්ගලයායයි කියනු ලැබේ.

**5.** "මහණෙනි, නැවතී සිටින පුද්ගලයා කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ඔරම්භාගීය සංයොජන පස ක්ෂයවීමෙන් ඔපපාතික වේද ඒ ලොකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තේ එහිම පිරිනිවෙන්නේවේද මේ සිටියාවූ පුද්ගලයායයි කියනු ලැබේ.

**6.** "මහණෙනි, කෙලෙස් ජල පහරින් එතරවූ පරතෙරට ගිය නිවණ නමැති ගොඩ සිටි උතුම් පුද්ගලයා කවරේද? මහණෙනි මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ආශ්‍රවයන් ක්ෂයවීමෙන් ආශ්‍රව රහිත අර්හත්ඵල සමාධියද, අර්හත්ඵල ප්‍රඥාවද, මෙලොවම තෙමේ විශිෂ්ට ඥාණයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරයිද, මහණෙනි, මේ කෙලෙස් ජල පහරින් එතරවූ පරතෙරට ගිය නිවණ නමැති ගොඩ සිටි උතුම් පුද්ගලයායයි කියනු ලැබේ.

**7.** "මහණෙනි මේ පුද්ගලයන් සතර දෙන ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්යයි වදාළසේක.

> **8.** "මේ ලොකයෙහි කාමයන්හි සංවරනුවූ තෘෂ්ණාවට බැසගත් යම්කිසි ජන කෙනෙක් වෙත්ද, කාම භොගීවූ නැවත නැවත ඉපදීමට ජරාවට බැසගන්නාවූ ඔව්හු ශ්‍රොතයට අනුව යන්නාහුය. එසේ හෙයින් මේ ලොකයෙහි එළඹ සිටි සිහි ඇති ඤාණවන්ත තෙමේ කාමයන්ද පාපයන්ද සෙවනය නොකරන්නේ දුකින් වුවත් කාමයන් අත්හරින්නේය. ඒ පුද්ගලයා පටිසොතගාමීයයි කීහු. යමෙක් ඒකාන්තයෙන් පිරිපුන් ශෛඛ වූයේද, නොපිරිහෙන ස්වභාව ඇත්තේද චිත්ත වසියට පැමිණියේද සංසුන් ඉඳුරන් ඇත්තේද හෙතෙම ඒකාන්තයෙන් සිටි මනුෂ්‍යයා යයි කියනු ලැබේ. යමෙකු විසින් කුශලාකුශල ධර්මයෝ සංසිඳුවා පිඹහරින ලද්දාහුද, විද්‍යමාන නොවෙත්ද, අස්තයට යවන ලද්දාහුද, ඥානයේ කෙළවරට ගිය, වැස

නිමවන ලද මග බඹසර ඇති, ලොකයේ කෙළවරට ගිය පුද්ගලයා පරතෙරට පැමිණියේයයි කියනු ලැබේ."

**6. අප්පස්සුත සූත්‍රය:-** 1. "මහණෙනි, ලොකයෙහි මේ පුද්ගලයන් සතරදෙනෙක් ඇත්තාහ, විද්‍යමාන වෙත්. කවර සතරදෙනෙක්ද යත්?

2. ශ්‍රැතයෙන් නූපන් අල්පශ්‍රැතයාය, ශ්‍රැතයෙන් උපන් අල්පශ්‍රැතයාය, ශ්‍රැතයෙන් නූපන් බහුශ්‍රැතයාය, ශ්‍රැතයෙන් උපන් බහුශ්‍රැතයාය යන සතරදෙනයි.

3. "මහණෙනි, ශ්‍රැතයෙන් නූපන් අල්පශ්‍රැතයා කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙකු විසින් සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල යන ධර්ම ස්වල්පයක් ඇසුයේ වේද, ස්වල්පයක් ඇසූ ඒ ධර්මයෙහි අර්ථය නොදැන, ධර්මය නොදැන, ධර්මානුධර්මයෙහි නොයෙදුනේ වේද, මහණෙනි, මෙසේ වනාහි මේ පුද්ගලයා ශ්‍රැතයෙන් නූපන් අල්පශ්‍රැතයෙක් වේ.

4. "මහණෙනි, ශ්‍රැතයෙන් උපන් අල්පශ්‍රැත පුද්ගලයා කෙසේ වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙකු විසින් සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක අබ්භූතධම්ම, වෙදල්ල සංඛ්‍යාත ධර්මය ස්වල්පයක් අසන ලද්දේද හෙතෙම ස්වල්පයක් අසන ලද ඒ ධර්මයාගේ අර්ථය දැන ධර්මය දැන ධර්මානුධර්මයෙහි පිළිපන්නේ වේද, මහණෙනි, මෙසේ වනාහි පුද්ගලයා ශ්‍රැතයෙන් උපන් අල්පශ්‍රැතයාවේ.

"මහණෙනි, කෙසේ වනාහි ශ්‍රැතයෙන් නූපන් බහුශ්‍රැතයා කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙකු විසින් සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල යන බොහෝ ධර්මයන් අසන ලද්දේ වේද, ඔහු බොහෝ අසනලද ඒ ධර්මයාගේ අර්ථය දැන ධර්මය දැන ධර්මානුධර්මයෙහි පිළිපන්නේ නොවේද, මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම ශ්‍රැතයෙන් නූපන් බහුශ්‍රැතයා වේ.

5. "මහණෙනි, කෙසේ නම් ශ්‍රැතයෙන් උපන් බහුශ්‍රැතයා වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙකු විසින් සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධර්ම, වෙදල්ල යන ධර්මයන් බොහෝ කොට අසනලද්දේ වේද, හෙතෙම බොහෝ අසන ලද ඒ ධර්මයාගේ අර්ථය දැන ධර්මය දැන ධර්මානුධර්මයෙහි පිළිපන්නේ වේද, මහණෙනි, මොහුමෙසේ වනාහි ශ්‍රැතයෙන් උපන් බහුශ්‍රැතයායයි කියනු ලැබේ. මහණෙනි, මේ පුද්ගලයින් සතරදෙන ලොකයෙහි ඇත්තාහ විද්‍යමාන වෙත්.

6. "ඉදින් සීලයන්හි පිහිටා සිත එකඟ නොකළ අල්පශ්‍රැතයෙක් වේද, ඔහු සීලයෙන්ද ශ්‍රැතයෙන්ද යන දෙකින්ම ගැරහුම් ලබත්. ඉදින් සීලයන්හි පිහිටා සිත එකඟකළ අල්පශ්‍රැතයෙක් වේද, ඔහුට සීලයෙන් ප්‍රශංසා කරත්. ඔහුට ශ්‍රැතය සම්පූර්ණ නොවේ. ඉදින් සීලයෙහි සංයමනොවූ බහුශ්‍රැතයෙක්වේද ඔහුට සීලයෙන් ගරහත්. ඔහුට ශ්‍රැතය සම්පූර්ණවේ. ඉදින් සීලයන්හි සංයමවූ බහුශ්‍රැතයෙක් වේද, ඔහුට සීලයෙන්ද ශ්‍රැතයෙන්ද යන දෙකින් ප්‍රශංසා කරත්. බහුශ්‍රැතවූ ධර්මධරවූ නුවණැත්තාවූ බුද්ධශ්‍රාවකයා ජම්බොනද ස්වර්ණයක් මෙන් කවරෙක් ඔහුට නින්දාකරන්නට සුදුසුද? ඔහුට දෙවියෝද ප්‍රශංසා කරත්. බ්‍රහ්මයා විසින්ද ප්‍රශංසා කරණ ලදී."

7. **සංඝ සොභක සූත්‍රය**:- 1. "මහණෙනි, ව්‍යක්තවූ විනීතවූ, විශාරදවූ, බහුශ්‍රැතවූ, ධර්මධරවූ, ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි පිළිපන් මේ පුද්ගලයෝ සතරදෙනෙක් සමූහය හොබවත්. කවර සතරදෙනෙක්ද යත්?

2. "මහණෙනි, ව්‍යක්තවූ, විනීතවූ, විශාරදවූ, බහුශ්‍රැතවූ ධර්මධරවූ ධර්මානුධර්ම ප්‍රතිපන්නවූ මහණතෙමේ භික්ෂු සංඝයා හොබවයි.

3. "මහණෙනි, ව්‍යක්තවූ, විනීතවූ විශාරදවූ, බහුශ්‍රැතවූ ධර්මධරවූ ධර්මානුධර්ම ප්‍රතිපන්නවූ භික්ෂුණිය භික්ෂුණී සංඝයා හොබවයි.

4. "මහණෙනි, ව්‍යක්තවූ විනීතවූ විශාරදවූ බහුශ්‍රැතවූ ධර්මධරවූ ධර්මානුධර්ම ප්‍රතිපන්නවූ උපාසක තෙමේ උපාසක සමූහය හොබවයි.

5. "මහණෙනි, ව්‍යක්තවූ විනීතවූ විශාරදවූ බහුශ්‍රැතවූ ධර්මධරවූ ධර්මානුධර්ම ප්‍රතිපන්නවූ උපාසිකා තොමෝ උපාසිකා සමූහය හොබවයි.

6. "මහණෙනි, ව්‍යක්තවූ විනීතවූ විශාරදවූ බහුශ්‍රැතවූ ධර්මධරවූ ධර්මානුධර්ම ප්‍රතිපන්නවූ මේ සතර දෙන සංඝයා හොබවත්යයි වදාළසේක.

7. "යමෙක් ව්‍යක්තවූයේද විශාරදවූයේද බහුශ්‍රැත වූයේද ධර්මධර වූයේද ධර්මයට අනුව හැසිරෙන්නේද එබඳුවූ හෙතෙම සංඝසොභන පුද්ගලයායයි කියනු ලැබේ. සීලසම්පන්න භික්ෂුවද, බහුශ්‍රැත භික්ෂුණියද ශ්‍රද්ධාවන්ත යම් උපාසකයෙක් ඇද්ද ශ්‍රද්ධාවන්ත යම් උපාසිකාවක් ඇද්ද, මොව්හු සමූහය හොබවත්. මොව්හු සංඝ සොභනයෝයි."

8. **චතුවෙසාරජ්ජ සූත්‍රයඃ-** 1. "මහණෙනි, යම් විශාරද බවකින් යුක්ත තථාගතයන් වහන්සේ උත්තම ස්ථානය ප්‍රතිඥා කෙරෙත්ද, පිරිසෙහි සිංහනාද කරයිද, ධර්ම චක්‍රය පවත්වයිද, තථාගතයන් වහන්සේගේ මේ විශාරද බැව් සතරක් වෙති. කවර සතරක්ද යත්?

2. "සම්‍යක් සම්බුද්ධභාවය ප්‍රතිඥාකරන්නාවූ මට 'නුඹ වහන්සේ විසින් මේ ධර්මයෝ අවබොධ නොකරණලදැයි' ඒකාන්තයෙන් ඒ කරුණෙහිලා ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලොකයෙහි කිසිවෙක් කරුණු සහිතව පෙරලා චෝදනා කරන්නේද, මහණෙනි, එබඳු පුද්ගලයකු නොදකිමි. මහණෙනි, එබඳු කෙනකු නොදක්නාවූ මම ක්ෂේම බවට පැමිණ, නිර්භය බවට පැමිණ, විශාරද බවට පැමිණ වෙසෙමි.

3. "තොපට ක්ෂීණාශ්‍රව බව ප්‍රතිඥා කරන්නාවූ මට 'මේ ආශ්‍රවයෝ ක්ෂය නොවූහ.' ඒකාන්තයෙන් ඒ කරුණෙහිලා

ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලොකයෙහි කිසිවෙක් කරුණු සහිතව චෝදනා කරන්නේද, මහණෙනි, එබඳු පුද්ගලයකු නොදකිමි. මහණෙනි, එබඳු කෙනෙකු නොදක්නාවූ මම ක්ෂේම බවට පැමිණ, නිර්භය බවට පැමිණ, විශාරද බවට පැමිණ වෙසෙමි.

**4.** "තොපට මාර්ගඵලයන්ට අන්තරායකරවූ ධර්ම කෙනෙක් වදාරණ ලද්දාහුද 'ඔවුන් සෙවනය කරන්නාහට අන්තරායකර නොවේයයි' මට ඒකාන්තයෙන් ඒ කරුණෙහිලා ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලොකයෙහි කිසිවෙක් කරුණු සහිතව පෙරලා චොදනා කරන්නේද, මහණෙනි, එබන්දෙකු නොදකිමි. මහණෙනි, එබන්දෙකු නොදක්නා වූ මම ක්ෂේම බවට පැමිණ, නිර්භය බවට පැමිණ, විශාරද බවට පැමිණ වෙසෙමි.

**5.** "තොපට යමක් උදෙසා ධර්මය දෙශනා කරණ ලද්දේද 'ඒ ධර්මය ඒ අනුව වැඩකරන්නහුට මනාකොට දුක් කෙළවර කිරීම පිණිස නොපවතීයයි' මේ කරුණෙහිලා මට ඒකාන්තයෙන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රාහ්මයෙක් හෝ ලොකයෙහි කිසිවෙක් කරුණු සහිතව චෝදනා කරන්නේද, මහණෙනි, එබන්දකු නොදකිමි. මහණෙනි, එබන්දකු නොදක්නාවූ මම ක්ෂේම බවට පැමිණ, නිර්භය බවට පැමිණ, විශාරද බවට පැමිණ වෙසෙමි.

**6.** "මහණෙනි, යම් විශාරද බවකින් යුක්ත තථාගත තෙම උත්තම ස්ථානය ප්‍රතිඥා කෙරෙයිද, පිරිසෙහි සිංහනාද කරයිද, ධර්මචක්‍රය පවත්වයිද, මේ ඒ සතර විශාරද භාවයෝ වෙත්.

> **7.** "සකස් කරන ලද යම්කිසි බොහෝ වාදපථයෝ වෙත්ද, යම් ඒ වාදපථ ඇසුරුකළ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙත්ද, ඔව්හු විශාරදවූ වාදපථ ඉක්මවූ තථාගතයන් වහන්සේ කරා පැමිණ නැතිවෙත්. යමෙක් ඒ සියලු වාද පථයන් මැඩ සියලුදෙනාට හිතකැමැත්තෙන් ධර්ම චක්‍රය පැවැත්වූයේද, සත්වයෝ භවයාගේ පරතෙරට ගිය, දිව්‍ය

මනුෂ්‍යයන්ට ශ්‍රෙෂ්ඨවූ එබඳුවූ බුදුරජාණන් වහන්සේට නමස්කාර කරත්.”

**9. තණ්හුප්පාද සූත්‍රය:-** 1. “මහණෙනි, භික්ෂුවට තෘෂ්ණාව උපදිනුයේ යම් තැනෙක්හි උපදීද මේ තෘෂ්ණාව උපදින කරුණු සතරකි. කිනම් කරුණු සතරක්ද යත්?

2. “මහණෙනි, භික්ෂුවට තෘෂ්ණාව උපදිනුයේ චීවර හෙතුකොටගෙන හෝ උපදී. මහණෙනි, භික්ෂුවට තෘෂ්ණාව උපදිනුයේ පිණ්ඩපාතය හෙතුකොටගෙන හෝ උපදී. මහණෙනි, භික්ෂුවට තෘෂ්ණාව උපදිනුයේ සෙනාසන හෙතු කොටගෙන හෝ උපදී. මහණෙනි, භික්ෂුවට තෘෂ්ණාව උපදිනුයේ ගිලන්පස හෙතුකොටගෙන හෝ උපදී.

3. “මහණෙනි, භික්ෂුවට තෘෂ්ණාව උපදිනුයේ යම් තැනෙක්හි උපදීද, මේ තෘෂ්ණාව උපදවන කරුණු සතරයි.

4. “තෘෂ්ණාව දෙවෙනිකොට ඇති පුරුෂතෙම දීර්ඝකාලයක් මුළුල්ලෙහි සැරිසරන්නේ සංසාරය මේ ආත්මභාවයට හෝ අනාගතාත්මභාවය යන සංසාරය නො ඉක්මවත්. තෘෂ්ණාව දුක්ඛයාගේ හෙතුවයයි මේ ආදීනවය දැක මහණතෙම පහවූ තෘෂ්ණා ඇත්තේ තණ්හාවෙන් නොගන්නේ සිහි ඇත්තේ පිරිනිවෙන්නේය.

**10. යොග විසංයොග සූත්‍රය:-** 1. “මහණෙනි, මේ (සසරෙහි බඳින අර්ථයෙන්) යෝගයෝ සතර දෙනෙකි. කවර සතරදෙනෙක්ද යත්?

2. “කාමයොගය, භවයොගය, දිට්ඨියොගය, අවිජ්ජා යොගය යන සතර දෙනයි.

3. “මහණෙනි, කාමයොගය කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් කාමයන්ගේ උත්පත්තියද, විනාශයද, මධුර භාවයද, දොසයද, නික්මීමද තත්වූ පරිද්දෙන් නොදනීද, කාමයන්ගේ උත්පත්තියද, විනාශයද, මධුරභාවයද දොසයද නික්මීමද තත්වූ පරිද්දෙන් නොදන්නාවූ ඔහුට කාමයන්හි යම් කාමරාගයක් ඇද්ද, කාම සතුටක් ඇද්ද, කාම ස්නෙහයක් ඇද්ද,

කාමමූර්ඡාවක් ඇත්ද, කාම පිපාසයක් ඇද්ද, කාම දැවිල්ලක් ඇද්ද, කාමයට බැසගැන්මක් ඇද්ද, කාම තෘෂ්ණාවක් ඇද්ද, එය උපදී මහණෙනි, මේ කාමයොගයයි කියනු ලැබේ. කාම යොගය මෙසේයි.

**4.** "භවයොගය කෙසේ වේද, මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් රූපාරූප භවයන්ගේ උත්පත්තියද විනාශයද, මධුරභාවයද, දොසයද, නික්මීමද තත්වූ පරිද්දෙන් නොදනීද, භවයන්ගේ උත්පත්තියද විනාශයද, මධුරභාවයද, දොසයද, නික්මීමද, තත්වූ පරිද්දෙන් නොදක්නාවූ ඔහුට භවයන්හි යම් භව රාගයක් ඇද්ද, භව සතුටක් ඇද්ද, භව ස්නෙහයක් ඇද්ද, භව මූර්ඡාවක් ඇද්ද, භව පිපාසයක් ඇද්ද, භව දැවිල්ලක් ඇද්ද, භවයට බැසගැන්මක් ඇද්ද, භව තෘෂ්ණාවක් ඇද්ද, එය උපදී. මහණෙනි, මේ භවයොගයයි කියනු ලැබේ. කාමයොගය හා භවයොගය මෙසේයි.

**5.** "දෘෂ්ටි යොගය කෙසේ වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් දෘෂ්ටීන්ගේ උත්පත්තියද, විනාශයද, මධුරභාවයද, දොෂයද, නික්මීමද, තත්වූ පරිද්දෙන් නොදනීද, දෘෂ්ටීන්ගේ උත්පත්තියද, විනාශයද, මධුර භාවයද, දොසයද, නික්මීමද තත්වූ පරිද්දෙන් නොදක්නාවූ ඔහුට දෘෂ්ටීන්හි යම් දෘෂ්ටි රාගයක් ඇද්ද, දෘෂ්ටි සතුටක් ඇද්ද දෘෂ්ටිස්නෙහයක් ඇද්ද, දෘෂ්ටි මූර්ඡාවක් ඇද්ද, දෘෂ්ටි පිපාසයක් ඇද්ද, දෘෂ්ටි දැවිල්ලක් ඇද්ද, දෘෂ්ටියට බැසගැන්මක් ඇද්ද, දෘෂ්ටි තෘෂ්ණාවක් ඇද්ද, එය උපදී. මහණෙනි, මේ දෘෂ්ටි යොගයයි. කාමයොගය, භවයොගය, දෘෂ්ටියොගය මෙසේයි.

**6.** "අවිද්‍යා යොගය කෙසේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් සවැදෑරුම් චක්ෂුර්ස්පර්ශාදී කාරණයන්ගේ උත්පත්තියද, විනාශයද, මධුරභාවයද, දොසයද, නික්මීමද තත්වූ පරිද්දෙන් නොදනීද, ඒ ස්පර්ශායතන සයදෙනාගේ උත්පත්තිහද, විනාශයද, මධුර භාවයද, දොසයද, නික්මීමද තත්වූ පරිද්දෙන් නොදක්නාහට ෂඩ්විධ ස්පර්ශායතනයන් කෙරෙහි යම් නොදැනීමයයි කියන ලද අවිද්‍යාවක් ඇද්ද, එය උපදී. මහණෙනි,

මේ අවිජ්ජා යොගයයි කියනු ලැබේ. කාමයොගය භවයොගය, දිට්ඨි යොගය, අවිජ්ජායොගය මෙසේයි.

7. "ක්ලෙශයන්ගෙන් යුක්තවූ පුනර්භවය ඇතිකරන්නාවූ කෙලෙස්දාහය සහිතවූ දුක් විපාක ඇත්තාවූ මත්තෙහි ජාති ජරා මරණ උපදවන්නාවූ ලාමක අකුශල ධර්මයන්ගෙන් යුක්තවූයේය. එහෙයින් යොගයන්ගෙන් නොමිදුණේයයි කියනු ලැබේ. මහණෙනි, මේ සතර යොගයෝයි."

8. "මහණෙනි, මේ සසරෙහි නොබඳින අර්ථයෙන් විසංයෝගයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක්ද යත්?

9. "කාමයොග විසංයොගය, භවයොග විසංයොගය, දිට්ඨියොග විසංයොගය, අවිජ්ජායොග විසංයොගය යන සතරයි.

10. "මහණෙනි, කාමයොග විසංයොගය, කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් කාමයන්ගේ උත්පත්තියද, විනාශයද, මධුර භාවයද, දොසයද, නික්මීමද තත්වූ පරිද්දෙන් දනීද, කාමයන්ගේ උත්පත්තියද, විනාශයද, මධුරභාවයද දොසයද නික්මීමද තත්වූ පරිද්දෙන් දක්නාවූ ඔහුට කාමයන්හි යම් කාමරාගයක් ඇද්ද, කාමසතුටක් ඇද්ද කාම ස්නෙහයක් ඇද්ද, කාම මූර්ඡාවක් ඇද්ද, කාම පිපාසයක් ඇද්ද, කාම දැවිල්ලක් ඇද්ද, කාමයට බැසගැන්මක් ඇද්ද, කාම තෘෂ්ණාවක් ඇද්ද එය නූපදී මහණෙනි, මේ කාම යොග විසංයොගයයි කියනු ලැබේ. කාමයොග විසංයොගය මෙසේයි.

11. "භවයොග විසංයොගය කෙසේ වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් රූපාරූප භවයන්හි උත්පත්තියද, විනාශයද මධුරභාවයද, දොෂයද, නික්මීමද තත්වූ පරිද්දෙන් දකීද, භවයන්ගේ උත්පත්තියද, විනාශයද, මධුර භාවයද, දොෂයද නික්මීමද තත්වූ පරිද්දෙන් දක්නාවූ ඔහුට භවයන්හි යම් භවරාගයක් ඇද්ද, භව සතුටක් ඇද්ද, භව ස්නෙහයක් ඇද්ද, භවමූර්ඡාවක් ඇද්ද, භවපිපාසයක් ඇද්ද, භව දැවිල්ලක් ඇද්ද, භවයට බැසගැන්මක් ඇද්ද, භවතෘෂ්ණාවක් ඇද්ද, එය නූපදී. මහණෙනි, මේ භවයොග විසංයොග යයි කියනු ලැබේ. කාමයොග විසංයොගය, භවයොග විසංයොගය මෙසේයි.

12. "දිට්ඨියොග විසංයොගය කෙසේ වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් දෘෂ්ටීන්ගේ උත්පත්තියද විනාශයද, මධුර භාවයද, දොසයද, නික්මීමද තත්වූ පරිද්දෙන් දනීද, දෘෂ්ටීන්ගේ උත්පත්තියද විනාශයද, මධුර භාවයද දොසයද නික්මීමද තත්වූ පරිද්දෙන් දක්නාවූ ඔහුට දෘෂ්ටීන්හි යම් දෘෂ්ටිරාගයක් ඇද්ද, දෘෂ්ටි සතුටක් ඇද්ද දෘෂ්ටි ස්නෙහයක් ඇද්ද, දෘෂ්ටි මූර්ඡාවක් ඇද්ද, දෘෂ්ටි පිපාසයක් ඇද්ද, දෘෂ්ටි දැවිල්ලක් ඇද්ද, දෘෂ්ටියට බැසගැන්මක් ඇද්ද, දෘෂ්ටි තෘෂ්ණාවක් ඇද්ද එය නූපදී මහණෙනි, මේ දිට්ඨියොග විසංයොගයයි කියනු ලැබේ. කාමයොග විසංයොගය, භවයොග විසංයොගය, දෘෂ්ටියොග විසංයොගය මෙසේයි.

13. "අවිජ්ජායොග විසංයොගය කෙසේ වේද, මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් සවැදෑරුම් චක්ෂුර් ස්පර්ශාදි ආයතනයන්ගේ උත්පත්තියද, විනාශයද, මධුර භාවයද, දොසයද, නික්මීමද තත්වූ පරිද්දෙන් දනීද, ඒ ස්පර්ශායතන සයදෙනාගේ උත්පත්තියද විනාශයද මධුර භාවයද දොෂයද නික්මීමද තත්වූ පරිද්දෙන් දක්නාහට ෂඩ්විධ ස්පර්ශායතනයන් කෙරෙහි යම් නොදැනීමයයි කියන ලද විද්‍යාවක් ඇද්ද එය නූපදී. මහණෙනි මේ අවිජ්ජායොග විසංයොගයයි කියනු ලැබේ කාමයොග විසංයොගය, භවයොග විසංයොගය, දිට්ඨි යොග විසංයොගය, අවිජ්ජායොග විසංයොගය මෙසේයි.

14. "ක්ලෙශයන්ගෙන් යුක්තවූ පුනර්භවය ඇති කරන්නාවූ කෙලෙස්දාහය සහිතවූ දුක් විපාක ඇත්තාවූ මත්තෙහි ජාති ජරා මරණ උපදවන්නාවූ ලාමක අකුශල ධර්මයන්ගෙන් යුක්ත නුවූයේය. එහෙයින් යොග ක්ෂයවීයයි කියනු ලැබේ. මහණෙනි, මේ සතර විසංයොගයෝයි.

15. "කාමයොගයෙන් යුක්තවූ, භවයොගයෙන්ද යුක්තවූ, දෘෂ්ටියොගයෙන් යුක්තවූ, අවිද්‍යාවෙන් පෙරටු කරණ ලද, ඉපදීම හා මරණයට යන සුළු සත්වයෝ සසරට යත්. යම්කිසි කෙනෙක් කාමයන්ද භවයොගයද සර්වප්‍රකාරයෙන් පිරිසිඳ දැන දිට්ඨියොගය නසා, අවිද්‍යා

යොගය දුරුකරන්නේ සියලු යොගයන්ගෙන් මිදුනාවූ ඔව්හු ඒකාන්තයෙන් යොගයන් ඉක්මවූ ක්ෂීණාශ්‍රව මුනිවරයෝයි.”

**(පළමුවන භණ්ඩගාම වර්ගය නිමි)**

---

## 2. චර වර්ගය.

11. **චරතො උප්පජ්ජති සූත්‍රයඃ-** 1. “මහණෙනි, ඉදින් සක්මන් කරණ භික්ෂුවට

2. “කාම විතර්කයක් හෝ ව්‍යාපාද විතර්කයක් හෝ විහිංසා විතර්කයක් හෝ උපදීද, භික්ෂුවද එය ඉවසයිද, අත්නොහරියිද, දුරු නොකරයිද, පහවූවක් නොකරයිද, නොවැඩීමට නොපමුණුවයිද,

3. “මහණෙනි, සක්මන් කරන්නෙම, කෙලෙස් තවන වීර්ය නැත්තේද,

4. “උපවාද භය නැත්තේද, නිතර නිරන්තරයෙන් මෙසේවූ භික්ෂුව කුසීතවූ හීන වීර්ය ඇත්තේයයි කියනු ලැබේ.

5. “මහණෙනි, සිටි භික්ෂුවටද, (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි)

6. “මහණෙනි, සිටියේම කෙලෙස් තවන වීර්ය නැත්තේද, (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

7. “මහණෙනි, වැඩහුන් භික්ෂුවටද, (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

8. “මහණෙනි, වැඩ සිටියේම කෙලෙස් තවන වීර්ය නැත්තේද, මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

9. “මහණෙනි, නිදි දුරු කරණ සයනය කරන්නාවූ භික්ෂුවටද, (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

10. “මහණෙනි, සයනය කරන්නේම කෙලෙස් තවන වීර්ය නැත්තේද, (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

11. "මහණෙනි, සක්මන් කරණ භික්ෂුවට,

12. "කාම විතර්කයක් හෝ ව්‍යාපාද විතර්කයක් හෝ විහිංසා විතර්කයක් හෝ උපදීද, භික්ෂුව එය නොඉවසයිද, අත් හරියිද, දුරු කරයිද, පහවූවක් කරයිද, වැඩීමට නොයවයිද,

13. "මහණෙනි සක්මන් කරන්නාවූ භික්ෂුව කෙලෙස් තවන වීර්ය ඇත්තේද,

14. "උපවාද භය ඇත්තේද, නිතර නිරන්තරයෙන් මෙසේවූ භික්ෂුව පටන්ගන්නා ලද වීර්ය ඇත්තේ නිවන කරා යවන ලද ආත්මය ඇත්තේයයි කියනු ලැබේ.

15. "මහණෙනි, සිටිවනම සිටි භික්ෂුවට, (මෙහි මේ සූත්‍රයේ 12 ඡේදය යෙදිය යුතුයි)

16. "මහණෙනි, සිටියේම කෙලෙස් තවන වීර්ය ඇත්තේද, (මෙහි මේ සූත්‍රයේ 14 ඡේදය යෙදිය යුතුයි.)

17. "මහණෙනි, හිඳගත් භික්ෂුවට, (මෙහි මේ සූත්‍රයේ 12 ඡේදය යෙදිය යුතුයි.)

18. "මහණෙනි, හිඳගත්තේම කෙලෙස් තවන වීර්ය ඇත්තේද, (මෙහි මේ සූත්‍රයේ 14 ඡේදය යෙදිය යුතුයි.)

19. "මහණෙනි, සයනය කරමින් නිදි දුරු කරණ භික්ෂුවට, (මෙහි මේ සූත්‍රයේ 12 ඡේදය යෙදිය යුතුයි.)

20. "මහණෙනි, සයනය කරන්නේම කෙලෙස් තවන වීර්ය ඇත්තේද, (මෙහි මේ සූත්‍රයේ 14 ඡේදය යෙදිය යුතුයි.)

> 21. "සක්මන් කරමින් හෝ, ඉදින් සිටිමින් හෝ හිඳිමින් හෝ නොහොත් සයනය කරමින් හෝ, යමෙක් ලාමකවූ ක්ලෙශ නිශ්‍රිතවූ විතර්කයක් සිතයිද, මුළාව උපදවන අරමුණු කෙරෙහි මුළාවූ නපුරු මාර්ගයට පිළිපන් එබඳුවූ භික්ෂුව උතුම් සම්බොධිය ස්පර්ශකරන්නට සුදුසු නොවේ.
>
> "යමෙක් තෙම සක්මන් කරමින් හෝ සිටිමින් හෝ හිඳිමින් හෝ නොහොත් සයනය කරමින් හෝ විතර්කය සංසිඳුවා විතර්කයන් ව්‍යපසමනය කිරීමෙහි යෙදුනු ඒ

එබඳුවූ භික්ෂුව උතුම් සම්බෝධිය ස්පර්ශ කිරීමට සුදුසු වෙයි.”

**12. සම්පන්න සීල සූත්‍රයඃ-** 1. “මහණෙනි, සම්පූර්ණ සිල් ඇත්තෝව සම්පූර්ණ ප්‍රාතිමොක්ෂ ඇත්තෝව වාසය කරව්. ප්‍රාතිමොක්ෂ සංවර සීලයෙන් යුක්තව වාසය කරව්. ආචාරයෙන් හා ගෝචරයෙන් යුක්තවූවාහු ස්වල්පමාත්‍ර වරදෙහි භය දක්නා සුළුව, සියලු ශික්ෂාපදයන් දැඩිව සමාදන්ව හික්මෙව්. මහණෙනි, සම්පූර්ණ සිල් ඇත්තෝව වාසය කරන්නාවූ, සම්පූර්ණ ප්‍රාතිමොක්ෂ ඇති ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරණය වී වාසය කරන්නාවූ, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූ, ස්වල්ප මාත්‍ර වරදෙහි භය දක්නා සුළුව, ශික්ෂාපදයන් දැඩිව ගෙණ හික්මෙන්නාවූ තොප විසින් මත්තෙහි කුමක් කටයුතු වන්නේද?

2. “මහණෙනි, ඉදින් සක්මන් කරන්නාවූ භික්ෂුවට,

3. “අභිධ්‍යාව හා ව්‍යාපාදය පහවූයේ වේද, ථිනමිද්ධය උද්ධච්ච කුක්කුච්චය විචිකිච්ඡාව ප්‍රහීණවූවාහු වෙත්ද. වීර්ය පටන්ගන්නා ලද්දේද නොහැකුළුණේද සිහිය එළඹ සිටියාද, නොමුළාවූවාද කය සංසිඳුණේද දාහ නැත්තේද සිත සමාහිත වූයේද එකඟ වූයේද,

4. “මහණෙනි, සක්මන් කරන්නාවූ භික්ෂුව කෙලෙස් තවන වීර්ය ඇත්තේ,

5. “උපවාදයට භය ඇත්තේ, නිතර නිරන්තරයෙන් පටන්ගන්නා ලද වීර්ය ඇත්තේ නිවන් කරා යවන ලද ආත්ම භාවය ඇත්තේ යයි කියයි.

6. “මහණෙනි, ඉදින් සිටි භික්ෂුවට, (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

7. “මහණෙනි, මෙබඳුවූ සිටි භික්ෂුව කෙලෙස් තවන වීර්ය ඇත්තේ, (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.)

8. “මහණෙනි, හිඳගත් භික්ෂුවට, (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

9. "මහණෙනි, මෙසේවූ හිඳගත් භික්ෂුව කෙලෙස් තවන වීර්ය ඇත්තේ, (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.)

10. "මහණෙනි, සයනය කරමින් නොනිදා සිටින භික්ෂුවට, (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

11. "මහණෙනි, මෙසේවූ සයනය කරමින් නිදි දුරු කරන්නාවූ භික්ෂුව කෙලෙස් තවන වීර්ය ඇත්තේ. (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.)

12. "භික්ෂුව යම් විධියකින් හැසිරෙන්නේද, යම් විධියකින් සිටින්නේද, යම් විධියකින් හිඳින්නේද, යම් විධියකින් සයනය කරන්නේද, යම් විධියකින් අත් පා හකුළුවන්නේද, යම් විධියකින් අත්පා දිග හරින්නේද, ලොකයාගේ ඉපදීම යම්තාක්ද, ඒතාක් උඩ මැද යට පඤ්ච සම්බන්ධ කර්මයන්ගේ උදයව්‍යය බලන හැම කල්හි සිහි චිත්ත සමථයට ගැලපෙන ප්‍රතිපදාවට අනුව හික්මෙන එබඳු භික්ෂුව නිරන්තරයෙන් බැහැර කළ ආත්මය ඇත්තේයයි කීහු."

13. **සම්මප්පධාන සූත්‍රයः**- 1. "මහණෙනි, උතුම් වීර්යයෝ මේ සතර දෙනෙක් වෙත්. කවර සතරදෙනෙක්ද යත්?

2. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නූපන් ලාමක අකුශල ධර්මයන්ගේ නොඉපදීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්ය පටන් ගනීද, සිත යොදවයිද, ප්‍රධන් වීර්ය කරයිද, උපන් ලාමක අකුශල ධර්මයන්, ප්‍රහාණය කිරීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්ය පටන් ගනීද, සිත යොදවයිද, ප්‍රධන් වීර්ය කරයිද, නූපන් කුශල ධර්මයන් ඉපදවීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්ය පටන්ගනීද, සිත යොදවයිද, ප්‍රධන් වීර්ය කරයිද, උපන් කුශල ධර්මයන්ගේ ස්ථිතිය පිණිස නොමුළා බව පිණිස, වැඩීම පිණිස, විපුලත්වයට යාම පිණිස, භාවනාවෙන් සම්පූර්ණවීම පිණිස සිත උපදවයිද වෑයම් කරයිද, වීර්ය පටන්ගනීද, සිත යොදවයිද, ප්‍රධන් වීර්ය කරයිද, මහණෙනි, මේ සතර සම්‍යක් ප්‍රධාන වීර්යයෝයි.

"සම්‍යක් ප්‍රධානයෝ වට්ට නම් මාරධෙය්‍යයන් ඉක්මවා සිටියාහ. ජාති මරණ භයයන්ගේ පරතෙරට ගිය (ඉන්ද්‍යුත්ත) ක්ෂීණාශ්‍රවයෝ අනිශ්‍රිතයෝය. සෙනාසහිත මාරයා නසා සිටි ඒ ක්ෂීණාශ්‍රවයෝ සතුටට පැමිණියහ. මාරබලය ඉක්මවා සිටි ඔව්හු තෘෂ්ණා නම් ඒජා නැත්තෝය. ඔව්හු සැපයෙන් යුක්තවූහ."

14. **පධාන චතුක්ක සූත්‍රයః-** 1. "මහණෙනි, මේ වීර්‍ය සතරෙකි. කවර සතරක්ද යත්?

2. "සංවර ප්‍රධානය, ප්‍රහාණ ප්‍රධානය, භාවනා ප්‍රධානය, අනුරක්ෂණ ප්‍රධානය යන සතරයි.

3. "මහණෙනි, සංවර ප්‍රධානය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ඇසින් රූපයක් දැක,

4. "නිමිති නොගන්නේවේද, අනුව්‍යඤ්ජන නොගන්නේවේද, යම් කාරණයකින් චක්ෂුරින්ද්‍රියයෙහි අසංවරව හැසිරෙන්නහු වෙත අභිධ්‍යා ව්‍යාපාද සංඛ්‍යාත ලාමක අකුශල ධර්මයන් නැවත නැවත පහළවන්නාහුද, ඔහුගේ සංවරය පිණිස පිළිපදී.

5. "චක්ෂුරින්ද්‍රිය රකී, චක්ෂුරින්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි.

6. "කණින් ශබ්දයක් අසා (මෙහි මේ සූත්‍රයේ 4 වෙනි ඡෙදය යෙදිය යුතුයි. "චක්ෂුරින්ද්‍රියයෙහි' වෙනුවට 'සොතෙන්ද්‍රියයෙහි' විය යුතුයි.) සොතෙන්ද්‍රිය රකී. සොතේන්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි.

7. "නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට (මෙහි මේ සූත්‍රයේ 4 ඡෙදය යෙදිය යුතුයි. 'චක්ෂුරින්ද්‍රියයෙහි' වෙනුවට 'ඝානෙන්ද්‍රියයෙහි' විය යුතුයි.) ඝානෙන්ද්‍රිය රකී. ඝානෙන්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි.

8. "දිවෙන් රසයක් විඳ (මෙහි මේ සූත්‍රයේ 4 ඡෙදය යෙදිය යුතුයි. චක්ෂුරින්ද්‍රියයෙහි' වෙනුවට 'ජිව්හේන්ද්‍රියයෙහි' විය යුතුයි.) ජිව්හේන්ද්‍රිය රකී. ජිව්හේන්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි.

9. "කයින් පහසක් විඳ (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි. 'චක්ෂුරින්ද්‍රියයෙහි' වෙනුවට 'කායෙන්ද්‍රියයෙහි' විය යුතුයි.) කායෙන්ද්‍රිය රකී. කායෙන්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි.

10. "සිතින් ධර්මයක් දැන (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි. 'චක්ෂුරින්ද්‍රියයෙහි' වෙනුවට 'මනෙන්ද්‍රියයෙහි' විය යුතුයි.) මනෙන්ද්‍රිය රකී. මනෙන්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි.

11. "මහණෙනි, ප්‍රහාණ ප්‍රධානය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම උපන් කාම විතර්කය නො ඉවසයිද, දුරුකරයිද, අත්හරියිද, පහවූවක් කරයිද, අභාවයට පමුණුවයිද, උපන් ව්‍යාපාද විතර්කය නොඉවසයිද, දුරුකරයිද, අත්හරියිද, පහවූවක් කරයිද, අභාවයට පමුණුවයිද, උපන් විහිංසා විතර්කය නොඉවසයිද, දුරුකරයිද අත්හරියිද, පහවූවක් කරයිද, අභාවයට පමුණුවයිද උපනුපන් ලාමක අකුශල ධර්මයන් නොඉවසයිද, දුරුකරයිද, අත්හරියිද, පහවූවක් කරයිද, අභාවයට පමුණුවයිද, මහණෙනි, මේ ප්‍රහාණ ප්‍රධාන යයි කියනු ලැබේ.

12. "මහණෙනි, භාවනා ප්‍රධානය කවරේද?

13. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේක සංඛ්‍යාත නිවණ ඇසුරු කළ, විරාග සංඛ්‍යාත නිවණ ඇසුරු කළ, නිරොධ සංඛ්‍යාත නිවණ ඇසුරු කළ, විදර්ශනාවය මාර්ගය යන දෙකට නැමුණු

14. "ස්මෘති සම්බොජ්ක්ධංගය වඩයි.

15. "(මෙහි 13 ඡේදය යෙදිය යුතුයි.) ධර්විචය සම්බොජ්ක්ධංගය වඩයි (මෙහි 13 ඡේදය යෙදිය යුතුයි.) වීර්ය සම්බොජ්ක්ධංගය වඩයි (මෙහි 13 ඡේදය යෙදිය යුතුයි.) ප්‍රීති සම්බොජ්ක්ධංගය වඩයි (මෙහි 13 ඡේදය යෙදිය යුතුයි) පස්සද්ධි සම්බොජ්ක්ධංගය වඩයි. (මෙහි 13 ඡේදය යෙදිය යුතුයි.) සමාධි සම්බොජ්ක්ධංගය වඩයි. (මෙහි 13 ඡේදය යෙදිය යුතුයි.) උපෙක්ඛා සම්බොජ්ක්ධංගය වඩයි. මහණෙනි, මේ භාවනා ප්‍රහාණයයි කියනු ලැබේ.

16. "මහණෙනි, අනුරක්ෂණ ප්‍රධානය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම උපන්නාවූ අට්ඨික සංඥාව, පුලවක සංඥාව, විනීලක සංඥාව, විනිපුබ්බක සංඥාව, විච්ඡිද්දක සංඥාව, උද්ධුමාතක සංඥාව යන යහපත් සමාධි නිමිති ආරක්ෂා කරයිද, මහණෙනි මේ අනුරක්ෂණ ප්‍රභාණයයි කියනු ලැබේ. මහණෙනි, මේ සතර ප්‍රධානයෝයි.

17. "සංවරයද, ප්‍රභාණයද, භාවනාවද අනුරක්ෂයද යන මේ සතර ප්‍රධානයේ ආදිච්ච බන්ධුවූ බුදුරජාණන් වහන්සේ විසින් දෙශනා කරණ ලදී. මෙහි කෙලෙස් තවන වීර්යයෙන් යුත් යම් භික්ෂුවක් වේද ඔහු දුක ක්ෂයවීමට පමුණු වන්නේය."

15. "**අග්ගපඤ්ඤත්ති සූත්‍රය**:- 1. "මහණෙනි, මේ අග්‍ර යයි පැනවීම් සතරක් වෙත්. කවර සතර දෙනෙක්ද යත්,

2. "මහණෙනි, යම් මේ රාහුඅසුරේන්ද්‍රයෙක් වේද, ආත්ම භාව ඇත්තන් අතුරින් මොහු අග්‍රයි. මහණෙනි, යම් මේ මන්ධාතු රජෙක් වේද කාමභොගීන්ගෙන් මොහු අග්‍රයි. මහණෙනි, යම් මේ පාපී මාරයෙක් වේද අධිපති භාවයෙන් මොහු අග්‍රයි. මහණෙනි, දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත, දිව්‍ය මනුෂ්‍ය ප්‍රජාවෙහි අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේ අග්‍රයයි කියනු ලැබේ. මහණෙනි, මේ සතර උත්තම ප්‍රඥප්තිය.

3. "ආත්මභාව ඇත්තන්ගෙන් රාහු අසුරේන්ද්‍ර තෙම ශ්‍රෙෂ්ඨයි. කාමභොගීන්ගෙන් මහාමන්ධාතු රජ ශ්‍රෙෂ්ඨයි. අධිපතීන් අතරෙන් ඍද්ධියෙන් යසසින් බබලන මාරයා ශ්‍රෙෂ්ඨයි. උඩද සරසද, යටද, ලොකයාගේ උත්පත්ති යම්තාක් ලොකයෙහි දෙවියන් සහිත ලොකයාට බුදුන් අග්‍රයයි කියනු ලැබේ."

16. **චතුකොඨ්ඨම සූත්‍රය**:- 1. "මහණෙනි, මේ සියුම් ස්වභාවයන් දැනගන්නා නුවණ සතරකි. කවර සතර දෙනෙක්ද යත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම රූපයෙහි උතුම්වූ සියුම් ලක්ෂණ දැනගන්නා නුවණින් යුක්ත වේද, ඒ සියුම් රූප ලක්ෂණ දැනගන්නාවූ නුවණට වඩා උතුම්වූ හෝ ප්‍රණීතවූ හෝ අනික් රූප ලක්ෂණ දැනගන්නා වූ ඥානයක් ඒ සියුම්වූ රූප ලක්ෂණ දැනගන්නාවූ ඥානයට වඩා උතුම්වූ හෝ ප්‍රණීතවූ හෝ අනික් රූප ලක්ෂණ දැනගන්නාවූ ඥානයක් නොපතයි. සියුම්වූ වෙදනා ලක්ෂණ දැනගන්නාවූ නුවණින් යුක්ත වේද සියුම් වෙදනා දැනගන්නාවූ ඥානයට වඩා උතුම්වූ හෝ ප්‍රණීතවූ අනික් සියුම් වෙදනා ලක්ෂණ දැනගන්නාවූ ඥානයක් නොදකියි. සියුම් වෙදනා ලක්ෂණ දැනගන්නාවූ ඥානයට වඩා උතුම්වූ හෝ ප්‍රණීතවූ අනික් වෙදනා ලක්ෂණ ඇත්තාවූ ඥානයක් නොපතයි. සියුම් සංඥා ලක්ෂණ දැනගන්නා ඥානයෙන් යුක්ත වේද ඒ සියුම් සංඥා ලක්ෂණ දැනගන්නා ඥානයට වඩා උතුම්වූද ප්‍රණීතවූද අනික් සංඥා ලක්ෂණ දැනගන්නා ඥානයක් නොදකියි. ඒ සියුම් සංඥා ලක්ෂණ දැනගන්නා ඥානයට වඩා උතුම්වූද ප්‍රණීතවූද අනික් සංඥාලක්ෂණ දැනගන්නාවූ ඥානයක් නොපතයි. සියුම්වූ සංස්කාර ලක්ෂණ දැනගන්නාවූ උතුම් ඥානයෙන් යුක්තවූයේ වෙයි. ඒ සියුම් සංස්කාර ලක්ෂණ දැනගන්නා ඥානයට වඩා උතුම්වූද ප්‍රණීත වූද සංස්කාර ලක්ෂණ දැනගන්නා අනික් ඥානයක් නොදකියි ඒ සියුම් සංස්කාර ලක්ෂණ දැනගන්නා ඥානයට වඩා උතුම්වූද ප්‍රණීතවූද අනික් සියුම් සංස්කාර ලක්ෂණ දැනගන්නා ඥානයක් නොපතයි.

3. "රූපස්කන්ධයාගේ සියුම් භාවය දැන වේදනාවන්ගේ ප්‍රභවයද දැන යම් හෙයකින් සංඥාව උපදීද එයද දැන, යම් තැනකදී නිරුද්ධවේද, එයද දැන සංස්කාරයන් අනිත්‍ය භාවයෙන් තමාගෙන් අන්‍යවූවක් වශයෙන්ද දුක් වශයෙන්ද අනාත්ම වශයෙන්ද දැන, ශාන්ති පදයෙහි ඇළුනු ශාන්තවූ, මනාව දක්නාවූ ඒ මහණ සෙනාවාහන සහිත මාරයා නසා අන්තිම ශරීරය දරයි."

17. "**පළමුවෙනි අගතිගමන සූත්‍රය**:- 1. "මහණෙනි, මේ අගතියට යාම් සතරකි. කවර සතරදෙනෙක්ද යත්,

**2.** "ඡන්දයෙන් අගතියට යයි, ද්වෙෂයෙන් අගතියට යයි, මොහයෙන් අගතියට යයි, භයෙන් අගතියට යයි. මහණෙනි, මේ සතර අගතියට යෑම් සතරය.

3. "ඡන්දයෙන් ද්වෙෂයෙන් භයෙන් මොහයෙන් යමෙක් ධර්මය ඉක්මවයිද, ඔහුගේ යසස කළුවර පක්ෂයෙහි චන්ද්‍රයා මෙන් පිරිහෙයි."

**18. දෙවෙනි අගතිගමන සූත්‍රය:-** 1. "මහණෙනි, මේ අගතියට නොයෑම් සතරක් වෙත්. කවර සතරදෙනෙක්ද යත්

**2.** "ඡන්දයෙන් අගතියට නොයයිද, ද්වෙෂයෙන් අගතියට නොයයිද, මොහයෙන් අගතියට නොයයිද, භයෙන් අගතියට නොයයිද, මහණෙනි, මේ අගතියට නොයෑම් සතරය.

3. "ඡන්දයෙන් ද්වෙෂයෙන් මොහයෙන් භයෙන් යමෙක් ධර්මය නොයික්මවයිද, ඔහුගේ යසය පුරපක්ෂයෙහි චන්ද්‍රයා සේ පිරෙයි."

**19. තුන්වෙනි අගතිගමන සූත්‍රය:-** (මේ සූත්‍ර දෙකම එකට සම්බන්ධ කළ තවත් සූත්‍රයක් ඇත්තේය. එහි වෙනස ගාථා දෙකම එක ළඟට ගැනීම පමණයි.)

**20. භත්තුද්දෙසක සූත්‍රය:-** 1. "මහණෙනි, ධර්ම සතරකින් යුක්තවූ භත්තුද්දෙසක තෙම ප්‍රත්‍ය බෙදන්නා ගෙන එන ලද්දක් හෙලන්නේ යම්සේද, එසේ නරකයේ උපදී. කවර සතරකින්ද යත්?

**2.** "ඡන්දයෙන් අගතියට යයිද ද්වෙෂයෙන් අගතියට යයිද මොහයෙන් අගතියට යයිද භයෙන් අගතියට යයිද මහණෙනි, මේ ධර්ම සතරින් යුක්තවූ භත්තුද්දෙසක තෙම ගෙනඑන ලද්දක් හෙලන්නේ යම්සේද, එසේ නරකයෙහි උපදී.

3. "මහණෙනි, ධර්ම සතරකින් යුක්තවූ භත්තුද්දෙසක තෙම ගෙන එන ලද්දක් හෙලන්නේ යම්සේද එසේ ස්වර්ගයෙහි උපදී. කවර කරුණු සතරකින්ද යත්, ඡන්දයෙන් අගතියට නොයයි. ද්වෙෂයෙන් අගතියට නොයයි. මොහයෙන් අගතියට නොයයි. භයෙන් අගතියට නොයයි. මහණෙනි, මේ ධර්ම සතරින් යුක්තවූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

හත්තුද්දෙසක තෙම ගෙන එන ලද්දක් හෙලන්නේ යම්සේද එසේ සුගතියෙහි උපදී.

4. "වස්තුකාම ක්ලෙශකාමයන්හි සංයම නොවූ යම්කිසි ජන කෙනෙක් අධාර්මික වෙත්ද, අධර්මය ගරු කරන්නාහුද, ඡන්දයෙන්ද ද්වෙෂයෙන්ද භයෙන්ද අගතියට යනසුළු වෙත්ද, මෙතෙමේ පිරිස් කසටයයි කියනු ලැබේ.

"දන්නාසුළු ශ්‍රමණයන් වහන්සේ (බුදුන්) විසින් මෙසේ වදාරණ ලදී. එසේ හෙයින් පැසසුම් ලැබිය යුතුවූ ඒ යම් සත්පුරුෂයෝ ධර්මයෙහි සිටියාහු පව් නොකරත්ද, ඡන්දයෙන් ද්වෙෂයෙන් භයින් අගතියට නොයන්නාහුද මේ තෙමේ පිරිස් බබලවන්නායයි කියනු ලැබේ. දන්නාවූ ශ්‍රමණයන් වහන්සේ මෙසේ වදාරණ ලදී."

(2. චර වර්ගය නිමි.)

---

## 3. උරුවෙල වර්ගය.

**21. සද්ධම්ම ගරුක සූත්‍රයː-** 1. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජෙතවනයෙහි අනේපිඬු සිටුහුගේ අරමෙහි වාසය කරණසේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ආමන්ත්‍රණය කළසේක. 'පින්වතුන් වහන්ස' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "මහණෙනි මම බුදුවූ මුලදීම එක් කාලයක උරුවෙල රටෙහි නෙරඤ්ජරා නදී තීරයෙහි අජපාල නුගරුක මුල වාසය කරමි. මහණෙනි රහසිගතව විවේකව හුන්නාවූ ඒ මට මේ කල්පනාවක් පහළ විය. ගුරුවරයෙකු නැතිව වැඩි මහල්ලෙකු නැතිව වාසය කරයිද එය දුකකි. මම කවර නම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ සත්කාර කොට ගරුකාර කොට ආශ්‍රය කොට වාසය කරව්ද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "මහණෙනි ඒ මට මම සම්පූර්ණ නොවූ සීල සම්බන්ධයාගේ සම්පූර්ණ කිරීම පිණිස අනෙක් ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ සත්කාර කොට ගරුකාර කොට අසුරු කොට වාසය කරන්නෙම් නම් මා විසින් සත්කාර කොට ගරුකාර කොට ආශ්‍රයකොට වාසය කළයුතුවූ මට වඩා ශීලයෙන් වැඩිවූ අනික් ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ නුවනැසින් නොදකිමි.

4. "මම සම්පූර්ණ නොවූ සමාධික්ඛන්ධයාගේ සම්පූර්ණ කිරීම පිණිස අනෙක් ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ සත්කාර කොට ගරුකාර කොට ඇසුරුකොට වාසය කරන්නෙම් නම් මා විසින් සත්කාර කොට ගරුකාර කොට ආශ්‍රය කොට වාසය කළයුතුවූ මට වඩා ශීලයෙන් වැඩිවූ අනික් ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ නුවනැසින් නොදකිමි. සම්පූර්ණ නොවූ ප්‍රඥා ස්කන්ධයාගේ සම්පූර්ණ කිරීම පිණිස අනික් ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ සත්කාර කොට ගරුකාර කොට ඇසුරු කොට වාසය කරන්නෙම් නම් මා විසින් සත්කාර කොට ගරුකාර කොට වාසය කළ යුතුවූ තමාට වඩා වැඩි ප්‍රඥාවෙන් යුත් අනික් ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු මරුන් සහිත බඹුන් සහිත ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත දෙව් මිනිසුන් සහිත ලොකයෙහි දෙව් මිනිසුන් සහිත ප්‍රජාවෙහි නුවණැසින් නොදකිමි.

5. "මම සම්පූර්ණ නොවූ විමුක්ති ස්ඛන්ධයාගේ සම්පූර්ණ කිරීම පිණිස අනික් ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ සත්කාර කොට ගරුකාර කොට ඇසුරුකොට වාසය කරන්නෙම් නම් මා විසින් යමෙකුට සත්කාර කොට ගරුකාර කොට වාසය කළ යුතුවූ තමාට වඩා වැඩි විමුක්තියෙන් යුක්ත වූ අනික් ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ මරුන් සහිත බඹුන් සහිත ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත දෙව් මිනිසුන් සහිත ලොකයෙහි දෙව් මිනිසුන් සහිත ප්‍රජාවෙහි නුවණැසින් නොදකිමි.

6. "මහණෙනි, ඒ මට යම් මේ ධර්මයක් මා විසින් අවබොධ කරන ලදද, ඒ ධර්මය මම සත්කාර කොට ගරු කාරකොට

ආශ්‍රයකොට වාසය කරන්නෙම් නම් යෙහෙකැයි යන මේ සිත ඇතිවිය.

7. "මහණෙනි, එකල්හි සහම්පතී මහා බ්‍රහ්ම තෙම ඔහුගේ සිතින් මගේ සිතෙහි පහළවූ අදහස දැන යම්සේ බලවත් පුරුෂයෙක් හැකුලු අත දිග හරින්නේද, දිගු කළ අත හකුළුවන්නේද එසේම බ්‍රහ්ම ලොකයෙන් අන්තර්ධාන වූයේ මගේ ඉදිරිපිට පහළවිය. මහණෙනි ඉක්බිති සහම්පතී බ්‍රහ්මතෙම උතුරු සළුව එකාංශ කොට පෙරවා දකුණු දන මඬල පොළොවෙහි ඇන මම යම්තැනෙක් හිඳ ඊට ඇඳිලි බැඳ වැඳ භාග්‍යවතුන් වහන්ස, එය එසේමය, සුගතයන් වහන්ස එය එසේමය, ස්වාමීනි, අතීත කාලයෙහි යම් ඒ අර්හත් සම්බුදු කෙනෙක් වූවාහුද උන්වහන්සේලාද ධර්මයම සත්කාරකොට ගරුකාරකොට ආශ්‍රයකොට වාසය කළාහුය. ස්වාමීනි, අනාගත කාලයෙහි යම් ඒ අර්හත් සම්බුදු කෙනෙක් වන්නාහුද, උන්වහන්සේලාද ධර්මයම සත්කාර කොට ගරුකාර කොට ආශ්‍රයකොට වාසය කරත්. ස්වාමීනි දැන් අර්හත්සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේද ධර්මයටම සත්කාර කොට ගරුකාර කොට ආශ්‍රය කොට වාසය කෙරෙත්වා. සහම්පතී මහාබ්‍රහ්ම රාජයා මෙසේ කීයේය. මෙසේ කියා නැවතද මෙසේ කීයේය.

8. "අතීත කාලයෙහි යම් සම්බුදු කෙනෙක් වූවාහුද අනාගත කාලයෙහි යම් බුදු කෙනෙක් වන්නාහුද බොහෝ දෙනාගේ ශොක නසන වර්තමාන යම් බුදුවරයෙක් වේද, ඒ සියලුදෙනා වහන්සේම ධර්මගරුකව වාසය කළාහුය. වාසය කරත්. යලිදු වාසය කරන්නාහුය. මේ බුදුවරුන්ගේ ධර්මතාවයයි. එසේ හෙයින් වැඩ කැමැත්තහු විසින් උසස් බව කැමති වන්නවුන් විසින් බුදුවරුන්ගේ අනුශාසනය සිහි කරමින් සද්ධර්මයට ගරු කළ යුතුයි."

9. "මහණෙනි, සහම්පතී බ්‍රහ්මතෙම මෙසේ කීයේය. මෙය කියා මා වැඳ ගරුකොට එහිම අතුරුදහන් විය. මහණෙනි, ඉක්බිති මම බ්‍රහ්මයාගේද ඉල්ලීම දැන මටද

සුදුසුවූ, මා විසින් අවබොධ කළ යම් ධර්මයක් වේද, ඒ ධර්මයම සත්කාරකොට, ගරුකාරකොට, ආශ්‍රයකොට, වාසය කළෙමි. මහණෙනි, යම් කලෙක සිට සංඝයාද මහත් බවට උසස් බවට පැමිණියේද එකල්හි සංඝයා කෙරෙහිද මගේ ගෞරවය විය."

22. "**වුද්ධාපචායන සූත්‍රයඃ**- 1. "මහණෙනි, එක්කාලයෙක්හි මම බුදුවූ අළුත උරුවෙලාවෙහි නෙරඤ්ජරා නදී තීරයෙහි අජපල් නුගරුක මුල වසමි. මහණෙනි, එකල්හි දිරූ, වෘද්ධවූ, මහළුවූ, කල්ගිය වයසට පැමිණි බොහෝ බ්‍රාහ්මණයෝ මා යම්තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ මා සමග සතුටු වූහ. සතුටු වියයුතුවූ සිහිකට යුතුවූ කථාකොට නිමවා එකත්පසෙක සිටියාහුය.

2. "මහණෙනි, එකත්පසෙක සිටි ඒ බ්‍රාහ්මණයෝ භවත් ගෞතමයන් වහන්ස, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ දිරූ, වෘද්ධවූ, මහළු කල්ගිය, වයසට පැමිණි, බමුණන් නොවඳියි කියාද, උපස්ථාන නොකරයි කියාද, අසුනින් නිමන්ත්‍රණ (හිඳීමට කීම) නොකෙරෙයි කියාද යන මෙය අප විසින් අසන ලදී. භවත් ගෞතමයන් වහන්ස එය එසේමද? භවත් ගෞතමයන් වහන්සේ දිරූ, වෘද්ධවූ, මහළු, කල්ගිය, වයසට පැමිණි බමුණන්ට නොවඳින්නේද, උපස්ථාන නොකෙරේද, අසුනින් නිමන්ත්‍රණය නොකරයිද, භවත් ගෞතමයන් වහන්ස, එය නුසුදුසුය."

3. "මහණෙනි, ඒ මට මේ ආයුෂ්මත්හු ස්ථවිරයන් හෝ (වැඩිමහල්ලා) ස්ථවිර බවට පත්කරණ ධර්ම හෝ නොදනිති මහණෙනි, ඉදින් උත්පත්තියෙන් අසූවයස්වූ හෝ අනූවයස්වූ හෝ වර්ෂ සියයක්වූ හෝ වෘද්ධයෙක් වේද, හෙතෙමේ නොකල්හි කියන්නේ වේද, නොවූවක් කියන්නේද, අනර්ථයෙන් කියන්නේද, අධර්මයෙන් කියන්නේද, නොහික්මීමෙන් කියන්නේ වේද, හෘදයෙහි තබා නොගත යුතු වචනය කියන්නේද, කරුණු සහිතව නොකියන්නේද, සීමානොදක්වා කියන්නේද, ලෞකික ලොකොත්තර අර්ථය නැතිව කියන්නේද, හුදෙක් ඔහු අන්ධබාල ස්ථවිරයෙකි යන සංඛ්‍යාවටම පැමිණෙයි.

**4.** "මහණෙනි, ඉදින් තරුණවූ, ලපටිවූ, කළුකෙස් ඇති යහපත් යෞවනයෙන් යුක්ත පළමුවෙනි වයසෙහි සිටි බාලයෙක් වේද හෙතෙම සුදුසු කාලයෙහි කියයිද, අර්ථයෙන් කියයිද, ධර්මයෙන් කියයිද, විනයෙන් කියයිද සුදුසු කාලයෙන් කරුණු සහිතව කියයිද, සීමා දක්වා කියයිද, අර්ථ සහිතව කියයිද, හෘදයෙහි තැන්පත් කරගතයුතු වචන කියයිද, හුදෙක් හෙතෙම පණ්ඩිත ස්ථවිරයෙකි යන සංඛ්‍යාවට යයි.

**5.** "මහණෙනි, මේ ස්ථවිර බව ඇතිකරණ ධර්ම සතරකි. කවර සතරක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම සීලයෙන් යුක්තවෙයිද, ප්‍රාතිමොක්ෂ සංවර සීලයෙන් සංවරව වෙසෙයිද, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තද සුලු වරදෙහිද බිය දක්නාසුළු වේද, ශික්ෂාපදයන් දැඩිව ගෙන හික්මේද, බහුශ්‍රැතද, ඇසූදේ දරන්නේද, ඇසූදේ රැස්කරණ තැනද යම් ඒ ධර්ම කෙනෙක් මුල මැද අග යහපත්ද අර්ථ සහිතද, ව්‍යඤ්ජන සහිතද, හැමලෙසින්ම සම්පූර්ණද පිරිසිදු බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කරයිද, ඔහු විසින් එබඳු ධර්මයෝ බොහෝ අසන ලද්දාහුද, දරණ ලද්දාහුද, වචනයෙන් පුරුදු කරන ලද්දාහුද, සිතින් සලකන ලද්දාහුද, ප්‍රඥාවෙන් ප්‍රතිවෙධ කරණ ලද්දාහුද, පිරිසිදු සිතින් ලැබුවාවූ මේ ආත්මයෙහි සැපවිහරණ ඇති ධ්‍යාන සතර කැමති පරිදි ලබන්නේ වේද, පහසුවෙන් ලබන්නේ වේද, නිදුකින් ලබන්නේ වේද, ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිත අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද මේ ආත්මයෙහි ම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරයිද, මහණෙනි, මේ ස්ථවිර භාවය ඇතිකරණ ධර්ම සතරය.

**6.** "යමෙක් විසිරුණු සිතින් බොහෝ ප්‍රලාප දොඩවයිද ලාමක දෘෂ්ටි ඇති ආලය රහිත එකගනොවූ සිත් ඇති අසද්ධර්මයෙහි ඇලුණු මෘගයකු වැනි හෙතෙම ස්ථිරභාවයෙන් දුරව සිටියේය. යමෙක් ශීලයෙන් යුක්තද ශ්‍රැතවත්ද, වැටහීමෙන් යුක්තද, නුවණින් යුක්තද සංයමද, ප්‍රඥාවෙන් අර්ථය දනීද, සියලු ධර්මයන්ගේ පරතෙරට ගියේද, රාගාදි හුල් රහිතද වැටහෙන ප්‍රඥා ඇත්තේද,

"ඉපදීම මරණය දෙක ප්‍රහීණවූයේද සියලු බ්‍රහ්ම චර්යයෙන් යුක්තද යමෙකුට ආශ්‍රවයෝ නැද්ද, ඔහු මම ථෙරයයි කියමි. මහණතෙම ආශ්‍රවයන් ක්ෂයවීමෙන් ස්ථවිරයයි කියනු ලබේ."

23. "**ලොකවිජානන සූත්‍රයඃ**- 1. "මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් ලොකය (දුක්ඛසත්‍යය) මනාව අවබොධ කරණ ලදී. තථාගතයන් වහන්සේ ලොකයෙන් වෙන්වූහ. මහණෙනි, ලොකයට හෙතුව තථාගතයන් වහන්සේ විසින් මනාව අවබොධ කරණ ලදී. ලොකයට හෙතුව තථාගතයන් වහන්සේ විසින් ප්‍රහීණ කරන ලදී. මහණෙනි, ලොක නිරොධය තථාගතයන් වහන්සේ විසින් ප්‍රතිවෙධ කරණ ලදී. ලොක නිරොධය තථාගතයන් වහන්සේ විසින් ප්‍රත්‍යක්ෂ කරණ ලදී. මහණෙනි, ලොක නිරොධගාමිනී ප්‍රතිපදාව තථාගතයන් වහන්සේ විසින් මනාව අවබොධ කරණ ලදී. ලොක නිරොධ ගාමිනී ප්‍රතිපදාව තථාගතයන් වහන්සේ විසින් වඩන ලදී.

2. "මහණෙනි මරුන් සහිත බඹුන් සහිත දෙව් මිනිසුන් සහිත ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත ප්‍රජාවෙහි දෙවියන් සහිත ලොකයාගේ යම් රූපායතනයක් වේද, ශබ්දායතනයක් වේද, ගන්ධරස ඵොට්ඨබ්බායතනයක් වේද, සැප දුක් ආදී ධර්මාරම්මණයක් වේද, සොයා හෝ නොසොයා පැමිණි යමක් වේද, සොයන ලද්දක් වේද, සිතින් හැසිරෙන ලද්දක් වේද, ඒ සියල්ල තථාගතයන් වහන්සේ විසින් මනාව අවබොධ කරණ ලදී. එසේ හෙයින් තථාගතයයි කියනු ලැබේ.

3. "මහණෙනි, යම් රාත්‍රියක තථාගත තෙම අවබොධ කරයිද, යම් රාත්‍රියක පිරිනිවෙයිද, මේ අතරෙහි යමක් වදාරයිද, කථාකරයිද, දක්වයිද, ඒ සියල්ල එසේම වේ. අනික් විධියකින් නොවේ. එසේ හෙයින් තථාගතයයි කියනු ලැබේ. මහණෙනි, තථාගත තෙම යම්සේ කියන්නේද එසේම කරන්නේ වෙයි. යම්සේ කරන්නේද එසේම කියන්නේ වෙයි. මෙසේ යම්සේ කියන්නේද එසේ කරන්නේද යම්සේ කරන්නේද එසේ කියන්නේද එහෙයින් තථාගතයයි කියනු ලැබේ.

4. "මහණෙනි, මරුන් සහිත බඹුන් සහිත දෙව් මිනිසුන් සහිත ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත ප්‍රජාවෙහි දෙව් මිනිසුන් සහිත ලොකයන් තථාගත තෙම සියල්ලන් මැඩ පවත්වන්නේය කවරකු විසිනුත් මැඩ පැවැත්විය නොහැක. ඒකාන්තයෙන් දක්නේය. වශගයෙහි පවත්වන්නේය එහෙයින් තථාගතයයි කියනු ලැබේ.

5. "සියලු ලොකය දැන ත්‍රිවිධ ලොකය යම්සේද එසේ අවිපරීතකොට දැන සියලු ලොකයෙහි නොඇලුනේ සියලු ලොකයෙහි තෘෂ්ණා දෘෂ්ටි දෙකින් තොරවූයේ සියලු ගැට මුදන්නාවූ සියල්ල මැඩ පවත්වන්නාවූ ප්‍රඥාවත්වූ උන්වහන්සේ කිසිවකින් බියනැති පරම ශාන්ත නිවන ස්පර්ශ කෙළේ වේ.

"ආශ්‍රවයන් ක්ෂය කළාවූ දුක් නැත්තාවූ සිඳින ලද සැක ඇත්තාවූ සියලු කර්මයන් ක්ෂය කළාවූ බුදුරජ තෙම නිවන අරමුණුකොට ඇත්තාවූ ඵලවිමුක්තියෙන් මිදුනේ වෙයි. ඒ භාග්‍යවත් තෙම බුද්ධය. උන්වහන්සේ අනුත්තරවූ සිංහ නම්, දෙවියන් සහිත ලොකයාට ශ්‍රෙෂ්ඨ ධර්මචක්‍රය පැවැත්වූයේය.

"එහෙයින් යම් දෙවියෝද මනුෂ්‍යයෝද බුදුන් සරණ ගියාහුද ඔව්හු එක්ව පහවූ දැවීම් ඇති උන්වහන්සේ නමස්කාර කරත්. දැමුණේය දමනය කරන්නවුන්ට ශ්‍රෙෂ්ඨය. සංසිඳුනේය. සංසිඳෙන්නවුන්ට ඍෂිය, මිදුනේය මිදෙන්නවුන්ට අග්‍රය, එතෙර විය. එතෙර වන්නවුන්ට උතුම් දෙවියන් සහිත ලොකයෙහි නුඹවහන්සේට සමාන පුද්ගලයෙක් නැතැයි මෙසේ මහත්වූ වීතසාරදයන් වහන්සේ වඳිත්."

24. "**කාලකාරාම සූත්‍රයඃ-** 1. 'එක්කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සාකෙත නුවර කාලකාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. ඒ භික්ෂූහු පින්වතුන් වහන්සැයි භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, මරුන් සහිත බඹුන් සහිත ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත දිව්‍ය මනුෂ්‍යයන් සහිත ප්‍රජාවෙහි දෙවියන් සහිත ලොකයෙහි යම් රූපායතනයක් ඇද්ද, යම් ශබ්දායතනයක් ඇද්ද, ගන්ධරස ඵොට්ඨබ්බායතනයක් ඇද්ද, සැපදුක් ආදී ධර්මාරම්මණයක් වේද, සොයා හෝ නොසොයා පැමිණෙන ලද්දක් ඇද්ද, සොයන ලද්දක් වේද, සිතින් හසුරුවන ලද්දක් වේද,

3. "ඒ සියල්ල මම මනාව අවබොධ කෙළෙමි. එය තථාගතයන් විසින් ප්‍රකටව දැනගන්නා ලදී. ඒ ෂඩ්ද්වාරික අරමුණු කරා තථාගත තෙම තෘෂ්ණා දෘෂ්ටි දෙකින්

(මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යොදාගත යුතුයි.) එය මම දනිමියි කියන්නෙම් නම් එය මගේ මුසාවක් වන්නේය.

4. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යොදා ගත යුතුයි.) එය මම දනිමියිද නොදනිමියිද කියන්නේ නම් එයද එවැනිම මුසාවකි. එය මම නොමදනිමි. නොදනිමියි කියන්නේ නම් එය මගේ දොෂයකි.

5. "මහණෙනි, මෙසේ තථාගත තෙම දැක්ක යුත්ත දැක දක්නා ලද්ද තෘෂ්ණාදී වශයෙන් නොහඟියි. නොදක්නා ලද්ද දක්නෙමියි නොහඟියි. දක්නා ලද්ද නොදක්නා ලද්දද නොහඟියි. දක්නෙකු නොහඟියි. ඇසිය යුත්ත අසා අසන ලද්ද නොහඟියි. නොඇසිය යුත්ත නොහඟියි. ඇසිය යුත්තද නොඇසිය යුත්තද නොහඟියි, අසන්නෙකු නොහඟියි. නාසය දිව, කය යන තුනෙන් දැනගතයුත්ත දැන නොහඟියි. නාසය දිව කය යන තුනෙන් නොදැන ගත යුත්ත නොහඟියි. නාසය දිව කය යන තුනෙන් දැනගත යුත්තද නොදැන ගතයුත්තද නොහඟියි. දැනගන්නා නොහඟියි. දතයුත්ත දැන දතයුත්තෙහි නොහඟියි. නොදත යුත්තෙහි නොහඟියි. දතයුත්තද නොදතයුත්තද නොහඟියි. දන්නා නොහඟියි. මහණෙනි, මෙසේ වනාහි තථාගතයන් වහන්සේ දිට්ඨ සුත මුත විඤ්ඤාතවූ ධර්මයන්හි එකසමානමය. එනිසා තාදීය, ඒ තාදීභාවයෙන් අතිශයින් උතුම්වූ හෝ ප්‍රණීතවූ හෝ අනික් තාදී පුද්ගලයෙක් නැතැයි කියමි.

6. "අනුන් ඇදහීමෙන් සත්‍යයයි නිෂ්ටාවට පැමිණ ගන්නා ලද යම්කිසි දක්නා ලද්දක් හෝ අසන ලද්දක් හෝ දන්නා ලද්දක් හෝ තමාම සිහි කොට ගත් ග්‍රහණ ඇති දෘෂ්ටි ගතිකයන් කෙරෙහි ඇත්තක් හෝ බොරුවක් හෝ අනිකක් උතුම් කොට නොඅදහන්නේය. ඔවුන් අතරෙහි තාදී නොවේ. මේ දෘෂ්ටිය නමැති හුල බොධි මූලයෙහිම දැක යම්තැනෙක්හි ලැගුනාවූ සත්වයෝ නිමාවට ගියාහුද එය එසේ දනිමි, දකිමි. තථාගතයන්ට එසේ තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් බැසගැන්මක් නැත."

25. බ්‍රහ්මචරිය වාස සූත්‍රයː- 1. "මහණෙනි, මම ජනයා විස්මය පත් කරවනු පිණිස ජනයාගෙන් ප්‍රශංසා ලබන පිණිස ලාභ සත්කාර කීර්ති අනුසස් පිණිස බ්‍රහ්මචර්යයෙහි නොහැසිරෙමි. වාදයන්ගෙන් ජය ගැනීම පිණිස මා මෙසේ ජනතෙම දනීවායි මේ බ්‍රහ්මචර්යාවෙහි වසන්නේ නොවේ. හුදෙක් මහණෙනි, සංවරය පිණිස ප්‍රහාණය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස බ්‍රහ්මචර්යයෙහි වසන්නේය.

2. "ඒ භාග්‍යවතුන් වහන්සේ සංවරය පිණිසද ප්‍රහාණය පිණිසද නිර්වාණයට පැමිණීම පිණිස මේ බ්‍රහ්ම චර්ය දෙශනා කළසේක. මහත්වයට ගිය මහර්ෂීන් විසින් අනුගමනය කළ මේ මාර්ගය බුදුන් දෙශනා කළ පරිදි යම්කිසිවෙක් එහි පිළිපදිත්ද ශාස්තෘන් වහන්සේගේ අනුශාසනය කරන්නාවූ ඔව්හු දුක් කෙළවර කරන්නාහුය."

26. ධම්ම විරූහන සූත්‍රයː- 1. "මහණෙනි, යම් ඒ මහණ තෙම කුහකද ක්‍රොධයෙන් හා මානයෙන් තදද ලාභ සත්කාර ගරුකොට කියාද සිංහ (අඟ) නම් ප්‍රකට කෙලෙස් ඇද්ද නැග සිටි මාන ඇත්තාහුද එකඟනොවූ සිත් ඇත්තාහුද, මහණෙනි, ඒ භික්ෂූහු මා විසින් මමත්වය නොකරණ ලදහ. මහණෙනි, ඒ භික්ෂූහු මේ ධර්ම විනයෙන් පහවූහ. ඔව්හු මේ ධර්ම විනයෙහි වෘද්ධියට වැඩීමට විපුලත්වයට නොපැමිණෙත්.

2. "මහණෙනි, යම් ඒ භික්ෂු කෙනෙක් කුහක නොවෙත්ද, ලාභය පිණිස ගරු නම්බු දී කථා නොකරද්ද ධෛර්යවත්ද, තද

නොවූවාහුද සංසුන් සිත් ඇත්තාහුද? මහණෙනි, ඒ භික්ෂූහු මා විසින් මමත්වය කරණ ලදහ. මේ ධර්ම විනයෙන් පහ නොවූවාහුද වෙත්. ඔව්හු මේ ධර්ම විනයෙහි වෘද්ධියට වැඩීමට විපුලත්වයට පැමිණෙත්.

3. "කුහකවූ තදවූ අනුන් පහත් කොට කථා කරන්නාවූ මාන නමැති අං ඇති ඔසවන ලද මාන නල ඇති අසංයමවූ ඔව්හු සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් දෙසන ලද ධර්මයෙහි නොවැඩෙත්. කුහක නොවූ ලාභ බලාපොරොත්තුවෙන් කථා නොකරණ ධෛර්යවත්වූ තද නොවූ එකඟ සිත් ඇති ඔව්හු සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් දෙශිතවූ ධර්මයෙහි වැඩෙත්."

27. "**අප්පසුලභ සූත්‍රය**:- 1. "මහණෙනි, සුලුවූද සුලභ වූද නිවරද වූද මේ සතර දෙනෙක් වෙත්. කවර සතර දෙනෙක්ද යත්.

2. "මහණෙනි සිවුරු අතුරෙන් පාංශුකූල චීවරය සුලුද සුලභද නිවැරදිද වේ. මහණෙනි, භොජනයන්ගෙන් පිණ්ඩපාත භොජනය සුලුද සුලභද නිරවද්‍යද වේ. මහණෙනි, සෙනාසන අතුරෙන් වෘක්ෂ මූල සෙනාසනය සුලු ද සුලභද නිරවද්‍ය ද වේ. මහණෙනි, බෙහෙත් අතුරින් ගො මුත්‍රය සුලුද සුලභද, නිවරදද වේ. මහණෙනි, මේ සතර සුලුද සුලභද නිරවද්‍යද වෙත්.

3. මහණෙනි, යම් කලක පටන් භික්ෂුව සුලු දෙයින් සතුටුවූයේ වේද, සුලභ දෙයින් සතුටුවූයේ වේද, මේ ඔහුගේ එක්තරා ශ්‍රමණ භාවයට සුදුසු අංගයකැයි කියනු ලැබේ.

4. "සුලුවූද සුලභවූද සෙනසුන්, සිවුරු, පියයුතු පානය බුදිය යුතු අහරපාන නිර්දොෂ දෙයින් සතුටු භික්ෂුවගේ සිතට බාධාවක් (දුකක්) නොවේ. දිශාවන්හි නොගැටේ. අප්‍රමාද සතුටු සිත් ඇති භික්ෂුවට පැවිදිකමට අනුලොමවූ යම් ධර්ම කෙනෙක් වදාරණ ලද්දාහුද, ඔව්හු ලබන ලද්දාහ."

**28. (මහා) අරියවංස සූත්‍රය**:- 1. "මහණෙනි, මේ ආර්යවංශ සතර අග්‍රයයි දත යුත්තාහ, බොහෝ පැරණියයි දතයුත්තාහ. වංශය (පරපුර) යයි දතයුත්තාහ. අළුත් දෙයක් නොවේයයි දතයුත්තාහ. බැහැර නොකරණ ලද්දාහ. පෙර බුදුවරයන් විසිනුදු අත්නොහරින ලදහ. දැනුදු අත්නොහරිත්. අනාගතයෙහිත් අත්නොහරින්නාහ. ශ්‍රමණයන් විසිනුදු බ්‍රාහ්මණයන් විසිනුදු නුවණැත්තන්, විසිනුදු ගර්හා නොකරණ ලද්දාහ. කවර සතර දෙනෙක්ද යත්?

2. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ලැබුණු යම්කිසි සිවුරකින් සතුටු වූයේ වේද, ලැබුණු යම්කිසි සිවුරක් ගැන සතුටු වීමෙහි ගුණ කියන්නේ වේද, සිවුරක් නිසා නුසුදුසු සෙවීමකට නොපැමිණෙයි. සිවුරු නොලැබීම හෙතුකොට ගෙන නොතැවෙයි. සිවුරු ලැබද එහි නොඇලුණේ මුසපත් නොවූයේ නොගිලුණේ ආදිනව දකිමින්, සසරින් නික්මීමේ නුවණින් යුක්තව පරිභොග කරයිද, ලැබුණු යම්කිසි සිවුරකින් සතුටුවීමෙන් තමන් උසස් කොට නොසිතයිද, අනුන් පහත්කොට නොසිතයිද,

3. "ලද දෙයින් සතුටුවීමෙහි දක්ෂවූයේ අලස නොවූයේ නුවණින් හා සිහියෙන් යුක්තවූයේ වෙයි. මහණෙනි මේ මහණ තෙම අග්‍රයයි දතයුතු පැරණි ආර්ය වංසයෙහි සිටියේය.

4. "මහණෙනි, නැවතද භික්ෂුතෙමේ ලැබුණු යම්කිසි පිණ්ඩපාතයකින් සතුටුවූයේ වේද, ලැබුණු යම්කිසි පිණ්ඩපාතයකින් සතුටුවීමේ ගුණ කියන්නේ වේද, පිණ්ඩපාත හෙතුවෙන් නුසුදුසු සෙවීමකට නොපැමිණේද, පිණ්ඩපාතය නොලැබීම නිසා නොතැවෙයිද පිණ්ඩපාතය ලැබද එහි නොඇලුණේ තෘෂ්ණාවෙන් මුසපත් නුවූයේ නොගිලුණේ ආදීනව දකිමින් සසරින් මිදීමේ නුවණින් යුක්තව වළඳයිද, ඒ ලැබුණු යම්කිසි පිණ්ඩපාතයකින් සතුටුවීමෙන් තමන් උසස් කොට නොසිතයිද, අනුන් පහත් කොට නොසිතයිද, හෙතෙමේ

5. (මේ ඡෙදය මේ සූත්‍රයේ 3 ඡෙදය මෙනි)

6. "මහණෙනි, නැවතද භික්ෂුතෙමේ ලැබුණු යම්කිසි සෙනසුනකින් සතුටුවූයේ වේද, ලැබුණු යම්කිසි සෙනසුනකින්

සතුටුවීමේ ගුණ කියන්නේ වේද, සෙනසුන් හෙතුවෙන් නුසුදුසු සෙවීමකට නොපැමිණේද, සෙනසුනක් නොලැබීම නිසා නොතැවෙයිද, සෙනසුන ලැබද ලොභ නුවූයේ තෘෂ්ණාවෙන් මුසපත් නුවූයේ නොගිලුණේ ආදීනව දකිමින් සසරින් මිදීමේ නුවණින් පරිභොග කරයිද, ඒ ලැබුණු යම්කිසි සෙනාසනයකින් සතුටු වීමෙන් තමන් උසස්කොට නොසිතයිද, අනුන් පහත්කොට නොසිතයි.

7. (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

8. "මහණෙනි, නැවතද භික්ෂුතෙම භාවනාවෙහි කැමැත්ත ඇත්තේ වේද, භාවනාවෙහි ඇලුනේ වේද? කෙලෙස් ප්‍රහාණයෙහි කැමැත්ත ඇත්තේද, කෙලෙස් ප්‍රහාණයෙහි ඇලුනේ වේද, ඒ භාවනාවෙහි කැමැත්තෙන් භාවනාවෙහි ඇල්මෙන් කෙලෙස් පහකිරීමෙහි කැමැත්තෙන් කෙලෙස් පහකිරීමෙන් ඇල්මෙන් තමා උසස්කොට නොසිතයි. අනුන් පහත් කොට නොසිතයි.

9. "හෙතෙමේ එහි දක්ෂවූයේ නොමැළි වූයේ මනාව දන්නා නුවණින්ද සිහියෙන්ද යුක්තවූයේ වෙයි. මහණෙනි මේ මහණතෙම අග්‍රයයි දතයුතු පුරාණ ආර්ය වංශයෙහි සිටියේය.

10. "මහණෙනි, මේ ආර්ය වංශ සතර අග්‍රයයි දත යුත්තාහ. බොහෝ පැරණි යයි දත යුත්තාහ. වංශයයි දත යුත්තාහ. අළුත් දෙයක් නොවේයයි දත යුත්තාහ. බැහැර නොකරණ ලද්දාහ. පෙර බුදුවරයන් විසිනුදු ඉවත් නොකරන ලදහ. දැනුදු අත් නොහරිත්. අනාගතයෙහිත් අත් නොහරිත්. ශ්‍රමණයන් විසින්ද බ්‍රාහ්මණයන් විසින්ද නුවණැත්තන් විසින්ද ගර්හා නොකරණ ලදී.

11. "මහණෙනි, මේ සතර ආර්යවංශයෙන් යුක්තවූ භික්ෂුව ඉදින් පෙරදිග වසන්නේද හෙතෙමේම අරතිය (සසුන්හි නොඇල්ම) යටපත් කරයි. අරතිය තොමෝ ඔහු යටපත් නොකරයි. ඉදින් පච්ඡිම දිශාවෙහි වාසය කරන්නේද හෙතෙමේම අරතිය යටපත් කරයි. අරති තොමෝ ඔහු යටපත් නොකරයි. උතුරු දිශාවෙහි ඉදින් වසන්නේද, හෙතෙමේම

අරතිය යටපත් කරයි. අරති තොමෝ ඔහු යටපත් නොකරයි. දකුණු දිසාවෙහි වසන්නේද, හෙතෙමේ අරතිය යටපත් කරයි. අරති තොමෝ ඔහු යටපත් නොකරයි. ඊට හෙතු කවරේද? ප්‍රාඥතෙමේ අරතියද පඤ්චකාම ගුණයන්හි ඇලීමද අභිභවනය කරන්නේය.

12. "අරති තොමෝ වීර්යවන්තයා අභිභවනය නොකරයිද, එහෙයින් අරතිය ධීරයා යටපත් නොකරයි. ධීර තෙමේ අරතිය අභිභවනය කරයිද, එහෙයින් ධීරයා අරතිය මඩින්නේ නම් වේ. සියලු ත්‍රෛභූමික ධර්මයන් පිරිසිඳ කෙලෙසුන් පහකොට සිටි ඔහු කවර නම් රාග දොෂ මොහයෙක් වලක් වන්නේද? ජාම්බොනද ස්වර්ණයක් වැනි ඔහුට කවරෙක් නින්දා කිරීමට සුදුසුද? ඔහුට දෙවියෝද ප්‍රශංසා කරත්. බ්‍රහ්මයා විසිනුදු ප්‍රශංසා කරණ ලදී."

**29. ධම්මපද චතුක්ක සූත්‍රයː-** 1. "මහණෙනි, අග්‍රයයි දතයුතු පැරණිවූ, වංශය යයි දතයුතුවූ අළුත් දෙයක් නොවූ බැහැර නොකරත්ද, පෙර බුදුවරයන් විසිනුදු බැහැර නොකළාහුද දැනුදු අත්නොහරිත්. අනාගතයෙහිත් බැහැර නොකරන්නාහුය. ශ්‍රමණයන් විසින්ද බ්‍රාහ්මණයන් විසින්ද නුවණැත්තන් විසින්ද ගර්හා නොකරණ ලද මේ ධර්ම කොට්ඨාස සතරක් වෙත්. කවර සතරක්ද යත්.

2. "මහණෙනි, අනභිද්‍යාව (අලොභය) යන ධර්ම පදය අග්‍රයයි දතයුතුය.

3. "පැරණියයි දතයුතුය. වංශය යයි දතයුතුය. අළුත් දෙයක් නොවේ. බැහැර නොකටයුතුය. අත් නොහරින ලදී. දැනුදු අත්නොහරියි. මත්තෙහිද අත්නොහරින්නේය. ශ්‍රමණයන් විසින්ද බ්‍රාහ්මණයන් විසින්ද නුවණැත්තන් විසින්ද ගර්හා නොකරණ ලදී.

4. "මහණෙනි, අව්‍යාපාද යන ධර්ම පදය අග්‍රයයි දත යුතුයි.

5. (මේ ඡෙදය මේ සූත්‍රයේ 3 ඡෙදය මෙනි.)

6. "මහණෙනි, සම්මාසති යන ධම්ම පදය අග්‍රයයි දතයුතුයි.

7. (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

8. "මහණෙනි, සම්මා සමාධි යන ධර්ම පදය අග්‍රයයි දතයුතුයි.

9. (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

10. "මහණෙනි මේ ධර්ම පද සතර අග්‍ර යයි දතයුත්තාහ. බොහෝ පැරණි යයි දතයුත්තාහ. වංශයයි දතයුත්තාහ. අළුත් දෙයක් නොවේයයි දතයුත්තාහ. බැහැර නොකටයුත්තාහ. පෙරද අත් නොහරින ලදහ. දැනුදු අත්නොහරිත්. අනාගතයෙහිත් අත්නොහරින්නාහ. ශ්‍රමණයන් විසින්ද බ්‍රාහ්මණයන් විසින්ද නුවණැත්තන් විසින්ද ගර්හා නොකරන ලදී.

11. "තෘෂ්ණා විරහිතව ව්‍යාපාද රහිත සිතින් වාසය කරන්නේය. සිහි ඇත්තේ අධ්‍යාත්මය යහපත්ව තැබූයේ එකග සිත් ඇත්තේ වන්නේය."

**30. සප්පිනියා තීර සූත්‍රය:-** 1. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගිජ්ජකූට පර්වතයෙහි වාසය කරණසේක. එකල්හි වනාහි බොහෝ ප්‍රසිද්ධ ප්‍රසිද්ධ පරිබ්‍රාජකයෝ සප්පිනියා ගං ඉවුරෙහි පරිබ්‍රාජකාරාමයෙහි වාසය කරත්. ඒ කවරහුද? අන්නභාර පරිබ්‍රාජකයාද, වරධර පරිබ්‍රාජකයාද, සකුළුදායී පරිබ්‍රාජකයාද, අනිකුත් ප්‍රසිද්ධ ප්‍රසිද්ධ පරිබ්‍රාජකයෝද වෙත්.

2. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි ඵල සමවතින් නැගී සිටිසේක් සප්පිනියා තොට පරිබ්‍රාජකාරාමය යම්තැනෙක්හිද එහි වැඩිසේක. වැඩ පණවන ලද අස්නෙහි වැඩහුන් සේක. වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ ඒ පරිබ්‍රාජකයන්ට මේ කරුණු වදාළසේක.

3-11. (මෙහි මේ වර්ගයේ 9 සූත්‍රයේ ඡේද 1-9 දක්වා යෙදිය යුතුයි. ආමන්ත්‍රණ වචනය 'මහණෙනි' වෙනුවට 'පරිබ්‍රාජකවරුනි' විය යුතුයි.)

12. "පරිබ්‍රාජකයෙනි, යමෙක් මම මේ අනභිද්‍යා ධර්ම පදය ප්‍රතික්ෂෙප කොට අභිජක්ධා බහුලවූ කාමයන්හි තියුණු රාග ඇති ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ පනවන්නෙමියි මෙසේ කියන්නේ නම් මම ඔහුට ඒ වචනයේදී ඒවා කියවා ප්‍රකාශ කෙරේවා ඔහුගේ ආනුභාවය බලමියි, මෙසේ කියන්නෙමි. 'පරිබ්‍රාජකයෙනි' හෙතෙමේ ඒකාන්තයෙන් අනභිද්‍යා ධර්ම පදය ප්‍රතික්ෂේප කොට අභිද්‍යා බහුලකොට ඇති කාමයන්හි තියුණු රාග ඇති ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ පනවන්නේය යන මීට හෙතු නැත්තේය.

13. "පරිබ්‍රාජකයෙනි, යමෙක් 'මම මේ අව්‍යාපාද ධර්ම පදය ප්‍රතික්ෂේප කොට ව්‍යාපාද සිත් ඇති දූෂ්‍යවූ සිත් ඇති ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ පනවන්නෙමියි' මෙසේ කියන්නේ නම් ඒ මම එහි ඔහුට ඒවා කියවා ප්‍රකාශ කෙරේවා ඔහුගේ ආනුභවය දකිමියි මෙසේ කියන්නෙමි. 'පරිබ්‍රාජකයෙනි, හෙතෙම ඒකාන්තයෙන් අව්‍යාපාද ධර්ම පදය ප්‍රතික්ෂේප කොට ව්‍යාපාද සිත් ඇති දූෂ්‍යවූ සිත් ඇති ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ පනවන්නේය යන මීට හෙතු නැත.

14. "පරිබ්‍රාජකයෙකි, යමෙක් මම මේ සම්මාසති ධර්ම පදය ප්‍රතික්‍ෂේප කොට මුළා සිහි ඇති සම්‍යක් ප්‍රඥාව නැති ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ පණවන්නෙමියි මෙසේ කියන්නේ නම් 'මම ඔහුට එහිදී ඒවා කියවා ප්‍රකාශ කෙරේවා ඔහුගේ ආනුභාවය දනිමියි' මෙසේ කියන්නෙමි. 'පරිබ්‍රාජකයෙනි, හෙතෙම ඒකාන්තයෙන් සම්මාසති ධර්ම පදය ප්‍රතික්ෂේප කොට මුළා සිහි ඇති සම්‍යක් ප්‍රඥා නැති ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ පනවන්නේය යන මීට හෙතු නැත්තේය."

15. "පරිබ්‍රාජකයෙනි, යමෙක් මම මේ සම්මා සමාධි ධම්ම පදය අත්හැර සමාධිගත නුවූ සිත් ඇති විසුරුනු සිත් ඇති අනික් ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ පණවන්නෙමියි මෙසේ කියන්නේ 'මම ඔහුට එහිදී ඒවා කියවා ප්‍රකාශ කෙරේවා, ඔහුගේ ආනුභාවය දකිමියි' මෙසේ කියන්නේය. පරිබ්‍රාජකයෙනි

හෙතෙමේ ඒකාන්තයෙන් සම්මා සමාධි ධර්ම පදය ප්‍රතික්ෂේප කොට අසමාහිතවූ විසුරුනු සිත් ඇත්තාවූ ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ පනවන්නේය යන මීට හෙතු නැත්තේය. පරිබ්‍රාජකයෙනි යමෙක් මේ ධර්ම පද සතර ගැරහිය යුතුයයි ප්‍රතික්ෂේප කළයුතුයයි සිතන්නේද, ඔහුට මෙලොවම කරුණු සහිතව ගැරහිය යුතු තැනම වාද සතරක් පැමිණෙත්. කවර සතර දෙනෙක්ද යත්.

16. "ඉදින් පින්වත් තෙමේ අනභිද්‍යා ධම්මපදයට ගරහන්නේද ආක්‍රොශ කරන්නේද අභිජ්ක්ධා බහුලකොට ඇති, කාමයන්හි තියුණුවූ රාග ඇති, යම් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් ඇද්ද, ඔහු පින්වත්හුගේ පිදිය යුත්තෝය. ඔව්හු පින්වතාගේ ප්‍රශංසා කටයුත්තෝය. ඉදින් පින්වත් තෙම අව්‍යාපාද ධර්මපදයට ගර්හා කරයිද, ආක්‍රොශ කෙරේද, ව්‍යාපාද සිත් ඇති දූශ්‍යවූ සිත් ඇති යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් ඇද්ද ඔව්හු පින්වතාගේ පිදිය යුත්තෝය. ඔව්හු පින්වතාගේ ප්‍රශංසා කටයුත්තෝය. පින්වත ඉදින් සම්මාසති ධම්මපදයටද ගරහයිද, ආක්‍රොශ කරයිද, මුලා සිහි ඇති සම්‍යක් ප්‍රඥාව නැති යම් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් ඇද්ද, ඔව්හු පින්වතාගේ පිදිය යුත්තෝය. ඔව්හු පින්වතාගේ ප්‍රශංසා කටයුත්තෝය. ඉදින් සම්මාසමාධි ධම්මපදයට ගරහෙයිද, ආක්‍රොශ කරයිද, සමාහිත සිත් නැති විසුරුණු සිත් ඇති යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් ඇද්ද, ඔව්හු පින්වත්හුගේ පිදිය යුත්තෝය. ඔව්හු පින්වත්හුගේ ප්‍රශංසා කටයුත්තෝය. (යනුයි)

17. "පරිබ්‍රාජකයෙනි, යමෙක් මේ ධර්මපද සතර ගැරහිය යුතුකොට ප්‍රතික්ෂෙප කළයුතු කොට හිතන්නේද, ඔහුට මෙලොවම කරුණු සහිත ගැරහිය යුතු වාදයෝ සතර දෙනෙක් පැමිණෙත්. පරිබ්‍රාජකයෙනි, යමෙක් අහෙතුක වාද ඇති, අකිරිය වාද ඇති, නාස්තික වාද ඇති උක්කලා ජනපදවාසී වස්ස භඤ්ඤ යන දෙදෙනෙක් වූවාහුද ඔව්හුද මේ ධර්ම පද සතර නොගැරහිය යුතුකොට ප්‍රතික්ෂේප නොකළයුතු කොට සිතුවාහුය. ඊට හේතු කවරේද? නින්දා භය නිසාය සහ උපවාද භය නිසාය.

18. "හැමකල්හි ව්‍යාපාද නැත්තේ සිහි ඇත්තේ අධ්‍යාත්මයෙහි මනා සමාධියෙන් යුක්තවූයේ අභිජ්ක්ධා විනය නම් අර්හත්වයෙහි හික්මෙන්නේ අප්‍රමත්ත යයි කියනු ලැබේ."

**(තුන්වෙනි උරුවෙල වර්ගය නිමි.)**

---

## 4. චක්ක වර්ගය.

**31. චතු චක්ක සූත්‍රයඃ-** 1. "මහණෙනි, යමකින් යුක්තවූ දෙව්මිනිසුන්ට සම්පත් සතරක් පවත්නාහුද යමකින් යුක්ත දිව්‍ය මනුෂ්‍යයෝ භොගයන්හි නොබෝ කලකින් මහත් බවට විපුල බවට පමුණුවත්ද, මේ සම්පත් සතරකි කවර සතරක්ද යත්?

2. "සුදුසු ප්‍රදෙශයෙහි වාසයද, සත්පුරුෂයන්ගේ ආශ්‍රයද, තමන් මනාකොට පිහිටුවීම, පෙර රැස්කළ පින් ඇති බවද, යමකින් යුක්ත දෙව් මිනිසුන්ට සම්පත් සතරක් පවත්වයි යමකින් යුක්තවූ දෙව් මිනිස්සු නොබෝ කලකින් භොගයන්හි මහත්වයට විපුලත්වයට පැමිණෙත්ද, මහණෙනි, මේ සම්පත් සතර වෙත්.

3. "සුදුසු ප්‍රදෙශයෙහි වසන්නේද ආර්ය චිත්තය (දියුණු) කරන්නෙක් වන්නේය. තමා මනාකොට පිහිටුවීමෙන් යුක්තවූ පෙර කළ පින් ඇති මනුෂ්‍යතෙම ධාන්‍යයටද ධනයටද යසසටද කීර්තියටද යන මේ සැපයට අධිකව පැමිණේ."

**32. සංගහවත්ථු සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ සංග්‍රහ වස්තු සතරක් වෙත්. කවර සතර දෙනෙක්ද යත්.

2. "දානය, ප්‍රිය වචනය, අර්ථචර්යාව, සමානාත්මතාව යන සතරයි. මහණෙනි, මේ සතර සංග්‍රහ වස්තූහුය.

3. "මේ ලොකයෙහි දීමද, ප්‍රිය වචනයද අභිවෘද්ධිය ඇතිවන කථාද, ඒ ඒ ධර්මයන්හි සුදුසු පරිද්දෙන් සමානාත්මතාවද යන ලොකයෙහි මේ සංග්‍රහයෝ වනාහි

යන රථයාගේ ඇණය මෙනි. මවුතොමෝ මේ සංග්‍රහයන් පුත්‍රයන්ට නොකරන්නාහු, ඉදින් පිය තෙමේ මේ සංග්‍රහයන් පුතාට නොකරන්නේද, සැලකිල්ලක් හෝ පූජාවක් හෝ නොලබන්නාහුය. යම්සේ පණ්ඩිතයෝ මේ සංග්‍රහයෝ සමව බලත්ද, එසේ හෙයින් ඔව්හු මහත්වයට පැමිණෙත්, ප්‍රශංසාර්හද වෙත්."

33. **සීහොපම සූත්‍රය**:- 1. "මහණෙනි, මෘගරාජවූ සිංහතෙම සවස් වේලාවෙහි ගුහාවෙන් නික්මෙයි. ගුහාවෙන් නික්ම කෙසරුැසලා ඇඟ සොලවයි. කෙසුරුැසලා හාත්පස සතර දිශාව බලයි. හාත්පස සතර දිශාව බලා තුන්වරක් සිංහනාද කරයි. තුන්වරක් සිංහනාද කොට ගොදුරු පිණිස නික්මෙයි. මහණෙනි, යම් ඒ තිරිසන්ගත ප්‍රාණීහු නාදකරන්නාවූ මෘගරාජවූ සිංහයාගේ ශබ්දය අසත්ද, ඔව්හු බොහෝ සෙයින් භයට සංවේගයට තැතිගැන්මට පැමිණෙත්. ගුල්වල වාසය කරන්නාහු ගුලට ප්‍රවිෂ්ට වෙත්. ජලයෙහි වාසය කරන්නාහු ජලයට ප්‍රවිෂ්ටවෙත්. වනයෙහි වාසය කරන්නාහු වනයට ප්‍රවිෂ්ට වෙත්. පක්ෂීහු ආකාශයට යත්.

2. "මහණෙනි, ගම් නියම්ගම් රාජධානීන්හි තද වරපට බන්ධනයෙන් බඳින ලද රජුගේ ඇත්තු වෙද්ද, ඔව්හුද ඒ බන්ධන සිඳ බිඳ බිය වූවාහු මළමුත්‍ර කරමින් යම් ඒ තැනක පලායත්. මහණෙනි, තිරිසන් ගත සතුන් අතුරින් සිංහවූ මෘගරාජයා මෙසේ මහත් ඍද්ධි ඇත්තේය. මෙසේ මහෙශාක්‍ය වන්නේය. මෙසේ මහානුභාව ඇත්තේය.

3. "මහණෙනි, එසේම යම්කලෙක්හි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්තවූ සුගතවූ ලොකය දත් නිරුත්තර පුරුෂධම්ම සාරථිවූ දෙව් මිනිසුන්ගේ ශාස්තෘවූ, බුද්ධවූ, භාග්‍යවත්වූ තථාගතයන් වහන්සේ ලොකයෙහි උපදී. හෙතෙමේ මේ සක්කාය නම් පඤ්චඋපාදානස්කන්ධයෝය. මේ සක්කාය සමුදය නම් පඤ්චා උපාදානස්කන්ධයට හෙතුවයි. මේ සක්කාය නිරොධය මේ සක්කාය නිරොධගාමිනී ප්‍රතිපදාවයයි ධර්මය වදාරයි.

**4.** "මහණෙනි, දීර්ඝායුෂ්කවූ වර්ණවත්වූ සැප බහුල කොට ඇත්තාවූ උස්වූ විමානවල බොහෝකල් සිටින්නාවූ යම් දෙවතා කෙනෙක් ඇද්ද, ඔව්හුද තථාගතයන් වහන්සේගේ ධර්මය අසා බොහෝසෙයින් භයට සංවේගයට තැති ගැන්මට පැමිණෙත්. පින්වත්නි, ඒකාන්තයෙන් අනිත්‍යවූ අපි නිත්‍යයයි සිතුවෙමු. පින්වත්නි, ඒකාන්තයෙන් අනියතවූ අපි නියතයයි සිතුවෙමු. පින්වත්නි, අශාස්වත අපි ශාස්වත යයි සිතුවෙමු. අපිදු පින්වත්නි, අනිත්‍ය වෙමු. අනියත වෙමු. අශාස්වත වෙමු, පඤ්ච උපාදානස්කන්ධයට ඇතුළත් වෙමු කියායි. මහණෙනි, තථාගත තෙම මෙසේ මහත් ඍද්ධි ඇත්තේය. දෙවියන් සහිත ලොකයට මෙසේ මහෙශාක්‍යය, මෙසේ මහානුභාව ඇත්තේය.

**5.** "දෙවියන් සහිත ලොකයාගේ අප්‍රතිපුද්ගලවූ ශාස්තෲවූ බුදුරජ තෙම පඤ්ච උපාදානස්කන්ධ සංඛ්‍යාත සක්කායද එහි නිරොධයද එහි හෙතුවද දුක්ඛයාගේ සංසිඳීමට පැමිණෙන මාර්ගයද විශිෂ්ට ඥානයෙන් දැන යම්කලෙක්හි ධර්ම චක්‍රය පැවැත්වූයේද, වර්ණවත්වූ යසස් ඇත්තාවූ දීර්ඝායුෂ්කවූ දෙවියෝ සෙසු මෘගයෝ සිංහයාට මෙන් කෙලෙසුන්ගෙන් මිදුනාවූ තාදීවූ බුදුරජාණන් වහන්සේගේ වචනය අසා පින්වත්නි, අපි ඒකාන්තයෙන් අනිත්‍ය වෙමු. සක්කාය නොඉක්මවූ වෙමුයි බියවූවාහුය. තැතිගැන්මට පැමිණියාහුය."

**34. අග්ගප්පසාද සූත්‍රයː-** 1. "මහණෙනි, මේ අග්‍ර පැහැදීම් සතරක් වෙත්. කවර සතරක්ද යත්,

**2.** මහණෙනි, පා නැත්තාවූ හෝ දෙපා ඇත්තාවූ හෝ පා සතරක් ඇත්තාවූ හෝ බොහෝ පා ඇත්තාවූ හෝ රූප ඇත්තාවූ හෝ රූප නැත්තාවූ හෝ සංඥා ඇත්තාවූ හෝ සංඥා නැත්තාවූ හෝ භවාග්‍රයෙහි ඉපදුනාවූ හෝ යම්තාක් සත්වයෝ ඇත්තාහුද අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගත තෙම ඔවුන්ට අග්‍රයයි කියනු ලැබේ. මහණෙනි, යම්කෙනෙක් බුදුන් කෙරෙහි පැහැදුණාහුද ඔව්හු අග්‍රවූ දෙයෙහි පැහැදුණාහු වෙති. අග්‍රදෙයෙහි පැහැදුනවුන්ට අග්‍රවූ විපාකය වේ. මහණෙනි, සංඛත ධර්මයෝ

යම්තාක් ඇත්තාහුද ඔවුන් අතුරෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගය අග්‍රයයි කියනු ලැබේ. මහණෙනි, යම්කෙනෙක් ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි පැහැදුණාහුද ඔව්හු අග්‍ර දෙයෙහි පැහැදුනෝය. අග්‍ර දෙයෙහි පැහැදුනවුන්ට අග්‍ර විපාකය වේ. මහණෙනි, සංඛතවූ හෝ අසංඛතවූ හෝ යම්තාක් ධර්ම වෙත්ද, ඔවුන් අතුරෙන් විරාග සංඛ්‍යාත නිර්වාණය අග්‍රයයි කියනු ලැබේ. මදය නොමදයක් කරන, පිපාස සංසිඳුවන, තෘෂ්ණාව නසන, වට්ටය සිඳින, තෘෂ්ණා ක්ෂයවූ විරාගවූ නිරොධවූ නිර්වාණයක් නිර්වාණයයි. මහණෙනි, යම්කෙනෙක් ධර්මයෙහි පැහැදුනාහුද ඔව්හු අග්‍ර දෙයෙහි පැහැදුණාහුය. අග්‍ර දෙයෙහි පැහැදුණවුන්ට අග්‍ර විපාක වේ. මහණෙනි, යම්තාක් සමූහයෝ වෙත්ද, ඔවුන් අතුරෙන් පුරුෂ යුග සතරක්වූ පුරුෂ පුද්ගලයන් අටදෙනෙක්වූ ආහුණෙය්‍යවූ පාහුණෙය්‍යවූ දක්ඛිණෙය්‍යවූ අඤ්ජලිකරණීයවූ භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සංඝයා අග්‍රයි. මහණෙනි, යම්කෙනෙක් සංඝයා කෙරෙහි පැහැදුණාහුද ඔව්හු අග්‍ර දෙයෙහි පැහැදුණාහුය. අග්‍ර දෙයෙහි පැහැදුනවුන්ට අග්‍ර විපාකය වේ. මහණෙනි, මේ අග්‍රයන් කෙරෙහි පැහැදීම් සතරය.

> "ඒකාන්තයෙන් අග්‍රවූවන්ට පැහැදුනවුන්ට අග්‍රවූ ධර්මය දැනගන්නවුන්ට නිරුත්තර අග්‍ර දක්ෂිණෙය්‍යවූ බුදුන් කෙරෙහි පැහැදුනවුන්ට රාගයෙන් දුරුවූ සංසිඳීම් සැපය ඇති අග්‍ර ධර්මයෙහි පැහැදුනවුන්ටද නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍රවූ අග්‍ර සංඝයා කෙරෙහි පැහැදුනවුන්ටද අග්‍ර වස්තුන් කෙරෙහි දන් දෙන්නවුන්ටද අග්‍රවූ පින් වැඩෙයි. අග්‍රවූ ආයුෂ වර්ණ සැප බල යසස් කීර්ති ලැබෙයි. අග්‍ර ධර්මයන්ගෙන් යුක්තවූ අග්‍රපුද්ගලයාට දන්දෙන්නාවූ අග්‍ර ධර්මයෙන් යුත් නුවණැති පුද්ගල තෙමේ දෙවි වූයේ හෝ මනුෂ්‍ය වූයේ හෝ අග්‍ර සැපයට පැමිණ සතුටු වෙයි."

**35. වස්සකාර සූත්‍රයː-** 1. "එක්කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම් තන්හි වෙළුවනාරාමයෙහි වාසය කරණ සේක. ඉක්බිති මගධ මහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ

යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවිය යුතුවූ සිහි කටයුතුවූ කථාවකොට නිමවා එකක් පසෙක සිටියේය.

2. එකත්පසෙක සිටි මගධ මහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස, අපි කරුණු සතරකින් යුක්තවූ මහත්වූ ප්‍රඥා ඇති මහාපුරුෂයෙකු පනවමු'යි කීයේය. කවර සතරකින්ද යත්. භවත් ගෞතමයන් වහන්ස, මේ ලොකයෙහි ඇසූ ඒ ඒ දෙයින් බහුශ්‍රැතවූයේ වේද, මේ මේ භාෂිතයාගේ අර්ථයය. මේ මේ භාෂිතයාගේ අර්ථයයි. ඒ ඒ භාෂිතයාගේ අර්ථය දනීද, කර බොහෝ කල් ගිය දේද කියා බොහෝ කල් ගිය දේද සිහිකරන්නාවූ නැවත නැවත සිහිකරන්නාවූ සිහි ඇත්තේ වේද? ගෘහස්ථයන්ට අයත්වූ කටයුතුවූ යමක් වේද එහි දක්ෂවේද අලස නුවූයේ වේද, මෙය කළයුතුය. සංවිධාන කළයුතුයයි ඒ ඒ කටයුත්තෙහි උපායභූත ප්‍රඥාවෙන් යුක්තවූයේ වේද, භවත් ගෞතමයන් වහන්ස, මේ කරුණු සතරින් යුක්තවූ මහත්වූ ප්‍රඥා ඇති මහා පුරුෂයා පනවමි."

3. "භවත් ගෞතමයන් වහන්ස, ඉදින් භවත් ගෞතමයන් වහන්සේ මෙය පිළිගත යුතු නම් පිළිගනිත්වා. භවත් ගෞතමයන් වහන්ස, ඉදින් භවත් ගෞතමයන් වහන්සේ මෙය ප්‍රතික්ෂෙප කටයුතු නම් ප්‍රතික්ෂෙප කෙරෙත්වා."

4. "බ්‍රාහ්මණය, මම මෙය පිළිගැනීමද නොකරමි. ප්‍රතික්ෂෙපද නොකරමි. බ්‍රාහ්මණය, මම කරුණු සතරකින් යුක්තවූ මහා ප්‍රාඥ මහා පුරුෂයෙකු පනවමි. කවර කරුණු සතරකින්ද යත්.

5. "බ්‍රාහ්මණය, මේ ලොකයෙහි බොහෝදෙනාගේ හිත පිණිස පිළිපන්නේ වේද බොහෝ දෙනාගේ සැප පිණිස පිළිපන්නේ වේද, බොහෝ ජන සමූහයා යහපත් ස්වභාවය වූද, කුශල ස්වභාවය වූද, විදර්ශනා සහිත ආර්ය මාර්ගයෙහි පිහිටුවන්නේ වේද, හෙතෙම යම් විතර්කයක් සිතන්නට කැමැති නම් ඒ විතර්කය සිතයිද, යම් විතර්කයක් සිතන්නට නොකැමැති

නම් ඒ විතර්කය නොසිතයිද? යම් කල්පනාවක් සිතන්නට කැමති නම් එය කල්පනා කරයි. යම් කල්පනාවක් සිතන්නට නොහැකි නම් එය කල්පනා නොකරයි. මෙසේ විතර්කයන්හි සිත වසඟ කරගත හැකි බවට පැමිණියේ වේද,

**6.** "ඉතා පිරිසිදු සිතින් උපන් මේ ආත්මයෙහිම සැප විහරණ ඇත්තාවූ, ධ්‍යාන සතර කැමති පරිදි ලබන්නේ පහසුවෙන් ලබන්නේ නිදුකින් ලබන්නේ වේද ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිත අර්හත් ඵල සමාධියද අර්හත් ඵල ප්‍රඥාවද මෙලොවම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරයිද, බ්‍රාහ්මණය, මම ඔවුන් පිළිගැනීමද නොකරමි. ප්‍රතික්ෂේපද නොකරමි. බ්‍රාහ්මණය, මම මේ ධර්ම සතරින් යුක්තවූ මහත් ප්‍රඥා ඇති මහා පුරුෂයෙකු පනවමි."

**7.** "භවත් ගෞතමයන් වහන්ස, ආශ්චර්යයය, භවත් ගෞතමයන් වහන්ස, අද්භූතය. භවත් ගෞතමයන් වහන්සේ විසින් එපමණම යහපත් වචනයක් වදාරණ ලදී. අපි මේ ධර්ම සතරින් යුක්තවූ භාග්‍යවතුන් වහන්සේ දරමු. භවත් ගෞතමයන් වහන්සේ බොහෝදෙනාගේ හිත පිණිස, බොහෝ දෙනාගේ සැප පිණිස, පිළිපන්නාහු වෙත්. යහපත් ස්වභාවය වූද කුශල ස්වභාවය වූද ආර්ය මාර්ගයෙහි බොහෝ ජනයා පිහිටු වන්නාහුද වෙත්. භවත් ගෞතමයන් වහන්සේ යම් විතර්කයක් සිතන්ට කැමති නම් ඒ විතර්කය සිතන්නාහ. යම් විතර්කයක් සිතන්ට නොකැමැති නම් ඒ විතර්කය නොසිතන්නාහ. යම් කල්පනාවක් කල්පනා කරන්ට කැමැති නම් ඒ කල්පනාව කල්පනා කරන්නාහ. යම් කල්පනාවක් කල්පනා කරන්ට නොකැමැති නම් ඒ කල්පනාව කල්පනා නොකරන්නාහ. භවත් ගෞතමයන් වහන්සේ විතර්කයන්හි සිත වසඟ කළ හැකි බවට පැමිණිසේක.

**8.** "භවත් ගෞතමයන් වහන්සේ, ඉතා පිරිසිදු සිතින් උපන් මේ ආත්මයෙහිම සැප විහරණ ඇත්තාවූ ධ්‍යාන සතර කැමති පරිදි ලබන්නාහුද නිදුකින් ලබන්නාහුද පහසුවෙන් ලබන්නාහුද වෙත්. භවත් ගෞතමයන් වහන්සේ, ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධියද අර්හත් ඵල ප්‍රඥාවද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මෙලොවම තෙමේ විශිෂ්ට ඥාණයෙන් දැන පැමිණ වාසය කරන සේක."

**9.** "බ්‍රාහ්මණය, තොප විසින් ඒකාන්තයෙන් උසස් කර කියන වචනයක් කියන ලද්දේ වෙමි. එතකුදු වුවත් මම තොපට ප්‍රකාශ කරමි. බ්‍රාහ්මණය, මම වනාහි බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සැප පිණිස පිළිපන්නේ වෙමි. මා විසින් බොහෝ ජන සමූහයා යහපත් ස්වභාවයවූ කුශල ධර්ම ස්වභාවයවූ ආර්ය මාර්ගයෙහි පිහිටුවන ලදහ. බ්‍රාහ්මණය, මම වනාහි යම් විතර්කයක් සිතන්නට කැමැත්තෙම්ද ඒ විතර්කය සිතන්නෙමි. යම් විතර්කයක් සිතන්නට නොකැමැත්තෙම්ද ඒ විතර්කය නොසිතමි. යම් කල්පනාවක් කල්පනා කරන්නට කැමැත්තෙම්ද, ඒ කල්පනාව කල්පනා කරමි. යම් කල්පනාවක් කල්පනා කිරීමට නොකැමැත්තෙම් නම් ඒ කල්පනාව කල්පනා නොකරමි. බ්‍රාහ්මණය, මම විතර්කයන්හි සිත වසග කළ හැකි බවට පැමිණියෙමි. බ්‍රාහ්මණය. මම වනාහි ඉතා පිරිසිදු සිතින් උපන් මෙලොවම සැප විහරණ ඇති ධ්‍යාන සතර කැමති පරිදි ලබන්නේද පහසුවෙන් ලබන්නේද නිදුකින් ලබන්නේද වෙමි. බ්‍රාහ්මණය, මම ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධියද අර්හත් ඵල ප්‍රඥාවද මෙලොවම තෙමේ විශිෂ්ට ඥාණයෙන් දැන පැමිණ වාසය කරමි.

> **10.** "බොහෝ දෙනා යමක් ඒකාන්තයෙන් දැකද අසාද පහදිත්. සියලු සත්වයන් මාරපාසයෙන් මිදීම යමෙක් දැනගත්තේද? උන්වහන්සේ දෙව් මිනිසුන්ට හිතවත්වූ න්‍යාය ධර්මය ප්‍රකාශ කළසේක්ද? මග නොමග දක්ෂවූ, කළ කටයුතු ඇති, ආශ්‍රව රහිත අන්තිම සිරුර දරන මහා ප්‍රාඥ බුදුරජාණන් වහන්සේ මහා පුරුෂ යයි කියනු ලැබේ."

**36. දොණ (බ්‍රාහ්මණ) සූත්‍රයඃ-** 1. "එක් කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ උක්කට්ඨා නුවරටත් සෙතව්‍ය නුවරටත් අතරෙහිවූ දීර්ඝ මාර්ගයට පිළිපන්සේක. දොණ බ්‍රාහ්මණ තෙමේද උක්කට්ඨා නුවරටත් සෙතව්‍ය නුවරටත් අතරෙහිවූ දීර්ඝ මාර්ගයට පිළිපන්නේ වේ. දොණ බ්‍රාහ්මණ තෙම

භාග්‍යවතුන්වහන්සේගේ පාදයන්හි දහසක් අර ඇති නිම්වළලු සහිත, නාභිය සහිත සියලු ආකාරයෙන් පිරුණාවූ චක්‍රයන් දැක්කේය. දැක "පින්වත්නි, ඒකාන්තයෙන් ආශ්චර්යයි. පින්වත්නි, ඒකාන්තයෙන් පුදුමයි. ඒකාන්තයෙන් මේ මිනිස් වූවෙකුගේ පා නොවෙන්නාහුය."

**2.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මාර්ගයෙන් ඉවත්ව පලක් බැඳ ශරීරය ඍජුව තබා සිහිය ඉදිරියෙහි පිහිටුවා එක්තරා වෘක්ෂමූලයෙක්හි වැඩසිටිසේක. ඉක්බිති ද්‍රොණ බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේගේ පිය අනුව යන්නේ එක්තරා වෘක්ෂමූලයක වැඩසිටි ප්‍රසාදජනකවූ පැහැදියයුතු ශාන්ත ඉඳුරන් ඇති සන්සුන් සිත් ඇති උතුම්වූ අර්හත් මාර්ග නම් දමථයටත් මාර්ග සමාධි නම් සමථයටත් පැමිණි භාග්‍යවතුන් වහන්සේ දුටුයේය. දාන්තවූ රක්නා ලද සන්සුන් ඉඳුරන් ඇති, භාග්‍යවතුන් වහන්සේ දැක භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට

**3.** "පින්වතුන් වහන්සේ දෙවියෙක් නොවන්නේදැයි?" ඇසීය.

"බ්‍රාහ්මණය, මම දෙවියෙක් නොවන්නෙමි."

"පින්වතුන් වහන්සේ ගාන්ධර්වයෙක් නොවන්නේද?" - "බ්‍රාහ්මණය, මම ගාන්ධර්වයෙක්ද නොවන්නෙමි."

"පින්වතුන් වහන්සේ යක්ෂයෙක් නොවන්නේද?" - "බ්‍රාහ්මණය, මම යක්ෂයෙක්ද නොවන්නෙමි."

"පින්වත් තෙමේ මනුෂ්‍යයෙක් නොවන්නේද?" - "බ්‍රාහ්මණය, මම මනුෂ්‍යයෙක්ද නොවන්නෙමි."

**4.** "පින්වතුන් වහන්සේ දෙවියෙක් නොවන්නේ දැයි" මෙසේ විචාරණ ලද්දේම 'බමුණ, මම දෙවියෙක් නොවන්නෙමියි' වදාළෙහිය. 'පින්වතුන් වහන්සේ ගාන්ධර්වයෙක් නොවන්නේදැයි' මෙසේ විචාරණ ලද්දේම 'බමුණ, මම ගාන්ධර්වයෙක් නොවන්නේයයි' වදාළෙහිය. 'පින්වතුන්වහන්සේ යක්ෂයෙක් නොවන්නෙහිදැයි' මෙසේ විචාරණ ලද්දේම 'බමුණ, මම යක්ෂයෙක් නොවේයයි' මෙසේ

වදාළෙහිය. 'පින්වතුන් වහන්සේ මනුෂ්‍යයෙක් නොවේදැයි' මෙසේ විචාරණ ලද්දේම 'බමුණ, මම මනුෂ්‍යයෙක් නොවේයයි' මෙසේ වදාළෙහිය. වැලිදු දැන් පින්වතුන් වහන්සේ කවරෙක් වන්නෙහිද?"

**5.** "බමුණ, මම යම් ආශ්‍රව කෙනෙකුන් ප්‍රහීණ නොවූ බැවින් දෙවියෙක් වන්නෙම්ද, මා විසින් ඒ ආශ්‍රවයෝ ප්‍රහීණ කරණ ලදහ. සිඳින ලද මුල් ඇත්තාහ. සිඳින ලද තල්ගසක් මෙන් කරණ ලද්දාහ. අභාවයට යවන ලද්දාහ. මතු නූපදින තත්ත්වයට පමුණුවන ලද්දාහ. බමුණ, මම යම් ආශ්‍රව කෙනෙකුන් ප්‍රහීණ නොකළ බැවින් ගාන්ධර්වයෙක් වන්නෙම්ද, බමුණ මම යම් ආශ්‍රව කෙනෙකුන් ප්‍රහීණ නොකළ බැවින් යක්ෂයන් වන්නෙම්ද මනුෂ්‍යයෙක් වන්නෙම්ද මා විසින් ඒ ආශ්‍රවයෝ ප්‍රහීණ කරණ ලදහ. සිඳින ලද මුල් ඇත්තාහ. සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දාහ. අභාවයට යවන ලද්දාහ. මනුෂ්‍ය දීනත්වයට පමුණුවන ලද්දාහ. බමුණ මම යම් ආශ්‍රව කෙනෙකුන් ප්‍රහීන නොකළ බැවින් යක්ෂයන් වන්නෙම්ද මනුෂ්‍යයෙක් වන්නෙම්ද මා විසින් ඒ ආශ්‍රවයෝ ප්‍රහීණ කරණ ලදහ. සිඳින ලද මුල් ඇත්තාහ. සිඳින ලද තල් ගසක් මෙන් කරන ලද්දාහ. අභාවයට යවන ලද්දාහ. මතු නූපදින තත්වයට පමුණුවන ලද්දාහ. යක්ෂයෙක් වන්නෙම්ද මනුෂ්‍යයෙක් වන්නෙම්ද මා විසින් ඒ ආශ්‍රවයෝ ප්‍රහීණ කරණ ලදහ. සිඳින ලද මුල් ඇත්තාහ. සිඳින ලද තල්ගසක් මෙන් කරණලදහ. අභාවයට යවන ලද්දාහ. මතු නූපදින තත්වයට පමුණුවන ලද්දාහ.

**6.** "බමුණ, උපුලක් හෝ රත් පියුමක් හෝ සුදු පියුමක් හෝ ජලයෙහි හටගන්නේ, ජලයෙහි වැඩුනේ, ජලයෙන් උඩට නැගේ. ජලය හා නොගැටුනේ යම්සේ සිටීද, බමුණ, එසේම මම ලොකයෙහි උපන්නේ ලොකයෙහි වැඩුනේ ලොකය හා නොගැටුනේ ලොකය අභිභවා වාසය කරමි. බමුණ මා බුද්ධයයි දරව."

**7.** "යම් ආශ්‍රවයක් හෙතුකොට ගෙන දෙවියන් අතර උත්පත්තියක් වන්නේද අහසින් යන ගාන්ධර්වයෙක් හෝ

වන්නේද, යමකින් යක්ෂත්වයට යන්නේද, මනුෂ්‍යත්වයට යන්නේද, අණ්ඩජ යොනියෙහි උපදින්නේද, මට ඒ ආශ්‍රවයෝ ක්ෂයවූවාහුය. පිඹහරින ලද්දාහ. පහකළ බැඳුම් ඇත්තාහ. යහපත්වූ උපුලක් යම්සේ ජලයෙන් නොමැකේද, එමෙන් ලොකයා හා නොඇලෙමි. බමුණ එසේ හෙයින් මම බුද්ධ වෙමි.”

**37. අපරිහානිය ධම්ම සූත්‍රයඃ-** 1. “මහණෙනි, ධර්ම සතරකින් යුක්තවූ මහණතෙම පිරිහීමට නුසුදුසුය. නිවණ සමීපයෙහිම වේ. කවර සතරකින්ද යත්.

2. “මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සීලයෙන් යුක්තවේද ඉන්ද්‍රියයන්හි වසන ලද දොරටු ඇත්තේ වේද, භොජනහෙි පමණ දන්නේද නිදි දුරුකිරීමෙහි යෙදුනේ වේද, මහණෙනි, මහණ තෙම කෙසේ සීලයෙන් යුක්ත වේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සිල්වත් වේද ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරවූයේ වේද, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූයේ වේද, සුලු වරදෙහිද භය දක්නා සුළු වේද, ශික්ෂාපද දැඩිකොටගෙන හික්මේද, මහණෙනි, භික්ෂුව මෙස් සීලසම්පන්නයෙක් වේ.

3. “මහණෙනි, භික්ෂුතෙම කෙසේ ඉන්ද්‍රියන්හි වසන ලද දොරටු ඇත්තේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම ඇසින් රූපයක් දැක නිමිති නොගන්නේ වේද, අනුබ්‍යඤ්ජන නොගන්නේ වේද, යම් කාරණයකින් චක්ෂුරින්ද්‍රියෙහි අසංවරව වාසය කරණ මොහු කරා ලොභ දොස යන ලාමක අකුශල ධර්මයෝ ලුහුබඳනාහුද, ඔහුගේ සංවරය පිණිස පිළිපදීද, ඇස රකීද, ඇසෙහි සංවරයට පැමිණේද,

“කණින් ශබ්දයක් අසා නිමිති නොගන්නේ වේද, අනුබ්‍යඤ්ජන නොගන්නේ වේද, යම් කාරණයකින් ශ්‍රොතෙන්ද්‍රියයෙහි අසංවරව වාසය කරණ මොහු කරා ලොභ දොස යන ලාමක අකුශල ධර්මයෝ ලුහුබඳනාහුද, ඔහුගේ සංවරය පිණිස පිළිපදීද, කණ රකීද, කණෙහි සංවරයට පැමිණේද,

"නාසයෙන් ගඳක් ආඝ්‍රාණය කොට නිමිති නොගන්නේ වේද, අනුබ්‍යඤ්ජන නොගන්නේ වේද, යම් කාරණයකින් ඝ්‍රාණෙන්ද්‍රියයෙහි අසංවරව වාසය කරණ මොහු කරා ලොභ දොස යන ලාමක අකුශල ධර්මයෝ ලුහුබඳනාහුද, ඔහුගේ සංවරය පිණිස පිළිපදීද, නාසය රකීද, නාසයෙහි සංවරයට පැමිණේද,

"දිවෙන් රසයක් විඳ නිමිති නොගන්නේ වේද, අනුබ්‍යඤ්ජන නොගන්නේ වේද, යම් කාරණයකින් ජිව්හෙන්ද්‍රියයෙහි අසංවරව වාසය කරණ මොහු කරා ලොභ දොස යන ලාමක අකුශල ධර්මයෝ ලුහුබඳනාහුද, ඔහුගේ සංවරය පිණිස පිළිපදීද, දිව රකීද, දිවෙහි සංවරයට පැමිණේද,

"ශරීරයෙන් ස්පර්ශයක් ස්පර්ශකොට නිමිති නොගන්නේ වේද, අනුබ්‍යඤ්ජන නොගන්නේ වේද, යම් කාරණයකින් කායෙන්ද්‍රියයෙහි අසංවරව වාසය කරණ මොහු කරා ලොභ දොස යන ලාමක අකුශල ධර්මයෝ ලුහුබඳනාහුද, ඔහුගේ සංවරය පිණිස පිළිපදීද, කය රකීද, කයෙහි සංවරයට පැමිණේද,

"සිතින් ධර්මයක් දැන නිමිති නොගන්නේ වේද, අනුබ්‍යඤ්ජන නොගන්නේ වේද, යම් කාරණයකින් සිතෙහි අසංවරව වාසය කරන්නහු කරා ලොභ ද්වෙෂ නම් ලාමක අකුශල ධර්මයෝ ලුහුබඳනාහුද එය සංවරය පිණිස පිළිපදීද, මනින්ද්‍රියය රකීද, මනින්ද්‍රියෙහි සංවරයට පැමිණෙයිද මහණෙනි, මෙසේ වනාහි මහණතෙම ඉන්ද්‍රියයන්හි වසන ලද දොරටු ඇත්තේ වේ.

4. "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම භොජනයෙහි පමණ දන්නේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නුවණින් කල්පනාකොට ආහාර ගනියිද ක්‍රීඩා පිණිස නොවේ. මද වැඩීම පිණිස නොවේ. සැරසීම පිණිස නොවේ, අලංකාරය පිණිස නොවේ. මේ ශරීරයාගේ පැවැත්ම පිණිසම යැපීම පිණිසම, වෙහෙස දුරුකර ගැනීම පිණිසම, බ්‍රහ්මචර්යාවට අනුග්‍රහ පිණිසම වේ. මෙසේ පරණ වේදනා මැඩපවත්වමි. අළුත් වේදනා නූපදවන්නෙමි. මාගේ ජීවිත යාත්‍රාවද වන්නේය.

නිවරදද වන්නේය. සැපවිහරණයද වන්නේයයි නුවණින් මෙනෙහි කොට ආහාර වළඳන්නේය. මහණෙනි, මෙසේ වනාහි මහණතෙම භොජනයෙහි පමණ දන්නේ වෙයි.

**5.** "මහණෙනි, කෙසේ නම් මහණතෙම නිදි දුරුකිරීමෙහි යෙදුනේ වේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම දවල් දවස සක්මන් කිරීමෙන් සහ හිඳීමෙන් වැළැක්විය යුතු ක්ලෙශ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරයි. රාත්‍රියෙහි ප්‍රථම යාමයෙහිද සක්මන් කිරීමෙන් සහ හිඳීමෙන් වැළැක්විය යුතු ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරයි. රාත්‍රියෙහි මධ්‍යම යාමයෙහි දකුණැලයෙන් දකුණු පය මත වම්පය මදක් ඇද තබා නැගිටින සංඥාව මෙනෙහි කොට සිහි ඇතිව සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තව සිංහසෙය්‍යාව කරයි. රාත්‍රියෙහි අවසන් යාමය නැගිට සක්මන් කිරීමෙන් සහ හිඳීමෙන් වැළැක්විය යුතු ක්ලෙශ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරයි. මහණෙනි, මෙසේ වනාහි මහණතෙම නිදි දුරුකිරීමෙහි යෙදුනේ වේ. මහණෙනි, මේ ධර්ම සතරින් යුක්තවූ මහණතෙම පිරිහීමට නුසුදුසුය. නිවණ සමීපයේම වේ.

> "මහණතෙම ශීලයෙහි පිහිටියේද ඉන්ද්‍රියයන්හි සංවරවූයේද භොජනයෙහි පමණ දන්නේද නිදි දුරු කිරීමෙහි යෙදෙයිද රෑ දවල් දෙක්හි මෙසේ වාසය කරමින් යොගයන්ගෙන් මිදීමට පැමිණීම පිණිස කුශල ධර්ම වඩන්නාවූ අප්‍රමාදයෙහි ඇලුණාවූ ප්‍රමාදයෙහි භය දක්නා සුලු භික්ෂුතෙම පිරිහීමට යොග්‍ය නොවේ. නිවන සමීපයෙහිම සිටියේ වෙයි."

**38. පටිලීන සූත්‍රය:-** 1. "මහණෙනි, මෙයම සත්‍යයයි වෙන වෙනම ගත් දෘෂ්ටි දුරු කළ සියලු සෙවීම් අත්හළ ආශ්වාස ප්‍රශ්වාස සංසිඳවූ මහණතෙම විවේකයට පැමිණියේයයි කියනු ලැබේ. මහණෙනි, කෙසේ නම් මහණ තෙම මෙම සත්‍යයි වෙන වෙනම ගත් දෘෂ්ටි දුරුකෙළේ වෙයිද? මහණෙනි, මේ ලොකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ මෙම සත්‍යයයි ගත් නොයෙක් බොහෝවූ දෘෂ්ටි වෙත්ද ඒ කවරහුද? ලොකය ශාශ්වතයයි කියා හෝ ලොකය අශාශ්වතයයි කියා හෝ ලොකය

අන්තයක් ඇත්තේයයි කියා හෝ ලොකය අන්තයක් නැත්තේයයි කියා හෝ එයම ජීවයද එයම ශරීරයද වෙයි කියා හෝ අනිකක් ජීවය අනිකක් ශරීරය කියා හෝ සත්වයා මරණින් මතු වෙයි කියා හෝ සත්වයා මරණින් මතු නොවෙයි කියා හෝ සත්වයා මරණින් මතු වෙයි නොවෙයි කියා හෝ සත්වයා මරණින් මතු නොවෙයි, නොදනොවෙයි කියා හෝ ගන්නාවූ දෘෂ්ටිහුය. භික්ෂුව විසින් ඒ සියලු දෘෂ්ටි උදුරා දමන ලද්දාහුද, හරන ලද්දාහුද, දුරුකරන ලද්දාහුද, මුදන ලද්දාහුද, පහකරණ ලද්දාහුද, ඉවත් කරන ලද්දාහුද මහණෙනි, මහණ තෙම මෙසේ වනාහි උදුරා දමන ලද වෙන වෙනම ගත් දෘෂ්ටි ඇත්තේ වෙයි.

2. "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම දුරුකළ සියලු සෙවීම් ඇත්තේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුවගේ (අනාගාමි මාර්ගයෙන්) කාමයන් සෙවීම ප්‍රහීණවූයේ වේද, (අර්හත් මාර්ගයෙන්) භවයන් සෙවීම ප්‍රහීණ වූයේ වේද, (අර්හත් මාර්ගයෙන්) බ්‍රහ්මචර්යාව සෙවීම සංසිඳුනේ වේද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම දුරුකළ සියලු සෙවීම් ඇත්තේ වේ.

3. "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම සංසිඳුනු ආශ්වාස ප්‍රශ්වාස ඇත්තේ වේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම සැපය ප්‍රහීන වීමෙන්ද දුක්ඛය ප්‍රහීන වීමෙන්ද සොම්නස් දොම්නස් දෙදෙනාගේ අස්තංගතයෙන් දුක් නැති සැප නැති උපෙක්ෂා ස්මෘති දෙකින් පිරිසිදුවීම් ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයිද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම සංසිඳුනු ආශ්වාස ප්‍රශ්වාස ඇත්තේ වේ.

4. "මහණෙනි, කෙසේ නම් මහණතෙම විවේකයෙන් යුක්ත වේද මහණෙනි, මේ ශාසනයෙහි මහණහට 'මම වෙමි මානය ප්‍රහීණවූයේ වේද, සිඳිනලද මුල් ඇත්තේද, අග සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දේද, අභාවයට යවන ලද්දේද මතු නූපදින තත්වයට කරණ ලද්දේද,' මහණෙනි, මෙසේ වනාහි භික්ෂු තෙම විවේකයෙන් යුක්තවූයේ වෙයි. මහණෙනි, මෙයම සත්‍යයි බැහැර කරගත් භික්ෂුව මනාව හරණ ලද සියලු සෙවීම් ඇත්තේ බර හරින ලද කාය සංස්කාර ඇත්තේ එක්කෙනෙක් බවට පැමිණියේයයි කියනු ලැබේ."

5. "සියලු රාගයන්ගෙන් දුරුවූ අර්හත්ඵල විමුක්තියෙන් යුක්තවූ යමෙකු විසින් බ්‍රහ්මචරිය එසනාව සහ කාමෙසනා භවෙසනාව යන එසනා (සෙවීම්) දුරුකරන ලද්දාහුද මෙයම සත්‍යයයි ඔසවාගත් වැරදි දැකීම් සහ දෘෂ්ටි උදුරා දමන ලද්දාහුද ඒකාන්තයෙන් ශාන්තවූ සිහි ඇත්තාවූ සංසිඳුනාවූ නොපැරදවිය හැක්කාවූ මානය දුරු කළාවූ චතුස්සත්‍ය අවබොධ කළාවූ මහණ තෙම විවේකයෙන් යුක්තවූයේයයි" කියනු ලැබේ.

**39. උජ්ජාය සූත්‍රයː-** 1. "ඉක්බිති උජ්ජාය නම් බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථාකොට නිමවා එකත් පසෙක හුන්නේය. එකත්පසෙක හුන් උජ්ජාය බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "භවත් ගෞතමයන් වහන්සේත් යාගකිරීම වර්ණනා කෙරෙද්ද?" යනුය. "බ්‍රාහ්මණය, මම සියලු යාග වර්ණනා නොකරමි. බ්‍රාහ්මණය, මම සියලුම යාග වර්ණනා නොකරන්නේද නොවෙමි, 'බ්‍රාහ්මණය, යම්බඳු යාගයෙක්හි ගවයන් මරත්ද, එළු බැටළුවන් මරත්ද, කුකුලන් ඌරන් මරත්ද, නොයෙක් ප්‍රාණීහු විනාශයට පමුණුවත්ද, බමුණ, මම මෙබඳුවූ ප්‍රාණඝාතය පිළිබඳ බොහෝ කටයුතු සහිත යාග වර්ණනා නොකරමි. ඊට හෙතු කවරේද?

3. "බමුණ, මෙබඳු ප්‍රාණඝාතනය පිළිබඳ බොහෝ කටයුතු ඇති යාගයට රහත්හු හෝ රහත් මාර්ගයට පිළිපන්නාහු හෝ නොඑළඹෙත්. බමුණ යම්බඳු යාගයෙක්හි ගවයන් නොමරත්ද, එළු බැටළුවන් නොමරත්ද, කුකුලන් ඌරන් නොමරත්ද, නොයෙක් සතුන් මරණයට නොපමුණුවත්ද, බ්‍රාහ්මණය මම මෙබඳුවූ ප්‍රාණඝාතය පිළිබඳ බොහෝ කටයුතු නැති යාගය වර්ණනා කරමි. එනම්ː සලාක දානයත්, පරම්පරාගත දානයත් යන දෙකයි. ඊට හේතු කවරේද? බමුණ, මෙබඳු නිරාරම්භ යාගයට රහත්හු හෝ රහත් මාර්ගයට පිළිපන්නාහු හෝ පැමිණෙත්.

4. "අස්සමෙධ යාගය, පුරුෂමෙධ යාගය, සම්මාපාස යාගය, වාජපෙය්‍ය යාගය, නිරග්ගලයාගය යන මහත් කටයුතු ඇති ඒ මහායාගයෝ මහත්ඵල නොවෙත්. එළු බැටළුවන්ද ගවයන්ද යන නානාප්‍රකාර සත්වයෝ යම් යාගයෙක්හි නසනු ලැබෙත්ද, ඒ යාගයන් යහපත් මාර්ගයෙහි පිළිපන් මහත් සෘෂීහු කරා නොපැමිණෙත්. යම්කිසි යාගයක් මහත් කටයුතු නැත්තේද, පරම්පරාගතව එන්නේද එළු බැටළුවන් ද ගවයන්ද නානාප්‍රකාර සත්වයෝ මෙහි නසනු නොලැබෙත්ද, යහපත් මාර්ගයෙහි පිළිපන් මහර්ෂීහු ඒ යාගයට පැමිණෙත්. ඤාණවන්ත මේ යාගය කරන්නේය. මේ යාගය මහත් ඵලයි. මෙය යාගය කරන්නා ශ්‍රෙෂ්ඨවේ. ලාමකයෙක් නොවේ. යාගයද මහත්ඵලවේ. දෙවියෝද පහදිත්."

**40. උදායී බ්‍රාහ්මණ සූත්‍රයː-** 1. ඉක්බිති උදායි බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටු වියයුතු කථාකොට නිමවා එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් උදායි බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ගෞතමයන් වහන්සේ යාගය වර්ණනා කරන්නේද?" යනුයි.

"බමුණ, මම සියලු යාගම වර්ණනා නොකරමි. බ්‍රාහ්මණය මම සියලු යාග වර්ණනා නොකරන්නෙම්ද නොවෙමි. බමුණ යම්බඳු යාගයෙක්හි ගවයන් මරත්ද, එළු බැටළුවන් මරත්ද ඌරන් කුකුලන් මරත්ද, නොයෙක් ප්‍රාණීහු විනාශයට පමුණුවත්ද, බමුණ මම මෙබඳුවූ බොහෝ කටයුතු ඇති ප්‍රාණීන් මරණ යාග වර්ණනා නොකරමි. ඊට හෙතු කවරේද?

3. "බමුණ, මෙබඳුවූ බොහෝ කටයුතු ඇති යාගයට රහත්හු හෝ රහත් මාර්ගයට පිළිපන්නාහු හෝ නොපැමිණෙත්. බමුණ යම්බඳු යාගයෙක්හි ගවයන් නොමරත්ද, එළුවන් බැටළුවන් නොමරත්ද, කුකුලන් ඌරන් නොමරත්ද නොයෙක් ප්‍රාණීන් විනාශයට නොපමුණුවද්ද, බමුණ මම මෙබඳු යාග

වර්ණනාකරමි. එනම් නිත්‍ය දානයත් පරම්පරාවේ එන දානයත්ය. ඊට හෙතු කවරේද? බමුණ මෙබඳු ප්‍රාණීන් නොමරණ යාගයට රහත්හු හෝ රහත් මාර්ගයට පිළිපන්නාහු එළඹෙත්.

4. "සුදුසු කාලයෙහි රැස් කරණ ලද කැපවූ සතුන් නොමරණ යාගයක් වේද, එබඳු යාගය කරා සංයමවූ බ්‍රහ්මචාරීහු පැමිණෙත්. කාලයද ගතියද ඉක්මවූ පහ කළ කෙලෙස් වැසුම් ඇති පිණට දක්ෂ යම් බුදුවරයෝ ලොකයෙහි වෙත්ද උන්වහන්සේලා මේ යාගය පසසත්. ප්‍රකෘති දානයෙහි හෝ මතක දානයෙහි හෝ පැහැදුනු සිත් ඇත්තේ සුදුසු පරිද්දෙන් දෙය්‍ය ධර්මයන් සකස් කොට බ්‍රහ්මචාරීන් කෙරෙහි යහපත් ක්ෂෙත්‍රයෙහි පුදයි. දක්ෂිණාවට සුදුස්සන් කෙරෙහි යමක් කරණ ලද්දේද, එය මනාකොට නිමකරණ ලද්දකි. මනාකොට පුදන ලද්දකි, මනාකොට පැමිණෙන ලද්දකි. පිදීමද මහත්වේ. දෙවියෝද පහදිත්. පරිත්‍යාග චිත්තයෙන් යුක්තව ශ්‍රද්ධාවත් ප්‍රඥාවන්ත තෙම මෙසේ යාගකොට පණ්ඩිත තෙම ව්‍යාපාද නැති සැපවත් භවයකට පැමිණේ."

(සතරවෙනි චක්ක වර්ගය නිමි.)

## 5. රොහිතස්ස වර්ගය.

**41. සමාධි භාවනා සූත්‍රය:-** 1. "මහණෙනි, මේ සමාධි භාවනා සතර දෙනෙකි. කවර සතර දෙනෙක්ද යත්, මහණෙනි, වඩන ලද බහුල කරන ලද සමාධි භාවනාවක් මේ ආත්මයෙහි සැප විහරණ පිණිස වන්නීද, එබඳු සමාධි භාවනාවක් ඇත්තේය. මහණෙනි, වඩන ලද බහුල කරන ලද සමාධි භාවනාවක් දිව්‍යචක්ෂුරභිඥානය පිණිස වන්නේද එබඳු සමාධි භාවනාවක් නැත්තේය. වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ සමාධි භාවනාවක් සිහිය හා නුවණින් දැනීම පිණිස පවතීද මහණෙනි, එබඳු සමාධි භාවනාවක් ඇත. වඩන ලද බහුල කරන ලද සමාධි භාවනාවක්

ආශ්‍රවයන් ක්ෂය කිරීම පිණිස පවතියිද එබඳු සමාධි භාවනාවක් ඇත.

2. "මහණෙනි, වඩන ලද බහුල කරන ලද කවර සමාධි භාවනාවක් මේ ආත්මයෙහි සැප විහරණය පිණිස පවතීද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්ව අකුශලයන්ගෙන් වෙන්වම, විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති සතරවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයිද මහණෙනි, වඩන ලද බහුල කරන ලද මේ සමාධි භාවනාව මේ ආත්මයෙහි සැප විහරණය පිණිස පවතීයයි කියනු ලැබේ.

4. "මහණෙනි, වඩන ලද බහුල කරන ලද කවර සමාධි භාවනාවක් දිව්‍යචක්ෂුස ලැබීම පිණිස පවතීද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ආලෝක සංඥාව මෙනෙහි කරයිද දහවල්ය යන සංඥාව මෙනෙහි කරයිද දහවල් යම්සේද එසේම රාත්‍රියද රාත්‍රිය යම්සේද එසේ දවාලද මෙසේ විවෘතවූ නොවැසුණාවූ සිතින් ආලෝක සහිත සිත වඩයිද මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ මේ සමාධි භාවනාව දිව්‍ය චක්ෂුව ලැබීම පිණිස පවතී.

5. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ කවර සමාධි භාවනාවක් සිහිය හා නුවණින් දැනීම පිණිස පවතීද, මහණෙනි, මේ ශාසනයෙහි මහණහට ප්‍රකටව වේදනාවෝ උපදිත්ද ප්‍රකටව වෙදනා හටගනිත්ද, ප්‍රකටව වේදනා අභාවයට යත්ද, ප්‍රකටව හටගනිත්ද, ප්‍රකටව අභාවයට යෙත්ද, ප්‍රකටවූ සංඥා ප්‍රකටවූ විතර්ක උපදිත්ද, මහණෙනි, වඩන ලද බහුල වශයෙන් කරන ලද මේ සමාධි භාවනා තොමෝ සිහිය හා නුවණින් දැනීම පිණිස පවතී.

5. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ කවර සමාධි භාවනාව ආශ්‍රවයන් ක්ෂයවීම පිණිස පවතීද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම උපාදාන ස්කන්ධ පසෙහි ඉපදීමද විනාශයද දකිමින් වාසය කරයිද, මේ රූපයයි, මේ රූපයාගේ ඉපදීමයි, මේ රූපයාගේ නැතිවීමයි, මේ වෙදනාවයි, මේ

වෙදනාවගේ ඉපදීමයි, මේ වෙදනාවගේ නැතිවීමයි. මේ සංඥාවයි, මේ සංඥාවගේ ඉපදීමයි. මේ සංඥාවගේ නැතිවීමයි. මේ සංස්කාරයෝයි. මේ සංස්කාරයන්ගේ ඉපදීමයි, මේ සංස්කාරයන්ගේ නැතිවීමයි. මේ විඤ්ඤාණයයි, මේ විඤ්ඤාණයාගේ ඉපදීමයි, මේ විඤ්ඤාණයාගේ නැතිවීමයි.

**6.** "මහණෙනි, මේ වඩනලද්දාවූ බහුලකරන ලද්දාවූ මේ සමාධි භාවනාව ආශ්‍රවයන් ක්ෂයවීම පිණිස පවතී. මහණෙනි, මේ සතර සමාධි භාවනාවෝයි මහණෙනි, පරායන සූත්‍රයෙහි පුණ්ණක ප්‍රශ්නයෙහි මෙය වනාහී මේ සඳහා වදාරණ ලදී.

> 7. "ලොකයෙහි කිසිතැනක යමෙකුට ස්කන්ධ ධාතු ආයතන ආරම්මණ යන මොවුන් කෙරෙහි සැළීමක් නැද්ද, සත්ව ලොකයෙහි උසස් පහත් භෙදය දැන ශාන්ත වූයේද, පහවූ ක්‍රොධ නමැති දුම් ඇත්තේද, දුක් නැත්තේද ආශානැත්තේද හෙතෙම ජාති ජරා මරණය පහකෙළේයයි කියමි."

**42. පඤ්හ ව්‍යාකරණ සූත්‍රයː-** 1. "මහණෙනි, මේ ප්‍රශ්න විසඳීම් සතරක් වෙත්. කවර සතර දෙනෙක්ද යත්. මහණෙනි, ඒකාන්තයෙන් විසඳිය යුතු ප්‍රශ්නයක් ඇත්තේය. මහණෙනි, බෙදා විසඳිය යුතු ප්‍රශ්නයක්ද ඇත්තේය. මහණෙනි ප්‍රශ්නකොට විසඳිය යුතු ප්‍රශ්නයක් ඇත්තේය. මහණෙනි, නොවිසඳා තැබියයුතු ප්‍රශ්නයක් ඇත්තේය. මහණෙනි, මේ ප්‍රශ්න ප්‍රකාශ කිරීම් සතරය.

> 2. "ඒකාන්තයෙන් කිවයුතු එකෙක. බෙදා කිව යුතු අනිකෙක. විචාරියයුතු තුන්වැන්නය. සතරවැන්න වනාහි තැබිය යුතුය. යමෙක් ඒ ඒ තන්හි ධර්මයට අනුව ඒ ප්‍රශ්නයන් දනීද, එබඳු භික්ෂුව ප්‍රශ්න සතරෙහි දක්ෂ යයි කීහු. හෙතෙම නොගැටිය හැකි මැඩපැවැත්විය නොහැකි ගැඹුරු ගත් දේ වෙනස් නොකළහැකි අර්ථයෙහිද අනර්ථයෙහිදැයි යන දෙක්හිම දක්ෂ වෙයි. ඒ පණ්ඩිත තෙම අනර්ථය දුරු කරයි. අර්ථය ගනියි. අර්ථය අවබොධ

කළ හෙතෙම නැණවත් පණ්ඩිත පුද්ගලයායයි කියනු ලැබේ.”

**43. කොධගරුතා සූත්‍රය:-** 1. “මහණෙනි, ලොකයෙහි මේ පුද්ගලයන් සතරදෙනෙක් ඇත්තාහ. කවර සතර දෙනෙක්ද යත්. ක්‍රොධය ගරු කරන ධර්මය ගරු නොකරන නොගන්නා පුද්ගලයාය. ගුණමකු බව ගරු කරන ධර්මය ගරු නොකරන පුද්ගලයාය, ලාභය ගරු කරන සද්ධර්මය ගරු නොකරන පුද්ගලයාය. සත්කාරය ගරු කරන ධර්මය ගරු නොකරන පුද්ගලයාය යන මොහුය. මහණෙනි, මේ පුද්ගලයන් සතරදෙන ලොකයෙහි ඇත්තාහ.

2. “මහණෙනි, මේ පුද්ගලයන් සතර දෙනෙක් ලොකයෙහි විද්‍යමාන වෙත්. කවර සතර දෙනෙක්ද යත්. ධර්මය ගරු කරණ ක්‍රොධය ගරු නොකරන පුද්ගලයාය, ධර්මය ගරු කරණ ගුණමකු බව ගරු නොකරණ පුද්ගලයාය, ධර්මය ගරු කරණ ලාභය ගරු නොකරණ පුද්ගලයාය, ධර්මය ගරු කරණ සත්කාරය ගරු නොකරණ පුද්ගලයා යන සතර දෙනයි. මහණෙනි, මේ පුද්ගලයන් සතරදෙන ලොකයෙහි ඇත්තාහ.

3. “ක්‍රොධය ගුණමකු බව ගරු කරණ ලාභ සත්කාර ගරු කරණ ඒ භික්ෂූහු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ විසින් වදාරණ ලද ධර්මයෙහි නොවැඩෙත්. යම් කෙනෙක් සද්ධර්මය ගරු කොට වාසය කළාහුද, වාසය කෙරෙත්ද, ඔව්හු ඒකාන්තයෙන් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ වදාළ ධර්මයෙහි වැඩෙත්.”

**44. අසද්ධම්ම චතුක්ක සූත්‍රය:-** 1. “මහණෙනි, මේ අසද්ධර්මයෝ සතර දෙනෙකි. කවර සතරදෙනෙක්ද යත්? ක්‍රොධ ගරු කරන සද්ධර්මය ගරු නොකරණ බවය, ගුණමකු බව ගරු කරණ ධර්මය ගරු නොකරණ බවය. ලාභය ගරු කරණ ධර්මය ගරු නොකරණ බවය. සත්කාරය ගරුකරණ ධර්මය ගරු නොකරණ බවය. මහණෙනි, මේ සතර අසද්ධර්මයෝයි.

2. “මහණෙනි, සද්ධර්ම සතර දෙනෙකි. කවර සතර දෙනෙක්ද යත්, ධර්මය ගරුකරණ ක්‍රොධය ගරු නොකරණ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

බවය. ධර්මය ගරු කරණ ගුණමකු බව ගරු නොකරණ බවය. ධර්මය ගරු කරණ ලාභය ගරු නොකරණ බවය. ධර්මය ගරු කරණ සත්කාරය ගරු නොකරන බවය. මහණෙනි මෙසතර සද්ධර්මයෝයි.

3. "ක්‍රොධය ගුණමකු බව ගරු කරන ලාභ සත්කාරයන් ගරු කරන භික්ෂුව යහපත් කෙතෙක්හි කුණුවූ බීජයක් මෙන් සද්ධර්මයෙහි නොවැඩෙයි. යම් කෙනෙක් සද්ධර්ම ගරුකොට වාසය කළාහුද වාසය කරත්ද ඔව්හු ඒකාන්තයෙන් ඖෂධය තෛලයෙන් මිශ්‍රවූවාක් මෙන් ධර්මයෙහි වැඩෙත්."

**45. පළමුවෙනි රොහිතස්ස සූත්‍රයඃ-** 1. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි අනේපිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. ඉක්බිති රොහිතස්ස නම් දිව්‍ය පුත්‍රතෙම කාලය ඉක්ම ගිය රාත්‍රියෙහි බබලන ශරීර වර්ණයෙන් යුක්තව ජේතවනය ආලොක කොට භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක් හිඳ එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේය.

2. එකත්පසෙක සිටි රොහිතස්ස දිව්‍ය පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "යම් තැනෙක්හි නූපදියිද නොදිරයිද නොමැරේද චුත නොවේද නූපදීද, ස්වාමීනි ගමණින් ලොකයෙහි කෙළවර දැනගන්ට හෝ දකින්ට හෝ පැමිණෙන්ට හෝ හැක්කේදැයි" ඇසීය.

3. "ඇවැත්නි, යම්තැනක නොඋපදීද නොදිරාද නොමැරේද චුත නොවේද නූපදීද ලොකයෙහි කෙළවරට පා ගමනින් ගොස් දතයුතු යයි දැක්ක යුතුයයි පැමිණිය යුතු යයි නොකියමි."

4. "ස්වාමීනි, ආශ්චර්යයි. ස්වාමීනි, පුදුමයි. (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.) යන යමක් වදාළේද භාග්‍යවතුන් වහන්සේ විසින් එය යහපත්කොට වදාරන ලදී.

5. "ස්වාමීනි, මම පෙර ඉර්ධි ඇති අහසින් යන්නාවූ වැදි පුත්‍රවූ රොහිතස්ස නම් ඍෂියෙක් වූවෙමි. ස්වාමීනි, ඒ මට

හික්මුනාවූ කළ පුරුද්ද ඇති දක්වන ලද ශිල්ප ඇති සැහැල්ලු ඊයකින් තිදුකින් තල් සෙවනැල්ලක් ඉක්මවන්නේ නම් එබඳු උතුම් දුන්නක් ඇති දුනු දරන්නේ යම්සේද එබඳු ජවයක් වූයේය. යම්සේ පූර්වදිග මුහුදින් බටහිර මුහුද යම් සේද එබඳු පා මාරුවක් වූයේය. 'මෙබඳු ජවයකින් යුත් මෙබඳු ගමන් ඇති ඒ මට මම ගමනින් ලොකයෙහි කෙළවරට යන්නෙමි'යි මෙබඳු අදහසක් ඇතිවිය. ස්වාමීනි, ඒ මම කෑම් බීම් දෙක හැර මලමූත්‍ර කිරීම් හැර නිදීම් ක්ලාන්ත සංසිඳවීම් හැර වර්ෂ සීයක් ඇත්තේ වර්ෂ සියයක් ජීවත් වන්නේ වර්ෂ සියයක් ගොස් ලොකයෙහි අන්තයට නොපැමිණම ලොකය අතරෙහිම කාලක්‍රියා කළෙමි.

**6.** "භාග්‍යවතුන් වහන්සේ විසින් (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි) වදාරන ලද්ද භාග්‍යවතුන් වහන්සේ විසින් යහපත්කොටම වදාරන ලද්දකි."

**7.** (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.) ඇවැත්නි, එහෙත් යම්තැනක නූපදීද නොදිරාද නොමැරේද චුත නොවේද? ඇවැත්නි, මම ලොකයාගේ කෙළවරට නොපැමිණ දුක් කෙළවර කිරීම නොකියමි. ඇවැත්නි, මම සංඥාවෙන් යුත් සිතින් යුත් මේ බඹයක් පමණ ශරීරයෙහි ලොකයද (දුක්ඛ සත්‍යයද) පනවමි. ලොක සමුදයද (දුකට හෙතුවද) පනවමි. ලොක නිරොධයද පනවමි. ලොක නිරොධයට පැමිණෙන මාර්ගයද පනවමි."

**8.** "කිසිකලෙක ලොකයාගේ කෙළවරට ගමණින් නොපැමිණිය හැක. ලොකයාගේ කෙළවරට නොපැමිණ දුකින් මිදීමක් නැත. එසේහෙයින් ඒකාන්තයෙන් ලොකය දත් ප්‍රඥාවත් ලොකයෙහි කෙළවරට ගිය වැස නිමවන ලද බඹසර ඇති පව් සමනය කළ ලොකයාගේ කෙළවර දැන මෙලොවද පරලොවද බලාපොරොත්තු නොවෙමි."

**46. දුතිය රොහිතස්ස සූත්‍රය:-** 1. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රාත්‍රිය ඇවෑමෙන් පසු භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. "මහණෙනි, මේ රාත්‍රියෙහි රොහිතස්ස දිව්‍ය පුත්‍ර තෙම කාලය ඉක්ම ගිය රාත්‍රියෙහි හොබනා ශරීර වර්ණ ඇතිව

මුළු ජේතවනය ආලොක කොට මා යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ මා වැඳ එකත්පසෙක සිටියේය.

2. එකත්පසෙක සිටි රොහිතස්ස දිව්‍ය පුත්‍රතෙම මට ස්වාමීනි යම් තැනෙක වනාහී නූපදීද නොදිරාද, නොමැරේද, චුත නොවේද පහළ නොවේද, ස්වාමීනි, ඒ ලොකයේ කෙළවර පා ගමනින් දැනගැනීමට හෝ දැකීමට හෝ පැමිණීමට හෝ හැක්කේදැයි' ඇසීය. මෙසේ ඇසූ කල්හි මහණෙනි මම රොහිතස්ස දිව්‍ය පුත්‍රයාට 'ඇවැත්නි, යම් තැනෙක නූපදීද නොදිරාද නොමැරේද චුත නොවේද නූපදීද ගමනින් ලොකයෙහි ඒ කෙළවර දතහැකියයි හෝ දැක්ක හැකියයි හෝ පැමිණිය හැකියයි හෝ මම නොකියමි

3. "මහණෙනි, මෙසේ කී කල්හි රොහිතස්ස දිව්‍ය පුත්‍රතෙම මට 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් 'ඇවැත්නි, යම් තැනෙක්හි වනාහී පහළ නොවේද නොදිරාද නොමැරේද චුත නොවේද නූපදීද ඒ ලොකයෙහි ඒ කෙළවර ගමනින් දතහැකියයි හෝ දැක්ක හැකියයි හෝ පැමිණිය හැකියයි හෝ නොවදාරමියි' වදාරන ලද්ද යහපත් කොට වදාරන ලද්දක්මය. ස්වාමීනි, ආශ්චර්යයයි. ස්වාමීනි, අද්භූතයකියි කීයේය.

4. "ස්වාමීනි, පෙර වූ දෙයක් නම් මම ඉර්ධි ඇති අහසින් යන වැදි පුත්‍රවූ රොහිතස්ස නම් ඍෂිවරයෙක් වීමි. ස්වාමීනි, ඒ මට මෙබඳු ජවයක් විය. හික්මුනාවූ අත්දැකීම් ඇති ශිල්ප දක්වා පළපුරුදු දුනු දරණ දුනු ආචාර්යයෙක් යම්සේ සීඝ්‍ර ඊතලයෙන් නිදුකින් තල් ගසක සෙවනක් සරසට ඉක්ම වන්නේද ඒ යම්සේ පෙරදිග මුහුදින් බටහිර මුහුද යම්සේ ඉක්මවන්නේද මෙබඳු ගමන් වේගයක් වූයේය. ස්වාමීනි, මෙබඳු ජවයකින් යුත් මෙබඳු ගමන් වේගයකින් යුත් ඒ මට මම පා ගමනින් ලොකයෙහි කෙළවරට පැමිණෙන්නෙමි යන මෙබඳු අදහසක් පහළ විය. ස්වාමීනි, ඒ මම අනුභව කිරීම් පානය කිරීම් කෑම් රස විඳීම් හර මළමුත්‍ර කිරීම් හැර නිදීම් ක්ලාන්ත සංසිඳුවීම් හැර වර්ෂ සියයක් ඉතිරිවූ ආයුෂ ඇත්තේ වර්ෂ සියයක් ජීවත් වන්නේ වර්ෂ සියයක් ගොස් ලොකයාගේ කෙළවරට නොපැමිණම අතරෙහි කළුරිය කෙළෙමි.

**5.** "ඇවැත්නි, යම් තැනක පහළ නොවේද, නොදිරාද, නොමැරේද, චුත නොවේද, නූපදීද, ගමනින් ලොකයාගේ ඒ කෙළවර දතහැකියයිද, දැක්කහැකියයිද, පැමිණිය හැකියයිද, නොකියමි' භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ වචනය මනාකොට වදාරන ලද්දක්මය. ස්වාමීනි, එය ආශ්චර්යයි අද්භූතයි" කීයේය.

**6.** "මහණෙනි, මෙසේ කී කල්හි මම රොහිතස්ස දිව්‍ය පුත්‍රයාට 'ඇවැත්නි, යම් තැනෙක්හි පහළනොවේද නොදිරාද නොමැරේද චුත නොවේද නූපදීද ගමණින් ලොකයාගේ ඒ කෙළවර දත හැකියයිද දැක්ක හැකියයිද පැමිණිය හැකියයිද නොකියමියි කීවෙමි. ඇවැත්නි, මම ලොකයෙහි කෙළවරට නොපැමිණ දුක්ඛයාගේ කෙළවර කිරීම නොකියමි. ඇවැත්නි මම නැවතද සංඥාව සහිතවූ සිත සහිතවූ බඹයක් පමණවූ මේ ශරීරයෙහි ලොකය හෙවත් දුක්ඛ සත්‍යයද පනවමි. සමුදය හෙවත් දුකට හෙතුව පනවමි. දුක්ඛනිරොධය හෙවත් නිවන පනවමි. දුක්ඛ නිරොධයට යන ප්‍රතිපදාව පනවමි.

> **7.** "ගමනින් ලොකයෙහි කෙළවරට කිසිකලෙක නොපැමිණිය හැක. ලොකයාගේ කෙළවරට නොපැමිණ දුකින් මිදීමක්ද නැත්තේය. එසේහෙයින් ඒකාන්තයෙන් ලොකයෙහි කෙළවරට ගිය වැස නිමවන ලද බඹසර ඇති ලොකය දත් ඤාණවන්ත පව් සමනය කළ පුද්ගලයා ලොකයෙහි කෙළවර දැක මෙලොවද පරලොවද බලාපොරොත්තු නොවෙයි."

**47. සුවිදූරවිදූර සූත්‍රයඃ-** 1. "මහණෙනි, ඉතා දුරවූ මේ සතර දෙනෙක් වෙත්. කවර සතරදෙනෙක්ද යත්. මහණෙනි, අහසද පොළොවද යන මෙය පළමුවෙනි ඉතා දුරවූ කරුණය. සමුද්‍රයේ මෙතෙරද එතරද යන මෙය දෙවෙනි ඉතා දුරවූ කරුණය. මහණෙනි, යම් තැනකින් සූර්යයා පහළ වේද යම් තැනක අස්තංගම වේද මේ තුන් වෙනි ඉතා දුරවූ කරුණයි. මහණෙනි, සත්පුරුෂ ධර්මයද අසත්පුරුෂ ධර්මයද යන මෙය සතරවන ඉතා දුරවූ කරුණයි. මහණෙනි, මේ සතර දුරවූවෝ වෙති."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "අහසද දුරෙහිය, පොළොවද දුරෙහිය. සමුද්‍රයෙන් එතෙරද දුරය. යම් තැනකින් ආලොකය ගෙන දෙන සූර්යයා උදා වේද, යම් තැනක අස්ත වේද, එමෙන් සත්පුරුෂ ධර්මයද අසත්පුරුෂ ධර්මයද ඒකාන්තයෙන් ඊටත් වඩා අතිශයින් දුර යයි කියත්. සත්පුරුෂයන්ගේ සමාගමය වෙනස් නොවන ස්වභාව ඇත්තේය. යම්තාක් කල් පවතී නම් ඒතාක් එසේම වේ. අසත් පුරුෂයන්ගේ සමාගමය වහා වෙනස් වේ. එසේහෙයින් අසත්පුරුෂ සමාගමයෙන් සත්පුරුෂයන්ගේ ධර්මය ඈත්ව සිටියේය."

48. **විශාඛ පඤ්චාල පුත්ත සූත්‍රය**:- 1. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනයෙහි අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි පඤ්චාලීපුත්‍ර ආයුෂ්මත් විසාඛ ස්ථවිර තෙමේ උපස්ථාන ශාලාවෙහි භික්ෂූන් පැහැදිලි නිර්දොෂ වූ අර්ථ හඟවන විවර්තපර්යාපන්නවූ විවර්තනිශ්‍රිතවූ සම්පූර්ණ කථාවෙන් නිදර්ශන සහිතව කියයි, සමාදන් කරවයි, තෙදගන්වයි, සතුටු කරවයි.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් වේලාවෙහි පලසමවතින් නැගිට සිටිසේක් උපස්ථාන ශාලාව යම්තැනෙක් හිද එතැනට වැඩිසේක. පැමිණ, පණවන ලද අසුනෙහි වැඩහුන් සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳ භික්ෂූන්ට ඇමතූසේක. මහණෙනි, කවරෙක් උපස්ථාන ශාලාවෙහි භික්ෂූන් පැහැදිලි නිර්දෝෂවූ අර්ථ හඟවන විවර්ත පර්යාපන්නවූ විවර්ත නිශ්‍රිතවූ සම්පූර්ණ කථාවෙන් නිදර්ශන සහිතව කියයිද, සමාදන් කරවයිද, තෙදගන්වයිද, සතුටු කරවයිදැයි විචාළසේක.

3. "ස්වාමීනි, ආයුෂ්මත් පඤ්චාලීපුත්‍ර විසාඛ තෙමේ උපස්ථාන ශාලාවෙහි භික්ෂූන් පැහැදිලි නිර්දෝෂ අර්ථ හඟවන විවර්තපර්යාපන්න විවර්තනිශ්‍රිත සම්පූර්ණ කථාවෙන් භික්ෂූන් නිදර්ශන සහිතව කියයි, සමාදන් කරවයි, තෙදගන්වයි, සතුටු කරවයි.

4. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පඤ්චාලීපුත්‍රවූ ආයුෂ්මත් විසාඛතෙරුන්ට 'විසාඛ, යහපත! යහපත! විසාඛ, ඔබ පැහැදිලි

නිර්දොෂ අර්ථ හඟවන විවර්ත පර්යාපන්න විවර්තනිශ්‍රිත සම්පූර්ණ කථාවෙන් භික්ෂූන්ට නිදර්ශන සහිතව කීයෙහිය, සමාදන් කරවූයෙහිය, තෙදගැන්වූයෙහිය, සතුටු කරවූහ, යහපතැයි වදාළසේක.

5. "කථානොකරන්නාවූ පණ්ඩිතයාගේ බාලයන් හා ඇති වෙනස නොදනිත්. අමෘතපදය දෙශනා කරණ කල්හිම බාලයාගේත් පණ්ඩිතයාගේත් වෙනස දැන ගනිත්. ධර්මය කියන්නේය බබුළුවන්නේය. ඍෂීන්ගේ ධජය ඔසවන්නේය. ඍෂීහු සුභාෂිතය. ධජය කොට ඇත්තාහ. ධර්මය ඍෂීන්ගේ ධජයයි."

**49. චතුවිපල්ලාස සූත්‍රයඃ-** 1. "මහණෙනි මේ විපරීත සංඥාවෝ, විපරීත චිත්තයෝ, විපරීත දෘෂ්ටීහු සතරදෙනෙක් වෙත්. කවර සතර දෙනෙක්ද යත්.

2. "මහණෙනි, අනිත්‍යයෙහි නිත්‍යය යන මෙය විපරීත සංඥාවකි. විපරීත චිත්තයකි. විපරීත දෘෂ්ටියකි. මහණෙනි, දුකෙහි සැපය යන මෙය විපරීත සංඥාවකි. විපරීත සිතකි, විපරීත දෘෂ්ටියකි. මහණෙනි, අනාත්මයෙහි ආත්මය යන මෙය විපරීත චිත්තයකි, විපරීත දෘෂ්ටියකි. මහණෙනි, අසුභයෙහි ශුභය යන මෙය විපරීත සංඥාවකි, විපරීත චිත්තයකි, විපරීත දෘෂ්ටියකි.

3. "මහණෙනි, මේ සතර විපරීත සංඥාවෝය, විපරීත චිත්තයෝය, විපරීත දෘෂ්ටීහුය. මහණෙනි, මේ සතර විපරීත සංඥාවෝ නොවෙති, විපරීත චිත්තයෝ නොවෙති, විපරීත දෘෂ්ටීහු නොවෙති කවර සතර දෙනෙක්ද?

4. 'මහණෙනි, අනිත්‍යයෙහි අනිත්‍යය යන මෙය විපරීත සංඥාවක් නොවේ. විපරීත චිත්තයක් නොවේ, විපරීත දෘෂ්ටියක් නොවේ. මහණෙනි, දුකෙහි දුකය යන මෙය විපරීත සංඥාවක් නොවේ. විපරීත චිත්තයක් නොවේ. විපරීත දෘෂ්ටියක් නොවේ. මහණෙනි, අනාත්මයෙහි අනාත්මය යන මෙය විපරීත සංඥාවක් නොවේ. විපරීත චිත්තයක් නොවේ. විපරීත දෘෂ්ටියක් නොවේ. මහණෙනි, අශුභයෙහි අශුභය යන මෙය විපරීත සංඥාවක් නොවේ. විපරීත චිත්තයක් නොවේ. විපරීත දෘෂ්ටියක් නොවේ.

මහණෙනි, මේ සතර සංඥා විපර්යාසයෝ නොවෙති, චිත්ත විපර්යාසයෝ නොවෙති, දිට්ඨි විපර්යාසයෝ නොවෙති.

5. "අනිත්‍යයෙහි නිත්‍යය යන සංඥා ඇත්තාවූද දුකෙහි සැපය යන සංඥා ඇත්තාවූද අනාත්මයෙහි ආත්මය යන සංඥා ඇත්තාවූද, අශුභයෙහි ශුභය යන සංඥා ඇත්තාවූද වික්ෂිප්තවූ සිත් ඇති විපරීත සංඥා ඇති මිථ්‍යාදෘෂ්ටි ගත් මාරයාගේ බැම්මෙහි බැඳුනාවූ යොගයන් ක්ෂය නොකළ ජනයන් වන ඒ සත්වයෝ ඉපදීමට මරණයට පැමිණෙමින් සසර ගමන් කරත්. යම් කලෙක්හි ආලෝකය ඇතිකරන්නාවූ බුදුවරයෝ ලොකයෙහි උපදිත්ද, ඔව්හු දුක සංසිඳීමට යන මේ ධර්මය ප්‍රකාශ කරත්. නුවණැත්තෝ ඔවුන්ගේ ධර්මය අසා ස්වකීය චිත්තය ලැබ අනිත්‍යය අනිත්‍ය වශයෙන් දක්නාහුය. දුක දුක වශයෙන් දැක්කාහුය. අනාත්මය අනාත්ම වශයෙන් අශුභය අශුභ වශයෙන් දැක්කාහුය. සම්‍යක් දෘෂ්ටි ඇතිවීමෙන් සියලු දුක ඉක්මවූවාහුය."

**50. චන්දිම සූරියොපක්කිලෙස සූත්‍රයඃ-** 1. "මහණෙනි, යම්බඳු උපකේලශයන්ගෙන් වැසුණු චන්ද්‍ර සූර්යයෝ නොතවත්ද එලිය නොදෙත්ද නොබබලත්ද චන්ද්‍ර සූර්යයන්ට මේ උපක්ලෙශ සතරක් වෙත්. කවර සතරක්ද යත්.

2. යම් උපක්ලෙශයකින් වැසුණු චන්ද්‍ර සූර්යයෝ නොතවත්ද, එලිය නොදෙත්ද, නොබබලත්ද, මහණෙනි, වලාකුල් චන්ද්‍ර සූර්යයන්ට උපක්ලෙශයකි. යම් උපක්ලෙශයකින් වැසුණු චන්ද්‍ර සූර්යයෝ නොතවත්ද, එලිය නොදෙත්ද, නොබබලත්ද මහණෙනි, හිම චන්ද්‍ර සූර්යන්ට උපක්ලෙශයකි. යම් උපක්ලෙශයකින් වැසුණු චන්ද්‍ර සූර්යයෝ නොතවත්ද එලිය නොදෙත්ද නොබබලත්ද, මහණෙනි, දුම් හා රජස් චන්ද්‍ර සූර්යන්ට උපක්ලෙශයකි. යම් උපක්ලෙශයකින් වැසුණු චන්ද්‍ර සූර්යයෝ නොතවත්ද එලිය නොදෙත්ද නොබබලත්ද මහණෙනි, රාහු චන්ද්‍ර සූර්යයන්ට උපක්ලෙශයකි යම් උපක්ලෙශයකින් වැසුණු චන්ද්‍ර සූර්යයන් නොතවත්ද එලිය නොදෙත්ද

නොබබලත්ද මහණෙනි, මේ චන්ද්‍ර සූර්යයන්ට සතර උපක්ලෙශයෝය.

3. "මහණෙනි, එසේම යම්බඳු කෙලෙසුන්ගෙන් කිලිටිවූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ගුණ තැවීමෙන් නොතැවෙත්ද ගුණ ආලොකයෙන් එළිය නොදෙත්ද ගුණයෙන් නොබැබලෙත්ද ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ මේ උපක්ලෙශ සතරක් වෙත්. කවර සතරක්ද යත්? මහණෙනි, සුරා බොන මෙරය බොන රහමෙර පානයෙන් නොවැලැක්කාවූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ. මහණෙනි, යම් උපක්ලෙශයකින් කිලිටුවූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් ගුණ තැවීමෙන් නොතැවෙත්ද ගුණ ලොකයෙන් එළිය නොදෙත්ද ගුණයෙන් නොබැබලෙත්ද මේ පළමුවෙනි උපක්ලෙශයයි.

4. "මහණෙනි, ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙවුන්දම් සෙවනය කරත්. මෛථුන ධර්මයෙන් වෙන් නුවූවාහු වෙත්. යම් උපක්ලෙශයකින් කිලිටිවූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් ගුණ තැවීමෙන් නොතැවෙත්ද, ගුණ ලොකයෙන් එළිය නොදෙත්ද, ගුණයෙන් නොබැබලෙත්ද, මේ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ දෙවෙනි උපක්ලෙශයයි.

5. "මහණෙනි, ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් රන්, රිදී, මසු, කහවණු ඉවසත්. රන්, රිදී, මසු, කහවණු පිළිගැනීමෙන් නොවැලැක්කාහු වෙත්. මහණෙනි, යම් උපක්ලෙශයකින් යුක්තවූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ගුණ තැවීමෙන් නොතැවෙත්ද, ගුණ ලොකයෙන් එළිය නොදෙත්ද, ගුණයෙන් නොබැබලෙත්ද, මේ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ තුන්වෙනි උපක්ලෙශයයි.

6. "මහණෙනි, වැරදි ජීවිකාවෙන් ජීවත්වන, වැරදි ජීවිකාවෙන් වෙන් නොවූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. යම් උපක්ලෙශයකින් යුක්තවූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ගුණ තැවීමෙන් නොතැවෙත්ද ගුණ ලොකයෙන් එළිය නොදෙත්ද, ගුණයෙන් නොබැබලෙත්ද, ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ මේ සතරවෙනි උපක්ලෙශයයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

7. "මහණෙනි, යම් උපක්ලෙශයකින් යුක්තවූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ගුණ තැවීමෙන් නොතැවෙත්ද, ගුණ ආලොකයෙන් එලිය නොදෙත්ද, ගුණයෙන් නොබැබලෙත්ද, මේ සතර ශ්‍රමණ බ්‍රාහ්මණයින්ගේ උපක්ලෙශයයි.

8. "රාග ද්වෙෂයන්ගෙන් කිලිටිවූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ අවිද්‍යාවෙන් වැසුනාහුය. පිය රූපයන්හි සතුටු වන ඒ පුරුෂයෝ රහ මෙරය පානය කරත්. මෛථුන සෙවනය කරත්. බාලයෝ රන් රිදී ඉවසත්. ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වැරදි ජීවිකාවෙන් ජීවත් වෙත්. ආදිච්චබන්ධුවූ බුදුරජාණන් වහන්සේ විසින් මේ උපක්ලෙශයෝ වදාරණ ලද්දාහ. යමකින් කෙලෙසුණු සමහර ශ්‍රමණ බ්‍රාහ්මණයෝ අස්ථිරවූ කෙලෙස් සහිත ජලයෙන් නොදිලිසෙත්, නොබැබලෙත්. තණ්හා යොතින් ගෙන යන අන්ධකාරයෙන් වැළඳගත් තෘෂ්ණා දාසයෝ සොහොන් පුරවත්. දරුණු පුනර්භවය ගනිත්."

**(පස්වෙනි රොහිතස්ස වර්ගය නිමි.)**

---

## දෙවෙනි පණ්ණාසකය.

# 6. පුඤ්ඤාභිසන්ද වර්ගය.

1. **පඨම පුඤ්ඤාභිසන්ද සූත්‍රය**:- "මහණෙනි, සැප ගෙණ දෙන්නාවූ අග්‍රරූපාදිය දෙන්නාවූ, සැපවිපාකවූ ස්වර්ගය පිණිස පවත්නාවූ පුණ්‍යොත්පත්තීහු, කුශලොත්පත්තීහු සතර දෙනෙක් ඉෂ්ට බව පිණිස කාන්ත බව පිණිස මන වඩන බව පිණිස හිත පිණිස සැප පිණිස පවතිත්. කවර සතරදෙනෙක්ද යත්?

2. "මහණෙනි, යමෙකුගේ සිවුරක් පරිභොග කරණ භික්ෂුව අර්හත්ඵල සමාධියට පැමිණ වාසය කරයිද ඔහුගේ සැප ගෙන දෙන්නාවූ අග්‍ර රූපාදිය දෙන්නාවූ සැප විපාකවූ ස්වර්ගයෙහි උපදින්නාවූ අප්‍රමාණවූ පුණ්‍යොත්පත්තිය කුශලොත්පත්තිය

ඉෂ්ට බව පිණිස කාන්ත බව පිණිස මන වඩන බව පිණිස හිත පිණිස සැප පිණිස පවතී.

3. "මහණෙනි, යමෙකුගේ පිණ්ඩපාතයක් පරිභොග කරණ භික්ෂුව අර්හත්ඵල සමාධියට පැමිණ වාසය කරයිද, ඔහුගේ සැප ගෙන දෙන්නාවූ අග්‍ර රූපාදිය දෙන්නාවූ සැප විපාකවූ සර්වගයෙහි උපදින්නාවූ අප්‍රමාණ පුන්‍යොත්පත්තිය කුශලොත්පත්තිය ඉෂ්ට බව පිණිස, කාන්ත බව පිණිස, මන වඩන බව පිණිස, හිත පිණිස, සැප පිණිස පවතී.

4. "මහණෙනි, යමෙකුගේ සෙනසුනක් පරිභොග කරණ භික්ෂුව අර්හත්ඵල සමාපත්තියට පැමිණ වාසය කරයිද, ඔහුගේ සැප ගෙන දෙන්නාවූ අග්‍ර රූපාදිය දෙන්නාවූ සැප විපාක දෙන්නාවූ ස්වර්ගයෙහි උපදින්නාවූ අප්‍රමාණවූ පුණ්‍යොත්පත්තිය කුශලොත්පත්තිය ඉෂ්ට බව පිණිස කාන්ත බව පිණිස මන වඩන බව පිණිස හිත පිණිස සැප පිණිස පවතී.

5. "මහණෙනි, යමෙකුගේ ගිලනුන්ට ප්‍රත්‍යවූ බෙහෙත් පිරිකර පරිභොග කරණ භික්ෂුව අර්හත්ඵල සමාපත්තියට පැමිණ වාසය කරයිද, ඔහුගේ සැප ගෙන දෙන්නාවූ අග්‍ර රූපාදිය දෙන්නාවූ සැප විපාක වූ ස්වර්ගයෙහි උපදින්නාවූ අප්‍රමාණවූ පුණ්‍යොත්පත්තිය කුශලොත්පත්තිය ඉෂ්ට බව පිණිස කාන්ත බව පිණිස මන වඩන බව පිණිස හිත පිණිස සැප පිණිස පවතී. මහණෙනි, මේ සතර සැප ගෙන දෙන්නාවූ අග්‍ර රූපාදිය දෙන්නාවූ සැප විපාකවූ ස්වර්ගයෙහි උපදින්නාවූ පුණ්‍යොත්පත්තීහු කුශලොත්පත්තීහු ඉෂ්ට බව පිණිස කාන්ත බව පිණිස මන වඩන බව පිණිස හිත පිණිස සැප පිණිස පවතී.

6. "මහණෙනි, මේ සතර පුණ්‍යොත්පත්තීන්ගෙන් කුශලොත්පත්තීන්ගෙන් යුක්ත ආර්ය ශ්‍රාවකයාගේ සැප ගෙන දෙන්නාවූ, අග්‍ර රූපාදිය දෙන්නාවූ, සැප විපාකවූ ස්වර්ගයෙහි උපදින්නාවූ මෙපමණ පුන්‍යොත්පත්තියක් කුශලොත්පත්තියක් ඉෂ්ට බව පිණිස මන වඩන බව පිණිස හිත පිණිස සැප පිණිස පවතීයයි පිනෙහි ප්‍රමාණය ගණින් කරන්නට නොහැකිය. වැලිදු

අසංඛෙය්‍යවූ අප්‍රමෙය්‍යවූ මහා පුණ්‍යස්කන්ධයක්ය යන සංඛ්‍යාවට යයි.

7. "මහණෙනි, යම්සේ මහාසමුද්‍රයෙහි ජලයෙහි ප්‍රමාණය ජල ලාස් මෙපමණ ගණනකැයි කියා හෝ ජල ලාස් මෙපමණ සිය ගණනකැයි කියා හෝ ජල ලාස් මෙපමණ දහස් ගණනකැයි කියා හෝ ජල ලාස් මෙපමණ ලක්ෂයකැයි කියා හෝ ජලයෙහි ප්‍රමාණය ගන්නට නොහැකිවේද, වැලිදු සංඛ්‍යාවක් නැති ප්‍රමාණයක් නැති මහා උදක ස්කන්ධයකැයි යන සංඛ්‍යාවට යේද මහණෙනි, එසේම මේ සතර පුණ්‍යොත්පත්තීන් ගෙන් කුශලොත්පත්තීන්ගෙන් යුක්ත ආර්ය ශ්‍රාවකයාගේ සැප ගෙන දෙන්නාවූ අග්‍ර රූපාදිය දෙන්නාවූ සැප විපාකවූ ස්වර්ගයෙහි උපදින්නාවූ මෙපමණ පුණ්‍යොත්පත්තියක් කුශලොත්පත්තියක් ඉෂ්ට බව පිණිස මන වඩන බව පිණිස හිත පිණිස සැප පිණිස පවතීයයි පිනෙහි ප්‍රමාණයක් ගණන් කරන්නට නොහැකිය. යලිත් අසංඛෙය්‍යවූ අප්‍රමෙය්‍යවූ මහා පුණ්‍යස්කන්ධයක්ය යන සංඛ්‍යාවට යයි.

8. "මහත් ජල ස්කන්ධයක් දරණ සීමාවක් නොපෙනෙන මහත් විලක්වූ බොහෝ බිය සහිතවූ රත්න සමූහයට ස්ථානවූ මනුෂ්‍ය සමූහයා විසින් සෙවුනා ලද බොහෝ ගංගාවෝ යම්සේ මුහුදට පැමිණෙත්ද, එසේම ආහාර පාන වස්ත්‍ර දෙන්නාවූ සයනාසන හිඳිනාසන ඇතිරිලි දෙන පණ්ඩිත මනුෂ්‍යයා කරා ජලය ගෙන යන නදීහු සාගරයට යම්සේද එසේ පුණ්‍ය ධාරාවෝ පැමිණෙත්."

2. "**දුතිය පුඤ්ඤාභිසන්ද සූත්‍රය**:- 1. "මහණෙනි, සැප ගෙන දෙන්නාවූ අග්‍ර රූපාදිය දෙන්නාවූ සැප විපාකවූ ස්වර්ගයෙහි උපදින්නාවූ මේ සතර පුණ්‍යොත්පත්තීහු කුශලොත්පත්තීහු ඉෂ්ට බව පිණිස කැමති බව පිණිස මන වඩන බව පිණිස හිත පිණිස සැප පිණිස පවතිත්.

2. "කවර සතරක්ද යත්. මහණෙනි, මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවක තෙම,

3. "මේ කාරණයෙනුදු ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අර්හත්ය, සම්‍යක් සම්බුද්ධය, විජ්ජාචරණ සම්පන්නය සුගතය, ලොකවිදූය, නිරුත්තර පුරුෂදම්මසාරථීය, දෙව් මිනිසුන්ට ශාස්තෲය, බුද්ධය, භාග්‍යවත්යයි,

4. "බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්ත වෙයිද, (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.) මේ පළමුවැනි පුණ්‍යොත්පත්තිය කුශලොත්පත්තිය වෙයි.

5. "මහණෙනි, නැවතද ආර්ය ශ්‍රාවක තෙම,

6. "භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට දෙශනා කරණ ලදී. සන්දෘෂ්ටිකය අකාලිකය, එව, බලවයි පෙන්වීමට සුදුසුය. තමා වෙත එළවාගත යුතු ගුණ ඇත්තේය. නුවණැත්තන් විසින් තමා කෙරෙහිම ලා දත යුත්තේයයි,

7. "ධර්මයෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයි. (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.) මේ දෙවෙනි පුණ්‍යොත්පත්තිය කුශලොත්පත්තිය වන්නේය.

8. "මහණෙනි, නැවත ආර්ය ශ්‍රාවක තෙම,

9. "භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා සුප්‍රතිපන්නය භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා උජුපටි පන්නය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ඤායපටි පන්නය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා සාමීචිපටිපන්නය, යම් මේ පුරුෂ යුග සතරක් ඇද්ද පුරුෂ පුද්ගලයන් අටදෙනෙක් වෙත්ද, භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සංඝයා ආහුණෙය්‍යය, පාහුනෙය්‍යය, දක්ඛිණෙය්‍යය, අංජලි කර්මයට සුදුසුය. ලොකයාගේ නිරුත්තර පින් කෙතයයි.

10. "සංඝයා කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ වේද. (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.) මේ තුන් වැනි පුණ්‍යොත්පත්තිය කුශලොත්පත්තිය වන්නේය.

11. "මහණෙනි, නැවත ආර්ය ශ්‍රාවකතෙම නොකැඩුණු සිදුරු නොවූ කබර නොගැසුනු කිලිටිනුවූ නිදහස්වූ නුවණැත්තන් විසින් පසස්නා ලද තෘෂ්ණාදීන් පරාමර්ෂණය නොවූ සිත එකඟ

කරගැනීමට සුදුසු ආර්ය කාන්ත ශීලයෙන් යුක්තවූයේ වේද, (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.) මේ සතරවන පුණ්‍යොත්පත්තිය කුශලොත්පත්තිය වන්නේය.

12. (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

13. "තථාගතයන් වහන්සේ කෙරෙහි යමෙකුගේ ශ්‍රද්ධාව අචල වූයේද, මනාකොට පිහිටියේද, යමෙකුගේ ශීලයද යහපත්ද ආර්යයන්ට ප්‍රියද, පසසන ලද්දේද, යමෙකුට සංඝයා කෙරෙහි ප්‍රසාදය ඇත්තේද දර්ශනය ඍජු වූයේද ඔහු නොදිලින්දෙකැයි කීහු. ඔහුගේ ජීවිතය නොසිස්ය. එසේහෙයින් ශ්‍රද්ධාවෙහිද ශීලයෙහිද පැහැදීමෙහිද ධර්මය දැනීමෙහිද, ඤාණවන්තයා බුදුන්ගේ අනුශාසනය සිහිකරමින් යෙදෙන්නේය."

**3. මධුරක (යහපති) සූත්‍රයː-** 1 එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මධුරාවටත් වෙරඤ්ජාවටත් අතර දීර්ඝ මාර්ගයට පිළිපන්නේ විය. බොහෝ ගෘහපතීහුද ගෘහිණියෝද වෙරඤ්ජාවටත් මධුරාවටත් අතර දීර්ඝ මාර්ගයට පිළිපන්නාහු වෙත්. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මාර්ගයෙන් නික්ම එක්තරා ගසක් මුල වැඩහුන් සේක. ඒ ගෘහපතීහුද ගෘහපතිනියෝද එක්තරා රුකක් මුල වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දුටුවාහුය. දැක භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක් හිද එහි පැමිණියාහුය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියාහුය. එකත්පසෙක හුන් ඒ ගෘහපතීන්ටද ගෘහපතිනියන්ටද භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

2. "ගෘහපතිවරුනි, මේ එක්ව වාසය කිරීම් සතරක් වෙත්. කවර සතරක්ද යත්. මළකඳක් මළකඳක් සමග වාසය කරයි, මළකඳක් දෙව්දුවක් සමග වාසය කරයි, දෙවියෙක් මළකඳක් සමග වාසය කරයි, දෙවියෙක් දෙව්දුවක් සමග වාසය කරයි."

3. "ගෘහපතිවරුනි, කෙසේ නම් මළකඳක් මළකඳක් සමග වාසය කරයිද?

4. "ගෘහපතිවරුනි, මේ ලෝකයෙහි ස්වාමි පුරුෂයා සතුන් මරන්නේ වේද, නුදුන් දේ ගන්නේ වේද, කාමයන්හි වරදවා

හැසිරෙන්නේ වේද, බොරු කියන්නේ වේද, රහමෙර බොන්නේ වේද, දුස්සීලද ලාමක ස්වභාව ඇත්තේ වේද, මසුරු මලින් යටකොට ගත් සිතින් ගෙහි වෙසේද? ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට ආක්‍රොශ පරිභව කරයිද?

**5.** "ඔහුගේ භාර්යාවද ප්‍රාණඝාත කරන්නියක් වේද නුදුන් දේ ගන්නියක් වේද කාමයන්හි වරදවා හැසිරෙන්නියක් වේද බොරු කියන්නියක් වේද රහමෙර බොන්නියක් වේද දුශ්ශීලද ලාමක ස්වභාව ඇත්තීද මසුරු මලින් යටකොට ගත් සිතින් ගෙයි වසාද ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට ආක්‍රොශ පරිභව කරයිද,

**6.** "ගෘහපතිවරුනි මෙසේ වනාහී මළකඳක් මළකඳක් සමඟ වාසය කරයි."

**7.** "ගෘහපතිවරුනි, කෙසේ නම් මළකඳක් දෙවඟනක් සමග වාසය කරයිද? (මෙහි මේ සූත්‍රයේ 4 ඡෙදය යෙදිය යුතුයි.)

**8.** "ඔහුගේ භාර්යාව සතුන් මැරීමෙන් වැලකුනීද නුදුන් දේ ගැනීමෙන් වැලකුනීද කාමයන්හි වරදවා හැසිරීමෙන් වැලකුනීද, බොරු කීමෙන් වැලකුනීද, රහමෙර බීමෙන් වැළකුනීද සිල්වත්ද යහපත් ස්වභාව ඇත්තීද, මසුරු මළ දුරුකළ සිතින් ගෙයි වසයිද, ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට ආක්‍රොශ පරිභව නොකරයිද,

**9.** "ගෘහපතිවරුනි, මෙසේ මළකඳක් දෙව්දුවක් සමග ආශ්‍රය කිරීමක් වන්න.

**10.** "ගෘහපතිවරුනි, කෙසේ නම් දෙවියෙක් මළකඳක් සමග වාසය කරයිද."

**11.** "ගෘහපතිවරුනි මේ ලොකයෙහි ස්වාමිපුරුෂයෙක් ප්‍රාණඝාත නොකරන්නේ වේද නුදුන් දේ ගැනීමෙන් වැළකුණේ වේද කාමයන්හි වරදවා හැසිරීමෙන් දුරුවූයේ වේද රහමෙර බීමෙන් වැලැකුණේද සිල්වත්ද යහපත් ස්වභාව ඇත්තේද පහවූ මසුරු මලින් යුත් සිතින් ගෙයි වසයිද ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට ආක්‍රොශ පරිභව නොකරයිද,

**12.** "ඔහුගේ භාර්යාව, (මෙහි මේ සූත්‍රයේ 5 ඡෙදය යෙදිය යුතුයි.) මෙසේ වනාහි දෙවියෙක් මළකඳක් සමග වාසය කරයි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

13. "ගෘහපතිවරුනි, කෙසේ නම් දෙවියෙක් දෙව්දුවක් සමග වාසය කරයිද? (මෙහි මේ සූත්‍රයේ 11 ඡේදය යෙදිය යුතුයි.) ඔහුගේ භාර්යාවද (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.) ගෘහපතිවරුනි, මෙසේ දෙවියෙක් දෙවඟනක් සමග වාසය කරයි. ගෘහපතිවරුනි, මේ එක්ව විසීම් සතර වෙත්.

14. "දෙදෙනම දුස්සීලද ලොභොබීද පරිභව කෙරේද, ඒ අඹු සැමි දෙදෙන මළකඳක් මළකඳක් හා වාසයට පැමිණියාහුය. ස්වාමියා දුස්සීලද මසුරුද පරිභව කෙරේද, භාර්යාව ශීලවන්තද යාචක ජනයාගේ වචන දන්නේද පහවූ මසුරු කම් ඇත්තේද ඒ දෙවඟන මළකඳක්වූ ස්වාමියෙකු සමග වසයි. සැමියා සිල්වත්ද යාචක ජනයාගේ වචන දන්නේ වේද පහවූ මසුරු මල ඇත්තේද භාර්යාව දුස්සීල වේද තද මසුරුද පරිභව කරයිද, ඒ මළකඳ දෙවියෙකු සමග වසයි. දෙදෙනම ශ්‍රද්ධාවන්තද යාචක ජනයාගේ වචන දනිත්ද ඉන්ද්‍රිය සංයමයෙන් යුක්ත වූවාහුද ධාර්මික ජීවිකාවෙන් යුක්ත වූවාහුද ඔවුනොවුන් ප්‍රිය වචන කියන්නාහුද ඔව්හු අඹු සැමියෝ වෙති. ඔවුන්ගේ වස්තූහු වැඩෙත්. පහසුව පිණිස පහළ වේ. සමාන සිල් ඇති දෙදෙනෙකුගේ අමිත්‍රයෝ නොසතුටු වෙත්. සම ශීල පැවතුම් ඇති දෙදෙන මෙලොව ධර්මයෙහි හැසිර කැමති දේ ලබමින් සතුටු වන්නාහු දිව්‍ය ලොකයෙහි සතුටු වෙත්."

4. **චතුසංවාස සූත්‍රයः-** (මේ සූත්‍රයම භික්ෂූන්ටත් දෙසූ පරිදිම මීලඟට යොදා තිබේ. 'ගෘහපතිවරුනි'යි කී තැන 'මහණෙනියි' කීම පමණක් වෙනසි.)"

5. **නකුලපිතු සූත්‍රයः-** 1. "එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ භග්ග රට සුංසුමාර පර්වතයෙහි භෙසකලා වනයෙහි මිගදායෙහි වාසය කරණ සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු වේලාවෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන නකුල පිතෘ ගෘහපතියාගේ ගෘහය යම් තැනකද එහි වැඩිසේක. වැඩ, පණවන ලද අසුනෙහි වැඩහුන්සේක.

2. එකල්හි නකුල පිතෘ ගෘහපති තෙමේද නකුල මාතෘ ගෘහපතිනියද භාග්‍යවතුන් වහන්සේට "ස්වාමිනි, යම් කලක බාල වයස්හිවූ නකුල මාතෘව බාල වයස්හිවූ මා ගෙන එන ලද්දීද, නකුල මාතෘ ගෘහපතිනිය සිතිනුදු ඉක්ම ඉක්මවා හැසිරීමක් නොදනිමි. කයින් කියනුම කවරේද? ස්වාමීනි, අපි මෙලොවද ඔවුනොවුන් දකින්නට කැමතිවෙමු. පරලොවද ඔවුනොවුන් දකින්ට කැමති වෙමුයි'යි කීයේය.

3. "නකුල මාතෘ ගෘහපතිනියද භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, යම් කාලයක බාල වයසෙහිවූ නකුල පිතෘ ගෘහපතියාට බාල වයසෙහි සිටි මම ගෙන එන ලද්දෙමි. නකුලපිතෘ ගෘහපතිතෙම සිතිනුදු මා ඉක්මවා හැසිරීමක් නොදනිමි කයින් කියනුම කවරේද? ස්වාමීනි, අපි මෙලෙස මෙලොවද ඔවුනොවුන් දකින්නට කැමතිවෙමු. පරලොවද ඔවුනොවුන් දකින්ට කැමතිවෙමු."

4. "ගෘහපතිවරුනි, අඹු සැමි දෙදෙන මෙලොවද ඔවුනොවුන් දක්නටද, පරලොව ඔවුනොවුන් දක්නටද, කැමැත්තේ නම් දෙදෙනම සමාන ශ්‍රද්ධා, සමාන සීල, සමාන ත්‍යාග, සමාන ප්‍රඥා ඇත්තෝ වන්නාහුය. ඔව්හු මෙලොවද ඔවුනොවුන් දකිත්. පරලොවද ඔවුනොවුන් දකිත්යයි වදාළසේක.

5. "අඹු සැමි දෙදෙන ශ්‍රද්ධාවන්තද, යාචක ජනයාගේ වචන දන්නාහුද, සංයමයද, ධාර්මික ජීවිකාවෙන් යුක්තද, ඔව්හු ඔවුනොවුන් ප්‍රිය වචන කියන්නාහු වෙත්ද, ඔවුන්ගේ වස්තුහු බොහෝ වෙත්. පහසුව පිණිස පවතී. සමාන ස්වභාව ඇති දෙදෙනාගේ අමිත්‍රයෝ දුර්මුඛ වෙත්. සමාන සීල පැතුම් ඇති දෙදෙන මෙලොව ධර්මයෙහි හැසිර කැමති දෙයින් කැමතිවෙමින් සතුටුවන්නාහු දෙව්ලොවදීත් සතුටු වෙත්."

6. **සමජීව සූත්‍රයː-** 1. "මහණෙනි, අඹුසැමි දෙදෙන මෙලොව ඔවුනොවුන් දක්නටද, පරලොව ඔවුනොවුන් දක්නටද කැමැත්තහු නම් දෙදෙනම සමාන ශ්‍රද්ධා, සමාන සීල, සමාන

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ත්‍යාග, සමාන ප්‍රඥා ඇත්තේ වන්නාහුය. ඔව්හු මෙලොවද ඔවුනොවුන් දකිත්. පරලොවද ඔවුනොවුන් දකිත්යයි වදාළසේක.

2. "අඹු සැමි දෙදෙන ශ්‍රද්ධාවන්තද යාචක ජනයාගේ වචන දන්නාහුද සංයමද ධාර්මික ජීවිකාවෙන් යුක්තවූවාහුද ඔව්හු ඔවුනොවුන් ප්‍රිය වචන කියන්නාහු වෙත්ද, ඔවුන්ගේ වස්තූහු බොහෝ වෙත්. පහසුව පිණිස පවතී. සමාන ස්වභාව ඇති දෙදෙනාගේ අමිත්‍රයෝ දුර්මුඛ වෙත්. සමාන සීල පැවතුම් ඇති දෙදෙන මෙලොව ධර්මයෙහි හැසිර කැමති දෙයින් කැමතිවන්නාහු දෙව් ලොවදීත් සතුටු වෙත්."

7. **සුප්පවාස සූත්‍රයː**- 1. "එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සජ්ජනෙල නම් කොලියයන්ගේ නියම්ගම යම් තැනෙක්හිද, ඒ කොලිය ජනපදයෙහි වාසය කරණ සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන සුප්පවාස නම් කොලිය දුවගේ වාසස්ථානය යම් තැනෙක්හිද එහි වැඩි සේක. වැඩ, පනවන ලද අස්නෙහි වැඩ හුන්සේක.

2. "ඉක්බිති සුප්පවාස නම් කොලිය දුව ප්‍රණීත කෑයුතු දෙයින් බුදිය යුතු දෙයින් සිය අතින් සන්තර්පණය කළාය. පැවරුවාය. ඉක්බිති සුප්පවාසා නම් කොලිය දුව, වැළඳූ පාත්‍රයෙන් ඉවතට ගත් අත් ඇති භාග්‍යවතුන් වහන්සේගේ එකත්පසෙක හිඳ ගත්තාය.

3. "එකත්පසෙක හුන් සුප්පවාසා නම් කොලිය දුවට භාග්‍යවතුන් වහන්සේ "සුප්පවාසාවෙනි, භොජනය දෙන ආර්ය ශ්‍රාවිකාව ප්‍රතිග්‍රාහකයන්ට සතර කරුණක් දෙයි. කවර සතරක්ද යත්. ආයුෂ දෙයි, වර්ණය දෙයි, සැප දෙයි, බලය දෙයි. ආයුෂ දී දෙවියන් අතර හෝ මනුෂ්‍යයෙන් අතර ආයුෂට කොටස් කාරයෙක් වේ. වර්ණය දී දෙවියන් අතරත් මනුෂ්‍යයන් අතරත් වර්ණයට කොටස් කාරයෙක් වේ. සැපදී දෙවියන් අතරත් මනුෂ්‍යයන් අතරත් සැපයට කොටස් කාරයෙක්වේ. බලයදී දෙවියන් අතරත් මනුෂ්‍යයන් අතරත් බලයට කොටස් කාරයෙක්

වේ. සුප්පවාසාවෙනි, භොජනය දෙන ආර්ය ශ්‍රාවකයා ප්‍රතිග්‍රාහකයන්ට මේ කරුණු සතර දේයයි” වදාළසේක.

4. “පිරිසිදුවූ ප්‍රණීතවූ රසයෙන් යුක්තවූ මනාව සකස්කළ භොජනය යම් තැනැත්තියක් දෙයිද චරණ ධර්මවලින් මහත්වයට පැමිණි ඍජුව ගියවුන් කෙරෙහි ඒ දක්ෂිණාව දුන්නේද, පිනෙන් පින සම්බන්ධවෙමින් ලොකවිදූහු විසින් මහත්ඵලකොට වර්ණනා කරණ ලදී. මෙබඳු දානය සිහි කරමින් යම්කිසි කෙනෙක් සතුටු සිතින් ලොකයෙහි හැසිරෙත්ද, මුල් සහිත මසුරුමල සංසිඳුවා නින්දා නොවූවාහු ස්වර්ගස්ථානයට පැමිණෙත්.’

8. **සුදත්ත සූත්‍රයː-** 1. “ඉක්බිති අනේපිඬු ගෘහපති තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය.

2. “එකත්පසෙක හුන් අනාථපිණ්ඩික ගෘහපතියාට භාග්‍යවතුන් වහන්සේ “ගෘහපතිය, භොජනය දෙන ආර්ය ශ්‍රාවකතෙම ප්‍රතිග්‍රාහකයන්ට කරුණු සතරක් දෙයි. කවර සතරක්ද යත්. ආයුෂ දෙයි, වර්ණය දෙයි, සැප දෙයි, බලය දෙයි, ආයුෂ දී දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ ආයුෂයට කොටස් කාරයෙක්වේ. වර්ණයදී සැපදී බලයදී දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ බලයට කොටස් කාරයෙක්වේ. ගෘහපතිය භොජනය දෙන ආර්ය ශ්‍රාවක තෙම ප්‍රතිග්‍රාහකයන්ට මේ කරුණු සතර දේයයි” වදාළසේක.

3. “යමෙක් කාය වාක් සංයමවූ අනුන් දුන් දෙයින් යැපෙන්නවුන්ට සුදුසු කාලයෙන් සකස්කොට භොජනය දෙයිද, හෙතෙම කරුණු සතරක් දෙයි. ආයුෂද, වර්ණයද සැපයද, බලයද යන සතරයි. ආයුෂ දෙන බල දෙන සැප දෙන වර්ණ දෙන මනුෂ්‍ය තෙම යම් යම් තැනක උපදීද දීර්ඝායුෂ යශස් ඇත්තේ වෙයි.”

9. **ධාන චතුක්කදාන සූත්‍රයː-** 1. “මහණෙනි, භොජනය දෙන ආර්ය ශ්‍රාවක තෙම ප්‍රතිග්‍රාහකයන්ට කරුණු සතරක් දෙයි. කවර සතරක්ද යත්, ආයුෂ දෙයි, වර්ණය දෙයි, සැපය දෙයි

බලය දෙයි. ආයුෂය දී දිව්‍යමයවූ හෝ මනුෂ්‍යමයවූ හෝ ආයුෂට කොටස් කාරයෙක්වේ. වර්ණය දී සැප දී බලය දී දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ බලයට කොටස් කාරයෙක් වෙයි. මහණෙනි, භොජනය දෙන ආර්ය ශ්‍රාවකතෙම ප්‍රතිග්‍රාහකයන්ට මේ කරුණු සතර දේයයි" වදාළසේක.

**2.** (මේ ඡෙදය මේ වර්ගයේ 8 සූත්‍රයේ 3 ඡෙදය මෙනි.)

**10. ගිහි සාමීචි පටිපදා සූත්‍රයඃ-** 1. (මේ ඡෙදය මේ වර්ගයේ 8 සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

**2.** "එකත්පසෙක හුන් අනාථ පිණ්ඩික ගෘහපතියාට භාග්‍යවතුන් වහන්සේ, "ගෘහපතිය, කරුණු සතරකින් යුක්ත ආර්ය ශ්‍රාවක තෙම යසස් ලබන්නාවූද ස්වර්ගය පිණිස පවත්නා වූද ගිහිසාමීචි ප්‍රතිපදාවට පැමිණියේ වෙයි. කවර සතරකින්ද යත්?

**3.** "ගෘහපතිය, මේ ලොකයෙහි ආර්ය ශ්‍රාවකතෙම භික්ෂු සංඝයා චීවරයෙන් උපස්ථාන කෙළේද, භික්ෂු සංඝයා පිණ්ඩපාතයෙන් උපස්ථාන කළේ වේද, භික්ෂු සංඝයා සෙනසුනෙන් උපස්ථාන කළේ වේද, භික්ෂු සංඝයා ගිලන්පස බෙහෙත් පිරිකරින් උපස්ථාන කළේ වේද, ගෘහපතිය මේ කරුණු සතරින් යුක්ත ආර්ය ශ්‍රාවක තෙම යසස් ලැබෙන ස්වර්ගය පිණිස පවත්නා ගිහිසාමීචි ප්‍රතිපදාවට පිළිපන්නේවේ.

**4.** "යහපත් මාර්ගයෙහි පිළිපන්නාවූ සීලවන්තයෝ චීවරයෙන්ද, පිණ්ඩපාතයෙන්ද, සෙනස්නෙන්ද, ගිලන්පස බෙහෙත් පිරිකරින්ද උපස්ථාන කරණ ලද්දාහුද ඒ පණ්ඩිතයෝ ගිහි සාමිචි ප්‍රතිපදාවට පිළිපන්නාහුය. යහපත් කර්මයක් කොට රෑ දාවල් සියලු කල්හි පින් වැඩේ ස්වර්ගයටද පැමිණේ."

**(හයවැනි පුඤ්ඤාභිසන්ද වර්ගය නිමි.)**

# 7. පත්ත කම්ම වර්ගය.

11. **පත්ත කම්ම සූත්‍රය:-** 1. මේ ඡේදය මේ පණ්ණාසකයේ 8 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "එකත්පසෙක හුන් අනාථ පිණ්ඩික ගෘහපතියාහට "ගෘහපතිය, ලොකයෙහි ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ දුර්ලභවූ මේ සතර ධර්ම කෙනෙක් වෙත්යයි" වදාළසේක. "කවර සතරදෙනෙක්ද යත්. මට ධර්මයෙන්ම භොගයෝ උපදිත්වා යනු ලොකයෙහි ඉෂ්ටවූ කැමති වන්නාවූ මන වඩන්නාවූ දුර්ලභවූ මේ පළමුවන කාරණයයි.

3. "ධර්මයෙන්ම භොගයන් ලැබ ඥාතීන් සමග උපාධ්‍යායයන් සමග මාගේ කීර්තිය උස්ව නගීවා යන ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ මෙය ලොකයෙහි දුර්ලභවූ මේ දෙවෙනි කාරණයයි."

4. "ධර්මයෙන්ම භොගයන් ලැබ කීර්තිය ලැබ ඥාතීන් හා උපාධ්‍යායයන් හා බොහෝ කල් ජීවත් වෙමි. දීර්ඝ කාලයක් ආයුෂ විඳිමියි යන ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ මෙය ලොකයෙහි දුර්ලභවූ මේ තුන්වෙනි කාරණයයි.

5. "ධර්මයෙන්ම භොගයන් ලැබ කීර්තිය ලැබ ඥාතීන් හා උපාධ්‍යායයන් සමග බොහෝ කල් ජීවත්වී දීර්ඝ කාලයක් ආයුෂ පාලනය කොට කායයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලොකයෙහි උපදිමි යන ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ මෙය ලොකයෙහි දුර්ලභවූ සතරවන කාරණයයි,

6. "ලොකයෙහි ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ දුර්ලභවූ මේ කරුණු සතර වෙති. ලොකයෙහි ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ දුර්ලභවූ මේ සතර ධර්මයන් ලැබීම පිණිස ධර්ම සතරක් පවතිත්. කවර සතරක්ද යත්.

7. "ශ්‍රද්ධා සම්පත්තිය, සීල සම්පත්තිය, ත්‍යාග සම්පත්තිය, ප්‍රඥා සම්පත්තිය, යන සතරයි. ගෘහපතිය ශ්‍රද්ධා සම්පත්තිය කවරීද?

"ගෘහපතිය, මේ ලොකයෙහි ආර්ය ශ්‍රාවකතෙම ශ්‍රද්ධාවත් වේද, ඒ භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධයහ, විජ්ජාචරණ සම්පන්නයහ, සුගතයහ, ලෝකවිදූයහ, අනුත්තර පුරිසදම්ම සාරථීයහ, දෙව් මිනිසුන්ගේ ශාස්තෘයහ, චතුස්සත්‍යය අවබොධකළහ, භාග්‍යවත්හයි, තථාගතයන් වහන්සේගේ බුද්ධත්වය විශ්වාස කරයිද, ගෘහපතිය මේ ශ්‍රද්ධා සම්පත්තියයි කියනු ලැබේ.

8. "ගෘහපතිය, ශීල සම්පත්තිය කවරේද?

"ගෘහපතිය, (මෙහි මේ වර්ගයේ 3 සූත්‍රයේ 11 ඡෙදය යෙදිය යුතුයි) ගෘහපතිය, මේ සීල සම්පත්තියයි කියනු ලැබේ.

**9.** "ගෘහපතිය ත්‍යාග සම්පත්තිය කවරේද? ගෘහපතිය මේ ලොකයෙහි ආර්ය ශ්‍රාවක තෙම පහවූ මසුරු මලින් යුත් සිතින් ගෙයි වෙසේද මුදවන ලද ත්‍යාග ඇත්තේද, ශුද්ධ කරණ ලද අත් ඇත්තේද දානයෙහි ඇලුනේද, ඉල්ලීමට සුදුසු වූයේද, දීම බෙදීම දෙකෙහි ඇලුනේද ගෘහපතිය මේ ත්‍යාග සම්පදායයි කියනු ලැබේ.

10. "ගෘහපතිය, ප්‍රඥා සම්පත්තිය කවරේද?

"ගෘහපතිය, අභිජ්ඣා විෂමලොභයෙන් මඩනා ලද සිතින් වාසයකරන්නේ නොකටයුතු කරයි, කටයුතු වරද්දයි. නොකටයුතුදේ කිරීමෙන් කටයුතුදේ නොකිරීමෙන් යසසින්ද සැපයෙන්ද පිරිහෙයි. ගෘහපතිය, ව්‍යාපාදයෙන් මඩනාලද සිතින් යුක්තව වාසය කරන්නේ නොකටයුතු කරයි. කටයුතු නොකරයි, නොකටයුතු කිරීමෙන් කටයුතු නොකිරීමෙන් යසසින්ද සැපෙන්ද පිරිහෙයි. ගෘහපතිය, ථීනමිද්ධයෙන් මඩනාලද සිතින් යුක්තව වාසය කරන්නේ නොකටයුතු කරයි කටයුතු නොකරයි නොකටයුතු කිරීමෙන් කටයුතු නොකිරීමෙන් යසසින්ද සැපෙන්ද පිරිහෙයි. ගෘහපතිය, උද්ධච්චකුක්කුච්චයෙන් යුක්තව වාසය කරන්නේ කටයුතු නොකරයි. නොකටයුතු කරයි. නොකටයුතු කිරීමෙන් කටයුතු නොකිරීමෙන් යසසින්ද සැපයෙන්ද පිරිහෙයි. ගෘහපතිය, විචිකිච්ඡාවෙන් මඩනාලද

සිතින් යුක්තව වාසය කරන්නේ නොකටයුතු කරයි. කටයුතු නොකරයි. නොකටයුතු කිරීමෙන් කටයුතු නොකිරීමෙන් යසසින්ද සැපෙන්ද පිරිහෙයි.

11. "ගෘහපතිය, ඒ ආර්ය ශ්‍රාවක තෙම අභිජ්ඣා විෂම ලොභය සිතේ කිලුටකැයි මෙසේ දැන සිතට උපක්ලෙශවූ අභිජ්ඣා විෂම ලොභය දුරු කරයි. ව්‍යාපාදය සිතේ කිලුටකැයි මෙසේ දැන සිතට උපක්ලෙශවූ ව්‍යාපාදය දුරලයි. ථිනමිද්ධය සිතේ උපක්ලෙශයකැයි දැන සිතට උපක්ලෙශවූ ථිනමිද්ධය දුරලයි. උද්ධච්චකුක්කුච්චය සිතේ උපක්ලෙශයකැයි දැන සිතට උපක්ලෙශවූ උද්ධච්චකුක්කුච්චය දුරලයි. විචිකිච්ඡාව සිතේ උපක්ලෙශයකැයි දැන සිතට උපක්ලෙශවූ විචිකිච්ඡාව දුරලයි. ගෘහපතිය, යම්කලක පටන් ආර්ය ශ්‍රාවකයාට අභිජ්ඣා විෂම ලොභය සිතේ උපක්ලෙශයකැයි දැන සිතට උපක්ලෙශවූ අභිජ්ඣා විෂම ලොභය ප්‍රහීණවූයේ වේද, ව්‍යාපාදය සිතේ උපක්ලෙශයකැයි දැන සිතට උපක්ලෙශවූ ව්‍යාපාදය ප්‍රහීණවූයේ වේද, ථිනමිද්ධය සිතේ උපක්ලෙශයකැයි දැන සිතට උපක්ලෙශවූ ථිනමිද්ධය ප්‍රහීණවූයේ වේද, උද්ධච්චකුක්කුච්චය සිතේ උපක්ලෙශයකැයි දැන සිතට උපක්ලෙශවූ උද්ධච්චකුක්කුච්චය ප්‍රහීණවූයේවේද, විචිකිච්ඡාව සිතේ උපක්ලෙශයකැයි දැන සිතට උපක්ලෙශවූ විචිකිච්ඡාව ප්‍රහීණවූයේ වේද, ගෘහපතිය, මේ ආර්ය ශ්‍රාවක තෙම මහත් ප්‍රඥා ඇත්තේද පැතුරුණු ඒ ඒ ප්‍රඥාව ඇත්තේද, පැමිණි දේ දන්නේද ප්‍රඥාවෙන් සමන්විත වූයේද ගෘහපතිය මේ ප්‍රඥා සම්පදායයි කියනු ලැබේ.

12. "ගෘහපතිය, ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ලොකයෙහි දුර්ලභවූ මේ සතර ධර්මයන් ලැබීම පිණිස මේ සතර ධර්මයෝ පවතිත්.

13. "ගෘහපතිය, ඒ ආර්යශ්‍රාවක තෙම උට්ඨාන වීර්යයෙන් පැමිණෙන ලද අතේබලයෙන් පුරුදුවූ දහඩිය වැගිර වීමෙන් දැහැමින් ලද ධාර්මික භොගයන්ගෙන් කර්ම සතරක් කරන්නේ වේ. කවර සතරක්ද යත්.

14. "ගෘහපතිය, මේ ලොකයෙහි ආර්ය ශ්‍රාවකතෙම බාහු බලයෙන් රැස්කරන ලද ඩහදිය වගුරුවමින් දැහැමින් ලත් ධාර්මික වස්තුවෙන් තමා සුවපත් කරයි. පිනවයි. යහපත්සේ සුවසේ පරිහරණය කරයි. මවු පියන් සුවපත් කරයි පිනවයි මනාකොට සුවසේ පරිහරණය කරයි. අඹු දරු දාස කම්කරු පුරුෂයන් සුවපත් කරයි, පිනවයි මනාකොට සුවසේ පරිහරණය කරයි. හිතවතුන් සුවපත් කරයි. පිනවයි. යහපත්සේ සුවසේ පරිහරණය කරයි. මේ කරුණු සහිතව පරිභොග කරණ, යුක්ති සහගතව පරිභොගකරණ කළයුතු දේ අනුව පරිභොග කරණ පළමුවෙනි කාරණය වන්නේය,

15. "ගෘහපතිය, නැවතද ආර්ය ශ්‍රාවක තෙම බාහු බලයෙන් රැස්කරන ලද ඩහදිය වගුරවමින් දැහැමින් ලත් ධාර්මික වස්තුවෙන් ගින්නෙන් හෝ ජලයෙන් හෝ රජුන්ගෙන් හෝ සොරුන්ගෙන් හෝ අප්‍රියයන්ගෙන් හෝ දායාද ගන්නවුන්ගෙන් හෝ යම් ඒ ආපදාකෙනෙක් වෙත්ද එබඳු ආපදාවන්හිදී වස්තුව කරණකොට ගෙන ඒ ආපදාවන් වලක්වා ගනියිද, තමා සුවපත් කරයිද මේ කරුණු සහිතව පරිභොග කරණ යුක්ති සහගතව පරිභොග කරණ කළයුතු දේ අනුව පරිභොග කරණ දෙවෙනි කාරණයයි.

16. "ගෘහපතිය, නැවත අනිකක්ද කියමි. ආර්ය ශ්‍රාවකතෙම බාහු බලයෙන් රැස්කරන ලද ඩහදිය වගුරුවමින් දැහැමින් ලත් ධාර්මික වස්තුවෙන් ඤාති බලි (නෑයන්ට දීම) ආගන්තුක බලි (ආගන්තුකයන්ට දීම) පුබ්බපෙත බලි (මළගියවුන් උදෙසා දෙන දාන) රාජ බලි (රජුන්ට දීම) දෙවතා බලි (දෙවියන්ට පිදීම) යන පඤ්චවිධ බලි දෙන්නේ වේද, මේ ඔහුගේ කරුණු සහිතව යුක්ති සහිතව කළයුතු දේ අනුව කරන තුන්වැනි පරිභොගයයි.

17. "ගෘහපතිය, නැවත ආර්ය ශ්‍රාවක තෙම බාහු බලයෙන් රැස්කරනලද ඩහදිය වැගිරීමෙන් උත්ථානවීර්යයෙන් ලබන ලද ධාර්මිකවූ දැහැමින් ලද ධනයෙන් මදයෙන් හා ප්‍රමාදයෙන් වෙන්වූ ඉවසීමට හා සිල්වත් බවට බැසගත් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ හුදකලාව තමාගේ ආත්මය දමනය කරත්ද හුදකලාව තමාගේ

සිත කෙලෙසුන්ගෙන් සංසිඳවත්ද, හුදකලාව තමන්ම ක්ලෙශ පරිනිර්වාණයෙන් පිරිනිවෙත්ද එබඳු ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහි මතු මතු භූමින්හි විපාක දෙන ස්වර්ගය පිණිස පවත්නා සැප විපාක ඇති අග්‍ර සැප පිණිස පවත්නා දක්ෂිණාව (දානය) පිහිටුවයිද මේ ඔහුගේ කරුණු සහිතව යුක්ති සහිතව කළයුතු දේ අනුව පවත්වන සතරවැනි පරිභොගයයි.

18. "ගෘහපතිය. ඒ ආර්ය ශ්‍රාවකතෙමේ බාහු බලයෙන් රැස් කරන ලද ඩහදිය වැගිරීමෙන් උත්ථාන වීර්යයෙන් ලබන ලද ධාර්මිකවූ දැහැමින් ලද ධනයෙන් මේ යුතුකම් කරන්නේ වෙයි. ගෘහපතිය, යම්කිසිවෙකුගේ ධනය මේ යුතුකම් සතරින් වෙන්ව විනාශයට යත්ද, ගෘහපතිය මේ භොගයෝ අස්ථානයට පැමිණියාහුය. නුසුදුසු තැනට පැමිණියාහුය. යුතුකම් නොකොට පරිභොග කරන ලදහයි කියනු ලැබේ. ගෘහපතිය, යම් කිසිවෙකුට මේ යුතුකම් සතරින් භොගයෝ ක්ෂය වෙත්ද ගෘහපතිය මේ භොගයෝ නිසි තැනට පැමිණියාහුය. සුදුසු බවට පැමිණියාහුය. යුතුකම් කොට පරිභොග කළාහුයයි කියනු ලැබේ.

> 19. "මා විසින් වස්තුව පරිභොග කරන ලදී. පොෂ්‍ය කළ යුත්තෝ පොෂ්‍ය කරන ලදහ. ආපදා එතෙර කරන ලදහ."
>
> "උසස් භූමීන්හි උපදින දක්ෂිණා දෙන ලදහ. තවද පස්වැදෑරුම් බලි කරන ලදහ. සංයමවූ බ්‍රහ්මචාරීවූ සිල්වත්හු උපස්ථාන කරන ලදහ. ගිහිගෙයි වාසය කරන්නාවූ පණ්ඩිත තෙමේ යම් අර්ථයක් පිණිස වස්තුව කැමති වන්නේද,
>
> "ඒ අර්ථයට මා විසින් පැමිණෙන ලදී. නොතැවිය යුත්ත කරන ලදී. පඤ්ච සීල නම් ආර්ය ධර්මයෙහි පිහිටි මෙය සිහි කරන්නාවූ යම් මනුෂ්‍යයෙක් වේද ඔහුට මෙලොවද ප්‍රශංසා කරත්. පරලොව ස්වර්ගයෙහි සතුටු වෙයි."

12. **අනණසුඛ සූත්‍රයː-** 1. (මේ ඡේදය 6 වර්ගයේ 8 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. එකත්පසෙක හුන් අනාථ පිණ්ඩික ගෘහපතිහට භාග්‍යවතුන් වහන්සේ 'ගෘහපතිය, කාමභොගි ගිහියා විසින් කලින් කල අවස්ථාවෙන් අවස්ථාව ලැබිය යුතු මේ සැප සතරක් වෙත්. කවර සතරක්ද යත්, අර්ථසුඛය, (ඇති සැපය) භොග සුඛය, (පරිභොග සැපය) අණණ සුඛය, (ණය නැති සැපය) අනවජ්ජ සුඛය, (නිවරද සැපය) යන සතරයි.

3. ගෘහපතිය, අර්ථ සුඛය කවරේද? "ගෘහපතිය, මෙහි කුල පුත්‍රයෙකුට උත්ථාන වීර්යයෙන් සරිකර ගත් බාහු බලයෙන් රැස්කළ ඩහදිය වැගිරවීමෙන් දැහැමින් ලත් ධාර්මිකවූ වස්තුව ඇත්තේද, හෙතෙම උත්ථාන වීර්යයෙන් බාහුබලයෙන් ඩහදිය වගුරුවීමෙන් දැහැමින් ලත් ධාර්මික වස්තුව ඇතැයි සැපක් ලබයි සොම්නසක් ලබයි. ගෘහපතිය, මේ අර්ථ සුඛයයි

4. "ගෘහපතිය, භොග සුඛය කවරේද? ගෘහපතිය, මෙහි කුලපුත්‍රතෙම උත්ථාන වීර්යයෙන් බාහු බලයෙන් ඩහදිය වගුරුවීමෙන් ධාර්මික කර්මයන්ගෙන් දැහැමින් ලත් වස්තුව පරිභොග කරයි. පින්ද කරයි. හෙතෙම උත්ථාන වීර්යයෙන් බාහු බලයෙන් ඩහදිය වගුරුවීමෙන් ධාර්මික විධියෙන් දැහැමින් ලත් වස්තුව පරිභොග කරමි. පින්ද කරමියි සැපක් ලබයි. සොම්නසක් ලබයි. ගෘහපතිය මේ භොග සුඛයයි කියනු ලැබේ."

5. "ගෘහපතිය, අණණ සුඛය කවරේද? ගෘහපතිය මේ ලොකයෙහි කුල පුත්‍රතෙම ස්වල්පයක් හෝ බොහෝ හෝ කිසිවෙකුට කිසිවක් ණය නැත්තේද හෙතෙම ස්වල්පයක් හෝ වැඩියක් හෝ කිසිවෙකුට කිසිවක් ණය නැතැයි සැපක් ලබයි. සොම්නසක් ලබයි. ගෘහපතිය, මේ අණණ සුඛයයි."

6. "ගෘහපතිය, අනවජ්ජ සුඛය කවරේද? ගෘහපතිය, මේ ලොකයෙහි ආර්ය ශ්‍රාවකතෙම නිවැරදි කාය කර්මයෙන් යුක්තවූයේ වේද, නිවැරදි වාක් කර්මයෙන් යුක්තවූයේ වේද, නිවැරදි මනො කර්මයෙන් යුක්තවූයේ වේද, හෙතෙම නිවැරදි කාය කර්මයෙන් යුක්තවූයේ වෙයි. නිවැරදි වාක් කර්මයෙන් යුක්තවූයේ වෙයි. නිවැරදි මනො කර්මයෙන් යුක්තවූයේ වෙමියි සැපක් ලබයි. සොම්නසක් ලබයි. ගෘහපතිය මේ අනවජ්ජ

සුඛයයි කියනු ලැබේ. ගෘහපතිය, මේ සතර සැපය කාමභොගී ගිහියා විසින් කලින් කල අවස්ථාවෙන් අවස්ථාව ලැබිය යුත්තාහ."

7. "අනවජ්ජ සුඛය දැන නැවත අර්ථ සුඛය සිහි කරන්නේය. භොගය සුවසේ අනුභව කරන මනුෂ්‍ය තෙම නැවත ප්‍රඥාවෙන් මනාසේ බලයි. නුවණින් බලන්නාවූ ඥානවන්ත පුද්ගල තෙමේ පළමු සැප තුන අනවජ්ජ සුඛයාගේ සොළොස් කලාවෙන් කලාවටවත් නොඅගීයයි දැනගනියි."

13. **සබ්‍රහ්මක (කුල) සූත්‍රය**:- 1. "මහණෙනි, යම් පුත්‍ර කෙනෙකුන් විසින් මව්පියවරු සිය ගෘහයෙහි පුදන ලද්දාහු වෙත්ද, ඒ කුලයෝ බ්‍රාහ්මයා සහිත කුල වෙති. මහණෙනි, යම් පුත්‍ර කෙනෙකුන් විසින් මවුපියවරු සිය ගෘහයෙහි පුදන ලද්දාහු වෙත්ද ඒ කුලයෝ පූර්වාචාර්යයන් සහිත වෙත්. මහණෙනි, යම් පුත්‍ර කෙනෙකුන් විසින් මවුපියවරු සිය ගෘහයෙහි පුදන ලද්දාහු වෙත්ද, ඒ කුලයෝ පූර්වදෙවතාවන් සහිතය. මහණෙනි, යම් පුත්‍ර කෙනෙකුන් විසින් මවුපියවරු සිය ගෘහයෙහි පුදන ලද්දාහු වෙත්ද, ඒ කුලයෝ දුර සිට ගෙනෙන ලද දෙය දීමට සුදුසු කුල වෙති.

2. "මහණෙනි, බ්‍රහ්ම යනු මවු පියන්ට නමකි. මහණෙනි, පූර්වාචාර්ය යනු මව්පියන්ට නමකි. මහණෙනි, පූර්වදෙවතා යනු මවුපියන්ට නමකි. මහණෙනි, ආහුනෙය්‍ය යනු මවුපියන්ට නමකි. ඊට හෙතු කවරේද? මහණෙනි, මවුපියෝ පුත්‍රයන්ට බොහෝ උපකාර ඇත්තාහ. හදා වඩන්නෝය. පොෂ්‍යය කරන්නෝය. මේ ලොව පෙන්වන්නාහුය."

3. "ප්‍රජාවට අනුකම්පා කරණ මවුපියෝ පුත්‍රයන්ට බ්‍රහ්මයෝ යයිද, පූර්වාචාර්යයෝ යයිද, දුර සිට ගෙනවුත් පිදිය යුත්තෝ යයිද, කියනු ලැබෙත්. එසේ හෙයින් ඥාණවන්ත තෙමේ ඔවුන් වඳින්නේය. ආහාරයෙන්ද, නැවත පානයෙන්ද, වස්ත්‍රයෙන්ද, සෙනාසනයෙන්ද, ඇඟ ඉලීමෙන්ද, නැහැවීමෙන්ද, පා දෙවීමෙන්ද, සත්කාර

කරන්නේය. මවුපියන් කෙරෙහි කරණ මේ උපස්ථානයෙන් මෙලොවම ඔහුට ප්‍රශංසා කරත්. පරලොව ස්වර්ගයෙහි සතුට වේයයි" වදාළසේක.

14. **නිරයගාමි ධම්ම සූත්‍රයː-** 1. "මහණෙනි, කරුණු සතරකින් යුක්තවූ තැනැත්තේ ගෙන එන ලද්දක් බිම හෙළුවාක් මෙන් නරකයෙහි උපදියි.

2. "කවර සතරකින්ද යත්. සතුන් මරන්නේ වේද, නුදුන් දේ ගන්නේ වේද, කාමයන්හි වරදවා හැසිරෙන්නේ වේද, බොරු කියන්නේ වේද, මහණෙනි, මේ කරුණු සතරින් යුක්තවූයේ ගෙන එන ලද්දක් බිම හෙළුවාක් මෙන් නරකයෙහි උපදියි."

3. "සතුන් මැරීමද නුදුන් දේ ගැනීමද, බොරු කීමද, පරදාරාවන් කරා යාමද පණ්ඩිතයෝ ප්‍රශංසා නොකෙරෙත්යයි කියනු ලැබේ."

15. **රූපප්පමාණ සූත්‍රයː-** 1. "මහණෙනි, මේ පුද්ගලයෝ සතරදෙනෙක් ලොකයෙහි වෙත්. කවර සතර දෙනෙක්ද යත්, රූපය ප්‍රමාණයයි ගෙන රූපයෙහි පැහැදෙන පුද්ගලයාය. ශබ්දය ප්‍රමාණයයි ගෙන ශබ්දයෙහි පැහැදෙන පුද්ගලයාය. රූක්ෂ ප්‍රතිපත්තිය ප්‍රමාණයයි ගෙන රූක්ෂ ප්‍රතිපත්තියෙහි පැහැදෙන පුද්ගලයාය, ධර්මය ප්‍රමාණයයි ගෙන ධර්මයෙහි පැහැදෙන පුද්ගලයාය මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්.

2. "යමෙක් රූපය ප්‍රමාණ කළාහුද, යමෙක් ශබ්දයෙහි පැහැදුනාහුද? ඡන්ද රාග වශයෙන් යුක්ත ඔව්හු ඒ ජනයා නොහඳුනත්. අධ්‍යාත්මයද නොදනිත්. පිටත්හි ප්‍රතිපත්තිද නොදනී. ඒකාන්තයෙන් ඒ බාල තෙම ශබ්දයෙන් පමණක් ප්‍රමාණ කරයිද, හාත්පසින් ආවරණවූයේ වේ. අධ්‍යාත්ම ගුණය නොදනීද බාහිර ප්‍රතිපත්ති නොදනීද බාහිර සත්කාර ඵල දක්නේ හෙතෙමේද ශබ්දයෙන් මුළාවෙයි. අධ්‍යාත්ම ගුණය දනීද බාහිර ප්‍රතිපත්ති නුවණින් දකීද, විවෘතව පෙනෙන ඔහු ශබ්දයෙන් මුළාවට ගෙන නොයයි."

**16. බන්ධන වඩ්ඪන සූත්‍රය:-** 1. "මහණෙනි, ලොකයෙහි මේ පුද්ගලයන් සතර දෙනෙක් විද්‍යමාන වෙත්. කවර සතර දෙනෙක්ද යත්, රාග සහිත, ද්වෙෂ සහිත, මොහ සහිත, මාන සහිත, පුද්ගලයෝය. මහණෙනි, මේ පුද්ගලයන් සතර දෙන ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්.

"ඇලුම් කටයුතු දෙයෙහි ඇළුණු ප්‍රිය රූපයන්ට තුටුවන මොහයෙන් බැඳුණු අධම සත්වයෝ බැම්ම වඩත්."

"අඥාන සත්වයෝ රාගයෙන් හට ගන්නාවූද ද්වේෂයෙන් හට ගන්නාවූද, මොහයෙන් හට ගන්නාවූද දුක් සහිත මත්තෙහිද දුක් ගෙන දෙන අකුශල කර්ම කරත්"
"අන්ධවූ ප්‍රඥා චක්ෂුස රහිත අවිද්‍යාවෙන් වැසුණු පුරුෂයෝ රාගාදී ධර්මයන්හි සිටියාහු එබඳු සත්වයෝ යයි නොහඟිත්."

**17. අහිරාජ සූත්‍රය:-** 1. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අසල අනේපිඬු සිටානන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි සැවැත් නුවර එක්තරා භික්ෂුවක් සර්පයකු විසින් දෂ්ට කරණ ලද්දේ කළුරිය කළේවිය. ඉක්බිති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක හුන්නාහුය. එකත් පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, සැවැත් නුවර එක්තරා භික්ෂුවක් සර්පයකු විසින් දෂ්ට කරණ ලදුව කළුරිය කරණ ලද්දේ යයි" කීවාහුය.

2. "මහණෙනි, ඒකාන්තයෙන් ඒ භික්ෂුව සතර සර්පරාජ කුලයන් වෙත මෛත්‍රී සිත නොපැතිර විය. මහණෙනි, ඉදින් ඒ භික්ෂුව සතර සර්පරාජ කුලයන් වෙත මෛත්‍රී සිත පැතිර වූයේ නම්, මහණෙනි, ඒ භික්ෂුව සර්පයකු විසින් දෂ්ට කරන ලදුව කළුරිය නොකරන්නේය.

3. "සතර සර්පරාජ කුලයෝ කවරහුද? විරූපාක්ෂ නම් සර්පරාජ කුලය, එරාපථ නම් සර්පරාජ කුලය, ඡබ්‍යා පුත්ත නම් සර්පරාජ කුලය, කණ්හා ගොතම නම් සර්පරාජ කුලය, යන සතරයි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

5. "මහණෙනි, මේ සතර අහිරාජ කුලයන් තමාගේ ගොපනය පිණිස, තමාගේ ආරක්ෂාව පිණිස, තමාගේ රැකවරණ පිණිස, මෛත්‍රී සිතින් පතුරුවන්නට අනු දනිමි.

6. "මාගේ මෛත්‍රිය විරූපාක්ෂ නාග කුලයන් වෙත වේවා. මාගේ මෛත්‍රිය එරාපථ නාග කුලය වෙත වේවා. මාගේ මෛත්‍රිය ඡබ්‍යා පුත්ත නාග කුලය වෙත වේවා. මාගේ මෛත්‍රිය කණ්හා ගොතමක නාග කුලය වෙත වේවා."

"මාගේ මෛත්‍රිය පා නැත්තන් වෙත වේවා. මාගේ මෛත්‍රිය දෙපා ඇත්තන් වෙත වේවා. මාගේ මෛත්‍රිය සතර පා ඇත්තන් වෙත වේවා. මාගේ මෛත්‍රිය බොහෝ පා ඇත්තන් වෙත වේවා. පා නැත්තෙක් මා, නොපෙලාවා, දෙපා ඇත්තෙක් මා, නොපෙලාවා, සතර පා ඇත්තෙක් මා නොපෙලාවා, බොහෝ පා ඇත්තෙක් මා නොපෙලාවා,

"සියලු සත්වයෝ සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ සියල්ලෝ යහපත දකිත්වා කිසි දුකක් නොපැමිණේවා.

7. "බුදුරජ තෙම අප්‍රමාණ ගුණ ඇත්තේය. ධර්මය අප්‍රමාණ ගුණ ඇත්තේය. සංඝයා අප්‍රමාණ ගුණ ඇත්තේය. ප්‍රමාණවත් බඩගානා සර්පයෝද, ගෝනුස්සෝද, පත්තෑයෝද, මකුළුවෝද, හිකනල්ලුද, හූනෝද, මීයෝද මා විසින් ආරක්ෂා කරණ ලද්දාහ. මා විසින් ගොපනය කරන ලද්දාහුය. භූතයෝ දුරු වෙත්වා. ඒ මම භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කරමි. සත් බුදුවරයන්ට නමස්කාර කරමි."

18. අත්තවධ (දෙව දත්ත) සූත්‍රය:- 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගිජුකුළු පව්වෙහි දෙව්දත් තෙරුන්වහන්සේ මියගිය නොබෝ කල්හි වාසය කරණ සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ දෙව්දත් තෙරුන් වහන්සේ අරභයා භික්ෂූන් ආමන්ත්‍රණය කළසේක.

**2.** "මහණෙනි, දෙව්දත් හට ලාභ සත්කාර ප්‍රශංසා තමාගේ විනාශය පිණිස පහළ විය. මහණෙනි, යම්සේ කෙසෙල් ගස තම විනාශය පිණිස පුදියිද, පිරිහීමට පුදියිද, මහණෙනි එසේම දෙව්දත්හට ලාභ සත්කාර ප්‍රශංසා තම විනාශය පිණිස විය. දෙව්දත්හට ලාභ සත්කාර ප්‍රශංසා පිරිහීමට පහළ විය. මහණෙනි, යම්සේ හුණගස තම විනාශය පිණිස පුදියිද, පිරිහීමට පුදියිද, මහණෙනි, එසේම දෙව්දත්හට තම විනාශය පිණිස ලාභ සත්කාර ප්‍රශංසා පහළ විය. පිරිහීමට ලාභ සත්කාර ප්‍රශංසා පහළ විය.

**3.** "මහණෙනි, යම්සේ බට ගස තමාගේ විනාශය පිණිස පුදියිද, පිරිහීම පිණිස පුදියිද, එසේම දෙව්දත්හට තම විනාශය පිණිස ලාභ සත්කාර ප්‍රශංසා පහළ විය. පිරිහීමට ලාභ සත්කාර ප්‍රශංසා පහළ විය. මහණෙනි, යම්සේ වෙළඹ තම විනාශය පිණිස ගැබ් ගනියිද, පිරිහීම පිණිස ගැබ් ගනියිද මහණෙනි, එසේම දෙවදත්තහට තම විනාශය පිණිස ලාභ සත්කාර ප්‍රශංසා පහළ විය."

> **4.** "ඒකාන්තයෙන් යම්සේ එලය කෙසෙල් ගස නසයි.
> හුණගස එලය නිසා නැසෙයි. බට ගස එලය නිසා නැසෙයි.
> ගර්භය වෙළඹ නසයි. සත්කාරය නින්දිත පුරුෂයන් නසයි."

**19. පධාන චතුක්ක සූත්‍රයː-** 1. "මහණෙනි, මේ ප්‍රධාන වීර්ය සතර දෙනෙක් වෙත්. කවර සතර දෙනෙක්ද යත්. සංවරය පිණිස පවත්නා ප්‍රධාන වීර්ය කෙලෙස් ප්‍රහාණය පිණිස පවත්නා (ප්‍රධාන) වීර්ය කුශල ධර්මයන් වැඩීම පිණිස පවත්නා (ප්‍රධාන) වීර්ය කුශල ධර්මයන් ආරක්ෂා කිරීම පිණිස පවත්නා (ප්‍රධාන) වීර්ය යන සතරයි.

**2.** "මහණෙනි, සංවර ප්‍රධානය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම නූපන් ලාමක අකුශල ධර්මයන් නොඉපදීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්ය පටන්ගනීද, සිත පිහිටුවයිද ප්‍රධන් වීර්ය කරයිද, මහණෙනි, මේ සංවර ප්‍රධානයයි කියනු ලැබේ.

3. "මහණෙනි, ප්‍රහාණ ප්‍රධානය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම උපන් ලාමක අකුශල ධර්මයන් පහකිරීම පිණිස කැමැත්ත ඇති කරයිද, වෑයම් කරයිද, වීර්ය කරයිද, සිත යොදවයිද, ප්‍රධන් වීර්ය කරයිද මේ ප්‍රහාණ ප්‍රධානයයි කියනු ලැබේ.

4. "මහණෙනි, භාවනා ප්‍රධානය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නූපන් කුශල ධර්මයන් ඉපදීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්ය පටන්ගනීද, සිත යොදවයිද, ප්‍රධන් වීර්ය කරයිද මේ භාවනා ප්‍රධානයයි කියනු ලැබේ.

5. "මහණෙනි, අනුරක්ෂණ ප්‍රධානය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම උපන් කුශල ධර්මයන්ගේ පැවැත්ම පිණිස මුළාවීම නොවීම පිණිස වැඩිවීම පිණිස විපුලත්වයට යාම පිණිස සම්පූර්ණවීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්ය පටන් ගනීද, සිත යොදවයිද ප්‍රධන් වීර්ය කරයිද, මහණෙනි, මේ අනුරක්ෂණ ප්‍රධානයයි කියනු ලැබේ. මහණෙනි, මේ සතර ප්‍රධානයෝයි.

> 6. "යම් වීර්යයකින් මෙහි භික්ෂු තෙමේ කෙලෙස් තවන වීර්ය ඇත්තේ වේද, දුක්ඛයන්ගේ ක්ෂය බවට පැමිණෙයිද ඒ වීර්යයෝ සංවරයද, ප්‍රහාණයද, භාවනාවද, අනුරක්ෂණය දැයි ප්‍රධාන සතර සූර්ය වංශයෙහිවූ බුදුරජාණන් වහන්සේ විසින් වදාරණ ලදහ."

**20. අධම්මික රාජ සූත්‍රය**:- 1. "මහණෙනි, යම් කාලයෙක්හි රජවරු අධාර්මික වෙත්ද, ඒ කාලයෙහි රාජකාර්යයන්හි නියුක්ත පුරුෂයෝද අධාර්මික වෙත්. මහණෙනි, ඒ රාජකාර්යයන්හි නියුක්ත පුරුෂයන් අධාර්මිකවූ කල්හි බමුණු ගැහැවියෝද අධාර්මික වෙත්. බමුණු ගැහැවියන් අධාර්මිකවූ කල්හි නියම්ගම දනවු වාසීහුද අධාර්මික වෙත්. නියම්ගම් දනවු වැසියන් අධාර්මිකවූ කල්හි චන්ද්‍ර සූර්යයෝ විෂමව ගමන් කරත්. චන්ද්‍ර සූර්යයන් විෂමව ගමන් කරන කල්හි නැකැත් හා තරු විෂමව යත්. නැකැත් හා තරු විෂමව යන කල්හි රෑ දාවල් විෂම වෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

රෑ දාවල් විෂම වන කල්හි මාස අර්ධ මාසයෝ විෂම වෙත්. මාස අර්ධ මාස විෂමවූ කල්හි ඍතු සංවත්සර විෂම වෙත්. ඍතු සංවත්සර විෂමවූ කල්හි වාතයෝ විෂමව හමත්. මාර්ගයෝ නොහමත්. විෂම මාර්ගයන්හි විෂම වාතයන් හමන කල්හි දෙවියෝ කිපෙත්. දෙවියන් කුපිතවූ කල්හි වළාකුළු මනාව ධාරා නොහෙළත්. වළාකුළු මනාව ධාරා නොහෙලන කල විෂමව පැසෙන ශස්‍යයෝ වෙත්. මහණෙනි, විෂමව පැසෙන ශස්‍ය අනුභව කරණ මනුෂ්‍යයෝ අල්පායුෂ්ක වූවාහු, දුර්වර්ණ වූවාහු, දුර්වල වූවාහු බොහෝ ලෙඩ ඇත්තාහු වෙත්.

**2.** "මහණෙනි, යම් කාලයක රජවරු ධාර්මික වෙත්ද ඒ කාලයෙහි රාජකාර්යයන්හි නියුක්තයෝද ධාර්මික වෙත්. රාජකාර්යයන්හි නියුක්තයන් ධාර්මික කල්හි බමුණු ගැහැවීයන්ද ධාර්මික වෙත්. බමුණු ගැහැවියන් ධාර්මික කල්හි නියම්ගම් දනවු වැස්සෝ ඒ කාලයෙහි ධාර්මික වෙත්. නියම්ගම් දනවු වැසියන් ධාර්මික කල්හි චන්ද්‍ර සූර්යයෝ සමව ගමන් කරත්. චන්ද්‍ර සූර්යයන් සමව ගමන් කරන කල නැකැත් තාරකා සමව ගමන් කෙරෙත්. නැකැත් තාරකා සමව ගමන් කරන කල රෑ දාවල් සමව සිටිත්. රෑ දාවල් සමව සිටි කල්හි මාස අර්ධ මාසයෝ සමව යෙත්. මාස අර්ධ මාස සමවූ කල්හි ඍතු සංවත්සර සමවෙත්. ඍතු සංවත්සර සමවූ කල්හි සමව නියම මාර්ගයෙහි වාතය හමයි. සමව නියම මාර්ගයෙහි වාතය හමන කල දෙවියෝ ප්‍රීති වෙත්. දෙවියෝ නොකිපි කල්හි වළාකුළු මනාකොට ධාරා හෙලයි. වළාකුළු මනාකොට ධාරා හෙලන කල ශස්‍යයෝ සමව පැසෙත්. මහණෙනි, සමානව පැසුණු ශාස්‍ය අනුභව කරණ මනුෂ්‍යයෝ දීර්ඝායුෂ ඇත්තාහුද, වර්ණවත්ද, ශක්තිමත් වූවාහුද, නිරොග වූවාහුද වෙත්.

> "ගවයන් එතරවන කල්හි ප්‍රධාන ගවයා ඇදටයයිද ප්‍රධානියා ඇදට යයිද නෙතෘවරයා ඇදවූ කල්හි සියල්ලෝ ඇදට යත්.
>
> "එසේම මනුෂ්‍යයන් අතරෙහි යමෙක් ශ්‍රෙෂ්ඨයයි සම්මතද හෙතෙම ඉදින් අධර්මයෙහි හැසිරෙයිද සෙසු ජනයා ගැන කියනුම කවරේද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ඉදින් රජ අධාර්මික වුවහොත් මුළු රට අධාර්මික වේ.

"ගවයන් එතරවන කල්හි ප්‍රධාන ගවයා ඍජුව යයිද, ප්‍රධානියා ඍජුවූ කල්හි ඒ සියල්ලෝ ඍජු වෙත්.

"එසේම මනුෂ්‍යයන් අතරෙහි යමෙක් ශ්‍රෙෂ්ඨයයි සම්මතද හෙතෙම ධර්මයෙහි හැසිරෙයිද අනික් ජනයා ගැන කියනුම කවරේද, ඉදින් රජතෙම ධාර්මිකද සියලු රටම සැපසේ හොබී."

(හත්වෙනි පත්ත කර්ම වර්ගය නිමි.)

---

## 8. අපණ්ණක වර්ගය.

**21. පඨම අපණ්ණක ධම්ම සූත්‍රය**:- 1. "මහණෙනි, කරුණු සතරකින් යුක්තවූ මහණ තෙම නිවණට විරුද්ධ නොවූ ප්‍රතිපදාවට පිළිපන්නේ වේ. ආශ්‍රවයන්ගේ ක්ෂයවීමට හෙතු පටන්ගන්නා ලද්දේවේ. කවර සතරකින්ද යත්.

2. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සිල්වත් වේද, බහුශ්‍රැතද, පටන්ගන්නා ලද වීර්ය ඇත්තේ වේද, ප්‍රඥාවන්තද,

3. "මහණෙනි, මේ සතර කරුණින් යුක්තවූ භික්ෂුව අවිරුද්ධ ප්‍රතිපදාවට පිළිපන්නේ වේ. ආශ්‍රවයන්ගේ ක්ෂයවීම පිණිස කාරණා පටන්ගන්නා ලද්දේ වේ.

**22. දුතිය අපණ්ණක ධම්ම සූත්‍රය**:- 1. "මහණෙනි, කරුණු සතරකින් යුක්තවූ මහණතෙම නිවණට අවිරුද්ධ නොවූ ප්‍රතිපදාවට පිළිපන්නේ වේ. ආශ්‍රවයන්ගේ ක්ෂයවීම පිණිස කාරණා පටන්ගන්නා ලද්දේ වේ. කවර සතරකින්ද යත්?

2. "නෛෂ්ක්‍රම්‍ය විතර්කයෙන් අව්‍යාපාද විතර්කයෙන්, අවිහිංසා විතර්කයෙන්, සම්‍යක් දෘෂ්ටියෙන් යුක්ත වූයේ වේ.

3. "මේ සතර ධර්මයන්ගෙන් යුක්තවූ මහණතෙම අවිරුද්ධ ප්‍රතිපදාවට පිළිපන්නේ වේ. ආශ්‍රවයන්ගේ ක්ෂයවීම පිණිස කාරණා පටන්ගන්නා ලද්දේවේ."

**23. අසප්පුරිස ධම්ම සූත්‍රයː-** 1. "මහණෙනි, කරුණු සතරකින් යුක්තවූයේ අසත් පුරුෂයයි දතයුතුයි. කවර කරුණු සතරකින්ද යත්.

**2.** "මහණෙනි, මේ ලොකයෙහි අසත්පුරුෂ තෙම අනුන්ගේ යම් අගුණයක් වේද, එය නොඅසන ලද්දේද පහළ කරයි. ඇසූ දෙය ගැන කියනුම කවරේද? විචාරණ ලද්ද ප්‍රශ්නයට නගන ලද්දේ අඩුනොකොට එයද වුවමනායයි සම්පූර්ණයෙන් විස්තරකොට අනුන්ගේ නුගුණ කියන ලද්දේ වේද, මහණෙනි, මේ පින්වත් තෙමේ අසත්පුරුෂයයි දත යුතුයි.

**3.** "මහණෙනි, නැවතද අසත් පුරුෂ තෙම අනුන්ගේ යම් ගුණයක් වේද, එය අසාද පහළ නොකරයි. නොඅසන ලද්ද ගැන කියනුම කවරේද? විචාරණ ලද්ද ප්‍රශ්නයට නගන ලද්දේ අඩු නොකොට එයද වුවමනායයි සම්පූර්ණයෙන් විස්තර කොට අනුන්ගේ නුගුණ කියන ලද්දේ වේද, මහණෙනි, මේ පින්වත් තෙමේ අසත්පුරුෂයයි දතයුතුයි.

**4.** "මහණෙනි, නැවතද අනිකක් කියමි. අසත් පුරුෂ තෙම තමාගේ යම් අගුණයක් ඇද්ද එය ඇසූ නමුත් පහළ නොකරයි. නොවිචාරණ ලද්ද ගැන කියනුම කවරේද? විචාරණ ලද්ද වනාහි ප්‍රශ්නයට නගන ලද්දේ අඩු නොකොට එයද වුවමනායයි සම්පූර්ණ කොට විස්තර නොකොට තමාගේ දොෂය කියන ලද්දේ වේද, මහණෙනි, මේ පින්වත් තෙමේ අසත් පුරුෂයෙකැයි දතයුතුයි.

**5.** "මහණෙනි, නැවතද අනිකක් කියමි. අසත්පුරුෂ තෙම තමන්ගේ ගුණය යමක් වේද එය නොවිචාරණ ලද්දේද, පහළ කරයි. ඇසූ දේ ගැන කියනුම කවරේද? විචාරණ ලද්දේ වනාහි ප්‍රශ්නයට නගන ලද්දේ අඩුනොකොට එයද වුවමනායයි සම්පූර්ණකොට විස්තර වශයෙන් තමාගේ ගුණය කියන්නේ වේද, මහණෙනි, මේ පින්වත් තෙමේ අසත්පුරුෂයෙකැයි දත යුතුයි. මහණෙනි, මේ සතර කාරණයෙන් යුක්තවූයේ අසත්පුරුෂයයි දතයුතුයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**6.** "මහණෙනි, කරුණු සතරකින් යුක්තවූයේ සත් පුරුෂයෙකැයි දතයුතු. කවර සතරකින්ද යත්. මහණෙනි, මේ ලොකයෙහි සත්පුරුෂ තෙම අනුන්ගේ යම් නුගුණයක් ඇද්ද එය ඇසූයේ නමුත් ප්‍රකාශ නොකරයිද, නොවිචාරණ ලද්ද කියනුම කවරේද? විචාරණ ලද්දේ වනාහි ප්‍රශ්නයට නගන ලද්දේ අඩුකොට එයද වුවමනායයි සම්පූර්ණ නොකොට විස්තර නැතිව අනුන්ගේ නුගුණ කියන ලද්දේ වේද මහණෙනි, මේ පින්වත් තෙමේ සත්පුරුෂයයි දතයුතුයි.

**7.** "මහණෙනි, නැවත අනිකක් කියනු ලැබේ. සත්පුරුෂ තෙම අනුන්ගේ යම් ගුණයක් ඇද්ද එය නොවිචාරණ ලද්දේ පහළ කරයි. විචාරණ ලද්දේ කියනුම කවරේද? විචාරණ ලද්දේ වනාහි ප්‍රශ්නයට නගන ලද්දේ අඩු නොකොට ඉතුරු නොකොට සම්පූර්ණ නොකොට විස්තර වශයෙන් අනුන්ගේ ගුණය කියයි මහණෙනි, මේ පින්වත් තෙමේ සත්පුරුෂයයි කියනු ලබේ.

**8.** "මහණෙනි, නැවතද අනිකක් කියමි. සත්පුරුෂ තෙම යමක් තමන්ගේ නුගුණයක් වේද එය නොවිචාරණ ලද්දේද පහළ කරයි. විචාරණ ලද්දේ කියනුම කවරේද? විචාරණ ලද්දේ වනාහි ප්‍රශ්නයට නගන ලද්දේ අඩුනොකොට ඉතුරුනොකොට සම්පූර්ණයෙන් විස්තර වශයෙන් තමාගේ අගුණය කියන ලද්දේ වේද, මේ පින්වත් තෙමේ සත්පුරුෂ යයි දතයුතුයි.

**9.** "මහණෙනි, නැවතද අනිකක් කියමි. යමක් තමන්ගේ ගුණයක් වේද එය අසන ලද්දේද, පහළ නොකරයි. නොවිචාරණ දේ ගැන කියනුම කවරේද? අසන ලද්දේ වනාහි ප්‍රශ්න කරණ ලද්දේ අඩුකොට ඉතුරු කොට අසම්පූර්ණයෙන් විස්තර නැතිව තමාගේ ගුණය කියන ලද්දේ වේ. මහණෙනි, මේ පින්වත් තෙමේ සත්පුරුෂ යයි දතයුතුයි. මහණෙනි, මේ සතර ධර්මයන්ගෙන් යුක්තවූ සත්පුරුෂයා දතයුතුයි."

**24. වධුකාසම චිත්ත සූත්‍රයඃ-** 1. "මහණෙනි, යම්කිසි ලේලියක් යම්කිසි රාත්‍රියක හෝ දවාලක හෝ ගෙනඑන ලද්දී වේද, එකෙනෙහි මාමා කෙරෙහිද, නැන්දා කෙරෙහිද, ස්වාමියා කෙරෙහිද, යටත් පිරිසෙයින් දාස කර්මකාර පුරුෂයන් කෙරෙහිද

ඇගේ තියුණු ලජ්ජා භයක් ඇත්තේ වේද, ඕ තොමෝ මෑත කාලයෙහි ආශ්‍රයට පැමිණ, විශ්වාසයට පැමිණ, නැන්දාටද, මාමාටද, ස්වාමියාටද, 'නුඹලා කුමක් දනිත් ද, පහවව්යයි කියයි.'

**2.** "මහණෙනි, එසේම මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් යම්කිසි රාත්‍රියක හෝ දවාලක හෝ ගිහිගෙන් නික්ම අනගාරිය ශාසනයෙහි පැවිදිවූයේ වේද, එකෙණෙහි ඔහුට භික්ෂූන් කෙරෙහි හෝ භික්ෂුණීන් කෙරෙහි හෝ උපාසකයන් කෙරෙහි හෝ උපාසිකාවන් කෙරෙහි හෝ යටත්පිරිසෙයින් ආරාමයෙහි සාමණේරයන් කෙරෙහි හෝ තද ලජ්ජාවක් භයක් එළඹ සිටියේ වේ. හෙතෙම මෑත භාගයෙහි ආශ්‍රයට පැමිණ, විශ්වාසයට පැමිණ, ආචාර්ය උපාධ්‍යායයන්ටද 'නුඹ වහන්සේලා කුමක් දනිද්ද පහවව්යයි' කියන්නේය.

"මහණෙනි, එසේහෙයින් අලුත ගෙනා ලේලි කෙනෙකුට සමාන සිතින් වාසය කරන්නෙමුයි මෙහිදී මෙසේ හික්මිය යුතුය. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයි."

**25. පඨම චතුරංග සූත්‍රයː-** "මහණෙනි, අග්‍රයෝ සතර දෙනෙක් වෙත්. කවර සතර දෙනෙක්ද යත්. අග්‍ර සීලය, අග්‍ර සමාධිය, අග්‍ර ප්‍රඥාව, අග්‍ර මිදීම යන සතර දෙනය. මහණෙනි, මේ සතර අග්‍රයෝයි."

**26. දුතිය චතුරංග සූත්‍රයː-** "මහණෙනි, මේ අග්‍රයෝ සතර දෙනෙක් වෙත්. කවර සතර දෙනෙක්ද යත්. අග්‍ර රූපය, අග්‍ර වෙදනාව, අග්‍ර සංඥාව, අග්‍ර ආත්මභාවය යන සතර දෙනයි. මහණෙනි, මේ සතර අග්‍රයෝයි."

**27. සියාකංඛා (කුසිනාරා) සූත්‍රයː-** 1. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කුසිනාරා නුවර උපවත්තන නම් මල්ල රජුන්ගේ සල් වනයෙහි සල්ගස් දෙක අතරෙහි පිරිනිවන්පාන සමයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. ඒ භික්ෂුහු 'පින්වතුන් වහන්සැයි' කියා භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, එක් භික්ෂුවකට වත් බුදුන් කෙරෙහි හෝ ධර්මය කෙරෙහි හෝ සංඝයා කෙරෙහි හෝ මාර්ගයක් ගැන හෝ ප්‍රතිපදාවක් ගැන හෝ සැකයක් හෝ විමතියක් හෝ වන්නේ නම් අසව්. ශාස්තෲන් වහන්සේ අපට හමුවූහ. භාග්‍යවතුන් වහන්සේ හමුවෙහිදී අසන්ට නොලැබුනේයයි' පසුව විපිලිසර නොවව්යයි" වදාළ සේක. මෙසේ වදාළකල්හි ඒ භික්ෂූහු තුෂ්ණිම්භූත වූවාහුය.

3. "දෙවනුවත් භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි)

4. "තුන්වෙනුවත් භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ආමන්ත්‍රණය කළසේක. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

5. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. "මහණෙනි, ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් නොවිචාරන්නාහු වෙත් නම් මහණෙනි, සහායකයෙක් සහායකයෙකුට කියාවා. (මම ඔහු හා කථා කරන්නෙමි) මෙසේ වදාළ කල්හි ඒ භික්ෂූහු තුෂ්ණිම්භූත වූවාහුය.

6. "ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට, "ස්වාමීනි, ආශ්චර්යයි. ස්වාමීනි, පුදුමයි. ස්වාමීනි මම මේ භික්ෂු සංඝයා කෙරෙහි මෙසේ පැහැදුනෙමි. මේ භික්ෂු සංඝයා අතර එක භික්ෂුවකට වත් බුදුන් කෙරෙහි හෝ ධර්මය කෙරෙහි හෝ සංඝයා කෙරෙහි හෝ මාර්ගය කෙරෙහි හෝ ප්‍රතිපදාව කෙරෙහි හෝ සැකයක් හෝ විමතියක් හෝ නැත්තේයයි' කීහ.

7. "ආනන්දය, ඔබ ප්‍රසාදය කියන්නෙහිය. ආනන්දය, තථාගතයන් වහන්සේට මෙහි ප්‍රත්‍යවෙක්ෂා ඥාණය වේ. මේ භික්ෂු සංඝයා අතර එක භික්ෂුවකටවත් බුදුන් කෙරෙහි හෝ ධර්මයෙහි හෝ සංඝයා කෙරෙහි හෝ මාර්ගයෙහි හෝ ප්‍රතිපදාවෙහි හෝ සැකයක් හෝ වෙනස් මතයක් හෝ නැත. ආනන්දය, මේ පන්සියයක් භික්ෂූන්ගෙන් යමෙක් බාල භික්ෂුවක්

වේද හෙතෙම සෝවාන්ය, නිරයට නොයන ස්වභාව ඇත්තේය. සුගති නියතය. රහත් බව පිහිටකොට ඇත්තේය.”

**28. අචින්තෙය්‍ය සූත්‍රයː-** 1. “මහණෙනි, යම් දෙයක් සිතන්නේ උන්මාදයට දුකට පත්වන්නේද, නොසිතිය හැකි නොසිතිය යුතු මේ සතරක් වෙත්. කවර සතරක්ද යත්,

2. “යමක් සිතන්නේ උන්මාදයට දුකට පත්වන්නේද, මහණෙනි, බුදුවරුන්ගේ බුද්ධවිෂය නොසිතිය හැකිය. නොසිතිය යුතුය. මහණෙනි, යමක් සිතන්නේ උන්මාදයට දුකට පත්වන්නේද, ධ්‍යාන ඇත්තහුගේ ධ්‍යාන විෂය නොසිතිය හැකිය නොසිතිය යුතුය. මහණෙනි, යමක් සිතන්නේ උන්මාදයට දුකට පත්වේද කර්ම විපාකය නොසිතිය හැකිය. නොසිතිය යුතුය. මහණෙනි, යමක් සිතන්නේ උන්මාදයට දුකට පත්වේද ලොකය ගැන සිතීම නොසිතිය හැකිය නොසිතිය යුතුය.

3. “මහණෙනි, මේ සතර නොසිතිය යුතුය. යමක් සිතන්නේ උන්මාදයට දුකට පත්වේද නොසිතිය යුතු නොසිතිය හැකි මේ කරුණු සතරය.”

**29. දක්ඛිණා විභංග සූත්‍රයː-** 1. “මහණෙනි, දක්ෂිණාව (දානය) පිරිසිදු වන කරුණු සතරක් වෙත්. කවර සතරක්ද යත්?

2. “මහණෙනි, දායකයා නිසා පිරිසිදුවන, ලබන්නා නිසා පිරිසිදු නොවන දානයක් ඇත. මහණෙනි, දන් ලබන්නා නිසා පිරිසිදුවන, දායකයා නිසා පිරිසිදු නොවන දානයක් ඇත. මහණෙනි, දායකයා නිසාද දානය ලබන්නා නිසාද පිරිසිදු නොවන දානයක් ඇත. දායකයා නිසාද දානය ලබන්නා නිසාද පිරිසිදුවන දානයක් ඇත.

3. “මහණෙනි, දායකයා නිසා පිරිසිදු වන දානය ලබන්නා නිසා පිරිසිදු නොවන දානය කවරේද? මහණෙනි, මේ ලොකයෙහි දායකතෙම සිල්වත් වේද යහපත් ස්වභාව ඇත්තේ වේද, ප්‍රතිග්‍රාහකයන් (දානය ලබන්නන්) දුශ්ශීලද ලාමක හැසිරීම් ඇත්තේද, මහණෙනි, මෙසේ වනාහි දක්ෂිණාව (දානය) දායකයා නිසා පිරිසිදු වේ. ප්‍රතිග්‍රාහකයා නිසා පිරිසිදු නොවේ.

4. "මහණෙනි, කෙසේ නම් දානය දානය ලබන්නාගෙන් පිරිසිදු වේද, දායකයාගෙන් පිරිසිදු නොවේද? මහණෙනි, මෙහි දායකයෙක් දුශ්ශීලද ලාමක ස්වභාව ඇත්තේද දානය ලබන්නන් සීලවන්තද යහපත් ස්වභාව ඇත්තේද, මහණෙනි මෙසේ දක්ෂිණාව දායකයාගෙන් නොව දානය ලබන්නාගෙන් ශුද්ධවේ.

5. "මහණෙනි, කෙසේ නම් දක්ෂිණාව (දානය) දායකයාගෙනුත් දානය ලබන්නාගෙනුත් ශුද්ධ නොවේද, මහණෙනි, මෙහි දායකයෙක් දුශ්ශීලද ලාමක ස්වභාව ඇත්තේද දානය ලබන්නන්ද දුශ්ශීලද ලාමක ස්වභාව ඇත්තාහුද, මහණෙනි, දක්ෂිණාව මෙසේ දායකයාගෙනුත් දානය ලබන්නාගෙනුත් ශුද්ධ නොවේ.

6. "මහණෙනි, කෙසේ නම් දක්ෂිණාව (දානය) දානය ලබන්නන්ගෙන්ද දායකයාගෙන්ද ශුද්ධවේද? මහණෙනි, මෙහි දායකයෙක් සිල්වත්ද යහපත් ස්වභාව ඇත්තේද, දානය ලබන්නන්ද යහපත් ස්වභාව ඇත්තේද, මහණෙනි, මෙසේ වනාහි දක්ෂිණාව (දානය) දායකයා කෙරෙන්ද දානය ලබන්නා කෙරෙන්ද ශුද්ධවේ. මහණෙනි, මේ දක්ෂිණා (දාන) විසුද්ධි සතරය."

**30. පයුත්ත වණිජ්ජා සූත්‍රයඃ-** 1. "ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරුන් භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණි සේක. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේය. එකත්පසෙක සිටි ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, යම් කරුණකින් මෙහි ඇතැම් කෙනෙකු යම්බඳු වෙළඳාමක් යෙදුවාහු සිඳෙන ස්වභාව වේද ඊට හේතු කවරේද ප්‍රත්‍යය කවරේද? යම් හෙයකින් මෙහි ඇතැම් කෙනෙක් යම්බඳු වෙළඳාමක් යෙදුවාහු අදහස් කළ පරිදි නොවේද. ඊට හේතු කවරේද ප්‍රත්‍යය කවරේද? යම් කරුණකින් මෙහි ඇතැම් කෙනෙක් යම්බඳු වෙළඳාමක් යෙදුවාහු අදහස් කළ පරිදි වේද, ඊට හෙතු කවරේද, ප්‍රත්‍යය කවරේද? යම් කරුණකින් මෙහි ඇතැම් කෙනෙක් යම්බඳු වෙළඳාමක් යෙදුවාහු අදහස් කළ ක්‍රමයටත් වැඩිවේද?

**2.** "ශාරීපුත්‍රය, මේ ලොකයෙහි ඇතැමෙක් ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ කරා පැමිණ "ස්වාමීනි, ප්‍රත්‍යයෙන් යමක් කියන්නැයි ආරාධනා කරයි.

**3.** "හෙතෙම යමකින් පැවරුයේ නම් එය නොදෙයි. ඉදින් හෙතෙම ඉන් චුතවූයේ මේ ආත්මයට පැමිණියේ නම් හෙතෙම යම් යම් වෙළඳාමක් යෙදුයේද එය ඔහුට සිඳෙන ස්වභාව වේ.

**4.** (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි) හෙතෙම යමකින් පැවරුයේද එය අදහස් කළ පරිදි නොදේ. හෙතෙම ඉදින් ඉන් චුතවූයේ මේ මනුෂ්‍ය ආත්මයට පැමිණියේද හෙතෙම යම් වෙළඳාමක් එය ඔහු අදහස් කළ පරිදි නොවේ.

**5.** (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි) එය අදහස් කළ පරිදි දෙයි. හෙතෙම ඉදින් ඉන් චුතවූයේ මේ ආත්මයට පැමිණේද හෙතෙම යම් වෙළඳාමක් යොදයිද එය ඔහු අදහස් කළ පරිදි සිදුවේ.

**6.** (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි) හෙතෙම යමකින් පවරණ ලද්දේද එය අදහස් කළාටත් වැඩියෙන් දෙයි. හෙතෙම ඉදින් ඉන් චුතව මේ ආත්මයට පැමිණියේද හෙතෙම යම් යම් වෙළඳාමක් යොදයිද එය ඔහු අදහස් කළාටත් වඩා සැපයේ.

**7.** "ශාරීපුත්‍රය, යම් කරුණකින් මේ ලොකයෙහි ඇතැම් කෙනෙකුට යම්බඳු වෙළඳාමක් යෙදුවාහුද සිඳෙන ස්වභාව වේද, ශාරීපුත්‍රය, මේ ඊට හෙතුය, මේ ඊට ප්‍රත්‍යය. ශාරීපුත්‍රය, යම් කරුණකින් මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් යම්බඳු වෙළඳාමක් යෙදුවාහුද අදහස් කළ පරිදි නොවේද, ශාරීපුත්‍රය, මේ ඊට හෙතුය ප්‍රත්‍යයය. ශාරීපුත්‍රය, යම් කරුණකින් මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් යම්බඳු වෙළඳාමක් යෙදුවාහුද අදහස් කළ පරිදි වේද මේ ඊට හෙතුය, ප්‍රත්‍යය. ශාරීපුත්‍රය, යම් කරුණකින් මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් යම්බඳු වෙළඳාමක් යෙදුවාහුද එය අදහස් කළාටත් වැඩියෙන් වේද මේ ඊට හෙතුය ඊට ප්‍රත්‍යයයයි" වදාළසේක.

**31. කම්බොජ ගමන සූත්‍රය:-** 1. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර ඝොෂිතාරාමයෙහි වාසය කරණ සේක. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

2. "එකත්පසෙක සිටි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට 'ස්වාමීනි, ස්ත්‍රියක් යම් හෙයකින් සභාවෙහි නොසිටීද, කර්මාන්ත නොයොදවයිද, පිටරට නොයයිද ස්වාමීනි, ඊට හෙතු කවරේද ඊට ප්‍රත්‍යය කවරේදැයි" ඇසුයේය.

3. "ආනන්දය, ස්ත්‍රිය ක්‍රොධ කරණ ස්වභාවය, ආනන්දය මාගම ඊර්ෂ්‍යා කරණ ස්වභාවය, ආනන්දය, ස්ත්‍රිය මසුරුය, ආනන්දය, ස්ත්‍රිය මෝඩය, ආනන්දය ස්ත්‍රිය යම් කරුණකින් සභාවෙහි නොහිඳීද කර්මාන්ත නොයොදවයිද පිටරට නොයයිද ඊට හෙතු මේය, ඊට ප්‍රත්‍යය මෙසේය."

**(අටවෙනි අපණ්ණක වර්ගය නිමි)**

## 9. මචල වර්ගය.

**32. පඨම චතුධම්ම සමන්නාගත සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු සතරකින් යුක්ත වූයේ ගෙන එන ලද්දක් බහාතබන ලද්දේ, යම්සේද එසේ නිරයෙහි පිහිටියේ වේ. කවර සතරකින්ද යත්?

2. "සතුන් මරන්නේ වේද නුදුන්දේ ගන්නේ වේද කාමයන්හි වරදවා හැසිරෙන්නේ වේද, බොරු කියන්නේ වේද,

3. "මහණෙනි, මේ සතර ධර්මයන්ගෙන් යුක්තවූයේ ගෙන එන ලද්දක් බහාතැබුයේ යම්සේද එසේ නරකයෙහි වේ."

4. "මහණෙනි, ධර්ම සතරකින් යුක්තවූයේ ගෙන එන ලද්දක් බහාතබන ලද්දේ යම්සේද එසේ ස්වර්ගයෙහි වේ. කවර සතරකින්ද යත්?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**5.** "සතුන් මැරීමෙන් වෙන්වූයේ වේද, නුදුන් දෙය ගැනීමෙන් වෙන්වූයේ වේද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූයේ වේද, බොරු කීමෙන් වෙන්වූයේ වේද,

**6.** "මහණෙනි, මේ සතර ධර්මයන්ගෙන් යුක්තවූයේ ගෙන එන ලද්දක් බහාතබන ලද්දේ යම්සේද එසේ ස්වර්ගයෙහිවේ.

**33. දුතිය චතුධම්ම සමන්නාගත සූත්‍රයඃ-** (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.) 2. බොරු කියන්නේ වේද, පිසුණු කියන්නේ වේද, ඵරුස වචන කියන්නේ වේද, ප්‍රලාප කියන්නේ වේද (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

3. (මෙහි 32 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.) බොරු කීමෙන් වෙන්වූයේ වේද, පිසුණු වචන කීමෙන් වෙන්වූයේ වේද, ඵරුෂ වචන කීමෙන් වෙන්වූයේ වේද, ප්‍රලාප දෙඩීමෙන් වෙන්වූයේ වේද, (මෙහි 32 සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.)

**34. අවණ්ණභණන සූත්‍රයඃ-** (මෙහි 32 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි) 2. නොදැන පරීක්ෂා නොකොට නුගුණ කිව යුත්තාගේ ගුණ කියයි. නොදැන පරීක්ෂා නොකොට ගුණ කිව යුත්තාගේ අගුණ කියයි. නොදැන පරීක්ෂා නොකොට අප්‍රසාදය පහළ කළයුතු තැන ප්‍රසාදය පහළ කරයි. නොදැන පරීක්ෂා නොකොට ප්‍රසාදය පහළ කළයුතු නැන අප්‍රසාදය පහළ කරයි. (මෙහි 32 සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

3. (මෙහි 32 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.) දැන පරීක්ෂාකොට නුගුණ කිවයුත්තාගේ නුගුණ කියයි. දැන පරීක්ෂාකොට ගුණ කිව යුත්තාගේ ගුණ කියයි. දැන පරීක්ෂාකොට නොපැහැදිය යුතු තැන නොපහදයි. දැන පරීක්ෂාකොට පැහැදිය යුතු තැන පහදියි. (මෙහි 32 සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.)

**35. කොධගරුක සූත්‍රයඃ-** (මෙහි 32 සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.) ක්‍රොධය ගරුකොට ඇත්තේ වේ. සද්ධර්මය ගරුකොට නැත්තේ වේ, මකු ගතිය ගරුකොට ඇත්තේ වේ. සද්ධර්මය

ගරුකොට නැත්තේ වේ. ලාභය ගරුකොට ඇත්තේ වේද, සද්ධර්මය ගරුකොට නැත්තේ වේ. (මෙහි 32 සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

**3.** (මෙහි 32 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.) සද්ධර්මය ගරුකොට ඇත්තේ වේ. ක්‍රොධය ගරුකොට නැත්තේ වේ. සද්ධර්මය ගරු වේ. මකුගුණය ගරු නොවේ. සද්ධර්මය ගරුකරන්නේ වේ. ලාභය ගරු නොකරන්නේ වේ. සද්ධර්මය ගරුකරන්නේ වේ. සත්කාරය ගරු නොකරන්නේ වේ. (මෙහි 32 සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.)

**36. තමොතම පරායන සූත්‍රයː-** 1. "මහණෙනි, මේ පුද්ගලයෝ සතරදෙනෙක් ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්. කවර සතර දෙනෙක්ද යත්.

**2.** "අඳුරින් අඳුරට යන පුද්ගලයාය, අඳුරින් එළියට යන පුද්ගලයාය, එළියෙන් අඳුරට යන පුද්ගලයාය, එළියෙන් එළියට යන පුද්ගලයාය යන සතර දෙනයි. මහණෙනි, පුද්ගලතෙම කෙසේ අන්ධකාරයෙන් අන්ධකාරයට යන්නේ වේද?

**3.** "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සැඩොල් කුලයෙහි හෝ කුළුපොතු කුලයෙහි හෝ වැදි කුලයෙහි හෝ සොම්මර කුලයෙහි හෝ පුස්සඩු කුලයෙහි හෝ, උපන්නේ වේද, යම් තැනක දුකින් කෑම ඇඳීම ලැබේද දිළිඳුවූ අල්පවූ ආහාරපාන භොජන ඇති දුකින් ජීවිකා වෘත්තිය කරණ යථොක්ත නීච කුලයක උපන්නේ වේද, හෙතෙමේද දුර්වර්ණද, අවලක්ෂණද, මිටිද, රෝගිද, කණද, අත් කොරද, පා කොරද, කුදුද, ආහාරපාන වස්ත්‍ර යාන මල්ගඳ විලවුන්, අසුන් වාසස්ථාන, පහන් නොලැබෙන්නේ වේද?"

**4.** "හෙතෙම කයින් දුශ්චරිතයෙහි හැසිරෙයි. වචනයෙන් දුශ්චරිතයෙහි හැසිරෙයි. සිතින් දුශ්චරිත සිතයි. කයින් දුශ්චරිතයෙහි හැසිර, වචනයෙන් දුශ්චරිතයෙහි හැසිර, සිතින් දුශ්චරිතයෙහි හැසිර, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු අය සංඛ්‍යාත සැපයෙන් පහවූ දුර්ගතිවූ විවසව පතිතවන නරකයෙහි උපදී.

5. "මහණෙනි, පුද්ගල තෙම මෙසේ වනාහි අඳුරෙහි වේ. අඳුර පිහිට කොට ඇත්තේ වේ.

"මහණෙනි, පුද්ගල තෙම කෙසේ නම් අඳුරෙහි වේද, ආලොකයට යන්නේ වේද?

6. (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

7. "හෙතෙම කයින් සුචරිතයෙහි හැසිරේද, වචනයෙන් සුචරිතයෙහි හැසිරේද, සිතින් සුචරිතයෙහි හැසිරේද, හෙතෙම කයින් සුචරිතයෙහි හැසිර, වචනයෙන් සුචරිතයෙහි හැසිර, සිතින් සුචරිතයෙහි හැසිර, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතිවූ ස්වර්ග ලොකයෙහි උපදී"

8. "මහණෙනි, මෙසේ වනාහි පුද්ගල තෙම අඳුරෙහි වේ ආලොකයට යන්නේ වේ."

"මහණෙනි, කෙසේ නම් පුද්ගලතෙම ආලොකයෙහි වේද? අඳුරට යන්නේ වේද?"

9. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ආඪ්‍යවූ මහත් ධන ඇති. මහත් භොග ඇති, බොහෝ රන් රුවන් බොහෝ වස්තු උපකරණ බොහෝ ධන ධාන්‍ය ඇති, ක්ෂත්‍රිය කුලයෙහි හෝ බ්‍රාහ්මණ කුලයෙහි හෝ ගෘහපති කුලයෙහි හෝ උසස් කුලයක උපන්නේ වේ. හෙතෙමේද ලක්ෂණද, දර්ශනීයද, ප්‍රසාද එලවන්නේද, උතුම් පැහැයෙන් යුක්තද, ආහාරපාන වස්ත්‍ර යාන මල්ගඳ විලවුන් අසුන් ගෙවල් පහන් ලබන්නේ වේද?"

10. (මේ ඡේදය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි.)

11. "මහණෙනි, මෙසේ වනාහි පුද්ගල තෙම එලියෙහි වේ. අඳුරට යන්නේ වේ."

"මහණෙනි, පුද්ගල තෙම කෙසේ එලියෙහි වේද, ආලොකයට යන්නේ වේද?"

12. (මේ ඡේදය මේ සූත්‍රයේ 9 ඡේදය මෙනි.)

13. "හෙතෙම කයින් සුචරිතයෙහි හැසිරෙයි. වචනයෙන් සුචරිතයෙහි හැසිරෙයි. සිතින් සුචරිතයෙහි හැසිරෙයි කයින්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

සුචරිතයෙහි හැසිර වචනයෙන් සුචරිතයෙහි හැසිර සිතින් සුචරිතයෙහි හැසිර කායයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතිවූ ස්වර්ග ලොකයෙහි උපදී.”

**14.** “මහණෙනි, මෙසේ වනාහි පුද්ගල තෙම ආලොකයෙහි වේ. ආලොකයට යන්නේ වේ. මහණෙනි, මේ පුද්ගලයන් සතර දෙන ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්.

**37. ඔනතොනත සූත්‍රයː-** 1. (මේ වර්ගයේ ඉතුරු සූත්‍රවල 1 ඡෙදය මේ වර්ගයේ 36 සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

**2.** “පහත් වූ පහත සිටින පුද්ගලයාය, පහත සිටින උසස් වූ පුද්ගලයාය, උසස් වූ පහත සිටින පුද්ගලයාය, උසස් වූ ඉහල සිටින පුද්ගලයාය යන සතර දෙනයි.

“මහණෙනි, පහත් වූ පහත සිටින පුද්ගලයා කවරේද?”

**3.** (මේ ඡෙදය මේ වර්ගයේ 36 සූත්‍රයේ 3 ඡෙදය මෙනි.)

**4.** (මේ ඡෙදය මේ වර්ගයේ 36 සූත්‍රයේ 4 ඡෙදය මෙනි.)

**5.** “මහණෙනි, මෙසේ පුද්ගල තෙම පහත්වූයේ පහතම සිටින්නේ වේ.”

“මහණෙනි, පහත සිටින උසස්ම පුද්ගලයා කවරේද?”

**6.** (මේ ඡෙදය මේ වර්ගයේ 36 සූත්‍රයේ 3 ඡෙදය මෙනි.)

**7.** (මේ ඡෙදය මේ වර්ගයේ 36 සූත්‍රයේ 7 ඡෙදය මෙනි.)

**8.** “මහණෙනි මෙසේ පුද්ගල තෙම පහත් බවෙන් උසස් වේ.”

“මහණෙනි, උසස් බවෙන් පහත් බවට යන උණ්ණතොණ්ණත පුද්ගලයා කවරේද?”

**9.** (මේ ඡෙදය මේ වර්ගයේ 36 සූත්‍රයේ 9 ඡෙදය මෙනි.)

**10.** “හෙතෙම කයින් දුශ්චරිතයෙහි හැසිර වචනයෙන් දුශ්චරිතයෙහි හැසිර සිතින් දුශ්චරිතයෙහි හැසිර කායයාගේ භෙදයෙන් මරණින් මතු අයසංඛ්‍යාත සැප නැති දුර්ගතිවූ නරකයෙහි උපදී.”

11. "මහණෙනි, මෙසේ වනාහි පුද්ගල තෙම උසස් බවෙන් පහත්වූයේ වේ."

"මහණෙනි, පුද්ගල තෙමේ කෙසේ උසස්වූ ඉහල සිටින උණ්ණතුණ්ණත වේද?"

12. (මේ ඡේදය මේ වර්ගයේ 36 සූත්‍රයේ 9 ඡේදය මෙනි.)

13. "හෙතෙම කයින් සුචරිතයෙහි හැසිර වචනයෙන් සුචරිතයෙහි හැසිර, සිතින් සුචරිතයෙහි හැසිර, කායයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතිවූ ස්වර්ග ලොකයෙහි උපදී."

14. "මහණෙනි, මෙසේ වනාහි පුද්ගල තෙම උසස් බවෙන් උසස් බවට යේ. මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්."

38. **පඨම සමණමචල සූත්‍රය:-** 2. "ශ්‍රමණමචල පුද්ගලයා, ශ්‍රමණ පුණ්ඩරීක පුද්ගලයාය, ශ්‍රමණ පදුම පුද්ගලයාය, ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සුඛුමාල පුද්ගලයාය යන සතරදෙනයි."

2. "මහණෙනි, කෙසේ නම් පුද්ගල තෙමේ අචල ශ්‍රද්ධාවෙහි පිහිටි බැවින් නොසෙල්වෙන ශ්‍රමණ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ ශෛක්ෂ වේද නිරුත්තර අර්හත්වය ප්‍රාර්ථනා කරමින් ඒ ප්‍රතිපදාවට පැමිණ වාසය කරයි. අභිෂෙක කරණ ලද ක්ෂත්‍රිය රජෙකුගේ අභිෂෙකයට සුදුසු අභිෂෙක නොකළ නිශ්චල බවට පත් දෙටු පුත්‍රයා යම්සේද, මහණෙනි, එසේම මහණ තෙම නිරුත්තර අර්හත්වය ප්‍රාර්ථනාකරණ ප්‍රතිපදා ඇතිව වාසය කරණ ශෛක්ෂයෙක් වේද, මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම නිශ්චල ශ්‍රමණ වේ."

4. "මහණෙනි, කෙසේ පුද්ගල තෙම ශ්‍රමණ පුණ්ඩරීක වේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙම ආශ්‍රවයන්ගේ ක්ෂය වීමෙන් ආශ්‍රව රහිත අර්හත් ඵල සමාධිය, අර්හත් ඵල ප්‍රඥාව මෙලොවම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරයිද, අෂ්ට විමොක්ෂයන් කයින් ස්පර්ශ කොට වාසය නොකරයිද, මහණෙනි, මෙසේ වනාහි පුද්ගල තෙම ශ්‍රමණ පුණ්ඩරීක වේ."

**5.** "මහණෙනි, කෙසේ නම් භික්ෂු තෙම ශ්‍රමණ පදුම වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ආශ්‍රවයන්ගේ ක්ෂය වීමෙන් අර්හත්ඵල සමාධිය, අර්හත්ඵල ප්‍රඥාව මෙලොවම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරයිද, අෂ්ට විමොක්ෂයන් කයින් ස්පර්ශකොට වාසය කරයිද, මහණෙනි, පුද්ගල තෙමේ මෙසේ ශ්‍රමණ පදුම වේ."

**6.** "මහණෙනි, කෙසේනම් පුද්ගල තෙමේ ශ්‍රමණයන් අතරෙහි ශ්‍රමණ සුඛුමාල වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම, බොහෝසේ යාච්ඤා කරණ ලද්දේම සිවුරු පරිභොග කරයි. යාච්ඤා නොකොට ස්වල්පයක් පරිභොග කරයි. යාච්ඤා කරණ ලද්දේ බොහෝ වශයෙන් පිණ්ඩපාතය පරිභොග කරයි. යාච්ඤා නොකරණ ලද්දේ ස්වල්ප වශයෙන් පරිභොග කරයි. යාච්ඤා කරණ ලද්දේ බොහෝ සෙනසුන් පරිභොග කරයි. යාච්ඤා නොකරණ ලද්දේ ස්වල්පයක් පරිභොග කරයි. යාච්ඤා කරණ ලද්දේම බොහෝ ගිලන්පස බෙහෙත් පිරිකර පරිභොග කරයි. යාච්ඤා නොකරණ ලද්දේ ස්වල්පයකි. යම් සබ්‍රම්සරුන් සමග වාසය කරයිද, ඔව්හු ඔහුට මනාප කායකර්මයෙන් යුත්ව බොහෝසේ හැසිරෙයි."

**7.** "අමනාපයෙන් ස්වල්පය, බොහෝසේ මනාප වාක් කර්මයෙන් යුක්තව හැසිරෙත්, අමනාපයෙන් ස්වල්පය, බොහෝසේ මනාප මනො කර්මයෙන් යුක්තව හැසිරෙත්. අමනාපයෙන් ස්වල්පය, මනාපවූ බොහෝ පූජා ඵලවත්. අමනාපව ස්වල්පය පිතෙන් හටගත් හෝ සෙමින් හටගත් හෝ වාතයෙන් හටගත් හෝ සන්නිපාතයෙන් හටගත් හෝ, ඍතු විපර්යාසයෙන් හටගත් හෝ, විෂම පැවැත්මෙන් හටගත් හෝ, උපක්‍රමයෙන් හටගත් හෝ කර්ම විපාකයෙන් හටගත් හෝ, යම් ඒ වෙදනා කෙනෙක් ඇද්ද ඔහුට බොහෝ නොඋපදිත්, අල්පබාධා වේ. විශිෂ්ට සිතෙහි පහළවූ මේ ආත්මයෙහි සැප විහරණවූ සතර ධ්‍යානයන් අයත්නයෙන් ලැබෙන්නේ වේ. නොදුකින් ලබන්නේ වේ. පහසුවෙන් ලබන්නේ වේ. ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ආශ්‍රව රහිත අර්හත්ඵල සමාධිය,

අර්හත්ඵල ප්‍රඥාව මෙලොවම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරයි.

8. "මහණෙනි, මෙබඳු පුද්ගල තෙම ශ්‍රමණයන් අතුරෙහි ශ්‍රමණ සුඛුමාල පුද්ගලයා වේ. මහණෙනි, ඒ යමෙක් උදෙසා මනාකොට කියන්නාහු ශ්‍රමණයන් අතුරෙහි ශ්‍රමණ සුඛුමාලයයි කියත්ද, ශ්‍රමණයන් අතරෙහි ශ්‍රමණ සුඛුමාලයයි මනාකොට කියන්නාහු මා ගැනම කියන්නාහුය.

9. "මහණෙනි, මම වනාහි යාච්ඤා කරණ ලද්දේ බොහෝ සිව්රු පරිභොග කරමි. යාච්ඤා නොකරණ ලද්දේ ස්වල්පයකි. යාච්ඤා කරණ ලද්දේ බොහෝ පිණ්ඩපාතයන් පරිභොග කරමි. යාච්ඤා නොකරන ලද්දේ ස්වල්පයකි. යාච්ඤා කරණ ලද්දේ බොහෝ සෙනාසන පරිභොග කරමි. යාච්ඤා නොකරණ ලද්දේ ස්වල්පයකි. යාච්ඤා කරණ ලද්දේම බොහෝ ගිලන්පස බෙහෙත් පිරිකර පරිභොග කරමි. යාච්ඤා නොකරණ ලද්දේ ස්වල්පයකි. යම් භික්ෂූන් සමග වාසය කරම්ද ඔව්හු මට බොහෝසේ මනාප කාය කර්මයෙන් හැසිරෙත්.

10-11. (මේ ඡේදය මේ සූත්‍රයේ 7, 8 ඡේද මෙන් වෙත්.)

12. "මහණෙනි, මේ පුද්ගලයන් සතරදෙන ලොකයෙහි විද්‍යමාන වෙත්යයි" වදාළසේක.

**39. දුතිය සමණමචල සූත්‍රය**:- 2. "ශ්‍රමණමචල පුද්ගලයාය, ශ්‍රමණ පුණ්ඩරීක පුද්ගලයාය, ශ්‍රමණ පද්ම පුද්ගලයාය, ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සුඛුමාල පුද්ගලයාය යන සතරදෙනයි.

3. "මහණෙනි, ශ්‍රමණමචල පුද්ගලයා කවරේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සංයෝජන තුන් දෙනෙකුගේ ක්ෂයවීමෙන් නිරයට නොයන ස්වභාව ඇති සුගති නියතවූ රහත් බව පරම ප්‍රතිෂ්ඨාකොට ඇති සෝවාන් වූවෙක් වේද, මහණෙනි, මෙසේ පුද්ගලතෙම ශ්‍රමණමචල වේ.

4. "මහණෙනි, කෙසේ පුද්ගලතෙම ශ්‍රමණ පුණ්ඩරීක වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සංයොජන තුනක් ක්ෂයකිරීමෙන් රාග ද්වෙෂ මොහයන් තුනීවූ බැවින් සකෘදාගාමි

වේද, වරක් මෙලොවට පැමිණ දුක් කෙළවර කරයිද මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම ශ්‍රමණ පුණ්ඩරීකවේ.

5. "මහණෙනි, කෙසේ නම් පුද්ගල තෙම ශ්‍රමණ පදුම වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කාමධාතුව භජනය කරණ සංයෝජන පස ක්ෂය කිරීමෙන් ඕපපාතික වේද එහි පිරිනිවියේ ඒ ලෝකයෙන් නැවත එන ස්වභාව නැත්තේ වේද, මහණෙනි, මෙබඳු පුද්ගලතෙම ශ්‍රමණ පදුම වේ.

6, 7, 8. (මේ ඡේද මේ වර්ගයේ 38 සූත්‍රයේ 6, 7, 8 ඡේද මෙන් වෙත්.)

9. 'මහණෙනි, මේ පුද්ගලයන් සතරදෙන ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්."

**40. තතිය සමණමචල සූත්‍රයඃ-** 2. (මේ ඡේදය මේ වර්ගයේ 38 සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

3. "මහණෙනි, කෙසේ නම් පුද්ගල තෙම ශ්‍රමණමචල වේද?

4. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම සම්‍යක් දෘෂ්ටික වේද, සම්‍යක් සංකල්ප ඇත්තේ වේද, සම්‍යක් වචන කියන්නේ වේද, සම්‍යක් කර්මාන්ත ඇත්තේ වේද, යහපත් ජීවිකාවෙන් යුක්තද, යහපත් වෑයමෙන් යුක්තද, සම්‍යක් සතියෙන් යුක්තද, සම්‍යක් සමාධියෙන් යුක්තද,

5. "මහණෙනි, මෙසේ පුද්ගල තෙම ශ්‍රමණමචල වේ.

6. "මහණෙනි, කෙසේ නම් පුද්ගල තෙම ශ්‍රමණ පුණ්ඩරීක වේද?

7. (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.) අර්හත් ඵල ඥාණයෙන් යුක්තද, අර්හත්ඵල විමුක්තියෙන් යුක්තද, අෂ්ට විමොක්ෂයෙන් කයින් ස්පර්ශකොට වාසය නොකරයිද, මහණෙනි, මෙසේ පුද්ගල තෙම ශ්‍රමණ පුණ්ඩරීක වේ.

8. "මහණෙනි, කෙසේ නම් පුද්ගල තෙම ශ්‍රමණ පදුම වේද, (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.) අර්හත්ඵල

විමුක්තියෙන් යුක්තවූයේද, අෂ්ට විමොක්ෂයන් කයින් ස්පර්ශ කොට වාසය කෙරේද, මහණෙනි, මෙසේ වනාහි පුද්ගල තෙම ශ්‍රමණ පදුම වේ.

**9, 10, 11.** (මේ ඡේද මේ වර්ගයේ සූත්‍රයේ 6, 7, 8 ඡේද මෙන් වෙත්.)

**12.** "මහණෙනි, මේ පුද්ගලයන් සතර දෙනෙක් ලොකයෙහි ඇත්තාහ."

**41. චතුත්ථ සමණමචල සූත්‍රය**:- 2. (මේ ඡේදය මේ වර්ගයේ 38 සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

**3.** "මහණෙනි, පුද්ගලතෙම කෙසේ ශ්‍රමණමචල වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ශෛක්ෂවේද, නොපැමිණි අර්හත්වය ඇත්තේ නිරුත්තරවූ නිර්වාණය පතමින් වාසය කරයි. මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම ශ්‍රමණ මචලවේ.

**4.** "මහණෙනි, කෙසේ නම් පුද්ගලතෙම ශ්‍රමණ පුණ්ඩරීක වේද?

**5.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම රූපය මෙසේය. රූපය පහළවීම මෙසේය. රූපය අස්තංගම වන්නේ මෙසේය. වේදනාව මෙසේය, වේදනාව පහළවීම මෙසේය, වේදනාව අස්තංගම වන්නේ මෙසේය. සංඥාව මෙසේය, සංඥාව පහළවීම මෙසේය, සංඥාව අස්තංගම වන්නේ මෙසේය, සංස්කාරය මෙසේය, සංස්කාරය පහළවීම මෙසේය, සංස්කාරය අස්තංගම වන්නේ මෙසේය. විඥ්ඥාණය මෙසේය, විඥ්ඥාණයාගේ පහළවීම මෙසේය, විඥ්ඥාණයාගේ අස්තංගමය මෙසේයයි පඤ්ච උපාදානස්කන්ධයන්හි උදයව්‍යය අනුව බලමින් වාසය කරයි.

**6.** "අෂ්ට විමොක්ෂයන් කයින් ස්පර්ශ නොකොට වාසය කරයි. මහණෙනි, මෙසේ පුද්ගලතෙම ශ්‍රමණ පුණ්ඩරීක වේ.

**7.** "මහණෙනි, කෙසේ පුද්ගලතෙම ශ්‍රමණ පදුම වේද? (මේ ඡේදය මේ සූත්‍රයේ 5 ඡේදය මෙනි)

8. "මහණෙනි, මෙසේ වනාහි ශ්‍රමණ පදුම වේ.

"මහණෙනි, කෙසේ නම් පුද්ගලතෙම ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සුඛුමාල වේද?

9, 10, 11. (මේ ඡේද මේ වර්ගයේ 36 සූත්‍රයේ 6, 7, 8 ඡේද මෙන් වෙත්.)

12. "මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලොකයෙහි විද්‍යමාන වන්නාහුය."

(නවවෙනි මචල වර්ගය නිමි)

---

## 10. අසුර වර්ගය.

42. අසුර පරිවාර සූත්‍රයඃ- 1. "මහණෙනි, මේ පුද්ගලයන් සතර දෙනෙක් ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්. කවර සතර දෙනෙක්ද යත්?

2. "අසුරයන් පිරිවරකොට ඇති අසුරයාය, දෙවියන් පිරිවර කොට ඇති අසුරයාය, අසුරයන් පිරිවර කොට ඇති දෙවියාය, දෙවියන් පිරිවර කොට ඇති දෙවියාය යන සතර දෙනය.

3. "මහණෙනි, කෙසේ නම් පුද්ගලතෙම අසුරයන් පිරිවර කොට ඇති අසුරයා වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් දුශ්ශීල වේද, ලාමක ස්වභාව ඇත්තේ වේද, ඔහුගේ පිරිසද දුශ්ශීලද ලාමක ස්වභාව ඇත්තේද, මහණෙනි, මෙබඳු පුද්ගලතෙම අසුර පිරිවර ඇති අසුරයාය.

4. "මහණෙනි, දෙවියන් පිරිවර කොට ඇති අසුරයා කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් දුශ්ශීලද ලාමක ස්වභාව ඇත්තේද, ඔහුගේ පිරිස සිල්වත්ද, යහපත් ස්වභාව ඇත්තේද, මහණෙනි, මෙබඳු පුද්ගලතෙමේ දෙවියන් පිරිවරකොට ඇති අසුරයාය.

5. "මහණෙනි, පුද්ගලතෙම කෙසේ නම් අසුරයන් පිරිවරකොට ඇති දෙවියා වේද? මහණෙනි, මේ ලොකයෙහි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇතැම් පුද්ගලයෙක් සිල්වත්ද, යහපත් ස්වභාව ඇත්තේද, ඔහුගේ පිරිස වනාහි දුශ්ශීලද, ලාමක ස්වභාව ඇත්තේද, මහණෙනි, මෙවැනි පුද්ගල තෙම අසුරයන් පිරිවර කොට ඇති දෙවියෙක් වේ.

6. "මහණෙනි, කවර පුද්ගලයෙක් දෙව් පිරිස ඇති දෙවියෙක් වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සිල්වත්ද, යහපත් ස්වභාව ඇත්තේද, ඔහුගේ පිරිසද සිල්වත්ද, යහපත් ස්වභාව ඇත්තේද, මහණෙනි, මෙබඳු පුද්ගලතෙම දෙව් පිරිස් ඇති දෙවියෙක්වේ. මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්."

**43. පඨම චෙතොසමථ සූත්‍රයඃ-** 1. (මේ වර්ගයේ සියලු සූත්‍රවල 1 ඡේදය මේ පණ්ණාසකයේ 42 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් අධ්‍යාත්මයෙහි අර්පණා චිත්ත සමාධිය ලබන්නේවේ. විදර්ශනා ප්‍රඥාව නොලබන්නේ වේද,

3. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් විදර්ශනා ප්‍රඥාව ලබන්නේ වේ. අධ්‍යාත්මයෙහි අර්පණා චිත්ත සමාධිය නොලබන්නේ වේ.

4. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් අධ්‍යාත්මයෙහි අර්පණා චිත්ත සමාධිය නොලබයි, විදර්ශනා ප්‍රඥාව නොලබයි.

5. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් අධ්‍යාත්මයෙහි අර්පණා චිත්ත සමාධිය ලබයි. විදර්ශනා ප්‍රඥාව ලබයි.

6. "මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්."

**44. දුතිය චෙතො සමථ සූත්‍රයඃ-** 2, 3, 4, 5 (මේ ඡේද මේ පණ්ණාසකයේ 42 සූත්‍රයේ 2, 3, 4, 5 ඡේද මෙන් වෙත්.)

**6.** "මහණෙනි, එහි යම් මේ පුද්ගලයෙක් අධ්‍යාත්මයෙහි අර්පණා සමාධිය ලබන්නේ වේද, විදර්ශනා ප්‍රඥාව නොලබන්නේ වේද මහණෙනි, ඒ පුද්ගලයා විසින් අධ්‍යාත්මයෙහි අර්පණා චිත්තයෙහි පිහිටා විදර්ශනා ප්‍රඥාවට යොග කළ යුතුයි. හෙතෙම මෑත කලක අධ්‍යාත්මයෙහි අර්පණා චිත්තයද ලබන්නේවේ. අධිප්‍රඥා ධර්ම විදර්ශනාවද ලබන්නේවේ.

**7.** "මහණෙනි, එහි යම් මේ පුද්ගලයෙක් විදර්ශනා ප්‍රඥාව ලබන්නේ වේද, අධ්‍යාත්මයෙහි අර්පණා සමාධිය නොලබන්නේද, මහණෙනි, ඒ පුද්ගලයා විසින් විදර්ශනා ප්‍රඥාවේ සිට අධ්‍යාත්මයෙහි අර්පණා සමාධියෙහි වෑයම් කළ යුතුයි. හෙතෙම මෑත භාගයෙහි විදර්ශනා ප්‍රඥාවද ලබයි. අර්පණා සමාධියද ලබයි.

**8.** "මහණෙනි, එහි යම් පුද්ගලයෙක් අධ්‍යාත්මයෙහි අර්පණා චිත්ත සමාධිය නොලබන්නේද, අධිප්‍රඥා ධර්ම විදර්ශනාව නොලබන්නේද, මහණෙනි, ඒ පුද්ගලයා විසින් ඒ කුශල ධර්මයන්ගේම ප්‍රතිලාභය පිණිස අධිමාත්‍ර කැමැත්තක්ද වෑයමක්ද උත්සාහයක්ද, මහා වීර්යයක්ද නොනැවතීමක්ද සිහියක්ද සම්‍යක් ප්‍රඥාවක්ද කටයුතුයි.

**9.** "මහණෙනි, යම්සේ ගිනිගත් වස්ත්‍රයක් හෝ ගිනිගත් හිසක් ඇත්තේ ඒ ඒ වස්ත්‍රයාගේ හෝ ශීර්ෂයාගේ නිවීම පිණිස මහත් ඕනෑකමක්ද ප්‍රයොගයක්ද උත්සාහයක්ද මහා වීර්යයක්ද නොනැවතීමක්ද සිහියක්ද සම්‍යක් ප්‍රඥාවක්ද කරන්නේය.

**10.** "මහණෙනි, එසේම ඒ පුද්ගලයා විසින් ඒ කුශල ධර්මයන්ගේම ලැබීම පිණිස අධිමාත්‍ර ඡන්දයක් හෝ වෑයමක් හෝ උත්සාහයක් හෝ මහා වීර්යයක් හෝ නොනැවැත්මක් හෝ සිහියක් හෝ සම්‍යක් ප්‍රඥාවක් හෝ කටයුතුයි. හෙතෙම මෑතභාගයෙහි අධ්‍යාත්මයෙහි අර්පණා සමාධිය ලබන්නේවේ. විදර්ශනා ප්‍රඥාවද ලබන්නේවේ. මහණෙනි, යම් මේ පුද්ගලයෙක් අධ්‍යාත්මයෙහි අර්පණා චිත්තය ලබන්නේ වේද, අධිප්‍රඥා විදර්ශනා ප්‍රඥාව ලබන්නේද වේ. ඒ පුද්ගලයා විසින් ඒ කුශල ධර්මයන්හිම පිහිටා මත්තෙහි ආශ්‍රවයන්ගේ ක්ෂයය පිණිස යොග

කටයුතුයි. මහණෙනි, මේ පුද්ගලයන් සතරදෙන ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්යයි" වදාළසේක.

**45. තතිය චෙතොසමථ සූත්‍රය**:- 2, 3, 4, 5 (මේ ඡෙද මේ වර්ගයේ 2 සූත්‍රයේ 2, 3, 4, 5 ඡෙද මෙන් වෙත්.)

**6.** "මහණෙනි, එහි යම් මේ පුද්ගලයෙක් තෙම අධ්‍යාත්මයෙහි අර්පණා සමාධිය ලබන්නේද විදර්ශනා ප්‍රඥාව නොලබන්නේද, ඒ පුද්ගලයා විසින් යම් මේ පුද්ගලයෙක් විදර්ශනා ප්‍රඥාව ලබන ලද්දේ වේද, හෙතෙමේ පැමිණ මෙසේ කිවයුතු වන්නේය. "ඇවැත්නි, සංස්කාරයන් කෙසේ දත යුත්තාහුද? සංස්කාරයන් කෙසේ සන්මර්ශනය කටයුත්තාහුද, කෙසේ සංස්කාරයන් විදර්ශනා කටයුතුදැයි මෙසේ කියයුතු වන්නේය. ඔහුට ඔහු දුටු පරිදි දත් පරිදි ප්‍රකාශ කරයි. ඇවැත්නි, සංස්කාරයෝ මෙසේ දත යුත්තාහ. මෙසේ සංස්කාරයන් සන්මර්ශනය කටයුත්තාහ. මෙසේ සංස්කාරයන් විදර්ශනා කටයුතුයයි දත් පරිදි ප්‍රකාශ කරයි. හෙතෙම මෑත භාගයෙහි අධ්‍යාත්මයෙහි අර්පණා චිත්තය ලබන ලද්දේවේ. විදර්ශනා ප්‍රඥාවද ලබන ලද්දේවේ.

**7.** "මහණෙනි, එහි යම් මේ පුද්ගලයෙක් විදර්ශනා ප්‍රඥාව ලබන ලද්දේ වේද, අධ්‍යාත්මයෙහි අර්පණා සමාධිය නොලබන ලද්දේ වේද, මහණෙනි, ඒ පුද්ගලයා විසින් යම් පුද්ගලයෙක් අධ්‍යාත්මයෙහි අර්පණා සමාධිය ලබන ලද්දේවේද, හෙතෙම පැමිණ 'ඇවැත්නි, කෙසේ සිත පිහිටවිය යුතුද, කෙසේ සිත එකට පහලවන්නක් කළයුතුද මෙසේ සිත සමාධිගත කටයුතුයයි' දත් පරිදි ප්‍රකාශ කරයි. මහණතෙම මෑතභාගයෙහි විදර්ශනා ප්‍රඥාවද අර්පණා සමාධියද ලබන්නේ වේ.

**8.** "මහණෙනි, එහි යම් මේ පුද්ගලයෙක් අධ්‍යාත්මයෙහි අර්පණා සමාධිය නොලැබුයේද විදර්ශනා ප්‍රඥාවද නොලැබුයේ වේද, මහණෙනි, ඒ පුද්ගලයා විසින් යම් මේ පුද්ගලයෙක් අධ්‍යාත්මයෙහි අර්පණා සමාධිය ලැබුයේද, විදර්ශනා ප්‍රඥාවද ලැබුයේද, හෙතෙම පැමිණ 'ඇවැත්නි, කෙසේ සිත පිහිටුවිය යුතුද, කෙසේ සිත තබාගත යුතුද, කෙසේ සිත එකට පහළ

කරගතයුතුද කෙසේ සිත සමාධි ගත කටයුතුද කෙසේ සංස්කාරයෝ දතයුත්තාහුද? කෙසේ සංස්කාරයන් සන්මර්ශනය කටයුතුද, කෙසේ සංස්කාරයන් විදර්ශනා කටයුතුදැයි ඇසිය යුතුය. ඔහුට හෙතෙමේ 'ඇවැත්නි, මෙසේ සිත පිහිටුවිය යුතුය. මෙසේ සිත තබාගත යුතුය. මෙසේ සිත එකට පහළවන්නක් කටයුතුය. මෙසේ සිත එකග කළයුතුය. මෙසේ සංස්කාරයන් දත යුතුය. මෙසේ සංස්කාරයන් සන්මර්ශනය කටයුතුය. මෙසේ සංස්කාරයන් විදර්ශනා කටයුතුයයි' දුටු පරිදි දත් පරිදි ප්‍රකාශ කරයි. හෙතෙම මෑත භාගයෙහි අධ්‍යාත්මයෙහි අර්පණා සමාධියද විදර්ශනා ප්‍රඥාවද ලබන්නේ වේ.

**9.** "මහණෙනි, එහි යම් මේ පුද්ගලයෙක් අධ්‍යාත්මයෙහි අර්පණා සමාධියද ලබන්නේ වේ. විදර්ශනා ප්‍රඥාවද ලැබූයේ වේද, ඒ පුද්ගලයා විසින් ඒ කුශල ධර්මයන්හි පිහිටා මත්තෙහි ආශ්‍රවයන් ක්ෂයකිරීම පිණිස යොග කළයුතුයි. මහණෙනි, මේ පුද්ගලයන් සතරදෙන ලොකයෙහි ඇත්තාහ, විද්‍යමානවෙත්."

**46. ජවාලාත සූත්‍රයː-** 2. "තමාගේ යහපත පිණිස නොපිළිපන් අනුන්ගේ යහපත පිණිස නොපිළිපන් පුද්ගලයාය, අනුන්ගේ යහපත පිණිස පිළිපන් තමන්ගේ යහපත පිණිස නොපිළිපන් පුද්ගලයාය, තමන්ගේ යහපත පිණිස පිළිපන් අනුන්ගේ යහපත පිණිස නොපිළිපන් පුද්ගලයාය, තමාගේ යහපත පිණිසද අනුන්ගේ යහපත පිණිසද පිළිපන් පුද්ගලයාය යන සතරදෙනයි.

3. "මහණෙනි, දෙපැත්තෙන් දැවුණු මැද අශූචි වැගුරුණු සොහොන් පෙනෙල්ලක් යම්සේද ගමෙහි දරදඬු පිණිස නොපවතීද, වනයෙහි දර දඬු පිණිස නොපවතීද, යම් මේ පුද්ගලයෙක් තමාගේ හිත පිණිසත් අනුන්ගේ හිත පිණිසත් නොපිළිපන්නේද, මහණෙනි, මම මේ පුද්ගලයා බඳුයයි කියමි. මහණෙනි, යම් මේ පුද්ගලයෙක් අනුන්ගේ හිත පිණිස පිළිපන්නේද, තමන්ගේ යහපත පිණිස නොපිළිපන්නේද, මේ පුද්ගලයන් දෙදෙනා අතුරෙන් අතිශයින් ශ්‍රෙෂ්ඨද ප්‍රණීතද වේ.

**4.** "මහණෙනි, එහි යම් මේ පුද්ගලයෙක් තමන්ගේ හිත පිණිස පිළිපන්නේද, පරහිත පිණිස නොපිළිපන්නේද, මේ ත්‍රිවිධ පුද්ගලයන් අතුරෙන් අතිශයින් යහපත්යයිද ප්‍රණීතයයිද කියනු ලැබේ.

**5.** "මහණෙනි, එහි යම් මේ පුද්ගලයෙක් තමාගේ යහපත පිණිස පිළිපන්නේද අනුන්ගේ යහපත පිණිස පිළිපන්නේද මෙතෙමේ මේ සතර පුද්ගලයන්ගෙන් අග්‍රය, ශ්‍රෙෂ්ඨය, ප්‍රමුඛය, උත්තමය ප්‍රවරද වෙයි.

**6.** "මහණෙනි, යම්සේ දෙනගෙන් කිරිද, කිරෙන් දීද, දීවලින් වෙඩරුද, වෙඩරුවෙන් ගිතෙල්ද, ගිතෙලින් ගිතෙල් මණ්ඩද, එහි අග්‍රයයි කියනු ලැබේ. මහණෙනි, එසේම යම් ඒ පුද්ගලයෙක් තමන්ගේ අභිවෘද්ධිය පිණිසද අනුන්ගේ හිත පිණිසද, පිළිපන්නේ වේද, මෙතෙමේ මේ සතර පුද්ගලයන්ගෙන් අග්‍රද, ශ්‍රෙෂ්ඨද, ප්‍රමුඛද, උතුම්ද, ප්‍රවරද වේ. මහණෙනි, මේ සතර පුද්ගලයෝ ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්."

**47. රාගවිනය පටිපන්න සූත්‍රය:-** 2. "තමාගේ යහපත පිණිස පිළිපන් අනුන්ගේ යහපත පිණිස පිළිනොපන් පුද්ගලයාය, අනුන්ට හිත පිණිස, පිළිපන් තමාගේ යහපත පිණිස, පිළිනොපන් පුද්ගලයාය, තම යහපත පිණිස හෝ අනුන්ගේ යහපත පිණිස, පිළිනොපන් පුද්ගලයාය, තමාගේ යහපත පිණිසත්, අනුන්ගේ යහපත පිණිසත්, පිළිපන් පුද්ගලයාය යන සතර දෙනයි"

3. "මහණෙනි, කෙසේ පුද්ගල තෙම තමාගේ යහපත පිණිස පිළිපන්නේද, අනුන්ගේ යහපත පිණිස නොපිළිපන්නේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමන් රාග විනය පිණිස පිළිපන්නේද, අන්‍යයන් රාග විනය පිණිස සමාදන් නොකරවයිද, තමන් ද්වෙෂ විනය පිණිස පිළිපන්නේ වේද, අනුන් ද්වෙෂ විනය පිණිස සමාදන් නොකරවයිද, තමන් මොහ විනය පිණිස පිළිපන්නේද, අනුන් මොහ විනය පිණිස සමාදන් නොකරවයිද, මහණෙනි, මෙබඳු පුද්ගල තෙම තමන්ගේ යහපත පිණිස පිළිපන්නේය. අනුන්ගේ යහපත පිණිස නොපිළිපන්නේය."

**4.** "මහණෙනි, පුද්ගල තෙම කෙසේ අනුන්ගේ හිත පිණිස පිළිපන්නේද, තමන්ගේ යහපත පිණිස නොපිළිපන්නේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමන් රාග විනය පිණිස නොපිළිපන්නේද, අන්‍යයන් රාග විනයෙහි සමාදන් කරවයි. තමන් ද්වේෂ විනය පිණිස නොපිළිපදී. අන්‍යයන් ද්වෙෂ විනය පිණිස සමාදන් කරවයි. තමන් මොහ විනය පිණිස නොපිළිපදියි. මොහ විනය පිණිස සමාදන් කරවයි. මහණෙනි, මෙසේ පුද්ගල තෙම අන්‍යයන්ගේ හිත පිණිස පිළිපන්නේ වේ. තමන්ගේ යහපත පිණිස නොපිළිපන්නේ වේ.

**5.** "මහණෙනි, පුද්ගල තෙම කෙසේ තමාගේ යහපත පිණිසත්, අනුන්ගේ යහපත පිණිසත් නොපිළිපන්නේ වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමන් රාග විනය පිණිස පිළිනොපන්නේ වේ. අන්‍යයන් රාග විනය පිණිස සමාදන් නොකරවයි. තමන් ද්වේෂ විනය පිණිස පිළිනොපදී. අන්‍යයාද ද්වෙෂ විනය පිණිස සමාදන් නොකරවයි. තමන් මොහ විනය පිණිස නොපිළිපදී. අන්‍යයන්ද මොහ විනය පිණිස සමාදන් නොකරවයි. මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙමේ තමාගේ යහපත පිණිසත් අනුන්ගේ යහපත පිණිසත් නොපිළිපන්නේ වේ.

**6.** "මහණෙනි, තමාගේ යහපත පිණිසද, අනුන්ගේ යහපත පිණිසද, පිළිපන් පුද්ගලයා කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමන්ද රාග විනය පිණිස පිළිපන්නේද, අන්‍යයන්ද රාග විනයෙහි සමාදන් කරවයිද, තමන් ද්වෙෂ විනය පිණිස පිළිපන්නේද, අනුන්ද ද්වෙෂ විනයෙහි සමාදන් කරවයිද, තමන් මොහ විනය පිණිස පිළිපන්නේද අන්‍යයන්ද මොහ විනය පිණිස සමාදන් කරවයිද, මහණෙනි, මෙසේ වනාහි පුද්ගල තෙම තමන්ට හිතවත් පිණිසත්, අන්‍යයන්ට හිතවත් පිණිසත්, පිළිපන්නේ වේ. මහණෙනි, මේ පුද්ගලයන් සතරදෙන ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්."

**48. ඛිප්පනි සන්ති සූත්‍රයː-** 2. (මේ ඡෙදය මේ පණ්ණාසකයේ 47 සූත්‍රයේ 2 ඡෙදය මෙනි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "මහණෙනි, කෙසේනම් පුද්ගල තෙම තමන්ගේ යහපත පිණිස පිළිපන්නේද, අන්‍යයන්ගේ යහපත පිණිස නොපිළිපන්නේද?"

4. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් කුශල ධර්මයන් වහා දැනගන්නට සමර්ථ වේද, ඇසූ ධර්මයන් දරන ස්වභාව ඇත්තේ වේද, දැරූ ධර්මයන්ගේ අර්ථ පරීක්ෂා කරන්නේ වේ. අර්ථය දැන ධර්මය දැන ධර්මානුධර්ම ප්‍රතිපන්න වේ.

5. යහපත් වචන නැත්තේ වේ. යහපත් වචන හඬ නැත්තේ වේ. ද්විස්සට්ඨ අංගයෙන් යුත් කෙළතොළු නොවූ අර්ථයන් හඟවන නාගරික වචනයෙන් යුක්තවූයේ වේ. සබ්‍රම්සරුන්ට උදාහරණ දක්වා කියා නොදේද, සමාදන් නොකරවාද, තෙද නොගන්වාද, සතුටු නොඋපදවාද,

6. "මහණෙනි, මෙබඳු පුද්ගල තෙම තමාගේ යහපත පිණිස පිළිපන්නේ වේ. අනුන්ගේ යහපත පිණිස පිළිපන්නේ නොවේ."

"මහණෙනි, කෙසේ පුද්ගල තෙම අනුන්ගේ යහපත පිණිස පිළිපන්නේ තම හිත පිණිස පිළිපන්නේ නොවේ."

7. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් කුශල ධර්මයන් වහා දකින්නට සමර්ථ නොවේද, ඇසූ ධර්මයන් නොදරණ ස්වභාව ඇත්තේද, දැරූ ධර්මයන්ගේ අර්ථයන් පරීක්ෂා කරන්නේ නොවේද, අර්ථය දැන ධර්මය දැන ධර්මානු ධර්ම ප්‍රතිපන්න නොවේ."

8. "යහපත් වචන ඇත්තේ වේ. යහපත් ශබ්ද ඇත්තේ වේ. විස්සට්ඨ අංගයෙන් යුත් කෙළතොළු නොවූ අර්ථයන් හඟවන නාගරික වචනයෙන් යුක්තවූයේ වේ. සබ්‍රම්සරුන්ට උදාහරණ දක්වා කියා දේද, සමාදන් කරවයිද, තෙද ගන්වයිද, සතුටු කරවයිද,

9. "මහණෙනි, මේ පුද්ගල තෙම අනුන්ගේ යහපත පිණිස පිළිපන්නේ වේ. තමාගේ යහපත පිණිස පිළිපන්නේ නොවේ."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, කෙසේ පුද්ගල තෙම තමාගේ යහපත පිණිස පිළිනොපන්නේ වේද, අනුන්ගේ යහපත පිණිස පිළිනොපන්නේ වේද?

**10.** (මේ ඡේදය මේ සූත්‍රයේ 7 ඡේදය මෙනි.)

**11.** (මේ ඡේදය මේ සූත්‍රයේ 5 ඡේදය මෙනි.)

**12.** "මහණෙනි, මෙසේ වනාහි පුද්ගල තෙම තමාගේ යහපත පිණිසත්, අනුන්ගේ යහපත පිණිසත්, නොපිළිපන්නේ වේ."

"මහණෙනි, කෙසේ පුද්ගල තෙම තමාගේ යහපත පිණිසද, අනුන්ගේ යහපත පිණිසද පිළිපන්නේ වේද?

**13.** (මේ ඡේදය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි.)

**14.** (මේ ඡේදය මේ සූත්‍රයේ 8 ඡේදය මෙනි.)

**15.** "මහණෙනි, මෙසේ වනාහි පුද්ගල තෙම තමන්ගේ යහපත පිණිස පිළිපන්නේද, අනුන්ගේ යහපත පිණිස පිළිපන්නේද වේ. මහණෙනි, මේ පුද්ගලයන් සතර දෙන ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්."

**49. අත්තහිත පටිපන්න සූත්‍රය**:- 2. "තමාගේ යහපත පිණිස පිළිපන් අනුන්ගේ යහපත පිණිස නොපිළිපන් පුද්ගලයාය. අනුන්ගේ යහපත පිණිස පිළිපන් තමන්ගේ යහපත පිණිස නොපිළිපන් පුද්ගලයාය. තමාගේ යහපත පිණිසත් අනුන්ගේ යහපත පිණිසත් නොපිළිපන් පුද්ගලයාය, තමාගේ යහපත පිණිසත්, අනුන්ගේ යහපත පිණිසත් පිළිපන් පුද්ගලයාය යන සතරදෙනයි. මහණෙනි, මේ පුද්ගලයන් සතරදෙන ලොකයෙහි ඇත්තාහ, විද්‍යමානවෙත්."

**50. සික්ඛා පූරක සූත්‍රය**:- 2. (මේ ඡේදය මේ පණ්ණාසකයේ 47 සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

3. "මහණෙනි, කෙසේ පුද්ගලතෙම තමාගේ යහපත පිණිස පිළිපන්නේවේද? අනුන්ගේ යහපත පිණිස නොපිළිපන්නේද?

"මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමන් සතුන් මැරීමෙන් වෙන්වූයේවේද, අන්‍යයන් සතුන් මැරීමෙන් වෙන් වීමෙහි සමාදන් නොකරවයි. තමන් නුදුන්දෙය ගැනීමෙන් වෙන්වූයේවේ. අනුන් නුදුන්දේ ගැනීමෙන් වෙන්වීමෙහි සමාදන් නොකරවයි. තමන් කාමමිථ්‍යාචාරයෙන් වෙන්වූයේ වේ, අනුන් කාමයෙහි වරදවා හැසිරීමෙන් වෙන්වීමෙහි සමාදන් නොකරවයි. තමන් බොරුකීමෙන් වෙන්වූයේ වේ අන්‍යයන් බොරු කීමෙන් වෙන්වීමෙහි සමාදන් නොකරවයි. තමන් මදයට හා ප්‍රමාදයට කාරණාවූ රහමෙර පීමෙන් වෙන්වූයේ වේ. අනුන් මදයට හා ප්‍රමාදයට කාරණාවූ රහමෙර පීනේ වෙන්වීමෙහි සමාදන් නොකරවයි. මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම තමන්ගේ යහපත පිණිස පිළිපන්නේ වේ. අනුන්ගේ යහපත පිණිස නොපිළිපන්නේ වේ.

**4.** "මහණෙනි, කෙසේ පුද්ගලතෙම අනුන්ගේ හිත පිණිස පිළිපන්නේද තමන්ගේ යහපත පිණිස නොපිළිපන්නේවේද, මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමන් සතුන් මැරීමෙන් වෙන් නොවූයේ වේද, අන්‍යයන් සතුන් මැරීමෙන් වෙන්වීමෙහි සමාදන් කරවයි.

"තමන් නුදුන්දේ ගැනීමෙන් වෙන් නොවූයේ වේ, අනුන් නුදුන්දේ ගැනීමෙන් වෙන්වීමෙහි සමාදන් කරවයි. තමන් කාමමිථ්‍යාචාරයෙන් වෙන් නොවූයේවේ අනුන් කාමමිථ්‍යාචාරයෙන් වෙන්වීමෙහි සමාදන් කරවයි. තමන් බොරු කීමෙන් වෙන් නොවූයේවේ. අනුන් බොරුකීමෙන් වෙන්වීමෙහි සමාදන් කරවයි.

"තමන් මදයට හා ප්‍රමාදයට කාරණාවූ රහමෙර පීමෙන් වෙන්නුවූයේවේ අනුන් මදයට හා ප්‍රමාදයට කාරණවූ රහමෙර පානයෙන් වෙන්වීමෙහි සමාදන් කරවයි. මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම පරහිත පිණිස පිළිපන්නේ වේ. තමාගේ හිත පිණිස නොපිළිපන්නේවේ.

**5.** "මහණෙනි, කෙසේ නම් පුද්ගලතෙම තමාගේ අභිවෘද්ධිය පිණිසද, අනුන්ගේ අභිවෘද්ධිය පිණිසද, නොපිළිපන්නේ වේද?

මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමන් සතුන් මැරීමෙන් වෙන් නොවූයේ වේද, අන්‍යයන් සතුන් මැරීමෙන් වෙන්වීමෙහි සමාදන් නොකරවයි. තමන් නුදුන් දේ ගැනීමෙන් වෙන් නොවූයේ වේ. අනුන් නුදුන් දේ ගැනීමෙන් වෙන්වීමෙහි සමාදන් නොකරවයි, තමන් කාමමිථ්‍යාචාරයෙන් වෙන් නොවූයේ වේ, අනුන් කාමමිථ්‍යාචාරයෙන් වෙන්වීමෙහි සමාදන් නොකරවයි, තමන් බොරුකීමෙන් වෙන් නොවූයේ වේ, අනුන් බොරුකීමෙන් වෙන්වීමෙහි සමාදන් නොකරවයි. තමන් මදයට හා ප්‍රමාදයට කාරණවූ රහමෙර පීමෙන් වෙන් නොවූයේ වේ. අනුන් මදයට හා ප්‍රමාදයට කාරණවූ රහමෙර පීමෙන් වෙන්වීමෙහි සමාදන් නොකරවයි. මෙසේ වනාහි මහණෙනි, පුද්ගලතෙම තමාගේ යහපත පිණිසත් අනුන්ගේ යහපත පිණිසත් නොපිළිපන්නේ වේ.

**6.** "මහණෙනි, කෙසේනම් පුද්ගලතෙම තමන්ගේ යහපත පිණිසද අනුන්ගේ යහපත පිණිසද පිළිපන්නේවේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමන්ද සතුන් මැරීමෙන් වෙන්වූයේ අනුන්ද සතුන් මැරීමෙන් වෙන්වීමෙහි සමාදන් කරවයි.

"තමන් නුදුන්දෙය ගැනීමෙන් වෙන්වූයේවේ. අනුන් නුදුන්දේ ගැනීමෙන් වෙන්වීමෙහි සමාදන් කරවයි. තමන් කාමමිථ්‍යාචාරයෙන් වෙන්වූයේ වේ, අනුන් කාමයෙහි වරදවා හැසිරීමෙන් වෙන්වීමෙහි සමාදන් කරවයි. තමන් බොරු කීමෙන් වෙන්වූයේ වේ, අන්‍යයන් බොරු කීමෙන් වෙන් වීමෙහි සමාදන් කරවයි.

"තමන්ද මදයට හා ප්‍රමාදයට කාරණවූ රහමෙර පීමෙන් වෙන්වූයේ වේ, අනුන්ද මදයට හා ප්‍රමාදයට කාරණවූ රහමෙර පීමෙන් වෙන්වීමෙහි සමාදන් කරවයි, මහණෙනි, මෙසේ පුද්ගලතෙම තමහට හිතපිණිසද අනුන්ට හිතපිණිසද පිළිපන්නේවේ, මහණෙනි, මේ පුද්ගලයෝ සතරදෙන ලෝකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්."

**51. පොතලිය සූත්‍රයඃ-** 1. ඉක්බිති පොතලිය පරිබ්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවූයේය. සතුටු විය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එකත් පසෙක සිටියේය. එකත්පසෙක සිටි පොතලිය පරිබ්‍රාජකයාට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

2. "පොතලිය, මේ පුද්ගලයෝ සතරදෙනෙක් ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්. කවර සතරදෙනෙක්ද යත්, පොතලිය මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් නුගුණ කිව යුත්තාගේ ඇත්තාවූ, සත්‍යවූ නුගුණ කල් පැමිණි කල්හි නොකියන ලද්දේවේද,

ගුණ කිවයුත්තාගේ ඇත්තාවූ සත්‍යයවූ ගුණය කල් පැමිණිකල්හි කියනලද්දේවේද,

"පොතලිය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් නුගුණ කිවයුත්තාගේ ඇත්තාවූ සත්‍යයවූ ගුණය කල්පැමිණි කල්හි කියනලද්දේවේද, නුගුණ කිවයුත්තාගේ ඇත්තාවූ සත්‍යයවූ නුගුණය කල් පැමිණි කල්හි කියන ලද්දේ වේද,

"පොතලිය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් නුගුණ කිවයුත්තාගේ ඇත්තාවූ සත්‍යවූ නුගුණය කල්පැමිණි කල්හි නොකියන ලද්දේ වේද, ගුණ කිවයුත්තාගේ ඇත්තාවූ සත්‍යයවූ ගුණ කල් පැමිණි කල්හි නොකියන ලද්දේ වේද

"පොතලිය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් නුගුණ කිවයුත්තාගේ ඇත්තාවූ සත්‍යවූ නුගුණය කල් පැමිණිකල්හි කියනලද්දේවේද, ගුණ කිවයුත්තාගේ ඇත්තාවූ සත්‍යයවූ ගුණය කල් පැමිණි කල්හි කියන ලද්දේ වේද, පොතලිය, මේ පුද්ගලයන් සතරදෙන ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත.

3. "පොතලිය, මේ සතර පුද්ගලයන්ගෙන් කවර පුද්ගලයෙක් අතිශයින් යහපත්යයි, අතිශයින් ප්‍රණීතයයි, වැටහේද?

(මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි, ආමන්ත්‍රණ වචනය 'පොතලිය' වෙනුවට 'භාග්‍යවතුන් වහන්ස' විය යුතුයි.)

"භවත් ගෞතමයන්වහන්ස, මේ සතර පුද්ගලයන්ගෙන් යම් මේ පුද්ගලයෙක් තෙම නුගුණ කිවයුත්තාගේ ඇත්තාවූ, සත්‍යවූ නුගුණය කල් පැමිණි කල්හි නොකියන ලද්දේ වේද, ගුණ කිවයුත්තාගේ ඇත්තාවූ සත්‍යයවූ ගුණය සුදුසු කල් පැමිණි කල්හි නොකියන ලද්දේ වේද, මේ පුද්ගලතෙම මේ සතර පුද්ගලයන්ගෙන් අතිශයින් යහපත් යයිද අතිශයින් ප්‍රණීතයයිද වැටහේ, ඊට හේතු කවරේද? භවත් ගෞතමයන් වහන්සේ යම් මේ උපෙක්ෂාවක් ඇද්ද ඕතොමෝ අතිශයින් යහපත්ය.

4. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

"පොතලිය, මේ සතර පුද්ගලයන්ගෙන් යම් මේ පුද්ගලයෙක් තෙම නුගුණ කිවයුත්තාගේ ඇත්තාවූ සත්‍යවූ නුගුණය කල් පැමිණි කල්හි කියන ලද්දේ වේද, ගුණ කිවයුත්තාගේ ඇත්තාවූ සත්‍යයවූ ගුණය කල්පැමිණිකල්හි කියනලද්දේ වේද, මේ සතර පුද්ගලයන් අතරින් මේ තෙමේ අතිශයින් යහපත්ද, ප්‍රණීතදවේ. ඊට හේතු කවරේද? පොතලිය, ඒ ඒ තන්හි කල් දන්නා බව අතිශයින් යහපත්ය."

5. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) ආමන්ත්‍රණ වචනය 'පොතලිය' වෙනුවට 'භාග්‍යවතුන් වහන්ස' විය යුතුයි.)

"භවත් ගෞතමයන්වහන්ස, මේ සතර පුද්ගලයන්ගෙන් යම් මේ පුද්ගලයෙක් නුගුණ කිව යුත්තාගේ ඇත්තාවූ සත්‍යවූ නුගුණය කල් පැමිණි කල්හි කියන්නේ වේද, මේ සතර පුද්ගලයන්ගෙන් මේ පුද්ගල තෙම අතිශයින් යහපත්යයිද අතිශයින් ප්‍රණීතයයිද වැටහේ. ඊට හෙතු කවරේද? යම් මේ ඒ ඒ තන්හි කල් දැනීමක් ඇද්ද එය ඉතා යහපත්ය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපති.

6. "භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපති, භවත් ගෞතමයන් වහන්ස යම්සේ යටිකුරු කරණ ලද්දක් උඩුකුරු කරන්නේද, වැසුණු දෙයක් විවෘතකරන්නේද, මංමුලා වූවෙකුට මාර්ගය කියන්නේද, ඇස් ඇත්තෝ රූප දකිත්වයි අඳුරෙහි තෙල්පහනක් දරන්නේද, එසේම භවත් ගෞතමයන් වහන්සේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

විසින් අනෙක ප්‍රකාරයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලදී. ඒ මම භවත් ගෞතමයන්වහන්සේ සරණ යමි. ධර්මයද භික්ෂු සංඝයාද සරණ යමි. අද සිට දිවිහිම්කොට සරණගිය උපාසකයකුකොට භවත් ගෞතමයන්වහන්සේ මා දරාවා."

(දහවෙනි අසුර වර්ගය නිමි.)

---

## තුන්වෙනි පණ්ණාසකය.

## 11. වලාහක වර්ගය.

1. පඨම වලාහකොපම සූත්‍රයː- 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි අනේපිඬු සිටානන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි 'මහණෙනියි' කියා භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. ඒ භික්ෂූහු 'පින්වතුන් වහන්සැයි' කියා භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ වක්ෂ්‍යමාන සූත්‍රය වදාළසේක.

2. "මහණෙනි, මේ වලාහකයෝ සතර දෙනෙක් වෙති. කවර සතර දෙනෙක්ද යත්. ගර්ජනා කරන්නාහුය. නොවසින්නාහුය. වසින්නාහුය, ගර්ජනා නොකරන්නාහුය. නොවසින්නේද ගර්ජනා නොකරන්නේද, ගර්ජනා කරන්නේද වසින්නේද, මහණෙනි මේ සතර වළාහකයෝය.

"මහණෙනි, එසේම වළාහකයන්ට උපමා ඇති පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්. කවර සතරදෙනෙක්ද යත්. ගර්ජනා කරන්නාහුය, නොවසින්නාහුය, වසින්නාහුය, ගර්ජනා නොකරන්නාහුය. ගර්ජනා නොකරන්නාහුය, නොවසින්නාහුය. ගර්ජනා කරන්නාහුද වසින්නාහුද වෙත්.

3. "මහණෙනි, කෙසේනම් පුද්ගල තෙම ගර්ජනා සහිත වේද, නොවසින්නේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් කියන්නේ වේද නොකරන්නේ වේද, මහණෙනි,

ගර්ජනා කරණ ලද නොවසින ලද වලාකුලක් යම්සේ නම් මම මේ පුද්ගලයා එබඳු යයි කියමි.

4. "වසිනලද ගර්ජනා නොකරණලද පුද්ගලයා කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් කරන්නේ වේද නොකියන්නේ වේද, මහණෙනි, මේ පුද්ගල තෙම මෙසේ වසින්නේ වේ, ගර්ජනා නොකරන්නේ වේ. මහණෙනි, වසින්නාවූ ගර්ජනා නොකරන්නාවූ ඒ වලාකුල යම්සේද? මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි.

5. "මහණෙනි, කෙසේනම් පුද්ගල තෙම ගර්ජනා නොකරන්නේ වේද නොවසින්නේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් නොකියන්නේත් වේද, නොකරන්නේත් වේද, මහණෙනි, මෙබඳු පුද්ගල තෙම ගර්ජනා නොකරන්නේ වේ නොවසින්නේ වේ. මහණෙනි, ගර්ජනා නොකරණ නොවසින ඒ වලාකුල යම්සේද, මහණෙනි, මේ පුද්ගලයා එබඳු යයි කියමි.

6. "මහණෙනි, කෙසේනම් පුද්ගල තෙම ගර්ජනා කරණ ලද්දේද වසින ලද්දේද වේද, මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් කියන්නේද කරන්නේ වේද, මහණෙනි, මෙබඳු පුද්ගල තෙම ගර්ජනා කරන්නේද වසින්නේද වේ. මහණෙනි, ගර්ජනා කරන්නාවූද වසින්නාවූද, ඒ වලාකුල යම්සේද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු යයි කියමි. මහණෙනි, මේ වලාකුල්වලට උපමා ඇති පුද්ගලයන් සතර දෙන ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්."

2. **දුතිය වලාහකොපම සූත්‍රය**:- 1. (මේ ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 2 ඡෙදය මෙනි.)

2. "මහණෙනි, ගර්ජනා කරණ නොවසින පුද්ගලයා කවරේද?

3. "මහණෙනි. මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සූත්‍ර, ගාථා මිශ්‍ර සූත්‍ර, නිර්ගාථක සූත්‍ර, ගාථා, ප්‍රීතිය පෙන්වූ ධර්ම, නිදානය නැති සූත්‍ර පූර්වාපදාන, පුදුම වියයුතු ධර්ම, බලවත් සතුටින් දෙසූ ධර්ම ඉගෙණගනිත්.

4. "හෙතෙම මේ දුකයයි තත්වූ පරිද්දෙන් නොදනී. මේ දුක් ඉපදීමට හෙතුවයයි තත්වූ පරිද්දෙන් නොදනී මේ දුක්ඛ නිරොධය යයි තත්වූ පරිද්දෙන් නොදනී. මේ දුක්ඛ නිරොධ ගාමිනී ප්‍රතිපදාව යයි තත්වූ පරිද්දෙන් නොදනී.

5. "මහණෙනි, මෙසේ පුද්ගල තෙම ගර්ජනා කරන්නේය නොවසින්නේය. මහණෙනි, යම්සේ ඒ වලාකුලක් ගර්ජනා කරන ලද්දේ නොවසින ලද්දේද, මම මේ පුද්ගලයා එබඳු යයි කියමි.

"මහණෙනි, වසින ගර්ජනා නොකරණ පුද්ගලයා කවරේද?"

6. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සූත්‍ර ගාථා මිශ්‍ර සූත්‍ර නිර්ගාථක සූත්‍ර ගාථා ප්‍රීතිය පෙන්වූ ධර්ම, නිදාන නැති සූත්‍ර, පූර්වාපදාන, පුදුම වියයුතු ධර්ම ඉගෙන නොගනිත්.

7. "හෙතෙම මේ දුකයයි තත්වූ පරිද්දෙන් දනීද, මේ දුක් ඉපදීමට හෙතුවයයි තත්වූ පරිද්දෙන් දනීද, මේ දුක්ඛ නිරොධ යයි තත්වූ පරිද්දෙන් දනීද, මේ දුක්ඛ නිරොධ ගාමිනී ප්‍රතිපදාව යයි තත්වූ පරිද්දෙන් දනීද,

8. "මහණෙනි, මෙසේ පුද්ගල තෙම වසින ලද්දේ ගර්ජනා නොකරණ ලද්දේය. මහණෙනි, ඒ වලාකුලක් වර්ෂා කරණ ලදද ගර්ජනා නොකරණ ලදද, මම මේ පුද්ගලයා එබඳු යයි කියමි.

"මහණෙනි, ගර්ජනා නොකරණ නොවසින පුද්ගලයා කවරේද?"

9. "මහණෙනි. මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා උදාන ඉතිවුත්තක ජාතක අබ්භූත ධම්ම වෙදල්ල සංඛ්‍යාත ධර්මය ඉගෙන නොගනිත්ද,

10. (මේ ඡෙදය මේ සූත්‍රයේ 4 ඡෙදය මෙනි.)

11. මහණෙනි, මෙසේ පුද්ගලතෙම ගර්ජනා නොකරණ ලද්දේද නොවසින ලද්දේද වේ. මහණෙනි, ගර්ජනා නොකරණ නොවසින වලාකුල යම්සේද, මහණෙනි, මම ඒ පුද්ගලයා මෙබඳු යයි කියමි.

"මහණෙනි, ගර්ජනා කරණලද වසින ලද පුද්ගලයා කවරේද?

12. (මේ ඡෙදය මේ සූත්‍රයේ 3 ඡෙදය මෙනි.)

13. (මේ ඡෙදය මේ සූත්‍රයේ 7 ඡෙදය මෙනි.)

14. මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම ගර්ජනා කරණ ලද්දේද වසින ලද්දේද වේ. මහණෙනි, ගර්ජනා කරණ ලද වසින ලද වලාකුල යම්සේද, මහණෙනි, මේ පුද්ගලයා එබඳුයයි කියමි. මහණෙනි, වලාකුලට උපමා ඇති මේ පුද්ගලයන් සතරදෙනෙක් ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්."

3. **කුම්භොපම සූත්‍රයः-** 1. 'මහණෙනි, මේ කළ සතරක් වෙත්. කවර සතරක්ද යත්. හිස් වැසූ කළය, පිරුණු නොවැසූ කළය, හිස් නොවැසූ කළය, පිරුණු වැසූ කළය, මේ කළ සතර වෙත්. මහණෙනි, එසේම මේ කළ සතරට සමානවූ පුද්ගලයෝ ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්. කවර සතර දෙනෙක්ද යත්. හිස් වැසුණු, පිරුණු නොවැසුණු හිස් නොවැසුණු, පිරුණු වැසුණු වෙත්. මහණෙනි, හිස් වැසුණු පුද්ගලයා කවරේද?

2. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙකුට ඉදිරියට යාම, ආපසු ඒම, ඉදිරිපිට බැලීම, වටපිට බැලීම, හැකිලවීම, දිග හැරීම, සඟල පා සිවුරු දැරීම, ප්‍රසාදයට සුදුසුවේද?

3. "හෙතෙම මේ දුකයයි තත්වූ පරිද්දෙන් නොදනීද, මේ දුක් ඉපදීමට හේතුවයයි තත්වූ පරිද්දෙන් නොදනීද, මේ දුක් නැති කිරීමයයි තත්වූ පරිද්දෙන් නොදනීද, මේ දුක් නැති කිරීමට යන ප්‍රතිපදාවයයි තත්වූ පරිද්දෙන් නොදනිත්ද,

4. "මහණෙනි, මෙසේ පුද්ගලතෙම හිස්ය. වැසීය. මහණෙනි, යම්සේ ඒ කළය හිස්ද වැසීද මහණෙනි, මම ඒ පුද්ගලයා මෙබඳුයයි කියමි.

"මහණෙනි, කෙසේ පුද්ගලතෙම පිරුණේ විවෘතවූයේ වේද?

5. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙකුගේ ඉදිරියට යාම, ආපසු ඒම, ඉදිරිපිට බැලීම, වටපිට බැලීම, හැකිලවීම, දිග හැරීම, සඟල පා සිවුරු දැරීම, ප්‍රසාදයට සුදුසු නොවේද?

6. "හෙතෙම මේ දුකයයි තත්වූ පරිද්දෙන් දනී, මේ දුක් නැති කිරීමට හේතුවයයි තත්වූ පරිද්දෙන් දනී, මේ දුක් නැති කිරීමයයි තත්වූ පරිද්දෙන් දනී, මේ දුක් නැති කිරීමට යන ප්‍රතිපදාවයයි තත්වූ පරිද්දෙන් දනී.

7. "මහණෙනි, මෙසේ පුද්ගලතෙම පිරුණේ විවෘත වූයේ වේ. මහණෙනි, යම්සේ ඒ කළය පිරුණේ විවෘතවූයේ වේද? මේ පුද්ගලයා එබඳුයයි කියමි.

"මහණෙනි, කෙසේ පුද්ගලතෙම හිස්ද විවෘතවූයේ වේද?

8. (මේ ඡේදය මේ සූත්‍රයේ 5 ඡේදය මෙනි)

9. (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි)

10. "මහණෙනි, මෙසේ පුද්ගලතෙම තුච්ඡද විවටදවේ. මහණෙනි, යම්සේ ඒ කළය හිස්ද විවෘතද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි.

"මහණෙනි, කෙසේ පුද්ගලතෙම පිරුනේද, වැසුනේ වේද?

11. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

12. (මේ ඡේදය මේ සූත්‍රයේ 6 ඡේදය මෙනි.)

13. "මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම පිරුණේද වැසුනේද වේ. මහණෙනි, ඒ කළය පිරුනේ වැසුනේ යම් සේද, මහණෙනි. මම මේ පුද්ගලයා එබඳුයයි කියමි. මහණෙනි කළයට උපමා ඇති මේ සතර පුද්ගලයෝ ලොකයෙහි ඇත්තාහ විද්‍යමාන වෙත්."

4. **රහද චතුක්ක සූත්‍රය**:- 1. "මහණෙනි, මේ දියවිල් සතරක් වෙත්. කවර සතරක්ද යත්? නොගැඹුරුවූ ගැඹුරු පෙනීමක් ඇති එකෙක, ගැඹුරුවූ නොගැඹුරු පෙනීම ඇති එකෙක,

නොගැඹුරුවූ නොගැඹුරු පෙනීම ඇති එකෙක, ගැඹුරුවූ ගැඹුරු පෙනීම ඇති එකෙක. මහණෙනි, මේ සතර දිය විල් වෙත්. මහණෙනි, එසේ විල් ජලයට බඳු උපමා ඇති පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්. කවර සතර දෙනෙක්ද යත්. නොගැඹුරු ගැඹුරු පෙනීමක් ඇති, ගැඹුරු නොගැඹුරු පෙනීම ඇති, නොගැඹුරු නොගැඹුරු පෙනීම ඇති, ගැඹුරු ගැඹුරු පෙනීම ඇති, පුද්ගලයාය යන සතරදෙනය."

**5. රහදොපම සූත්‍රයː-** 1. "මහණෙනි, කෙසේ පුද්ගල තෙම නොගැඹුරුවූයේ ගැඹුරු පෙනීමක් ඇත්තේද?

**2, 3.** (මේ ඡෙදය මේ වර්ගයේ 3 සූත්‍රයේ 2, 3 ඡෙද මෙන් වෙත්.)

**4.** "මහණෙනි, මෙසේ වනාහි පුද්ගල තෙම නොගැඹුරු වූයේ ගැඹුරු පෙනීමක් ඇත්තේය. මහණෙනි, ඒ දියවිල නොගැඹුරු වූයේ ගැඹුරු පෙනීමක් ඇත්තේ යම්සේද මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි.

"මහණෙනි, පුද්ගලතෙමේ කෙසේ ගැඹුරුවේද නොගැඹුරු පෙනීමක් ඇත්තේද?

**5, 6.** (මේ ඡෙදය මේ වර්ගයේ 3 සූත්‍රයේ 5, 6 ඡෙද මෙන් වෙත්)

**7.** "මහණෙනි, මෙසේ පුද්ගලතෙම ගැඹුරුවේ. නොගැඹුරු පෙනීමක් ඇත්තේවේ. මහණෙනි, ගැඹුරු නොගැඹුරු පෙනීම ඇති ඒ දියවිල යම්සේද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි.

"මහණෙනි, කෙසේ පුද්ගලතෙම නොගැඹුරුවේද නොගැඹුරු පෙනීම ඇත්තේ වේද?

**8.** (මේ ඡෙදය මේ වර්ගයේ 3 සූත්‍රයේ 5 ඡෙදය මෙනි.)

**9.** (මේ ඡෙදය මේ වර්ගයේ 3 සූත්‍රයේ 3 ඡෙදය මෙනි)

**10.** "මහණෙනි, මෙසේ පුද්ගල තෙම නොගැඹුරුවේ. නොගැඹුරු පෙනීම ඇත්තේ වේ. මහණෙනි, යම්සේ නොගැඹුරු

නොගැඹුරු පෙනීම ඇති දියවිල යම්සේද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි.

"මහණෙනි, ගැඹුරුවූ ගැඹුරු පෙනීම ඇති පුද්ගලයා කවරේද?

11. (මේ ඡේදය මේ වර්ගයේ 3 සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

12. (මේ ඡේදය මේ වර්ගයේ 3 සූත්‍රයේ 6 ඡේදය මෙනි.)

13. "මහණෙනි, මෙසේ පුද්ගලතෙම ගැඹුරුවේ, ගැඹුරු පෙනීම ඇත්තේවේ. මහණෙනි, ගැඹුරුවූ ගැඹුරු පෙනීම ඇති දියවිලක් යම්සේද මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු යයි කියමි. මහණෙනි, මේ දිය විලකට බඳු උපමා ඇති සතර පුද්ගලයෝ ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්."

**6. අම්බොපම සූත්‍රය**:- 1. "මහණෙනි, මේ අඹ සතරක් වෙත්. කවර සතරක්ද යත්. නොපැසුණු පැසුන පාට ඇති එකක, පැසුණ අමුපාට එකකි, අමු අමුපාට එකකි, පැසුණු පැසුණ පාට එකකි, මහණෙනි, මේ සතර අඹය. මහණෙනි, එසේම අඹ වලට බඳු උපමා ඇති පුද්ගලයන් සතරදෙනෙක් ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්. කවර සතරදෙනෙක්ද යත්?

2. අමු පැසුණ පාට ඇති පුද්ගලයාය. පැසුණු අමු පාට ඇති පුද්ගලයාය. නොපැසුණු පැසුන පාට ඇති පුද්ගලයාය. පැසුණු පැසුන පාට ඇති පුද්ගලයාය. මහණෙනි, කෙසේ පුද්ගලතෙම නොපැසුණු පැසුණු පාට ඇත්තේද?

3, 4. (මේ ඡේද මේ වර්ගයේ 3 සූත්‍රයේ 2, 3 ඡේද මෙන් වෙත්.)

5. "මහණෙනි, මෙසේ පුද්ගලතෙම අමුවූයේ පැසුණු වර්ණ ඇත්තේ වේ. මහණෙනි, අමුවූ පැසුණු පාට ඇති අඹයක් යම්සේද මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි.

"මහණෙනි, කෙසේ පුද්ගලතෙම පැසුනේ අමු පාට ඇත්තේ වේද?

6-7. (මේ ඡේද මේ වර්ගයේ 3 සූත්‍රයේ 5, 6 ඡේද මෙන් වෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

8. "මහණෙනි, මෙසේ පුද්ගලතෙම පැසුනේ අමු පාට ඇත්තේවේ. මහණෙනි, පැසුණු අමුපාට ඇති අඹයක් යම් සේද මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි.

"මහණෙනි, කෙසේ පුද්ගලතෙම අමුවූයේම අමු පාට ඇත්තේ වේද?

9. (මේ ඡෙදය මේ වර්ගයේ 3 සූත්‍රයේ 5 ඡෙදය මෙනි.)

10. (මේ ඡෙදය මේ වර්ගයේ 3 සූත්‍රයේ 3 ඡෙදය මෙනි.)

11. "මහණෙනි, මෙසේ පුද්ගලතෙම අමුවේ, අමුපාට ඇත්තේ වේ, මහණෙනි, අමු අමුපාට ඇති අඹයක් යම්සේද මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි.

"මහණෙනි, කෙසේ පුද්ගලතෙම පැසුනේ පැසුණු පාට ඇත්තේ වේද?

12. (මේ ඡෙදය මේ වර්ගයේ 3 සූත්‍රයේ 2 ඡෙදය මෙනි.)

13. (මේ ඡෙදය මේ වර්ගයේ 3 සූත්‍රයේ 6 ඡෙදය මෙනි)

14. "මහණෙනි, පැසුණු පැසුණුපාට ඇති අඹගෙඩියක් යම්සේද මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි. මහණෙනි, මේ අඹ සතරකට උපමා ඇති පුද්ගලයෝ ලොකයෙහි ඇත්තාහ විද්‍යමාන වෙත්."

7. **මූසිකොපම සූත්‍රය**:- 1. "මහණෙනි, මේ මීයෝ සතර දෙනෙක් වෙත්. කවර සතර දෙනෙක්ද යත්. ගුලක් කරණ එහි නොවසන එකෙක, ගුලක වාසය කරන ගුලක් නොහදන එකෙක, ගුලක් නොහදන වාසයද නොකරණ එකෙක, ගුලක් හදන එහි වාසයද කරණ එකෙක. මහණෙනි, මේ මීයෝ සතරදෙනය. මහණෙනි, එසේම මීයන්ට උපමා කළ හැකි මේ පුද්ගලයෝ සතරදෙනෙක් ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්. කවර සතර දෙනෙක්ද යත්. ගෙවල් හදන නොවසන එකෙක, වසන ගෙවල් නොහදන එකෙක, ගෙවල්ද නොහදන වාසයද නොකරණ එකෙක. ගෙවල් හදන වාසයද කරණ එකෙක. මහණෙනි, ගෙවල් හදන නොවසන පුද්ගලයා කවරේද?

2. (මේ ඡේදය මේ වර්ගයේ 2 සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

3. (මේ ඡේදය මේ වර්ගයේ 2 සූත්‍රයේ 4 ඡේදය මෙනි.)

4. "මහණෙනි, මෙබඳු පුද්ගලතෙම ගෙය කරන්නේය. එහි නොවසන්නේය. මහණෙනි, ගෙයක් හදන නොවසන මීයෝ යම්සේද මහණෙනි, මේ පුද්ගලයා එබඳු යයි කියමි.

"මහණෙනි, වසන ගෙවල් නොහදන පුද්ගලයා කවරේද?

5. (මේ ඡේදය මේ වර්ගයේ 2 සූත්‍රයේ 6 ඡේදය මෙනි.)

6. (මේ ඡේදය මේ වර්ගයේ 2 සූත්‍රයේ 7 ඡේදය මෙනි)

7. "මහණෙනි, පුද්ගලතෙම මෙසේ වසන්නේ වේ. ගෙයක් නොහදන්නේ වේ. මහණෙනි, වසන ගෙවල් නොහදන මීයා යම්සේද මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු යයි කියමි.

"මහණෙනි පුද්ගලතෙමේ කෙසේ ගෙයක් නොකරන්නේ වේද, නොවසන්නේවේද?

8. (මේ ඡේදය මේ වර්ගයේ 2 සූත්‍රයේ 6 ඡේදය මෙනි.)

9. මේ ඡේදය මේ වර්ගයේ 2 සූත්‍රයේ 4 ඡේදය මෙනි)

10. "මහණෙනි, මෙසේ පුද්ගලතෙම ගෙයක් නොහදන්නේ නොවසන්නේද වේ. මහණෙනි ගෙයක් නොහදන නොවසන මීයෝ යම්සේද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි.

"මහණෙනි, කෙසේ පුද්ගලතෙම ගෙය හදන්නේද වසන්නේදවේ.

11. (මේ ඡේදය මේ වර්ගයේ 2 සූත්‍රයේ 3 ඡේදය මෙනි)

12. (මේ ඡේදය මේ වර්ගයේ 2 සූත්‍රයේ 7 ඡේදය මෙනි.)

13. "මහණෙනි, මෙසේ පුද්ගලතෙම ගෙයක් කරන්නේද වසන්නේද වේ. මහණෙනි, ගෙයක් කරන්නාවූද, වසන්නා වූද, මීයා යම්සේද, මහණෙනි, මේ පුද්ගලයා එබඳුයයි කියමි. මහණෙනි, මූසිකයන්ට උපමා ඇති මේ පුද්ගලයෝ සතරදෙන ලොකයෙහි ඇත්තාහ, විද්‍යමානවෙත්."

**8. බලිවද්දොපම සූත්‍රය:-** 1. "මහණෙනි, මේ ගවයෝ සතරදෙනෙක් වෙත්. කවර සතර දෙනෙක්දයත්, ස්වකීය ගවයන්ට සැර, පිටගවයන්ට සැර නැති එකෙක, පිට ගවයන්ට සැර, ස්වකීය ගවයන්ට සැරනැති එකෙක, ස්වකීය ගවයන්ට සැර පිටගවයන්ට සැර එකෙක, ස්වකීය ගවයන්ටත් පිට ගවයන්ටත් සැර නැති එකෙක මහණෙනි, මේ ගවයන් සතර දෙනාය.

"මහණෙනි, එසේම ගවයන්ට උපමා ඇති පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි ඇත්තාහ, විද්‍යමානවෙත්. කවර සතර දෙනෙක්දයත්, සගවචණ්ඩවූ, පරගවචණ්ඩ නොවූද, පරගව චණ්ඩද සගවචණ්ඩ නොවූද, සගවචණ්ඩද පරගවචණ්ඩද, සගවචණ්ඩනුවූද, පරගවචණ්ඩ නොවූද, යන සතරදෙනාය.

"මහණෙනි, කෙසේ පුද්ගලතෙම සඝවචණ්ඩවේද පරගව චණ්ඩ නොවේද?

**2.** "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ස්වකීය පිරිසට සැරඵරුෂවේද, අනුන්ට ඵරුෂනොවේද, මහණෙනි, මෙවැනි පුද්ගලතෙම සගව චණ්ඩද, පරගව චණ්ඩ නොවූයේද වේ. මහණෙනි. යම්සේ සගවචණ්ඩවූ පරගව චණ්ඩනොවූ ගවයා යම්සේද, මහණෙනි, මේ පුද්ගලයා එබඳු යයි කියමි.

3. "මහණෙනි, කෙසේ පුද්ගලතෙම පරගවචණ්ඩවේද සගවචණ්ඩ නොවේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් පිට පිරිසට සැරඵරුෂද, සිය පිරිසට සැරඵරුෂ නොවේද මහණෙනි, මෙවැනි පුද්ගලතෙම පරගව චණ්ඩය. සගවචණ්ඩනොවේ. මහණෙනි, පරගව චණ්ඩවූ සගවචණ්ඩ නොවූ ගවයා යම්සේද මහණෙනි, මේ පුද්ගලයා එබඳුයයි කියමි.

4. "මහණෙනි, කෙසේ පුද්ගලතෙම සගවචණ්ඩවේද, පරගවචණ්ඩවේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සිය පිරිසටද චණ්ඩද, ඵරුෂද, පිට පිරිස්වලට චණ්ඩද, ඵරුෂද මෙබඳු පුද්ගලතෙම සගවචණ්ඩද, පරගවචණ්ඩද වේ. මහණෙනි, සගවචණ්ඩ පරගවචණ්ඩ ගවයා යම්සේද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි.

**5.** "මහණෙනි, පුද්ගලතෙම කෙසේ සගවචණ්ඩත් නොවේද, පරගවචණ්ඩත් නොවේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමන්ගේ පිරිසද අනුන්ගේ පිරිසද උද්වෙගයට පමුණුවන්නාහු නොවෙත්ද, මහණෙනි, එසේම පුද්ගලතෙම සගව චණ්ඩත් නොවේ. පරගව චණ්ඩත් නොවේ. මහණෙනි, සගවචණ්ඩ නොවූ පරගවචණ්ඩ නොවූ ගවයා යම්සේද, මහණෙනි, මේ පුද්ගලයා එබඳුයයි කියමි. මහණෙනි, ගවයන්ට උපමා ඇති පුද්ගලයෝ සතරදෙන ලොකයෙහි ඇත්තාහ. විද්‍යමානවෙත්."

**9. රුක්ඛොපම සූත්‍රයː-** 1. "මහණෙනි, මේ වෘක්ෂයෝ සතරදෙනෙක් වෙත්. කවර සතරදෙනෙක්දයත්, ඵලය පිරිවර කොට ඇති ඵලය, හරය පිරිවරකොට ඇති ඵලය, ඵලය පිරිවර කොට ඇති හරය, හරය පිරිවරකොට ඇති හරය, යන සතර දෙනයි. මහණෙනි, එසේම වෘක්ෂයට බඳු උපමා ඇති පුද්ගලයන් සතරදෙනෙක් ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්. කවර සතරදෙනෙක්ද යත්, ඵලය පිරිවරකොට ඇති ඵලය, හරය පිරිවරකොට ඇති ඵලය, ඵලය පිරිවරකොට ඇති හරය, හරය පිරිවරකොට ඇති හරය යන සතරදෙනයි. මහණෙනි, පුද්ගල තෙමේ කෙසේ ඵලය පිරිවරකොට ඇති ඵලය වේද?

**2.** "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් දුශ්ශීලවේද, ලාමක ස්වභාව ඇත්තේවේද, ඔහුගේ පිරිසඳ දුශ්ශීලද ලාමක ස්වභාව ඇත්තේද, මහණෙනි මෙබඳු පුද්ගලතෙම ඵලය පිරිවරකොට ඇති ඵලයවේ, මහණෙනි, ඵලය පිරිවරකොට ඇති ඵලය යම්සේද මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි.

**3.** "මහණෙනි, කෙසේනම් පුද්ගලතෙම හරය පිරිවර කොට ඇති ඵලයවේද, මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් දුශ්ශීලද ලාමක ස්වභාව ඇත්තේද ඔහුගේ පිරිස්තොමෝ සිල්වත් ද යහප් ස්වභාව ඇත්තේද, මහණෙනි, මෙසේ පුද්ගලතෙම හරය පිරිවරකොට ඇති ඵලය වේද, මහණෙනි, හරය පිරිවරකොට ඇති ඵලය ඇති වෘක්ෂය යම් සේද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි.

4. "මහණෙනි, කෙසේ නම් පුද්ගලතෙම එලය පිරිවර කොට ඇති හරයවේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සිල්වත් ද, යහපත් ස්වභාව ඇත්තේද ඔහුගේ පිරිස දුශ්ශීලද ලාමක ස්වභාව ඇත්තේද, මහණෙනි, මෙසේ පුද්ගලතෙම එලය පිරිවරකොට ඇති හරයවේ. මහණෙනි, ඒ වෘක්ෂයක් එලය පිරිවරකොට ඇති හරයවේද, මහණෙනි, මේ පුද්ගලයා එබඳුයයි කියමි.

5. "මහණෙනි, හරය පිරිවරකොට ඇති හරය සමාන පුද්ගලයා කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සිල්වත්ද යහපත් ස්වභාව ඇත්තේද, ඔහුගේ පිරිසද සිල්වත්ද, යහපත් ස්වභාව ඇත්තේද, මහණෙනි, මෙසේ පුද්ගලතෙම හරය පිරිවරකොට ඇති හරයවේ. මහණෙනි, හරය පිරිවරකොට හරය ඇති වෘක්ෂය යම්සේද, මහණෙනි, මේ පුද්ගලයා එබඳුයයි කියමි. මහණෙනි, මේ සතර වෘක්ෂයන්ට උපමා ඇති පුද්ගලයෝ ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්."

10. **ආශිර්විසෝපම සූත්‍රයː**- 1. "මහණෙනි, මේ ආශිර්විෂයෝ ((සර්පයෝ) සතර දෙනෙක් වෙත්. කවර සතර දෙනෙක්ද යත්, පැමිණි විෂ ඇති ඝොර විෂ නැති සර්පයාය, ඝොර විෂ ඇති පැමිණි විෂ නැති සර්පයාය, පැමිණි විෂද ඇති දරුණු විෂද ඇති සර්පයාය, පැමිණි විෂද නැති දරුණු විෂද නැති සර්පයාය, මහණෙනි, මේ සතර සර්පයෝය. මහණෙනි, එසේම සර්පයන්ට උපමා ඇති පුද්ගලයෝ සතරදෙනෙක් ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්. කවර සතරදෙනෙක්දයත්,

2. "වැදුන විෂ ඇති දරුණු විෂ නැති පුද්ගලයාය. දරුණු විෂ ඇති වැදුන විෂ නැති පුද්ගලයාය, වැදුන විෂද දරුණු විෂද ඇති පුද්ගලයාය. වැදුන විසත් දරුණු විසත් නැති පුද්ගලයාය යන සතරදෙනය. මහණෙනි, පැමිණි විෂ ඇති දරුණු විෂ නැති පුද්ගලයා කවරේද?

3. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් වහා කිපෙයිද ඒ ක්‍රොධය බොහෝ වේලාවක් නොපවතීද, මහණෙනි, මෙබඳු පුද්ගලතෙම පැමිණි විෂ ඇති ඝොර විෂ නැති

පුද්ගලයාය. මහණෙනි, පැමිණි විෂ ඇති, දරුණුවිෂ නැති සර්පයා යම්සේද, මහණෙනි, මේ පුද්ගලයා එබඳුයයි කියමි.

4. "මහණෙනි, කෙසේනම් පුද්ගලතෙම දරුණු විෂ ඇත්තේවේද? පැමිණිවිෂ නැත්තේවේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් වහා නොකිපෙයි. ඔහුගේ ඒ ක්‍රොධය බොහෝ කලක් පවතී. මහණෙනි, මෙබඳු පුද්ගල තෙම දරුණු විෂ ඇත්තේවේ. පැමිණිවිෂ නැත්තේවේ. මහණෙනි, දරුණු විෂ ඇති වැදුනුවිෂ නැති සර්පයා යම්සේද, මහණෙනි මම මේ පුද්ගලයා එබඳුයයි කියමි.

5. "මහණෙනි, පැමිණිවිෂද ඇති දරුණු විෂද ඇති පුද්ගලයා කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් වහා කිපේද, ඔහුගේ ඒ ක්‍රොධය බොහෝ කලක් පවතී. මහණෙනි මෙබඳු පුද්ගලතෙම පැමිණි විෂ ඇත්තේද දරුණු විෂ ඇත්තේද වේ. මහණෙනි, පැමිණි විෂද දරුණු විෂද ඇති සර්පයා යම්සේද මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු යයි කියමි.

6. "මහණෙනි. පුද්ගලතෙම කෙසේ පැමිණි විෂ නැත්තේ වේද, දරුණු විෂ නැත්තේ වේද, මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් වහා නොකිපෙයි. ඔහුගේ ඒ ක්‍රොධය බොහෝ වේලාවක් නොපවතී. මහණෙනි මෙසේ පුද්ගලතෙම පැමිණිවිෂ නැත්තේද දරුණුවිෂ නැත්තේදවේ, මහණෙනි, පැමිණි විෂ නැති, දරුණුවිෂ නැති සර්පයකු යම් සේ ද, මහණෙනි. මම මේ පුද්ගලයා එබඳුයයි කියමි. මහණෙනි, මේ ආශිර්විෂයන්ට බඳු උපමා ඇති පුද්ගලයෝ සතරදෙන ලොකයෙහි ඇත්තාහ, විද්‍යමානවෙත්."

(එකොළොස්වෙනි වළාහක වර්ගය නිමි.)

---

## 12. කෙසී වර්ගය.

11. **කෙසී සූත්‍රය**:- 1. ඉක්බිති කෙසී නම් අශ්වයන් දමනය කරන්නා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එහි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත් පසෙක

සිටියේය. එකත්පසෙක සිටි කෙසී නම් අශ්වයන් දමනය කරන්නාට භාග්‍යවතුන් වහන්සේ "කෙසිය, ඔබ ප්‍රසිද්ධ අශ්වයන් දමනය කරන්නෙක් වෙහිය. ඔබ කෙසේ වනාහි දමනය කටයුතු අශ්වයන් හිස්මවන්නෙහිදැ"යි ඇසූසේක.

2. "ස්වාමීනි, මම දමනය කළයුතු අශ්වයකු මෘදුකමින්ද ඵරුෂකමින්ද, මෘදු ඵරුෂකමින්ද, හික්මවමි."

"කෙසිය, ඉදින් තොප විසින් දමනය කළයුතු අශ්වයා මෘදුකමින් හික්මීමට නොපැමිණේද, ඵරුෂකමින්ද හික්මීමට නොපැමිණේද, මෘදු ඵරුෂකමින් හික්මීමට නොපැමිණේද, ඔහුට කුමක් කරන්නෙහිද?"

"ස්වාමීනි, ඉදින් මගේ දමනය කළයුතු අශ්වයා මෘදුකමින් හික්මීමට නොපැමිණේද ඵරුෂකමින් හික්මීමට නොපැමිණේද මෘදුකමින් හා ඵරුෂකමින් හික්මීමට නොපැමිණේද, ස්වාමීනි, ඔහු නසමි. ඊට හේතු කවරේද? මාගේ ආචාර්ය කුලයට අවනම්බුවක් නොවේවා කියායි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ නිරුත්තර පුරුෂයන් හික්මවන්නෙකි. කෙසේ වනාහි ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කෙසේ දමනය කළයුතු පුරුෂයන් හික්මවන්නේද?"

3. "කෙසීය, මම දමනය කළයුතු පුරුෂයන් මෘදුකමින්ද හික්මවමි. ඵරුෂකමින්ද හික්මවමි. මෘදු ඵරුෂ කමින්ද හික්මවමි.

"කාය සුචරිතය මෙසේය, කාය සුචරිතයාගේ විපාකය මෙසේය, වචී සුචරිතය මෙසේය, වචී සුචරිතයාගේ විපාකය මෙසේය. මනො සුචරිතය මෙසේය, මනොසුචරිතයාගේ විපාකය මෙසේය.

"දෙවියෝ මෙසේය, මනුෂ්‍යයෝ මෙසේය කෙසීය, මෙය මෘදුකමය, කාය දුශ්චරිතය මෙසේය, කායදුශ්චරිතයාගේ විපාකය මෙසේයි, වාග් දුශ්චරිතය මෙසේයි, වාග්දුශ්චරිතයාගේ විපාකය මෙසේයි, මනොදුශ්චරිතය මෙසේයි. මනොදුශ්චරිතයාගේ විපාකය මෙසේයි, නිරය මෙසේයි, තිරිසන් යොනිය මෙසේය, ප්‍රේත නිකාය මෙසේය, කෙසීය, මෙය එහි මෘදුකම හා ඵරුෂකමය.

**4.** "කායසුචරිතය මෙසේය, කායසුචරිතයාගේ විපාකය මෙසේය. කායදුශ්චරිතය මෙසේය, කායදුශ්චරිතයාගේ විපාකය මෙසේය. වාග්සුචරිතය මෙසේය, වාග්සුචරිතයාගේ විපාකය මෙසේය, වාග්දුශ්චරිතය මෙසේය, වාග්දුශ්චරිතයාගේ විපාකය මෙසේය, මනො සුචරිතය මෙසේය, මනො සුචරිතයාගේ විපාකය මෙසේය, මනොදුශ්චරිතය මෙසේය, මනොදුශ්චරිතයාගේ විපාකය මෙසේය,

"දෙවියෝ මෙසේය, මනුෂ්‍යයෝ මෙසේය, නරකය මෙසේය, තිරිසන් යොනිය මෙසේය, ප්‍රෙතයොනිය මෙසේය."

**5.** "ස්වාමීනි, නුඹවහන්සේගේ දමනය කළයුතු පුද්ගලයා මෘදුකමින් හික්මීමට නොයාද, භාග්‍යවතුන් වහන්සේ ඔහුට කුමක් කරන්නේද?

"කෙසීය, ඉදින් මගේ දමනය කළයුතු පුරුෂයා මෘදු කමින් හික්මීමට නොයයිද, ඵරුෂකමින් හික්මීමට නොයයිද, මෘදුකමින් හා ඵරුෂකමින් හික්මීමට නොයයිද, කෙසීය, ඔහු නසමි."

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේට සතුන් මැරීම නොකැප නොවේද?"

**6.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "කෙසීය, මම ඔහු නසමියි" වදාළසේක. "කෙසීය, සත්‍යය, භාග්‍යවත්හට සතුන් මැරීම අකැපය, එසේ නමුදු දමනය කළයුතු ඒ පුරුෂතෙම මෘදුකමින් හික්මීමට නොයයිද, ඵරුෂකමින් හික්මීමට නොයයිද, මෘදුකමින් හා ඵරුෂකමින් හික්මීමට නොයයිද, තථාගතයන් වහන්සේ ඔහු කිවයුතුකොට අනුශාසනා කළ යුතු කොට හඟියි, නුවණැති සබ්‍රම්සරුන් නොකිවයුතුකොට අනුසාසනා නොකළයුතු කොට සිතත්ද, යමෙක් තථාගතයන් වහන්සේ නොකිවයුතුකොට අනුශාසනා නොකළයුතුකොට සිතයිද, නුවණැති සබ්‍රම්සරුන් කිවයුතුකොට අනුශාසනා කළයුතුකොට සිතත්ද, කේසිය, මෝ තොමෝ ආර්යවිනයෙහි වධය."

**7.** "යමෙකු තථාගතයන් වහන්සේ කිවයුතුකොට අනුශාසනා කළයුතුකොට නොසිතත්ද, නුවණැති සබ්‍රහ්මචාරීහු

කිවයුතුකොට අනුශාසනා කළයුතුකොට නොසිතත්ද, ස්වාමීනි, හෙතෙම ඒකාන්තයෙන් වධයට පැමිණියෙක් වේ.”

8. (මේ ඡේදය අසුර වර්ගයේ 51 සූත්‍රයේ 6 ඡේදය මෙනි.)

12. **අජ්ජව සූත්‍රයː-** 1. “මහණෙනි, අංග සතරකින් යුත් රජහුගේ යහපත් ආජානෙය අශ්වයා රජුට සුදුසුවේ. රාජභොගය රජුට අග්‍රය යන සංඛ්‍යාවට යයි. කවර සතරකින්ද යත්, ඍජු බැවින්ද, පාදවෙගයෙන්ද, ඉවසීමෙන්ද, පිරිසිදු ස්වභාවයෙන්ද, මහණෙනි, මේ සතර අංගයෙන් යුක්ත රජහුගේ යහපත් ආජානෙය අශ්වයා රජුට සුදුසුවේ. රාජභොගවේ. රජුට අග්‍රය, යන සංඛ්‍යාවට යේ. මහණෙනි, එසේම අංගසතරකින් යුත් මහණතෙම දුරසිට අවුත් පිදීමට යොග්‍යවේ. ඈතට ගෙනයනදේ ගෙනවුත් පිදීමට යොග්‍යවේ. දක්ෂිණාවට සුදුසුවේ. අංජලීකරණය හෙවත් දෑත් හිසතබා වැඳීමට යොග්‍යවේ.

ලොකයාගේ නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍රය, කවරසතරකින්දයත්, උජුභාවයෙන්, ඤාණජවයෙන් ඉවසීමෙන් සිල්වත්කමින් යන සතරිනි. මහණෙනි, මේ අංග සතරින් යුක්ත මහණතෙම දුර සිට අවුත් පිදීමට යොග්‍යවේ. ඈතට ගෙනයන දේ ගෙනවුත් පිදීමට යොග්‍යවේ. දක්ෂිණාවට සුදුසුවේ. අංජලීකරණය හෙවත් දෑත් හිස තබා වැඳීමට යෝග්‍යවේ. ලොකයාගේ නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍රය.

2. “මහණෙනි, මේ යහපත් ආජානෙය අශ්වයන් සතර දෙනෙක් ලොකයෙහි ඇත්තාහ. විද්‍යමානවෙත්. කවර සතර දෙනෙක්දයත්, මහණෙනි මේ ලෝකයෙහි ඇතැම් යහපත් ආජානෙය අශ්වයෙක් කෙවිටෙහි සෙවනැල්ල දැක කිමෙක්ද, ‘මට අද අශ්වදම්මසාරත්පීතෙම දඬුවම් කරන්නේද, ඊට මම කුමන ප්‍රතිකාරයක් කරම්දැ’යි දනී, සංවෙගයට පැමිණේ. මහණෙනි මෙලොකයෙහි ඇතැම් මෙබඳු යහපත් ආජානෙය අශ්වයෙක් වේ. මහණෙනි, මේ පළමුවෙනි යහපත් ආජානෙය අශ්වයා ලොකයෙහි ඇත්තාහ, විද්‍යමානවෙත්.

3. “මහණෙනි, නැවතද අනිකක් කියමි. මේ ලොකයෙහි ඇතැම් යහපත් ආජානෙය අශ්වයෙක් කෙවිටි සෙවනැල්ල දැක

දනී. සංවෙගයට පැමිණේ. වැලිදු රොමකූපයෙහි කැවිටේ ඇනයෙන් විදින්නේ දනී. සංවෙගයට පැමිණේ, 'කුමක් සඳහා මට අද අශ්වදම්ම සාරථීතෙම දඬුවම් කරන්නේද, ඊටම කවර ප්‍රතිකර්මයක් කරම්ද? මහණෙනි, මෙහි මෙබඳුවූ ඇතැම් යහපත් ආජානෙය අශ්වයෙක් වේ. මහණෙනි, මේ දෙවෙනි යහපත් ආජානෙය අශ්වයෙක් ලොකයෙහි ඇත්තාහ. විද්‍යමානවේ.

**4.** "නැවතද, මහණෙනි, මේ ලොකයෙහි යහපත් ආජානෙය අශ්වයෙක් කැවිටි සෙවනැල්ල දැක ගණන් නොගනී. සංවෙගයට නොපැමිණේ. රෝමකූපයෙහි කැවිටේ ඇනයෙන් විදුනේ ගණන් නොගනී. සංවේගයට නොපැමිණේ. එහෙත් සමෙහි ඇනයෙන් විදුනේ දනී. සංවෙගයට පැමිණේ. 'කිමෙක්ද, මා අද අශ්වදම්ම සාර්ථීතෙම දඬුවම් කරන්නේද, මම ඔහුට කවර ප්‍රතිකර්මයක් කරම්ද?' මහණෙනි, මේ ලොකයෙහි මෙබඳුවූ යහපත් ආජානෙය අශ්වයෙක් වේ. මහණෙනි, මේ තුන්වෙනි යහපත් ආජානෙය අශ්වයා ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්.

**5.** "මහණෙනි, නැවත මේ ලොකයෙහි ඇතැම් යහපත් ආජානෙය අශ්වයෙක් කැවිටි සෙවනැල්ල දැක ගණන් නොගනී. සංවෙගයට නොපැමිණේ. රොමකූපයෙහි විදින ලද්දේ ගනන් නොගනී. සංවෙගයට නොපැමිණේ. සම විදින ලද්දේ ගණන් නොගනී. එතකුදු වුවත් ඇට විදින ලද්දේ දනී. සංවෙගයට පැමිණේ. 'කුමක් සඳහා මා අද අශ්වදම්ම සාරථීතෙම දඬුවම් කරන්නේද, මම ඔහුට කවර ප්‍රතිකර්මයක් කරන්නේදැයි' සංවෙගයට පැමිණේ. මහණෙනි, මේ ලොකයෙහි මෙබඳුවූද යහපත් ආජානෙය අශ්වයෙක් වේ. මහණෙනි, මේ සතරවෙනි යහපත් ආජානෙය අශ්වයෙක් ලොකයෙහි ඇත්තාහ. විද්‍යමානවෙත්. මහණෙනි, මේ යහපත් සතර ආජානෙය අශ්වයෝ ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්.

**6.** "මහණෙනි, එසේම මේ යහපත් ආජානෙය පුරුෂයෝ සතරදෙනෙක් ලොකයෙහි ඇත්තාහ. විද්‍යමානවෙත්. කවර සතර දෙනෙක්ද යත්. මහණෙනි මේ ලොකයෙහි ඇතැම් යහපත්

ආජානෙය පුරුෂයෙක් අසවල් ගමෙහි හෝ නියම්ගමෙහි හෝ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ දුක්ඛිතය කියා හෝ කළුරිය කළේයයි කියා හෝ අසයි. හෙතෙම එයින් තැවෙයි, සංවෙගයට පැමිණෙයි. සංවෙගයට පැමිණියේ නුවණින් වීර්යකරයි. නිවණ කරා යොමු කළ ආත්ම ඇත්තේ නාම කයින්ද නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරයි. ප්‍රඥාවෙන්ද, විනිවිද දකී. මහණෙනි, ඒ යහපත් ආජානෙය අශ්වයා කෙවිට දැක යම්සේ තැවෙයිද, සංවෙගයට පැමිණේද, මහණෙනි, මම මේ යහපත් පුරුෂ ආජානෙයයා එබඳුයයි කියමි. මහණෙනි, මේ ලොකයෙහි මෙබඳුවූ යහපත් ආජානෙය පුරුෂයෙක්වේ. මහණෙනි මේ පළමුවෙනි යහපත් ආජානෙය පුරුෂතෙම ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්.

7. "මහණෙනි, නැවතද අනිකක් කියමි. මේ ලොකයෙහි යහපත් ආජානෙය පුරුෂයෙක් අසවල් ගමෙහි හෝ නියම්ගමෙහි හෝ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ දුකින් පෙලෙයි. කළුරිය කෙළේයයි නොඅසයි. නමුත් දුකට පත්, කළුරිය කළ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ තමාම දකී. හෙතෙම එයින් තැවෙයි. සංවෙගයට පැමිණෙයි. සංවෙග වූයේ නුවණින් සලකයි. නිවණට මෙහෙ වූ සිත් ඇත්තේ නාමකයින්ද ශ්‍රෙෂ්ඨ සත්‍යය ප්‍රත්‍යක්ෂ කරයි. ප්‍රඥාවෙන්ද විනිවිද දකී. මහණෙනි, යම්සේ යහපත් ආජානෙය අශ්වයෙක් රොමකූපයෙහි විදුම්කෑවේ, තැවෙයිද, සංවෙගයට පැමිණෙයිද, මහණෙනි, මේ යහපත් ආජානෙය පුරුෂයා එබඳුයයි කියමි. මහණෙනි, මෙබඳුවූද මේ ලොකයෙහි ඇතැම් ආජානෙය පුරුෂයෙක් වේ. මහණෙනි, මේ දෙවෙනි යහපත් පුරුෂාජානෙයයා ලොකයෙහි ඇත්තාහ, විද්‍යමානවෙත්.

8. "මහණෙනි, නැවතද අනිකක් කියමි. මේ ලොකයෙහි ඇතැම් යහපත් ආජානෙය පුරුෂයෙක් අසවල් ගමෙහි හෝ නියම්ගමෙහි හෝ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ දුකට පත්වූයේ කළුරිය කළේයයි නොඅසයි. දුකට පත්, කළුරියකළ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ හෙතෙමෙ දකී නැවතද ඔහුගේ නෑයෙක් හෝ සහ ලේ නෑයෙක් හෝ, දුකට පත්වූයේ හෝ, කළුරියකළේ හෝ වේද, හෙතෙම ඉන් තැවෙයි. සංවෙගයට පැමිණේ. සංවෙග

වූයේ නුවණින් බලයි. නිවන් කරා යැවූ සිත් ඇත්තේ කයින් පරම සත්‍යය ප්‍රත්‍යක්ෂ කරයි. ප්‍රඥාවෙන්ද විනිවිද බලයි. මහණෙනි, ඒ යහපත් ආජානෙය අශ්වයා යම්සේ සම්විදීමෙන් මිදුනේ තැවෙයිද, සංවෙගයට පැමිණෙයිද මහණෙනි, මම මේ යහපත් ආජානෙය පුරුෂයා එබඳුයයි කියමි. මහණෙනි, මෙබඳුවූද මෙ ලොකයෙහි ඇතැම් යහපත් ආජානෙය පුරුෂයෙක් වේ. මහණෙනි, මේ සතරවන ආජානෙය පුරුෂයා ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්.

9. "මහණෙනි, නැවතද අනිකක් කියමි. මෙහි ඇතැම් යහපත් ආජානෙය පුරුෂයෙක් අසවල් ගමෙහි හෝ නියම් ගමෙහි හෝ ස්ත්‍රියෙක් හෝ පුරුෂයෙක් හෝ දුකට පත්වූයේ යයි හෝ කළුරිය කළේයයි හෝ නොඅසයි. දුකටපත් කළුරිය කළ ස්ත්‍රියකු හෝ පුරුෂයෙකු හෝ තමන් නොදකී. ඔහුගේ නෑයෙක් හෝ සහලේ නෑයෙක් හෝ දුකට පත්වූයේ හෝ කළුරිය කළේ හෝ නොවේ. එතකුදු වුවත් දුක්වූ, තියුණුවූ, කෘරවූ කටුකවූ යහපත් නොවූ, මන නොවඩන්නාවූ ප්‍රාණය ගන්නාවූ ශාරීරික වේදනාවන්ගෙන් ස්පර්ශවූයේවේ. හෙතෙම ඉන් තැවුනේ වේ. සංවෙගයට පැමුණුනේ වේ. සංවෙගවූයේ නුවණින් සලකයි. නිවන් කරා යැවූ සිත් ඇත්තේ නාම කයින් පරම සත්‍යය ප්‍රත්‍යක්ෂ කරයි. ප්‍රඥාවෙන්ද විනිවිද දකියි. මහණෙනි, යම්සේ යහපත් ආජානෙය අශ්වයෙක් ඇට විදීමෙන් විදුනේ තැවුනේ සංවෙගයට පැමුණුනේ වේද, මහණෙනි, මේ යහපත් පුරුෂ ආජානෙයා එබඳුයයි කියමි. මහණෙනි, මෙබඳු ඇතැම් යහපත් ආජානෙය පුරුෂයෙක්වේ. මහණෙනි, මේ සතරවෙනි පුරුෂ ආජානෙයයා ලොකයෙහි ඇත්තාහ. විද්‍යමානවෙත්. මහණෙනි, මේ යහපත්වූ ආජානෙය පුරුෂයෝ ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්."

13. **පතොදච්ඡායා සූත්‍රයඃ-** 1. "මහණෙනි, අංග සතරකින් යුක්තවූ රාජභොගවූ රජුට සුදුසු රජුගේ ඇතා අංගයක යන සංඛ්‍යාවට යයි. කවර සතරකින්ද යත් මහණෙනි, මේ ලොකයෙහි රජුගේ ඇත්තෙමේ අසන්නේද වේ. නසන්නේද වේ, ඉවසන්නේද වේ, යන්නේද වේ. මහණෙනි, මේ ලොකයෙහි

රජුගේ ඇත්තෙමේ ඔහුට ඇතුන් දමනය කරන්නා ඉදින් කරන ලද්දාවූ හෝ ඉදින් නොකරන ලද්දාවූ හෝ දඬුවම් කරයිද, එය සිහිකොට මෙනෙහි කොට සියල්ල සිතට නගා නැමූ කන් ඇත්තේ අසයිද, මහණෙනි, රජුගේ මෙබඳු ඇත්තෙම අසන්නේ වේ.

2. "මහණෙනි, කෙසේ රජුගේ ඇත්තෙම නසන්නේ වේද? මහණෙනි, මේ ලොකයෙහි රජුගේ ඇත්තෙම යුද්ධයට ගියේ ඇතාද නසියි. ඇතරුවාද නසයි. අශ්වයාද නසයි, අසරුවාද නසයි. රියද නසයි රියේ සිටියවුන්ද නසයි. පාබල හමුදාවද නසයි. මහණෙනි, රජුගේ මෙබඳු ඇත්තෙමේ නසන්නේවේ.

3. "මහණෙනි, කෙසේ රජුගේ ඇත්තෙම ඉවසන්නේ වේද? මහණෙනි, මේ ලොකයෙහි රජුගේ ඇත්තෙමේ යුද්ධයට ගියේ ඇත් පහරවල්, ඊ පහරවල්, කඩු පහරවල්. පොරෝ පහරවල් බෙර පනාබෙර සක් ගැටබෙර, ශබ්දද මිශ්‍රශබ්දද ඉවසන්නේ වේ. මහණෙනි, රජහුගේ මෙබඳු ඇත්තෙමේ ඉවසන්නේ වේ.

4. "මහණෙනි, කෙසේ රජුගේ ඇත්තෙම යන්නේ වේද? මහණෙනි, මේ ලොකයෙහි රජුගේ ඇත්තෙම ඇතුන් දමනය කරන්නා යම් ගිය හෝ නොගිය හෝ දිශාවකට යවයිද එහි වහා යන්නේ වේද, මහණෙනි, මෙසේ රජුගේ ඇත්තෙම යන්නේ වේ. මහණෙනි, මේ අංග සතරින් යුත් රජුගේ ඇත්තෙම රජුට සුදුසුවේ. රාජභොගය. රජුගේ අංගයකැයි යන සංඛ්‍යාවට යයි. මහණෙනි, එසේම කරුණු සතරකින් යුක්ත මහණතෙම ආහුණෙය්‍යවේ. ඈතට ගෙන යන දේ ගෙනවුත් පිදීමට යොග්‍යවේ. දක්ෂිණාවට සුදුසුවේ. අඤ්ජලීකරණය හෙවත් දෑත් හිස තබා වැඳීමට යොග්‍යවේ. දුරසිට අවුත් පිදීමට යොග්‍යවේ. ලොකයාගේ නිරුත්තර පින්කෙතය. කවර සතරකින්ද යත්.

5. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම අසන්නේ වේද, නසන්නේ වේද, ඉවසන්නේ වේද, යන්නේ වේද, මහණෙනි, කෙසේ මහණතෙම අසන්නේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම බුදුන් වදාළ ධර්ම විනය දෙසන කල්හි ඇතිකොට මෙනෙහි කොට මුළු සිතින් සිහිකොට ඊට

යෙදූ කන් ඇත්තේ බණ අසයි. මහණෙනි, මෙසේ මහණතෙම අසන්නේවේ.

6. "මහණෙනි, කෙසේ මහණතෙම නසන්නේ වේද මහණෙනි. මේ ශාසනයෙහි මහණතෙම උපන් කාමවිතර්කය නොඉවසයි, දුරුකරයි, අත්හරියි, වැයට පමුණුවයි, නොවීමට යවයි, උපන් ව්‍යාපාද විතර්කය නොඉවසයි, දුරුකරයි අත්හරියි. අන්තභාවයට යයි අභාවයට යයි. උපන් විහිංසා විතර්කය නොඉවසයි. දුරුකරයි. අත්හරියි. අන්තභාවයට යයි. අභාවයට යයි. උපනූපන් ලාමක අකුශල ධර්මයන් නොඉවසයි. දුරු කරයි. අත්හරියි. අන්තභාවයට යයි. අභාවයට යයි. මහණෙනි, මෙසේ මහණතෙම නසන්නේවේ.

7. "මහණෙනි, කෙසේ මහණතෙම ඉවසන්නේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සීතය, උෂ්ණය, බඩගින්න, පිපාසය, ඩැහැ ලේබොන මැස්සෝය, මදුරුවෝය වාතය, දීර්ඝ ජාතීන්ගේ ස්පර්ශය, නපුරුව කියන ලද නපුරු ලෙස ආවචනයෝය, දුක්වූ, තියුණුවූ, කෲරවූ කටුකවූ යහපත් නොවූ අමනාපවූ, ප්‍රාණය නැතිවන ශාරීරික වේදනා ඉවසන සුළුවේද, මහණෙනි, මෙසේ මහණතෙම ඉවසන්නේවේ.

8. "මහණෙනි, කෙසේ මහණතෙම යන්නේ වේද, මහණෙනි, මේ ශාසනයේ මහණතෙම යම් දිශාවකට නොගිය විරූද මේ දීර්ඝ කාලයෙන් යම් මේ සර්ව සංස්කාරයන්ගේ සංසිඳුවීමක් වේද තෘෂ්ණා ක්ෂයක් වේද නොඇලීමක් ඇද්ද, නිරුද්ධවීමක් ඇද්ද, නිවණක් ඇද්ද, ඊට වහා යන්නේ වේ.

9. "මහණෙනි, මෙසේ මහණතෙම යන්නේ වේ. මහණෙනි, මේ කරුණු සතරින් යුක්තවූ මහණතෙමේ ඈතට ගෙනයන දේ ගෙනවුත් පිදීමට යොග්‍යවේ. දක්ෂිණාවට සුදුසු වේ. අඤ්ජලීකරණය හෙවත් දෑත් හිස තබා වැඳීමට යොග්‍ය වේ. ලොකයාගේ නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍රය."

15. **අමනාපඨාන සූත්‍රයඃ**- 1. "මහණෙනි. මේ කරුණු සතරක් වෙත්. කවර සතරක්ද යත්. මහණෙනි, කරන්නට නොමනාපවූ කරන්නාට අනර්ථය පිණිස පවතින කරුණක් ඇත්තේය.

මහණෙනි, කරන්නටද නොකැමැතිවූ එය කරන්නේද අර්ථය පිණිස පවතින කරුණක් ඇත. මහණෙනි, කරන්ට කැමතිවූ එය කරන්නේ අනර්ථය පිණිස පවතින කරුණක් ඇත. මහණෙනි, කරන්නට කැමති එය කරන්නේ අර්ථය පිණිස පවතින කරුණක් ඇත.

2. "මහණෙනි, මෙහි යම් ඒ කරුණක් කරන්ට නොකැමැතිද, එය කරන්නේ අනර්ථය පිණිස පවතීද, මහණෙනි, මේ කරුණ දෙපක්ෂය විසින් නොකටයුතු කොට සිතයි. යම් මේ කරුණක් කරන්නට නොකැමැතිද, මොහු විසින්ද එය නොකටයුතු කොට හඟී. යම් කරුණක් කරන්නේ අනර්ථය පිණිස පවතීද, මොහු විසින්ද එය නොකටයුතු කොට සිතයි. මේ කරුණ දෙපක්ෂය විසින් නොකටයුතු කොට සිතයි.

3. "මහණෙනි, එහි යම් කරුණක් කරන්ට නොකැමැතිද, එය කරන්නේ යහපත පිණිස පවතීද, මේ කාරණයෙහි බාලයාද පණ්ඩිතයාද දතයුතුයි. මහණෙනි, බාලයා මෙසේ නොසිතයි. නමුත් මේ කරුණ කරන්ට අමනාපය. නැවතද මෙය කරන්නේ යහපත පිණිස පවතීද, ඔහු එය නොකරයි. එය නොකරණ ඔහුට අනර්ථය පිණිස පවතී.

4. "මහණෙනි, පණ්ඩිත තෙමේද මෙසේ කල්පනා කරයි. හුදෙක් මේ කාරණය කරන්ට නොකමැතිය. නමුත් මෙය කිරීම යහපත පිණිස පවතී. මහණෙනි, එහි යම් මේ කාරණයක් කරන්ට කැමතිද එය කරන්නේ අනර්ථය පිණිස පවතීද මේ කරුණෙහිත් පුරුෂ ශක්තිය ඇති පුරුෂ වීර්ය ඇති පුරුෂ පරාක්‍රම ඇති බාලයන්ද පණ්ඩිතයන්ද දත යුතුයි.

5. "මහණෙනි, බාලයා හුදෙක් මෙය කරන්ට ප්‍රියය. නමුත් දැන් මෙය කරන්නේ අනර්ථය පිණිස පවතීයයි කල්පනා කරයි. හෙතෙම ඒ කාරණය කරයි. එය කරණ ඔහුට අනර්ථය පිණිස පවතී. මහණෙනි, පණ්ඩිත තෙමේද හුදෙක් මෙය කරන්ට මනාපය. නමුත් දැන් මෙය කරන්නේ අයහපත පිණිස පවතීයයි. සිතයි. නැවතද මෙය කරද්දී අනර්ථය පිණිස පවතී. හෙතෙම එය නොකරයි. එය නොකරණ ඔහුට යහපත පිණිස පවතී.

මහණෙනි, එහි යමක් කරන්නට ප්‍රියද එය කරන්නේ අර්ථය පිණිස පවතීද, මහණෙනි, මෙය දෙදෙනා විසින්ම කටයුතුයයි හඟී. මේ යමක් කරන්නට ප්‍රියද, ඔහු විසින්ද එය කටයුතුයයි හඟී. යම් දෙයක් කරන්නේ අර්ථය පිණිස පවතීද මොහු විසින්ද එය කටයුතුයයි හඟී. මහණෙනි, මේ කරුණ දෙපක්ෂය විසින්ම කටයුතුයයි හඟී. මහණෙනි, මේ කරුණු සතරය.

**16. අප්පමාද කරණීය සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු සතරකින් අප්‍රමාදය කටයුතුය. කවර සතරකින්ද යත්. මහණෙනි, කාය දුශ්චරිතය හරිව්, කාය සුචරිතය වඩව්. එහිද ප්‍රමාද නොවව්. මහණෙනි, වාග් දුශ්චරිතය අත්හරිව්. වාග් සුචරිතය වඩව්, එහිද ප්‍රමාද නොවව්. මහණෙනි, මනො දුශ්චරිතය හරිව් මනො සුචරිතය වඩව්. එහිද ප්‍රමාද නොවව්. මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිය අත්හරිව්. සම්‍යක් දෘෂ්ටිය වඩව්. එහිද ප්‍රමාද නොවව්.

2. "මහණෙනි, යම්තැනක පටන් භික්ෂුවගේ කාය දුශ්චරිතය ප්‍රහීණවූයේ වේද, කාය සුචරිතය වැඩුයේ වේද, වාක් දුශ්චරිතය ප්‍රහීනවූයේ වේද, වාක් සුචරිතය වැඩුයේ වේද මනො දුශ්චරිතය ප්‍රහීනවූයේ වේද, මනො සුචරිතය වැඩුයේ වේද, මිථ්‍යදෘෂ්ටිය ප්‍රහීනවූයේ වේද, සම්‍යක් දෘෂ්ටිය වැඩුයේ වේද හෙතෙම පරලොව වන මරණයට බිය නොවෙයි."

**17. ආරක්ඛකරණීය සූත්‍රය:-** 1. "මහණෙනි, සතර කාරණයෙක්හි තමහට හිත කැමැත්තා විසින් සිහියෙන් යුත් සිතින් අප්‍රමාදය ආරක්ෂාව කටයුතුය. කවරසතරෙක්හිද යත්, ඇලුම් කටයුතු ධර්මයන්හි මගේ සිත නොඇලේවායි තමහට වැඩ කැමැත්තා විසින් සිහියෙන් යුත් සිතින් අප්‍රමාදව ආරක්ෂාව කටයුතුය. 'ද්වෙෂ කටයුතු ධර්මයන් කෙරෙහි මාගේ සිත ද්වෙෂ නොවේවායි තමහට වැඩ කැමැත්තා විසින් සිහියෙන් යුත් සිතින් අප්‍රමාදව ආරක්ෂාව කටයුතුයි. 'මුළාවියයුතු ධර්මයන් කෙරෙහි මාගේ සිත මුළා නොවේවායි' තමහට වැඩ කැමැත්තා විසින් සිහියෙන් යුත් සිතින් අප්‍රමාදව ආරක්ෂා කටයුතුයි. 'මදයට පැමිණිය යුතු ධර්මයන් කෙරෙහි මාගේ සිත මදයට

නොපැමිණේවායි' තමහට වැඩකැමැත්තා විසින් සිහියෙන් යුත් සිතින් අප්‍රමාදව ආරක්ෂාව ඇති කළ යුතුයි.

2. "මහණෙනි, යම්තැනක පටන් මහණහට පහවූ රාග ඇති බැවින් ඇලුම්කටයුතු ධර්මයන් කෙරෙහි සිත නොඇලේද පහවූ ද්වෙෂ ඇති බැවින් ද්වෙෂ කටයුතු ධර්මයන් කෙරෙහි ද්වෙෂ නොකෙරේද, පහවූ මොහ ඇති බැවින් මුළා වියයුතු ධර්මයන් කෙරෙහි සිත මුළා නොවේද, පහවූ මද ඇති බැවින් මත්විය යුතු ධර්මයන් කෙරෙහි සිත මදයට නොපැමිණෙයි. හෙතෙම දෘෂ්ටි වශයෙන් නොගනී. කම්පානොවෙයි. නොවෙවුලයි. භයට නොපැමිණෙයි. ශ්‍රමණයන්ගේ වචන අනුව දෘෂ්ටි වශයෙන් නොයයි."

18. **සංවෙජනියඨාන සූත්‍රයː-** "මහණෙනි, ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයාට දර්ශනීයවූ සංවෙගකටයුතුවූ මේ කරුණු සතරක් වෙත්. කවර සතරක්ද යත්. මහණෙනි, මෙහි තථාගතයන් වහන්සේ උපන්නේයයි ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයාට දර්ශනීයවූ සංවෙගකටයුතුවූ තැනකි. මහණෙනි, තථාගතයන් වහන්සේ මෙහි නිරුත්තර සම්‍යක් සම්බොධියට පැමිණියේයයි ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයාට දර්ශනීයවූ සංවෙග කටයුතුවූ තැනකි. මහණෙනි, තථාගතයන් වහන්සේ මෙහි නිරුත්තර ධර්ම චක්‍රය පැවැත්වූහයි ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයාට දර්ශනීයවූ සංවෙග කටයුතුවූ තැනකි. මහණෙනි, මෙහි තථාගතයන් වහන්සේ අනුපදිශෙස නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑවේයයි ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයාට දර්ශනීයවූ සංවේග කටයුතුවූ තැනකි. මහණෙනි, මේ සතර ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයාට දර්ශනීයවූ සංවෙග කටයුතුවූ තැන්ය."

19. **ජාති භය සූත්‍රයː-** "මහණෙනි, මේ බිය සතරක් වෙත්. කවර සතරක්ද යත්. ජාති භය, ජරා භය, ව්‍යාධි භය, මරණ භය යන මේ සතර භයයි."

20. **අග්ගි භය සූත්‍රයː-** "මහණෙනි, මේ සතර බියක් වෙත්. කවර සතරක්ද යත්. ගිනිභය, දිය භය, රාජ භය, සොර භය යන සතර භයය".

**(දොළොස් වෙනි කෙසී වර්ගය නිමි.)**

---

## 13. භය වර්ගය.

**21. අත්තානුවාද භය සූත්‍රයඃ- 1.** "මහණෙනි, මේ බිය සතරක් වෙත්. කවර සතරක්ද යත්, ආත්මානුවාද භය, පරානුවාද භය, දණ්ඩ භය, දුග්ගති භය, යන සතරයි. "මහණෙනි, ආත්මානුවාද භය කවරේද?

**2.** "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් 'මම වනාහි කයින් දුශ්චරිතයක හැසිරෙන්නෙම් නම්, වචනයෙන් දුශ්චරිතයක හැසිරෙන්නෙම් නම්, සිතින් දුශ්චරිතයක හැසිරෙන්නම් නම්,

**3.** "කිමෙක්ද 'ඒ මාගේ ආත්මය සීලයෙන් උපවාද නොකරන්නේදැයි' මෙසේ කල්පනා කරයි. හෙතෙම තමහට උපවාද පැමිණෙන බියෙන් බියවූයේ කාය දුශ්චරිතය අත්හැර කාය සුචරිතය වඩයි. වාග් දුශ්චරිතය අත්හැර වාක් සුචරිතය වඩයි. මනො දුශ්චරිතය අත්හැර මනො සුචරිතය වඩයි. තමන් සුවසේ පරිහරණය කරයි. මහණෙනි, මේ ආත්මානුවාද භයයයි කියනු ලැබේ.

**4.** "මහණෙනි, පරානුවාද භය කවරේද? (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) කිමෙක්ද ඒ මා අන්‍යයන් සීලයෙන් උපවාද නොකරන්නාහුද, හෙතෙම අනුන්ගෙන් පැමිණෙන බියට බියපත්වූයේ, කාය දුශ්චරිතය හැර කාය සුචරිතය වඩයි. වාක් දුශ්චරිතය හැර වාක් සුචරිතය වඩයි. මනො දුශ්චරිතය හැර මනො සුචරිතය වඩයි. පිරිසිදු ආත්මය පරිහරනය කරයි. මහණෙනි, මේ පරානුවාද භය යයි කියනු ලැබේ.

**5.** "මහණෙනි, දණ්ඩ භය කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් රජවරු අපරාධකාරී හොරු අල්වා ගෙන,

**6.** "කසයෙන් තලවන්නාහුය, වේවැලෙන් තලවන්නාහුය, අර්ධ දඬුවලින් තලවන්නාහුය, අත් කපන්නාහුය, පා කපන්නාහුය, අත් පා කපන්නාහුය, කණ කපන්නාහුය, නාසය කපන්නාහුය, කන් නාසා කපන්නාහුය, හිස්කබල ගලවා රත් ලෝ ගුලි බහන කර්මය කරන්නාහුය, හිසෙහි සම ගලවා බොරළු

දමා අතුල්ලා කරන කර්මය කරන්නාහුය, මුවතුල පහන් දල්වන කර්මය කරන්නාහුය, සිරුරෙහි රෙදි ඔතා දල්වා කරණ කර්මය කරන්නාහුය, අතෙහි තෙල් රෙදි ඔතා දල්වා කරණ කර්මය කරන්නාහුය. බෙල්ලෙහි පටන් ගොප් ඇටය දක්වා හම ගසා කඩ දවටා අදින කර්මය කරන්නාහුය, වැහැරි වස්ත්‍ර හැන්දාක් මෙන් සම් ගලවා එල්ලෙන්නට හැරෙන කර්මය කරන්නාහුය. දෙඅත් දෙපා පොලොවෙහි තබා ඇන ගසන කර්මය කරන්නාහුය, දෙපැති ඇති බිලියෙන් ගසා මස් කඩන කර්මය කරන්නාහුය, කහවණු තරමට මුළු සිරුර කොටන්නවුන්, සිරුර ආයුධ වලින් කොටා කාරම් ඉසින කර්මය කරන්නාහුය, පාර්ශවයක් යටවෙන්ට හොවා කන් සිදුරුවල යකඩ හුල් අනින කර්මය කරන්නාහුය, සම ගලවා ඇට කඩා පිදුරු බිස්සක් මෙන් කරණ කර්මය කරන්නාහුය, රත්වූ තෙලින් ඉසින්නාහුය, බල්ලන් ලවා කවන්නාහුය, පන පිටින් උලසිටුවන්නාහුය, කඩුවෙන් හිස කපන්නාහුය. මෙයාකාර නානාප්‍රකාර කම් කටොලු කරවන්නවුන් දකිත්.

7. "ඕහට යම්බඳු පාප කර්මයක හෙතුවෙන් අපරාධකාරී සොරෙකු රජවරු ගෙන, නානාප්‍රකාර කම්කටොලු කරවත්ද, (මෙහි මේ සූත්‍රයේ 6 ඡෙදය යෙදිය යුතුයි.) 'මම වනාහී මෙබඳු පාප කර්මයක් කරන්නේ නම්' රජවරු මාද ගෙන මෙබඳු නානාප්‍රකාර කම්කටොලු කරවන්නාහුය. (මෙහි මේ සූත්‍රයේ 6 වෙනි ඡෙදය යෙදිය යුතුයි.) මෙසේ හෙතෙම දඬුවම් බියෙන් බියපත්වූයේ අනුන්ගේ වස්තුව සොරකම් නොකරමින් හැසිරෙයි. මහණෙනි, මේ දණ්ඩ භයයයි කියනු ලැබේ.

8. "මහණෙනි, දුර්ගති බිය කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් කාය දුශ්චරිතයාගේ ලාමක විපාකය පරලොවදීය. වාක් දුශ්චරිතයාගේ ලාමක විපාකය පරලෙව්හිය. මනො දුශ්චරිතයාගේ ලාමක විපාකය පරලෙව්හිය. මම වනාහි කයින් දුශ්චරිතයක හැසිරෙන්නෙම් නම්, වචනයෙන් දුශ්චරිතයක හැසිරෙන්නෙම් නම්, සිතින් දුශ්චරිතයක හැසිරෙන්නෙම් නම්, කිමෙක්ද යම්බඳු මම ශරීරයාගේ බිඳීමෙන්

මරණින් මතු අයසංඛ්‍යාත සැප නැති, දුර්ගතිවූ නපුරුසේ පතිතවන යම් නිරයක උපදින්නේ යයි මෙසේ කල්පනා කරයි.

**9.** "හෙතෙම දුගති බියෙන් බියපත්වූයේ කාය දුශ්චරිතය අත්හැර කාය සුචරිතය වඩයි. වාක් දුශ්චරිතය අත්හැර වාක් සුචරිතයෙහි හැසිරෙයි. මනො දුශ්චරිතය අත්හැර මනො සුචරිතය වඩයි. සැප ආත්මයක් පරිහරණය කරයි. මහණෙනි මේ දුර්ගති බිය යයි කියනු ලැබේ. මහණෙනි මේ සතර බියය."

**22. ඌර්මිභය සූත්‍රයඃ-** 1. "මහණෙනි, ජලයට බහින්නා මේ බිය සතරක් කැමතිවිය යුත්තාහ. කවර සතරක්ද යත්ඃ රැළින් වන බිය, කිඹුලන්ගෙන් වන බිය, සුලිවලින් වන බිය, සැඩ මසුන්ගෙන් වන බිය යන සතරයි. මහණෙනි, මේ සතර බිය ජලයට බසින්නා විසින් කැමති විය යුතුය.

**2.** "මහණෙනි, එසේම මේ ශාසනයෙහි ඇතැම් කුල පුත්‍රයෙක් ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම අනගාරිය ශාසනයෙහි පැවිදිවූයේද, මේ සතර බිය කැමති විය යුත්තාහ. කවර සතරක්ද යත්. රළ බිය, කිඹුල් බිය, සුළි බිය, සැඩ මසුන්ගෙන් වන බිය යන සතරයි.

**3.** "මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් කුල පුත්‍රයෙක් ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම මම ජාති ජරා මරණ සොක පරිදෙව දුක් දෙම්නස් උපායාසයන්ගෙන් බැසගත්තේ වෙමි. දුකට බැසගත්තෙමි. දුකින් පීඩා උනෙමි. මේ මුළු දුක් ගොඩ අවසන් කිරීමක් පෙනෙන්නේ නම් යෙහෙකැයි අනගාරිය ශාසනයෙහි පැවිදිවූයේ වේද?

**4.** "එසේ පැවිදිවූ ඔහුට මෙසේ තොප විසින් ඉදිරියට යායුතුය. මෙසේ තොප විසින් ආපසු ආ යුතුය. මෙසේ තොප විසින් ඉදිරි බැලිය යුතුය. මෙසේ තොප විසින් වටපිට බැලිය යුතුය. මෙසේ තොප විසින් අත් පා හැකිලිය යුතුය. මෙසේ තොප විසින් අත්පා දිගු කළයුතුය. මෙසේ තොප විසින් පා සඟල සිවුරු දැරිය යුතුය. සමාන බඹසර ඇත්තාහු අවවාද කරත්. අනුශාසනා කරත්. ඔහුට මම වනාහි පෙර ගිහි වූයේම අනුන්ට අවවාද කෙළෙමි. අනුශාසනා කළෙමි. මොව්හු වනාහි

අප පුත්‍රයන් මෙන් මුනුබුරන් මෙන් අවවාද කටයුතු කොට අනුශාසනා කටයුතු කොට හඟිත්. හෙතෙම කිපියේ නොසතුටු වූයේ ශික්ෂා අත්හැර ගිහිවෙයි. මහණෙනි, මේ මහණ රළ වේගයට බියෙන් ශික්ෂා අත්හැර ගිහිවූයේයයි කියනු ලැබේ. මහණෙනි, රළ බිය යනු මෙය ක්‍රොධයට නමකි.

**5.** "මහණෙනි, කිඹුල් බිය කවරේද? (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.)

**6.** "එසේ පැවිදිවූ ඔහුට 'මෙය තොප විසින් කෑ යුතුය. මෙය තොප විසින් නොකෑ යුතුය. මෙය තොප විසින් අනුභව කළයුතුය. මෙය තොප විසින් අනුභව නොකළ යුතුය. මෙය තොප විසින් රස වින්ද යුතුය. මෙය තොප විසින් රස නොවින්ද යුතුය. මෙය තොප විසින් පිය යුතුය. මෙය තොප විසින් නොපිය යුතුය, තොප විසින් කැප දෙය කෑ යුතුය. අකැප දේ නොකෑ යුතුය. තොප විසින් කැප දේ අනුභව කළයුතුය. අකැප දේ අනුභව නොකළ යුතුය. තොප විසින් කැප දෙය රස වින්ද යුතුය. අකැප දේ රස නොවින්ද යුතුය. තොප විසින් කැප දේ පිය යුතුය. අකැප දේ නොපිය යුතුය. තොප විසින් කාලයෙහි පිය යුතුය. විකාලයෙහි නොපිය යුතුය. තොප විසින් කාලයෙහි කෑ යුතුය. විකාලයෙහි නොකෑ යුතුය. තොප විසින් කාලයෙහි අනුභව කළයුතුය. විකාලයෙහි අනුභව නොකළ යුතුය. තොප විසින් කාලයෙහි රස වින්ද යුතුය. විකාලයෙහි රස නොවින්ද යුතුයයි, සමාන බඹසර ඇත්තාහු අවවාද කරත්. අනුශාසනා කරත්.

**7.** "ඔහුට 'අපි පෙර ගිහිගෙයි සිටියේ යමක් කැමැත්තෙමුද එය කමු. යමක් නොකැමැත්තෙමුද එය නොකමු. යමක් කැමැත්තෙමුද එය අනුභව කරමු. යමක් නොකැමැත්තෙමුද එය අනුභව නොකරමු. යමක් කැමැත්තෙමු නම් එය රස විඳිමු. යමක් නොකැමැත්තෙමුද එය රස නොවිඳිමු. යමක් කැමැත්තෙමුද එය බොමු. යමක් නොකැමැත්තෙමුද එය නොබොමු. කැප දේත් කමු. අකැප දේත් කමු. කැප දේත් අනුභව කරමු. අකැප දේත් අනුභව කරමු. කැප දේත් රස විඳිමු. අකැප දේත් රස විඳිමු. කැප දේත් බොමු. අකැප දේත්

බොමු කාලයෙහිත් කමු. අකාලයෙහිත් කමු. කාලයෙහිත් අනුභව කරමු. විකාලයෙහිත් අනුභව කරමු. කාලයෙහිත් රස විඳිමු. විකාලයෙහිත් රස විඳිමු. කාලයෙහිත් බොමු. විකාලයෙහිත් බොමු. ශ්‍රද්ධාවත් ගෘහපතිවරු යමක් අපට දවල් හෝ විකාලයෙහි හෝ ප්‍රණීත කෑයුතු දෙයක් හෝ බුදිය යුතු දෙයක් හෝ දෙත්ද, එහිද අපගේ මුව ආවරණය කිරීමක් හෝ මෙන් කරත්යයි' හෙතෙම කිපියේ නොසතුටුවූයේ ශික්ෂා අත්හැර ගිහිවෙයි.

8. "මහණෙනි, මේ මහණතෙම කිඹුල් විසට බියවූයේ ශික්ෂායා අත්හැර ගිහිවූයේ වේ. මහණෙනි, කිඹුල් බිය යනු මහත් බඩක් ඇති බවට නමකි. මහණෙනි, මේ කිඹුල් බිය යයි කියනු ලැබේ.

9. "මහණෙනි, සුළි බිය කවරේද, (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි)

10. "එසේ පැවිදිවූ ඔහු පූර්වාහ්න වේලාවෙහි හැඳ පෙරවා පාත්‍ර සිවුරු ගෙන ගමකට හෝ නියම් ගමකට හෝ නොරකින ලද කයින්, නොරකින ලද වචනයෙන්, නොරකින ලද සිතින්, එළඹ නොසිටි සිහියෙන් නොසංවර ඉන්ද්‍රියයන්ගෙන් පිඬු පිණිස හැසිරෙයි.

11. "හෙතෙම එහිදී පස්කම් ගුණයෙන් පිරී යුක්තව හැසිරෙන ගෘහපතියකු හෝ ගෘහපති පුත්‍රයකු හෝ දකියි. ඔහුට 'මම වනාහි අපි පෙර අගාරියවූයේම පස්කම් ගුණයෙන් පිරී යුක්තව වාසය කෙළෙමු. මගේ ගෘහයෙහි භෝගයෝ විද්‍යමාන වෙත්. භොගයන් අනුභව කරන්ටද, පින්කරන්ටද හැකියයි සිතයි. ම ශික්ෂා අත්හැර ගිහිවී වස්තුවද අනුභව කරන්නෙම් නම් පින්ද කරන්නෙම් නම් යෙහෙකැයි' සිතා හෙතෙම ශික්ෂා අත්හැර ගිහිවූයේය. මහණෙනි, මේ මහණ තෙම සුළි බියට බියවූයේ ශික්ෂා අත්හැර ගිහිවූයේය. මහණෙනි, ආවට්ටභය යනු පස්කම් ගුණයන්ට නමකි. මහණෙනි, මේ සුළි බියයයි කියනු ලැබේ.

12. "මහණෙනි, සැඩමසුන්ගේ බිය කවරේද? (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදයද 10 ඡෙදයද යෙදිය යුතුයි.)

13. "හෙතෙම එහිදී නපුරුකොට හැඳි නපුරුකොට පෙරවි ස්ත්‍රියක් එහි දකී. නපුරුකොට හැන්ද නපුරුකොට පෙරවි ස්ත්‍රිය දැක ඔහුගේ සිත රාගය යටපත් කරයි. හෙතෙම රාගයෙන් යටකොට ගත් සිතින්, ශික්ෂා අත්හැර ගිහිවෙයි මහණෙනි, මේ මහණතෙම සැඩමසුන්ගේ බියට පැමිණියේ ශික්ෂා අත්හැර ගිහිවූයේයයි කියනු ලැබේ. මහණෙනි, සුසුකාබිය යනු ස්ත්‍රියට නමකි. මහණෙනි, මේ සැඩමසුනගේ බියයයි කියනු ලැබේ.

"මහණෙනි, මේ බිය සතර ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම අනගාරිය නම් සස්නෙහි පැවිදිවන ඇතැම් කුලපුත්‍රයෙකු විසින් කැමැති වියයුත්තාහ."

23. **බ්‍රහ්මලොකුප්පත්ති සූත්‍රය**:- 1. "මහණෙනි, ලොකයෙහි මේ පුද්ගලයන් සතරදෙනෙක් ඇත්තාහ, කවර සතරදෙනෙක්ද යත්, මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් කාමයන්ගෙන් වෙන්ව, අකුශල ධර්මයන්ගෙන් වෙන්ව, විතර්ක ඇති විචාර ඇති විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයිද,

2. "හෙතෙම එය ආශ්වාද කරයි. එය බලාපොරොත්තු වෙයි. එයින්ම ඉන්ම සතුටට පත්වෙයි. එහි සිටියේ ඊට ඇලුනේ, එය බහුලකොට වාසයකරන්නේ නොපිරිහුනේ කාලක්‍රියාකරන්නේ බ්‍රහ්ම කායික දෙවියන් කෙරෙහි උපදී. මහණෙනි, බ්‍රහ්මකායික දෙවියන්ට ආයුප්‍රමාණය කල්පයකි. පෘථග්ජනයා එහි ආයු ඇතිතාක් සිට ඒ දෙවියන්ගේ ආයු ප්‍රමාණය යම්තාක්ද ඒ සියල්ල ගෙවා නරකයටද යයි' තිරිසන් යොනියටද යයි. ප්‍රෙතලොකයටද යයි. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකතෙමේ එහි ආයු ඇතිතාක් සිට ඒ දෙවියන්ගේ ආයු ප්‍රමාණය යම්තාක්ද ඒ සියල්ල ගෙවා ඒ භවයෙහිම පිරිනිවෙයි. යම් මේ ගතියද උත්පත්තියද ඇති කල්හි අශ්‍රැතවත් පෘථග්ජනයාගෙන් ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයාගේ මේ වෙනසයි.

4. "මහණෙනි. නැවතද අනික් පුද්ගලයෙක් කියමි. මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති සිතේ එකවිට

පහළවීම ඇති, විතර්කය නැති, විචාරය නැති, සමාධියෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති, ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරයි.

5. "හෙතෙම එය ආශ්වාදය කරයි. ඊට කැමති වෙයි. ඉන් සතුටට පත්වෙයි. එහි සිටියේ ඊට බැසගත්තේ එය බහුලකොට වසන්නේ, නොපිරිහුනේ කළුරිය කරන්නේ ආභස්සර දෙවියන් හා සහවාසයට යයි, මහණෙනි, ආභස්සර දෙවියන්ට ආයුප්‍රමාණය කල්ප දෙකකි. පෘථග්ජනයා එහි ඇතිතාක් සිට ඒ දෙවියන්ගේ ආයුප්‍රමාණය යම්තාක්ද, ඒ සියල්ල ගෙවා ඒ භවයෙහිම පිරිනිවෙයි. යම් මේ ගතිය උත්පත්තිය ඇතිකල්හි අශ්‍රැතවත් පෘථග්ජනයාගෙන් ශ්‍රැතවත් ආර්යශ්‍රාවකයාගේ වෙනසයි නරකයටද යයි. තිරිසන් යොනියටද යයි. ප්‍රෙතලොකයටද යයි. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකතෙම එහි ආයු ඇතිතාක් සිට ඒ දෙවියන්ගේ ආයු ප්‍රමාණය යම්තාක්ද, ඒ සියල්ල ගෙවා ඒ භවයෙහිම පිරිනිවෙයි. ගතිය උත්පත්තිය ඇතිකල්හි අශ්‍රැතවත් පෘථග්ජනයාගෙන් ශ්‍රැතවත් පෘථග්ජනයාගෙන් ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයාගේ මේ වෙනසයි, මේ වෙන් කිරීමයි.

5. "මහණෙනි, නැවත අනික් පුද්ගලයෙක් කියමි. මෙහි ඇතැම් පුද්ගලයෙක් ප්‍රීතිය නැතිවීමෙන් උපෙක්ෂා ඇත්තේ වසයි. සිහි ඇත්තේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ කයින් සැපයක් විඳියි. ආර්යයෝ උපෙක්ෂා ඇත්තේ සිහි ඇත්තේ සුඛවිහාරීයයි ඒ යමක් කියත්ද ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරයි.

6. "හෙතෙම එය ආශ්වාද කරයි. එය බලාපොරොත්තු වෙයි. එයින් සතුටට පැමිණෙයි. එහි සිටියේ ඊට නැමුනේ එය බහුලකොට වසන්නේ නොපිරිහුනේ කළුරිය කරන්නේ සුභ කිණ්හක දෙවියන් හා සහභාවයට යයි. මහණෙනි, සුභකිණ්හක දෙවියන්ට කල්ප සතරක් ආයුෂය පෘථග්ජනයා එහි යම්තාක් සිට ඒ දෙවියන්ගේ ආයු ප්‍රමාණය යම් ප්‍රමාණයක්ද ඒ සියල්ල ගෙවා නරකයට යයි. තිරිසන් යොනියට යයි. ප්‍රෙතලොකයට යයි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා එහි ආයු ඇතිතාක්

සිට ඒ භවයෙහිම පිරිනිවන්පායි. මහණෙනි, ගතිය උත්පත්තිය ඇතිකල්හි අශ්‍රැතවත් පෘථග්ජනයාගෙන් ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයාගේ මේ වෙනස යයි මේ වෙන් කිරීමයි.

7. "මහණෙනි, නැවත අනික් පුද්ගලයෙක් කියමි. මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සැපයාගේද ප්‍රහාණයෙන් දුඃඛයාගේද ප්‍රහාණයෙන් සොම්නස් දොම්නස් දෙක අස්තංගමයට පෙරටුව දුක් නැති සැප නැති උපෙක්ඛා ස්මෘති දෙදෙනාගේ පිරිසිදු වීම ඇති, හතරවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයි.

8. "හෙතෙම එය ආශ්වාදකරයි. ඊට කැමැතිවෙයි ඉන් සතුටට පැමිණෙයි. එහි සිටියේ ඊට නැමුනේ එය බහුල වශයෙන් කරන්නේ නොපිරිහුනේ කළුරිය කරන්නේ වෙහප්ඵල දෙවියන් හා සහවාසයට උපදී.

"මහණෙනි, වෙහප්ඵල දෙවියන්ගේ ආයුප්‍රමාණය කල්ප පන්සියයකි. එහි පෘථග්ජනයා ආයු ඇතිතාක් සිට ඒ දෙවියන්ගේ ආයුප්‍රමාණය යම් පමණක්ද ඒ සියල්ල ගෙවා නරකයටද යයි. තිරිසන්යොනියෙහිද උපදී. ප්‍රෙතලෝකයටද යයි. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වනාහි එහි ආයු ඇතිතාක් සිට ඒ දෙවියන්ගේ ආයු ප්‍රමාණය යම්තාක්ද එය ගෙවා ඒ භවයෙහිම පිරිනිවෙයි. මහණෙනි, ගතිය ඇතිකල්හි උත්පත්තිය ඇතිකල්හි අශ්‍රැතවත් පෘථග්ජනයාගෙන් ශ්‍රැතවත් ආර්යශ්‍රාවකයාගේ මේ වෙනසයි. මේ වෙන් කිරීමයි. මහණෙනි, මේ පුද්ගලයන් සතරදෙන ලොකයෙහි ඇත, විද්‍යමාන වෙත්."

24. **සුද්ධාවාසුප්පත්ති සූත්‍රය**:- 1. (මේ ඡෙදය මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

2. "හෙතෙම එහි යමක් රූප, වේදනා, සංඥා, සංස්කාර ඒ ධර්මයන් අනිත්‍ය වශයෙන් නොසැප වශයෙන්, රොග වශයෙන්, ගඩුවක් වශයෙන්, හුලක් වශයෙන්, දුක්වශයෙන් ලෙඩක් වශයෙන්, අන්‍යයන් වශයෙන්, පලුදු වශයෙන්, ශුන්‍ය වශයෙන්, අනාත්ම වශයෙන්, විශිෂ්ට ඥානයෙන් බලයි. හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුද්ධාවාස දෙවියන් හා

සහභාවයට උපදී, මහණෙනි, මේ උත්පත්තිය පෘථග්ජනයන් හා අසාධාරණය.

3. "මහණෙනි, නැවත අනිකක් කියමි. (මෙහි මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 4 ඡේදයද මේ සූත්‍රයේ 2 ඡේදයද යෙදිය යුතුයි.

4. (මෙහි මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 5 ඡේදයද මේ සූත්‍රයේ 2 ඡේදයද යෙදිය යුතුයි.)

5. (මෙහි මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 7 ඡේදය යෙදිය යුතුයි.) හෙතෙම ඒ ඒ තන්හි රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥ්ඥාණ යන යමක් යමක්වේද, ඒ ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, රොග, ගණ්ඩ, සල්ල, අඝ, ආබාධ, පර, පලොක, සුඤ්ඤත, අනත්ත වශයෙන් බලයි. හෙතෙම කරජකායයාගේ බිඳීමෙන් මරණින් මතු සුද්ධාවාස දෙවියන් හා සහභාවයට යයි. මහණෙනි, මේ උත්පත්තිතොමෝ පෘථග්ජනයන් හා අසාධාරණය, මහණෙනි, මේ පුද්ගලයෝ සතරදෙන ලොකයෙහි ඇත්තාහ, විද්‍යමානවෙත්."

**25. පඨම අප්පමඤ්ඤා සූත්‍රයː-** 1. "මහණෙනි, මේ පුද්ගලයන් සතරදෙනෙක් ලොකයෙහි විද්‍යමාන වෙත්. කවර සතරදෙනෙක්ද යත්, මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් මෛත්‍රී සහගත සිතින්.

2. "එක් දිසාවක්, දෙදිසාවක්, තුන් දිසාවක්, සතර දිසාවක්, පතුරුවා වාසය කරයි. මෙසේ උඩ යට සරස සර්වප්‍රකාර වශයෙන් සියල්ල සහිත විපුලවූ මහත්වූ මහද්ගත වූ, අප්‍රමාණවූ, අවෛරවූ, අව්‍යාපාදවූ ලෝකය.

3. "මෛත්‍රී සහගත සිතින් පතුරුවා වාසය කරයි.

4. "හෙතෙම එය ආශ්වාදය කරයි. එය කැමති වෙයි. එයින් තෘප්තියට පැමිණෙයි. එහි සිටියේ, ඊට නැමුනේ එය බහුලකොට වසන්නේ, නොපිරිහුනේ, කළුරිය කරන්නේ බ්‍රහ්මකායික දෙවියන් හා සහවාසයට පැමිණෙයි.

**5.** "මහණෙනි, බ්‍රහ්මකායික දෙවියන්ට කල්පයක් ආයු ප්‍රමාණයවෙයි.

**6.** "පෘථග්ජනයා එහි ආයු ඇතිතාක් සිට ඒ දෙවියන්ගේ ආයු ප්‍රමාණය යම් ප්‍රමාණයක්ද ඒ සියල්ලගෙවා නරකයට ද යයි. තිරිසන් අපායටද යයි. ප්‍රෙත ලොකයටද යයි. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා එහි ආයු ඇතිතාක් සිට ඒ දෙවියන්ගේ ආයු ප්‍රමාණය යම්තාක්ද, ඒ සියල්ල ගෙවා ඒ භවයෙහිම පිරිනිවෙයි. මහණෙනි, ගතිය, උත්පත්තිය ඇති කල්හි අශ්‍රැතවත් පෘථග්ජනයා හා ශ්‍රැතවත් ආර්යශ්‍රාවකයාගේ මේ විශෙෂයයි. මේ අදහසයි. මේ වෙන්කිරීමයි.

**7.** "මහණෙනි. නැවතද මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් කරුණාසහගත සිතින් මෙහි (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.) කරුණාසහගත සිතින් පතුරුවා වාසය කරයි. (මෙහි මේ සූත්‍රයේ 4 ඡෙදය යෙදිය යුතුයි.)

**8.** "මහණෙනි, නැවතද මේලොකයෙහි ඇතැම් පුද්ගලයෙක්, මුදිතා සහගත සිතින් (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.) මුදිතා සහගත සිතින් (මෙහි මේ සූත්‍රයේ 4 ඡෙදය යෙදිය යුතුයි)

**9.** "මහණෙනි, නැවතද මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් උපෙක්ෂා සහගත සිතින් (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.) උපෙක්ෂා සහගත සිතින් (මෙහි මේ සූත්‍රයේ 4 ඡෙදය යෙදිය යුතුයි.) බ්‍රහ්මකායික දෙවියන් වෙනුවට 'ආභස්සර දෙවියන්' යන වචනය යෙදිය යුතුයි.)

"මහණෙනි, ආභස්සර දෙවියන්ගේ ආයු ප්‍රමාණය කල්ප දෙකකි. එහි පෘථග්ජනයා ආයු ඇතිතාක් සිට සුභකිණ්හක දෙවියන් හා සහභාවයට යයි. මහණෙනි, සුභකිණ්හක දෙවියන්ට ආයු ප්‍රමාණය කල්ප සතරකි. එහි පෘථග්ජනයා ආයු ඇතිතාක් සිට වෙහප්ඵල දෙවියන් හා සහභාවයට යයි. මහණෙනි, වෙහප්ඵල දෙවියන්ට කල්ප පහක් ආයුෂය.

**10.** (මේ ඡෙදය මේ සූත්‍රයේ 6 ඡෙදය මෙනි.)

**11.** "මහණෙනි, මේ පුද්ගලයෝ සතරදෙන ලොකයෙහි ඇත්තාහ, විද්‍යමානවෙත්"

**26. දුතිය අප්පමඤ්ඤා සූත්‍රයඃ-** 1. 2. 3. (මේ ඡෙදය මේ පණ්ණාසකයේ 25 සූත්‍රයේ 1. 2. 3. ඡෙද මෙන් වෙත්.)

**4.** (මේ ඡෙදය මේ පණ්ණාසකයේ 24 සූත්‍රයේ 2 ඡෙදය මෙනි.)

**5.** "මහණෙනි, නැවත මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් කරුණා සහගත සිතින්, (මෙහි මේ පණ්ණාසකයේ 25 සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි) කරුණාසහගත සිතින් පතුරුවා වාසය කරයි. (මෙහි මේ පණ්ණාසකයේ 24 සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

**6.** "මහණෙනි, නැවත මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් මුදිතා සහගත සිතින් (මෙහි මේ පණ්ණාසකයේ 25 සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.) මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කරයි.) මෙහි මේ පණ්ණාසකයේ 24 සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

**7.** "මහණෙනි, නැවත මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් උපෙක්ෂා සහගත සිතින් (මෙහි මේ පණ්ණාසකයේ 25 සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි) උපෙක්ෂා සහගත සිතින් පතුරුවා වාසයකරයි.) මෙහි මේ පණ්ණාසකයේ 24 සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

**8.** "මහණෙනි. මේ පුද්ගලයෝ සතරදෙන ලොකයෙහි ඇත්තාහ, විද්‍යමානවෙත්."

**27. තථාගතච්ඡරිය සූත්‍රයඃ-** 1. "මහණෙනි, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ පහළවීමෙන් සතර ආශ්චර්ය අද්භූත ධර්ම කෙනෙක් පහළවෙත්. කවර සතරක්ද යත්.

**2.** "මහණෙනි, යම්කලෙක්හි බොධිසත්වයන් වහන්සේ තුසිත දෙව්ලොවින් චුතව සිහි ඇත්තේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ මව් කුසට බැස ගනීද,

3. "නැවත මාරයා සහිත, බ්‍රහ්මයා සහිත, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත ප්‍රජාවෙහි දෙවියන් සහිත ලොකයෙහි දෙවිමිනිසුන් අතරෙහි අප්‍රමාණ මහත් ආලොකයක් දෙවියන්ගේ දිව්‍යානුභාවය ඉක්ම පහළවෙයි. නිතර විවෘතවූ යට පිහිටීමක් නැති අඳුරුවූ අන්ධ අඳුරින් යුත් යම් ඒ ලොකාන්තරිකයක් ඇත්තේද, මෙසේ මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ චන්ද්‍ර සූර්යයන්ගේ ආලොකය නොවැටේද එහිද දෙවියන්ගේ අප්‍රමාණවූ දිව්‍යානුභාවය ඉක්ම එහිදු අප්‍රමාණ ආලොකයක් පහළ වෙයි. එහි උපන් යම් සත්වකෙනෙක් වේද ඔව්හු 'පින්වත්නි, අනික් සත්වයෝ මෙහි උපන්නාහුයයි' ඔවුනොවුන් හඳුනත්.

4. "මහණෙනි, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ පහළවීමෙන් මේ පළමුවන ආශ්චර්ය අද්භූත ස්වභාවය පහළ වේ.

5. "මහණෙනි, නැවත අනිකක් කියමි. යම්කලෙක බොධිසත්වයන් වහන්සේ සිහියෙන් සම්‍යක් ප්‍රඥාවෙන් මව්කුසින් නික්මේද, (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.)

6. "මහණෙනි. තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ පහළවීමෙන් මේ දෙවෙනි ආශ්චර්ය අද්භූත ස්වභාවය පහළවේ.

7. "මහණෙනි, නැවතද අනිකක් කියමි. යම්කලෙක්හි තථාගතයන් වහන්සේ නිරුත්තර සම්‍යක් සම්බොධියට පැමිණේද, (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.)

8. "මහණෙනි, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ පහළවීමෙන් මේ තෙවැනි ආශ්චර්ය අද්භූත ස්වභාවය පහළ වේ.

9. "මහණෙනි, නැවත අනිකක් කියමි. යම්කලෙක්හි තථාගතයන් වහන්සේ නිරුත්තර ධර්ම චක්‍රය පැවැත්වූයේද, (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.)

10. "මහණෙනි, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ පහළවීමෙන් මේ සතරවන ආශ්චර්ය අද්භූත ස්වභාවය පහළ වේ."

28. **තථාගතබ්භූත සූත්‍රය**:- 1. (මේ ඡේදය මේ වර්ගයේ 27 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "මහණෙනි, මේ ප්‍රජාව තෘෂ්ණාවෙහි ඇලුනාහ. තෘෂ්ණාවෙහි කැමැති වූවාහුය. තෘෂ්ණාවෙන් ප්‍රීති වූවාහුය. ඒ ප්‍රජාතොමෝ තථාගතයන් වහන්සේ පරිත්‍යාගය ගැන බණ කියද්දී ඇසිය යුත්තක් කොට සිතයි. කණ යොමුකරයි. දැනගැනීමට සිත එලවයි. තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ පහළවීමෙන් මේ පළමුවන ආශ්චර්ය අද්භූත ධර්මය පහළවෙයි.

3. "මහණෙනි, ප්‍රජාව මානයෙහි ඇලෙයි. මානයෙහි රතිය උපදවයි, මානයෙන් කැමතිවෙයි. ඒ ප්‍රජාව තථාගතයන් වහන්සේ විසින් මාන ප්‍රහාණයට බණ දෙසද්දී ඇසිය යුතු කොට සිතයි. කන යොමුකරයි. දැන ගැනීමට සිත එලවයි. මහණෙනි. තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ පහළවීමෙන් මේ දෙවෙනි ආශ්චර්ය අද්භූත ස්වභාවය ලොකයෙහි පහළ වෙත්.

4. "මහණෙනි, ප්‍රජාව සසරෙහි ඇලුනේය. සසරෙහි රතිය උපදවයි, සසරට කැමති වෙයි. ඒ ප්‍රජාව තථාගතයන් වහන්සේ විසින් නිවණ ගැන කරුණු දෙසද්දී ඇසියයුත්තක් කොට සිතයි. කණ නමයි. දැනගැනීම පිණිස සිත පිහිටුවයි. මහණෙනි. තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ පහළවීමෙන් මේ තුන්වන ආශ්චර්ය අද්භූත ස්වභාවය ලොකයෙහි පහළවේ.

5. "මහණෙනි, ප්‍රජාව අණ්ඩයක් වැනි අවිද්‍යාවට අයත් වූවාය. වැළඳගත්තාය. ඒ ප්‍රජාව තථාගතයන් වහන්සේ අවිද්‍යා ප්‍රහාණය කරන ධර්මය දෙසද්දී ඇසියයුත්තක් කොට සිතයි. කණ නමයි. දැනගැනීමට සිත පිහිටුවයි. මහණෙනි, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ පහළ වීමෙන් මේ සතරවෙනි ආශ්චර්ය අද්භූත ධර්මය පහළවේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**6.** "මහණෙනි, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ පහළවීමෙන් මේ සතර ආශ්චර්ය අද්භූත ධර්මයෝ පහළ වෙත්."

**29. ආනන්දඅබ්භූත සූත්‍රයඃ-** 1. "මහණෙනි, අනද තෙරුන් කෙරෙහි මේ සතර ආශ්චර්ය අද්භූත ධර්ම කෙනෙක් වෙත්. කවර සතර කෙනෙක්ද යත්?

**2.** "මහණෙනි, ඉදින් භික්ෂු පිරිසක් ආනන්ද ස්ථවිරයන් දකින්ට පැමිණේද, දැකීමෙන් සතුටු වෙයි. ඔවුන්ට එහිදී ආනන්ද ධර්මදෙශනා කරයි. වදාළ කල්හිද ඒ පිරිස සතුටුවූවාහු වෙත්. මහණෙනි, ඒ භික්ෂු පිරිස තෘප්තනුවූවාහුම වෙත්. ඉක්බිති ආනන්ද තුෂ්ණිම්භූත වේ.

**3.** "මහණෙනි, ඉදින් භික්ෂුණී පිරිසක් අනඳ බලන්ට පැමිණේද, දැකීමෙන් සතුටුවේද, ඔවුන්ට එහිදී අනඳ බණ වදාරයිද, දෙසූ කල්හිද සතුටුවේද මහණෙනි, භික්ෂුණී පිරිස අතෘප්තවේද නැවත ආනන්ද තුෂ්ණිම්භූත වේද,

**4.** "ඉදින් මහණෙනි, උපාසක පිරිසක් ආනන්ද ස්ථවිරයන් දකින්නට පැමිණේද දැකීමෙන් සතුටුවේද ඔවුන්ට එහිදී ආනන්ද ධර්මදෙශනා කරයිද වදාළ කල්හිද ඒ පිරිස සතුටු වෙත්ද, මහණෙනි, උපාසක පිරිස අතෘප්තවූයේ වේද නැවත ආනන්ද තෙමේ තුෂ්ණිම්භූත වේද,

**5.** "මහණෙනි, ඉදින් උපාසිකා පිරිසක් ආනන්ද ස්ථවිරයන් දකින්නට පැමිණෙත්ද, දැකීමෙන් ඒ පිරිස සතුටුවූවා වේද, ඉදින් එහි ආනන්ද ස්ථවිරයන් බණ වදාරයි. ඒ පිරිස කීමෙන් සතුටු වෙයි. මහණෙනි, උපාසිකා පිරිස අතෘප්ත වූයේම වේ. ඉක්බිති ආනන්ද ස්ථවිරයන් තුෂ්ණිම්භූත වේ.

**6.** "මහණෙනි, ආනන්ද ස්ථවිරයන් කෙරෙහි මේ සතර ආශ්චර්ය අද්භූත ධර්මයෝ වෙත්."

**30. චක්කවත්ති අබ්භූත සූත්‍රයඃ-** 1. "මහණෙනි, චක්‍රවර්ති රජු කෙරෙහි මේ සතර ආශ්චර්ය අද්භූත ධර්මකෙනෙක් වෙත්. කවර සතර කෙනෙක්ද යත්?

**2.** "මහණෙනි, ඉදින් ක්ෂත්‍රිය පිරිස චක්‍රවර්ති රජු දකින්ට පැමිණේද, දැකිමෙන් ඒ පිරිස සතුටුවේ. එහි ඉදින් චක්‍රවර්ති රජ කථාකරයිද, කථාවෙන්ද ඒ පිරිස සතුටුවේ. මහණෙනි, ක්ෂත්‍රිය පිරිස අතෘප්තවේ. ඉක්බිති චක්‍රවර්ති රජ තුෂ්ණිම්භූත වෙයි.

**3.** "මහණෙනි, ඉදින් බ්‍රාහ්මණ පිරිසක් චක්‍රවර්ති රජු දකින්ට පැමිණේද, දැකීමෙන් ඒ පිරිස සතුටුවූයේද, එහිදී චක්‍රවර්තිරජ කථාකරයිද, කථාවෙන්ද ඒ පිරිස සතුටු වේ. මහණෙනි, බ්‍රාහ්මණ පිරිස අතෘප්තවේ. ඉක්බිති චක්‍රවර්ති රජ තුෂ්ණිම්භූතවේ.

**4.** "මහණෙනි, ඉදින් ගෘහපති පිරිසක් චක්‍රවර්ති රජු දකින්නට පැමිණේද, දැකීමෙන් ඒ පිරිස සතුටුවේ. ඉදින් එහිදී සක්විති රජ කථා කරයිද, කථාවෙන් ඒ පිරිස සතුටු වූයේ වේ මහණෙනි, ගෘහපති පිරිස අතෘප්තවේ. ඉක්බිති සක්විති රජ තුෂ්ණිම්භූත වේ.

**5.** "මහණෙනි, ඉදින් ශ්‍රමණ පිරිසක් සක්විති රජු දකින්ට පැමිණේද දැකීමෙන් ඒ පිරිස සතුටුවේ. ඉදින් එහිදී සක්විති රජ කථාකරයිද කථාවෙන් ඒ පිරිස සතුටුවූයේ වේ. මහණෙනි, ශ්‍රමණ පිරිස අතෘප්තවේ. නැවත සක්විති රජ තුෂ්ණිම්භූතවේ.

**6.** "මහණෙනි, සක්විති රජු කෙරෙහි මේ ආශ්චර්ය අද්භූත කරුණු සතරය.

**7.** "මහණෙනි, එසේම සතර ආශ්චර්ය අද්භූත ධර්ම කෙනෙක් ආනන්ද ස්ථවිරයන් කෙරෙහි ඇතිවේ. කවර සතරක්ද යත්. (මෙහි මේ වර්ගයේ 29 සූත්‍රයේ 2, 3, 4, 5 දෙ යෙදිය යුතුයි.)

**8.** "මහණෙනි මේ සතර ආශ්චර්ය අද්භූත ධර්මයෝ ආනන්ද ස්ථවිරයන් කෙරෙහි වේ."

**(දහතුන්වෙනි භය වර්ගය නිමි.)**

---

## 14. පුද්ගල වර්ගය.

**31. සංයොජනප්පහාණ සූත්‍රයː-** 1. "මහණෙනි, මේ පුද්ගලයෝ සතරදෙනෙක් ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්. කවර සතරදෙනෙක්ද යත්.

2. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙකුට ලොකය භජනය කරණ,

3. "සංයොජන ප්‍රහීණ නොවූවාහු වෙත්ද, උත්පත්තිය ලැබෙන සංයොජන ප්‍රහීණනුවූවාහු වෙත්ද, භවය ලැබෙන සංයොජන ප්‍රහීණ නොවූවාහු වෙත්ද,

4. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙකුට කාමධාතුව භජනය කරණ, (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.)

5. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙකුට කාම ධාතුව භජනය කරණ, (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.)

6. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙකුට කාම ධාතුව භජනය කරණ සංයොජන ප්‍රහීණවූවාහු වෙත්ද, උත්පත්තිය ලැබෙන සංයොජන ප්‍රහීනවූවාහු වෙත්ද භවය ලැබෙන සංයොජන ප්‍රහීනවූවාහු වෙත්ද,

7. "මහණෙනි, කවර පුද්ගලයෙකුට කාමධාතුව භජනය කරණ සංයොජන ප්‍රහීන නොවූවාහු වෙත්ද, ඉපදීම ලැබෙන සංයොජන ප්‍රහීන නොවූවාහු වෙත්ද, භවය ලැබෙන සංයොජන ප්‍රහීන නොවූවාහු වෙත්ද, ඒ සකෘදාගාමි පුද්ගලයාටය. මහණෙනි, මේ පුද්ගලයාට කාම ධාතුව භජනය කරණ සංයොජන ප්‍රහීන නොවූවාහු වෙත්. උත්පත්තිය ලැබෙන සංයොජන ප්‍රහීන නොවූවාහු වෙත්. භවය ලැබෙන සංයොජන ප්‍රහීන නොවූවාහු වෙත්.

8. "මහණෙනි, කවර පුද්ගලයෙකුට කාමධාතුව භජනය කරණ සංයොජන ප්‍රහීනවූවාහු වෙත්ද, උත්පත්තිය ලැබෙන සංයොජන ප්‍රහීනනොවූවාහු වෙත්ද, භය දෙන සංයොජන ප්‍රහීන

නොවූවාහු වෙත්ද, උද්ධංසොත අකනිට්ඨගාමී පුද්ගලයාටය. මහණෙනි, මේ පුද්ගලයාට කාමධාතුව භජනය කරණ සංයොජන ප්‍රහීනවූවාහු වෙත්. උත්පත්තිය දෙන සංයොජන ප්‍රහීන නොවූවාහු වෙත්. භවය දෙන සංයොජන ප්‍රහීන නොවූවාහු වෙත්.

**9.** "මහණෙනි, කවර පුද්ගලයෙකුට කාමධාතුව භජනය කරණ සංයොජන ප්‍රහීනවූවාහුද, උත්පත්තිය දෙන සංයොජන ප්‍රහීන වූවාහුද, භවය දෙන සංයොජන ප්‍රහීන නොවූවාහුද අනන්තරාපරිනිබ්බායී පුද්ගලයාටය. මහණෙනි, මේ පුද්ගලයාට කාමධාතුව භජනය කරණ සංයොජන ප්‍රහීන වූවාහු වෙත්. උත්පත්තිය ලැබෙන සංයොජන ප්‍රහීනවූවාහු වෙත්. භවය ලැබෙන සංයොජන ප්‍රහීන නොවෙත්.

**10.** "මහණෙනි. කවර පුද්ගලයෙකුට කාමධාතුව භජනය කරණ සංයොජන ප්‍රහීන වෙත්ද, උත්පත්තිය ලැබෙන සංයොජන ප්‍රහීන වෙත්ද, භවය ලැබෙන සංයොජන ප්‍රහීන වෙත්ද, රහතන් වහන්සේටය. මහණෙනි, මේ පුද්ගලයාට කාමධාතුව පරිහරණය කරන සංයොජන ප්‍රහීන වෙත්. උත්පත්තිය ලැබෙන සංයොජන ප්‍රහීන වෙත්. භවය ලැබෙන සංයොජන ප්‍රහීන වෙත් මහණෙනි, මේ පුද්ගලයන් සතර දෙන ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්."

**32. යුත්තපටිභාණ සූත්‍රයː-** (මේ වර්ගයේ 8 වෙනි සූත්‍රය දක්වා 1 ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

**2.** "සුදුස්සම වැටහෙන වහා නොවැටහෙන එකෙක, වහා වැටහෙන සුදුස්ස නොවැටහෙන එකෙක, සුදුස්සත් වැටහෙන වහාත් වැටහෙන එකෙක, සුදුස්සද නොවැටහෙන වහාත් නොවැටහෙන එකෙක. මහණෙනි, මේ පුද්ගලයෝ සතරදෙන ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්."

**33. උග්ඝටිතඤ්ඤූ සූත්‍රයː-** 2. "උද්ඝටිතඥ පුද්ගලයාය, විපචිතඥ පුද්ගලයාය, නෙය්‍ය පුද්ගලයාය, පදපරම පුද්ගලයාය. මහණෙනි, මේ පුද්ගලයන් සතරදෙන ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්."

34. **උට්ඨානඵලුපජීවි සූත්‍රයː-** 2. "උට්ඨානවීර්යයෙන් ජීවත්වන, කර්ම ඵලයෙන් ජීවත් නොවන පුද්ගලයාය, කර්ම ඵලයෙන් ජීවත්වන උට්ඨාන වීර්යයෙන් ජීවත් නොවන පුද්ගලයාය, උට්ඨාන වීර්යයෙන්ද කර්ම ඵලයෙන්ද ජීවත්වන පුද්ගලයාය. උට්ඨාන වීර්යයෙන් හා කර්ම ඵලයෙන් ජීවත් නොවන පුද්ගලයාය. මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙන ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්."

35. **භාවජ්ජානවජ්ජ සූත්‍රයː-** 2. "වැරදි සහිත පුද්ගලයාය, වැරදි බහුල පුද්ගලයාය, වැරදි අඩු පුද්ගලයාය, නිවරද පුද්ගලයාය යන සතරදෙනයි.

3. "මහණෙනි, වැරදි සහිත පුද්ගලයා කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් වරද සහිත කාය කර්මයෙන් යුක්තවූයේ වේද, වරද සහිත වාක් කර්මයෙන් යුක්තවූයේ වේද, වරද සහිත මනො කර්මයෙන් යුක්ත වූයේ වේද, මහණෙනි, මෙසේ පුද්ගලතෙම වරද සහිත වූයේ වේ.

4. "මහණෙනි. කෙසේ පුද්ගලතෙම වැරදි බොහෝ වූයේ වේද, මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් බහුල වශයෙන් සාවද්‍ය කාය කර්මයෙන් යුක්තවූයේද, නිවැරදිව ස්වල්පද, බහුල වශයෙන් සාවද්‍ය වාක් කර්මයෙන් යුක්තවූයේද, නිරවද්‍යව ස්වල්පද, බහුල වශයෙන් සාවද්‍ය මනො කර්මයෙන් යුක්තවූයේ වේද නිවරදව ස්වල්පද, මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම වැරදි බහුල වේ.

5. "මහණෙනි, කෙසේ පුද්ගලතෙම ස්වල්ප වැරදි ඇත්තේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් බහුලව නිවැරදි කාය කර්මයෙන් යුක්ත වූයේද, වැරදි සහිතව ස්වල්පයක් වේද බහුල වශයෙන් නිවැරදි වාක් කර්මයෙන් යුක්තවූයේ වේද වැරදි සහිතව ස්වල්පයක් වේද බහුල වශයෙන් නිවැරදි මනො කර්මයෙන් යුක්තවූයේ වේද වැරදි සහිතව ස්වල්පයක් වේද, මහණෙනි, පුද්ගලතෙමේ මෙසේ වැරදි අඩුවේ.

6. "මහණෙනි, පුද්ගලතෙමේ කෙසේ නිවැරදි වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් නිවැරදි කාය

කර්මයෙන් යුක්තවූයේ වේද, නිවැරදි වාක් කර්මයෙන් යුක්තවූයේ වේද, නිවැරදි මනො කර්මයෙන් යුක්තවූයේ වේද, මහණෙනි මෙසේ පුද්ගලතෙම නිවැරදිවේ. මහණෙනි, මේ පුද්ගලයෝ සතරදෙන ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්."

**36. සීල පරිපූරකාරී සූත්‍රයඃ**- 2. "මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සීලයත් සම්පූර්ණ නොකරන්නේද, සමාධිය සම්පූර්ණ නොකරන්නේ වේද, ප්‍රඥාව සම්පූර්ණ නොකරන්නේ වේද,

3. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සීලයත් සම්පූර්ණ කරන්නේ වේද, සමාධිය සම්පූර්ණ නොකරන්නේ වේද, ප්‍රඥාව සම්පූර්ණ නොකරන්නේ වේද,

4. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සීලය සම්පූර්ණ කරන්නේ වේද, සමාධිය සම්පූර්ණ කරන්නේ වේද, ප්‍රඥාව සම්පූර්ණ නොකරන්නේ වේද,

5. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සීලයත් සම්පූර්ණ කරන්නේ වේද, සමාධිය සම්පූර්ණ කරන්නේ වේද, ප්‍රඥාව සම්පූර්ණ කරන්නේ වේද, මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙන ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්."

**37. සීලගරුක සූත්‍රයඃ**- 2. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සීලය ගරුකොට නැත්තේ වේද, සීලය අධිපතිකොට නැත්තේ වේද, සමාධිය ගරුකොට නැත්තේ වේද, සමාධිය අධිපතිකොට නැත්තේ වේද ප්‍රඥාව ගරුකොට නැත්තේ වේද, ප්‍රඥාව අධිපතිකොට නැත්තේ වේද,

3. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සීලය ගරුකොට ඇත්තේ වේද සීලය අධිපතිකොට ඇත්තේ වේද, සමාධිය ගරුකොට නැත්තේ වේද, සමාධිය අධිපති කොට නැත්තේ වේද, ප්‍රඥාව ගරුකොට නැත්තේ වේද, ප්‍රඥාව අධිපතිකොට නැත්තේ වේද,

4. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සීලය ගරුකොට ඇත්තේ වේද, සීලය අධිපතිකොට ඇත්තේ වේද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සමාධිය ගරුකොට ඇත්තේ වේද, සමාධිය අධිපති කොට ඇත්තේ වේද, ප්‍රඥාව ගරුකොට නැත්තේ වේද, ප්‍රඥාව අධිපතිකොට නැත්තේ වේද,

5. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සීලය ගරුකොට ඇත්තේ වේද, සීලය අධිපතිකොට ඇත්තේ වේද, සමාධිය ගරුකොට ඇත්තේ වේද, සමාධිය අධිපති කොට ඇත්තේ වේද, ප්‍රඥාව ගරුකොට ඇත්තේ වේද, ප්‍රඥාව අධිපතිකොට ඇත්තේ වේද, මහණෙනි, මේ පුද්ගලයන් සතරදෙන ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්."

38. **නිකට්ඨකාය සූත්‍රයඃ-** 2. "කයින් ගමින් පිටවූ සිත ගමෙහිම ඇති පුද්ගලයාය. කය ගමෙහි ඇති සිත ගමෙහි නැති පුද්ගලයාය, කය සිත දෙකම ගමෙහි ඇති පුද්ගලයාය, කය ගමෙහි නැති සිතද ගමෙහි නැති පුද්ගලයාය යන සතරදෙනය.

3. "මහණෙනි, කෙසේ පුද්ගලතෙම කයින් ගමින් පිටවූයේ වේද, සිත ගමෙහි ඇත්තේ වේද, මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් වනයෙහි වානප්‍රස්ත ප්‍රාන්ත සෙනාසනවල වසයි. හෙතෙම එහි කාමවිතර්කයන්ද සිතයි. ව්‍යාපාද විතර්කද සිතයි. විහිංසා විතර්කද සිතයි. මහණෙනි, මෙසේ පුද්ගලතෙම කයින් ගමින් පිටවූයේ වේ. සිතින් ගමින් පිටවූයේ නොවේ.

4. "මහණෙනි, කෙසේ පුද්ගලතෙම කයින් ගමින් පිටනොවූයේ වේද, සිතින් ගමින් පිටවූයේ වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් වානප්‍රස්ත ප්‍රාන්තසෙනාසන සේවනය නොකරයි. හෙතෙම එහිදීම නෛෂ්ක්‍රම්‍ය විතර්කයන් සිතයි. අව්‍යාපාද විතර්කයන් සිතයි. අවිහිංසා විතර්කයන් සිතයි. මහණෙනි, පුද්ගලතෙම මෙසේ කයින් ගමින් පිටවූයේ නොවේ. සිතින් ගමින් පිටවූයේ වේ.

5. "මහණෙනි, කෙසේ පුද්ගලතෙම කයින් ගමින් පිටනොවූයේ වේද, සිතින් ගමින් පිටනොවූයේ වේද, මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් අරණ්‍යයෙහි වානප්‍රස්ත ප්‍රාන්තසෙනාසනවල නොවසයි. හෙතෙම එහි කාමවිතර්කද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

සිතයි, ව්‍යාපාද විතර්කද සිතයි. විහිංසා විතර්කද සිතයි. මහණෙනි, මෙසේ පුද්ගලතෙම කයින් ගමින් පිට නොවූයේද සිතින් ගමින් පිටනොවූයේද වේ.

**6.** "මහණෙනි, කෙසේ පුද්ගලතෙම කයින් ගමින් පිටවූයේද සිතින් ගමින් පිටවූයේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් වනයෙහි වානප්‍රාස්ත ප්‍රාන්ත සෙනාසන ආශ්‍රය කරයි. එතෙම එහි නෛෂ්ක්‍රමය විතර්කද සිතයි. අව්‍යාපාද විතර්කද සිතයි. අවිහිංසා විතර්කද සිතයි. මහණෙනි, මෙසේ පුද්ගලතෙම නික්මුනු කය ඇත්තේද නික්මුනු සිත ඇත්තේ වේ. මහණෙනි, මේ පුද්ගලයෝ සතරදෙන ලොකයෙහි ඇත්තාහ, විද්‍යමාන වෙත්"

**39. ධම්මකථික සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ ධර්ම කථිකයෝ සතරදෙනෙක් වෙත්. කවර සතරදෙනෙක්ද යත්?

**2.** "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් ධර්ම කථිකයෙක් තේරුමක් නැතිව ස්වල්පයක් කියයි. පිරිසිද අර්ථ අනර්ථයන්හි දක්ෂ නොවේද, මහණෙනි, මෙබඳු ධර්ම කථික තෙම මෙබඳු පිරිසක ධර්මකථිකයාය යන සංඛ්‍යාවට යයි.

**3.** "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් ධර්ම කථිකයෙක් අර්ථ සහිතව ස්වල්පයක් කියයි. පිරිසිද අර්ථ අනර්ථ දෙකේහි දක්ෂද මහණෙනි, මෙබඳු ධර්මකථික තෙම මෙබඳු පිරිසට ධර්ම කථිකයෙකැයි සංඛ්‍යාවට යයි.

**4.** "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් ධර්මකථිකයෙක් අර්ථ රහිතව බොහෝ කියයි. පිරිසද අර්ථ අනර්ථ දෙකේ අදක්ෂද මහණෙනි, මෙබඳු ධර්ම කථිකතෙම මෙබඳු පිරිස මැද ධර්ම කථිකයෙක යන සංඛ්‍යාවට යයි.

**5.** "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් ධර්මකථිකයෙක් අර්ථ සහිතව බොහෝ කියයි. පිරිසද අර්ථානර්ථ දැනීමේ දක්ෂය. මහණෙනි, එබඳු ධර්ම කථික තෙම මෙබඳු පිරිස මැද ධර්ම කථිකය යන සංඛ්‍යාවට යයි මහණෙනි, මේ සතර ධර්ම කථිකයෝය."

**40. වාදීපභෙද සූත්‍රයː-** 1. "මහණෙනි, මේ වාදිහු සතරදෙනෙක් වෙත්. කවර සතරදෙනෙක්ද යත්?

2. "මේ ලොකයෙහි ඇතැම් වාදියෙක් අර්ථ කථා වශයෙන් කියන්ට නොහැකිවෙයි. ව්‍යඤ්ජන වශයෙන් කිව හැකිවෙයි. මහණෙනි, ව්‍යඤ්ජන වශයෙන් නොකිවහැකි අර්ථ වශයෙන් කිවහැකි වාදියෙක්ද ඇත. අර්ථ වශයෙනුත් ව්‍යඤ්ජන වශයෙනුත් කිවහැකි වාදියෙක් ඇත. අර්ථ වශයෙනුත් ව්‍යඤ්ජන වශයෙනුත් නොකිවහැකි වාදියෙක් ඇත. මහණෙනි මේ වාදීන් සතරදෙනාය.

සතර ප්‍රතිසම්භිදාවන් ගෙන් යුත් භික්ෂුවට අර්ථ වශයෙනුත් ව්‍යඤ්ජන වශයෙනුත් නොකිව හැකියේ ය යන මෙය නොසිදු වන්නකි."

(දහහතරවෙනි පුද්ගල වර්ගය නිමි)

## 15. ආභා වර්ගය.

**41. චතුරාභා සූත්‍රයː-** "මහණෙනි, මේ ආලොක සතරක් වෙත්. කවර සතරක්ද යත්. චන්ද්‍රාලොකය, සූර්යාලොකය, අග්නි ආලොකය, ප්‍රඥාලොකය යන සතරයි. මහණෙනි, මේ සතර ආලොකයෝය. මහණෙනි, මේ සතර ආලොකයන්ගෙන් ප්‍රඥාලොකය ශ්‍රෙෂ්ඨයි."

**42. චතුප්පභා සූත්‍රයː-** "මහණෙනි, මේ ප්‍රභාවෝ සතර දෙනෙකි. කවර සතරදෙනෙක්ද යත්. චන්ද්‍රප්‍රභාව, සූර්ය ප්‍රභාව, අග්නිප්‍රභාව, ප්‍රඥාප්‍රභාව, මහණෙනි, මේ සතර ප්‍රභාවෝයි. මහණෙනි, මේ සතර ප්‍රභාවන්ගෙන් යම් මේ ප්‍රඥා ප්‍රභාවයක් ඇද්ද එය අග්‍රයි."

**43. චතුරාලොක සූත්‍රයː-** "මහණෙනි, මේ සතර ආලොකයෝ වෙත්. කවර සතරක්ද යත්. චන්ද්‍රාලොකය, සූර්යාලොකය, අග්නිලොකය, ප්‍රඥාලොකය. මහණෙනි, මේ

සතර ආලොකයෝය. මහණෙනි. මේ සතර ආලොකයන්ගෙන් යම් මේ ප්‍රඥාලොකයක් ඇද්ද එය ශ්‍රෙෂ්ඨයි.”

**44. චතුරොභාස සූත්‍රයः-** “මහණෙනි මේ ඔභාස සතරක් වෙත්. කවර සතරක්ද යත් චන්ද්‍රොභාසය, සූරියොභාසය, අග්නි ඔභාසය, ප්‍රාඥොභාසය යන සතරයි. මහණෙනි, මේ සතර ඔභාසයන්ගෙන් යම් මේ ප්‍රඥා ඔභාසයක් ඇද්ද එය ශ්‍රෙෂ්ඨයි.”

**45. පජ්ජොතචතුක්ක සූත්‍රයः-** “මහණෙනි, මේ පජ්ජොත සතරක් වෙත්. කවර සතරක්ද යත්. චන්ද්‍ර ප්‍රද්‍යොතය, සූරියප්‍රද්‍යොතය, අග්නි ප්‍රද්‍යොතය, ප්‍රඥාප්‍රද්‍යොතය යන සතරයි. මහණෙනි, මේ සතර ප්‍රද්‍යොතයෝයි. මහණෙනි, මේ සතර ප්‍රද්‍යොතයන්ගෙන් යම් මේ ප්‍රඥාප්‍රද්‍යොතයක් ඇද්ද එය ශ්‍රෙෂ්ඨයි.”

**46. කාලචතුක්ක සූත්‍රයः-** 1. “මහණෙනි, මේ කාල සතරක් වෙත්. කවර සතරක්ද යත් කාලයෙහි ධර්ම ශ්‍රවණය, කාලයෙහි ධර්ම සාකච්ඡාව, කාලයෙහි සමථය, කාලයෙහි විදර්ශනාව යන සතර මහණෙනි, කාලයෝයි.”

**47. භාවියමාන සූත්‍රයः-** 1. “මහණෙනි, මේ කාලයෝ සතරදෙනෙක් මනාකොට වඩනු ලබන්නේ, මනාකොට නැවත නැවත පෙරලන ලද්දේ, ක්‍රමයෙන් ආශ්‍රවයන් ක්ෂයට පමුණුවයි. කවර සතරක්ද යත්. සුදුසු කාලයෙහි ධර්මශ්‍රවණය, සුදුසු කාලයෙහි ධර්ම සාකච්ඡාව, සුදුසු කාලයෙහි සමථය සුදුසු කාලයෙහි විදර්ශනාව යන සතරයි. මහණෙනි, මේ සතර කාලයෝ මනාකොට භාවිතා කරණ ලද්දේ මනාකොට නැවත නැවත කරණ ලද්දේ ක්‍රමයෙන් ආශ්‍රවයන්ගේ ක්ෂයයට පැමිණෙත්.

2. “මහණෙනි, යම්සේ පර්වතයක් මුදුනෙහි මහත්කොට ස්පර්ශ කරණ ලද වර්ෂාව වස්නා කල්හි ඒ ජලය පහත් භූමි කරා යන්නේ පර්වත කඳුරු ප්‍රදරශාඛාවන් පුරවත්. පර්වත කන්දර ප්‍රදරශාඛාවන් සම්පූර්ණවීමෙන් කුඩා වලවල් පුරවත්. කුඩා වලවල් පිරවීමෙන් මහ වලවල් පුරවත්. මහ වලවල් පිරීමෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කුඩා නදීහු පුරවත්. කුඩා නදීහු පිරීමෙන් මහා නදී පුරවත්. මහා නදී පිරීමෙන් සමුද්‍ර සංඛ්‍යාත සාගරය පුරවත්. මහණෙනි, එසේම මේ සතර කාලයෝ මනාකොට වඩනු ලබන්නාහු මනාකොට පෙරලනු ලබන්නාහු ක්‍රමයෙන් ආශ්‍රවයන් ක්ෂයට පමුණුවත්"

**48. වචීදුච්චරිත සූත්‍රය:-** "මහණෙනි, මේ වාක් දුශ්චරිත සතරක් වෙත්. කවර සතරක්ද යත්. මුසාවාදය, පිසුනාවාචය එරුසාවාචය, සම්ඵප්‍රලාපය යන සතරයි. මහණෙනි, මේ සතර වාග් දුශ්චරිතයෝය.

**49. වචීසුචරිත සූත්‍රය:-** "මහණෙනි, මේ සතර වාග් සුචරිත කෙනෙක් වෙත්. කවර සතරක්ද යත් සත්‍යවචන, නොපිසුනු වචන, සිනිඳු වචන ප්‍රමාණවත් කථාව මහණෙනි, මේ සතර වාග් සුචරිතයෝය."

**50. චතුසාර සූත්‍රය:-** "මහණෙනි, මේ සාර සතරක් වෙත්. කවර සතරක්ද යත්. සීලසාරය, සමාධිසාරය, ප්‍රඥාසාරය, විමුක්තිසාරය මහණෙනි, මේ සතර සාරයෝය."

**(පසලොස්වෙනි ආභා වර්ගය නිමි.)**

---

## හතරවෙනි පණ්ණාසකයː

# 16. ඉන්ද්‍රිය වර්ගය.

**1. චතුරින්ද්‍රිය සූත්‍රය:-** "මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ සතරක් වෙත් කවර සතරක්දයත්, සද්ධින්ද්‍රියය, විරින්ද්‍රියය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රියය යන සතරයි. මහණෙනි, මේ සතර ඉන්ද්‍රියයෝයි."

**2. සද්ධාබල සූත්‍රය:-** 1. "මහණෙනි, මේ බල සතරක් වෙත්. කවර සතරක්ද යත්,

2. "ශ්‍රද්ධාබලය, වීර්යබලය, සතිබලය, සමාධිබලය යන සතරයි. මහණෙනි, මේ සතර බලයෝය.

3. **පඤ්ඤාබල සූත්‍රය**:- 1. (3, 4, 5 සූත්‍රවල 1 ඡේදය මේ වර්ගයේ 2 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "ප්‍රඥාබලය, වීර්යබලය, අනවද්‍යබලය සංග්‍රහබලය යන සතරයි. මහණෙනි, මේ සතර බලයෝයි.

4. **සතිබල සූත්‍රය**:- 2. "සතිබලය සමාධිබලය, අනවජ්ජ බලය, සංග්‍රහබලය යන සතරයි. මහණෙනි, මේ සතර බලයෝයි.

5. **පටිසංඛානබල සූත්‍රය**:- 2. "ප්‍රත්‍යවෙක්ෂාබලය, භාවනාබලය, අනවද්‍යබලය, සංග්‍රහබලය යන සතරයි. මහණෙනි, මේ සතර බලයෝයි."

6. **අසංඛෙය්‍යකප්ප සූත්‍රය**:- 1. "මහණෙනි, කල්පයාගේ මේ අසංඛෙය්‍යය සතරක් වෙත්. කවර සතරක්දයත්, මහණෙනි, යම් කලෙක්හි කල්පය නැසෙන්නේ වේද,

2. "එය මෙපමණ වර්ෂයයි කියා හෝ මෙපමණ වර්ෂ දහසකැයි කියා හෝ මෙපමණ වර්ෂ ලක්ෂයකැයි කියා හෝ සංඛ්‍යා කරන්නට නොහැකිය.

3. "මහණෙනි. යම් කලෙක්හි කල්පය නැසී සිටීද, (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

4. මහණෙනි, යම් කලෙක්හි කල්පය ඇතිවේද, (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

5. "මහණෙනි, යම්කලෙක්හි කල්පය ඇතිවී පවතීද, (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි) මහණෙනි, මේ සතර කල්පයාගේ අසංඛ්‍යායෝයි."

7. **පබ්බජිතරොග සූත්‍රය**:- 1. "මහණෙනි, මේ රෝගයෝ දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක්දයත්, කායික රොගය, චෛතසික රෝගය යන දෙකයි.

2. "කායික රෝගයෙන් එක් වර්ෂයක් නිරෝගිකම ප්‍රතිඥා කරනුලබන වර්ෂ දෙකක් නිරෝගීකම බලාපොරොත්තු වන්නාවූ වර්ෂ තුනක් නිරෝගිකම බලාපොරොත්තු වන්නාවූ වර්ෂ සතරක් නිරෝගිකම බලාපොරොත්තුවන්නාවූ වර්ෂ පසක් නිරොගිකම

බලාපොරොත්තුවන්නාවූ, දසවර්ෂයක් නිරෝගිකම බලාපොරොත්තු වන්නාවූ, විසි වර්ෂයක් නිරෝගිකම බලාපොරොත්තු වන්නාවූ තිස් වර්ෂයක් නිරෝගිකම බලාපොරොත්තු වන්නාවූ, හතළිස් වර්ෂයක් නිරෝගිකම බලාපොරොත්තු වන්නාවූ, පනස් වර්ෂයක් නිරෝගිකම බලාපොරොත්තු වන්නාවූ, වර්ෂ සියයක් නිරෝගිකම බලාපොරොත්තු වන්නාවූ සත්වයන් දකිත්.

**3.** "යම්කිසි කෙනෙක් චෛතසික රෝගයෙන් මොහොතක් නමුත් නිරෝගිකම ප්‍රතිඥාකරත්ද ක්ෂීණාශ්‍රවයන් හැර ඒ සත්වයෝ දුර්ලභවෙත්.

**4.** "මහණෙනි, පැවිද්දාට මේ රෝග සතරක් වෙත්. කවර සතරක්දයත්, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මහත් ආශා ඇත්තේවේද, දුක් ඇත්තේවේද, තව තවත් සිවුරු පිඬු, සෙනසුන්, ගිලන්පස, බෙහෙත්, පිරිකරින් නොසතුටුවූයේවේද, හෙතෙම මහත් ආශා ඇත්තේ දුක් ඇත්තේ තව තවත් සිවුරු පිඬු සෙනසුන්, ගිලන්පස, බෙහෙත් පිරිකරින් නොසතුටුවූයේ අවනම්බු නොලැබීමට ලාභ සත්කාර ගුණ කථාව ලැබීමට ලාමක අදහස උපදවයි. හෙතෙම අවනම්බු නොලැබීමට ලාභ සත්කාර ගුණ කථා ලැබීමට නැගිටියි. සෙලවෙයි. වෑයම් කෙරෙයි. හෙතෙම දැනගැනීම පිණිස කුලයන් කරා පැමිණෙයි. දැනගැනීම පිණිස හිඳියි. දැනගැනීම පිණිස බණ කියයි. දැනගැනීම පිණිස මලමුත්‍ර උසුලයි. මහණෙනි, මේ සතර පැවිද්දාට රෝගයෝය.

**5.** "මහණෙනි, තොප විසින් මෙහි මෙසේ හික්මිය යුතුයි. මහත් ආශා නොවන්නෙමි, දුක් නොවන්නෙමි. තව තවත් සිවුරු පිඬු සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරින් නොසතුටු නොවන්නෙමු, අවනම්බු ලැබීමට, ලාභ, සත්කාර කීර්ති ප්‍රශංසා ලැබීමට ලාමක අදහසක් නොකරන්නෙමි. ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා නිසා අවනම්බු නොලැබීමට නොනැගිටින්නෙමි. නොගැටෙන්නෙමි. වෑයම් නොකරන්නෙමි. සීත, උෂ්ණ, බඩසය, පවස්, ඩැහැලේ බොන මැස්සෝය, මදුරුවෝය. වා අව්

දීර්ඝජාතීන්ගේ ස්පර්ශ, නපුරුකොට කියන නපුරුකොට ආවචනයන් දුක්වූ, තියුණුවූ කෘරවූ, කටුකවූ, අයහපත්වූ නොමනාපවූ, පා නගන්නාවූ ශාරීරික වෙදනාවන් ඉවසන්නේ වන්නෙමු යයි තොප විසින් මෙසේ හික්මිය යුතුයි.”

8. **පරිහානි ධම්ම සූත්‍රය**:- 1. එහි වනාහි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ‘ඇවැත්නි මහණෙනි’යි භික්ෂූන් ඇමතූසේක. ඒ භික්ෂූහු ‘ඇවැත්නියි’ කියා ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට පිළිවදන් දුන්හ. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙසේ වදාළසේක.

2. ඇවැත්නි, යම්කිසි භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ සතර ධර්මයක් තමා කෙරෙහි දකී, කුශල ධර්මයන්ගෙන් පිරිහෙයි. මේ පිරිහීම භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී යයි නිමාවට යායුතුයි.

3. “කවර සතරක්දයත්, රාගයාගේ විපුල භාවය, ද්වෙෂයාගේ විපුලභාවය, මොහයාගේ විපුලභාවය, ඔහුට ගැඹුරුවූ ස්ථාන අස්ථානයන්හි ප්‍රඥාචක්ෂුස නොපවතී (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

4. (මේ ඡෙදය මේ සූත්‍රයේ 2 ඡෙදය මෙනි.)

5. “කවර සතරක්දයත්, රාගය තුනී බැවින්ද ද්වෙෂය තුනී බැවින්ද මොහය තුනී බැවින්ද, ගැඹුරුවූ ස්ථාන අස්ථානයන්හි ප්‍රඥාචක්ෂුස පවතීද එහෙයිනි. (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

9. **ආනන්ද - භික්ඛුනී සූත්‍රය**:- 1. එක් කාලයෙක්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ කොසඹෑ නුවර ඝොෂිතාරාමයෙහි වාසය කරණසේක. ඉක්බිති එක්තරා භික්ෂුණියක් එක්තරා පුරුෂයෙකුට ආමන්ත්‍රණය කෙළේය. ‘එම්බා පුරුෂය, ඔබ මෙහි එන්න. ආර්ය ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එහි යව්. ගොස් මාගේ වචනයෙන් ආර්ය ආනන්ද ස්ථවිරයන් වහන්සේට වඳුව.

**2.** "ස්වාමීනි, මෙනම් ඇති භික්ෂුණිය ලෙඩ ඇත්තීය, දුක් ඇත්තීය, දැඩිගිලන් ඇත්තීය. ඕතොමෝ ආර්ය ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ පා සිරසින් වඳී. මෙසේද කියව, 'ආර්ය ආනන්ද ස්ථවිරයන් වහන්සේ භික්ෂුණී අසපුව යම් තැනෙක්හිද, ඒ භික්ෂුණිය යම් තැනෙක්හිද එහි අනුකම්පා උපදවා වඩීවා යහපත්ය කියායි.

**3.** ඒ පුරුෂතෙම 'ආර්යාවෙනි, එසේය'යි ඒ පුරුෂතෙම භික්ෂුණියට පිළිවදන්දී, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වැඳ, එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ පුරුෂතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ තුෂ්ණිම්භාවයෙන් ඉවසූසේක.

**4.** ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ හැඳපෙරවා පාත්‍ර සිවුරු ගෙන භික්ෂුණී ආශ්‍රමය යම් තැනෙක්හිද එහි පැමිණිසේක.

**5.** ඒ භික්ෂුණිය දුරින්ම එන ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ දැක්කේය. වඩින්නාවූ උන්වහන්සේ දැක හිස සහිතව පොරවා ඇඳෙහි හොත්තේය. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඒ භික්ෂුණිය යම් තැනෙක්හිද එහි වැඩිසේක. වැඩ, පණවන ලද අස්නෙහි වැඩසිටි සේක. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ වැඩසිට ඒ භික්ෂුණියට "නැගනියනි, මේ කය ආහාරයෙන් හටගත්තේය. ආහාරය ඇසුරුකොට ඇත්තේය. ආහාරය අත්හැරිය යුතුය.

**6.** "නැගනිය, මේ ශරීරය තෘෂ්ණාවෙන් හටගත්තේය. තෘෂ්ණාව ඇසුරුකළේය. තෘෂ්ණාව අත්හැරිය යුතුය. නැගනිය, මේ ශරීරය මානයෙන් හටගත්තේය. මානය ඇසුරුකොට ඇත්තේය. මානය දුරුකටයුතුය. නැගනිය, මේ ශරීරය මෛථුනයෙන් හටගත්තේය. මෛථුනයෙහි ප්‍රත්‍යය නැසීම භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළේය.

7. "නැගනියෙනි, මේ ශරීරය ආහාරයෙන් හටගත්තේය. ආහාරය ඇසුරුකර ඇත්තේය. ආහාරය ප්‍රහීන කටයුතුයයි යන යමක් වදාළසේක්ද, මෙය කුමක් සඳහා වදාරණ ලද්දේද?

8. "නැගණියෙනි, මේ ලෝකයෙහි මහණ නුවණින් කල්පනාකොට ආහාරය ගනියි. ක්‍රීඩා පිණිස නොවේ. මද වැඩීම පිණිස නොවේ. සැරසීම පිණිස නොවේ. යම්තාක් මේ ශරීරය පැවැත්ම පිණිස, යැපීම පිණිස, විහිංසාව දුරුවීම පිණිස බ්‍රහ්මචරියට අනුකම්පා පිණිස, ආහාරය ගනියිද, මෙසේ පරණ වේදනාව සංසිඳුවමි. අළුත් වේදනාවක් නූපදවමි. මාගේ ජීවිත යාත්‍රාව වන්නේය. නිවරද බවද පහසු විහරණයද වන්නේය' කියායි.

9. "හෙතෙම මැත භාගයෙහි ආහාරය නිසා ආහාරය අත්හරියි. නැගනියනි, මේ ශරීරය ආහාර ඇසුරුකොට වේ. ආහාරය දුරුකටයුතුය. මෙසේ යමක් කියන ලද්දේද එය මේ සඳහා වදාරණ ලද්දේය.

10. "නැගනියනි, මේ ශරීරය තෘෂ්ණාවෙන් හටගත්තේය. තෘෂ්ණාව ඇසුරුකොට වේ. තෘෂ්ණාව දුරු කටයුතුය. මෙසේ යමක් වදාරණලදද මෙය කුමක් සඳහා කියන ලදද,

"නැගණියෙනි, මේ ලොකයෙහි නැගනියක් 'අසවල් භික්ෂුව ආශ්‍රවයන් ක්ෂයවීමෙන් ආශ්‍රව රහිත අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද මෙලොව තෙමේ විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරයි. ඔහුට මෙසේ සිතෙයි. කවදා නම් මමත් ආශ්‍රවයන් ක්ෂයවීමෙන් අර්හත්ඵල සමාධියද අර්හත්ඵල ප්‍රඥාවද මෙලොව තෙමේ විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරන්නෙමියි'.

11. "හෙතෙම මැතභාගයෙහි තෘෂ්ණාව නිසා තෘෂ්ණාව අත්හරියි. නැගනියනි, ශරීරය තෘෂ්ණාවෙන් උපන්නේය. තෘෂ්ණාව ඇසුරුකොට සිටී. තෘෂ්ණාව ප්‍රහීන කටයුතුයයි යමක් වදාරණ ලද්දේ නම් එය මේ සඳහා වදාරණලදී.

12. "නැගනියනි, මේ ශරීරය මානයෙන් හටගත්තේය. මානය ඇසුරුකොට ඇත්තේය. මානය දුරුකටයුතුය. මෙසේ යමක් වදාරණලද්දේ නම් එය කුමක් සඳහා වදාරණ ලද්දේද?

13. "නැගනියෙනි, මේ ලොකයෙහි භික්ෂුවක් අසවල් භික්ෂුව ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ආශ්‍රව රහිත චිත්ත විමුක්තියද, ප්‍රඥා විමුක්තියද, මෙලොව තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කෙරේයයි අසයි.

14. "ඔහුට මෙසේ සිතක්වේ. 'ඒ ආයුෂ්මත් තෙමේ ආශ්‍රවයන් ක්ෂයවීමෙන් ආශ්‍රව රහිත චිත්ත විමුක්තියද ප්‍රඥා විමුක්තියද මෙලොව තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන පැමිණ වාසය කරයි. මා ගැන කෙසේදැයි සිතෙයි."

15. "හෙතෙම මෑත භාගයෙහි මානය නිසා මානය හරියි. නැගනියනි, මේ ශරීරය මානයෙන් හටගත්තේය. මානය නිසා මානය පෑහිය යුතුය. මෙසේ යමක් වදාරණ ලද්දේ නම් එය මේ සඳහා වදාරණලදී. නැගනිය, මේ ශරීරය මෛථුනයෙන් උපන්නේය. භාග්‍යවතුන් වහන්සේ විසින් මෛථුනයේ හෙතුව නැසීම වදාරණලදී."

16. "එකල්හි ඒ භික්ෂුණිය ඇඳෙන් නැගිට උතුරුසළුව එකස්කොට ආයුෂ්මත් අනඳ ස්ථවිරයන්ගේ පාමුල හිසින්වැටී ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙසේ කීයේය. "ස්වාමීනි, වැරැද්ද මා පහව ගියේය. මෙසේ බාල මුළා අකුසල්වූ යමක් යම් බඳුවූ මම කෙළෙම්ද ඒ මට ආර්ය ආනන්ද ස්ථවිරයන් වහන්සේ වැරැද්ද වැරැද්ද වශයෙන් අනාගතයට සංවරය පිණිස පිළිගන්නා සේක්වා."

17. "යම්බඳුවූ තොප මෙසේ කෙළේද, එසේ නම් නැගනිය, බාලවූ මුළාවූ අකුසල්වූ වැරැද්ද ඉක්මයේවා. නැගනිය, ඔබ යම් වේලාවක පටන් වැරැද්ද වැරැද්ද වශයෙන් දැක ධර්මයවූ පරිදි පිළියම් කෙරේද, තොපගේ එය මම පිළිගනිමි. නැගනිය, වැරැද්ද වැරැද්ද වශයෙන් දැක ආයති සංවරය පිණිස ධර්මයවූ ධර්මයවූ පරිදි ප්‍රතිකර්ම කෙරේද මෝ තොමෝ අර්ය විනයෙහි වැඩීමකි."

10. **සුගතවිනය සූත්‍රයඃ-** 1. 'මහණෙනි, සුගතයන් වහන්සේ හෝ සුගත විනය හෝ ලෝකයෙහි ඇත්තේ එය බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සැප පිණිස ලොවට

අනුකම්පා පිණිස දෙව් මිනිසුන්ගේ අර්ථය හිත සුව පිණිස වේ.

2. "මහණෙනි, සුගතයන් වහන්සේ කවරේද? මහණෙනි, මේ ලොකයෙහි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ විද්‍යාචරණ සම්පන්නවූ, සුගතවූ, ලොකවිදුවූ, නිරුත්තර පුරුෂයන් හික්මවන සාරථියෙක්වූ, දෙවිමිනිසුන්ගේ ශාස්තෘවූ, භාග්‍යවත්වූ, බුදුරජාණන් වහන්සේ ලොකයෙහි උපදීද, මහණෙනි, මේ සුගතය.

3. "මහණෙනි, සුගත විනය කවරේද? උන්වහන්සේ මුල යහපත්, මැද යහපත්, අග යහපත් අර්ථසහිත ව්‍යඤ්ජන සහිත සම්පූර්ණයෙන් පිරුණාවූ පිරිසිදු මාර්ග බ්‍රහ්මචර්ය ප්‍රකාශ කරයි. මහණෙනි, මේ සුගත විනයයි. මහණෙනි, මෙසේ සුගතයන් වහන්සේගේ හෝ සුගත විනය හෝ ලොකයෙහි ඇත්තේ බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සැප පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙවිමිනිසුන්ගේ අර්ථය හිත පිණිස පවතී.

4. "මහණෙනි, මේ ධර්ම සතරක් සද්ධර්මයාගේ සිහි නොවීම පිණිස අන්තර්ධානය පිණිස පවතී. කවර සතරක්ද යත්, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම පිළිවෙල වරදවාගත් පදව්‍යඤ්ජනයන් ගෙන් පිළිවෙළ වරදවාගත් සූත්‍ර ව්‍යඤ්ජන පරිහරණය කරත්. මහණෙනි, පිළිවෙල වරදවාගත් පද ව්‍යඤ්ජනයාගේ අර්ථයද නපුරුකොට පමුණුවාගන්නා ලද්දේ වේ. මහණෙනි, මේ පළමුවෙනි, ධර්මය සද්ධර්මයාගේ අමතකවීම පිණිස අතුරුදහන්වීම පිණිස පවතී.

5. "මහණෙනි, නැවතද මහණතෙම දුර්වචවේද, දුර්වචබව කරණ ධර්මයන්ගෙන් යුක්තද, අවවාදය නොපිළිගන්නේද, නොඉවසන්නේද, මහණෙනි, මේ දෙවෙනි කාරණය සද්ධර්මය අමතකවීම පිණිස අතුරුදහන්වීම පිණිස පවතී.

6. "මහණෙනි, නැවතද යම් ඒ භික්ෂුවක් බහුශ්‍රැතද උගත් ආගම ඇත්තේද ධර්මධරද විනයධරද මාතෘකාධරද ඔව්හු නො සකස්ව සූත්‍රාන්ත අනුන්ට කියවත්ද ඔවුන්ගේ ඇවෑමෙන්

සූත්‍රාන්තය සිඳුනු මුල් ඇත්තේවේ. පිහිටක් නැත්තේ වේ මහණෙනි, මේ තුන්වෙනි කාරණය සද්ධර්මයාගේ සිහි නොවීම පිණිස අතුරුදහන්වීම පිණිස පවතී.

6. "මහණෙනි, නැවතද ස්ථවිර භික්ෂූහු ප්‍රත්‍යය බහුල කොට ඇත්තාහු වෙත්ද, සස්න ලිහිල්කොට ගත්තාහුවෙත්ද, පඤ්චනීවරණ ධර්ම පිරීමෙහි පෙරටුවූයේද, ප්‍රකර්ෂ විවෙකයෙහි බහාතැබූ බර ඇත්තේද, නොපැමිණි ශ්‍රෙෂ්ඨත්වයකට පැමිණීමට, නොලැබූ ගුණ ධර්මයක් ලබාගැනීමට, ප්‍රත්‍යක්ෂ නොකළ මාර්ගඵලයක් ලබාගැනීමට වීර්ය නොකරයිද, මේ සතරවෙනි ධර්මය. සද්ධර්මයාගේ සිහිනොවීම පිණිස අතුරුදහන් නොවීම පිණිස පවතී. මහණෙනි, මේ ධර්ම සතර සද්ධර්මයාගේ සිහි නොවීම පිණිස අතුරුදහන් නොවීම පිණිස පවතිත්යයි වදාළ සේක.

7. මහණෙනි, මේ ධර්ම සතරක් සද්ධර්මයාගේ පැවැත්ම පිණිස, සිහිවීම පිණිස, අතුරුදහන් නොවීම පිණිස පවතිත්. කවර සතරක්දයත්, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම යහපත්කොට ගත් සූත්‍රාන්තයන් මනාකොට ගත් පද ව්‍යඤ්ජනයන් ගෙන් ඉගෙණගනිත්ද, මහණෙනි, මනාකොට තබනලද පදයාගේ ව්‍යඤ්ජනයාගේ අර්ථයද මනාකොට පැමිණෙන්නේවේද, මහණෙනි, මේ පළමුවෙනි ධර්මය සද්ධර්මයාගේ පැවැත්ම පිණිස සිහිවීම පිණිස අතුරුදහන් නොවීම පිණිස පවතී.

8. "මහණෙනි, නැවතද මහණහු, කීකරු වෙත්ද, කීකරුබව ඇතිකරණ ධර්මයන්ගෙන් යුක්තවූවාහු වෙත්ද, අනුශාසනාව ඉවසන්නෝ වෙත්ද, ගරුකරන්නෝ වෙත්ද මහණෙනි, මේ දෙවෙනි කරුණ සද්ධර්මයාගේ පැවැත්ම පිණිස අතුරුදහන් නොවීම පිණිස පවතී.

9. "මහණෙනි, නැවතද යම් ඒ භික්ෂුකෙනෙක් බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තාහු වෙත්ද උගත් ධර්මය ඇත්තේ වෙත්ද ධර්මය දරන්නාහුද, විනය දරන්නාහුද, මාතෘකා දරන්නාහුද, ඔව්හු යහපත්කොට සූත්‍රාන්තය අන්‍යයන්ට කියවත්ද, ඔවුන්ගේ

ඇවෑමෙන් සූත්‍රාන්තය නොසිඳුන මුල් ඇත්තේවේ. පිහිට ඇත්තේවේ. මහණෙනි, මේ තුන්වෙනි කරුණ සද්ධර්මයාගේ පැවැත්ම පිණිස අතුරුදහන් නොවීම පිණිස පවතී.

10. "මහණෙනි, නැවතද ස්ථවිර භික්ෂූහු ප්‍රත්‍යය බහුල කොට ඇත්තාහු නොවෙත්ද, සස්න ලිහිල්කොට ගන්නාහු නොවෙත්ද, පඤ්චනීවරණයන්ට බැසගැනීමෙහි බහා තැබූ වැඩ ඇත්තාහු වෙත්ද, විවේකයෙහි පෙරටුව යන්නාහුවෙත්ද, නොපැමිණි විශෙෂයකට පැමිණීමට නොලත් ගුණධර්මයක් ලැබීමට ප්‍රත්‍යක්ෂ නොකළ මාර්ග ඵලයක් ප්‍රත්‍යක්ෂ කිරීමට වීර්ය කරත්ද, ඊට පසුව ඇතිවන ජනයා ඔවුන්ගේ දෘෂ්ටියට අනුව යාමට පැමිණේද, ඒ ජනයාද ප්‍රත්‍යය බහුලකොට නැත්තාහු සස්න ලිහිල්කොට නොගන්නාහු පඤ්චනීවරණයන්ට බැසගැන්මෙහි බහා තැබූ වැඩ ඇත්තාහු විවේකයෙහි පෙරටුව යන්නාහු නොපැමිණි ගුණයකට පැමිණීමට නොලත් ගුණධර්මයක් ලැබීමට, ප්‍රත්‍යක්ෂ නොකළ මාර්ග ඵලයක් ප්‍රත්‍යක්ෂ කිරීමට වීර්ය කරත්ද, මහණෙනි, මේ සතර වෙනි ධර්මය සද්ධර්මයාගේ පැවැත්ම පිණිස, සිහිවීම පිණිස, අතුරුදහන් නොවීම පිණිස, පවතිත්. මහණෙනි, මේ ධර්ම සතර සද්ධර්මයාගේ පැවැත්ම පිණිස සිහිවීම පිණිස අතුරුදන් නොවීම පිණිස පවතිත් යයි" වදාළසේක.

**(දහසය වෙනි ඉන්ද්‍රිය වර්ගය නිමි.)**

---

# 17. පටිපදා වර්ගය.

11. **සංඛිත්ත පටිපදා සූත්‍රයඃ-** "මහණෙනි, මේ පිළිපැදීම් සතරක් වෙත්. කවර සතරක්ද යත්. දුක්වූ ප්‍රතිපදාවය, ප්‍රමාදවූ අභිඥාවය, (උසස් දැනීම) දුක්වූ ප්‍රතිපදාවය, වහා ලැබෙන අභිඥාවය, සුඛ ප්‍රතිපදාවය, ප්‍රමාදවූ අභිඥාවය, සැපවූ ප්‍රතිපදාවය, වහා ලැබෙන අභිඥාය. මහණෙනි මේ සතර අභිඥාවය."

**12. චිත්ථත පටිපදා සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ සතර අභිඥාවෝය. කවර සතරක්ද යත්. දුක්වූ ප්‍රතිපදාවය, ප්‍රමාදවූ අභිඥාවය, (උසස් දැනීම) දුක්වූ ප්‍රතිපදාවය වහා ලැබෙන අභිඥාවය, සුඛ ප්‍රතිපදාවය, ප්‍රමාද අභිඥාය, සුඛ ප්‍රතිපදාවය, වහා ලැබෙන අභිඥාය.

2. "මහණෙනි, දුක්වූ ප්‍රතිපදාව හා ප්‍රමාද අභිඥාව කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ඇතැමෙක් ප්‍රකෘතියෙන් තද රාග ස්වභාව ඇත්තේ වේද, වහා රාගයෙන් උපන් දුකක් දොම්නසක් විදියි. ප්‍රකෘතියෙන් තද ද්වෙෂ ස්වභාව ඇත්තේ වේද, වහා ද්වෙෂයෙන් උපන් දුකත් දොම්නසක් විඳීද, ප්‍රකෘතියෙන් තද මුළාවූවෙක් වේද, වහා මොහයෙන් උපන් දුකක් දොම්නසක් විඳීද, ඔහුට සද්ධින්ද්‍රිය (පැහැදීම) විරියින්ද්‍රිය (වීර්ය) සතින්ද්‍රිය (සිහිය) සමාධින්ද්‍රිය (එකඟ කම) පඤ්ඤින්ද්‍රිය (නුවණ) යන මේ ඉන්ද්‍රියයන් පස මෘදුව පහළ වෙත්.

3. "හෙතෙම මේ ඉන්ද්‍රියයන් පස්දෙනාගේ මෘදු බැවින් ආශ්‍රවයන්ගේ ක්ෂය වීම පිණිස ප්‍රමාදව දෙවෙනි ආත්ම භාවයට පැමිණෙයි. මහණෙනි මේ දුක්වූ ප්‍රතිපදාව හා ප්‍රමාදව ලැබෙන අභිඥා ඇත්තේ වේ.

4. "මහණෙනි, දුක්වූ ප්‍රතිපදාව හා වහා ලබන අභිඥා ඇත්තේ කෙසේ වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් ප්‍රකෘතියෙන් තද රාගය ඇත්තෙක් වේද, වහා රාගයෙන් උපන් දුකක් දොම්නසක් විඳියි. ස්වභාවයෙන් තද ද්වෙෂ ඇත්තෙක් වේද, වහා ද්වෙෂයෙන් උපන් දුකක් දොම්නසක් විඳියි, ප්‍රකෘතියෙන් තියුණු මුළා ස්වභාව ඇත්තෙක් වේද, වහා මොහයෙන් උපන් දුකක් දොම්නසක් විඳීද, ඔහුට සද්ධින්ද්‍රිය විරියින්ද්‍රිය සතින්ද්‍රිය සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය යන මේ ඉන්ද්‍රියයන් පස අධිකව පහළ වෙත්ද, හෙතෙම මේ පඤ්චෙන්ද්‍රියයන් වැඩි බැවින් වහා ආශ්‍රවයන් ක්ෂය කිරීම පිණිස දෙවෙනි ආත්ම භාවයට පැමිණේ. මහණෙනි, මේ දුක්වූ ප්‍රතිපදා හා වහා ලැබෙන අභිඥා ඇත්තේ වේ.

5. "මහණෙනි, සැපවූ ප්‍රතිපදාව හා ප්‍රමාද අභිඥා ඇත්තේ කෙසේ වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් ප්‍රකෘතියෙන් තියුණු රාග ස්වභාව ඇත්තේ වේද, වහා රාගයෙන් උපන් දුකක් දොම්නසක් නොවිඳීද, ප්‍රකෘතියෙන් තද ද්වෙෂ ස්වභාව ඇත්තේ නොවේද, වහා ද්වෙෂයෙන් උපන් දුකක් දොම්නසක් නොවිඳීද, ප්‍රකෘතියෙන් තියුණු මොහ ස්වභාව ඇත්තෙක් නොවේද, වහා මොහයෙන් උපන් දුකක් දොම්නසක් නොවිඳීද, ඔහුට සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය යන මේ ඉන්ද්‍රියයන් පස මෘදුව පහළ වෙත්ද, හෙතෙම මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ මෘදු බැවින් ආශ්‍රව ක්ෂයට ප්‍රමාදව දෙවෙනි ආත්ම භාවයට පැමිණෙයි. මහණෙනි මේ සුවවූ ප්‍රතිපදාව හා ප්‍රමාදවූ අභිඥා ඇත්තේය.

6. "මහණෙනි, සැපවූ ප්‍රතිපදාව සහ වහා අභිඥා ලැබෙන ප්‍රතිපදාව කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ප්‍රකෘතියෙන්ද රාග ඇත්තේ නොවේද, වහා රාගයෙන් උපන් දුකක් දොම්නසක් නොවිඳියි. ප්‍රකෘතියෙන් තියුණු ද්වෙෂ පුද්ගලයෙක් නොවේද, වහා ද්වෙෂයෙන් උපන් දුකක් දොම්නසක් නොවිඳීද, ප්‍රකෘතියෙන් තියුණු මුළාවූවෙක් නොවේද වහා මොහයෙන් උපන් දුකක් දොම්නසක් නොවිඳීද, ඕහට සද්ධින්ද්‍රිය විරියින්ද්‍රිය සතින්ද්‍රිය සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය යන මේ පඤ්චෙන්ද්‍රියයෝ වැඩි වශයෙන් පහළ වෙත්. හෙතෙම මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ වැඩි බැවින් වහා ආශ්‍රව ක්ෂයට අනතුරු ආත්මයට පැමිණේ. මහණෙනි, මේ සුවවූ ප්‍රතිපදාව හා තියුණු අභිඥා ඇත්තේ වේ. මහණෙනි, මේ සතර ප්‍රතිපදාවෝයි."

13. **අසුභානු පස්සි සූත්‍රයః**- 1. (මේ ඡෙදය මේ වර්ගයේ 2 සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

2. "මහණෙනි, දුක්වූ ප්‍රතිපදාව හා ප්‍රමාදවූ අභිඥාව කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ශරීරයෙහි අශුභය අනුව බලමින් වාසය කරයි. අහරෙහි පිළිකුල් සංඥා ඇත්තේ. සියලු ලොකයෙහි නොඇලෙන සංඥා ඇත්තේ. සියලු සංස්කාරයන්හි

අනිත්‍යය අනු දක්නේ. වාසය කරයිද. ඔහුට මරණ සංඥාව අධ්‍යාත්මයෙහි එළඹ සිටියේ වේද? හෙතෙම ශ්‍රද්ධා, ලජ්ජා, භය, වීර්ය, ප්‍රඥා, බලයයි කියන ලද ශෛක්ෂ (හික්මෙන) බල පස ඇසුරු කොට වසයි. ඔහුට සද්ධින්ද්‍රිය, වීරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය සංඛ්‍යාත මේ පඤ්ච ඉන්ද්‍රියයන් මෘදුව පහළ වෙත්. හෙතෙම මේ ඉන්ද්‍රියයන් පසේ මෘදු බැවින් ප්‍රමාදව ආශ්‍රව ක්ෂය පිණිස දෙවෙනි ආත්ම භාවයට පැමිණේ. මහණෙනි, මේ දුක්වූ ප්‍රතිපදාව හා ප්‍රමාදවූ අභිඥා ඇත්තේ වේ.

3. "මහණෙනි, දුක්වූ ප්‍රතිපදාව සහ තියුණු (වහා ලැබෙන) අභිඥා කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ශරීරයෙහි අසුභය අනුව බලන සුළුවූයේ ආහාරයෙහි පිළිකුල් සංඥාව ඇත්තේ, සියලු ලොකයෙහි නො ඇලුනු සංඥාව ඇත්තේ. සියලු සංස්කාරන් අනිත්‍යය අනුව දකිමින් වාසය කරයි. ඔහුගේ අභ්‍යන්තරයෙහි මරණ සංඥාව එළඹ සිටියේ වේ. හෙතෙම සද්ධා, හිරි, ඔත්තප්ප, විරිය, පඤ්ඤා බල නම් පඤ්ච බලයන් ඇසුරු කොට වාසය කරයි. ඔහුට ශ්‍රද්ධා විරිය සති සමාධි ප්‍රඥා නම් මේ පඤ්චෙන්ද්‍රියයන් අධිකව පහළ වෙත්. හෙතෙම මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ අධිකත්වයෙන් ආශ්‍රව ක්ෂයට වහා දෙවෙනි ආත්මයට පැමිණේ. මහණෙනි, මේ දුක්වූ ප්‍රතිපදාව හා වහා ලැබෙන අභිඥාවේ.

"මහණෙනි, සැපවූ ප්‍රතිපදාව හා ලස්වූ (ප්‍රමාදවූ) අභිඥාව කවරේද?

4. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත විචාර සහිත විවෙකයෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි. විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති සිත හා එකට පහළවන විතර්ක නැති විචාර නැති සමාධියෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරයි. ප්‍රීතියගේ වෙන්වීමෙන් උපෙක්ෂා ඇතිව වාසය කරයි. සිහි ඇත්තේද සම්‍යක් ප්‍රඥා

ඇත්තේ සැපය කයින් විඳියි. ආර්යයෝ උපෙක්ෂා ඇත්තේ සිහි ඇත්තේ සැප විහාරියයි යමක් කියත්ද, ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරයි. සැපය ප්‍රහාණයෙන්ද දුක ප්‍රහාණයෙන්ද සොම්නස් දොම්නස් දෙදෙනා නොපෙනී යාමට පූර්වයෙහිම දුක් නැති, සැප නැති, උපෙක්ෂා ස්මෘති දෙදෙනාගේ පිරිසිදු බව ඇති සතරවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයි.

**5.** "හෙතෙම සද්ධා හිරි ඔත්තප්ප විරිය පඤ්ඤා යන මේ බල පස ඇසුරු කොට වසයි, ඔහුට සද්ධා විරිය සති සමාධි ප්‍රඥා ඉන්ද්‍රියන් යන මේ ඉන්ද්‍රියයන් පස මෘදුව පහළ වෙත්. හෙතෙම මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ මෘදුත්වයෙන් ආශ්‍රවයන්ගේ ක්ෂය පිණිස ප්‍රමාදව දෙවෙනි ආත්මයට පැමිණේ. මහණෙනි මේ සුව ප්‍රතිපදාව හා ප්‍රමාදවූ අභිඥාවයි.

**6.** "මහණෙනි, සැප ප්‍රතිපදාව වහා ලැබෙන අභිඥා කවරේද? (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

**7.** "හෙතෙම සද්ධා හිරි ඔත්තප්ප විරිය ප්‍රඥා බල සංඛ්‍යාත මේ පඤ්ච ශෛක්ෂ බලයන් ඇසුරුකොට වාසය කරයි. ඔහුට සද්ධා විරිය සති සමාධි ප්‍රඥා යන ඉන්ද්‍රියයන් පස වැඩිව පහළ වෙත්. හෙතෙම මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ අධික මාත්‍රත්වයෙන් ආශ්‍රවයන් ක්ෂය කිරීම පිණිස වහා අනතුරු ආත්මයට පැමිණේ. මහණෙනි මේ සැප ප්‍රතිපදාව හා වහා ලැබෙන අභිඥාය. මහණෙනි, මේ සතර ප්‍රතිපදාවෝයි.

**14. පච්චක්කොසන සූත්‍රයः-** 1. "මහණෙනි, මේ ප්‍රතිපදා සතරක් වෙත්. කවර සතරක්ද යත්? නො ඉවසන ප්‍රතිපදාවය, ඉවසන ප්‍රතිපදාවය, සන්සිඳුනු ප්‍රතිපදාවය, සම ප්‍රතිපදාවය යන සතරය.

**2.** මහණෙනි, නොඉවසන ප්‍රතිපදාව කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ආක්‍රොශ කරන්නාට ආපසු ආක්‍රොශ කරයිද, ක්‍රොධ කරන්නාට ආපසු ක්‍රොධ කෙරේද, කොලාහල කරන්නාට ආපසු කෝලාහල කරයිද, මෙ අක්ෂමා ප්‍රතිපදායයි, කියනු ලැබේ.

3. "මහණෙනි, ඉවසන ප්‍රතිපදාව කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ආක්‍රොශ කරන්නාට ආපසු ආක්‍රොශ නොකෙරේද, ක්‍රොධ කරන්නාට ආපසු ක්‍රොධ නොකරයිද, කොලාහල කරන්නාට ආපසු ක්‍රොධ නොකරාද, මහණෙනි, මේ ක්ෂමා ප්‍රතිපදායයි කියනු ලැබේ.

4. "මහණෙනි. සන්සිඳුනු ප්‍රතිපදාව කවරේද? මහණෙනි, මේ ලොකයෙහි මහණතෙම ඇසින් රූපයක් දැක නිමිති නොගන්නේද ලක්ෂණ නොගන්නේද යම් කාරණයකින් චක්ෂුරින්ද්‍රියය අසංවරව වාසය කරන්නාට ලොභය ද්වෙෂය යන ලාමක අකුශල ධර්මයෝ ලුහුබඳනාහුද එය සංවරවීම පිණිස පිළිපදියි. චක්ෂුරින්ද්‍රියය රකියි. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කණින් ශබ්දයක් අසා නිමිති නොගන්නේද ලක්ෂණ නොගන්නේද යම් කාරණයකින් සෝතේන්ද්‍රිය අසංවරව වාසය කරන්නාට ලොභය ද්වෙෂය යන ලාමක අකුශල ධර්මයෝ ලුහුබඳනාහුද, එය සංවර වීම පිණිස පිළිපදියි. සෝතේන්ද්‍රිය රකියි. සෝතේන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. නාසයෙන් ගඳ සුවඳත් ආඝ්‍රාණය කොට නිමිති නොගන්නේද ලක්ෂණ නොගන්නේද, යම් කාරණයකින් ඝානේන්ද්‍රියය අසංවරව වාසය කරන්නාට ලොභය ද්වෙෂය යන ලාමක අකුශල ධර්මයෝ ලුහුබඳනාහුද එය සංවර වීම පිණිස පිළිපදියි. ඝානේන්ද්‍රියය රකියි ඝානේන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. දිවෙන් රසයක් විඳ නිමිති නොගන්නේද ලක්ෂණ නොගන්නේද යම් කාරණයකින් ජිහ්වේන්ද්‍රියය අසංවරව වාසය කරන්නාට ලොභය ද්වෙෂය යන ලාමක අකුශල ධර්මයෝ ලුහුබඳනාහුද එය සංවරවීම පිණිස පිළිපදියි. ජිහ්වේන්ද්‍රියය රකියි. ජිහ්වේන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කයින් පහසක් දැනී, නිමිති නොගන්නේද ලක්ෂණ නොගන්නේද වේ. යම් කාරණයකින් කායේන්ද්‍රියය අසංවරව වාසය කරන්නාට ලොභය ද්වෙෂය යන ලාමක අකුශල ධර්මයෝ ලුහුබඳනාහුද එය සංවරවීම පිණිස පිළිපදියි. කායේන්ද්‍රියය රකියි. කායේන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. සිතින් ධර්මයක් දැන නිමිති නොගන්නේ වේ. අනුබ්‍යඤ්ජන නොගන්නේ වේ. යම් කාරණයකින් මනින්ද්‍රියයෙහි අසංවරව

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

වාසය කරන්නාට ලොභය ද්වෙෂය යන ලාමක අකුශල ධර්මයෝ ලුහුබඳනාහුද, එය සංවරය පිණිස පිළිපදියි. මනින්ද්‍රියය රකියි. මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. මහණෙනි, මේ සන්සිඳුනු ප්‍රතිපදාව යයි කියනු ලැබේ.

5. "මහණෙනි, සම ප්‍රතිපදාව කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම උපන් කාම අදහස නොඉවසයි, අත්හරියි, දුරු කරයි, සමනය කරයි, කෙළවර කරයි, අභාවයට යවයි. උපන් ව්‍යාපාද විතර්කය, නොඉවසයි, අත්හරියි, දුරු කරයි, සමනය කරයි, කෙළවර කරයි, අභාවයට යවයි. උපන් විහිංසා විතර්කය, නොඉවසයි, අත්හරියි, දුරු කරයි, සමනය කරයි, කෙළවර කරයි, අභාවයට යවයි. උපනූපන් ලාමක අකුශල ධර්මයන් නො ඉවසයි, දුරු කරයි, අත්හරියි, සමනය කරයි, අවසන් කරයි, අභාවයට යවයි. මහණෙනි, මේ සම ප්‍රතිපදාව යයි කියනු ලැබේ. මහණෙනි, මේ සතර ප්‍රතිපදාවෝයි."

15. **අක්ඛම සූත්‍රයː-** 1 (මේ ඡේදය මේ වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "මහණෙනි, නොඉවසීමේ ප්‍රතිපදාව කවරේද?

3. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් සීත, උෂ්ණ බඩසාය, පිපාසය, ඩැහැලේ බොන මැස්සෝය මදුරුවෝය, වාතය, අව්වය, දීර්ඝජාතීන්ගේ ස්පර්ශය

4. නො ඉවසන්නේවේද,

5. නපුරුකොට කියන ද නපුරු වශයෙන් ආ වචනයෙන් උපන් දුක්වූ, තියුණුවූ, කෘරවූ, කටුකවූ, අයහපත්වූ නොමනාපවූ ප්‍රාණය පැහැරගන්නාවූ උපන් ශාරීරික වේදනාවන්,

6. "නොඉවසන ස්වභාව ඇත්තේ වේ. මහණෙනි, මේ අක්ෂමා ප්‍රතිපදායයි කියනු ලැබේ.

7. "මහණෙනි, ඉවසන ප්‍රතිපදාව කවරේද? (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි) ඉවසන්නේ වේද, (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි) ඉවසන ස්වභාව වූයේ වේද, මහණෙනි, මේ ක්ෂමා (ඉවසන) ප්‍රතිපදායයි කියනු ලැබේ.

8. (මේ ඡේදය මේ පණ්ණාසකයේ 14 සූත්‍රයේ 4 වෙනි ඡේදය මෙනි.)

9. (මේ ඡේදය මේ පණ්ණාසකයේ 14 සූත්‍රයේ 4 වෙනි ඡේදය මෙනි.)

**16. උභය හීන සූත්‍රයː-** 1. "මහණෙනි, මේ ප්‍රතිපදා සතරක් වෙත්. කවර සතරක්ද යත්. දුක්වූ ප්‍රතිපදාවය, ප්‍රමාදවූ අභිඥාවය, දුක්වූ ප්‍රතිපදාය වහා ලැබෙන අභිඥාය, සැපවූ ප්‍රතිපදාවය ප්‍රමාදවූ අභිඥාය, සැපවූ ප්‍රතිපදාවය වහා ලැබෙන අභිඥාය යන සතරය.

2. "මහණෙනි, එහි යම් ප්‍රතිපදාවක් දුක්ද ප්‍රමාදව ලැබෙන අභිඥා ඇත්තේද, මහණෙනි, මේ ප්‍රතිපදාව දෙකින්ම ලාමකයයි කියනු ලැබේ. යම් මේ ප්‍රතිපදාවක් දුක්ද වෙයි, මෙය හීනයයි වැටහේ. යම් මේ ප්‍රතිපදාවක් දුක්ද වෙයි, මෙය හීනයයි වැටහේ. යම් මේ ප්‍රතිපදාවක් ප්‍රමාදද වෙයි, එය හීනයයි හැගේ. මහණෙනි, මේ ප්‍රතිපදාව දෙකින්ම හීන යයි කියනු ලැබේ. මහණෙනි, එහි යම් මේ ප්‍රතිපදාවක් වහා ලැබෙන අභිඥාද දුක්ද, මහණෙනි, මේ ප්‍රතිපදාව දුක් බැවින් හීනයයි කියනු ලැබේ. මහණෙනි, එහි යම් මේ ප්‍රතිපදාවක් සැපද ප්‍රමාදව ලැබෙන අභිඥාද මහණෙනි, මේ ප්‍රතිපදාව ප්‍රමාද බැවින් හීනයයි කියනු ලැබේ. මහණෙනි. එහි යම් මේ ප්‍රතිපදාවක් සැපද වහා ලැබෙන අභිඥාද, මහණෙනි, මේ ප්‍රතිපදාව දෙකින්ම ප්‍රණීතයයි හැගේ.

3. "යම් මේ ප්‍රතිපදාවක් සැපද වෙයි, මෙය ප්‍රණීතයයි කියනු ලැබේ. යම් මේ ප්‍රතිපදාවක් තියුණුද වෙයි, මෙය ප්‍රණීතයයි කියනු ලැබේ. මහණෙනි, මේ ප්‍රතිපදාව දෙකින්ම ප්‍රණීතයයි කියනු ලැබේ. මහණෙනි, මේ සතර ප්‍රතිපදාවෝයි."

**17. මොග්ගල්ලාන සූත්‍රයː-** 1. "ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණිසේක. පැමිණ ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ සමග සතුටුවිය සතුටුවිය යුතු සිහිකටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්සේක.

2. "එකත්පසෙක හුන් ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට 'ඇවැත් මොග්ගල්ලානය,

3. "මේ ප්‍රතිපදා සතරකි. කවර සතරක්ද යත්, දුක්වූ ප්‍රතිපදාය ප්‍රමාදවූ අභිඥාය, දුක්වූ ප්‍රතිපදාය වහා ලැබෙන අභිඥාය සැපවූ ප්‍රතිපදාය ප්‍රමාදවූ අභිඥාය, සැපවූ ප්‍රතිපදාය වහා ලැබෙන අභිඥාය, ඇවැත්නි, මේ සතර ප්‍රතිපදාවෝයි.

4. "ඇවැත්නි, මේ සතර ප්‍රතිපදාවන්ගෙන් තොප කවර ප්‍රතිපදාවකට පැමිණ තෘෂ්ණා මාන දෘෂ්ටි වශයෙන් නොගෙන සිත කෙලෙසුන්ගෙන් මිදුනේද?

5. "ඇවැත් ශාරිපුත්‍රය, (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

"ඇවැත්නි, මේ සතර ප්‍රතිපදාවන් ගෙන් යම් මේ ප්‍රතිපදාවක් දුක්ද වහා ලැබෙන අභිඥා ඇත්තේද, මා විසින් මේ ප්‍රතිපදාවට පැමිණ තෘෂ්ණාදී වශයෙන් නොගෙන ආශ්‍රවයන්ගෙන් සිත මුදන ලදී."

18. **සාරිපුත්ත සූත්‍රයඃ**- (මේ සූත්‍රයම සාරිපුත්ත ස්ථවිර යන තැනට මොග්ගල්ලාන ස්ථවිර කියාද මොග්ගල්ලාන ස්ථවිර යන තැනට සාරිපුත්ත ස්ථවිර කියාද යොදා නැවත ගතයුතුයි.)

19. **සසංඛාර සූත්‍රයඃ**- 1. "මහණෙනි, මේ පුද්ගලයෝ සතරදෙනෙක් ලොකයෙහි විද්‍යමාන වෙත්. කවර සතර දෙනෙක්ද යත්. මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් මෙලොවම සසංඛාර පරිනිබ්බායී වේ, මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ශරීරයාගේ බිඳීමෙන් සසංඛාර පරිනිබ්බායි වේ. මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් මෙලොවම අසංඛාර පරිනිබ්බායී වේ. මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ශරීරයාගේ බිඳීමෙන් අසංඛාරපරිනිබ්බායී වේ.

"මහණෙනි, කෙසේ පුද්ගලතෙම මෙලොවම සසංඛාර පරිනිබ්බායී වේද?

2. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ශරීරයෙහි අශුභය අනුව බලන සුළුව ආහාරයෙහි පිළිකුල් හැඟීම ඇතිව සියලු ලොකයෙහි නොඇලුනු හැඟීම ඇතිව සියලු සංස්කාරයන්හි අනිත්‍යය අනුව බලමින් වෙසෙයි. ඔහුගේ අභ්‍යන්තරයෙහි මරණ සිහිය එළඹ සිටියාවෙයි. හෙතෙම සද්ධා, හිරි, ඔත්තප්ප, විරිය, ප්‍රඥා බල සංඛ්‍යාත මේ පඤ්චවිධ ශෛක්ෂ බලයන් ඇසුරුකොට වාසය කරයි.

3. "ඔහුට ශ්‍රද්ධා, වීර්ය, ස්මෘති, සමාධි, ප්‍රඥා ඉන්ද්‍රිය නම් මේ පඤ්චවිධ ඉන්ද්‍රියයන් අධිකව පහළ වෙත්. හෙතෙම මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ අධිකත්වයෙන් මෙලොවම සසංඛාර පරිනිබ්බායී වේ. මහණෙනි. මෙසේ වනාහි පුද්ගලතෙම මෙලොවම සසංඛාර පරිනිබ්බායී වේ.

4. "මහණෙනි, කෙසේනම් පුද්ගලතෙම කරජකායයාගේ බිඳීමෙන් සසංඛාර පරිනිබ්බායී වේද, (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

5. "ඔහුට සද්ධා, වීරිය, සති, සමාධි, පඤ්ඤා ඉන්ද්‍රිය නම් මේ පඤ්චෙන්ද්‍රියයන් මෘදුව පහළ වෙත්. හෙතෙම මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ මෘදුත්වයෙන් ශරීරයාගේ බිඳීමෙන් සසංඛාර පරිනිබ්බායී වේ. මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම කායයාගේ බිඳීමෙන් සසංඛාර පරිනිබ්බායී වේ.

6. "මහණෙනි, කෙසේ නම් පුද්ගලතෙම මෙලොවම අසංඛාර පරිනිබ්බායී වේද, (මෙහි මේ පණ්ණාසකයේ 13 සූත්‍රයේ 4 ඡෙදය යෙදිය යුතුයි.) හෙතෙම සද්ධා හිරි ඔත්තප්ප විරිය, පඤ්ඤා බල සංඛ්‍යාත මේ ශෛක්ෂ බල පස ඇසුරු කොට වාසය කරයි.

7. 'ඕහට සද්ධා, විරිය, සති, සමාධි පඤ්ඤා නම් මේ ඉන්ද්‍රියයන් පස අධිකව පහළ වෙත්. හෙතෙම මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ අධික බැවින් මෙලොවම අසංඛාර පරිනිබ්බායී වේ. මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම මෙලොවම අසංඛාර පරිනිබ්බායී වේ.

8. "මහණෙනි, කෙසේ නම් පුද්ගලතෙම ශරීරයාගේ බිඳීමෙන් අසංඛාර පරිනිබ්බායී වේද? (මෙහි මේ පණ්ණාසකයේ 13 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

9. "හෙතෙම සද්ධා, හිරි, ඔත්තප්ප, වීරිය, පඤ්ඤා බල සංඛ්‍යාත මේ පඤ්චවිධ ශෛක්ෂ බලයන් ඇසුරුකොට වසයි. ඔහුට සද්ධා, විරිය, සති සමාධි පඤ්ඤා නම් මේ පඤ්චෙන්ද්‍රියයන් මෘදුව පහළ වෙත්. හෙතෙම මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ මෘදුත්වයෙන් කායයාගේ බිඳීමෙන් අසංඛාර පරිනිබ්බායී වේ. මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම කායයාගේ බිඳීමෙන් අසංඛාර පරිනිබ්බායී වේ. මහණෙනි, මේ පුද්ගලයන් සතර දෙන ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්'යයි වදාළසේක.

20. යුගනද්ධ සූත්‍රයː- 1. "එක් කාලයෙක්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ කොසඹෑනුවර ඝොෂිතාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ 'ඇවැත්නි මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. ඒ භික්ෂූහු 'ඇවැත්නියි' ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට ප්‍රතිවචන දුන්හ.

2. "ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ 'ඇවැත්නි, යම්කිසි භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ මා සමීපයෙහි අර්හත්වයට පැමිණීම ප්‍රකාශ කරයිද, ඒ සියල්ල සතර මාර්ගයන්ගෙන්ද මොවුන්ගෙන් හෝ එක්තරා එකකිනි. කවර සතරකින්ද යත්.

3. "ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම සමථය (කෙලෙස් වඩා තැවීම) පෙරටුකොට ඇති විදර්ශනාව වඩයි. සමථය පූර්වංගමකොට ඇති විදර්ශනාව වඩන ඔහුට මාර්ගය උපදියි.

4. "හෙතෙම ඒ මාර්ගය සෙවනය කරයි. වඩයි, බහුල වශයෙන් කරයි. ඒ මාර්ගය ආසෙවනය කරණ වඩන බහුල වශයෙන් කරණ ඔහුට සංයොජනයෝ ප්‍රහීන වෙත්. අනුශය කෙලෙස් කෙළවර වේ.

5. "ඇවැත්නි, නැවතද මහණතෙම විදර්ශනාව පෙරටු කොට ඇති සමථය වඩයි. විදර්ශනාව පූර්වංගම කොට ඇති සමථය ධ්‍යානය වඩන්නාට මාර්ගය පහළ වේ.

6. (මේ ඡේදය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි.)

7. "ඇවැත්නි, නැවතද මහණතෙම සමථය හා විදර්ශනාව සමසමව වඩයි. සමථය හා විදර්ශනාව සමසමව වඩන ඔහුට මාර්ගය හැඳිනේ. (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

8. "ඇවැත්නි, නැවතද මහණහට මානය වේද, යම් ඒ සිතක් අධ්‍යාත්මයෙහිම සිටීද, හිඳීද, එකට පහළවේද, සමාධි ගත වේද, ඔහුට මාර්ගය උපදී. (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි)

"අවැත්නි, යම්කිසි භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ මා සමීපයෙහි අර්හත්ව ප්‍රාප්තිය ප්‍රකාශ කරයිද ඒ සියල්ල මේ සතර මාර්ගයෙහි මොවුන්ගෙන් එකකිනැයි වදාළේය."

**(දාහත්වෙනි ප්‍රතිපදා වර්ගය නිමි.)**

## 18. සඤ්චෙතනීය වර්ගය

21. **සඤ්චෙතනා හෙතුක සූත්‍රය:-** 1. "මහණෙනි, කය හෝ ශරීරයේ සිතුවිලි හෙතුවූ කල්හි අධ්‍යාත්මයෙහි සැප දුක උපදී. මහණෙනි, වචනයාගේ හෝ වාග්සඤ්චේතනාවගේ හෙතුවෙන් අධ්‍යාත්මයෙහි සැප දුක් උපදී. මහණෙනි, සිත් හා මනො සංචෙතනා හෙතුවෙන් හෝ අවිද්‍යා හෙතුවෙන් හෝ අධ්‍යාත්මයෙහි සැප දුක් උපදී.

2. "යමක් ප්‍රත්‍යයවීමෙන් අධ්‍යාත්මයෙහි සැප දුක් උපදීද, ඒ කාය සංස්කාරය තමා හෝ සකස් කරයි. යමක් ප්‍රත්‍යයවීමෙන් අධ්‍යාත්මයෙහි සුව දුක් උපදීද, ඒ කාය සංස්කාරය අනුන් හෝ රැස්කරයි. යමක් ප්‍රත්‍යයවීමෙන් අධ්‍යාත්මයෙහි සුව දුක් පහළවේද, සම්‍යක් ප්‍රඥාවෙන් හෝ ඒ කාය සංස්කාරය රැස්කරයි.

යමක් ප්‍රත්‍යයවීමෙන් අධ්‍යාත්මයෙහි සැප දුක් පහළ වේද, නොසිහියෙන් හෝ ඒ කාය සංස්කාරය රැස්කරයි.

3. "යමක් ප්‍රත්‍යයවීමෙන් අධ්‍යාත්මයෙහි ඒ සුවදුක් පහළ වේද, තෙමේ හෝ ඒ වාග් සංස්කාරය රැස්කරයි. යමක් ප්‍රත්‍යයවීමෙන් අධ්‍යාත්මයෙහි ඒ සුවදුක් පහළ වේද, මහණෙනි, අනුන් හෝ ඒ වාග් සංස්කාරය රැස්කරයි. යමක් ප්‍රත්‍යයවීමෙන් අධ්‍යාත්මයෙහි සුව දුක් පහළ වේද, සම්‍යක් ප්‍රඥාවෙන් හෝ වාග් සංස්කාරය රැස්කරයි. යමක් ප්‍රත්‍යයවීමෙන් අධ්‍යාත්මයෙහි ඒ සුවදුක් පහළවේද, නොසිහියෙන් හෝ මහණෙනි, ඒ වාග් සංස්කාරය රැස්කරයි.

4. "යමක් ප්‍රත්‍යයවීමෙන් අධ්‍යාත්මයෙහි ඒ සුවදුක් පහළවේද, තෙමේ හෝ මහණෙනි, ඒ මනො සංස්කාරය රැස්කරයි. යමක් ප්‍රත්‍යයවීමෙන් ඒ මනො සංස්කාරය පහළ වේද, අනුන් හෝ මහණෙනි, ඒ මනො සංස්කාරය රැස්කරයි යමක් ප්‍රත්‍යයවීමෙන් ඒ මනො සංස්කාරය පහළ වේද, සම්‍යක් ප්‍රඥාවෙන් හෝ ඒ මනො සංස්කාරය රැස් කරයි. යමක් ප්‍රත්‍යයවීමෙන් ඒ මනො සංස්කාරය පහළවේද, නොසිහියෙන් හෝ මහණෙනි, ඒ මනො සංස්කාරය රැස් කරයි.

5. "යමක් ප්‍රත්‍යයවීමෙන් අධ්‍යාත්මයෙහි ඒ සුවදුක් පහළ වේද, මේ ධර්මයන්හි අවිද්‍යාව පතිතවූවාය. අවිද්‍යාවගේම ඉතුරු නොකොට නිරුද්ධවීමෙන් යමක් හෙතුකොටගෙන අධ්‍යාත්මයෙහි සුවදුක් උපදීද, ඒ ශරීරය නොවේ. යමක් ප්‍රත්‍යයවීමෙන් අධ්‍යාත්මයෙහි සුවදුක් උපදීද, ඒ වචනයෝ නොවෙත්. යමක් ප්‍රත්‍යයවීමෙන් අධ්‍යාත්මයෙහි සුවදුක් උපදීද ඒ සිත නොවේ. යමක් හෙතුකොට ගෙන අධ්‍යාත්මයෙහි සුවදුක් උපදීද ඒ ක්ෂෙත්‍රය නොවේ. ඒ වස්තුව නොවේ. ඒ ආයතනය නොවේ. ඒ ආධාරය නොවේ."

**22. අත්තභාව පටිලාභ සූත්‍රය.** 1. "මහණෙනි, මේ ආත්මභාවයන්ගේ ලැබීම් සතරෙකි. කවර සතරක්ද යත්, මහණෙනි, යම් ආත්ම භාවයෙක්හි තමා ගැන සිතීම කෙරෙයිද අනුන් ගැන සිතීම නොකරයිද, එබඳු ආත්ම භාවයක ලැබීමක්

ඇත. මහණෙනි, යම් ආත්මභාවයක අනුන්ගැන සිතයිද, තමා ගැන නොසිතයිද, එබඳු ආත්මභාව ප්‍රතිලාභයක් ඇත, මහණෙනි, යම් ආත්මභාවයෙක්හි තමා ගැන සිතීමද අනුන් ගැන සිතීමද කරයි. එබඳු ආත්මභාව ප්‍රතිලාභයක් ඇත. මහණෙනි, යම් ආත්මභාවයෙක්හි තමා ගැනද නොසිතයි. අනුන් ගැනද නොසිතයි. එබඳු ආත්මභාවයක් ඇත. මහණෙනි, මේ සතර ආත්මභාවයෝයි.

2. මෙසේ වදාළකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂේපයෙන් වදාරණලද මොහුගේ වනාහි විස්තර වශයෙන් අර්ථය දනිමියි කීයේය.

3. "ස්වාමීනි, එහි යම් මේ ආත්මභාව ප්‍රතිලාභයෙක්හි තමා ගැන සිතයිද, අනුන් ගැන නොසිතයිද, තමා ගැන සිතීම් හේතුවෙන් ඒ සත්වයන් ඒ ශරීරයෙන් චුතවෙයි. ස්වාමීනි එහි යම් මේ ආත්මභාව ප්‍රතිලාභයක්වේද, යම් ආත්මභාව ප්‍රතිලාභයෙක්හි අනුන් ගැන සිතයිද, තමා ගැන නොසිතයිද අනුන් ගැන සිතීම් හෙතුවෙන් ඒ සත්වයන් ඒ ශරීරයෙන් චුතවේ.

4. "ස්වාමීනි, එහි යම් මේ ආත්මභාව ප්‍රතිලාභයෙක්හි තමා ගැනද සිතයිද, අනුන් ගැනද සිතයිද, තමා ගැනද අනුන් ගැනද සිතීම් හේතුවෙන් ඒ සත්වයන් ඒ ශරීරයෙන් චුතවේ. ස්වාමීනි එහි යම් මේ ආත්මභාව ප්‍රතිලාභයක් වේද, යම් ආත්මභාව ප්‍රතිලාභයෙක්හි තමා ගැනද නොසිතයිද, අනුන් ගැනද නොසිතයිද, එයින් කවර දෙවිකෙනෙක් දතයුත්තාහුද?" "ශාරිපුත්‍රය ඉන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණි දෙවියෝ, දතයුත්තාහ."

5. "ස්වාමීනි, යම් කරුණකින් මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ ඒ ශරීරයෙන් චුතව මේ ආත්මභාවයට එන සුළු ආගාමී පුද්ගලයෝ වෙත්ද, ඊට හේතු කවරේද ඊට ප්‍රත්‍යය කවරේද?

"ස්වාමීනි. යම් කරුණකින් මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ ඒ ශරීරයෙන් චුතවූවාහු මේ ආත්මභාවයට නො

එන සුළු (අනාගාමී) පුද්ගලයෝ වෙත්ද ඊට හේතු කවරේද, ප්‍රත්‍යය කවරේද

6. "ශාරිපුත්‍රය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙකුට කාමධාතුව භජනය කරන (බැමි) සංයොජන ප්‍රහීන නොවූවාහු වෙත්ද, හෙතෙම මේ ආත්මභාවයෙහිම නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. හෙතෙම එය ආස්වාදය කරයි. එය කැමති වෙයි, ඉන් තෘප්තියට පැමිණෙයි. එහි සිටියේ ඊට බැසගත්තේ, එය බහුල වශයෙන් කරන්නේ නොපිරිහුනේ කළුරිය කරන්නේ නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට අයත් දෙවියන් හා සහභාගීබවට උපදියි. හෙතෙම ඉන් චුතවූයේ මේ ආත්මයට එන සුළු (ආගාමී) පුද්ගලයෙක්වේ.

7. ශාරිපුත්‍රය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙකුට කාමලොකයට අයත් සංයෝජන ප්‍රහීනවූවාහු වෙත්ද, හෙතෙම මෙලොවම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. හෙතෙම එය ආශ්වාද කරයි. එය කැමතිවෙයි. ඉන් තෘප්තියට පැමිණෙයි. එහි සිටියේ ඊට බැසගත්තේ එහි බහුල වශයෙන් වසන්නේ නොපිරිහුනේ කළුරිය කරන්නේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට අයත් දෙවියන් හා විසීමට පැමිණෙයි. හෙතෙම ඉන් චුතවූයේ මේ ආත්මයට නොඑනසුළු (අනාගාමි) පුද්ගලයෙක් වේ. ශාරිපුත්‍රය, යම් කාරණයකින් මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ ඒ සත්ව සමූහයෙන් චුතවූවාහු මේ ආත්මයට එන සුළු ආගාමී පුද්ගලයෝවේද, මේ ඊට හේතුවයි. මේ ඊට ප්‍රත්‍යයි. යම් කරුණකින් මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ ඒ සත්ව කොටසින් චුතවූවාහු මේ ආත්මයට නො එනසුළු අනාගාමීහු වෙත්ද, ශාරිපුත්‍රය මේ ඊට හෙතුය මේ ඊට ප්‍රත්‍යයයි"

**23. පටිසම්භිසච්ඡිකරණ සූත්‍රය**:- 1. එකල්හි වනාහි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ 'ඇවැත්නි, මහණෙනි'යි භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. ඒ භික්ෂූහු 'ඇවැත්නියි' ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට පිළිවදන් දුන්හ,

ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ "ඇවැත්නි උපසම්පදාවූ අඩමසක් ඇති මා විසින් අර්ථප්‍රතිසම්භිදාව."

**2.** "කොටස් වශයෙන්, ව්‍යඤ්ජන වශයෙන් ප්‍රත්‍යක්ෂ කරණ ලද්දෙමි. එය මම නොයෙක් අයුරින් ප්‍රකාශ කරමි. දෙශනා කරමි. පණවමි. තබමි. විවරණය කරමි. බෙදමි. පහසු කරමි. යමෙකුට වනාහි සැකයක් හෝ විමතියක් හෝ වන්නේද, ඒ මා ප්‍රශ්න කිරීමෙන්ද මම ප්‍රකාශ කිරීමෙන්ද හමුවෙමු. යමෙක් අපගේ ධර්මයන්හි දක්ෂද ඒ අපගේ ශාස්තෘවරයන් වහන්සේය.

**3.** "ඇවැත්නි, උපසම්පදාවූ අඩමසක් ඇති මා විසින් ධර්ම ප්‍රතිසම්පදාව (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

**4.** "ඇවැත්නි, උපසම්පදාවූ අඩමසක් ඇති මා විසින් නිරුත්ති ප්‍රතිසම්භිදාව (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි)

"ඇවැත්නි, උපසම්පදාවූ අඩමස් ඇති මා විසින් ප්‍රතිභාන ප්‍රතිසම්භිදාව (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි)

**24. ඡඵස්සායතන සූත්‍රයඃ-** 1. ඉක්බිති ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද, එහි පැමිණියහ. පැමිණ, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සමග සතුටුවූහ. සතුටුවිය යුතු සිහිකටයුතු කථාවකොට නිමවා එකත්පසක සිටියහ එකත්පසෙක සිටියාවූ ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට.

**2.** "ඇවැත්නි, සය වැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ඉතුරු නොකොට නොඇලීමෙන් නැතිකිරීමෙන් අන්කිසිවක් ඇත්තේද?"

"ඇවැත්නි, එසේ නොසිතනු මැනවි"

"ඇවැත්නි, සය වැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ඉතුරු නොකොට නොඇලීමෙන් නැතිකිරීමෙන් අන්කිසිවක් නැත්තේද?"

"ඇවැත්නි, එසේ නොසිතනු මැනවි."

"ඇවැත්නි, සයවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ඉතුරු නොකොට නොඇලීමෙන් නැතිකිරීමෙන් අන්කිසිවක් ඇත්තේද නැත්තේද" "ඇවැත්නි, එසේ නොසිතනු මැනව."

"ඇවැත්නි, සය වැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ඉතිරි නොකොට නොඇලීමෙන් නැතිකිරීමෙන් අන්කිසිවක් නැත්තේද, නැත්තේ නොවේද?"

"ඇවැත්නි, එසේ නො සිතනු මැනවි."

3. "ඇවැත්නි, සයවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ඉතුරු නොකොට නොඇලීමෙන්, නැතිකිරීමෙන් අන්කිසිවක් ඇත්තේදැයි මෙසේ විචාරණ ලද්දේම, 'ඇවැත්නි, එසේ නොසිතනු මැනවයි කීයෙහිය. ඇවැත්නි, සයවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ඉතුරුකොට නොඇලීමෙන්, නැතිකිරීමෙන් අන්කිසිවක් නැත්තේද, මෙසේ විචාරණ ලද්දේම, "ඇවැත්නි, එසේ නොසිතනු මැනවයි' කීයෙහිය.

"ඇවැත්නි, සය වැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ඉතුරු නොකොට නොඇලීමෙන් නැතිකිරීමෙන් අන්කිසිවක් ඇත්තේද, නැත්තේදැයි මෙසේ විචාරණලද්දේ, 'ඇවැත්නි, එසේ නොසිතනු මැනවයි' කීයෙහිය. ඇවැත්නි, සයවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ඉතුරුකොට නොඇලීමෙන් නැතිකිරීමෙන් අන්කිසිවක් නැත්තේද, නැත්තේ නොවේදැයි, මෙසේ විචාරණ ලද්දේ, 'ඇවැත්නි, එසේ නොසිතනු මැනවයි' කීයෙහිය.

4. "ඇවැත්නි, මේ භාෂිතයාගේ අර්ථය කෙසේ වනාහි දතයුත්තේද?" "ඇවැත්නි, සයවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ඉතුරු නොකොට නොඇලීමෙන් නැතිකිරීමෙන් අන්කිසිවක් ඇතැයි කියන්නේ ප්‍රමාද නුවූවක් ප්‍රමාද කරයි.

5. "ඇවැත්නි, සයවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ඉතුරු නොකොට නොඇලීමෙන්, නැතිකිරීමෙන් අන්කිසිවක් නැතැයි මෙසේ කියන්නේ ප්‍රමාද නොවියයුත්තක ප්‍රමාදවේ. ඇවැත්නි, සයවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ඉතුරු නොකොට නොඇලීමෙන් නැතිකිරීමෙන් අන්කිසිවක් ඇත්තේද

නැත්තේදැයි කියන්නේ ප්‍රමාද නොවිය යුත්තක ප්‍රමාද වෙයි.

"ඇවැත්නි, සයවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ඉතුරු නොකොට නොඇලීමෙන් නැතිකිරීමෙන් අන්කිසිවක් නොද ඇත්තේය. නොද නැත්තේයයි මෙසේ කියන්නේ ප්‍රමාද නොවියයුත්ත ප්‍රමාද කරවයි.

**6.** "ඇවැත්නි, සයවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ගතිය (ඇතිවීම) යම්තාක්ද ප්‍රමාදයාගේ (කෙලෙසුන්ගේ) ගතියත් (ඇතිවීමත්) එපමණකි. ප්‍රමාදයාගේ (කෙලෙසුන්ගේ) ගතිය යම්තාක්ද සයවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ගතිය ඒතාක්ය. ඇවැත්නි, සයවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ඉතුරු නොකොට නොඇලීමෙන් නැතිවීමෙන් ප්‍රමාදයන්ගේ (ක්ලේශයන්ගේ) නැතිවීම වේ. ප්‍රමාදය වැලැක්මෙන් ප්‍රමාදයන්ගේ ව්‍යපශමනය වේ. (ක්ලේශයන්ගේ) නැතිවීමෙන් ක්ලේශයන්ගේ සංසිඳීමවේ."

**7.** ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් මහා කොට්ඨිත තෙරුන් යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් සමග සතුටුවිය. සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එකත්පසෙක සිටියේය.

**8.** එකත්පසෙක සිටි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් මහා කොට්ඨිත තෙරුන්ට (මෙහි මේ සූත්‍රයේ 2 දෙය යෙදිය යුතුයි.)

**9. 10, 11, 12.** (මේ ඡේදය මේ සූත්‍රයේ 3, 4, 5, 6, ඡේද මෙන් වෙත්.)

**25. උපවාන (හෝ) විජ්ජායන්තකර සූත්‍රයඃ-** 1. ඉක්බිති ආයුෂ්මත් උපවාන ස්ථවිරතෙමෙ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථාවකොට නිමවා එකත්පසෙක සිටියේය.

2. එකත්පසෙක සිටි ආයුෂ්මත් උපවාන ස්ථවිරතෙමේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්ට "ඇවැත්නි, ශාරිපුත්‍රය, කිමෙක්ද, විද්‍යාවගේ කෙළවරට ගියේද?"

"ඇවැත්නි, මෙය නොවේ."

"ඇවැත් ශාරිපුත්‍රය, කිමෙක්ද මරණයෙන් කෙළවරට ගියේද?"

"ඇවැත්නි, මෙය නොවේ."

"ඇවැත් ශාරිපුත්‍රය, කිමෙක්ද, විද්‍යාචරණ දෙකින් කෙළවරට ගියේද?"

"ඇවැත්නි, මෙය නැත.

"ඇවැත් ශාරිපුත්‍රය, කිමෙක්ද, විද්‍යාචරණයන් හැර කෙළවරට ගියේද?"

"ඇවැත්නි, මෙය නැත."

3. "ඇවැත්නි, ශාරිපුත්‍රය, කිමෙක්ද, විද්‍යාවෙන් කෙළවරට ගියේදැයි මෙසේ විචාරණ ලද්දේම, 'ඇවැත්නි, මෙය නොවේයයි' කීවෙහිය. ඇවැත්නි ශාරිපුත්‍රය, කිමෙක්ද, චරණයෙන් කෙළවරට ගියේදැයි' මෙසේ විචාරණ ලද්දේම, 'ඇවැත්නි, මෙය නොවේයයි' කීවෙහිය.

'ඇවැත් ශාරිපුත්‍රය, කිමෙක්ද, විද්‍යාවෙන් හා චරණයෙන් කෙළවරට ගියේ දැයි මෙසේ විචාරණ ලද්දේ 'ඇවැත්නි, මෙය නොවේයයි' කීයෙහිය. ඇවැත් ශාරිපුත්‍රය කිමෙක්ද 'විද්‍යාචරණයන් හැර කෙළවරට ගියේදැයි' මෙසේ විචාරණ ලද්දේ 'ඇවැත්නි, මෙය නොවේයයි' කීයෙහිය. ඇවැත්නි, යම් ඒ කෙසේ කෙළවරට ගියේදැයි' ඇසීය.

4. "ඇවැත්නි, ඉදින් විද්‍යාවෙන් කෙළවරට ගියේ නම් උපාදාන සහිතවම කෙළවරට ගියේ වේ. ඉදින් ඇවැත්නි, චරණයෙන් කෙළවරට ගියේ නම් උපාදාන සහිතවම කෙළවරට ගියේ වන්නේය. ඉදින් ඇවැත්නි, විද්‍යාචරණයන් හැර කෙළවරට ගියේ නම් පෘථග්ජනයා නම් වේ. ඇවැත්නි, පෘථග්ජනයා වනාහි

විද්‍යාචරණයන් හැර කෙළවරට පැමිණියේය. ඇවැත්නි, චරණයෙන් දුරුවූයේ තත්වූ පරිද්දෙන් නොදනී, නොදකී. චරණයෙන් යුක්තවූයේ තත්වූ පරිද්දෙන් දනී, දකී, තත්වූ පරිද්දෙන් දන්නේ දක්නේ කෙළවරට ගියේනම් වේ."

**26. ආයාචමාන සූත්‍රයඃ-** 1. "මහණෙනි, ශ්‍රද්ධාවත් මහණතෙම 'සැරියුත් මුගලන් දෙනම යම්සේ නම් එබඳු වෙමියි' මෙසේ මනාකොට ආයාචනා කරණු ලබන්නේ ආයාචනා කරන්නේය. මහණෙනි, යම් මේ සැරියුත් මුගලන් දෙනමක් ඇද්ද, මාගේ ශ්‍රාවකවූ භික්ෂූන්ට මේ තුලනාවකි. මේ ප්‍රමාණයකි.

2. "මහණෙනි, 'ඛෙමා භික්ෂුණියද උප්පලවණ්ණාවද යම් බඳුද එබඳු වෙමියි' ශ්‍රද්ධාවත් භික්ෂුණිය මෙසේ මනාකොට ආයාචනා කරණු ලබන්නේ ආයාචනා කරන්නේය. මහණෙනි, යම් මේ ඛෙමාභික්ෂුණියද උත්පලවණ්ණා භික්ෂුණියද යම්සේ නම් මාගේ ශ්‍රාවිකා භික්ෂුණීන්ට මෙය තුලනාවකි මෙය ප්‍රමාණයකි.

3. "මහණෙනි, 'චිත්ත ගෘහපතියා හා හත්ථක ආලවක යම්සේද එබඳු වෙමියි' ශ්‍රද්ධාවත් උපාසකතෙම මෙසේ මනාකොට ආයාචනා කරණු ලබන්නේ ආයාචනා කරන්නේය. මහණෙනි, යම් මේ චිත්ත ගෘහපතියාද හත්ථක ආලවකද යම් සේ නම් මාගේ ශ්‍රාවක උපාසකයන්ට මෙය තුලනාවකි. මෙය ප්‍රමාණයකි.

මහණෙනි, 'ඛුජ්ජුත්තරා උපාසිකාවද වෙළුකණ්ඨකී නන්ද මාතාවද යම් සේද එබඳු වෙමියි' ශ්‍රද්ධාවත් උපාසිකා තොමෝ මෙසේ මනාකොට ආයාචනා කරණු ලබන්නී ආයාචනා කරන්නීය. මහණෙනි, යම් මේ ඛුජ්ජුත්තරා උපාසිකාවද, යම් සේ නම් තමාගේ ශ්‍රාවක උපාසිකාවන්ට මෙය තුලනාවකි. මෙය ප්‍රමාණයකි."

**27. රාහුලොවාද සූත්‍රයඃ-** 1. "ඉක්බිති ආයුෂ්මත් රාහුල ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණිසේක. පැමිණ භාග්‍යවතුන්වහන්සේ වැඳ

එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ආයුෂ්මත් රාහුල ස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන්වහන්සේ "රාහුලය, යම් අධ්‍යාත්මික පෘථුවි ධාතුවක් ඇද්ද? යම් බාහිර පෘථුවි ධාතුවක් ඇද්ද? මෝතොමෝ පෘථුවිධාතුවමය.

**2.** "එය මගේ නොවේ. මේ තෙමේ මම නොවෙමි. මේ තෙමේ මාගේ ආත්මය නොවේ. මෙය මෙසේ තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දැක්ක යුතුයි.

**3.** "මෙය මෙසේ සම්‍යක් ප්‍රඥාවෙන් තත්වූ පරිද්දෙන් දැක පෘථුවි ධාතුවෙහි කලකිරෙයි. පෘථුවි ධාතුවෙහි සිත නොඇලවයි.

**4.** "රාහුලය, යම් අධ්‍යාත්මික ආපොධාතුවක් ඇද්ද යම් බාහිර අපොධාතුවක් ඇද්ද මෝ තොමෝ ආපොධාතුවමය. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මෙසේ එය සම්‍යක් ප්‍රඥාවෙන් තත්වූ පරිද්දෙන් දැක ආපොධාතුවෙහි කලකිරෙයි. අපොධාතුවෙහි සිත නොඇලවයි.

**5.** "රාහුලය, යම් අධ්‍යාත්මික තෙජෝධාතුවක් ඇද්ද යම් බාහිර තෙජොධාතුවක් ඇද්ද? මෝතොමෝ තෙජො ධාතුවමය. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මෙසේ එය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දැක තෙජෝ ධාතුවෙහි කලකිරෙයි. තෙජෝ ධාතුවෙහි සිත නොඇලවයි.

**6.** "රාහුලය, යම් අධ්‍යාත්මික වායො ධාතුවක් ඇද්ද යම් බාහිර වායො ධාතුවක් ඇද්ද? මෝතොමෝ වායොධාතුවමය. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි) මෙසේ එය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දැක තෙජො ධාතුවෙහි කලකිරෙයි. තෙජො ධාතුවෙහි සිත නොඇලවයි.

**7.** "රාහුලය, යම්තැනෙක සිටි මහණතෙම මේ සතර ධාතුන්හි තමා නොවේයයි තමා කෙරෙහි නොවේයයි මනාව දකීද, රාහුලය, මේ මහණතෙමේ තෘෂ්ණාව සින්දේය, සංයොජනය පෙරලා දැම්මේය. මනාකොට මානයාගේ ප්‍රහානයෙන් දුක් කෙළවර කෙළේයයි කියනු ලැබේ."

**28. ජම්බාලියොපම සූත්‍රය:-** 1. "මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි ඇත්තාහ. විද්‍යමානවෙත්. කවර සතරදෙනෙක්ද යත්?

**2.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම එක්තරා ශාන්ත චිත්ත විමුක්තියකට පැමිණ වාසය කෙරේද, හෙතෙම ශරීරයේ නොපැවැත්ම මෙනෙහි කරයි. සක්කාය නිරොධය මෙනෙහි කරණ ඔහුට සක්කාය නිරොධයෙහි සිත ලුහුනොබඳියිද, නොපහදියිද, නොසිටියිද, බැසනොගනියිද මහණෙනි, ඒ භික්ෂුව විසින් සක්කාය නිරොධය කැමති නොවිය යුත්තේය.

**3.** "මහණෙනි, පුරුෂයෙක් යම්සේ ලාටුසහිතවූ අතින් අත්තක් ගන්නේද ඔහුගේ ඒ අත ඇලෙන්නේද ගන්නේද කැඩෙන්නේද වේ. එසේම (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

**4.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම එක්තරා ශාන්ත චිත්ත විමුක්තියකට පැමිණ වාසය කරයිද හෙතෙම සක්කාය නිරොධය මෙනෙහි කරයිද සක්කාය නිරොධය මෙනෙහිකරණ ඔහුට සක්කාය නිරොධයෙහි සිත ලුහුබඳියිද පහදියිද සිටීද බැසගනීද, මහණෙනි, ඒ භික්ෂුව විසින් සක්කාය නිරෝධය කැමති විය යුතුය.

**5.** "මහණෙනි, යම්සේ පුරුෂයෙක් පිරිසිදු අතින් අත්තක් ගන්නේද ඔහුගේ ඒ අත නොඇලෙන්නේද නොගන්නේද නොකැඩෙන්නේද වේ. මහණෙනි, එසේම (මෙහි මේ සූත්‍රයේ 4 ඡෙදය යෙදිය යුතුයි.)

**6.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම එක්තරා ශාන්ත චිත්ත විමුක්තියකට පැමිණ වාසය කරයිද, හෙතෙම අවිද්‍යා කොටස් මෙනෙහි කරත්ද අවිද්‍යා කොටස් මෙනෙහි කරණ ඔහුට අවිද්‍යා ප්‍රභෙදයෙහි සිත ලුහුනොබඳියිද, නොපහදියිද නොසිටීද බැසනොගනීද මහණෙනි, ඒ භික්ෂුව විසින් අවිද්‍යා ප්‍රභෙදය කැමති විය යුතුයි.

**7.** "මහණෙනි, නොයෙක් වර්ෂ ගණන් පැරණි ගවර වළක් යම්සේද පුරුෂයෙක් තෙම ඒ ගවරවලෙහි යම් ප්‍රවෙශ මාර්ගයක්

වේද එය වසන්නේය. යම් පිටව යන සිදුරු වේද එය විවෘත කරන්නේද වර්ෂාවද මනාකොට ධාරා ප්‍රවෙශ කරවන්නේය මහණෙනි, එසේ ඒ ගවරවලෙහි ඉවුරුකැඩීම කැමති නොවිය යුත්තාහ. එසේම (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.)

8. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම එක්තරා ශාන්ත චිත්ත විමුක්තියකට පැමිණ වාසය කරයිද, හෙතෙම අවිද්‍යා ප්‍රභෙදය මෙනෙහි කරයිද, අවිද්‍යා ප්‍රභෙදය මෙනෙහි කරණ ඔහුට අවිද්‍යා ප්‍රභෙදයෙහි සිත ලුහුබඳියිද පහදියිද සිටීද බැසගනීද මහණෙනි, ඒ භික්ෂුව විසින් අවිද්‍යා කොටස් කැමතිවිය යුතුයි.

9. "මහණෙනි, නොයෙක් වර්ෂගණන් ගිය ගවරවලක් යම්සේද පුරුෂයෙක් තෙම ඒ ගවරවලෙහි යම් වැඩෙන මාර්ගයක් වේද එය විවෘත කරන්නේය. යම් පිරිහෙන මාර්ගයක් වේද එය වසන්නේය. වර්ෂාවද මනාකොට ධාරා හෙලන්නේය. මහණෙනි, එසේ ඒ ගවරවලෙහි ඉවුරු කැඩීම කැමතිවිය යුත්තාහ. මහණෙනි, එසේම (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙන ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්."

**29. දිට්ඨධම්ම පරිනිබ්බාණ සූත්‍රයඃ-** 1. "ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණිසේක. පැමිණ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එකත්පසෙක සිටිසේක. එකත්පසෙක සිටි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට ඇවැත්නි, ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්ස, යම් කරුණකින් මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ මේ ආත්මයෙහිම පිරිනිවන් නොපාත්ද, ඊට හෙතු කවරේද ඊට ප්‍රත්‍යය කවරේදැයි" ඇසූයේය.

2. "ඇවැත්නි, ආනන්දය මේ ලොකයෙහි සත්වයෝ මේ සංඥාවෝ පිරිහීම භජනය කරත්යයි තත්වූ පරිද්දෙන් නොදනිද්ද, මේ ධර්මයෝ පැවැත්ම භජනය කරත්යයි තත්වූ පරිද්දෙන් නොදනිද්ද, මොව්හු විශෙෂයට පැමිණේයයි තත්වූ පරිද්දෙන්

නොදනිද්ද, මොව්හු නිවණ භජනය කෙරෙත්යයි තත්වූ පරිද්දෙන් නොදනිත්ද, ඇවැත්නි, ආනන්දය යම් කරුණකින් මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ මේ ආත්මයෙහිම පිරිනිවන් නොපාත්ද, මේ ඊට හෙතුය, මේ ඊට ප්‍රත්‍යය.

3. "ඇවැත්නි, ශාරිපුත්‍රය යම් කරුණකින් මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ මේ ආත්මයෙහිම පිරිනිවන් පාත්ද, ඊට හේතු කවරේද ඊට ප්‍රත්‍යය කවරේද?

4. "ඇවැත්නි, ආනන්දය මේ ලොකයෙහි සත්වයෝ මේ සංඥාවෝ පිරිහීමට යන්නේයයි තත්වූ පරිද්දෙන් දනීද, මොව්හු පැවැත්ම භජනය කරත්යයි තත්වූ පරිද්දෙන් දනිද්ද මොව්හු විශෙෂයට පමුණුවන්නේයයි තත්වූ පරිද්දෙන් දනිද්ද මොව්හු නිවණ භජනය කෙරෙත්යයි තත්වූ පරිද්දෙන් දනිද්ද, ඇවැත්නි ආනන්දය යම් කරුණකින් මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ මෙලොවම පිරිනිවෙත්ද මේ ඊට හෙතුය මේ ඊට ප්‍රත්‍යය."

30. **මහාපදෙස සූත්‍රයː-** 1. "එක්කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ භොග නගරයෙහි ආනන්ද චෛත්‍යයෙහි වාසය කරණසේක. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' භික්ෂූන් ආමන්ත්‍රණය කළසේක. 'පින්වතුන් වහන්සැයි' ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මේ සතර මහාපදෙශයන් දෙශනා කරන්නෙමි. එය අසව්, මනාකොට මෙනෙහි කරව් කියන්නෙමියි වදාළසේක. ඒ භික්ෂූහු 'එසේය ස්වාමීනියි' කියා භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

3. "මහණෙනි, සතර මහාපදෙශයෝ කවරහුද?

4. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ කෙනෙක්, ඇවැත්නි, මෙය භාග්‍යවතුන් වහන්සේ ඉදිරිපිටදී අසන ලදී. ඉදිරිපිටදී පිළිගන්නා ලදී. මේ ධර්මය මේ විනය මේ ශාස්තෲ ශාසනයයි මෙසේ කියන්නේය.

5. "මහණෙනි, ඒ භික්ෂුවගේ කීමට නොසතුටු නොවිය යුතුයි. ආක්‍රොශ නොකටයුතුය. නොසතුටු නොවී ආක්‍රොශ නොකොට ඒ පදයන් ව්‍යඤ්ජනයන් මනාකොට උගෙණ සූත්‍රයන් හා සමකළ යුත්තාහ. විනය හා සැසඳිය යුත්තාහ.

6. "ඉදින් ඔවුන් සූත්‍රයන් හා සමාන කරන්නේ, විනය හා සසඳන්නේ සූත්‍රයට සමාන නොවෙත්ද, විනය හා නොසැසඳෙත්ද ඒකාන්තයෙන් මෙය භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ වචන නොවන්නේමය. මේ භික්ෂුව නපුරුකොට වරදවා ගත් එකකැයි නිෂ්ටාවට යා යුතුය. මහණෙනි, මෙය මෙසේ අත්හරිව්.

7. (මේ ඡේදය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි.)

8. "ඉදින් ඔවුන් සූත්‍රයන් හා සමකරන්නේ විනය හා සසඳන්නේ සූත්‍ර හා සමද විනය හා සැසඳෙත්ද ඒකාන්තයෙන් මෙය ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ වචනය මේ භික්ෂුවද යහපත්සේ උගත්තේයයි නිෂ්ටාවට යා යුත්තාහ.

9. "මහණෙනි, මේ පළමුවෙනි මහාපදෙශය දරව්.

10. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ කෙනෙක් අසවල් ආවාසයෙහි තෙරුන් සහිත ප්‍රමුඛයන් සහිත සංඝයා වසයි. මා විසින් ඒ සංඝයාගේ සම්මුඛයෙන් අසනලදී. සම්මුඛයෙන් පිළිගන්නා ලදී. මේ ධර්මයය මේ විනයය මේ ශාස්තෘ ශාසනයයි' කියන්නේය.

11-12. (මේ ඡේද මේ සූත්‍රයේ 5, 6 ඡේද මෙන් වෙත්.)

13-14. (මේ ඡේද මේ සූත්‍රයේ 4, 5 ඡේද මෙන් වෙත්.)

15. "ඉදින් ඔවුන් සූත්‍රයන් හා සමකරන්නේ විනය හා සසඳන්නේ සූත්‍ර හා සමද විනය හා සැසඳෙත්ද ඒකාන්තයෙන් මෙය ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ වචනය මේ භික්ෂුවද යහපත්සේ උගත්තේයයි නිෂ්ටාවට යා යුත්තාහ.

16. "මහණෙනි, මේ දෙවෙනි මහාපදෙශය දරව්.

17. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ කෙනෙක් අසවල් ආවාසයෙහි බහුශ්‍රැතවූ ආගම දත් ධර්මධර විනයධර මාතිකාධර බොහෝ ස්ථවිර භික්ෂූහු වාසය කරත්. මා විසින් ඒ තෙරුන්ගේ සම්මුඛයෙන් අසන ලදී. සම්මුඛයෙන් පිළිගන්නා ලදී. මේ ධර්මය මේ විනය මේ ශාස්තෲශාසනයයි කියන්නේය.

18. "මහණෙනි, ඒ භික්ෂුවගේ වචනයට නොසතුටු නොවිය යුතුය. ආක්‍රොශ නොකට යුතුය. නොසතුටු නොවී ආක්‍රොශ නොකොට ඒ පදයන් ඒ ව්‍යඤ්ජනයන් මනාකොට උගෙණ සූත්‍රයන් හා සමකළ යුත්තාහ. විනය හා සැසඳිය යුත්තාහ.

19. (මේ ඡේදය මේ සූත්‍රයේ 6 ඡේදය මෙනි.)

20-21. (මේ ඡේද මේ සූත්‍රයේ 16, 17 ඡේද මෙන් වෙත්)

22. (මේ ඡේදය මේ සූත්‍රයේ 15 ඡේදය මෙනි.)

23. "මහණෙනි, මේ තුන්වෙනි මහා ප්‍රදෙශයයි.

24, 25, 26. (මේ ඡේද මේ සූත්‍රයේ 17, 18, 19 ඡේද මෙන් වෙත්.)

27. (මේ ඡේදය මේ සූත්‍රයේ 17 ඡේදය මෙනි.)

28. "මහණෙනි, ඒ භික්ෂුවගේ වචනයට නොසතුටු නොවිය යුතුය. ආක්‍රොශ නොකොට යුතුය නොසතුටුනොවී ආක්‍රොශ නොකොට ඒ පදයන් ඒ බ්‍යඤ්ජනයන් මනාකොට උගෙණ සූත්‍රයන් හා සමකළ යුත්තාහ. විනය හා සැසඳිය යුත්තාහ.

29. "ඉදින් ඔවුන් සූත්‍ර හා සමකරන්නේ විනය හා සසඳන්නේ සූත්‍ර හා සමවෙත්ද විනය හා සැසඳෙත්ද ඒකාන්තයෙන් මෙය ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ වචනය ඒ තෙරුන්ද මනාකොට ගන්නාලද්දේයයි නිෂ්ටාවට යා යුතුය. මහණෙනි, මේ සතරවෙනි මහාපදෙශය දරව්. මහණෙනි, මේ සතර මහාපදෙශයෝයි"

**(දහඅටවෙනි සඤ්චෙතනීය වර්ගය නිමි.)**

# 19. යොධාජීව වර්ගය.

31. යොධාජීව සූත්‍රය:- 1. "මහණෙනි, කරුණු සතරකින් යුක්තවූ යොධතෙමේ රජුට සුදුසුවූයේ රජුගේ වස්තුව වූයේ රජුට අග්‍රය යන සංඛ්‍යාවට යයි. කවර සතරකින්ද යත්. මහණෙනි, මේ ලොකයෙහි යොධතෙම ස්ථානයෙහි දක්ෂවේද, ඈත පනින්නේ වේද, විදුලි එළියෙන් විදින්නේ වේද, මහත් සණ ඇති දෙයක් විදින්නේද, මේ කරුණු සතරින් යුක්තවූ යුද්ධයෙන් ජීවත්වන්නා රජුට සුදුසුවේ. රජුගේ භොගය වෙයි. රජහුට අග්‍රයයි යන සංඛ්‍යාවට යේ.

2. "මහණෙනි, එසේම කරුණු සතරකින් යුක්ත මහණ තෙම ආහුණෙය්‍ය වේ. පාහුණෙය්‍ය වේ. දක්ඛිණෙය්‍ය වේ, අඤ්ජලිකරණීය වේ. ලොකයාගේ නිරුත්තර පුණ්‍ය ක්ෂෙත්‍රයයි.

3. "කවර සතරකින්ද යත් මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ස්ථානයෙහි දක්ෂවේද, ඈත පනින්නේවේද, විදුලි එළියෙන් මහත් සණයන් පලන්නේ වේද, මහණෙනි, මහණතෙමේ කෙසේ ස්ථානයෙහි දක්ෂවේද?

4. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සිල්වත්ද සංවරවූයේ වේද, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තද, සුලු වරදෙහි බිය දක්නා ස්වභාව වේද ශික්ෂාපදයන් සමාදන්ව රකීද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම ස්ථානයෙහි දක්ෂවේ.

5. "මහණෙනි, කෙසේ මහණතෙම දුර හෙන්නේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම අතීතානාගත වර්තමානවූ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඖදාරිකවූ හෝ සියුම්වූ ලාමකවූ හෝ ප්‍රණීතවූ හෝ ඈත හෝ සමීපයෙහිවූ යම් රූපයක් වේද සියළු රූපය එය මගේ නොවේ. මේතෙම මම නොවෙමි. හෙතෙම මගේ ආත්මය නොවේයයි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දකී. යම්කිසි වෙදනාවක් ඇත්ද යම් වේදනාවක් වේද සියළු වේදනාව එය මගේ නොවේ. මේතෙම මම නොවෙමි. හෙතෙම මගේ ආත්මය නොවේයයි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන්

දකී. යම්කිසි සංඥාවක් ඇත්ද සියළු සංඥාව එය මගේ නොවේ මේ තෙම මම නොවෙමි. හෙතෙම මගේ ආත්මය නොවේයයි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දකී. යම්කිසි සංස්කාරයක් ඇත්ද යම් සංස්කාරයක් වේද සියළු සංස්කාරය එය මගේ නොවේ. මේ තෙම මම නොවෙමි. හෙතෙම මගේ ආත්මය නොවේයයි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දකී. යම්කිසි විඥ්ඥාණයක් ඇත්ද එය මගේ නොවේ. මේ තෙම මම නොවෙමි. හෙතෙම මගේ ආත්මය නොවේ. මෙසේ මෙය සම්‍යක් ප්‍රඥාවෙන් තත්වූ පරිද්දෙන් දකී. මහණෙනි, මෙසේ වනාහි මහණතෙම දුර හෙන්නේ වේ.

6. "මහණෙනි, කෙසේ මහණතෙම විදුලි එලියෙන් විදින්නේ වේද? (මෙහි 11 වර්ගයේ 3 සූත්‍රයේ 6 ඡෙදය යෙදිය යුතුයි) මහණෙනි, මෙසේ මහණතෙම විදුලි එලියෙන් විදින්නේ වේ.

7. "මහණෙනි, මහණතෙම කෙසේ මහත් ඝනයක් විදින්නේවේද මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මහත්වූ අවිද්‍යා සම්බන්ධයක් පලයිද, මහණෙනි මෙසේ මහණ තෙම මහත්වූ ශරීරයක් ප්‍රදාලනය කරන්නේ වේ.

8. (මේ ඡෙදය මේ සූත්‍රයේ 2 ඡෙදය මෙනි.)

**32. පාටිභොග රහිත සූත්‍රයඃ-** 1. "මහණෙනි, ධර්ම සතරකට ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලොකයෙහි කිසිවෙක් හෝ යම්කිසිවෙක් ඇපකාරයෙකු නොවේ. කවර සතර දෙනෙකුටද යත්.

2. "ජරා ස්වභාවය නොදිරේවයි,

3. "ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ ලොකයෙහි කිසිවෙක් හෝ ඇපකාරයෙක් නැත.

4. "ව්‍යාධි ස්වභාවය, ව්‍යාධි නොවේවයි, (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.)

5. "මරණ ස්වභාවය, නොමැරේවයි (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.)

6. "කිලුටුකරණ පුනර්භවය ඇතිකරවන කෙලෙස් විඩාව සහිත දුක්ඛ විපාකවූ මත්තෙහි ජාති ජරා මරණ ඇති යම් ඒ ලාමක කර්ම කෙනෙක් ඇත්ද ඔවුන්ගේ විපාකය නොඉපදේවායි, (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

33. **සබ්බදිට්ඨ සූත්‍රය**:- 1. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර වෙළුවනයෙහි කලන්දක නිවාප ස්ථානයෙහි වාසය කරණසේක. එකල්හි මගධ මහාමාත්‍ය වස්සකාර බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටුවිය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එකත්පසෙක සිටියේය.

2. "එකත්පසෙක සිටි මගධ මහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස, යම් කිසිවෙක් මා විසින් මෙසේ දක්නා ලදැයි දක්නා ලද්ද කියයිද, ඉන් දොෂයක් නැත. යම් කිසිවෙක් මා විසින් මෙසේ අසන ලදයයි අසන ලද්ද කියයිද, ඒ හෙතුවෙන් දොෂයක් නැත. යම් කිසිවෙක් මෙසේ මා විසින් ගන්ධ රස ඵොට්ඨබ්බ වශයෙන් ගන්නා ලද්දේයයි මුතය කියයිද ඒ හෙතුවෙන් දොෂයක් නැත. යම් කිසිවෙක් මා විසින් සිතින් දන්නා ලද්දේ යයි විඤ්ඤාණය කියයිද ඒ හෙතුවෙන් දොෂයක් නැතැයි මෙසේ කියන්නෙක් මෙබඳු දෘෂ්ටි ඇත්තෙක් යයි" කීයේය.

3. "බ්‍රාහ්මණය, මම දක්නාලද සියල්ල කිවයුතු යයි නොකියමි. බ්‍රාහ්මණය මම දක්නාලද සියල්ල නොකිවයුතු යයි නොකියමි. බමුණ, මම අසන ලද සියල්ල කිවයුතු යයි නොකියමි. බ්‍රාහ්මණය, මම අසන ලද සියල්ල නොකිවයුතු යයි නොකියමි. බමුණ මම සියලු ගන්ධ රස ස්පර්ශය කිවයුතු යයි නොකියමි. බමුණ, මම සියලු ගන්ධ රස ස්පර්ශය නොකිව යුතු යයි නොකියමි. බමුණු මම සියලු දතයුත්ත කිවයුතුයයි නොකියමි. බමුණ, මම සියලු දතයුත්ත නොකිව යුතුයයි නොකියමි.

4. "බමුණ, යම් දුටු දෙයක් කියන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, මෙබඳු දක්නා ලද්ද

නොකිවයුතු යයි කියමි. බමුණ, යම් දුටු දෙයක් කියන්නාට අකුශල ධර්ම පිරිහෙත්ද, කුශල ධර්ම වැඩෙත්ද, මෙබඳු දුටු දෙය කිවයුතුයයි කියමි.

**5.** "බමුණ, යම් ඇසූ දෙයක් කියන්නාට අකුශල ධර්මයන් වැඩෙත්ද කුශල ධර්මයන් පිරිහෙත්ද, මෙබඳු අසන ලද්ද නොකිවයුතුයි කියමි. බමුණ, යම් අසන ලද්දක් කියන්නාට අකුශල ධර්ම පිරිහෙත්ද කුශල ධර්ම වැඩෙත්ද, මෙබඳු අසන ලද්ද කිවයුතුයයි කියමි.

**6.** "බමුණ, යම් ගන්ධ රස ඵොට්ඨබ්බයක් කියන්නාහට අකුශල ධර්ම වැඩෙත්ද කුශල ධර්ම පිරිහෙත්ද එබඳු මුතය (පඤ්චෙන්ද්‍රියයන්ගෙන් දන්නා දෙය) නොකිවයුතුයයි කියමි. බමුණ, යම්කිසි ගන්ධ රස ඵොට්ඨබ්බයක් කියන්නාට අකුශල් පිරිහේ නම් කුශල් වැඩේ නම් මෙබඳු මුතය (පඤ්චෙන්ද්‍රියන්ගෙන් දැනගත් දේ) කිවයුතුයයි කියමි.

**7.** "බමුණ, යම්කිසි, සිතින් දතයුත්තක් කියන්නාහට අකුශල් වැඩෙත්ද, කුසල් පිරිහෙත්ද එබඳු විඤ්ඤාණය නොකිවයුතුයයි කියමි. බමුණ, යම් විඤ්ඤාණයක් කියන්නාට අකුශල් පිරිහෙත්ද කුසල් වැඩෙත්ද, එබඳු විඤ්ඤාණය කිව යුතුයයි කියමි.

**8.** "ඉක්බිති මගධ මහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව හුනස්නෙන් නැගිට ගියේය.

**34. මරණ භායන සූත්‍රයː-** 1. ඉක්බිති ජානුස්සොනී බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක් හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එකත්පසෙක සිටියේය.

**2.** එකත්පසෙක සිටි ජානුස්සොනී බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස, මම වනාහි යමෙක් මරණය ස්වභාව කොට ඇත්තේ මරණයට බිය නොවෙයිද, තැවීමට නොපැමිණෙයිද, හෙතෙම නැත්තේ යයි, මෙබඳු වාද ඇත්තෙක්මි, මෙබඳු දෘෂ්ටි ඇත්තෙක්මි.

3. "බමුණ, මරණය ස්වභාව කොට ඇත්තේ මරණයට බිය වෙයිද තැවීමට පැමිණෙයිද (එවැන්නෙක්) ඇත්තේය. බමුණ මරණ ස්වභාව ඇත්තේ මරණයට බිය නොවෙයිද, තැවීමට නොපැමිණෙයිද, (එවැන්නෙක්) ඇත්තේය.

4. "බමුණ මරණය ස්වභාව කොට ඇත්තේ මරණයට බිය වෙයිද තැවීමට පැමිණෙයිද ඒ කවරෙක්ද? බමුණ, මේ ලොකයෙහි ඇතැමෙක් කාමයන්හි පහවූ රාග නැත්තේද,

5. පහ නොවූ කැමත්ත ඇත්තේද, පහ නොවූ ප්‍රේමය ඇත්තේද, පහ නොවූ කාම පිපාසය ඇත්තේ වේද, පහනොවූ දැවීම ඇත්තේ වේද, පහනොවූ තෘෂ්ණාව ඇත්තේ වේද, ඔහු එක්තරා දැඩි රොගයක් ස්පර්ශ කරයි.

6. "එක්තරා දැඩිවූ රෝගයකින් ස්පර්ශ කළහුට ඒකාන්තයෙන් ප්‍රියවූ කාමයෝ 'මා අත්හරිත්. මම ප්‍රිය කාමයන් අත් හරිනෙමියි' හෙතෙම ශොක කරයි. ක්ලාන්ත වෙයි. වැළපෙයි, ළය අත් ගසා අඬයි. මුළාවට පැමිණෙයි. බමුණ, මේ තෙම මරණයට භයවෙයි. තැතිගැනීමට පැමිණෙයි.

7. "බමුණ, නැවතද අන් කෙනෙක් කියමි. මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් මරණය ස්වභාව කොට ඇත්තේ ශරීරයෙහි පහවූ රාග නැත්තේ වේද, (මෙහි මේ සූත්‍රයේ 5 ඡෙදය යෙදිය යුතුයි.)

8. "දැඩිවූ රොගයකින් ස්පර්ශ කළ ඔහුට ඒකාන්තයෙන් ප්‍රියවූ ශරීරය 'මා අත්හරියි. මම ප්‍රිය ශරීරය අත් හරින්නෙමි.' හෙතෙම ශොක කරයි. ක්ලාන්ත වෙයි, වැළපෙයි, ළය අත් ගසා අඬයි. මුළාවට පැමිණෙයි. බමුණ, මේ තෙමේද මරණ ස්වභාව ඇත්තේ මරණයට බිය වෙයි. තැති ගැනීමට පැමිණෙයි.

9. "බමුණ, නැවතද මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් නොකරණ ලද යහපතක් ඇත්තේ වේද නොකරණ ලද කුශලයක් ඇත්තේ වේද, බියට නොකළ ආරක්ෂාවක් ඇත්තේද, කරණලද පව් ඇත්තේ වේද කරණ ලද කර්කශ කර්ම ඇත්තේ වේද, කරණ ලද නපුරු අපිරිසිදු කර්ම ඇත්තේද ඔහු එක්තරා දැඩි රෝගයක් ස්පර්ශ කරයි.

10. "එක්තරා දැඩි රෝගයකින් ස්පර්ශ කළහුට මා විසින් ඒකාන්තයෙන් යහපතක් නොකරණ ලදී. කුශලයක් නොකරණ ලදී. බියට ආරක්ෂාවක් නොකරණ ලදී. පාපයක් කරණ ලදී. කර්කශ කර්මයක් කරණ ලදී. අපිරිසිදු කර්මයක් කරණ ලදී. පින්වත, නොකරණ ලද යහපත ඇති නොකරණ ලද කුශල් ඇති නොකරණ ලද බියට ආරක්‍ෂා ඇති කරණ ලද, පව් ඇති කරණ ලද කර්කශ කර්ම ඇති කරණ ලද අපිරිසිදු කර්ම ඇතියවුන්ගේ ගතිය යම්තාක්ද ඒ ගතියට පරලොව යමියි.' හෙතෙම ශොක කරයි. ක්ලාන්ත වෙයි. වැළපෙයි. ලෙහි අත් ගසා අඬයි. මුළාවට පැමිණෙයි. බමුණ මේ තෙමේද මරණ ස්වභාව කොට ඇත්තේ මරණයට බියවෙයි. තැති ගැනීමට පැමිණෙයි.

11. "බමුණ, නැවතද මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් සැක ඇත්තේ වේද, විචිකිච්ඡා ඇත්තේ වේද, සද්ධර්මයෙහි නිෂ්ටාවට නොගියේ වේද, ඔහු එක්තරා දරුණු රොගයක් ස්පර්ශ කරයි.

12. "එක්තරා දරුණු රොගයකින් ස්පර්ශ කළහුට මම ඒකාන්තයෙන් සැක ඇත්තේ වෙමි. විචිකිච්ඡා ඇත්තේ වෙමි. සද්ධර්මයෙහි නිෂ්ටාවට නොපැමිණියෙමි. හෙතෙම ශොක කරයි. ක්ලාන්ත වෙයි. වැළපෙයි, ලෙහි අත් හපා අඬයි, මුළාවට පැමිණෙයි. බමුණ මේ තෙමේද මරණ ස්වභාව ඇත්තේ මරණයට බිය වෙයි. සන්තාපයට පැමිණෙයි. බමුණ, මේ සතරදෙන මරණ ස්වභාව ඇත්තෝ මරණයට බිය වෙත්, තැතිගැනීමට පැමිණෙත්.

12. බමුණ, මරණය ස්වභාවකොට ඇති කවරෙක් හෝ මරණයට බිය නොවෙත්ද, තැතිගැනීමට නොපැමිණෙද්ද? බමුණ මේ ලොකයෙහි ඇතැමෙක් කාමයන්හි පහවූ රාග ඇත්තේ වේද.

13. පහවූ ඡන්දය ඇත්තේ වේද, පහවූ ප්‍රේමය ඇත්තේ වේද, පහවූ පිපාසය ඇත්තේ වේද, පහවූ දැවිල්ල ඇත්තේ වේද, පහවූ තෘෂ්ණාව ඇත්තේ වේද, ඔහු එක්තරා දරුණු රොගයක් ස්පර්ශ කරයි.

14. "එක් දරුණු රෝගයකින් ස්පර්ශ කළ ඔහුට ඒකාන්තයෙන් 'මා ප්‍රිය කාමයෝ අත්හරිත්, මම ප්‍රිය කාමයන් අත්හරින්නෙමියි' මෙසේ නොවේ. හෙතෙම ශොක නොකරයි. ක්ලාන්ත නොවෙයි. විලාප නොකියයි. ළය දෙඅත් බදා නොහඬයි. මුළාවට නොපැමිණෙයි. බමුණ, මේ තෙමේ මරණ ස්වභාව ඇත්තේ මරණයට බිය නොවෙයි. තැතිගැනීමට නොපැමිණෙයි.

15. "බමුණ, නැවත අනිකක් කියමි. මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් ශරීරයෙහි පහවූ රාග ඇත්තේ වේද, (මෙහි මේ සූත්‍රයේ 13 ඡේදය යෙදිය යුතුයි.)

16. "එක්තරා දරුණු රෝගයකින් ස්පර්ශ කළහුට ඒකාන්තයෙන් 'මා ප්‍රියවූ ශරීරය අත්හරින්නේය. මම ප්‍රිය ශරීරය අත් හරින්නෙමියි මෙසේ වේ. හෙතෙම ශොක නොකරයි, ක්ලාන්ත නොවෙයි. නොවැලපෙයි, ළෙහි අත් ගසා නොහඬයි, මුළාවට නොපැමිණෙයි. බමුණ, මේ තෙමේ මරණ ස්වභාව ඇත්තේ මරණයට බිය නොවෙයි. තැති ගැනීමට නොපැමිණෙයි.

17. 'බමුණ, නැවත අනිකෙක් කියමි. මේ ලෝකයෙහි ඇතැම් කෙනෙක් නොකරණ ලද පවක් ඇත්තේ වේද, නොකරණ ලද කර්කශ කර්ම වේද, නොකරණ ලද අපිරිසිදු කර්ම වේද, කරණ ලද යහපත ඇත්තේ වේද, කරණ ලද කුසල් ඇත්තේ වේද, කරණ ලද බියට පිළියම් ඇත්තේවේද, ඔහු එක්තරා දරුණු රෝගයක් ස්පර්ශ කරයි.

18. "එක්තරා දරුණු රෝගයකින් ස්පර්ශ කළාවූ ඔහුට ඒකාන්තයෙන් 'මා විසින් පාපයක් නොකරණ ලදී. අපිරිසිදු කර්මයක් නොකරණ ලදී. යහපතක් කරණ ලදී. කුශලයක් කරණ ලදී. බියට ප්‍රතිකර්මයක් කරණ ලදී. පින්වත නොකළ පව් ඇති නොකළ කර්කශ කර්ම ඇති, නොකළ අපිරිසිදු කර්ම ඇති කරණලද යහපත ඇති කරණලද කුසල් ඇති කරණ ලද බියට ප්‍රතිකර්ම ඇති අයට යම් ගතියක් ඇද්ද, ඒ ගතියට පරලොව යමි'යි හෙතෙම ශොක නොකරයි. ක්ලාන්ත නොවෙයි. නොවැලපෙයි. ළෙහි දෙඅත් ගසා නොහඬයි. මුළාවට

නොපැමිණෙයි. බමුණ මේ තෙමේද මරණ ස්වභාව ඇත්තේම, මරණයට බිය නොවෙයි. තැතිගැනීමට නොපැමිණෙයි.

**19.** "බමුණ, නැවතද මේ ලොකයෙහි ඇතැමෙක් සද්ධර්මයෙහි සැක නොකරන්නේ වේද, විචිකිච්ඡා නැත්තේ වේද, නිෂ්ටාවට ගියේද, ඔහු එක්තරා දරුණු රොගයක් ස්පර්ශ කරයි.

**20.** "එක්තරා දරුණු රොගයක් ස්පර්ශ කළ ඔහුට 'ඒකාන්තයෙන් සද්ධර්මයෙහි සැක නොකෙළෙමි. විචිකිච්ඡා නැත්තෙමි. නිෂ්ටාවට පැමිණියෙමි, මෙසේ සිතයි. හෙතෙම මරණයට ශොක නොකරයි. ක්ලාන්ත නොවෙයි. නොවැලපෙයි. ළෙහි අත් බැද නොහඬයි. මුළාවට නොපැමිණෙයි. බමුණ මේ තෙමේද මරණ ස්වභාව ඇත්තේම මරණයට බිය නොවෙයි, සන්ත්‍රාසයට නොපැමිණෙයි. මහණෙනි මරණ ස්වභාව ඇති මේ සතරදෙන මරණයට බිය නොවෙයි. තැතිගැනීමට නොපැමිණෙයි."

**35. බ්‍රාහ්මණ සච්ච සූත්‍රයඃ-** 1. එක්කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ගිජුකුළු පව්වෙහි වාසය කරණ සේක. එකල්හි ප්‍රසිද්ධ බොහෝ පරිබ්‍රාජකයෝ සප්පිනික ගඟ අද්දර පරිබ්‍රාජිකාරාමයෙහි වාසය කරත්. එනම් අන්නභාර, ද්වරධර, සකුළුදායී, පරිබ්‍රාජිකාවන්ද අනිකුත් ප්‍රසිද්ධ පරිබ්‍රාජිකාවන්ය.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි පල සමවතින් නැගිටිසේක් සප්පිනිකා තීරයෙහි පරිබ්‍රාජිකාරාමය යම් තැනෙක්හිද එහි පැමිණිසේක. එකල්හි වනාහි රැස්වූ වැඩහුන් ඒ පරිබ්‍රාජකයෝ අතර 'මේත් බ්‍රාහ්මණ සත්‍යය, මේත් බ්‍රාහ්මණ සත්‍යයයි, මේ අතුරු කථාවක් පහළවිය.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ පරිබ්‍රාජකයෝ යම් තැනෙක්හිද එහි පැමිණිසේක. පැමිණ පණවන ලද අස්නෙහි වැඩසිටිසේක, වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ ඒ පරිබ්‍රාජකයන්ට 'පරිබ්‍රාජකවරුනි, දැන් කවර කථාවකින් සිටියාහුද? තොපගේ කවර කථාවක් අඩාලවිනිදැයි?" කීසේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

"භවත් ගෞතමයන් වහන්ස, මෙහි වැඩහුන් රැස්වූ අප අතරේ මෙසේද බ්‍රාහ්මණ සත්‍යය, මෙසේද බ්‍රාහ්මණ සත්‍ය යයි' මේ අතුරුකථාව පහළවූයේයයි" කීවාහුය.

"පරිබ්‍රාජිකාවරුනි, මේ බ්‍රාහ්මණසත්‍ය සතරක් මා විසින් තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශකරණ ලද්දහ. කවර සතරක්ද යත්

**4.** "පරිබ්‍රාජකවරුනි, මේ ලොකයෙහි බමුණුතෙමේ සියළු ප්‍රාණීහු නොවඳයයි කීහ.

**5.** මෙසේ කියන බ්‍රාහ්මණතෙම සත්‍යයක් කීහ. බොරුවක් නොකීහ. හෙතෙම ඒ කරුණින් ශ්‍රමණයෙක් නොවේයයි හඟියි. බමුණෙක් නොවේයයි හඟියි. ශ්‍රේෂ්ඨ වෙමියි නොහඟියි. සමාන වෙමියි නොහඟියි. හීන වෙමියි නොහඟියි.

**6.** "එතකුදු වුවත් යමක් එහි සත්‍යයද එය විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රාණීන්ගේම දයාව අනුකම්පාව පිණිස පිළිපන්නේ වේ.

**7.** "පරිබ්‍රාජකවරුනි, නැවතද බමුණුතෙම සියලු කාමයෝ අනිත්‍යය දුක්ය වෙනස්වන ස්වභාව ඇත්තේයයි කීහ. (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.)

"යමක් එහි සත්‍යයද එය විශිෂ්ට ඥානයෙන් දැන කාමයන්ගේම නිර්වෙදය නොඇලීම පිණිස නිරුද්ධය පිණිස පිළිපන්නේ වේ.

**8.** "පරිබ්‍රාජකවරුනි, නැවත අනිකක් කියමි. බ්‍රාහ්මණ තෙමේ සියලු භවයෝ අනිත්‍යය, දුක්ය, පෙරලෙන ස්වභාව ඇත්තේයයි (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි) යමක් එහි සත්‍යයද එය විශිෂ්ට ඥානයෙන් දැන භවයන්ගේම නිර්වෙදනීය පිණිස නොඇලීම පිණිස නිරුද්ධය පිණිස පිළිපන්නේ වේ.

**9.** පරිබ්‍රාජකවරුනි, නැවතද අනිකක් කියමි. මම කිසි තැනෙක්හි නැත. කිසිවෙකුගේ යයි කැඳවිය යුතුකොටද නැත. අනුන්ගේ ආත්මය කොහිත් නැත. කිසිතැනෙක්හි නැතැයි, (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.) යමක් එහි සත්‍යද, එය

විශිෂ්ට ඥානයෙන් දැන පලිබොධ රහිත ප්‍රතිපදාවකට පිළිපන්නේවේ. පරිබ්‍රාජක වරුනි, මේ බ්‍රාහ්මණ සත්‍ය සතර මා විසින් තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන දේශනා කරණ ලද්දාහ.”

**36. ලොකනීයන සූත්‍රය**:- 1. ඉක්බිති එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට ‘ස්වාමීනි, කවරකින් ලොකයා ගෙනයනු ලැබේද, කවරකින් ලෝකයා අදීද, උපන්නාවූ කවරෙකුගේ වසඟයට යයිදැයි?” ඇසීය.

**2.** “මහණ, යහපත, යහපත, තොපගේ නුවණ යහපත්ය. වැටහීම යහපති. ප්‍රශ්න කිරීම යහපත්ය.

**3.** “මහණ, තොප ‘ස්වාමීනි, කවරකින් ලෝකයා ගෙන යනු ලබයිද? කවරකින් ලොකයා අදීද? උපන් කවරෙකුගේ වසඟයට යාදැයි’ මෙසේ විචාරන්නෙහිය.” - “ස්වාමීනි, එසේය.”

**4.** “මහණ සිතින් වනාහි ලොකය ගෙනයයි. සිතින් අදියි. උපන් සිතේ වසඟයට යයි”

**5.** “ස්වාමීනි, යහපතැයි” ඒ මහණතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව අනුමෝදන්ව, භාග්‍යවතුන් වහන්සේගෙන් මත්තෙහි ප්‍රශ්න විචාළේය.

**6.** “ස්වාමීනි, බහුශ්‍රැතයාය, ධර්මධරයාය, බහුශ්‍රැතයාය ධර්මධරයා යයි කියයි. ස්වාමීනි කොපමණකින් බහුශ්‍රැත වේද, ධර්මධරවේදැයි විචාළේය.

**7.** (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි) මහණ, නුඹ (මෙහි මේ සූත්‍රයේ 6 ඡෙදය යෙදිය යුතුයි.) “මහණ, මා විසින් දෙශනා කරණලද සූත්‍ර, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භුතධම්ම, වෙදල්ල බොහෝය. මහණතෙම ඉදින් සතරපද ගාථාවක වුවත් අර්ථය දැන ධර්මය දැන ධර්මානු ධර්ම ප්‍රතිපන්නවේද, බහුශ්‍රැතයයිද ධර්මධරයයිද කීමට සුදුසුය.

**8.** (මෙහි මේ සූත්‍රයෙහි 6 ඡෙදය යෙදිය යුතුයි.)

**9.** "ස්වාමීනි, ශ්‍රැතවත්ය, කලකිරෙන ප්‍රඥා ඇත්තේය. ශ්‍රැතවත්ය, කලකිරෙන ස්වභාවය ඇත්තේයයි කියයි, ස්වාමීනි, කොපමණකින් ශ්‍රැතවත්ද? කලකිරුණ ප්‍රඥා ඇත්තේද?

**10.** (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

**11.** මහණ තොප (මෙහි මේ සූත්‍රයේ 9 ඡේදය යෙදිය යුතුයි.)

**12.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මේ දුක යයි අසනලද්දේවේද, ඔහුගේ නුවනින් අර්ථය විනිවිද දකී. මේ දුක් ඉපදීමට හේතුවයයි අසනලද්දේ වේ. ඔහුගේ නුවණින් අර්ථය විනිවිද දකී. මේ දුක්ඛ නිරොධයයි අසනලද්දේ වේ. ඔහුගේ නුවණින් අර්ථය විනිවිද දකී. මේ දුක්ඛ නිරොධ ගාමිනී ප්‍රතිපදාව යයි, අසනලද්දේ වේ. ඔහුගේ නුවණින් අර්ථය විනිවිද දකී. මෙසේ වනාහි, මහණ, ශ්‍රැතවත්වේ. කළකිරුණු නුවණින් යුක්තවූයේ වේ.

**13.** (මේ ඡේදය මේ සූත්‍රයේ 5 ඡේදය මෙනි.)

**14.** "ස්වාමීනි, පණ්ඩිතය මහා ප්‍රාඥය පණ්ඩිතය මහා ප්‍රඥායයි කියයි. ස්වාමීනි, කොපමණකින් පණ්ඩිතද, මහා ප්‍රාඥවේදැයි' විචාළේය.

**15.** (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මහණ, නුඹ (මෙහි මේ සූත්‍රයේ 14 ඡේදය යෙදිය යුතුයි.) මෙසේ අසන්නෙහිය "එසේය ස්වාමීනි"

**16.** "මහණ, මේ ශාසනයෙහි පණ්ඩිත තෙමේ මහා ප්‍රාඥතෙමේ. තමාගේ පෙළීම පිණිස නොසිතයි. අනුන්ගේ පෙළීම පිණිස නොසිතයි. දෙපක්ෂයේම පෙළීම පිණිස නොසිතයි. තමාගේ යහපත, අනුන්ගේ යහපත, දෙපක්ෂයේම යහපත සියලු ලෝකයාගේ යහපතම සිතමින් සිතයි. මහණ මෙසේ වනාහි පණ්ඩිතද මහා ප්‍රාඥද වේ."

**37. වස්සකාර සූත්‍රයඃ-** 1. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර වෙළුවනයෙහි කලන්දක නිවාපයෙහි වාසය කරණසේක. ඉක්බිති මගධ මහාමාත්‍යවූ වස්සකාර

බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතුවූ සිහිකටයුතුවූ කථාවකොට නිමවා එකත්පසෙක සිටියේය.

2. එකත්පසෙක සිටි මගධ මහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට 'භවත් ගෞතමයන් වහන්ස, මේ තෙමේ අසත්පුරුෂයායයි අසත්පුරුෂයා හඳුනන්නේදැයි' ඇසීය.

3. 'බමුණ, මේ තෙමේ අසත්පුරුෂයායයි යම් අසත්පුරුෂයෙක් අසත්පුරුෂයා, දනීද මෙය නො සිදුවන්නකි. අනවකාශයකි.

4. "භවත් ගෞතමයන් වහන්ස, මේතෙමේ සත්පුරුෂයා යයි අසත්පුරුෂතෙමේ සත්පුරුෂයා දනීද?"

5. "බමුණ, මේ තෙමේ සත්පුරුෂයා යයි අසත්පුරුෂ තෙමේ සත්පුරුෂයා දනීද, මෙයද නොසිදුවන්නකි. අනවකාශයකි."

6. "භවත් ගෞතමයන් වහන්ස, මේ තෙමේ සත් පුරුෂයායයි සත්පුරුෂයා සත්පුරුෂයාව දන්නේද?"

7. "බමුණ, මේ තෙමේ සත්පුරුෂයයි සත්පුරුෂයා සත්පුරුෂයා දනීද මේ කාරණය විද්‍යමානවේ.

8. "මේතෙමේ අසත්පුරුෂයයි සත්පුරුෂතෙමේ අසත්පුරුෂයා දනීද?"

9. "බමුණ, මේතෙමේ අසත්පුරුෂයා යයි සත්පුරුෂ තෙමේ අසත්පුරුෂයා දනීද, මේ කාරණය විද්‍යමානවේ.

10. 'භවත් ගෞතමයන් වහන්ස, ආශ්චර්යයි. 'භවත් ගෞතමයන් වහන්ස, අද්භූතයි. භවත් ගෞතමයන් වහන්සේ විසින්, (මෙහි මේ සූත්‍රයේ 3, 5, 7, 9 ඡේද යෙදිය යුතුයි.)

11. "භවත් ගෞතමයන් වහන්ස, එක් කාලයෙක්හි මෙය සිදුවිය. තොදෙය්‍ය බ්‍රාහ්මණයාගේ පිරිසෙහි මේ රජතෙමේ රාම පුත්‍ර ශ්‍රමණයා කෙරෙහි මනාව පැහැදුනේ ශ්‍රමණ රාම පුත්‍රයා

කෙරෙහි යම් මේ වැඳීමක්, පෙරගමන් යාමක් ඇඳිලි බැඳීමක් සාමීචි කථාවක් ඇද්ද, බාලවූ මේ රජ තෙම ඥාණවන්තය. තමාගේ දොස් කථාවක් පැවැත්තේය. යමකය, මොග්ගල්ලය, උග්‍රය, නාවින්දකීය, ගන්ධර්වය, අග්ගිවෙස්සය යන මොව්හුද ඥාණවන්ත රජුගේ පිරිවරවූ බාලයෝය.

12. "ශ්‍රමණ රාම පුත්‍රයන් කෙරෙහි ප්‍රසන්නය. ශ්‍රමණ රාම පුත්‍රයන් කෙරෙහි යම් මේ වැඳීමය, පෙරගමනය, ඇඳිලි බැඳීමය, සාමීචි කර්මය යන ශ්‍රෙෂ්ඨ ගෞරවයන් කරත්.

13. "තමාගේ පිරිසෙහි සිටි ඔවුන්ට තොදෙය්‍ය බ්‍රාහ්මණ තෙම 'පින්වත්නි, ඒ කුමකැයි සිතන්නහුද රජතෙමේ පණ්ඩිතය, කෙළතොළුය, පණ්ඩිතයන් විසින් කළයුතු අතිරේක කෘත්‍යයන්හිද කිවයුතු අතිරේක වශයෙන් කිවයුතු දෙයෙහිද, පණ්ඩිතකමින් අතිශය පණ්ඩිතයයි, මේ කාරණයන්හි ලා දන්වයි. මෙසේ පින්වත්නි රජතෙමේ පණ්ඩිතය කෙළතොලුය කළයුතු අතිරේක කෘත්‍යයන්හිද, කිවයුතු අතිරේක වශයෙන් කිවයුතු පණ්ඩිතකමින් අතිශය පණ්ඩිතය එසේ හෙයින් රජතෙම පණ්ඩිතයි.

14. "පින්වත්නි, යම්හෙයකින් ශ්‍රමණ රාමපුත්‍රතෙම ඥාණවන්ත පණ්ඩිතකමින් අතිශයින් පණ්ඩිතවූ රජු විසින් කළයුතු අතිරේක වශයෙන් කළයුතු කිවයුතු අතිරේක වශයෙන් කිවයුතු පාණ්ඩිත්‍යයෙන් අතිරේක පාණ්ඩිත්‍යයෙන් සලකයිද, එසේ හෙයින් ඥාණවන්ත රජතෙම (මෙහි මේ සූත්‍රයේ 12 ඡෙදය යෙදිය යුතුයි.)

15. "පින්වත්නි, ඥාණවන්ත රජුගේ පිරිවරවූ යමක මොග්ගල්ල, උග්ගනාවින්දකී, ගන්ධර්ව අග්ගිවෙස්ස යන පණ්ඩිතයෝ කළයුතු අතිරේක වශයෙන් කළයුතු කිවයුතු අතිරේක වශයෙන් කිවයුතු පාණ්ඩිත්‍යයෙන් අතිරේක පාණ්ඩිත්‍යයෙන් යුක්ත පණ්ඩිතයෝ යයි හඟිත්ද පින්වත්නි, එසේය, ඥාණවන්ත රජුගේ පිරිවරවූ යමක, මොග්ගල්ලාන, උග්ග, නාවින්දකී, ගන්ධබ්බ, අග්ගිවෙස්ස යන කළයුතු අතිරේක වශයෙන් කළයුතු කිවයුතු අතිරේක වශයෙන් කිවයුතු

පාණ්ඩිත්‍යයෙන් හා අතිරේක පාණ්ඩිත්‍යයෙන් යුක්ත පණ්ඩිතයෝය.

16. "පින්වත්නි, යම් හෙයකින් ශ්‍රමණ රාම පුත්‍රතෙම කළයුතු අතිරේක වශයෙන් කළයුතු කිවයුතු විශෙෂයෙන් කිවයුතු පාණ්ඩිත්‍යයෙන් අතිරේක පාණ්ඩිත්‍යයෙන් යුත් ඣාණවන්ත රජහුගේ පණ්ඩිතයන්ගෙන් අතිශයින් පණ්ඩිතද එසේ හෙයින් ඣාණවන්ත රජුගේ පිරිවර ශ්‍රමණ රාම පුත්‍රයන් කෙරෙහි අතිශයින් ප්‍රසන්නය. (මෙහි මේ සූත්‍රයේ 12 ඡේදය යෙදිය යුතුයි.)

17. "භවත් ගෞතමයන් වහන්සේ විසින් 'මේ තෙමේ අසත්පුරුෂයායයි අසත්පුරුෂයා අසත්පුරුෂයා දන්නේද? බමුණ, මෙය නොසිදුවන්නකි. අනවකාශයකියි යම් සුභාසිතයකි' භවත් ගෞතමයන් වහන්සේ විසින් වදාළේද? භවත් ගෞතමයන් වහන්ස,

18. "මේ සත්පුරුෂ තෙමේයයි අසත්පුරුෂයා සත්පුරුෂයා දනීද? බමුණ, මෙයද නොසිදුවන්නකි. අනවකාශයකියිද, මේ පින්වත් තෙමේ සත්පුරුෂයයි සත්පුරුෂතෙම සත්පුරුෂයා දනී නම් මේ කරුණ විද්‍යමාන වේයයිද, මේ පින්වත් තෙමේ අසත්පුරුෂයායයි සත්පුරුෂයා, අසත්පුරුෂයා දනීද, බමුණ, මේ කරුණද විද්‍යමාන වේයයිද?" වදාළේද,

19. "මෙය ආශ්චර්යයි, භවත් ගෞතමන් වහන්ස, මෙය අද්භූතයි. භවත් ගෞතමයන් වහන්ස, එසේ නම් දැන් අපි යමු අපට බොහෝ වැඩ බොහෝ කටයුතු ඇත්තාහ."

20. "බ්‍රාහ්මණය, ඔබ දැන් යමකට කාලයද, එය හඟින්නැයි" වදාළසේක. ඉක්බිති මගධ මහාමාත්‍යවූ වස්සකාර බ්‍රාහ්මණතෙම සතුටුවී අනුමෝදන්ව අස්නෙන් නැගිට ගියේය."

38. **උපක චණ්ඩිකාපුත්ත සූත්‍රයඃ-** 1. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ගිජුකුළු පව්වෙහි වාසය කරණසේක. චණ්ඩිකා පුත්‍ර උපකතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි චණ්ඩිකාපුත්‍ර උපකතෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, යම් කිසිවෙක්,

**2.** "අනුන්ට ගරහයිද, අනුන්ට ගරහන්නේ සර්වප්‍රකාරයෙන් කුසල් නොඋපදවයි. කුසල් නොඋපදවන්නේ ගැරහිය යුත්තේ වේ, වරද සහිතවේ.

"මෙසේ මම කියන්නෙමි මෙබඳු දෘෂ්ටි ඇත්තෙක්මි."

"උපකය, ඉදින් (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

**4.** "ස්වාමීනි යම්සේ මතුවෙන්නෙකු මහත් පාසයකින් බඳින්නේද එසේම ස්වාමීනි, මම මතුවන්නේ භාග්‍යවතුන් වහන්සේ විසින් මහත් වාද පාසයකින් බැන්දේයයි" කීයේය.

'උපකය, මෙය අකුශලයයි මා විසින් පණවනලදද, මේ අකුශලය මෙසේයයි,

**5.** "එහි අප්‍රමාණ පද ඇත්තාහ, අප්‍රමාණ ව්‍යඤ්ජන ඇත්තාහ. තථාගතයන් වහන්සේගේ ධර්ම දෙශනාව අප්‍රමාණය.

**6.** "උපකය, ඒ අකුශලය ප්‍රහීන කටයුතුයයි මා විසින් පණවනලදද, එහි මේ අකුශලය මෙසේ ප්‍රහීන කටයුතුයයි (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.) උපකය, මේ කුශලයයි මා විසින් පණවන ලදද මේ අකුශලයද මෙසේයයි (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.) උපකය, ඒ කුශලය වැඩිය යුතුයයි මා විසින් පණවන ලදද මේ කුසලය මෙසේ වැඩිවිය යුතුයයිද (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි) වදාළසේක.

**7.** ඉක්බිති චණ්ඩිකාපුත්‍ර උපකතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව අනුමෝදන්ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණුකොට වෙදෙහි පුත්‍ර අජාසත් මගධ රජතෙම යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග කථා සල්ලාපය යම්තාක්ද ඒ සියල්ල වෙදෙහි පුත්‍ර අජාසත් මගධ රජුට සැළකෙළේය.

**8.** මෙසේ කී කල්හි වෙදෙහි පුත්‍ර අජාසත් මගධ රජ තෙම කිපුණේ නොසතුටුවූයේ චණ්ඩිකා පුත්‍ර උපකට "මුඛරවූ මේ ලොනකාරගම් දරුවා යම් ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට අගුණ කියන්ට සිතන්නෙහිද, මේ

තෙමේ යම්තාක් ගුණය නැසුයේද යම්තාක් බුහුටිද, ඔබ පහව යව හික්මීම පිණිස ඔබ මා නොදකුවයි” කීයේය.

**39. සච්ඡිකරණීය ධම්ම සූත්‍රය:-** 1. “මහණෙනි, මේ ප්‍රත්‍යක්ෂ කටයුතු ධර්ම සතරක් වෙත්. කවර සතරක්ද යත්, මහණෙනි, නාම කයින් ප්‍රත්‍යක්ෂ කටයුතු ධර්මයෝ ඇත්තාහ. මහණෙනි, පූර්වෙනිවාසානුස්මෘතියෙන් ප්‍රත්‍යක්ෂ කටයුතු ධර්මයෝ ඇත්තාහ. මහණෙනි, දිව ඇසින් ප්‍රත්‍යක්ෂ කටයුතු ධර්මයෝ ඇත්තාහ. මහණෙනි ධ්‍යාන ප්‍රඥාවෙන් විදර්ශනා ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂ කටයුතු ධර්මයෝ ඇත්තාහ.

**2.** “මහණෙනි, කවර ධර්ම කෙනෙක් නාම කයින් ප්‍රත්‍යක්ෂ කටයුතුද? මහණෙනි, අෂ්ටවිමොක්ෂයෝ කයින් ප්‍රත්‍යක්ෂ කටයුතුය. මහණෙනි, කවර ධර්ම කෙනෙක් ස්මෘතියෙන් ප්‍රත්‍යක්ෂ කටයුතුද? මහණෙනි, පූර්වෙනිවාසය සිහියෙන් ප්‍රත්‍යක්ෂ කටයුතුය. මහණෙනි, කවර ධර්ම කෙනෙක් ඇසින් ප්‍රත්‍යක්ෂ කටයුතුද? මහණෙනි, සත්වයන්ගේ චුතිය හා උත්පත්තිය නුවණැසින් ප්‍රත්‍යක්ෂ කටයුතුය. මහණෙනි, කවර ධර්මකෙනෙක් ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂකටයුතුද? මහණෙනි, ආශ්‍රවක්ෂය ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂ කටයුතුය. මහණෙනි, මේ සතර ප්‍රත්‍යක්ෂ කටයුතු ධර්මයෝයි.”

**40. තදහුපොසථ සූත්‍රය:-** 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර මිගාරමාතා ප්‍රාසාද නම් පූර්වාරාමයෙහි වාසය කරණසේක. ඒ අවස්ථාවෙහි භාග්‍යවතුන් වහන්සේ පොහෝ දිනයෙහි භික්ෂු සංඝයා පිරිවරාගෙන වැඩ සිටිසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණිම්භූතවූ භික්ෂු සංඝයා බලා භික්ෂූන් ඇමතූසේක.

**2.** “මහණෙනි, මේ පිරිස ප්‍රලාප රහිතය, මහණෙනි, මේ පිරිස නිෂ්ප්‍රලාපය. පිරිසිදුය, එබඳු හරයෙහි පිහිටියේය. මහණෙනි, මේ භික්ඛු සංඝතෙම යම්බඳු පිරිසක් ලොකයෙහි දක්නට දුර්ලභද, මේ පිරිස එබඳුය, මහණෙනි, මේ පිරිස යම් සේ ආහුණෙය්‍යද, පාහුණෙය්‍යද, දක්ඛිණෙය්‍යද, අඤ්ජලි කරණීයද, ලොකයාගේ නිරුත්තර පින්කෙතද, මේ භික්ෂු සංඝයා

එබඳුය. ස්වල්පයක් දෙනලද්දේ බොහෝ වේද, බොහෝ දෙනලද්දේ අතිශයින් බොහෝ වෙත්ද, මහණෙනි, මේ පිරිස එබඳුය. යම් පිරිසක් මාර්ගොපකරණ අංශයෙහි බහා යොදුන් ගණනක් දැක්මට යාමට සුදුසුද මේ පිරිස එබඳුය. මහණෙනි, මේ භික්ෂු සංඝයා අතර දේවත්වයට පැමිණියහු වසත්. මේ භික්ෂු සංඝයා එබඳුය. මහණෙනි, මේ භික්ෂු සංඝයා අතර බ්‍රහ්මත්වයට පැමිණි භික්ෂුහු සිටිත්. මේ භික්ෂු සංඝයා අතර නොසෙල්වෙන ස්වභාවයට පැමිණි සංඝයා සිටිත්. මේ භික්ෂු සංඝයා අතර ආර්යත්වයට පැමිණියහු වසත්.

3. "මහණෙනි, මහණතෙමේ කෙසේ දෙවත්වයට පැමිණියේවේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්ව (මෙහි තිකනිපාතයෙහි, බ්‍රාහ්මණ වර්ගයෙහි 9 සූත්‍රයේ 4 ඡෙදය "මේ සාසනයෙහි මහණතෙම" කී තැන්හි සිට යෙදිය යුතුයි. **(අ 1, පිට 305)** පැමිණ වාසයකරයි. මහණෙනි, මෙසේ වනාහි මහණතෙම දේවත්වයට පැමිණියේවේ,

4. "මහණෙනි, කෙසේ මහණතෙම බ්‍රහ්මත්වයට පැමිණියේවේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මෛත්‍රී සහගත සිතින් (මෙහි 3 පණ්ණාසකයේ 25 සූත්‍රයේ 2, 3 ඡෙද යෙදිය යුතුයි.

5. "මහණෙනි, මහණතෙම කරුණාසහගත සිතින් (මෙහි 3 පණ්ණාසකයේ 25 සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.) කරුණා සහගත සිතින් පතුරුවා වාසය කරයි.

6. "මහණෙනි, මහණතෙම මුදිතාසහගත සිතින් (මෙහි මේ පණ්ණාසකයේ 2 ඡෙදය යෙදිය යුතුයි.) මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කරයි.

7. "මහණෙනි, මහණතෙම උපෙක්ෂා සහගත සිතින් (මෙහි 3 පණ්ණාසකයේ 25 සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.) උපෙක්ෂා සහගත සිතින් පතුරුවා වාසය කරයි. මහණෙනි, මෙසේ වනාහි මහණතෙම බ්‍රහ්මත්වයට පැමිණියේවේ.

8. "මහණෙනි, කෙසේ මහණතෙම අකම්පන ස්වභාවයට පැමිණියේවේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සර්වප්‍රකාරයෙන් රූප සංඥාවන්ගේ ඉක්මීමෙන් ප්‍රතිඝසංඥාවන්ගේ අස්තංගමයෙන් නානත්ව සංඥාවන්ගේ නොමෙනෙහි කිරීමෙන් ආකාශය අනන්තයයි ආකාශානඤ්චායතනයට පැමිණ වාසය කරයි. ආකාශානඤ්චායතනය සර්වප්‍රකාරයෙන් ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤානඤ්චායතනයට පැමිණ වාසය කරයි. සර්වප්‍රකාරයෙන් විඤ්ඤානඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්චායතනයට පැමිණ වාසය කරයි. සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. මහණෙනි, මෙසේ වනාහි මහණතෙම අකම්පන ස්වභාවයට පැමිණියේවේ.

9. "මහණෙනි, කෙසේ මහණතෙම ආර්යත්වයට පැමිණියේවේද, (මෙහි 3 පණ්ණාසකයේ 2 සූත්‍රයේ 7 ඡෙදය යෙදිය යුතුයි) මහණෙනි, මෙසේ වනාහී මහණතෙම ආර්යත්වයට පැමිණියේ වේ."

## 20 මහා වර්ගය

41. **සොතානුගත සූත්‍රය**:- 1. "මහණෙනි, වචනයෙන් පුරුදු කරණ ලද, සිතින් ලබන ලද, දෘෂ්ටියෙන් පිළිවිදිනා ලද, ඤාණසොතයෙන් ව්‍යවස්ථා කරණ ලද ධර්මයන්ට ආනිසංස සතරක් කැමතිවිය යුතුය. කවර සතරක්ද යත්.

2. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සූත්‍ර ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූත ධම්ම, වෙදල්ල නම් ධර්මය පුරුදු කරයිද ඔහුට ඒ ධර්මයෝ කණට වැදුනාහු වෙත්ද, වචනයෙන් පුරුදුවූවාහු වෙත්ද සිතින් බලන ලද්දාහු වෙත්ද, දෘෂ්ටියෙන් අවබොධ කරණ ලද්දාහු වෙත්ද, හෙතෙම මුළාසිහි ඇතිව කාලක්‍රියා කරන්නේ එක්තරා දිව්‍ය නිකායක උපදී.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "එහි සුව ඇත්තාවූ ඔහුට ධර්ම පදයන් වැටහෙත්. සිහි ඉපදවීම ප්‍රමාදය. ඉක්බිති ඒ සත්වතෙම වහාම විශෙෂගාමි (නිර්වාණගාමී) වේ. මහණෙනි, වචනයෙන් පුරුදු සිතින් බලන ලද දෘෂ්ටියෙන් පිළිවිදි ශ්‍රොතයට පැමිණි ධර්මයන්ගේ මේ පළමු වෙනි ආනිසංසය කැමතිවිය යුතුය.

4. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

5. "සුවපත්වූ ඔහුට එහිදී ධර්මපද නොවැටහෙත්. එතකුදු වුවත් චිත්ත වසියට පැමිණි ඍද්ධි ඇති මහණතෙම දෙව පිරිසෙහි බණ කියයිද, යම්තැනෙක්හි 'මම පූර්වයෙහි බ්‍රහ්මචර්යයෙහි හැසුරුනෙම්ද, ඒ ධර්මය මේ දැයි' මෙබඳු සිතක්වේ. මහණෙනි, සිහි ඉපදවීම ප්‍රමාදවේ.

6. "එතකුදු වුවත් ඒ සත්වතෙම මහණෙනි, යම්සේ දක්ෂ පුරුෂයෙක් තෙම දීර්ඝ මාර්ගයට පිළිපන්නේ බෙරහඬ අසාද ඔහුට බෙරහඬක් බෙරහඬක් නොවේයයිද සැකයක් හෝ විමතියක් හෝ නොවේද නැවත බෙරහඬමයයි නිෂ්ටාවට යේද හෙතෙම වහා විශෙෂගාමී වේ.

7. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි.) සුවපත්වූ ඔහුට එහි ධර්මපද නොවැටහෙත්. එතකුදු වුවත් ඍද්ධි ඇති චිත්ත වසියට පැමිණි, මහණතෙම දිව්‍ය පිරිසෙහි බණ කියයි. ඔහුට යම්තැනෙක්හි මම පූර්වයෙහි බ්‍රහ්මචර්යාවෙහි හැසුරුනෙම්ද ඒ ධර්මය මේදැයි මෙබඳු සිතක් වේ. මහණෙනි, සිහි ඉපදවීම ප්‍රමාදවෙයි. ඉක්බිති ඒ සත්වතෙම වහාම විශේෂගාමිවේ.

"මහණෙනි, වචනයෙන් පුරුදු සිතින් බලන ලද දෘෂ්ටියෙන් ප්‍රතිවෙධ කරණ ලද කණට පැමිණි ධර්මයන්ගේ මේ දෙවෙනි ආනිසංසය කැමතිවිය යුතුයි.

8. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

9. "ඔහුට එහිදී ධර්ම සුවසේ නොවැටහෙයි. ඍද්ධි ඇති චිත්ත වසියට පැමිණි මහණ දෙව් පිරිසෙහි බණ කියයි. තවත් දිව්‍යපුත්‍රතෙම දිව්‍ය පිරිසෙහි බණ කියයි ඔහුට යම්තැනෙක්හි

මම පූර්වයෙහි බ්‍රහ්මචර්යයෙහි හැසුරුනෙම්ද, මේ ඒ ධර්ම විනයදැයි' මෙබඳු සිතක් වේ. මහණෙනි, සිහි ඉපදවීම ප්‍රමාද වෙයි. ඉක්බිති ඒ සත්වතෙම වහා විශෙෂගාමි වේ.

**10.** "මහණෙනි, සක් හඬෙහි දක්ෂ පුරුෂයෙක් යම්සේද හෙතෙම මහා මාර්ගයට පිළිපන්නේ සක්හඬ අසන්නේය. ඔහුට සක්හඬක්ද සක්හඬක් නොවේදැයි සැකයක් හෝ විමතියක් හෝ නොසිතෙන්නේය. වැලිදු සක්හඬක්මයයි නිෂ්ටාවට යයි. (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

**11.** "එහි සුවපත් ඔහුට ධර්මපද නොවැටහෙත්. ඍද්ධි ඇති චිත්ත වසියට පැමිණි භික්ෂුවක් දෙව් පිරිසෙහි බණද නොකියයි. එතකුදුවුවත් දිව්‍ය පුරුෂයෙක් දිව්‍ය පිරිසෙහි බණ කියයි. ඔහුට යම්තැනෙක්හි 'මම පූර්වයෙහි බ්‍රහ්මචර්යයෙහි හැසුරුනෙම්ද මේ ඒ ධර්මයදැයි' මෙබඳු සිතක්වේ. මහණෙනි සිහි ඉපදවීම ප්‍රමාදවේ. එතකුදු ඒ සත්වතෙම වහාම විශෙෂගාමී වේ. මහණෙනි, වචනයෙන් පුරුදු සිතින් බලන ලද දෘෂ්ටියෙන් ප්‍රතිවෙධ කරන ලද කණට වැදුනු ධර්මයන්ගේ මේ තුන්වෙනි ආනිශංසය කැමතිවිය යුතුයි.

**12.** (මේ ඡෙදය මේ සූත්‍රයේ 2 ඡෙදය මෙනි)

**13.** "එහිදී සුවපත්වූ ඔහුට ධර්මපද නොවැටහෙත්. ඍද්ධි ඇති චිත්ත වසියට පැමිණි භික්ෂුවක් දෙව් පිරිසෙහි බණ නොකියයි. එතකුදුවුවත් පළමුවෙන් උපන් දිව්‍ය පුත්‍රයෙක් පසුව උපන් දිව්‍ය පුත්‍රයකු 'නිදුකානෙනි, අපි පූර්වයෙහි බ්‍රහ්ම චර්යාවෙහි හැසුරුනෙමු ඔබ සිහිකරන්නෙහිදැයි' සිහි කරවයි. හෙතෙම නිදුකාණෙනි, සිහිවෙයි. නිදුකාණෙනි, සිහිවේයයි කියයි. මහණෙනි සිහි ඉපදවීම ප්‍රමාදවෙයි. එතකුදු වුවත් ඒ සත්වතෙම වහා විශෙෂගාමිවේ.

**14.** "මහණෙනි, (දාදු) ක්‍රීඩාකරන්නාවූ යහළුවන් දෙදෙනෙක් යම්සේද, ඔව්හු යම්කිසි කාලයක එක්වන්නාහුද, ඔවුන් අතුරෙන් යහළුවා යහළුවාට 'යහළුව, මෙසේද සිහි කරන්නෙහිද මෙසේද සිහිකරන්නෙහිදැයි' මෙසේ කියන්නේය. 'යහළුව සිහිවෙයි. යහළුව සිහිවෙයි' (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

**15.** "එහි සුවපත්වූ ඔහුට ධර්මපද වැටහෙත්. සෘද්ධි ඇති චිත්ත වසියට පැමිණි මහණතෙම දෙව් පිරිසෙහි බණ නොකියයි. දිව්‍ය පුත්‍රයෙක් දෙව් පිරිසෙහි බණ නොකියයි. එතකුදු වුවත් 'නිදුකාණෙනි අපි පූර්වයෙහි බ්‍රහ්මචර්යයෙහි හැසුරුනෙමු. ඔබට සිහිඇද්දැයි' සිහි කරවයි. හෙතෙම සිහිවෙයි. නිදුකාණෙනි, සිහිවෙයි නිදුකාණෙනියි' කියයි. මහණෙනි, සිහි ඉපදවීම ප්‍රමාදය එතකුදු වුවත් ඒ සත්වතෙම වහා විශෙෂගාමී වේ.

**16.** "මහණෙනි, වචනයෙන් පුරුදු සිතින් දක්නා ලද දෘෂ්ටියෙන් ප්‍රතිවෙධ කරණ ලද කණට පැමිණි ධර්මයන්ගේ මේ සතරවෙනි ආනිශංසය කැමතිවිය යුතුයි. මහණෙනි, වචනයෙන් පුරුදු සිතින් බලන ලද දෘෂ්ටියෙන් ප්‍රතිවෙධ කරණ ලද කණට පැමිණි ධර්මයන්ගේ මේ ආනිශංස සතර කැමතිවිය යුත්තාහ."

**42. චතුට්ඨාන ජානන සූත්‍රයː-** 1. "මහණෙනි, මේ කරුණු සතරක් කරුණු සතරකින් දතයුත්තාහ. කවර සතරක්ද යත්. මහණෙනි, එකට විසීමෙන් ස්වභාවය දත යුතුය.

**2.** "එයද ස්වල්ප කාලයකින් නොවේ. දීර්ඝ කාලයකිනි. සිහිකරන්නාහටය. නොමෙනෙහි කරන්නාට නොවේ. ප්‍රඥාවන්තයා විසිනි. දුෂ්ප්‍රාඥයා විසින් නොවේ.

**3.** "මහණෙනි, කථාවෙන් පිරිසිදු බව දතයුතුය. (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

**4.** "මහණෙනි, විපතක් පැමිණි කල්හි ශක්තිය දත යුත්තාහ. (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

**5.** "මහණෙනි, සාකච්ඡාවෙන් ප්‍රඥාව දත යුතුය. (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

**6.** "මහණෙනි, එකට විසීමෙන් ස්වභාවය දත යුතුය. (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

මෙසේ යමක් වදාරණ ලද්දේ නම් මෙය කුමක් නිසා වදාරණ ලද්දේද?

7. "මහණෙනි, මේ ලොකයෙහි පුද්ගලතෙම පුද්ගලයෙකු සමග වසන්නේ බොහෝ කාලයක් මේ ආයුෂ්මත් තෙමේ ශීලය කැඩීම කරන්නේය, සිදුරු කරන්නේය. පුල්ලි කරන්නේය. කිලුටු කරන්නේය ස්ථිර ක්‍රියා නොකරන්නේය. සීලය සියලු කාලයෙහි නොරකින්නේය. මේ ආයුෂ්මත් තෙමේ දුශ්ශීලය, මේ ආයුෂ්මත් තෙමේ සිල්වත් නොවේයයි' මෙසේ දනී.

8. "මහණෙනි, මේ ලොකයෙහි පුද්ගලතෙම පුද්ගලයෙකු සමග වසන්නේ 'මේ ආයුෂ්මත් තෙමේ බොහෝ කාලයක් ශීලය කැඩීම නොකරන්නේය. සිදුරු නොකරන්නේය, පුල්ලි නොකරන්නේය, කිලුටු නොකරන්නේය, ස්ථිර ක්‍රියා කරන්නේය, සියලු කල්හි සීලය රකින්නේය, මේ ආයුෂ්මත් තෙමේ සීලවන්තය. මේ ආයුෂ්මත් තෙමේ දුශ්ශීල නොවේයයි' මෙසේ දනී.

9. "මහණෙනි, සමග වාසයෙන් සීලය දත යුතුය.

10. "එයද ස්වල්ප කාලයකින් නොවේ. දීර්ඝ කාලයකිනි. සිහිකරන්නාහටය. නොමෙනෙහි කරන්නාට නොවේ. ප්‍රඥාවන්තයා විසිනි. දුෂ්ප්‍රාඥයා විසින් නොවේයයි මෙසේ යමක් වදාරණ ලද්දේ නම් එය මේ සඳහා වදාරණ ලද්දේය.

11. "මහණෙනි, කථාවෙන් පිරිසිදු බවදත යුතුය. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුය.) මෙසේ යමක් වදාරණ ලද්දේ නම් මෙය කුමක් නිසා වදාරණ ලද්දේද?

12. "මහණෙනි, මේ ලොකයෙහි පුද්ගලතෙම පුද්ගලයෙකු සමග කථාකරන්නේ 'මේ ආයුෂ්මත් තෙමේ අන් ප්‍රකාරයකින් එකෙකු සමග එකෙකුවී කථාකරයි. දෙදෙනෙකු සමග අන් ප්‍රකාරයකින්ද තුන්දෙනෙකු සමග අන් පරිද්දෙකින්ද, බොහෝදෙනා සමග අන් පරිද්දෙකින්ද, බැසගනී. මේ ආයුෂ්මත් තෙමේ පූර්ව කථාවෙන් අපර කථාව අපිරිසිදු කථා ඇත්තෙකි. මේ ආයුෂ්මත් තෙමේ අපිරිසිදු කථා ඇත්තේයයි' මෙසේ දනියි.

13. "මහණෙනි, මේ ලොකයෙහි පුද්ගලතෙම පුද්ගලයෙකු සමග කථා කරන්නේ, යම් පරිද්දෙකින් මේ ආයුෂ්මත් තෙමේ

එකෙකු හා එකක් කථා කරයි. දෙදෙනෙකු සමගත් එසේය තුන්දෙනෙකු සමගද එසේය. බොහෝදෙනා සමගද එසේය. මේ ආයුෂ්මත් තෙමේ පූර්ව කථාවෙන් අපර කථාව පිරිසිඳු කථා ඇත්තෙකුව නොපවතී. මේ ආයුෂ්මත් තෙමේ අපිරිසිඳු කථා ඇත්තේයයි නොදනියි. මහණෙනි, කථාවෙන් පිරිසිඳුකම දතයුතුය. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි) මෙසේ ඒ යමක් වදාරණ ලද නම් මෙය මේ සඳහා වදාරණ ලදී.

14. "මහණෙනි, විපතක් පැමිණි කල්හි ශක්තිය දත යුතුය. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මෙසේ යමක් වදාරණ ලද්දේ නම් එය කුමක් සඳහා වදාරණ ලදද?

15. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් ඥාතීන්ගේ ව්‍යසනයකින් ස්පර්ශවූයේ වස්තු විනාශයකින් ස්පර්ශවූයේ රොග ව්‍යසනයකින් ස්පර්ශවූයේ යම්බඳු ලොකයෙහි යම්බදු ආත්ම ප්‍රතිලාභයෙක්හි ලාභය, අලාභය, අයස, යසස, නින්දා, ප්‍රශංසා, සුඛ, දුක්ඛ යන අෂ්ටලොක ධර්මයෝ ලොකය ලුහුබඳිද්ද, ලොකයාද අෂ්ටලොක ධර්මයන් ලුහුබඳයි. මේ ලෝකයේ වාසය එබඳුය.

16. "මේ ආත්මභාව ප්‍රතිලාභය එසේයයි මෙසේ කල්පනා නොකරයි. හෙතෙම ඥාතිව්‍යසනයෙන් ස්පර්ශවූයේම භොග ව්‍යසනයෙන් ස්පර්ශවූයේ, රොගව්‍යසනයෙන් ස්පර්ශ වූයේම සොක කරයි, ක්ලාන්තවෙයි, වැළපෙයි, ළෙහි අත්බැඳ හඬයි, මුළාවට පැමිණෙයි.

17. (මේ ඡේදය මේ සූත්‍රයේ 15 ඡේදය මෙනි)

18. "මේ ආත්ම භාවලැබීම එබඳුයයි මෙසේ කල්පනා කරයි. හෙතෙම ඥාති ව්‍යසනයෙන් හෝ ස්පර්ශවූයේ, භොග ව්‍යසනයෙන් ස්පර්ශවූයේ, රොගව්‍යසනයෙන් ස්පර්ශවූයේ ශොක නොකරයි. ක්ලාන්ත නොවෙයි. නොවැළපෙයි. ළෙහි අත් බැඳ නොහඬයි, මුළාවට නොපැමිණෙයි.

19. (මේ ඡේදය මේ සූත්‍රයේ 14 ඡේදය මෙනි.)

20. "මහණෙනි, සාකච්ඡාවෙන් ප්‍රඥාව දත යුතුය. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මෙසේ යමක් වදාරණ ලද්දේද ඒ කුමක් සඳහා වදාරණ ලදද?

21. "මහණෙනි, මේ ලොකයෙහි පුද්ගලයෙක් තෙම පුද්ගලයෙකු සමග සාකච්ඡා කරන්නේ 'මේ ආයුෂ්මත්හුගේ ප්‍රශ්නකිරීමේ නුවණ ප්‍රශ්න ගෙතීම ප්‍රශ්න හැසිරවීම යම් බඳුද, මේ ආයුෂ්මත් තෙමේ දුෂ්ප්‍රාඥය, මේ ආයුෂ්මත්තෙමේ ප්‍රඥාවන්ත නොවේ. ඊට හේතු කවරේද?

22. "මේ ආයුෂ්මත් තෙමේ ශාන්තවූ ප්‍රණීතවූ තර්කයට අසුනොවන සියුම් පණ්ඩිතයන් විසින් දතයුතුවූ ගැඹුරු අර්ථයන් ගැඹුරු පදයන් නොඑලවයි. මේ ආයුෂ්මත්තෙමේ යම් ධර්මයක් කියයිද, ඒ ධර්මයාගේ සංක්ෂෙපයෙන් හෝ විස්තර වශයෙන් හෝ අර්ථය ප්‍රකාශ කරන්ට දෙශනාකරන්ට පණවන්ට තබන්ට විවරණය කරන්ට බෙදන්ට පහසුකරන්ට අදක්‍ෂය. මේ ආයුෂ්මත් තෙමේ දුෂ්ප්‍රාඥය. මේ ආයුෂ්මත් තෙමේ ඥාණවන්ත නොවේ.

"මහණෙනි, යම්සේ ඇස ඇති පුරුෂයෙක් දිය විලෙක්හි ඉවුරෙහි සිටියේ මතුවෙන කුඩා මසෙකු දක්නේය. ඔහුට යම්සේ වනාහි මේ මත්ස්‍යයාගේ මතුවූ මාර්ගය යම්සේද සුලිපහර යම්සේද, වේගය යම්සේද මේ මත්ස්‍යයා පොඩි එකෙක මේ මත්ස්‍යයා මහත් එකෙක් නොවේයයි මෙබඳු අදහසක් වන්නේය. (මෙහි මේ සූත්‍රයේ 21 ඡේදය යෙදිය යුතුයි.)

23. "මහණෙනි, මේ ලොකයෙහි පුද්ගලයෙක් තෙම පුද්ගලයෙකු සමග සාකච්ඡා කරන්නේ මේ ආයුෂ්මත්හුගේ ප්‍රශ්න කිරීමේ නුවණ ප්‍රශ්න ගෙතීම ප්‍රශ්න හැසිරවීම යම් බඳුද මේ ආයුෂ්මත්තෙමේ ඥාණවන්තය. මේ ආයුෂ්මත් තෙමේ දුෂ්ප්‍රාඥ නොවේයයි දනියි. ඊට හෙතු කවරේද? එසේම මේ ආයුෂ්මත් තෙමේ ශාන්ත ප්‍රණීත තර්කයට නොඅසුවන සියුම්වූ පණ්ඩිතයන් විසින් දතයුතුවූ ගැඹුරු අර්ථයන් ගැඹුරු පදයන් උදාහරණ කරයිද, මේ ආයුෂ්මත් තෙමේ යම් ධර්මයක් කියයිද ඒ ධර්මයාගේ සංක්ෂෙපයෙන් හෝ විස්තර වශයෙන් හෝ අර්ථය ප්‍රකාශකරන්ට දෙශනා කරන්ට පණවන්ට තබන්ට විවරණය

කරන්ට බෙදන්ට පහසුකරන්ට දක්ෂවේ. මේ ආයුෂ්මත් තෙමේ ඥානවන්තය. මේ ආයුෂ්මත් තෙමේ දුෂ්ප්‍රාඥ නොවේයයි,

**24.** "මහණෙනි, යම්සේ පුරුෂයෙක් දියවිලෙක්හි ඉවුරෙහි සිටියේ මතුවෙන මහත් මසෙකු දක්නේය. ඕහට මේ මත්ස්‍යයාගේ මතුවූ මාර්ගය යම්සේද රළ යම්සේද වේගය යම්සේද මේ මත්ස්‍යයා මහත්ය. මේ මත්ස්‍යයා ස්වල්ප නොවේ යයි මෙසේ සිතෙන්නේය.

**25.** (මෙහි මේ සූත්‍රයේ 23 ඡේදය යෙදිය යුතුයි.)

**26.** "මහණෙනි, සාකච්ඡාවෙන් ප්‍රඥාව දතයුතුයයි (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) මෙසේ යමක් වදාරණ ලද්දේද මෙය මේ සඳහා වදාරණ ලදී. මහණෙනි, මේ කරුණු සතර මේ කරුණු සතරින් දතයුත්තාහ."

**43. භද්දිය ලිච්ඡවි සූත්‍රයඃ-** 1. "එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර මහා වනයෙහි කූටාගාර ශාලාවෙහි වාසය කරණසේක. ඉක්බිති භද්දිය නම් ලිච්ඡවි රජතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි භද්දිය ලිච්ඡවි තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි මා විසින් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මායා දන්නේය. යම් මායාවකින් අන්‍ය තීර්ථකයන්ගේ ශ්‍රාවකයන් හරවා ගනිත්ද, එබඳු ආවර්තනීය මායාවක් දනීයයි මා විසින් අසන ලදී.

**2.** "ස්වාමීනි, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මායාවීය. යම් මායාවකින් අන්‍ය තීර්ථකයන්ගේ ශ්‍රාවකයන් හරවාගනීද එබඳු ආවර්තනීය මායාවක් දනීයයි' මෙසේ කීවාහුද, ස්වාමීනි, කිමෙක්ද ඔව්හු භාග්‍යවතුන් වහන්සේ වදාළ දෙයක් කියන්නාහුද භාග්‍යවතුන් වහන්සේ බොරුවෙන් යටකොට කියත්ද ධර්මයට අනු ධර්මයක් ප්‍රකාශ කරන්නහුද කිසියම් කරුණු සහිත වාදයක් ගැරහියයුතු කොට නොපැමිණෙත්ද, ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේ අභිභවා නොකියනු කැමැත්තෝ වෙමු.

**3.** "භද්දියෙනි, තොප මෙහි එව ඇසූ පමණකින් පිළිනොගනුව, පරම්පරාවෙන් ආ පමණකින් පිළිනොගනුව.

මෙය මෙය මෙසේයයි නොගනුව, පිටකය හා සමයයිද නොගනුව. තර්කයෙන්ද නොගනුව. න්‍යායයෙන්ද නොගනුව. හැඩහුරුකම (සමාන බව පෙනෙන) හොඳ නිසාත් නොගනුව. අපගේ දෘෂ්ටියට සමයයි කියාද නොගනුව. හොඳ තැනැත්තාගේයයි කියාද නොගනුව. ශ්‍රමණයන් වහන්සේ අපේ ගුරුවරයායයිද නොගනුව.

**4.** "භද්දියෙනි, යම්කලක තොපට මේ ධර්මයෝ අකුශලය මේ ධර්මයෝ වරදය, මේ ධර්මයෝ ඥානවන්තයන් විසින් ගර්හා කරණ ලද්දාහ. මේ ධර්මයෝ සම්පූර්ණ කරණ ලද්දාහු සමාදන් වන ලද්දාහු අහිත පිණිස දුක් පිණිස පවතිත්යයි යම් කලෙක තොප තමන්ම දන්නහු නම් ඉක්බිති භද්දිය තොපම අත්හරිව්.

"භද්දිය, ඒ කුමකැයි හඟින්නෙහිද? ලොභය,

**5.** "පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදින්නේ හිත පිණිස හෝ අහිත පිණිස හෝ පවතීද?"

"ස්වාමීනි, අහිත පිණිසය."

**6.** "භද්දිය ලොභයෙන් මඩනා ලද

**7.** "යටකොට ගත් සිත් ඇති පුරුෂ පුද්ගලතෙම ප්‍රාණීන්ද මරයි. නුදුන් දේද ගනී. පර අඹුවන් වෙතද යයි. බොරුද කියයි. යම් කරුණක් ඒ පුද්ගලයාට බොහෝ කාලයක් අහිත පිණිස දුක් පිණිස වේද, අනුන්ද ඒ පිණිස පමුණුවයි. ඒ කුමකැයි හඟින්නේද?"

"එසේය, ස්වාමීනි"

**8.** "භද්දිය, ද්වෙෂය (මෙහි මේ සූත්‍රයේ 5 ඡෙදය යෙදිය යුතුයි.) භද්දිය ද්වෙෂයෙන් මඩනා ලද (මෙහි මේ සූත්‍රයේ 7 ඡෙදය යෙදිය යුතුයි)

**9.** "භද්දිය, මොහය පුරුෂයාගේ 6මෙහි මේ සූත්‍රයේ 5 ඡෙදය යෙදිය යුතුයි) භද්දිය, මොහයෙන් මඩනා ලද (මෙහි මේ සූත්‍රයේ 7 ඡෙදය යෙදිය යුතුයි.) කරණුත්තරිය කරණය

පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදින්නේ හිත පිණිස උපදීද අහිත පිණිස උපදීද?

10. "භද්දිය, ඒ කුමකැයි හඟින්නෙහිද? මේ ධර්මයෝ කුසල් හෝ අකුසල් වෙත්ද?" - "ස්වාමීනි, අකුසල්ය."

"ස්වාමීනි, වරද සහිත හෝ වරද රහිතද?" - "ස්වාමීනි, වරද සහිතය. ඥාණවන්තයින් විසින් ගර්හා කරණ ලද්දේද, ඥාණවන්තයන් විසින් ප්‍රශංසා කරණ ලද්දේද?" - "ස්වාමීනි, ඥානවන්තයින් විසින් ගර්හා කරණ ලද්දේය."

"සම්පූර්ණ කරණ ලද්දාහු සමාදන් වන ලද්දාහු අහිත පිණිස දුක් පිණිස පවතිත්ද?" "මෙහි අපට මෙසේ වේ."

"භද්දිය, මෙසේ ඒ යමක් කීවෙමුද (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුය.)

11. "භද්දිය, තොප යම්කලෙක මේ ධර්මයෝ කුසල්ය මේ ධර්මයෝ නිවරදය මේ ධර්මයෝ ඥාණවන්තයන් විසින් ප්‍රශස්තයයි. මේ ධර්මයෝ සම්පූර්ණ කරණ ලද්දාහු සමාදන් වන ලද්දාහු හිත පිණිස සුව පිණිස පවතිත්යයි. තමා විසින්ම දන්නහු නම් භද්දිය තොප නැවත පැමිණ වාසය කරව්.

12. "භද්දිය, ඒ කුමකැයි හඟින්නෙහිද? අලොභය,

13. "පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදින්නේ හිත පිණිස හෝ අහිත පිණිස හෝ උපදීද?" - "ස්වාමීනි, හිත පිණිසය."

14. "භද්දිය, මේ අලොභ පුරුෂ පුද්ගලතෙම ලොභයෙන් මැඩ නොපවත්වන ලද්දේ,

15. "යටකොට නොගන්නා ලද සිත් ඇත්තේ ප්‍රාණියකු නොමරයි. නුදුන්දේ නොගනියි. පරදාරාවන් කරා නොයයි. බොරු නොකියයි. යමක් බොහෝ කලක් හිත පිණිස සැප පිණිස වේද, අනුන්ද ඒ පිණිස සමාදන් කරවයි." - "ස්වාමීනි, එසේය."

16. "භද්දිය, ඒ කුමකැයි හගින්නෙහිද? අද්වෙෂය (මෙහි මේ සූත්‍රයේ 13 ඡේදය යෙදිය යුතුයි.) භද්දිය මේ අලොභ පුරුෂ

පුද්ගල තෙම අලොභයෙන් මැඩ නොපවත්වන ලද්දේ (මෙහි මේ සූත්‍රයේ 15 ඡේදය යෙදිය යුතුයි.)

17. "භද්දිය, ඒ කුමකැයි හඟින්නෙහිද? අමොහය, (මෙහි මේ සූත්‍රයේ 13 ඡේදය යෙදිය යුතුයි.) භද්දිය, මේ අමොහය පුරුෂ පුද්ගලතෙම අමොහයෙන් මැඩ පවත්වන ලද්දේ (මෙහි මේ සූත්‍රයේ 15 ඡේදය යෙදිය යුතුයි.)

එකට එක කිරීම පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදින්නේ හිත පිණිස වේද අහිත පිණිස වේද?" "ස්වාමීනි හිත පිණිසය." "භද්දිය මේ එකට එක කිරීමෙන් දුරුවූ පුරුෂ පුද්ගලතෙම එකට එක කිරීමෙන් නොමඩනා ලද්දේ සතුන් නොමරයි. නුදුන් දෙය නොගනියි. පරදාරාවන් කරා නොයයි. බොරු නොකියයි. යමක් ඔහුට බොහෝ කලක් හිත පිණිස සැප පිණිස පවතීද අනුන් ඒ පිණිස යොදවයිද? - "ස්වාමීනි, එසේය."

18. "භද්දිය, මේ කුමකැයි හඟින්නෙහිද? මේ ධර්මයෝ කුශල් හෝ අකුසල් වේද? - "ස්වාමීනි, කුසල්ය" වරද සහිතද නිවරදද?" - "ස්වාමීනි, නිවරදය."

"ඥාණවන්තයන් විසින් ගර්හා කරණ ලද්දේද ඥාණවන්තයන් විසින් ප්‍රශංසා කරණ ලද්දේද?" - "ස්වාමීනි, ඥාණවන්තයන් විසින් ප්‍රශංසා කරණ ලද්දේය"

"සම්පූර්ණ කරණ ලද්දාහු සමාදන් වන ලද්දාහු හිත පිණිස සැප පිණිස පවතීද නොවේද, මෙහි කෙසේ හෝ වේද?"

"සම්පූර්ණ කරණ ලද්දාහු සමාදන් වන ලද්දාහු හිත පිණිස සැප පිණිස පවතිත්. මෙහි අපට මෙසේ සිතේ."

19. "භද්දිය, මෙසේ වනාහි (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

20. "භද්දිය, යම් කාලයෙක්හි තොප මේ ධර්මයෝ කුශල්ය, මේ ධර්මයෝ නිවරදය. මේ ධර්මයෝ ඥාණවන්තයන් විසින් ප්‍රශස්තය. මේ ධර්මයන් සම්පූර්ණ කරණ ලද්දාහු සමාදන්වන ලද්දාහු හිත පිණිස සැප පිණිස පවතිත් යයි. තමා විසින්ම

දන්නහුද, භද්දිය එකල තොප පැමිණ වාසය කරව්යයි. මේ යමක් සඳහා වදාරණ ලද්දේනම්. මෙය ඒ සඳහා වදාරණ ලදී.

21. "භද්දිය, ලොකයෙහි යම් ශාන්ත සත්පුරුෂ කෙනෙක් ඇද්ද? ඔව්හු 'එම්බා පුරුෂය, මෙහි එව, ලොභය යටපත්කර කර වාසය කරව. ලොභය යටපත්කර කර වාසය කරන්නේ කයින් වචනින් මනසින් ලොභයෙන් උපන් කර්ම නොකරන්නෙහිය. ද්වෙෂය යටපත් කර කර වාසය කරන්නේය. ද්වෙෂය යටපත් කර කර වාසය කරන්නේ කයින් වචනින් මනසින් ද්වෙෂයෙන් උපන් කර්ම නොකරන්නේය. මොහය යටපත් කර කර වාසය කරන්නේය මොහය යටපත් කර කර වසන්නේ කයින් වචනන් මනසින් මොහයෙන් උපන් කර්ම නොකරන්නේය. එකට එක කිරීම යටපත් කර කර වසන්නේය. එකට එක කිරීම යටපත් කර කර වසන්නේ කයින් වචනින් මනසින් කරනුත්තරිය කර්ම නොකරන්නේයයි මෙසේ සමාදන් කරවත්.

22. මෙසේ වදාළ කල්හි භද්දිය ලිච්ඡවීතෙම භාග්‍යවතුන් වහන්සේට, (මෙහි 2 පණ්ණාසකයේ 51 සූත්‍රයේ 6 ඡෙදය යෙදිය යුතුයි.)

23. "භද්දිය, තොපට මම 'භද්දිය, එව. මගේ ශ්‍රාවකයකු වෙව. මම ශාස්තෘවන්නෙමියි' කීයෙම් නොවෙම්ද?" "නැත ස්වාමීනි."

"ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ 'ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මායාවීය ආවර්තනීය මායාවක් දනීයි අන්‍ය තීර්ථකයන්ගේ ශ්‍රාවකයන් තමා අතට පෙරලා ගනීයයි අසත්‍යවූ හිස් වූ බොරුවූ නොවූ දෙයකින් මා මෙසේ කියන්නෙකැයි මෙසේ කීයේ නොවේද?"

"ස්වාමීනි, ආවර්තනීය මායාව යහපත්ය. ආවර්තනීය, මායාව යහපත්ය. ස්වාමීනි යම් මායාවකින් මාගේ නෑයන් සහලේ නෑයන් මේ පෙරලා ගැනීමෙන් හරවාගන්නාහු නම් මගේ ප්‍රියවූ නෑයන්ට සහලේ නෑයන්ට බොහෝ කාලයක් හිත පිණිස සැප පිණිස වන්නේය. ස්වාමීනි, ඉදින් සියලු ක්ෂත්‍රියයෝ

"මේ ආවර්තනීය මායාවෙන් පෙරලා ගන්නාහු නම් සියලු ක්ෂත්‍රියයන්ට,

**24.** "බොහෝ කාලයක් හිත පිණිස සැප පිණිස වන්නේය.

**25.** "ස්වාමීනි, ඉදින් සියලු බ්‍රාහ්මණයන් (මෙහි මේ සූත්‍රයේ 24 ඡේදය යෙදිය යුතුයි) වෛශ්‍යයන් (මෙහි මේ සූත්‍රයේ 24 ඡේදය යෙදිය යුතුයි) ක්ෂුද්‍රයන් (මෙහි මේ සූත්‍රයේ 24 ඡේදය යෙදිය යුතුයි.) භද්දිය, එය එසේමය. සියලු ක්ෂත්‍රියයන්,

**26.** "ආවර්තනය කරන්නාහු නම්, අකුශල ධර්මයන් ප්‍රහීන කිරීම පිණිස කුශල ධර්මයන්ට පැමිණීම පිණිස සියලුම ක්ෂත්‍රියයන්ට බොහෝ කාලයක් හිත පිණිස සැප පිණිස වේ.

**27.** "භද්දිය ඉදින් සියළු බ්‍රාහ්මණයන් (මෙහි මේ සූත්‍රයේ 26 ඡේදය යෙදිය යුතුයි. 'ක්ෂත්‍රියයන්' වෙනුවට බ්‍රාහ්මණයන්' කියා වේ.)

**28.** සියලු වෛශ්‍යයන් (මෙහි මේ සූත්‍රයේ 26 ඡේදය යෙදිය යුතුයි. 'ක්ෂත්‍රියයන්' වෙනුවට 'වෛශ්‍යයන්' යොදන්න) ක්ෂුද්‍රයන් ආවර්තනය කරත්.

**29.** සියලු ක්ෂුද්‍රයන් (මෙහි මේ සූත්‍රයේ 26 ඡේදය යෙදිය යුතුයි. 'ක්ෂත්‍රියයන්' වෙනුවට 'ක්ෂුද්‍රයන්' විය යුතුයි.)

**30.** "භද්දියය, ඉදින් දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත ප්‍රජාවෙහි, දෙව් මිනිසුන් අතරෙහි බොහෝ කාලයක් හිත පිණිස සැප පිණිස වේ. භද්දියය, මේ මහා සල්ගස් දෙක මේ ආවර්තනයෙන් අකුශල් ප්‍රහීන කිරීමට කුශල් වැඩීමට හරවාගන්නාහු නම් මේ මහා සල්ගස් වලටද ඉදින් සිතන්නාහු නම්, බොහෝ කාලයක් හිත පිණිස සැප පිණිස වේ. මනුෂ්‍යවූවන් ගැන කියනුම කවරේද?"

**44. සාපුගිය (සාමුගිය) සූත්‍රය:-** 1. එක් කාලයෙක්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ කොළිය ජනපදයෙහි සාපූග නම් කොලියයන්ගේ නියම්ගමෙහි වාසය කරණසේක. ඉක්බිති බොහෝවූ සාපූග නියම් ගම්වැසි කොලිය පුත්‍රයෝ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එහි

පැමිණියාහුය. පැමිණ ආයුෂ්මත් ආනන්ද තෙරුන් වැඳ එකත්පසෙක සිටියාහුය. එකත්පසෙක සිටි සාපූගිය කොලිය පුත්‍රයන්ට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ මේ වක්ෂ්‍යමාන කරුණ වදාළසේක.

2. "සාපූග ගම්වාසීනි, දක්නාවූ, දන්නාවූ, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් සත්වයන්ගේ විශුද්ධිය පිණිස, ශෝක වැළපීම් සංසිඳවා ගැනීම පිණිස, දුක් දොම්නස් සංසිඳවීම පිණිස, ආර්ය අෂ්ටාංගික මාර්ගය ලබා ගැනීම පිණිස, නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස, මේ පිරිසිදු බව පිණිස, වැඩියයුතු කරුණු සතරක් මනාකොට දෙශනා කරණ ලදී. කවර සතරක්ද යත්. සිල් පිරිසිදු කරණ වීර්යය, සිත පිරිසිදු කරණ වීර්යය, දෘෂ්ටිය පිරිසිදු කරණ වීර්යය, කෙලෙසුන්ගෙන් සිත මිදීම පිරිසිදු කරණ වීර්යය යන සතරයි.

3. "සාපූග ගම්වාසීනි, සිල් පිරිසිදු කරණ වීර්යය කවරේද? සාපූග ගම්වාසීනි, මේ ශාසනයෙහි මහණතෙම, සිල්වත්වේද, සංවරවූයේ වේද, ආචාර ගොචර දෙකින් සමන්විත වේද, කුඩා වරදෙහි පවා භය දක්නා ස්වභාව ඇත්තේ වේද, ශික්ෂාපදයන් සමාදන්ව හික්මෙයිද, සාපූග ගම්වාසීනි, මේ ශීල පාරිසුද්ධියයි. මෙසේ මෙබඳු සීල පාරිසුද්ධිය,

4. "අසම්පූර්ණයෙන් හෝ පුරන්නෙමි. සම්පූර්ණයෙන් හෝ පුරන්නෙමියි ඒ ඒ තන්හි ප්‍රඥාවෙන් අනුග්‍රහ කරන්නෙමි යන සිහියද එහි යම් ඡන්දයක්ද, වෑයමක්ද, උත්සාහයක්ද, දැඩි උත්සාහයක්ද, නොනැවතීමක්ද, සිහියක්ද, සම්‍යක් ප්‍රඥාවක්ද ඇද්ද, සාපූග ගම්වාසීනි, මෙය සීල පාරිසුද්ධිපධානියංගය සිල් පිරිසිදු කරණ වීර්යය නම්වේ.

5. "සාපූග ගම්වාසීනි, සිත පිරිසිදු කරණ වීර්යය කවරේද? සාපූග ගම්වාසීනි, මේ ශාසනයෙහි මහණතෙම කර්මයන්ගෙන් වෙන්ව (මෙහි තික නිපාතයෙහි බ්‍රාහ්මණ වර්ගයෙහි 9 සූත්‍රයේ 4 ඡෙදය යෙදිය යුතුයි. අ: 1, පිට 305) සාපූග ගම්වාසීනි, මේ චිත්තපාරිශුද්ධියයි. මෙසේ මෙබඳු චිත්ත පාරිශුද්ධිය.

**6.** (මේ ඡේදය මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

"සාපූග ගම් වාසීනි, මෙය (සිත පිරිසිදු කරණ වීර්යයයි.) චිත්ත පාරිසුද්ධි පධාන අංගයයි.

**7.** "සාපූග ගම්වාසීනි, දෘෂ්ටිය පිරිසිදු කරණ වීර්යය කවරේද? සාපූග ගම්වාසීනි, මේ දුක් ඉපදීමට හේතුවයයි තත්වූ පරිද්දෙන් දනීද, මේ දුක් නැති කිරීමයයි තත්වූ පරිද්දෙන් දනීද, මේ ශාසනයෙහි මහණතෙම මේ දුකයයි තත්වූ පරිද්දෙන් දනීද, මේ දුක් ඉපදීමට හේතුවයයි තත්වූ පරිද්දෙන් දනීද, මේ දුක් නැතිකිරීම යයි තත්වූ පරිද්දෙන් දනීද, මේ දුක් නැතිකිරීමට යන ප්‍රතිපදාවයයි තත්වූ පරිද්දෙන් දනීද, සාපූගගම් වාසීනි, මේ දිට්ඨි පාරිශුද්ධියයි කියනු ලැබේ. මෙසේ මෙවැනි දිට්ඨි පාරිශුද්ධිය, මේ (දිඨිය පිරිසිදු කරණ වීර්යය) දිඨිපාරිශුද්ධි පධානියංගයයි කියනු ලැබේ. (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

**8.** සාපූග ගම් වාසීනි, සිත කෙලෙසුන්ගෙන් මුදන විමුක්ති පාරිශුද්ධි පධානියංගය කවරේද? සාපූග ගම් වාසීනි, ඒ ආර්ය ශ්‍රාවකතෙම මේ සිල් පිරිසිදු කරනා වීර්යයෙන් යුක්තවූයේ මේ සිත පිරිසිදු කරණ වීර්යයෙන් යුක්තවූයේ මේ දෘෂ්ටිය පිරිසිදු කරණ වීර්යයෙන් යුක්තවූයේ ඇලුම් කටයුතු ධර්මයන්හි සිත නොඅලවයි. විඳුවිය යුතු ධර්මයන්ගෙන් සිත මුදවයි. හෙතෙම ඇලුම් කටයුතු ධර්මයන්ගෙන් සිත දුරුකොට විදිය යුතු ධර්මයන්ගෙන් සිත මුදා මනාකොට නිවණ ස්පර්ශ කරයි. සාපූග ගම් වාසීනි, මෙය විමුක්ති පාරිශුද්ධියයි කියනු ලැබේ. මෙසේ මෙවැනි විමුක්ති පාරිශුද්ධිය (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි) මේ විමුක්ති පාරිශුද්ධි පධානියංග යයි කියනු ලැබේ.

**9.** "සාපූග ගම් වාසීනි, මේ පිරිසිදු බව පිණිස කරණ වීර්ය සතර දන්නාවූ දක්නාවූ භාග්‍යවත්වූ ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මනාකොට වදාරණ ලදී. සත්වයන්ගේ විශුද්ධිය පිණිස ශොක පරිදෙවයන් ඉක්මවීම පිණිස දුක් දොම්නස් අස්තංගම කිරීම පිණිස ආර්ය අෂ්ටාංගික මාර්ගය අවබොධ කර ගැනීම පිණිස නිවණ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතී යයි වදාළසේක."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**45. වප්පසක්ක සූත්‍රයඃ-** 1. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත් නුවර ශාක්‍ය ජනපදයන්හි නිග්‍රොධාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි නිඝණ්ඨ ශ්‍රාවකයෙක්වූ වප්ප ශාක්‍යතෙමේ ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් මහා මොග්ගල්ලාන තෙරුන් වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි නිඝණ්ඨ ශ්‍රාවක වප්ප ශාක්‍යයාට ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ,

**2.** "වප්පය, මේ ලොකයෙහි කයින් සංවරවූයේ වචනයෙන් සංවරවූයේ සිතින් සංවරවූයේ අවිද්‍යාවෙන් වෙන්වූයේ විද්‍යාව ඉපදවූයේ වන්නේය. වප්පය, නුඹ යම් හේතුවකින් පුරුෂයා පරලොව දුක් විඳිය යුතු ආශ්‍රවයෝ ලුහුබඳනාහුද ඒ කාරණය දක්නෙහිද?"

**3.** "ස්වාමීනි, මේ ලොකයෙහි පෙර නොපැසුණු විපාක ඇති පාප කර්මයක් කරණ ලද්දේ වේද, ඒ හෙතුවෙන් පුරුෂයා කරා පරලොව දුක් විඳිය යුතු ආශ්‍රවයෝ ලුහුබඳනාහු වෙත්ද, ස්වාමීනි, මම ඒ කාරණය දකිමි."

**4.** නිඝණ්ඨ ශ්‍රාවකවූ වප්ප ශාක්‍යයා සමග මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේගේ මේ අවසන් නොවූ කථාව වූයේද, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් වේලාවෙහි ඵල සමවතින් නැගී සිටියේ, උපස්ථාන ශාලාව යම් තැනෙක්හිද එහි පැමිණිසේක. පැමිණ, පණවනලද අස්නෙහි වැඩසිටි සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳ ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට, "මොග්ගල්ලානය, දැන් කවර කථාවකින් යුක්තව සිටියාහුද? තොප විසින් කවර අතුරු කථාවක් අවසන් නොවූ කථාව කරණ ලද්දාහුදැයි" ඇසූසේක.

**5.** "ස්වාමීනි, දැන් මම නිඝණ්ඨ ශ්‍රාවකවූ වප්ප ශාක්‍යයාට, (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

**6.** මෙසේ කීකල්හි, ස්වාමීනි, නිඝණ්ඨ ශ්‍රාවකවූ වප්ප ශාක්‍යතෙම, (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

7. "ස්වාමීනි, නිඝණ්ඨ ශ්‍රාවකවූ වප්ප සමග මේ කථාව අවසන් නොවූවක් විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වැඩි සේකැයි" කීයේය. ඉක්බිති නිඝණ්ඨ ශ්‍රාවකවූ වප්ප ශාක්‍යයාට භාග්‍යවතුන් වහන්සේ, "වප්පය, ඉදින් ඔබ මට යම් කියනලද්දකගේ අර්ථය නොදන්නෙහි නම් මත්තෙහි මගෙන් ප්‍රශ්න කරව. අනුදැනිය යුත්තක් අනුදන්නෙහිය. ආක්‍රොශ කටයුත්තක් ආක්‍රොශ කරන්නෙහිය." "ස්වාමීනි, 'මෙය කෙසේද මෙහි තේරුම කුමක්දැයි,' අපගේ කථා සල්ලාපයක් මෙහි වන්නේයයි" වදාළසේක.

8. "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේට අනුදැනිය යුත්තක් අනුදනිමි. ප්‍රතික්ෂෙප කළ යුත්තක් ප්‍රතික්ෂෙප කරමි. භාග්‍යවතුන් වහන්සේගේ යම් භාසිතයක අර්ථයක් නොදන්නෙම්ද, 'ස්වාමීනි, මෙය කෙසේද මෙහි අර්ථය කවරේදැයි' භාග්‍යවතුන් වහන්සේම විචාරමි. මෙහි අපගේ කථා සල්ලාපයක් වේවා."

9. "වප්පය, ඒ කුමකැයි හඟින්නෙහිද? කාය කර්ම ප්‍රත්‍යයෙන් දුක් හා දැවීම ඇති යම් ආශ්‍රව කෙනෙක් උපදිත්ද, කාය කර්මයෙන් වෙන්වූවහුට මෙසේ දුක් හා දැවීම ඇති ආශ්‍රවයෝ නොවෙත්.

10. "හෙතෙම 'අළුත් කර්මයක් නොකරයි. පරණ කර්මය ස්පර්ශ කර කර කෙළවර කරයි. තමා විසින්ම දැක්ක යුතු කල් නොයවා විපාක දෙන, එව බලව' යන විධියට සුදුසු තමා කෙරෙහි ලා දතයුතු ඥාණවන්තයන් විසින් අධ්‍යාත්මයෙහි ලා කෙලෙස් දිරවන ප්‍රතිපදාව දතයුත්තාහ.

11. "වප්පය, නුඹ යම් හෙතුවකින් පුරුෂයා කරා මෙලොව දුක් වේදනා ඇති ආශ්‍රවයෝ ලුහුබඳනාහුද, ඒ කාරණය දක්නාහුද?" "ස්වාමීනි, නොදකිමි."

"වප්පය, ඒ කුමකැයි හඟින්නෙහිද, වාක් කර්මය ප්‍රත්‍යය වීමෙන් දුක හා දැවීම ඇති යම් ආශ්‍රව කෙනෙක් උපදීද, වාක් කර්මයෙන් වෙන්වූවහුට දුක හා දැවීම ඇති ඒ ආශ්‍රවයෝ නොවෙත්. (මෙහි මේ සූත්‍රයේ 10 ඡේදය යෙදිය යුතුයි.)

12. "වප්පය, යම් හෙතුවකින් පුරුෂයා කරා දුක් වේදනා ඇති ආශ්‍රවයෝ මෙලොව ලුහුබඳනාහුද ඒ කාරණය දක්නාහුද?" "ස්වාමීනි, නැත."

"වප්පය, ඒ කුමකැයි හඟින්නෙහිද, මනඃ කර්ම ප්‍රත්‍යයෙන් දුක් හා දැවීම් ඇති යම් ආශ්‍රව කෙනෙක් උපදිත්ද, මනඃ කර්මයෙන් වැලක්කාහට දුක හා දැවීම ඇති කරණ ඒ ආශ්‍රවයෝ නොවෙත්. (මෙහි මේ සූත්‍රයේ 10 ඡේදය යෙදිය යුතුයි.)

13. "වප්පය, යම් හෙතුවකින් පුරුෂයා කරා මෙලොව දුක් වේදනා ඇති ආශ්‍රවයන් ලුහුබඳනාහුද ඒ කාරණය ඔබ දක්නහුද?" "නැත ස්වාමීනි"

"වප්පය, ඒ කුමකැයි හඟින්නෙහිද? අවිද්‍යා ප්‍රත්‍යයෙන් දුක හා දැවීම ඇති කරණ යම් ආශ්‍රව කෙනෙක් උපදිත්ද, විද්‍යාව පහළ වීමෙන් මෙසේ ඒ දුක හා දැවීම ඇති කරණ ආශ්‍රවයෝ නොවෙත්. (මෙහි මේ සූත්‍රයේ 10 ඡේදය යෙදිය යුතුයි.)

14. "වප්පය, යම් හෙතුවකින් පුරුෂයා කරා මෙලොව දුක් විඳින්නාහු ආශ්‍රවයන් ලුහුබඳනාහුද, ඒ කාරණය දක්නාහුද?" "නැත, ස්වාමීනි."

"වප්පය, මෙසේ කාරණා සහිතව මනාකොට කෙලෙසුන්ගෙන් මිදුන භික්ෂුවට නිබද්ධ විහරණ සයක් ලබන ලද්දාහු වෙත්. හෙතෙම ඇසින් රූපයක් දැක,

15. "සතුටු වූයේ හෝ සතුටු නොවූයේ නොවේ. සිහි ඇත්තේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ ඒ ආරම්මණයන්හි මධ්‍යස්ථාව වසයි.

16. "කණින් ශබ්දයක් අසා (මෙහි මේ සූත්‍රයේ 15 ඡේදය යෙදිය යුතුයි) නාසයෙන් ගඳක් ආඝ්‍රාණය කොට (මෙහි මේ සූත්‍රයේ 15 ඡේදය යෙදිය යුතුයි.) දිවෙන් රසයක් විඳ (මෙහි මේ සූත්‍රයේ 15 ඡේදය යෙදිය යුතුයි.) කයින් ස්පර්ශයක් ස්පර්ශකොට (මෙහි මේ සූත්‍රයේ 15 ඡේදය යෙදිය යුතුයි.) සිතින් ධර්මයක් (මෙහි මේ සූත්‍රයේ 15 ඡේදය යෙදිය යුතුයි.) කය තිබෙන තුරු වේදනාවක් විඳින්නේ කය තිබෙන තුරු වෙදනා විඳිමියි දනියි.

දිවි තිබෙනතුරු වෙදනාවක් විඳින්නේ දිවි තිබෙනතුරු වෙදනාව විඳිමියි දනියි. කය බිඳීමෙන් ජීවිතක්ෂයෙන් පෙර මෙහිම සියළු වෙදනාවන් සතුටු වූවාහු නොපැවැත්මට ගියාහුයයි දනියි.

**17.** "වප්පය, යම්සේ ගස නිසා සෙවන පවතීද, (අ.1, තික නිපාතයේ 7 මහා වර්ගයේ 19 සූත්‍රයේ 18 ඡේදයේ 'ඉක්බිති උදැල්ලක් ගෙන... පා කර හරින්නේය' යන කොටස යෙදිය යුතුයි පිට 351)

**18.** "වප්පය, මෙසේ වනාහි ගස නිසා යම් ඡායාවක් වීද, ඒ ඡායාව මුළින් සිඳින ලදී. මුල් හෝ කරටිය සිඳි තල් ගසක් මෙන් කරණ ලදී. අභාවයට යවන ලදී. මත්තෙහි නූපදින තත්ත්වයට පත් කරණ ලදී.

**19.** "වප්පය, එසේම මෙසේ මනාව කෙලෙසුන්ගෙන් මිදුන භික්ෂුව විසින් අත්නොහළ විහරණ සයක් ලබන ලද්දාහු වෙත්. හෙතෙම ඇසින් රූපයක් දැක,

**20.** "සතුටු නොවූයේ වේ. නොසතුටු නොවූයේ වේ. සිහි ඇත්තේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ, උපෙක්ෂාවෙන් වසයි.

**21.** "කණින් ශබ්දයක් අසා (මෙහි මේ සූත්‍රයේ 20 ඡේදය යෙදිය යුතුයි.) නාසයෙන් සුවඳක් ආඝ්‍රාණය කොට (මෙහි මේ සූත්‍රයේ 20 ඡේදය යෙදිය යුතුයි.) දිවෙන් රසයක් අනුභවකොට (මෙහි මේ සූත්‍රයේ 20 ඡේදය යෙදිය යුතුයි.) කයින් ස්පර්ශයක් විඳ (මෙහි මේ සූත්‍රයේ 20 ඡේදය යෙදිය යුතුයි.) සිතින් ධර්මයක් දැන සතුටු නොවන්නේවේ. නොසතුටුද නොවන්නේවේ. සිහි ඇත්තේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ හෙතෙම ශරීරය හිම්කොට වෙදනාව විඳින්නේ ශරීරය හිම්කොට වෙදනාව විඳිමියි දනියි. ජීවිතය හිම්කොට වෙදනාව විඳින්නේ ජීවිතය හිම්කොට වෙදනාව විඳිමියි දනී. ශරීරයාගේ බිඳීමෙන් ජීවිතක්ෂයට පෙර මෙහිම සියලු වේදනාවන් සතුටුවන ලද්දාහු, සිහිල් වූවාහුයයි දනී."

**22.** "මෙසේ කීකල්හි, නිඝණ්ඨ ශ්‍රාවකවූ වප්ප ශාක්‍ය තෙම භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, යම් සේ පුරුෂතෙම

අභිවෘද්ධිය බලාපොරොත්තු වන්නේ අශ්ව රංචුවක් පොෂායය කරන්නේය. හෙතෙම දියුණුවක්ද නොලබන්නේය. මත්තෙහිද ක්ලාන්තයට දුකට භාජන වන්නේය. ස්වාමීනි, එසේම මම දියුණුව බලාපොරොත්තුවෙන් මෝඩවූ නිඝණ්ඨයන් ආශ්‍රය කළෙමි. ඒ මම දියුණුවටද නොපැමිණියෙමි. මත්තෙහි ක්ලාන්තයට දුකට පැමුණුනෙමි. ස්වාමීනි, ඒ මම අද සිට බාල නිඝණ්ඨයන් කෙරෙහි මගේ යම් පැහැදීමක් විඳ එය මහා වාතයෙහි පිඹ හරිමි. නදියක සැඩපහරක හෝ පාකර හරිමි.

23. (මේ ඡෙදය 2 පණ්ණාසකයේ 51 සූත්‍රයේ 6 දෙය මෙනි.)

46. **සාළ්හාභය සූත්‍රයː-** 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසාලාමහනුවර කූටාගාර ශාලාවෙහි වැඩසිටින සේක ඉක්බිති සාළ්හ ලිච්ඡවිතෙම්ද අභය ලිච්ඡවිතෙමේද භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියාහුය. එකත්පසෙක සිටි සාළ්හ ලිච්ඡවිතෙම භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, සීලයෙන් පවට පිළිකුල්කරන්නාවූද, තපසින් පාපයට පිළිකුල් කරන්නාවූද, මේ දෙකින් ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ සතර ඔඝයන්ගෙන් එතරවීම පණවත්. ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ මෙහිදී කුමක් වදාරණසේක්ද, සාළ්හය, මම සීලවිසුද්ධිය එක් ශ්‍රමණ ධර්ම කොට්ඨාසයකැයි කියමි.

2. "සාළ්හය, යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් තපසින් පවට පිළිකුල් කරන වාද ඇත්තේද, තපසින් පවට පිළිකුල් කිරීම හරයකොට ඇත්තේද, තපසින් පවට පිළිකුල් කිරීමෙහි ඇලුනාහු වෙත්ද, ඔව්හු ඔඝයෙන් එතෙරවීමට නුසුදුසුය.

3. "සාළ්හය, යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් අපිරිසිදු කායික හැසිරීම් ඇත්තාහුද, අපිරිසිදු වාක් හැසිරීම් ඇත්තාහුද, අපිරිසිදු සිතිවිලි ඇත්තාහුද අපිරිසිදු ජීවිකාව ඇත්තාහුද ඔව්හු නිරුත්තර සම්බොධිය පිණිස මාර්ගඥාන දර්ශනය ඉපදවීමට නුසුදුසුය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "සාල්හය, යම් සේ පුරුෂතෙම නදියක් තරණය කරණු කැමැත්තේ තියුණු කෙටේරියක් ගෙන වනයට ප්‍රවිෂ්ට වන්නේය. හෙතෙම එහි ඍජුවූ අළුත්වූ සැක නො ඉපදවිය යුතු මහත් සල්ගසක් දක්නේය. ඔහු එය මුලින් සිඳින්නේය. මුලින් සිඳ අගින් සිඳින්නේය. අගින් සිඳ අතු කොළ අතිශයින් පිරිසිදුකොට පිරිසිදු කරන්නේය අතිශයින් පිරිසිදුකොට සුද්ධකොට වෑයෙන් සසින්නේය. කෙටේරියෙන් සැස වෑයෙන් සසින්නේය.

4. වෑයෙන් සැස යත්තෙන් ගාන්නේය. යත්තෙන් ගා ගල්අලුවෙන් මදින්නේය. ගල්අළුවෙන් මැද ගඟට බස්වන්නේය. සාල්හය, ඒ කුමකැයි හඟින්නේද ඒ පුරුෂ තෙම නදිය තරණය කරන්ට සුදුසුද නැත ස්වාමීනි, ඊට හේතු කවරේද?"

5. "ස්වාමීනි, ඒ සල්ගස පිටතින් පරිකර්ම කරණ ලද්දේ ඇතුළත සුද්ධනොකරණ ලද්දේ සල්ගස කිදෙන්නේය පුරුෂයා විනාශයට පැමිණෙන්නේය, යන මෙය ඔහු විසින් කැමතිවිය යුතුයි."

"සාල්හය, එසේම යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් තපසින් කෙලෙස් තවනවාද ඇත්තාහු තපසින් කෙලෙස් තැවීම් හරයකොට ඇත්තාහු තපසින් පාපයට පිළිකුල් කිරීමෙහි ඇලුනාහු වෙසෙත්ද, ඔව්හු ඔඝයන්ගෙන් එතරවීමට නුසුදුසුය.

6. (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

7. සාල්හය, යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් තපසට නින්දාකරනවාද නැත්තේද තපසට නින්දාකිරීම හරයකොට නැත්තේද, තපසට නින්දා කිරීමෙහි නොඇලී වෙසෙත්ද, ඔව්හු ඔඝයෙන් එතරවීමට සුදුසුය. සාල්හය, යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් පිරිසිදු කයින් හැසිරීම් ඇත්තේද, පිරිසිදු වචනයෙන් හැසිරීම් ඇත්තේද, පිරිසිදු සිතින් හැසිරීම් ඇත්තේද, පිරිසිදු ආජීවය ඇත්තේද, ඔව්හු නිරුත්තර සම්බොධිය පිණිස ඥාණදර්ශය ඉපදවීමට සුදුසුය.

8. (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) උපකරණ උපකරණය ගෙන සාරන්නේය. ඇතුළත සුද්ධකරන්නේය. යත්තෙන් යතුගාන්නේය. යත්තෙන් යතුගා ගල් අළුයෙන්

මදින්නේය. ගල් අළුයෙන් මැද නැවක් කරන්නේය. නැවක්කොට කොල්ලෑව සහ රුවල්බඳින්නේය. කොල්ලෑව සහ රුවල් බැඳ ගඟට දමන්නේය. සාල්හය ඒ කුමකැයි හඟින්නෙහිද? ඒ පුරුෂතෙම ගඟ තරණය කරන්ට සුදුසුද? "ස්වාමීනි, එසේයි" - "ඊට හේතු කවරේද?

ස්වාමීනි, ඒ සල්ගස පිටත මනාකොට පිරියම් කරණ ලදී. ඇතුළත පිරිසිදු නැවක් කරනලදී. කොල්ලෑව සහ රුවල බඳිනලදී. නැව ගිලානොබසී. පුරුෂයා සුවසේ පරතෙරට යන්නේය, යන මෙය කැමතිවිය යුතුයි.

**9.** "සාල්හය එසේම යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණකෙනෙක් පිරිසිදු කාය හැසිරීම් ඇද්ද, පිරිසිදු වාක් හැසිරීම් ඇද්ද, පිරිසිදු සිතකින් හැසිරීම් ඇද්ද, පිරිසිදු ජීවිකාව ඇද්ද, ඔව්හු නිරුත්තර සම්බොධිය පිණිස ඥාණ දර්ශනය ඉපදවීමට සුදුසුය.

**10.** "සාල්හය, යම්සේ යුද්ධයෙන් ජීවත්වන්නෙක් බොහෝ හීවලින් කළයුතු චිත්‍ර දනීද, වැලිදු හෙතෙම කරුණු තුනකින් රජුට සුදුසුවේ. රාජභොග්‍යවේ. රජුගේ කොටසකැයි යන සංඛ්‍යාවටයේ. කවර තුනකින්දයත්, ඈත හෙලන්නේද වේ. විදුලි එලියෙන් විදින්නේවේ. මහත් ශරීරලන්නේවේ. සාල්හය, යම්සේ යොධාජීව තෙමේ දුර ගෙන්නේවේද, සාල්හය, එසේම ආර්‍ය ශ්‍රාවකතෙම සම්‍යක් සමාධියෙන් යුක්තවූයේ වේද, සාල්හය, සම්‍යක් සමාධියෙන් යුත් ආර්‍යශ්‍රාවකතෙමේ,

**11.** "අතීත අනාගත වර්තමානවූ අධ්‍යාත්මවූ හෝ බාහිර වූ ගොරෝසුවූ හෝ සියුම්වූ හීනවූ හෝ ප්‍රණීතවූ ඈත පිහිටි හෝ සමීපයෙහිවූ,

**12.** "යම්කිසි රූපයක්වේද, සියලු රූපය,

**13.** "මෙය මගේ නොවේ. මේතෙමේ මම නොවෙමි මේ මගේ ආත්මය නොවේයයි' මෙසේ මෙය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දනියි.

**14.** "(මෙහි 11 ඡෙදය යෙදිය යුතුයි.) යම්කිසි වේදනාවක් (මෙහි 13 වෙනි ඡෙදය යෙදිය යුතුයි.) (මෙහි 11 ඡෙදය යෙදිය

යුතුයි.) යම්කිසි සංඥාවක් වේද, (මෙහි 13 ඡේදය යොදාගත යුතුයි.) (මෙහි 11 ඡේදය යෙදිය යුතුයි) යම්කිසි සංස්කාරයක් වේද, (මෙහි 13 ඡේදය යොදාගතයුතුයි.) අතීත අනාගත වර්තමානවූ අධ්‍යාත්මවූ හෝ බාහිරවූ ගොරෝසුවූ හෝ සියුම්වූ හීන වූ හෝ ප්‍රණීතවූ ඈත පිහිටි හෝ සමීපයෙහි වූ යම්කිසි විඤ්ඤාණයක්වේද, සියලු විඤ්ඤාණය මෙය මගේ නොවේ මෙතෙමේ මම නොවෙමි. මේ මගේ ආත්මය නොවේයයි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දකියි. සාළ්හය, විදුලි එලියෙන් විදින යොධයා යම්සේද, එසේම සාළ්හය, සම්‍යක් දෘෂ්ටියෙන් යුත් ආර්ය ශ්‍රාවකතෙම මේ දුකයයි තත්වූ පරිද්දෙන් දනී. මේ දුක් ඉපදීමට හේතුවයයි තත්වූ පරිද්දෙන් දනී. මේ දුක්ඛනිරොධයයි තත්වූ පරිදි දනී. මේ දුක් නිරුද්ධයට ප්‍රතිපදාවයයි තත්වූ පරිද්දෙන් දනී.

15. "සාළ්හය, මහත් පිරිසක් පලන යුද්ධයෙන් ජීවත්වන්නා යම්සේද, සාළ්හය, එසේම ආර්ය ශ්‍රාවකතෙම අර්හත් ඵල විමුක්තියෙන් යුක්තවූයේවේද, සාළ්හය සම්‍යක් විමුක්තියෙන් යුත් ආර්ය ශ්‍රාවකතෙම මහත් අවිද්‍යා කඳ පලායයි වදාළ සේක"

**47. මල්ලිකොවාද සූත්‍රයඃ-** 1. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු මහ සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරණ සේක. එකල්හි මල්ලිකාදේවිතොමෝ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියාය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියාය. එකත්පසෙක සිටි මල්ලිකා දේවිතොමෝ භාග්‍යවතුන් වහන්සේට,

"ස්වාමීනි, යම් කරුණකින් මේ ලෝකයෙහි ඇතැම් ස්ත්‍රියක්,

2. "දුර්වර්ණ වේද, නපුරු ස්වරූපද, දක්නට පවිටුද, දිළිඳු වේද, ස්වකීය ධන ධාන්‍ය නැද්ද, උපභොග පරිභොග වස්තු නැද්ද, ස්වල්ප පිරිවරද,

3. "මීට හේතු කවරේද, මීට ප්‍රත්‍යය කවරේද?"

"ස්වාමීනි, යම් කාරණයකින් මේ ලොකයෙහි ඇතැම් ස්ත්‍රියක්,

4. "දුර්වර්ණවේද, නපුරු ස්වරූපද, දක්නට පවිටුද, වස්තුවෙන් ආඪ්‍යද, ධන ධාන්‍ය ඇද්ද, උපභොග පරිභොග වස්තු ඇද්ද, මහත් පිරිවරද ඇත්තේවේද,

5. "මට හේතුව කවරේද, මීට ප්‍රත්‍යය කවරේද?

"ස්වාමීනි, යම් කාරණයකින් මේ ලොකයෙහි ඇතැම් ස්ත්‍රියක්,

6. "මනා රූප ඇත්තේවේද, දැකුමට ප්‍රියද, සතුට එලවයිද, ශ්‍රෙෂ්ඨ වර්ණයෙන්, සෞන්දර්යයෙන් යුක්තද, දිළිඳු වේද, ධන ධාන්‍ය රහිතද, භොග නැත්තේද, මහා බලවතියෙක් නොවේද,

7. "ඊට හේතුකවරේද, ඊට ප්‍රත්‍යය කවරේද? ස්වාමීනි, යම් කරුණකින් මේ ලොකයෙහි ඇතැම් ස්ත්‍රියක්,

8. යහපත් රූප ඇත්තේ වේද, දැකුමට ප්‍රියද, සතුට එලවයිද, ශ්‍රෙෂ්ඨ වර්ණසෞන්දර්යයෙන් යුක්තද, ධන ධාන්‍ය බොහෝ ඇත්තේද, මහත් ධන ඇත්තේද, මහත් භොග ඇත්තේද, බොහෝ පිරිවර ඇත්තේද,

9. "මීට හේතු කවරේද, ප්‍රත්‍යය කවරේද?"

10. මල්ලිකාව, මේ ලොකයෙහි ඇතැම් ස්ත්‍රියක් ක්‍රොධ කරන්නීවේද, කිපීම බහුලකොට ඇත්තීවේද, ස්වල්පයක් කියන ලද්දේම ලැගෙයිද, කිපෙයිද, නියමභාවය අත්හරියිද, තදබවට පැමිණෙයිද, කොපයද, ද්වෙෂයද, නොසතුටද, පහළ කරයිද,

11. "ඕතොමෝ ශ්‍රමණයන්ට හෝ බ්‍රාහ්මණයන්ට හෝ ආහාරපාන, වස්ත්‍ර යානා, මල්ගඳ, විලවුන්, සයන, ආවාස, ප්‍රදීප නොදෙන්නීවේද, ඊර්ෂ්‍යාවෙන් යුත් සිත් ඇත්තේවේද, අනුන්ගේ ලාභ, සත්කාර, ගරුකාර, සැළකිලි, වැඳීම්, පූජාවන්හි ඊර්ෂ්‍යාකරයිද, තරහවේද, ඊර්ෂ්‍යාවබඳීද,

12. "ඕතොමෝ ඉදින් ඉන් චුතවූයේ මේ ආත්මභාවයට පැමිණේද, ඕතොමෝ යම් යම් තැනෙක්හි උපදීද, (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

13. (මේ ඡෙදය මේ සූත්‍රයේ 10 ඡෙදය මෙනි.)

14. ඕතොමෝ ශ්‍රමණයන්ට හෝ බ්‍රාහ්මණයන්ට හෝ ආහාරපාන, වස්ත්‍ර, යානා, මල්, ගඳවිලවුන්, සයන, ආවාස, ප්‍රදීප දෙන්නීවේද, ඊර්ෂ්‍යාවෙන් යුත් සිත් නැත්තේවේද, අනුන්ගේ ලාභ, සත්කාර, ගරුකාර, සැළකිළි, වැඳීම්, පූජාවන්හි ඊර්ෂ්‍යා නොකරයිද, ද්වෙෂ නොවේද, ඊර්ෂ්‍යාව නොබඳීද

15. "ඕතොමෝ ඉදින් ඉන් චුතවූවා, මේ ආත්මභාවයට පැමිණේද, ඕතොමෝ යම් යම් තැනෙක්හි උපදීද, (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.)

16. "මල්ලිකාව, මේ ලොකයෙහි ඇතැම් ස්ත්‍රියක් ක්‍රොධ නොකරන්නී වේද ක්‍රොධ බහුල කොට නැත්තේ බොහෝ කීවත් නොලැගෙයිද, නොකිපෙයිද, ප්‍රකෘතිභාවය අත්නොහරියිද, තද බවට නොපැමිණෙයිද, කොපයද ද්වෙෂයද නොසතුටද ප්‍රකාශ කරයිද,

17. "ඕතොමෝ ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ ආහාර පාන වස්ත්‍ර යානා මල් ගඳ විලවුන් සයන ආවාස, ප්‍රදීප නොදෙන්නී වේද, ඊර්ෂ්‍යාවෙන් යුත් සිත් ඇත්තේවේද, අනුන්ගේ ලාභ සත්කාර ගරුකාර සැලකිලි වැඳීම් පූජාවන්හි ඊර්ෂ්‍යා කරයිද ප්‍රදූශ්‍ය වෙයිද ඊර්ෂ්‍යාව බඳියිද,

18. ඕතොමෝ ඉදින් ඉන් චුතවූවා මේ ආත්මභාවයට පැමිණේද ඕතොමෝ යම් යම් තැනෙක්හි උපදීද, මනා රූප ඇත්තේ වෙයි දැකුමට ප්‍රියය. ප්‍රසාද එළවයි. ශ්‍රෙෂ්ඨ වර්ණ සෞන්දර්යයෙන් යුක්ත වෙයි. දිලිඳු වෙයි තමාගේයයි කියා යමක් නැත්තේ භොග නැත්තේ පිරිවර නැත්තේ වෙයි.

19. (මේ ඡෙදය මේ සූත්‍රයේ 15 ඡෙදය මෙනි.)

20. "ඕතොමෝ ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්ණයෙකුට හෝ ආහාරපාන වස්ත්‍ර යානා මල්ගඳවිලවුන් සයන ආවාස ප්‍රදීප දෙන්නී වේද, ඊර්ෂ්‍යාවෙන් යුත් සිත් නැත්තේ වේද, අනුන්ගේ ලාභ සත්කාර ගරුකාර සැලකිලි වැඳීම් පූජාවන්හි ඊර්ෂ්‍යානොකරයිද, කෝප නොවෙයිද, ඊර්ෂ්‍යාව නොබඳියිද,

21. "ඕතොමෝ ඉදින් ඉන් චුතවූවා මේ ආත්මභාවයට පැමිණේද, ඕතොමෝ යම් යම් තැනක උපදීද මනා රූ ඇත්තේ

වෙයි. දැකුමට ප්‍රියය. ප්‍රසාද එළවයි. ශ්‍රෙෂ්ඨ වර්ණ සෞන්දර්යයෙන් යුක්තවෙයි. ධන ධාන්‍යයෙන් ආඪ්‍යවේ. මහත් ධන ඇත්තේද, මහත් භොග ඇත්තේද, බොහෝ පිරිවර ඇත්තේද වේ.

22. "මල්ලිකාව, යම් කරුණකින් මේ ලොකයෙහි ඇතැම් ස්ත්‍රියක් (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

23. "මල්ලිකාව, යම් කරුණකින් මේ ලොකයෙහි ඇතැම් ස්ත්‍රියක් (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.) මේ ඊට හෙතුය මේ ඊට ප්‍රත්‍යය.

24. "මල්ලිකාව, යම් කරුණකින් මේ ලොකයෙහි ඇතැම් ස්ත්‍රියක් (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) මේ ඊට හෙතුය මේ ඊට ප්‍රත්‍යය

25. "මල්ලිකාව, යම් කරුණකින් මේ ලෝකයෙහි ඇතැම් ස්ත්‍රියක් (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.) මේ ඊට හෙතුය මේ ඊට ප්‍රත්‍යය.

26. "මෙසේ වදාළ කල්හි මල්ලිකා දේවී තොමෝ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, එකාන්තයෙන් මම අන් ජාතියක ක්‍රොධ ඇත්තියක් වූයෙම්ද, දැඩි ආයාස බහුලකොට ඇත්තී ස්වල්පයක් කියන ලද්දීම හැපුනෙම්ද, කිපුනෙම්ද, ප්‍රකෘතිභාවය අත්හළෙම්ද තද බවට පැමිණියෙම්ද කොපයද ද්වෙෂයද නොසතුටද ප්‍රකාශ කෙළෙම්ද වෙමි. ස්වාමීනි, ඒ මම දැන් නපුරු වර්ණ ඇත්තී, නපුරු රූප ඇත්තී, දැකීමට නපුරු වූයෙම්ද වෙමි. ස්වාමීනි, ඒ මම ඒකාන්තයෙන් අන් ජාතියෙක්හි ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ ආහාර පාන වස්ත්‍ර යානා මල් ගඳ විලවුන් සයන ආවාස ප්‍රදීප දුන්නෙමි. ස්වාමීනි, ඒ මම දැන් ධන ධාන්‍යයෙන් ආඪ්‍යවූයේ මහත් ධන ඇත්තේ මහත් භොග ඇත්තේ වෙමි.

27. "ස්වාමීනි, ඒකාන්තයෙන් මම අනෙක් ජාතියෙක්හි ඊර්ෂ්‍යාවෙන් යුත් සිත් නැත්තේ වීමි. අනුන්ගේ ලාභ සත්කාර ගරුකාර සැලකිලි වැඳීම් පූජාවන්හි ඊර්ෂ්‍යා නොකෙළෙමි.

ප්‍රදුෂ්‍යනොවීම ඊර්ෂ්‍යාව නොබැන්දෙමි. ස්වාමීනි, ඒ මම දැන් මහත් පිරිවර ඇත්තෙමි. ස්වාමීනි මේ රජගෙදර ක්ෂත්‍රිය කන්‍යාවෝද, බ්‍රාහ්ණ කන්‍යාවෝද, ගෘහපති කන්‍යාවෝද ඇත්තාහ. මම ඔවුන්ට අධිපතිකම් කරමි.

**28.** "ස්වාමීනි, ඒ මම අද සිට ක්‍රොධ නොකරන්නේ වන්නෙමි, දැඩි කොප බහුලකොට නැත්තේ බොහෝ කියන ලද්දේද නොලැගෙන්නෙමි නොකිපෙන්නෙමි, ප්‍රකෘතිභාවය නොහරින්නෙමි. තද බවට නොපැමිණෙන්නෙමි. කොපයද ද්වෙෂයද නොසතුටද පහළ නොකරන්නෙමි. ශ්‍රමණයන්ට බ්‍රාහ්මණයන්ට ආහාරපාන වස්ත්‍ර යානා, මල් ගඳ විලවුන් සයන ආවාස ප්‍රදීප දෙන්නෙමි. ඊර්ෂ්‍යාවෙන් යුත් සිත් නැත්තේ වන්නෙමි. අනුන්ගේ ලාභ සත්කාර ගරුකාර සැලකිලි වැඳීම් පූජාවන්හි ඊර්ෂ්‍යා නොකරන්නෙමි. ප්‍රදුෂ්‍ය නොවෙමි. ඊර්ෂ්‍යාව නොබඳිමි.

**29.** (මෙහි 2 පණ්ණාසකයේ 51 සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි. එහි 'උපාසකයකුකොට' වෙනුවට 'උපාසිකාවක්කොට' යන වචනය යෙදිය යුතුයි.)

**48. අත්තන්තපාදි සූත්‍රයː-** 1. "මහණෙනි, මේ පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්. කවර සතරදෙනෙක්ද යත්. මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමා තවයි. තමා තවන යොගයන්හි යෙදුනේ වෙයි, මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් අනුන් තවන්නේ වේ. අනුන් තවන යොගයන්හි යෙදුනේ වෙයි. මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමා තවන්නේද වේ. තමා තවන යොගයන්හි යෙදුනේද අනුන් තවන්නේද අනුන් තවන යොගයන්හි යෙදුනේද වේ. මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමා නොතවන්නේද වේ. තමා තවන ප්‍රතිපදාවෙන් යුක්තනොවූයේ වෙයි. අනුන් නොතවන්නේද වේ. අනුන් තවන යොගයන්හි නොයෙදුනේ හෙතෙම තමා නොතවන්නේ අනුන් නොපෙලන්නේ මෙලොවම තණ්හාවෙන් යුක්තවූයේ නිවුනේ සිහිල්වූයේ සැප විඳින්නේ තමා බ්‍රහ්මයෙකු කොට වාසය කරයි.

2. "මහණෙනි, කෙසේ නම් පුද්ගලතෙම තමා තවන්නේ වේද, තමා තැවීමෙහි යෙදුන යොගයෙන් යුක්තවූ පුද්ගලයා කෙසේ වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් (මෙහි දීඝනිකායේ 8 සූත්‍රයේ 17 ඡේදයේ 'නිර්වස්ත්‍රවේද... කෑමෙහි යෙදෙමින් වාසය කෙරේද?' යන කොටස යොදාගත යුතුයි- පිට 339. එසේම 'ඉදින් නොපිසූ පලා 'කෑමෙන් යැපෙයි'- පිට 341. 'ඉදින් හත් පට්ටා රෙදි දරාද... දියේ ගැලීමෙහි යෙදී වාසය කෙරේද, පිට 342 යන කොටස් මෙහි යෙදිය යුතුයි)

"මෙසේ අනෙක ප්‍රකාර මෙබඳු අනෙක ප්‍රකාර සිරුර තැවීම විශෙෂයෙන් තැවීම් වීර්යයෙන් යුතුව වාසය කරයි. මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම ආත්මය තවන වීර්යයෙහි යෙදී ආත්මය තවන්නේ වේ.

3. "මහණෙනි, කෙසේ නම් පුද්ගලතෙම අනුන් තවන වීර්යයෙහි යෙදී අනුන් තවන්නේ වේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් එළුවන් මරන්නේවේ. හූරන් මරන්නේ වේ. පක්ෂීන් මරන්නේ වේ. මුවන් මරන්නේ වේ. කර්කශද, මසුන් නසන්නේද, චෞරද, චෞරඝාතකද, හිරගෙවල් ආරක්ෂා කරන්නේද, යම්බඳු අන්‍යවූ කෲරවූ කර්මාන්ත ඇත්තේද, මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම අනුන් තවන වීර්යයෙන් යුක්තවූයේ අනුන් තවන්නේවේ.

4. "මහණෙනි, තමා තැවීමෙහි යෙදුන වීර්යයෙන් යුක්ත තමා තවන අනුන් තැවීමෙහි යෙදුන වීර්යයෙන් යුත් අනුන් තවන පුද්ගලයා කෙසේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ඔටුණු පැළඳි රජෙක් හෝ වේද, බ්‍රාහ්මණ මහාසාර පුද්ගලයෙක් හෝ වේද, හෙතෙම නුවර පෙරදිගින් අළුත් රැස්වීම් ශාලාවක් කරවා හිසකෙස් රැවුල් බහා කුර සහිත අඳුන් දිවිසමක් පොරවා ගිතෙල් හා තලතෙල් සිරුරෙහි ගා මුව අඟකින් පිට කසමින් මෙහෙසිය සමගද පුරොහිත බ්‍රාහ්මණයා සමගද, රැස්වීම් ශාලාවට පිවිසෙයි. හෙතෙම එහි ගොම ඉසින ලද නොඅතුරණ ලද භූමියෙහි සයනය කරයි. සමාන පාට වසුපැටියෙක් ඇති එක් එළදෙනෙකුගේ එක් තනයෙක්හි යම්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කිරක් වේද එයින් යැපෙයි. දෙවෙනි තනයෙහි යම් කිරක්වේද, එයින් මෙහෙසිය යැපෙයි. තුන්වෙනි තනයෙහි යම් කිරක් වේද, ඉන් පුරෝහිත බ්‍රාහ්මණයා යැපෙයි. සතරවෙනි තනයෙහි යම් කිරක් වේද ඉන් ගිනිදෙවියා පුදයි. ඉතිරි හරියෙන් වසුපැටවා යැපෙයි. හෙතෙම 'යාගය පිණිස මෙතෙක් ශ්‍රෙෂ්ඨ ගවයන් මරත්වා. යාගය පිණිස මෙතෙක් ගොනුන් මරත්වා. යාගය පිණිස මෙතෙක් එළදෙනුන් මරත්වා. යාගය පිණිස මෙතෙක් එළුවන් මරත්වා. යාගය පිණිස මෙතෙක් බැටළුවන් මරත්වා කණු පිණිස මෙතෙක් ගස් කපත්වා. ඇහිරීමට හා යාග භූමියෙහි ඇතිරීමට මෙතෙක් දැව කපත්වායි' මෙසේ කියයි. ඔවුන්ගේ යම් දාසකෙනෙක් හෝ පණිවුඩ ගෙනයන්නෙක් හෝ වැඩකරුවෙක් හෝ වෙත්ද, ඔවුහුද දණ්ඩණයෙන් තැතිගත්තාහු බියෙන් තැතිගත්තාහු, කඳුළු පිරුණු මුහුණු ඇත්තාහු, අඬමින් වැඩපල කරත්. මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම ආත්මය තවන වීර්යයෙන් යුක්තවූ ආත්මය තවන්නෙක්වේ. අනුන් තවන වීර්යයෙහි යෙදුන අනුන් තවන පුද්ගලයෙක් වේ.

**5.** "මහණෙනි, කෙසේ වනාහි ආත්මය තවන වීර්යයෙහි නොයෙදුන, ආත්මය තවන්නේ නැති, අනුන් තවන වීර්යයෙහි නොයෙදුන අනුන්ද තවන්නේ නැති පුද්ගලයා කවරේද? තමා නොතවන අනුන්ද නොතවන හෙතෙම මෙලොවම බඩසය නැත්තේ නිවුනේ සිහිල්වූයේ සැපවිඳිමින් බ්‍රහ්මයා වැනි ආත්මයෙන් වාසය කරයි. මහණෙනි, (මෙහි දීඝ නිකායේ 7 සූත්‍රයේ 18 ඡේදයේ අර්හත්වූ... දක්වන... පිට 315 යන කොටසද, එම සූත්‍රයේ 3 ඡේදයද, 4 ඡේදයේ 'මේ සස්නෙහිවූ භික්ෂුවක්... කියන්නේ වේද යන කොටසද එම ඡේදයේ 'තණගස්... යන මෙයින්ද සම්පූර්ණයෙන් වැළැක්කේය' යන කොටසද, යෙදිය යුතුයි.)

**6.** (මේ ඡේදය දීඝනිකායේ 7 සූත්‍රයේ 21 ඡේදයේ 'භික්ෂුතෙම... බැහැරයයි' යන කොටස වේ)

**7.** "ආර්ය සීල රාශියෙන් යුක්තවූ හෙතෙම ආර්ය සීලස්කන්ධයෙන් යුක්තවූයේ අධ්‍යාත්මයෙහි නිවරද සැපය විඳියි.

(මෙහි 4 පණ්ණාසකයේ 14 වෙනි සූත්‍රයේ 4 ඡේදයේ 'මහණතෙම ඇසින් රූපයක් දැක සංවරයට පැමිණේ'... යන කොටස යෙදිය යුතුයි)

8. "හෙතෙම ආර්ය ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වූයේ අධ්‍යාත්මයෙහි කෙලෙසුන් නොගැවසුණු සැපය විඳියි. (මේ ඡේදය දීඝනිකායේ 7 සූත්‍රයේ 20 ඡේදයේ 'භික්ෂුතෙම මේ මේ දේ මනානුවණින් දැන කරන්නේය' යන කොටස යෙදිය යුතුයි.)

**9-10.** (මෙහි දීඝනිකායේ 7 සූත්‍රයේ 22, 23 ඡේද මෙන් වෙත්.)

(මේ ඡේද දීඝනිකායේ 8 සූත්‍රයේ 47, 48, 49, 50 ඡේද මෙන් වෙත් පිට 359 'මෙයද ඒ භික්ෂුහුගේ සමාධි සම්පත්ති යයි' යන වාක්‍යය අත්හැරිය යුතුයි)

(මේ ඡේද දීඝනිකායේ 8 සූත්‍රයේ 61, 63, 65 ඡේද මෙන් වෙත්.)

"මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම තමා තවන වීර්යයෙහි නොඇලුනේ ආත්මය තවන්නෙක් නොවේ. අනුන් තවන වීර්යයෙහි නොඇලුනේ අනුන් තවන්නෙක් නොවේ. හෙතෙම තමා නොතවන්නේ අනුන් නොතවන්නේ මෙලොව බඩගින්නෙන් මිදුනේ නිවුනේ සිහිල් වූයේ සැප විඳින්නේ තමා බ්‍රහ්ම භූතව වාසය කරයි. මහණෙනි, මේ පුද්ගලයන් සතරදෙන ලොකයෙහි ඇත්තාහ. විද්‍යමානවේ."

**49. තණ්හා ජාල සූත්‍රය:-** 1. "මහණෙනි, තොපට යමකින් මේ ලොකය මත්තෙහි නසන ලදද, හාත්පසින් වෙලන ලද්දේද නූලක් මෙන් අවුල්වූයේද, පෙශකාරයන්ගේ නූල් සූත්‍රයක් මෙන් වූයේද මුදුතණ බබුස්තණ සමානවූයේ අයසංඛ්‍යාත සැප නැති නපුරු ගති ඇති විවසව පතිතවන සංසාරය නොයික්මවත්ද, ඒ දැල, හැසිරීම, පැතිරීම, ලැගීම දෙශනා කරන්නෙමි.

**2.** "එය අසව්. මනාකොට මෙනෙහි කරව් කියන්නෙමියි" වදාළසේක.

**3.** (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**4.** "මහණෙනි, මේ තෘෂ්ණා හැසිරවීම දහඅටක් වෙත්. මහණෙනි, මේ තෘෂ්ණා හැසිරවීම දහඅටක් බාහිරය අරමුණු කොට ඇතිවේද, මේ තෘෂ්ණා හැසිරීම් දහඅටක් තමා අරමුණු කොට ඇති වේද, මහණෙනි, තමාගේ ස්කන්ධ පඤ්චකය තෘෂ්ණා මාන දෘෂ්ටි වශයෙන් ගැනීම ඇතිකල්හි,

**5.** "මම වෙමියි' අදහසක් වෙයි. මේ ආකාරයෙන් 'මම වෙමියි' වේ. මෙසේ 'මම වෙමියි' වෙයි. අන් ප්‍රකාරයකින් මම වෙමියි වේ. අසවලා වෙමි. සත්පුරුෂයා වෙයි වේ. ඇත්තේ වේ. මේ ආකාරයෙන් ඇත්තේවේ. මෙසේ ඇත්තේ වේ. අන් ප්‍රකාරයකින් ඇත්තේවේ. මම ඇත්තේද වේ. මේ ප්‍රකාරයෙන් ඇත්තේ වේ මෙසේ ඇත්තේද වේ. අන් ප්‍රකාරයන් ඇත්තේද වේ වන්නේ වේ. මේ ප්‍රකාරයෙන් වන්නේ වේ. මෙසේ වන්නේ වේ. අන් පරිද්දෙකින් වන්නේ වේ. මේ අටළොස් තෘෂ්ණා හැසිරීම් තමා ඇසුරු කොට ඇතිවේ.

**6.** "කවර අටළොස් තෘෂ්ණා විචරිතයක් බාහිර පඤ්චස්කන්ධය අරමුණු කොට ඇති වේද? මේ රූපයෙන් වෙමියි ඇති කල්හි මේ රූපයෙන් මේ ප්‍රකාරයෙන් වෙමියි වෙයි. මේ රූපයෙන් මෙසේ වෙමියි වේ. මේ රූපයෙන් අන්ප්‍රකාරයකින් වෙමියි වෙයි. මේ රූපයෙන් අසවලාවන්නේයයි වේ. මේ රූපයෙන් සත්පුරුෂයා වෙයි වේ. මේ රූපයෙන් ඇත්තේ වේ. මේ රූපයෙන් මේ ප්‍රකාරයෙන් ඇත්තේ වේ. මේ රූපයෙන් මෙසේ ඇත්තේ වේ. මේ රූපයෙන් අන් පරිද්දෙකින් ඇත්තේ වේ. මේ රූපයෙන්ද මෙහි ඇත්තේ වේ. මේ රූපයෙන්ද මේ ප්‍රකාරයෙන් ඇත්තේ වේ. මේ ප්‍රකාරයෙන්ද මෙසේ ඇත්තේ වේ. මේ රූපයෙන්ද අන් පරිද්දෙකින් ඇත්තේ වේ. මේ රූපයෙන් වන්නේ වේ. මේ රූපයෙන් මේ ප්‍රකාරයෙන් වන්නේ වේ. මේ රූපයෙන් මෙසේ වන්නේ වේ. මේ රූපයෙන් අන් පරිද්දෙකින් වන්නේ වේ. මේ අටළොස් තෘෂ්ණා හැසිරවීම් කෙනෙක් අධ්‍යාත්මික ස්කන්ධ පඤ්චකය අරභයා ඇතිවේ. මෙසේ අටළොස් තෘෂ්ණා විචරිත කෙනෙක් බාහිර ස්කන්ධ පඤ්චකය අරමුණුකොට ඇතිවේ.

7. "මහණෙනි, මේ සතිස් තෘෂ්ණා හැසිරවීම් යයි කියනු ලැබෙත්. මෙසේ මෙබඳු අතීත තෘෂ්ණා විචරිත සතිසද අනාගත තෘෂ්ණා සතිසද වර්තමාන තෘෂ්ණා හැසිරවීම් සතිස් දෙකද තෘෂ්ණා හැසිරවීම් එක්සිය අටක් වේ. මහණෙනි, යමකින් මේ ලොකය මත්තෙහි නසන ලදද හාත්පසින් වෙලන ලද්දේද නූලක් මෙන් අවුල්වූයේද, පෙශකාරයන්ගේ නූල් සූත්‍රයක් මෙන් වූයේද, මුදුතණ බබුස්තණ හා සමාන වූයේ අයසංඛ්‍යාත සැප නැති නපුරු ගති ඇති විවසව පතිත වන සංසාරය නොයික්වෙත්ද, ඒ තෘෂ්ණා දැල, හැසිරීම, පැතිරීම, ලැගීම, නම් මේයයි" වදාළසේක.

**50. පෙමජායන සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ කරුණු සතරක් හටගනී. කවර සතරක්ද යත් ඇල්මෙන් ඇල්ම හටගනී. ඇල්මෙන් ද්වෙෂය හටගනී. ද්වෙෂයෙන් ඇල්ම හටගනී. ද්වෙෂයෙන් ද්වෙෂය හටගනී. මහණෙනි, කෙසේ වනාහි ප්‍රේමයෙන් ප්‍රේමය හටගනීද?

2. "මහණෙනි, මේ ලොකයෙහි පුද්ගලයෙක් පුද්ගලයෙකුට යහපත්ද, හොඳද, මන වඩන්නේද, අනුන් ඔහුට යහපත් හොඳ මන වඩන දෙයින් ව්‍යවහාර කරත්. ඔහුට මෙබඳු අදහසක් වේ. 'මට යම් මේ පුද්ගලයෙක් තෙමේ යහපත්ද, හොඳද, මන වඩන්නේද, අනුන් ඔහුට යහපත් හොඳ මන වඩන දෙයින් ව්‍යවහාර කරත්යයි' හෙතෙම ඔවුන් කෙරෙහි ඇල්ම උපදවයි. මහණෙනි, මෙසේ වනාහි ඇල්මෙන් ඇල්ම උපදී.

3. "මහණෙනි, කෙසේ වනාහි ඇල්මෙන් ද්වෙෂය උපදීද? මහණෙනි, මේ ලොකයෙහි පුද්ගලයෙක් තෙම පුද්ගලයෙකුට යහපත්ද හොඳද මන වඩන්නේද අනුන් ඔහුට අයහපත් අකාන්ත අමනාප දෙයින් ව්‍යවහාර කරත්. ඔහුට මෙසේ වේ. 'මට යම් මේ පුද්ගලයෙක්තෙම යහපත්ද, හොඳද මන වඩන්නේද, අනුන් ඔහුට අයහපත් අකාන්ත අමනාප දෙයින් ව්‍යවහාර කරත්යයි,' හෙතෙම ඔවුන් කෙරෙහි ද්වෙෂය උපදවා ගනියි.

4. "මහණෙනි, කෙසේ වනාහි, ද්වෙෂයෙන් ප්‍රේමය හටගනීද? මහණෙනි, මේ ලොකයෙහි පුද්ගලයෙක්තෙම පුද්ගලයෙකුට අයහපත්ද, අකාන්තද, අමනාපද, අනුන් ඔහුට

අයහපතින් අකාන්තයෙන් අමනාපයෙන් ව්‍යවහාර කරත්. ඔහුට මෙසේ සිතක් වෙයි 'මට යම් මේ පුද්ගලයෙක්තෙම අයහපත්ද අකාන්තද අමනාපද අනුන් ඔහුට අයහපතින් අකාන්තයෙන් අමනාපයෙන් හැසිරෙත් යයි.' හෙතෙම ඔවුන් කෙරෙහි ප්‍රේමය උපදවයි.

**5.** "මහණෙනි, කෙසේ වනාහි ද්වෙෂයෙන් ද්වේෂය උපදීද? මහණෙනි මේ ලොකයෙහි පුද්ගලයෙක් පුද්ගලයෙකුට අයහපත්ද අකාන්තද අමනාපද අනුන් යහපතින් කාන්තයෙන් මන වඩන්නෙන් ව්‍යවහාර කෙරෙත්ද ඔහුට 'මට යම් මේ පුද්ගලතෙම අයහපත්ද අකාන්තද අමනාපද අනුන් ඔහු යහපතින් හොඳින් මන වඩන්නෙන් ව්‍යවහාර කරත්යයි' මෙසේ සිතක් වෙයි. හෙතෙම ඔවුන් කෙරෙහි ද්වේෂය පහළ කරයි. මහණෙනි, මෙසේ වනාහි ද්වේෂයෙන් ද්වේෂය උපදී. මහණෙනි, මේ සතර පහළ වෙත්.

**6.** "මහණෙනි, යම් කාලයෙක්හි මහණතෙම කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි.

**7.** "ඔහුට යම් ඇල්මකින් යම් ඇල්මක් හට ගත්තේද, ඔහුට එවේලාවෙහි එය නැත. ප්‍රේමයෙන් යම් ද්වේෂයක් හටගත්තේද, ඔහුට ඒ වේලාවේ එය නැත. ද්වේෂයෙන් යම් ඇල්මක් ඉපදුනේ වන්නේද, ඒ අවස්ථාවෙහි ඔහුට එයද නැත. ද්වේෂයෙන් ද්වේෂයක් ඉපදුනේද එය ඔහුට ඒ වේලාවේ නැත.

**8.** "මහණෙනි, යම් කාලයෙක්හි මහණතෙම විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් තමා තුළ පැහැදීම් ඇති සිතේ එකඟකම ඇති විතර්ක විචාර නැති සමාධියෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති දෙවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයිද, (මෙහි මේ සූත්‍රයේ 7 ඡේදය යෙදිය යුතුයි.)

**9.** "මහණෙනි, යම් කාලයෙක්හි මහණතෙම, ප්‍රීතියගේ වෙන් වීමෙන් උපෙක්ෂා ඇතිව වාසය කරයි. සිහි ඇත්තේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ කයින් සැපක් විඳියි. උපෙක්ෂා

ඇති සිහි ඇති සැප විහරණයකැයි යමක් ආර්යයෝ කියත්ද, ඒ තුන්වෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයි (මෙහි මේ සූත්‍රයේ 7 ඡේදය යෙදිය යුතුයි.)

10. මහණෙනි, යම් කාලයෙක්හි මහණතෙම සැප පහවීමෙන්ද දුක පහවීමෙන්ද සොම්නස දොම්නස දෙක අස්තවීමට පෙර දුක් නැති සැප නැති උපෙක්ෂා ස්මෘති දෙදෙනාගේ පිරිසිදු බව ඇති සතරවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරද්ද, (මෙහි මේ සූත්‍රයේ 7 ඡේදය යෙදිය යුතුයි.)

11. "මහණෙනි, යම් කාලයෙක්හි මහණතෙම ආශ්‍රවයන්ගේ ක්ෂයවීමෙන් ආශ්‍රව නැති අර්හත් ඵල සමාධියද අර්හත් ඵල ප්‍රඥාවද මෙලොව තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරයිද, ඔහුට ඇල්මෙක් යම් ඇල්මක් වූයේද, එයද ඔහුට ප්‍රහීන වූයේ වේ.

12. "සිඳින ලද මුල් ඇත්තේද, මුල් හෝ කරටිය සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දේය. අභාවයට යවන ලද්දේය. මත්තෙහි නූපදින ස්වභාව ඇත්තේය.

13. "ඔහුට ඇල්මෙන් යම් ද්වේෂයක් උපදීද, එයද ඔහුට ප්‍රහීන වූයේ වේ. (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි)

14. "ඔහුට ද්වේෂයෙන් යම් ප්‍රේමයක් උපදීද, ඔහුට එයද ප්‍රහීන වූයේවේ. (මෙහි මේ සූත්‍රයේ 12 ඡේදය යෙදිය යුතුයි.)

15. ඔහුට ද්වේෂයෙන් යම් ද්වේෂයක් උපදීද, එය ඔහුට ප්‍රහීන වූයේය. (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි මේ මහණතෙම දෘෂ්ටි වශයෙන් නැඟී නොසිටි, විරුද්ධව නැඟී නොසිටි ඇතුලත තෘෂ්ණා දුම් නොහමයි. බාහිර වශයෙන් නොදැවෙයි. වෙමි යන මාන වශයෙන් නොහඟියි.

16. "මහණෙනි, කෙසේ මහණතෙම දෘෂ්ටි වශයෙන් නැඟී නොසිටීද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම රූපය ආත්ම වශයෙන් බලයි. ආත්මය රූපවත්යයි බලයි. ආත්මය කෙරෙහි රූපයයි බලයි. රූපයෙහි ආත්මයයි බලයි. වේදනාව ආත්මය වශයෙන් බලයි. ආත්මය වෙදනාවත්යයි බලයි. ආත්මය කෙරෙහි වෙදනාවයයි බලයි. වෙදනාවෙහි ආත්මයයි බලයි. සංඥාව

ආත්ම වශයෙන් බලයි. ආත්මය සංඥාවත්යයි බලයි. ආත්මය කෙරෙහි සංඥාවයයි බලයි. සංඥාවෙහි ආත්මයයි බලයි. සංස්කාරය ආත්ම වශයෙන් බලයි. ආත්මය සංස්කාරවත්යයි බලයි. ආත්මය කෙරෙහි සංස්කාරයයයි බලයි, සංස්කාරයන්හි ආත්මයයි බලයි, විඤ්ඤාණය ආත්ම වශයෙන් බලයි, ආත්මය කෙරෙහි විඤ්ඤාණය යයි බලයි, ආත්මයෙහි හෝ විඤ්ඤාණය යයි බලයි, විඤ්ඤාණයෙහි ආත්මයයිද බලයි. මහණෙනි, මෙසේ වනාහි මහණතෙම දෘෂ්ටි වශයෙන් නැඟී සිටී.

17. "මහණෙනි, කෙසේ මහණතෙම දෘෂ්ටි වශයෙන් නැඟී නොසිටීද? මහණෙනි මේ ශාසනයෙහි මහණතෙම රූපය ආත්ම වශයෙන් නොබලයි. ආත්මය රූපවත් යයිද ආත්මයෙහි රූපයයිද, රූපයෙහි ආත්මයයිද, නොබලයි. වෙදනාව ආත්ම වශයෙන් නොබලයි. ආත්මය වෙදනාවත් යයිද ආත්මයෙහි වෙදනාව යයිද, වෙදනාවෙහි හෝ ආත්ම යයිද, නොබලයි. සංඥාව ආත්ම වශයෙන් නොබලයි. ආත්මය සංඥාවත්යයිද, ආත්මයෙහි සංඥාවයයිද, සංඥාවෙහි හෝ ආත්මයයිද නොබලයි. සංස්කාරයන් ආත්ම වශයෙන් නොබලයි. ආත්මය සංස්කාරවත් යයිද, ආත්මයෙහි හෝ සංස්කාරයයිද, සංස්කාරයන්හි ආත්මයයිද, නොබලයි. විඤ්ඤාණය ආත්ම වශයෙන් නොබලයි. ආත්මය විඤ්ඤාණවත්යයිද, ආත්මයෙහි හෝ විඤ්ඤාණයයිද, විඤ්ඤාණයෙහි හෝ ආත්මයයිද, නොබලයි. මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම දෘෂ්ටි වශයෙන් නොනැඟිටී.

18. මහණෙනි, කෙසේ වනාහි මහණතෙම විරුද්ධව නැඟිටීද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ආක්‍රොශ කරන්නාට ආපසු ආක්‍රොශ කරයිද, ද්වේශ කරන්නහුට ආපසු ද්වේෂ කෙරේද, ඩබර කරන්නහුට ආපසු ඩබර කරයිද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම විරුද්ධව නැඟිටී.

19. "මහණෙනි, කෙසේ වනාහි මහණතෙම විරුද්ධව නොනැඟිටීද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ආක්‍රොශ කරන්නහුට ආපසු ආක්‍රොශ නොකෙරේද, ද්වේෂ කරන්නහුට නැවත ද්වේශ නොකෙරේද, ඩබර කරන්නහුට නැවත ඩබර

නොකෙරේද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම විරුද්ධව නොනැඟිටී.

**20.** "මහණෙනි, කෙසේ මහණතෙම දුවයිද? මමය යන මානය ඇතිකල්හි මේ ප්‍රකාරයෙන් වෙමියි වේ. මෙසේ වෙමියි වේ. අන් ප්‍රකාරයකින් වෙමියි වේ. අසවලා වේයයි වේ. සත්පුරුෂයා වේයයි වේ. ඇත්තේ වේ. මේ ප්‍රකාරයෙන් ඇත්තේ වේ. මෙසේ ඇත්තේ වේ. අන් ප්‍රකාරයකින් ඇත්තේ වේ. මම ඇත්තේද වෙමි. මේ ප්‍රකාරයෙන් ඇත්තේද වෙමි. මෙසේ ඇත්තේද වෙමි. අන් ප්‍රකාරයකින් ඇත්තේද වෙමි වන්නේ වේ. මේ ප්‍රකාරයෙන් වන්නේ වේ. මෙසේ වන්නේ වේ. අන් පරිද්දෙකින් වන්නේ වේ. මහණෙනි, මෙසේ මහණතෙම දුවයි.

**21.** "මහණෙනි, කෙසේ මහණතෙම නොදුවයිද? මහණෙනි, අස්මි මානය නැති කල්හි මේ ප්‍රකාරයෙන් වෙමියි නොවෙයි. අන් ප්‍රකාරයකින් වෙමියි නොවෙමි. අසවලා වෙමියි, නොවෙයි. සත්පුරුෂයා වෙමියි නොවෙයි. ඇත්තේ නොවේ. මේ ප්‍රකාරයෙන් ඇත්තේ නොවේ. මෙසේ ඇත්තේ නොවේ. අන් ප්‍රකාරයකින් ඇත්තේ නොවේ. මම ඇත්තේද නොවේ මේ ප්‍රකාරයෙන් ඇත්තේද නොවේ. මෙසේ ඇත්තේද නොවේ. අන් ප්‍රකාරයකින් ඇත්තේ නොවේ. වන්නේ නොවේ. මෙසේ වන්නේ නොවේ. අන් ප්‍රකාරයකින් වන්නේ නොවේ. මහණෙනි මෙසේ වනාහි මහණතෙම නොදුවයි.

**22.** "මහණෙනි, කෙසේ මහණතෙම ඇවිලෙයිද? මහණෙනි, මේ රූපයෙන් වෙමියි ඇතිකල්හි මේ රූපයෙන් මේ ආකාරයෙන් වෙමියි' සිතයි. මේ රූපයෙන් මෙසේ වෙමියි වෙයි. මේ රූපයෙන් අන්පරිද්දෙකින් වෙමියි වෙයි. මේ රූපයෙන් අසවලා වෙමියි වෙයි. මේ රූපයෙන් සත්පුරුෂයා වෙමියි වෙයි. මේ රූපයෙන් ඇත්තේ වේ. මේ රූපයෙන් මේ ප්‍රකාරයෙන් ඇත්තේ වේ. මේ රූපයෙන් මෙසේ ඇත්තේ වේ. මේ රූපයෙන් අන් ප්‍රකාරයෙන් ඇත්තේ වේ. මේ රූපයෙන් ඔබ ඇත්තේද වේ. මේ රූපයෙන් මේ ප්‍රකාරයෙන් ඇත්තේද වේ. මේ රූපයෙන් මෙසේ ඇත්තේද වේ. මේ රූපයෙන් අන්

ප්‍රකාරයෙන් ඇත්තේ වේ. මේ රූපයෙන් වන්නේද වේ. මේ රූපයෙන් මේ ප්‍රකාරයෙන් වන්නේ වේ. මේ රූපයෙන් මෙසේ වන්නේ වේ. මේ රූපයෙන් අන් පරිද්දෙකින් වන්නේ වේ. මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම ඇවිලෙයි.

23. "මහණෙනි, කෙසේ වනාහි මහණතෙම නොඇවිලෙයිද? මහණෙනි, මේ රූපයෙන් වෙමියි නැති කල්හි මේ රූපයෙන් මේ ප්‍රකාරයෙන් වෙමියි නොවෙයි. මේ රූපයෙන් මෙසේ වෙමියි නොවෙයි. මේ රූපයෙන් අන්ප්‍රකාරයකින් වෙමියි නොවෙයි. මේ රූපයෙන් අසවලා වෙමියි, නොවෙයි. මේ රූපයෙන් සත්පුරුෂයා වෙමියි නොවෙයි. මේ රූපයෙන් ඇත්තේ නොවේ. මේ රූපයෙන් මේ ප්‍රකාරයෙන් ඇත්තේ නොවේ. මේ රූපයෙන් මෙසේ ඇත්තේ නොවේ. මේ රූපයෙන් අන්ප්‍රකාරයකින් ඇත්තේ නොවේ. මම ඇත්තේද නොවේ. මේ රූපයෙන් මේ ප්‍රකාරයෙන් ඇත්තේ නොවේ. මේ රූපයෙන් මෙසේ ඇත්තේ නොවේ. මේ රූපයෙන් අන් ප්‍රකාරයකින් ඇත්තේ නොවේ. මේ රූපයෙන් මේ ප්‍රකාරයෙන් වන්නේ නොවේ. මේ රූපයෙන් මෙසේ වන්නේ නොවේ. මේ රූපයෙන් අන්පරිද්දෙකින් වන්නේ නොවේ. මහණෙනි, මෙසේ වනාහි මහණතෙම නොදැවෙයි.

24. "මහණෙනි, කෙසේ මහණතෙම මමය යන මාන වශයෙන් නොහඟියිද? මහණෙනි, මේ ශාසනයෙහි මහණහට අස්මිමානය ප්‍රහීන නුවූයේ වේද, (මෙහි මේ සූත්‍රයේ 20 ඡේදයේ මෙසේ වෙමියි වේ... අන් පරිද්දකින් වන්නේ වේ' යන කොටස යෙදිය යුතුයි.) මෙසේ වනාහි මහණතෙම හඟියි.

25. "මහණෙනි, කෙසේ මහණතෙම නොහඟියිද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ හට අස්මිමානය ප්‍රහීනවූයේ වේද, (මෙහි මේ සූත්‍රයේ 12 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙසේ වනාහි මහණතෙම නොහඟියි."

**(විසිවෙනි මහා වර්ගය නිමි.)**

---

**(සතරවෙනි පණ්ණාසකය නිමි.)**

## පස්වෙනි පණ්ණාසකය

# 21. සප්පුරිස වර්ගය.

1. **සික්ඛාපූරක සූත්‍රයඃ-** 1. "මහණෙනි, තොපට අසත්පුරුෂයාද, අසත්පුරුෂයන් ගෙන් අතිශයින් අසත් පුරුෂයාද, සත්පුරුෂයාද, සත්පුරුෂයන්ගෙන් අතිශයින් සත්පුරුෂයාද දෙශනා කරන්නෙමි. එය අසව් මනාකොට මෙනෙහි කරව් කියන්නෙමි" වදාළේය. "ස්වාමීනි, එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

2. "මහණෙනි, අසත්පුරුෂයා කවරේද?

3. (මේ ඡෙදය 2 පණ්ණාසකයේ 3 සූත්‍රයේ 4 ඡෙදයේ 'සතුන් මරන්නේවේද,... බොන්නේ වේද,' යන කොටස මෙනි. 538 පිට)

4. "මහණෙනි, මේ අසත්පුරුෂයායයි කියනු ලැබේ. "මහණෙනි, අසත්පුරුෂයාටත් වඩා අතිශයින් අසත්පුරුෂයා කවරේද?

5. (මේ ඡෙදය 2 පණ්ණාසකයේ 50 සූත්‍රයේ 5 ඡෙදයේ 'මහණෙනි, මේ ලොකයෙහි... රහමෙර පීමෙන් වෙන්වීමෙහි සමාදන් නොකරවයි' යන කොටස මෙනි. 586 පිට)

6. "මහණෙනි, මේ අසත්පුරුෂයාටත් වඩා අතිශයින් අසත්පුරුෂයාය.

"මහණෙනි, සත්පුරුෂයා කවරේද?

7. (මේ ඡෙදය 2 පණ්ණාසකයේ 3 සූත්‍රයේ 11 ඡෙදයේ "ප්‍රාණඝාත... බීමෙන් වැලකුණේද' යන කොටස මෙනි. 539 පිට)

8. "මහණෙනි, මේ සත්පුරුෂයායයි කියනු ලැබේ. "මහණෙනි, සත්පුරුෂයාටත් වඩා අතිශයින් සත්පුරුෂයා කවරේද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**9.** (මේ ඡේදය 2 පණ්ණාසකයේ 50 සූත්‍රයේ, 6 ඡේදයේ "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක්... පීමෙන් වෙන්වීමෙහි සමාදන් කරවයි" යන කොටස මෙනි පිට 586)

**10.** "මහණෙනි, මේ සත්පුරුෂයාටත් වඩා අතිශයින් සත්පුරුෂයායි."

**2. අස්සද්ධ සූත්‍රයඃ-** (මේ වර්ගයේ 1-6 සූත්‍රවල 1, 2 ඡේද මේ වර්ගයේ 1 සූත්‍රයේ 1, 2 ඡේදය මෙන් වෙත්.)

**3.** "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් අශ්‍රද්ධාද, ලජ්ජා නැත්තේද භය නැත්තේද, අල්පශ්‍රැතද, කුසීතද මුළා සිහි ඇත්තේද, දුෂ්ප්‍රාඥද,

**4.** "මහණෙනි, මේ අසත්පුරුෂයා යයි කියනු ලැබේ "මහණෙනි, අසත්පුරුෂයාටත් වඩා අතිශයින් අසත්පුරුෂයා කවරේද?

**5.** "මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් තමා අශ්‍රද්ධාද අනුන්ද අශ්‍රද්ධාවෙහි සමාදන් කරවයිද, තමා ලජ්ජා නැත්තේද අනුන්ද, නිර්ලජ්ජාවෙහි සමාදන් කරවයිද, තමා බිය නැද්ද අනුන්ද බිය නැතිබවෙහි සමාදන් කරවයිද, තමා අල්පශ්‍රැතද, අනුන්ද අල්පශ්‍රැත බැව්හි සමාදන් කරවයිද, තමා කුසීතද අනුන්ද කුසීත බැව්හි සමාදන් කරවයිද, තමා මුළා සිහි ඇත්තේද අනුන්ද මුළාබැව්හි සමාදන් කරවයිද, තමා දුෂ්ප්‍රාඥද අනුන්ද දුෂ්ප්‍රාඥ බැව්හි සමාදන් කරවයිද,

**6.** "මහණෙනි, මේ අසත්පුරුෂයාටත් වඩා අතිශයින් අසත්පුරුෂයායයි කියනු ලැබේ.

"මහණෙනි, සත්පුරුෂයා කවරේද?

**7.** "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් ශ්‍රද්ධාවත්ද, ලජ්ජාවේද බිය ඇත්තේවේද, බහුශ්‍රැතද පටන්ගන්නාලද වීර්ය ඇත්තේද, සිහි ඇත්තේ වේද නුවණැත්තේ වේද,

**8.** "මහණෙනි, මේ සත්පුරුෂයා යයි කියනු ලැබේ.

"මහණෙනි, සත්පුරුෂයාටත් වඩා අතිශයින් සත්පුරුෂයා කවරේද?

**9.** "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් තමා ශ්‍රද්ධාවත්ද අනුන්ද ශ්‍රද්ධා සම්පත්තියෙහි පිහිටුවයිද, තමා ලජ්ජා ඇත්තේවේද අනුන්ද ලජ්ජා ඇතිබවෙහි සමාදන් කරවයිද, තමා බිය ඇත්තේද අනුන්ද බිය ඇති බැව්හි සමාදන් කරවයිද, තමා බහුශ්‍රැතද අනුන්ද බහුශ්‍රැත බැව්හි සමාදන් කරවයිද, තමන්ද පටන්ගන්නාලද වීර්ය ඇත්තේවේද, අනුන්ද පටන්ගන්නාලද වීර්යයෙහි සමාදන් කරවයිද, තමා එළඹ සිටි සිහි ඇත්තේවේද, අනුන්ද එලඹ සිටි සිහියෙහි සමාදන් කරවයිද, තමා ප්‍රඥාසම්පන්නද, අනුන්ද ප්‍රඥාසම්පත්තියෙහි සමාදන් කරවයිද,

**10.** "මහණෙනි, මේ සත්පුරුෂයාටත් වඩා අතිශයින් සත්පුරුෂයා යයි කියනු ලැබේ."

**3. සත්තකම්ම සූත්‍රයඃ-** 3. (මෙහි 2 පණ්ණාසකයේ 3 සූත්‍රයේ 4 ඡෙදයේ සතුන්... බොරු කියන්නේවේද' යන කොටස යෙදිය යුතුයි. - පිට 538)

"පිසුනු කියන්නේවේද, පරුෂවචන කියන්නේ වේද, ප්‍රලාප දොඩන්නේවේද,

**4.** "මහණෙනි, මේ අසත්පුරුෂයායයි කියනු ලැබේ.

"මහණෙනි, අසත්පුරුෂයාටත් වඩා අතිශයින් අසත්පුරුෂයා කවරේද?

**5.** (මෙහි 2 පණ්ණාසකයේ 50 සූත්‍රයේ 3 ඡෙදයේ "මහණෙනි, මේ ලොකයෙහි... බොරු කීමෙන් වෙන්වී මෙහි සමාදන් නොකරවයි' යන කොටස යෙදිය යුතුයි.

"තමන්ද පිසුණු කියන්නේවේද, අනුන්ද පිසුණු කීමෙහි සමාදන් කරවයිද, තමන්ද එරුෂවචන කියන්නේවේද අනුන්ද එරුෂවචන කීමෙහි සමාදන් කරවයිද, තමන්ද ප්‍රලාප දොඩයිද, අනුන්ද ප්‍රලාප දෙඩීමෙහි සමාදන් කරවයිද?

**6.** "මහණෙනි, මේ අසත්පුරුෂයාටත් වඩා අතිශයින් අසත්පුරුෂයායයි කියනු ලැබේ.

"මහණෙනි, සත්පුරුෂයා කවරේද?

**7.** මෙහි 2 පණ්ණාසකයේ 3 සූත්‍රයේ 11 ඡේදයේ "ප්‍රාණඝාත.. බොරු කීමෙන් වැලකුණේද" යන කොටස මෙහි යෙදිය යුතුයි.)

"පිසුණු කීමෙන් වෙන්වූයේවේද, ඵරුෂ වචනයෙන් වෙන්වූයේ වේද, ප්‍රලාප දෙඩීමෙන් වෙන්වූයේ වේද,

**8.** "මහණෙනි, මේ සත්පුරුෂයා යයි කියනුලැබේ. "මහණෙනි, සත්පුරුෂයාටත් වඩා අතිශයින් සත්පුරුෂයා කවරේද?

**9.** (මෙහි 2 පණ්ණාසකයේ 50 සූත්‍රයේ 6 ඡේදයේ 'මේ ලොකයෙහි... බොරු කීමෙන් වෙන්වීමෙහි සමාදන් කරවයි" යන කොටස යෙදිය යුතුයි) තමාද පිසුණු කීමෙන් වෙන්වූයේ වේද, අනුන්ද පිසුණු කීමෙන් වෙන්වීමෙහි සමාදන් කරවයිද, තමන්ද ඵරුෂ වචනයෙන් වෙන්වූයේ වේ. අනුන්ද ඵරුෂ වචනයෙන් වෙන්වීමෙහි සමාදන් කරවයිද, තමාද ප්‍රලාප දෙඩීමෙන් වෙන්වූයේ වේද, අනුන්ද ප්‍රලාප දෙඩීමෙන් වෙන්වීමෙහි සමාදන් කරවයිද,

**9.** "මහණෙනි, මේ සත්පුරුෂයාටත් වඩා අතිශයින් සත්පුරුෂයායයි කියනු ලැබේ."

**4. දසකම්ම සූත්‍රයඃ-** 3. (මෙහි 2 පණ්ණාසකයේ 3 සූත්‍රයේ 'සතුන් මරන්නේ වේද... බොන්නේ වේද' යන කොටස යෙදිය යුතුයි) බහුලවූයේ වේද, විපන්න සිත් ඇත්තේ වේද, මිථ්‍යාදෘෂ්ටික වේද,

"මහණෙනි, මේ අසත්පුරුෂයායයි කියනු ලැබේ.

"මහණෙනි, අසත්පුරුෂයාටත් වඩා අතිශයින් අසත්පුරුෂයා කවරේද?

**5.** (මෙහි 2 පණ්ණාසකයේ 50 සූත්‍රයේ 5 ඡේදයේ මහණෙනි, මේ ලොකයෙහි... රහමෙර පීමෙන් වෙන්වීමෙහි සමාදන් නොකරවයි' යන කොටස යෙදිය යුතුයි. පිට 586) තමාද තෘෂ්ණා බහුලකොට ඇත්තේ වේද, අනුන් තෘෂ්ණා බහුල භාවයෙහි

සමාදන් කරවයිද තමාද විපන්න සිත් ඇත්තේ වේද අනුන් විපන්න සිත් සමාදන් කරවයිද, තමාද මිථ්‍යාදෘෂ්ටිකවේද, අනුන්ද මිථ්‍යාදෘෂ්ටියෙහි සමාදන් කරවයිද,

**6.** "මහණෙනි, මේ අසත්පුරුෂයාටත් වඩා අතිශයින් අසත්පුරුෂයායයි කියනු ලැබේ.

**7.** "මහණෙනි, සත්පුරුෂයා කවරේද? (මෙහි 2 පණ්ණාසකයේ 3 සූත්‍රයේ 11 ඡේදයේ 'ප්‍රාණඝාත... යන කොටස යෙදිය යුතුයි - 539 පිට) තෘෂ්ණා බහුලකොට නැත්තේවේද, විපන්න සිත් නැත්තේ වේද සම්‍යක් දෘෂ්ටිකද,

**8.** "මහණෙනි, මේ සත්පුරුෂයායයි කියනු ලැබේ.

"මහණෙනි, සත්පුරුෂයාටත් වඩා අතිශයින් සත්පුරුෂයා කවරේද?

**9.** "(මෙහි 2 පණ්ණාසකයේ 50 සූත්‍රයේ 6 ඡේදයේ 'මහණෙනි, මේ ලෝකයේ... පීමෙන් වෙන්වීමෙහි සමාදන් කරවයි යන තැන දක්වා යෙදිය යුතුයි.) තමාද තෘෂ්ණා බහුලකොට නැත්තේ වේද අනුන්ද තෘෂ්ණා බහුල භාවයෙහි සමාදන් නොකරයිද, තමාද විපන්න සිත් නැත්තේවේද අනුන්ද අව්‍යාපාදයෙහි සමාදන් කරවයිද, තමන් සම්‍යක් දෘෂ්ටිකද, අනුන් සම්‍යක් දෘෂ්ටියෙහි සමාදන් කරවයිද,

**10.** "මහණෙනි, මේ සත්පුරුෂයාටත් වඩා අතිශයින් සත්පුරුෂයායයි කියනු ලැබේ."

**5. අට්ඨංගික සූත්‍රය**:- 3 "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් මිථ්‍යාදෘෂ්ටික වේද, මිථ්‍යා කල්පනා ඇත්තේ වේද, මිථ්‍යා වචන ඇත්තේ වේද, මිථ්‍යා කර්මාන්ත ඇත්තේ වේද, මිථ්‍යා ආජීව ඇත්තේ වේද, මිථ්‍යා ව්‍යායාම ඇත්තේ වේද, මිථ්‍යා සිහි ඇත්තේ වේද මිථ්‍යාවෙන් සිත එකඟ කිරීම ඇත්තේ වේද,

**4.** "මහණෙනි, මේ අසත්පුරුෂයායයි කියනු ලැබේ. "මහණෙනි, අසත්පුරුෂයාටත් වඩා අතිශයින් අසත්පුරුෂයා කවරේද?

**5.** "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් තමාද මිථ්‍යාදෘෂ්ටික වේද, අනුන්ද මිථ්‍යාදෘෂ්ටියෙහි සමාදන් කරවයිද, තමන්ද මිථ්‍යා කල්පනා ඇත්තේ වේද අනුන්ද මිථ්‍යා කල්පනාවෙහි සමාදන් කරවයිද, තමාද මිථ්‍යා වචන ඇත්තේ වේද, අනුන් ද මිථ්‍යා වචනයෙහි සමාදන් කරවයිද, තමාද මිථ්‍යා කර්මාන්ත ඇත්තේ වේද, අනුන්ද මිථ්‍යාකර්මාන්තයෙහි සමාදන් කරවයිද, තමා මිථ්‍යා ජීවිකාව ඇත්තේ වේද අනුන්ද මිථ්‍යා ජීවිකාවෙහි සමාදන් කරවයිද, තමාද මිථ්‍යා ව්‍යායාම ඇත්තේ වේද, අනුන්ද මිථ්‍යා ව්‍යායාමයෙහි සමාදන් කරවයිද, තමන්ද මිථ්‍යා සිහි ඇත්තේ වේද, අනුන්ද මිථ්‍යා සිහියෙහි සමාදන් කරවයිද, තමාද මිථ්‍යාවෙන් සිත එකඟ කරන්නේ වේද අනුන්ද මිථ්‍යාවෙන් සිත එකඟ කරයිද,

**6.** "මහණෙනි, මේ අසත්පුරුෂයාටත් වඩා අතිශින් අසත්පුරුෂයායයි කියනු ලැබේ.

"මහණෙනි, සත්පුරුෂයා කවරේද?

**7.** "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් සම්‍යක් කල්පනා ඇත්තේද, සම්‍යක් වචන ඇත්තේද සම්‍යක් කටයුතු ඇත්තේද සම්‍යක් ජීවිකාව ඇත්තේ වේද, සම්‍යක් ව්‍යායාම ඇත්තේ වේද, සම්‍යක් ස්මෘති ඇත්තේ වේද සම්‍යක් සමාධි ඇත්තේ වේද,

**8.** "මහණෙනි, මේ සත්පුරුෂයායයි කියනු ලැබේ.

"මහණෙනි, සත්පුරුෂයාටත් වඩා අතිශයින් සත්පුරුෂයා කවරේද?

**9.** "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් තමන්ද යහපත් දැකීම් ඇත්තේ වේද අනුන්ද යහපත් දැකීමෙහි සමාදන් කරවයිද, තමන්ද යහපත් කල්පනා ඇත්තේ වේද, අනුන්ද යහපත් කල්පනාවෙහි සමාදන් කරවයිද, තමන්ද යහපත් වචන ඇත්තේ වේද අනුන්ද යහපත් වචනයෙහි සමාදන් කරවයිද, තමන්ද යහපත් වැඩ ඇත්තේ වේද, අනුන්ද යහපත් වැඩෙහි යොදවයිද තමාද යහපත් දිවිපැවැත්මෙන් යුක්තද අනුන්ද යහපත් දිවිපැවැත්මෙහි සමාදන් වෙයිද, තමන්ද යහපත් ව්‍යායාම

කරන්නේද අනුන්ද යහපත් ව්‍යායාමෙහි සමාදන් කරවයිද, තමන්ද යහපත් සිහි ඇත්තේ වේද, අනුන්ද යහපත් සිහියෙහි සමාදන් කරවයිද තමාද යහපත්ව සිත එකඟ කරයිද, අනුන්ද යහපත්ව සිත එකඟ කිරීමෙහි සමාදන් කරවයිද,

10. "මහණෙනි, මේ සත්පුරුෂයාටත් වඩා අතිශයින්ම සත්පුරුෂයායයි කියනු ලැබේ."

6. **දසංගික සූත්‍රය**:- 3 (මෙහි මේ වර්ගයේ 5 සූත්‍රයේ 3 ඡේදයේ මුලසිට මිථ්‍යා ව්‍යායාම ඇත්තේ වේද, යන කොටස් යෙදිය යුතුයි) වැරදි නුවණ ඇත්තේ වේද, වැරදි මිදීම ඇත්තේ වේද,

4. "මහණෙනි, මේ අසත්පුරුෂයායයි කියනු ලැබේ. "මහණෙනි, අසත්පුරුෂයාටත් වඩා අතිශයින් අසත්පුරුෂයා කවරේද?

5. (මෙහි මේ වර්ගයේ 5 සූත්‍රයේ 5 ඡේදයේ මුලසිට මිථ්‍යා ව්‍යායාමයෙහි සමාදන් කරවයිද' යන කොටස යෙදිය යුතුයි.) තමන් වැරදි ඥාණයෙන් යුක්තවූයේ වේද අනුන්ද වැරදි ඥාණයෙහි සමාදන් කරවයිද තමන් වැරදි මිදීමෙන් යුක්තවූයේ වේද අනුන්ද වැරදි මිදීමෙන් සමාදන් කරවයිද,

6. "මහණෙනි, මේ අසත්පුරුෂයාටත් වඩා අතිශයින් අසත්පුරුෂයායයි කියනු ලැබේ.

"මහණෙනි, සත්පුරුෂයා කවරේද?

7. (මෙහි මේ වර්ගයේ 5 සූත්‍රයේ 7 ඡේදයේ මුලසිට... සම්‍යක් ව්‍යායාම ඇත්තේ වේද' යන කොටස යෙදිය යුතුයි.) යහපත් නුවණ ඇත්තේ වේද, යහපත් මිදීම ඇත්තේ වේද,

8. "මහණෙනි, මේ සත්පුරුෂයායයි කියනු ලැබේ.

"මහණෙනි, සත්පුරුෂයාටත් වඩා අතිශයින් සත්පුරුෂයා කවරේද?

9. (මෙහි මේ වර්ගයේ 5 සූත්‍රයේ 9 ඡේදයේ මුලසිට අනුන්ද යහපත් ව්‍යායාමෙහි සමාදන් කරවයිද' යන කොටස යෙදිය යුතුයි.) තමන්ද යහපත් නුවණ ඇත්තේ වේද, අනුන්ද යහපත්

නුවණෙහි සමාදන් කරවයිද, තමන්ද යහපත් මිදීමෙන් යුක්තවූයේ වේද අනුන්ද යහපත් මිදීමෙහි සමාදන් කරවයිද,

**10.** "මහණෙනි, මේ සත්පුරුෂයාටත් වඩා අතිශයින් සත්පුරුෂයායි කියනු ලැබේ."

**7. පඨම පාපතර සූත්‍රයඃ-** 1 "මහණෙනි, තොපට පාපී පුද්ගලයාද, පාපී පුද්ගලයින්ගෙන් අතිශය පාපී පුද්ගලයාද, නිවැරදි පුද්ගලයාද නිවැරදි පුද්ගලයින්ගෙන් අතිශය නිවැරදි පුද්ගලයාද දෙසන්නෙමි.

**2.** "එය අසව්. මනාකොට මෙනෙහි කරව්, කියන්නෙමියි" වදාළේය. "ස්වාමීනි, එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

**3.** "මහණෙනි, පාපී පුද්ගලයා කවරේද?

**4.** (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි) මිථ්‍යා දෘෂ්ටික වේද, මහණෙනි, මේ පාපී පුද්ගලයායයි කියනු ලැබේ.

**5.** "මහණෙනි, පාපී පුද්ගලයාටත් වඩා අතිශයින් පාපීවූ පුද්ගලයා කවරේද?

**6.** (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි) තමන්ද මිථ්‍යා දෘෂ්ටික වේද අනුන්ද මිථ්‍යා දෘෂ්ටියෙහි සමාදන් කරවයිද,

**7.** "මහණෙනි, මේ පාපයාටත් වඩා අතිශයින් පාපයා යයි කියනු ලැබේ.

"මහණෙනි, නිවැරදි පුද්ගලයා කවරේද?

**8.** (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 7 ඡේදය යෙදිය යුතුයි.) සම්‍යක් දෘෂ්ටික වේද,

**9.** "මහණෙනි, මේ නිවැරදි පුද්ගලයායි කියනු ලැබේ.

"මහණෙනි, නිවැරදි පුද්ගලයන්ගෙන් අතිශය නිවැරදි පුද්ගලයා කවරේද?

**10.** (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 9 ඡේදය යෙදිය යුතුයි) තමාත් සම්‍යක් දෘෂ්ටිකවේද, අන්‍යයාත් සම්‍යක් දෘෂ්ටියෙහි සමාදන් කරවයිද,

**11.** "මහණෙනි, මේ නිවැරදි පුද්ගලයාගෙනුත් අතිශය නිවැරදි පුද්ගලයායයි කියනු ලැබේ."

**8. දුතිය පාපතර සූත්‍රයः-** 1, 2, 3 (මේ සූත්‍රයේ 1, 2, 3 ඡේද මේ වර්ගයේ 7 සූත්‍රයේ 1, 2, 3 ඡේද මෙන් වෙත්.)

**4.** (මේ ඡේදය මේ වර්ගයේ 6 සූත්‍රයේ 3 ඡේදය මෙනි)

**5.** "මහණෙනි, මේ පාපී පුද්ගලයායයි කියනු ලැබේ.

"මහණෙනි, පවිටු පුද්ගලයාටත් වඩා අතිශයින් පවිටු පුද්ගලයා කවරේද?

**6.** (මේ ඡේදය මේ වර්ගයේ 6 සූත්‍රයේ 5 ඡේදය මෙනි)

"මහණෙනි, මේ පාපී පුද්ගලයාටත් වඩා අතිශයින් පාපී පුද්ගලයායයි කියනු ලැබේ.

"මහණෙනි, නිවැරදි පුද්ගලයා කවරේද?

**7.** (මේ ඡේදය මේ වර්ගයේ 6 සූත්‍රයේ 7 ඡේදය මෙනි.)

**8.** "මහණෙනි, මේ නිවැරදි පුද්ගලයායයි කියනු ලැබේ.

"මහණෙනි, නිවැරදි පුද්ගලයාටත් වඩා අතිශයින් නිවැරදි පුද්ගලයා කවරේද?

**9.** (මේ ඡේදය මේ වර්ගයේ 6 සූත්‍රයේ 7 ඡේදය මෙනි.)

**10.** "මහණෙනි, මේ නිවැරදි පුද්ගලයාටත් වඩා අතිශයින් නිවැරදි පුද්ගලයායයි කියනු ලැබේ."

**9. පඨම පාපධම්ම සූත්‍රයः-** 1 "මහණෙනි, තොපට පාපී ස්වභාව ඇති පුද්ගලයාද, පාපී ස්වභාව ඇති පුද්ගලයාටත් වඩා අතිශය පාපී පුද්ගලයාද, නිවැරදි ස්වභාව ඇති පුද්ගලයාද, නිවැරදි ස්වභාව ඇති පුද්ගලයාටත් වඩා අතිශය නිවැරදි ස්වභාව ඇති පුද්ගලයාද දෙශනා කරන්නෙමි.

**2.** "(මේ ඡේදය මේ වර්ගයේ 7 සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

**3.** "මහණෙනි, පාප ස්වභාව ඇති පුද්ගලයා කවරේද?

**4.** (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි) මිථ්‍යා දෘෂ්ටි ඇත්තේ වේද,

**5.** "මහණෙනි, මේ පාප ස්වභාව ඇති පුද්ගලයායයි කියනු ලැබේ.

"මහණෙනි, පාප ස්වභාවයෙනුත් අතිශයින් පාප ස්වභාව ඇති පුද්ගලයා කවරේද?

**6.** (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි) තමාද මිථ්‍යා දෘෂ්ටිකවේද අනුන්ද මිථ්‍යාදෘෂ්ටියෙහි සමාදන් කරවයිද,

**7.** "මහණෙනි, මේ පාප ස්වභාව ඇති පුද්ගලයාගෙන් අතිශයින් පාප ස්වභාව ඇති පුද්ගලයායයි කියනු ලැබේ.

"මහණෙනි, යහපත් ස්වභාව ඇති පුද්ගලයා කවරේද?

**8.** (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 7 ඡේදය යෙදිය යුතුයි) සම්‍යක් දෘෂ්ටික වේද,

**9.** "මේ යහපත් ස්වභාව ඇති පුද්ගලයායයි කියනු ලැබේ.

"මහණෙනි, නිවැරදි පුද්ගලයාටත් වඩා අතිශයින් නිවැරදි ස්වභාවය ඇති පුද්ගලයා කවරේද?

**10.** (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 9 ඡේදය යෙදිය යුතුයි) තමාද සම්‍යක් දෘෂ්ටික වේද, අනුන්ද සම්‍යක් දෘෂ්ටියෙහි සමාදන් කරවයිද,

**11.** "මහණෙනි, මේ නිවැරදි පුද්ගලයාටත් වඩා අතිශයින් නිවැරදි පුද්ගලයායයි කියනු ලැබේ."

**10. දුතිය පාප ධම්ම සූත්‍රයඃ-** 1-2-3 (මේ සූත්‍රයේ 1, 2, 3 ඡේද මේ වර්ගයේ 9 සූත්‍රයේ 1, 2, 3 ඡේද මෙන් වෙත්.)

**4.** (මේ ඡේදය මේ වර්ගයේ 6 සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

5. "මහණෙනි, මේ පාප ස්වභාව ඇති පුද්ගලයාය, මහණෙනි, පාප ස්වභාවයටත් වඩා අතිශයින් පාප ස්වභාවයෙන් යුත් පුද්ගලයා කවරේද?

6. (මේ ඡේදය මේ වර්ගයේ 6 සූත්‍රයේ 5 ඡේදය මෙනි.) "මහණෙනි, මේ පාප ස්වභාව ඇත්තන්ගෙන් අතිශයින් පාප ස්වභාව ඇත්තේයයි කියනු ලැබේ

"මහණෙනි, යහපත් ස්වභාව ඇත්තේ කවරේද?

7. (මේ ඡේදය මේ වර්ගයේ 6 සූත්‍රයේ 7 ඡේදය මෙනි.)

8. මහණෙනි, මේ යහපත් ස්වභාව ඇත්තේයයි කියනු ලබේ.

"මහණෙනි, යහපත් ස්වභාව ඇත්තන්ගෙනුත් අතිශයින් යහපත් ස්වභාවය ඇත්තා කවරේද?

9. (මේ ඡේදය මේ වර්ගයේ 6 සූත්‍රයේ 9 ඡේදය මෙනි.)

10. "මහණෙනි, මේ යහපත් ස්වභාව ඇත්තාට වඩා අතිශයින් යහපත් ස්වභාව ඇත්තායයි කියනු ලැබේ."

(විසිඑක් වන සත්පුරුෂ වර්ගය නිමි)

---

## 22 පරියසොභන වර්ගය.

11. **පරිසදූසනා සූත්‍රයඃ-** 1 "මහණෙනි, පිරිස් දූෂ්‍යකරන්නෝ මේ සතරදෙනෙකි. කවර සතර දෙනෙක්ද යත්. මහණෙනි, දුශ්ශීලවූ ලාමක ස්වභාව ඇති භික්ෂුව පිරිස් දූෂ්‍ය කරන්නෙකි. මහණෙනි දුශ්ශීලවූ ලාමක ස්වභාව ඇති භික්ෂුණිය පිරිස් දූෂිකාවකි. මහණෙනි, දුශ්ශීලවූ පාපස්වභාව ඇති උපාසක තෙමේ පිරිස් දූෂකයෙකි. දුශ්ශීලවූ ලාමක ස්වභාව ඇති උපාසකයා පිරිස් දූෂකයෙකි. මහණෙනි මේ සතර දෙන පිරිස් දූෂකයෝයි.

2. "මහණෙනි, පිරිස් හොබවන්නෝ මේ සතරදෙනෙකි. කවර සතරදෙනෙක්ද යත්. මහණෙනි, සිල්වත් යහපත් ස්වභාව

ඇති භික්ෂුව පිරිස් හොබවන්නෙකි. මහණෙනි, සිල්වත් යහපත් ස්වභාව ඇති භික්ෂුණිය පිරිස් හොබවන්නියකි. මහණෙනි, සිල්වත් යහපත් ස්වභාව ඇති උපාසක තෙම පිරිස් හොබවන්නෙකි. මහණෙනි, සිල්වත් යහපත් ස්වභාව ඇති උපාසිකාව පිරිස් හොබවන්නියකි. මහණෙනි, මේ සතරදෙන පිරිස් හොබවන්නාහුය."

**12. සුචරිත දුච්චරිත සූත්‍රයː-** 1 "මහණෙනි, කරුණු සතරකින් යුක්තවූයේ ගෙන එන ලද්දක් බහා තබන ලද්දේ යම්සේද, එසේ නිරයෙහි වේ. කවර සතරකින්ද යත්.

2. "කාය දුශ්චරිතයෙන්ද, වාක් දුශ්චරිතයෙන්ද, මනො දුශ්චරිතයෙන්ද මිථ්‍යා දෘෂ්ටියෙන්ද යන සතරිනි.

3. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි)

4. "මහණෙනි, කරුණු සතරකින් යුක්ත වූයේ ගෙන එන ලද්දක් බහාතබන ලද්දේ යම්සේද එසේ ස්වර්ගයෙහි වේ.

5. "කවර සතරකින්ද යත්. කාය සුචරිතය, වාක් සුචරිතය, මනො සුචරිතය, සම්‍යක් දෘෂ්ටිය යන සතරිනි.

6. (මේ ඡේදය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි)

**13. අකතඤ්ඤුතා සූත්‍රයː-** මේ වර්ගයේ ඉතුරු සූත්‍රවල 1, 3 ඡේද මේ පණ්ණාසකයේ 12 සූත්‍රයේ 1, 3 ඡේද මෙන්ද, 4, 6 ඡේද එම සූත්‍රයේ 4, 6 ඡේද මෙන්ද වෙත්.)

2. "කවර සතරකින්ද යත්, කාය දුශ්චරිතය, වාක් දුශ්චරිතය, මනො දුශ්චරිතය, කෙළෙහි ගුණ නොදන්නා අකෘතඥතාවය යන සතරයි.

5. "කවර සතර දෙනෙක්ද යත්. කාය සුචරිතය, වාක් සුචරිතය, මනො සුචරිතය, කෙළෙහි ගුණ දන්නා සුළු කෘතඥතාවය යන සතරයි."

**14. පාණඝාතාදී සූත්‍රයː-** 2 "සතුන් මරන්නේ වේද, නුදුන්දේ ගන්නේ වේද, කාමයන්හි වරදවා හැසිරෙන්නේද, බොරු කියන්නේ වේද,

5. "සතුන් මැරීමෙන් වෙන්වූයේ වේද, නුදුන් දෙය ගැනීමෙන් වෙන්වූයේ වේද, කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූයේ වේද, බොරු කීමෙන් වෙන්වූයේ වේද,

15. **මිච්ඡාමග්ගංග සූත්‍රය**:- 2 "මිථ්‍යාදෘෂ්ටික වේද, මිථ්‍යා සංකප්ප (කල්පනා) ඇත්තේ වේද, මිථ්‍යාවචන ඇත්තේ වේද, මිථ්‍යා කර්මාන්ත ඇත්තේ වේද,

5. "සම්‍යක් දෘෂ්ටික වේද, සම්‍යක් සංකල්පනා ඇත්තේ වේද, සම්‍යක් වචන ඇත්තේ වේද, සම්‍යක් කර්මාන්ත ඇත්තේ වේද,

16. **සම්මාමග්ගංග සූත්‍රය**:- 2 "මිථ්‍යා ආජීව ඇත්තේ වේද, මිථ්‍යා ව්‍යායාම ඇත්තේ වේද, මිථ්‍යා ස්මෘති ඇත්තේ වේද, මිථ්‍යාවෙන් සිත් එකඟ කිරීම ඇත්තේ වේද,

5. "සම්‍යක් ජීවිකාව ඇත්තේ වේද, සම්‍යක් ව්‍යායාමය ඇත්තේ වේද, සම්‍යක් ස්මෘතිය ඇත්තේ වේද, නුවණින් සිත එකඟ කිරීම ඇත්තේ වේද,

17. **පඨම වොහාරපථ සූත්‍රය**:- 2 "නුදුටු දෙයෙහි දක්නා ලද්දේය යන වාද ඇත්තේය, නොඇසූ දෙයෙහි ඇසුයෙමියි යන වාද ඇත්තේය, ආඝ්‍රාණය නොකළ රස නොවින්ද පහස නොලත් දෙයෙහි ලදිමි යන වාද ඇත්තේ වේද, නොදන්නා ලද දෙයෙහි දත්තෙමියි යන වාද ඇත්තේය.

5. "නොදක්නා ලද්දෙහි නොදක්නා ලද්දේය යන වාද ඇත්තේවේ. නොඅසන ලද්දෙහි නොඇසීමි යන වාද ඇත්තේවේ, ආඝ්‍රාණය නොකළ, රස නොවින්ද පහස නොලද්දෙහි ලද්දේය යන වාද ඇත්තේය. දැනනොගන්නා ලද්දෙහි නොදනිමියි යන වාද ඇත්තේය"

18. **දුතිය වොහාරපථ සූත්‍රය**:- 2 "දක්නා ලද්දෙහි නොදක්නා ලද්දෙමි යන වාද ඇත්තේ වේ. අසන ලද්දෙහි නොඅසන ලද්දේය යන වාද ඇත්තේ වේ. ආඝ්‍රාණය කළ රසවින්ද පහස ලැබූවෙහි නැතැයි වාද ඇත්තේය. දුන් දෙයෙහි නොදත්තෙමියි වාද ඇත්තේ වේ.

"දුටුදෙයෙහි දැක්කෙහි වාද ඇත්තේ වේ. ඇසූ දෙයෙහි අසන ලද්දේයයි වාද ඇත්තේ වේ. ආඝ්‍රාණය කළ රස වින්ද පහස ලද දෙයෙහි ලද්දේයයි යන වාද ඇත්තේය දන්නා ලද්දෙහි දත්තේයයි වාද ඇත්තේ වේ."

19. **හිරොත්තප්ප සූත්‍රය:-** 2 "අශ්‍රද්ධාවත් වේද, දුශ්ශීල වේද, ලජ්ජා නැතිවේද, බිය නැත්තේ වේද,

5. "ශ්‍රද්ධාවත් වේද, සිල්වත් වේද, ලජ්ජා ඇත්තේ වේද, බිය ඇත්තේ වේද,

20. **දුප්පඤ්ඤා සූත්‍රය:-** 2 "අශ්‍රද්ධාවත් වේද, දුශ්ශීල වේද, කුසීත වේද, දුෂ්ප්‍රාඥවේද,

5. "කවර සතරකින්ද යත්. ශ්‍රද්ධාවත් වේද, සිල්වත් වේද, පටන්ගන්නා ලද වීර්ය ඇත්තේ වේද, ප්‍රඥාවත් වේද,"

**(විසිදෙවෙනි පරිස සොභණ වර්ගය නිමි.)**

---

## 23. දුච්චරිත වර්ගය.

21. **වචී දුච්චරිත සූත්‍රය:-** 1 "මහණෙනි, මේ දුශ්චරිත සතරක් වෙත් කවර සතරක්ද යත්. බොරුකීම, පිසුණුකීම, පරොස්බස් කීම, ප්‍රලාපදෙඩීම යන සතරයි. මහණෙනි, මේ සතර වාග් දුශ්චරිතයෝය.

2. "මහණෙනි, මේ වාග් සුචරිත සතරක් වෙත්. කවර සතරක්ද යත්. සත්‍ය වචනය, කේලාම් නොකීම සියුම් වචනය ප්‍රමාණවත් වචනය යන සතරයි. මහණෙනි, මේ සතර වාග් සුචරිතයෝයි.

22. **මිච්ඡාදිට්ඨික සූත්‍රය:-** 1 "මහණෙනි, කරුණු සතරකින් යුක්තවූ නූගත් අසත් පුරුෂ බාලයා ගුණ සාරා දමන ලද, නසන ලද තමා පරිහරණය කරයි. නුවණැත්තන්ට වරද සහිතද වේ. බොහෝ අකුසල්ද රැස් කරයි. කවර සතරකින්ද යත්.

2. (මේ ඡෙදය මේ පණ්ණාසකයේ 12 සූත්‍රයේ 2 ඡෙදය මෙනි.)

3. "මහණෙනි, මේ කරුණු සතරින් යුක්තවූ නූගත් අසත්පුරුෂ බාලයා සාරාදමන ලද නසනලද තමා පරිහරණය කරයි. නුවණැත්තන්ට වරද සහිතද වේ. බොහෝ අකුසල්ද රැස්කරයි. රැස්කෙරේයයි" වදාළසේක.

4. "මහණෙනි, කරුණු සතරකින් යුක්තවූ පණ්ඩිත ව්‍යක්ත සත්පුරුෂයා සාරා නොදමන ලද නොනසන ලද තමා පරිහරණය කරයි. නිවරද ද වේ. නුවණැත්තන්ට වරද නැත්තේ බොහෝ පින්ද රැස්කරයි.

5. (මේ ඡේදය මේ පණ්ණාසකයේ 12 සූත්‍රයේ 5 ඡේදය මෙනි.)

6. "මහණෙනි, මේ කරුණු සතරින් යුක්තවූ පණ්ඩිත ව්‍යක්ත සත්පුරුෂයා සාරානොදමන ලද නොනසන ලද ආත්මය පරිහරණය කරයි. නිවරද ද වේ. නුවණැත්තන්ට වරදක් නැත්තේ බොහෝ පින්ද රැස් කරයි.

**23. අකතවෙදිතා සූත්‍රයඃ-** (මේ වර්ගයේ සූත්‍රවල 1, 3, 4, 6 ඡේද මේ පණ්ණාසකයේ 22 සූත්‍රයේ 1, 3, 4, 6 ඡේද මෙන් වෙත්.)

**2-5** (මේ ඡේද මේ පණ්ණාසකයේ 13 සූත්‍රයේ 2, 5 ඡේද මෙන් වෙත්.)

මෙහි දක්වන සූත්‍රවල 2, 5 ඡේද මේ පණ්ණාසකයේ මෙහි පහත දක්වන සූත්‍රවල 2, 5 ඡේද මෙන් වෙත්.)

**24.** චතුවෙර සූත්‍රයේ 2, 5, 14 වෙනි සූත්‍රයේ 2, 5 මෙනි.

**25.** මිච්ඡාසම්මාමග්ග සූත්‍රයේ 2, 5, 15 වෙනි සූත්‍රයේ 2, 5 මෙනි.

**26.** අදිට්ඨෙ දිට්ඨවාදී 2, 5,, 16 වෙනි සූත්‍රයේ 2, 5 මෙනි.

**27.** දිට්ඨෙ අදිට්ඨවාදි 2, 5, 17 වෙනි සූත්‍රයේ 2, 5 මෙනි.

**28.** අනොත්තාපි 2, 5, 18 වෙනි සූත්‍රයේ 2, 5 මෙනි.

**29.** දුප්පඤ්ඤ 2, 5, 19 වෙනි සූත්‍රයේ 2, 5 මෙනි.

**30. චතුබ්බිධකවි සූත්‍රය:-** 1. "මහණෙනි, මේ කවීහු සතර දෙනෙක් වෙත්. කවර සතර දෙනෙක්දයත්, සිතා කාව්‍යකරණ චින්තා කවියාය, අසාකාව්‍යකරණ සුත කවියාය, එක් අර්ථයක් ඇසුරුකොට කවිකරණ අර්ථ කවියාය, වැටහීමෙන් කවිකරණ පටිභාන කවියාය යන මේ සතරදෙන කවියෝය."

**(විසිතුන් වෙනි දුච්චරිත වර්ගය නිමි.)**

---

# 24. කම්ම වර්ගය.

**31. සංඛිත්ත කම්ම සූත්‍රය:-** 1. "මහණෙනි, මේ කර්ම සතරක් මා විසින් තෙමේ විශිෂ්ට ඥාණයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට දන්වනු ලැබේ.

2. "කවර සතරක්දයත්, අකුශල්වූ අකුශල විපාක ඇති කර්මයක් ඇත්තේය. කුශල්වූ කුශල විපාක ඇති කර්මයක් ඇත්තේය. මහණෙනි, අකුශල්වූද, කුශල්වූද, අකුශල විපාක ඇත්තාවූද, කුශල විපාක ඇත්තාවූද කර්මයන් ඇත්තේය. මහණෙනි, අකුශල්නුවූ කුශල් නොවූ අකුශල විපාක නොවූ, කුශල විපාක නොවූ කර්මයක් කර්මක්ෂය පිණිස පවතී.

3. (මේ ඡෙදය මේ සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

**32. විත්ථත කම්ම සූත්‍රය:-** 1, 2, (මෙහි ඡෙද 1 සූත්‍රයේ 1, 2, ඡෙද මෙන් වෙත්.)

3. "මහණෙනි, අකුශල්වූ අකුසල විපාකය ඇති කර්මය කවරේද?

"මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් ද්වෙෂ සහිත කාය චෙතනා රැස්කරයි. ද්වෙෂ සහිත වාක් චෙතනා රැස්කරයි. ද්වෙෂ සහිත මනොචෙතනා රැස්කරයි. හෙතෙම ද්වෙෂ සහිත කාය චෙතනා රැස්කර, ද්වෙෂ සහිත වාග්චෙතනා රැස්කර ද්වෙෂ සහිත මනො චෙතනා රැස්කර දුක් සහිත ලෝකයක උපදී.

4. "දුක් සහිත ලොකයක උපන්නේම දුක් සහිත ස්පර්ශයෝ ස්පර්ශකරත්, හෙතෙම දුක් සහිත ස්පර්ශවලින් ස්පර්ශ කරණ ලද්දේ නරකයෙහි සත්වයන් යම්සේද එසේ ආබාධ සහිත විපාක වේදනාවක් විඳියි. මහණෙනි, මේ කර්මය අකුශල්ය, අකුශල විපාකය.

5. මහණෙනි, කුශල්වූ කුශල් විපාකවූ කර්මය කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් ද්වෙෂ රහිත කාය චෙතනා රැස්කරයි. ද්වෙෂ රහිත වාක්චෙතනා රැස් කරයි. ද්වෙෂ රහිත මනොචෙතනා රැස්කරයි. හෙතෙම ද්වෙෂ රහිත කායචෙතනා රැස්කර ද්වෙෂ රහිත වාක්චෙතනා රැස්කර ද්වෙෂරහිත මනොචෙතනා රැස්කර සුභකිණ්හක දෙවියන් යම්සේද එබඳු දුක් නැති ලොකයක උපදී.

6. "දුක් නැති ලොකයක උපන් ඔහු කරා දුක් නැති ස්පර්ශයෝ ස්පර්ශ කරත්. හෙතෙම නිදුක් ස්පර්ශයන්ගෙන් ස්පර්ශ කරණ ලද්දේම නිදුක් වෙදනාවක් විඳියි. මහණෙනි, මේ කුශල්වූ කුශල විපාකවූ කර්මයයි කියනු ලැබේ.

7. "මහණෙනි, අකුශල්වූද, කුශල්වූද, අකුශල විපාක වූද, කුශල විපාකවූද කර්මය කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් ද්වෙෂ සහිතවූද, ද්වෙෂ රහිතවූද, කාය චෙතනා රැස්කරයි. ද්වෙෂ සහිතවූද ද්වෙෂ රහිතවූද වාක්චෙතනා රැස්කරයි. ද්වෙෂ සහිතවූද ද්වෙෂ රහිතවූ මනොචෙතනා රැස්කරයි. හෙතෙම ද්වෙෂ සහිතවූද ද්වෙෂ රහිතවූද කායචෙතනා රැස්කර, ද්වෙෂ සහිතවූද ද්වෙෂ රහිතවූද වාක්චෙතනා රැස්කර, ද්වෙෂ සහිතවූද ද්වෙෂ රහිතවූද මනොචෙතනා රැස්කර, දුක් සහිතවූද, දුක් රහිත වූද, ලොකයෙහි උපදී. දුක්සහිතවූද, දුක් රහිතවූද ලොකයක උපන්නේම දුක් සහිතවූද, දුක් රහිතවූද, ස්පර්ශයෝ ස්පර්ශ කෙරෙත්. හෙතෙම දුක් සහිතවූද, දුක්රහිතවූද, ස්පර්ශයන් ගෙන් ස්පර්ශ වූයේම දුක් සහිතවූද, දුක් රහිතවූද, මිශ්‍රවූ සැප දුක් ඇති මනුෂ්‍යයන් මෙන්ද ඇතැම් කාමාවචර දෙවියන් මෙන්ද ඇතැම් වෛමානික ප්‍රෙතයන් මෙන්ද වෙදනාවක් විඳියි. මහණෙනි, මේ අකුශල් හා

කුශල්වූද අකුශල් හා කුශල් විපාක ඇත්තාවූද කර්මයයි කියනු ලැබේ.

8. "මහණෙනි, අකුශල් නොවූත් කුශල් නොවූත්, අකුශල විපාකත් නොවූ කුශල විපාකත් නොවූ කර්මක්ෂය පිණිස පවත්නා කර්මය කවරේද? මහණෙනි, එහි යම් මේ කර්මයක් අකුශල්ද අකුශල විපාක ඇත්තේද ඔහුගේ ප්‍රහාණය පිණිස යම් චෙතනාවක්වේද, යම් මේ කර්මයක් කුශල්ද කුශල විපාකද ඔහුගේ ප්‍රහාණය පිණිස යම් චෙතනාවක් වේද, යම් කර්මයක් අකුශල්ද අකුශල කුශල විපාකද ඔවුන්ගේ ප්‍රහාණය පිණිස යම් චෙතනාවක් ඇත්තේද, මහණෙනි, මේ කර්මය කුශල් නොවේ. අකුශල් නොවේ. පවුත් නොවන පිනුත් නොවන විපාක ඇත්තේවේ. කර්මක්ෂය පිණිස පවතී. මහණෙනි, මේ කර්මසතර මා විසින් මාම විශිෂ්ට ඥාණයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට දක්වන ලද්දාහ."

33. **සිඛාමොග්ගල්ලාන සූත්‍රයː-** 1. ඉක්බිති ශිඛා මොග්ගල්ලාන බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටු වියයුතුවූ සිහිකටයුතුවූ කථාවකොට නිමවා එකත්පසෙක සිටියේය.

2. එකත්පසෙක සිටි ශිඛාමොග්ගල්ලාන බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස, පෙර දිනවල එයටත් පෙර දිනවල සොණකායන මාණවකතෙම මා යම් තැනෙකද එහි පැමිණියේය. පැමිණ, මට ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සියලු කර්මයන්ගේ නොකිරීම පණවයි. සියලු කර්මයන්ගේ නොකිරීම කියමින් ලොකයාගේ විනාශය කීයේය. පින්වත්නි, මේ ලොකය කර්මය ස්වභාවකොට ඇත්තේය. කර්ම රැස් කරමින්ම සිටීයයි කීයේයයි' ප්‍රකාශ කෙළේය.

3. "බමුණ, මම සොණකායන මානවකයා දුටු බවක්වත් නොදනිමි. මෙබඳු කථා සල්ලාපයක් කොහිද? බමුණ, මා විසින් විශිෂ්ට ඥාණයෙන් දැන, ප්‍රත්‍යක්ෂකොට දක්වනලද්දාවූ කර්ම සතරක් වෙත්.

**4.** (මෙහි මේ වර්ගයේ 1 සූත්‍රයේ 1, 2 ඡේද යෙදිය යුතුයි - ('මහණෙනි' වෙනුවට 'බමුණ' වියයුතුයි.)

**5, 6, 7, 8, 9, 10.** (මේ ඡේද මේ වර්ගයේ 2 සූත්‍රයේ 3, 4, 5, 6, 7, 8 ඡේද මෙන් වෙත්. 'මහණෙනි' වෙනුවට 'බමුණ' විය යුතුයි.

**34. කම්මක්ඛය සංවත්ත සූත්‍රයඃ-** 1, 2 (මේ ඡේද මේ වර්ගයේ 1 සූත්‍රයේ 1, 2 ඡේද මෙන් වෙත්.)

**3.** "මහණෙනි, අකුශල්වූ අකුශල විපාකවූ කර්මය කවරේද? මහණෙනි මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් (මෙහි 2 පණ්ණාසකයේ 3 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මේ අකුශල්වූ අකුශල විපාක ඇති කර්මයයි කියනු ලැබේ.

**4.** "මහණෙනි, කුශල්වූ කුශල විපාකවූ කර්මය කවරේද? (මෙහි 2 පණ්ණාසකයේ 3 සූත්‍රයේ 11 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මේ කුශල්වූ කුශල විපාකවූ කර්මයයි කියනු ලැබේ.

**5.** (මේ ඡේදය මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 7 ඡේදය මෙනි.)

**6.** (මේ ඡේදය මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 8 ඡේදය මෙනි.) කර්ම සතර මා විසින් තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට දක්වන ලද්දාහ.'

**35. පඨම පවෙදිතකම්ම සූත්‍රයඃ-** 1, 2, (මේ ඡේද මේ වර්ගයේ 1 සූත්‍රයේ 1, 2, ඡේද මෙන් වෙත්.)

**3.** "මහණෙනි, අකුශල විපාකවූ කර්මය කවරේද?

**4.** "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙකු විසින් මවු ජීවිතයෙන් තොරකරණ ලද්දේද, පියා ජීවිතයෙන් තොරකරණ ලද්දේද, රහත් නමක් ජීවිතයෙන් තොරකරණ ලදද, දුෂ්ට සිතින් තථාගතයන් වහන්සේගේ කයින් ලේ උපදවන ලද්දේද, සංඝභෙද ද කරණලද්දේද, මහණෙනි, මේ කර්මය අකුශලය අකුශල විපාකය.

**5.** "මහණෙනි, කවර කර්මයක් කුශල්ද කුශල විපාකද මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් (මෙහි 2 පණ්ණාසකයේ 3 සූත්‍රයේ 11 ඡෙදය යෙදිය යුතුයි.) පිසුණු බස් කීමෙන්, ඵරුෂ බස කීමෙන්. ප්‍රලාප දෙඩීමෙන්, වෙන්වූයේ වේ. අභිජ්ක්ධා බහුලකොට නැත්තේ, ව්‍යාපාදයට පැමිණි සිත් නැත්තේ සම්‍යක් දෘෂ්ටිකවේද, මහණෙනි, මේ කර්මය කුශල්ය, කුශල් විපාකය කියනු ලැබේ.

**6.** (මේ ඡෙදය මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 7 ඡෙදය මෙනි.)

**7.** (මේ ඡෙදය මේ පණ්ණාසකයේ 32 සූත්‍රයේ 8 ඡෙදය මෙනි.)

**36. දුතිය පවෙදිත කම්ම සූත්‍රයः-** 1, 7 (මේ ඡෙද මේ වර්ගයේ 1, 7, ඡෙද මෙන් වෙත්.)

8. "මහණෙනි, අකුශල් නොවූත්, කුශල් නොවූත් අකුශල විපාකත් නොවූ, කුශල විපාකත් නොවූ, කර්ම ක්ෂය පිණිස පවත්නා කර්මය කවරේද? මහණෙනි, සම්‍යක් දෘෂ්ටිය සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මෙයයි මහණෙනි, මේ අකුශල්ද නොවූ, කුශල්ද නොවූ අකුශල විපාකද නොවූ කුශල විපාකද නොවූ කර්ම ක්ෂය පිණිස පවත්නා කර්මයයි."

**37. සාවජ්ජ කම්ම සූත්‍රයः-** 1, 7 (මේ ඡෙද මේ වර්ගයේ 32 සූත්‍රයේ 1, 7 ඡෙද මෙන් වෙත්.)

(මේ වර්ගයේ 2 සූත්‍රයේ 1 සිට 7 දක්වා ඡෙද යොදාගත යුතුයි.)

8. "මහණෙනි, අකුශල් නොවූත්, කුශල් නොවූත්, අකුශල විපාකත් නොවූ, කුශල විපාකත් නොවූ, කර්ම ක්ෂය පිණිස පවත්නා කර්මය කවරේද? මහණෙනි, ස්මෘති සම්බොජ්ඣංගය ධර්ම විචය, විරිය, පීති පස්සද්ධි, සමාධි, උපෙක්ෂා සම්බොජ්ඣංගය යන මෙයයි. මහණෙනි, මේ කර්මය අකුශල්ද නොවූ, කුශල්ද

නොවූ, අකුශල විපාකද නොවූ, කුශල විපාකද නොවූ කර්ම ක්ෂය පිණිස පවත්නා කර්මයයි.”

38. **සබ්‍යාපජ්ජංග කම්ම සූත්‍රයː-** 1. “මහණෙනි, ධර්ම සතරකින් යුක්තවූයේ ගෙන එන ලද්දක් බහා තැබූයේ යම්සේද එසේ නිරයෙහි වේ.

2. “කවර සතරකින්ද යත් වරද සහිත කාය කර්මයෙන්ද, වරද සහිත වාක් කර්මයන්ද, වරද සහිත මනො කර්මයෙන්ද, වරද සහිත දෘෂ්ටියෙන්ද,

3. (මෙය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

4. “මහණෙනි, ධර්ම සතරකින් යුක්තවූයේ ගෙන එන ලද්දක් බහා තැබූයේ යම්සේද එසේ ස්වර්ගයෙහි වේ.

5. කවර සතරකින්ද යත් නිවරද කාය කර්මයෙන්ද නිවරද වාක් කර්මයෙන්ද, නිවරද මනො කර්මයෙන්ද, නිවරද දෘෂ්ටියෙන්ද යන,

6. (මෙය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි.)

39. **ඉධෙව සමණ සූත්‍රයː-** 1, 2, 4, 6 (මේ ඡේද මේ පණ්ණාසකයේ 38 සූත්‍රයේ 1, 3, 4, 6 ඡේද මෙන් වෙත්.)

2. “කවර සතරකින්ද යත්. ද්වේෂ සහිත කාය කර්මයෙන්ද, ද්වෙෂ සහිත වාක් කර්මයෙන්ද, ද්වෙෂ සහිත මනො කර්මයෙන්ද, ද්වේෂ සහිත දෘෂ්ටියෙන්ද යන,

5. “කවර සතරකින්ද යත්. ද්වේෂ රහිත කාය කර්මයෙන්ද ද්වේෂ රහිත වාක් කර්මයෙන්ද, ද්වේෂ රහිත මනො කර්මයෙන්ද, ද්වේෂ රහිත දෘෂ්ටියෙන්ද යන,

40. **සප්පුරිසානිසංස සූත්‍රයː-** 1. “මහණෙනි ශ්‍රමණයාත් මේ ශාසනයෙහිය, දෙවෙනි ශ්‍රමණයාත් මේ ශාසනයෙහිය, තුන්වැනි ශ්‍රමණයාත් මේ ශාසනයෙහිය, සතරවෙනි ශ්‍රමණයාත් මේ ශාසනයෙහිය, අන් දෙසැට දෘෂ්ටීහු ශ්‍රමණයන්ගෙන් ශූන්‍යය. මහණෙනි, මෙසේ මේ සිංහ නාදය කරව්.

**2.** "මහණෙනි, ශ්‍රමණයා කවරේද? මහණෙනි මේ ශාසනයෙහි මහණතෙම ත්‍රිවිධ සංයොජනයන් ක්ෂය කිරීමෙන් අපායට වැටෙන ස්වභාව නැති, සුගති නියතවූ, අර්හත්වය පරායනවූ සොවාන්වූවෙක් වන්නේද, මහණෙනි, මේ ශ්‍රමණයාය.

**3.** "මහණෙනි, දෙවෙනි ශ්‍රමණයා කවරේද? මහණෙනි මේ ශාසනයෙහි මහණතෙම ත්‍රිවිධ සංයොජනයන්ගේ ක්ෂය කිරීමෙන් රාග ද්වේෂ මොහයන් තුනී කිරීමෙන් සකෘදාගාමී වේ. වරක් මෙලොවට විත් දුක් කෙළවර කරයි. මහණෙනි, මේ දෙවෙනි ශ්‍රමණයායි.

**4.** "මහණෙනි, තුන්වෙනි ශ්‍රමණයා කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කාම ධාතුව භජනය කරණ සංයොජන පස නැති කිරීමෙන් ඔපපාතික වේද, ඒ ලොකයෙන් නොඑන්නේ එහි පිරිනිවෙන්නේ වේ. මහණෙනි මේ තුන්වෙනි ශ්‍රමණයායි.

**5.** "මහණෙනි, සතරවෙනි ශ්‍රමණයා කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් කෙලෙස් නැති අර්හත් ඵල සමාධියද, අර්හත් ඵල ප්‍රඥාවද මෙලොවම තෙමේ විශිෂ්ට ඥාණයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරයිද, මහණෙනි, මේ සතරවෙනි ශ්‍රමණයාය.

**6.** (මෙය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි)

**7.** "මහණෙනි, සත්පුරුෂයා නිසා ආනිශංස සතරක් කැමති විය යුත්තාහ. කවර සතරක්ද යත්. ආර්ය සීලයෙන් වැඩෙයි, ආර්ය සමාධියෙන් වැඩෙයි, ආර්ය ප්‍රඥාවෙන් වැඩෙයි, ආර්ය විමුක්තියෙන් වැඩෙයි. මහණෙනි සත්පුරුෂයා නිසා මේ ආනිසංස සතර කැමතිවිය යුත්තාහයි වදාළසේක.

**(විසි හතරවෙනි කර්ම වර්ගය නිමි.)**

---

# 25. ආපත්ති භය වර්ගය

**41. කොසම්භක (සංඝ භෙද) සූත්‍රයඃ-** 1. "එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර ඝොෂිතාරාමයෙහි වාසය කරණසේක. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය.

2. "එකත්පසෙක සිටි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ, "ආනන්දය, කුමක්ද ඒ නඩුව සන්සිඳුනේ දැයි" ඇසීය.

"ස්වාමීනි, ඒ නඩුව කවර කාරණයකින් සන්සිඳෙන්නේද? ස්වාමීනි, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේගේ බාහිය නම් සද්ධි විහාරිකයෙක් සම්පූර්ණයෙන් සංඝ භෙදය පිණිස සිටියේ එහි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ 'එක වචනයකුදු කථාකළ යුතුකොට නොහඟියයි' කියේය.

3. "ආනන්දය, අනුරුද්ධ ස්ථවිරයන් කවදා සඟ මැද නඩුව ඉදිරිපත් කරයිද, ආනන්දය, යම්කිසි නඩුවක් උපදිත්ද, ඒ සියල්ල තොපද සැරියුත් මුගලන් දෙනමද, සන්සිඳ වියයුතු නොවේද? ආනන්දය, කාරණා සතරක් බලමින් පාප භික්ෂූහු සංඝ භෙදයෙන් යට සතුටු වෙති.

4. "කවර සතරක්ද යත්, ආනන්දය, මේ ශාසනයෙහි පාප භික්ෂූහු දුශ්ශීල වෙත්ද, ලාමක ස්වභාව ඇත්තෝද, අපිරිසිදු වූවෝද, සැකයෙන් සිහි කටයුතු හැසිරීම් ඇත්තෝද, වැඩුනු පව්කම් ඇත්තෝද, ශ්‍රමණ නොවූයේ ශ්‍රමණ යන සංඥා ඇත්තෝ බ්‍රහ්මචාරීනොවූයේ බ්‍රහ්මචාරීය යන ප්‍රතිඥා ඇත්තෝ ඇතුළත කුණුවූවෝ සදොරින් කෙලෙස් වැගිරෙන්නෝ, කසට හටගත්තෝ ඔවුන්ට ඉදින් භික්ෂූහු ශ්‍රමණ නොවූයේ ශ්‍රමණය යන සංඥා ඇත්තේ බ්‍රහ්මචාරී නොවූයේ බ්‍රහ්මචාරීය යන සංඥා ඇත්තේ ඇතුළත කුණුවූයේ සදොරින් කෙලෙස් වැගිරෙන්නේ කසට හටගත්තේ යයි මා දනිත් නම්, ඔහුට සමගි වූවෝම මා නසත්යයි වර්ගව මා නොනසන්නහුයයි' මෙබඳු සිතක් වෙයි. මහණෙනි,

මේ පළමුවෙනි කාරණය දකිමින් පවිටු භික්ෂූහු සංඝ භෙදයට කැමති වෙත්.

5. "ආනන්දය, නැවතද පවිටු භික්ෂූහු මිත්ථ්‍යාදෘෂ්ටික වෙත්ද, අන්තග්‍රාහක දෘෂ්ටියෙන් යුක්ත වෙත්ද, ඔහුට ඉදින් වනාහි 'භික්ෂූහු මිත්ථ්‍යාදෘෂ්ටිකය, අන්තග්‍රාහික දෘෂ්ටියෙන් යුක්තයයි 'මා භික්ෂූහු දනිත් නම් සමගිව මා නසන්නාහ, වර්ගව මා නොනසන්නහුයයි" මෙබඳු අදහසක් වෙයි. ආනන්දය, මේ දෙවෙනි කාරණය දකිමින් පවිටු භික්ෂූහු සංඝ භෙදයට කැමතිවේ.

6. "ආනන්දය, නැවතද පාප භික්ෂූහු වැරදි ජීවිකාවෙන් ජීවිකාව කරයිද, 'ඉදින් මා වැරදි ජීවිකාවෙන් ජීවිකාව කෙරේයයි ඉදින් භික්ෂූහු මා දනී නම් සමගිව මා නසන්නහුය, වර්ග මා නොනසන්නහුය යන ආනන්දය මේ තුන්වෙනි කාරණය දකිමින් පාප භික්ෂූහු සංඝ භෙදයට කැමතිවේ.

7. "ආනන්දය, නැවතද පාප භික්ෂූහු ලාභ කැමැත්තේ වේද සත්කාර කැමැත්තේ වේද අවඥා නොකැමැත්තේ ඔහුට ඉදින් භික්ෂූහු මා ලාභ කැමැත්තේය. සත්කාර කැමැත්තේය. අවඥා නොකැමැත්තේයයි මා දනිත් නම් සමගිව මම සත්කාර නොකරත්, ගරු නොකරත් මාන්නය නොකරත්, පූජා නොකරත්. වර්ගව මා සත්කාර කරත්. ගරුකාර කරත්. මාන්නය කරත් පූජා කරත්යයි,' ආනන්දය මේ සතරවෙනි කාරණය දකිමින්, පවිටු භික්ෂූහු සංඝ භෙදයෙන් සතුටු වෙත්."

**42. අප්පති භය සූත්‍රය**:- 1. "මහණෙනි, මේ බිය සතරක් වෙත්. කවර සතරක්ද යත්.

2. "මහණෙනි, යම්සේ 'දෙවයන් වහන්ස, මේ ඔබවහන්සේගේ සොරා යයි රජු මොහුට දඬුවම් නියම කරන්නැයි' මං පැහැරූ සොරෙකු ගෙන රජුට දක්වන්නාහු නම්, රජු ඔහුට 'පින්වත යව, මේ පුරුෂයා දළ රැහැණින් අත් පිටිපස තබා දැඩි බැම්මෙන් බැඳ කරයෙන් මුඩුකර කෲර ශබ්ද ඇති බෙරයෙන් වීථියෙන් වීථිය සන්ධියෙන් සන්ධිය පමුණුවා දකුණු දොරින් නික්මවා නුවරට දකුණින් හිස සිඳුවයි'

කියන්නේය. රජුගේ පුරුෂයෝ ඔහු දළ රැහැණින් දෙඅත් පිටිපස තබා දැඩි බැම්මෙන් බැඳ කරයෙන් මුඩුකර ක්‍රෑර ස්වර ඇති බෙරහඬින් වීථියෙන් වීථිය සන්ධියෙන් සන්ධිය පමුණුවා දකුණු දොරින් නික්මවා නුවරට දකුණින් හිස සිඳින්නාහු නම් එහි ගොඩ සිටි එක්තරා පුරුෂයෙකුට, පින්වත, මේ පුරුෂතෙම ඒකාන්තයෙන් ගැරහියයුතු හිස සිඳිය යුතු, පවු කමක් කෙළේය. යම් තැනෙක්හි රාජපුරුෂයෝ දැඩි රැහැණින් දෙඅත් පිටිපස තබා දැඩි බැම්මෙන් බැඳ කරයෙන් මුඩුකර ක්‍රෑර ස්වර ඇති බෙරහඬින් වීථියෙන් වීථිය සන්ධියෙන් සන්ධිය ප්‍රමුණුවා දකුණු දොරින් පිටත් කරවා නුවරට දකුණින් හිස සිඳිත්. ඒකාන්තයෙන් මම මෙබඳු ගැරහිය යුතු හිස සිඳින පාප කර්මයක් නොකරන්නේ නම් යහපතැයි' වන්නේය.

3. "මහණෙනි, එසේම යම්කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ පාරාජිකා ධර්මයන් කෙරෙහි තද නිර්භය සංඥාව එළඹසිටියා වේද, ඔහුට නොපැමිණි පාරාජිකා ධර්මයට නොපැමිණෙන්නේය. පැමිණි පාරාජිකා ධර්මයට ධර්මය පරිදි පිළියම් කරන්නේය යන මෙය කැමති විය යුතුය.

4. "මහණෙනි, යම්සේ පුරුෂයෙක්

5. "කළු වස්ත්‍රයක් හැඳ කෙස් විසුරුවා මොහොලක් කරෙහි කොට මහජනයා වෙත පැමිණ, ස්වාමීනි, මම හැරහිය යුතු මෝල් පාරක් දියයුතු පාපකර්මයක් කෙළෙමි යම් කාරණයකින් මට ආයුෂ්මත්හු සතුටක් කරනු කැමැත්තාහුද එය කරත්වායි' කියන්නේය.

6. "එහි ගොඩ සිටි එක්තරා පුරුෂයෙකුට යම් කර්මයෙක්හි (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.) හෙතෙම ඒකාන්තයෙන් මම මෙබඳු ගැරහිය යුතු මොහොල් පහරක් කෑයුතු කර්මයක් නොකරන්නෙමි.'

7. "මහණෙනි, එසේම යම්කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ සංඝාදිශෙෂ ධර්මයන්හි මෙසේ තියුණුවූ නිර්භය සංඥාව එළඹ සිටියාවේද, ඔහු නොපැමිණි සංඝාදිශෙෂ

ධර්මයට නොපැමිණෙන්නේය. පැමිණි සංඝාදිශෙෂ ධර්මයට ධර්මයවූ පරිදි පිළියම් කරන්නේයයි කියා කැමති වියයුතු.

8. "මහණෙනි, යම්සේ පුරුෂයෙක්

9. "කළු වස්ත්‍රයක් හැඳ කෙස් විසුරුවා උණුඅළු පොට්ටනියක් කරපිට තබා මහජනයා වෙත පැමිණ, "ස්වාමීනි, මම ගැරහියයුතු උණුඅළු තැබියයුතු පාපකර්මයක් කෙළෙමි. යම් කර්මයකින් මට ආයුෂ්මත්හු කැමතිවෙත්ද එය කරමියි' කියන්නේය.

10. "එහි ගොඩ සිටි එක්තරා පුරුෂයෙකුට යම් කර්මයෙක්හි (මෙහි මේ සූත්‍රයේ 9 ඡේදය යෙදිය යුතුයි.) හෙතෙම ඒකාන්තයෙන් මෙබඳු ගැරහිය යුතු උණුඅළු තැබියයුතු කර්මයක් නොකරන්නේය.

11. "මහණෙනි, එසේම යම් භික්ෂුවකට හෝ භික්ෂුණියකට හෝ පාචිත්තිය ධර්මයන්හි මෙසේ තියුණුවූ නිර්භය සංඥාව එළඹ සිටියාවේද ඔහුට නොපැමිණි පාචිත්තිය ධර්මයට නොපැමිණෙන්නෙමි. පැමිණි පාචිත්තිය ධර්මයට පිළියම් කරන්නේයයි කියා කැමති වියයුතුය.

12. "මහණෙනි, යම්සේ පුරුෂයෙක්

13. "කළු වස්ත්‍රයක් හැඳ කෙස් විසුරුවා මහජනයා මැදට විත් 'ස්වාමීනි, මම ගැරහිය යුතු දොස් කිවයුතු පාප කර්මයක් කෙළෙමි. යම් කර්මයකින් මට ආයුෂ්මත්හු කැමති වෙත්ද, එය කරමියි' කියන්නේය.

14. "එහි ගොඩ සිටි එක්තරා පුරුෂයෙකුට යම් කර්මයෙක්හි (මෙහි මේ සූත්‍රයේ 13 ඡේදය යෙදිය යුතුයි.) හෙතෙම ඒකාන්තයෙන් මෙබඳු ගැරහියයුතු දොස් කිවයුතු කර්මයක් නොකරන්නේය.

15. "මහණෙනි, එසේම යම්කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට සෙසු සියලු ආපත්තීන්හි මෙසේ තියුණු නිර්භය සංඥාව එළඹ සිටියේවේද, ඔහුට නොපැමිණි සෙසු ආපත්ති ධර්මයට නො පැමිණෙන්නෙමි. පැමිණි සෙසු ආපත්ති ධර්මයට

පිළියම් කරන්නේයයි කියා කැමති වියයුතුය. මහණෙනි, මේ සතර ආපත්ති භය ය.”

43. **සික්ඛානිසංස සූත්‍රයඃ-** 1. “මහණෙනි, ශික්ෂාව ආනිශංසකොට ඇති ප්‍රඥාව අධිකකොට ඇති, විමුක්තිය හරයකොට ඇති, සිහිය අධිපතිකොට ඇති මේ බ්‍රහ්මචර්යය වසයි. මහණෙනි, කෙසේ ශික්ඛානිසංසය වේද?

2. “මහණෙනි, මා විසින් මේ ශාසනයෙහි ශ්‍රාවකයන්ට නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස පැහැදුනවුන්ගේ වඩා පැහැදීම පිණිස වත් පිළිවෙත් වශයෙන් ශික්ෂාවක් පනවන ලද්දේද,

“මහණෙනි, මා විසින් යම්යම් පරිද්දෙකින් නොපැහැදුන වුන්ගේ පැහැදීම පිණිස පැහැදුනවුන්ගේ වැඩි පැහැදීම පිණිස ශ්‍රාවක ආභිසමාචාරික ශික්ෂාවක් පනවන ලද්දේද,

3. “එසේ හෙතෙම ඒ ශික්ෂාව කඩනොකරන්නේ වේ. නො සිදුරු කරන්නේවේ. පුල්ලි නොගසන්නේය. කිලුටු නොකරන්නේය. ශික්ෂා පදයන් ගෙන හික්මෙයි.

4. “මහණෙනි, නැවතද, මා විසින් ශ්‍රාවකයන්ට සර්වප්‍රකාරයෙන් මනාව දුක් කෙළවර කිරීමට මාර්ගබ්‍රහ්චරියට ආදිවූ සිවුපිරිසිදු ශීලයක් පනවන ලද්දේද,

5. “මහණෙනි, යම් යම් ප්‍රකාරයකින් ශ්‍රාවකයන්ට මනාව දුක් කෙළවර කිරීමට ශික්ෂාවක් දෙශනා කළේද, (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙසේ ශික්ෂානිසංසයවේ.

6. “මහණෙනි, කෙසේ වනාහි පඤ්ඤුත්තරවේද, මහණෙනි, මා විසින් මේ ශාසනයෙහි ශ්‍රාවකයන්ට සර්වප්‍රකාරයෙන් මනාකොට දුක් කෙළවර කිරීමට ධර්ම දේශනා කරණ ලද්දේද

7. “මහණෙනි, මා විසින් යම් යම් පරිද්දෙකින් සර්වප්‍රකාරයෙන් මනාකොට දුක් කෙළවර කිරීමට ශ්‍රාවකයන්ට ධර්ම දෙශනා කරන ලද්දේද, ඒ ඒ ප්‍රකාරයෙන් ඒ ධර්මයෝ

ප්‍රඥාවෙන් මනාකොට දක්නාලද්දේ වේ. මහණෙනි, මෙසේ වනාහි පඤ්ඤුත්තරවේ. කෙසේ වනාහි අර්හත් ඥාණවිමුක්තිය සාරයකොට ඇත්තේද,

8. (මේ ඡේදය මේ සූත්‍රයේ 6 ඡේදය මෙනි.)

**9.** "ඒ ඒ පරිද්දෙන් ඔහු විසින් ඒ ධර්මයෝ අර්හත් ඥාණ විමුක්තියෙන් ස්පර්ශකරණ ලද්දාහු වෙත්. මහණෙනි, මෙසේ වනාහි විමුක්තිය සාරයකොට ඇත්තාහ.

**10.** "මහණෙනි, කෙසේ වනාහි සිහිය අධිපතිකොට ඇත්තේවේද? 'මෙසේ සම්පූර්ණ නොවූ හෝ වත් පිළිවෙත් ශික්ෂාව සම්පූර්ණ කරන්නෙමි. පිරිපුන් වත්පිළිවෙත් ශික්ෂාව ඒ ඒ තන්හි ප්‍රඥාවෙන් අනුග්‍රහ කරන්නෙමියි අධ්‍යාත්මයෙහි සිහිය එළඹ සිටියේ වේ.

"මෙසේ සම්පූර්ණ නොවූ සිවු පිරිසිදු සිල් සම්පූර්ණ කරන්නෙමි. සම්පූර්ණවූ හෝ සිවු පිරිසිදු ශීලය ඒ ඒ තන්හි ප්‍රඥාවෙන් අනුග්‍රහ කරන්නෙමියි අධ්‍යාත්මයෙහි සිහිය එළඹ සිටියේ වේ.

"මෙසේ නොදක්නාලද ධර්මය ප්‍රඥාවෙන් බලන්නෙමි. දුටු ධර්මය ඒ ඒ තන්හි ප්‍රඥාවෙන් අනුග්‍රහ කරන්නෙමියි අධ්‍යාත්මයෙහි සිහිය එළඹ සිටියේ වේ.

"මෙසේ ස්පර්ශ නොකරණලද ධර්මය අර්හත්ඵල විමුක්තියෙන් බලන්නෙමි. දක්නාලද ධර්මය ඒ ඒ තන්හි නුවණින් අනුග්‍රහ කරන්නෙමියි අධ්‍යාත්මයෙහිම සිහිය එළඹ සිටියේ වෙයි.

11. "මහණෙනි, මෙසේ වනාහි සිහිය අධිපති වූයේ වේ. මහණෙනි, ප්‍රඥාව ශ්‍රෙෂ්ඨකොට ඇති විමුක්තිය සාරයකොට ඇති, සිහිය අධිපතිකොට ඇති මේ බ්‍රහ්මචර්යය ශික්ෂාව අනුසස්කොට ඇත්තේයයි යමක් වදාරණ ලද්දේ නම් එය මේ සඳහා වදාරණලදී."

44. **සෙය්‍යාවතුක්ක සූත්‍රයඃ-** 1. මහණෙනි, මේ සෙය්‍යා සතරක් වෙත් කවර සතරක්දයත්, ප්‍රෙතසෙය්‍යාව කාමභොගී සෙය්‍යාව සිංහසෙය්‍යාව තථාගත සෙය්‍යාව යන සතරයි.

2. "මහණෙනි, ප්‍රෙත සෙය්‍යාව කවරේද මහණෙනි, බොහෝ සෙයින් ප්‍රෙතයෝ උඩුකුරුව සයනය කරත්. මේ ප්‍රෙත සෙය්‍යාවයි.

3. "මහණෙනි, කාමභොගී සෙය්‍යාව කවරේද, මහණෙනි, බොහෝ සෙයින් කාමභොගීවූ වාම පාර්ශවයෙන් සයනය කරත්. මේ කාමභොගී සෙය්‍යාවයයි කියනු ලැබේ."

4. "මහණෙනි, සිංහ සෙය්‍යාව කවරේද? මහණෙනි, මෘග රාජවූ සිංහතෙම පයෙහි පය මදක් ඇද දෙකෙලවර අතුරෙහි නගුට ප්‍රවෙශ කරවා දකුණු පසින් සයනය කරයි. හෙතෙම පිබිදී උඩකය ඉදිරියට නමා පසුකය බලයි. ඉදින් මහණෙනි, මෘගරාජවූ සිංහතෙම නොසතුටුවූයේ වේ. මහණෙනි, ඉදින් සිංහවූ මෘගරාජතෙම ශරීරයේ අවුල්වූ හෝ විසුරුණාවූ හෝ කිසිවක් දකීද මහණෙනි, ඒ කාරණයෙන් මෘගරාජවූ සිංහයා නොසතුටු වූයේ වේ. මහණෙනි, මේ සිංහ සෙය්‍යාවයයි කියනු ලැබේ.

5. "මහණෙනි, තථාගත සෙය්‍යාව කවරේද? මහණෙනි, මේ ලොකයෙහි තථාගතතෙම කාමයන්ගෙන් වෙන්ව (මෙහි තික නිපාතයෙහි බ්‍රාහ්මණ වර්ගයෙහි 9 සූත්‍රයේ 4 ඡෙදය යෙදිය යුතුයි. අ.1ඃ පිට 305) සතරවෙනි ධ්‍යානයට පැමිණ වාසයකරයිද, මහණෙනි මේ තථාගත සෙය්‍යාවයි. මහණෙනි, මේ සතර සෙය්‍යාවෝය."

45. **ථූපාරහ සූත්‍රයඃ-** 1. "මහණෙනි ථූප කරවීමට සුදුසු පුද්ගලයෝ සතරදෙනෙක් වෙත්. කවර සතරදෙනෙක්ද යත්ඃ තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ථූපයට යොග්‍යයි. පසේබුදුන් ථූපයට යොග්‍යයි. තථාගත ශ්‍රාවකයෙකු ථූපයට යොග්‍යයයි සක්විති රජතෙම ථූපයට යොග්‍යයි."

46. **පඤ්ඤාවුද්ධිධම්ම සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ ධර්ම සතරක් ප්‍රඥාවෘද්ධිය පිණිස පවතී. 2. "කවර සතරක්ද යත්, සත්පුරුෂ ආශ්‍රය, සද්ධර්මශ්‍රවණය, නුවණින් මෙනෙහි කිරීම, ධර්මානුධර්ම ප්‍රතිපත්තිය.

3. යනමේ සතර ධර්මයෝ ප්‍රඥාවගේ අභිවෘද්ධිය පිණිස පවතී.”

**47. බහුපකාරධම්ම සූත්‍රය**:- 1. “මහණෙනි, මේ ධර්ම සතරක් මනුෂ්‍යවූවහුට බොහෝ උපකාර වෙත්. (මෙහි මේ පණ්ණාසකයේ 46 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) යන මේ සතර ධර්මයෝ මනුෂ්‍යවූවහුට බොහෝ උපකාර වෙත්.”

**48. අනරියවොහාර සූත්‍රය**:- “මහණෙනි, මේ අනාර්ය ව්‍යවහාර සතරක් වෙත්.

“කවර සතරක්දයත්, නොදක්නාලද්දෙහි දැක්කෙමියි කීම නොඅසනලද්ද ඇසීමියි කීම. ඝාණ, ජිව්හා, කාය යන මෙයින් නොගන්නා ලද්ද ගත්තෙමියි කීම. නොදන්නා ලද්ද දැක්කෙමියි කීම යන මේ සතර අනාර්ය ව්‍යවහාරයි.”

**49. දුතිය අරියවොහාර සූත්‍රය**:- 1. “මහණෙනි, මේ ආර්ය ව්‍යවහාර සතරක් වෙත්. කවර සතරක්දයත්, නොදක්නා ලද්ද නොදක්නා ලද්දෙමියි කීම, නොඅසනලද්ද නොඅසන ලද්දෙමියි කීම, ඝාණ, ජිව්හා, කාය යන මෙයින් නොගන්නා ලද්ද නොගත්තෙමියි කීම, දත් දෙය දනිමියි කීම යන සතර ආර්ය ව්‍යවහාරයෝය.”

**50. අරියවොහාර සූත්‍රය**:- 2. “මහණෙනි, මේ අනාර්ය ව්‍යවහාර සතරක් වෙත්. කවර සතරක්දයත් දැක්ක දෙය නොදැක්කෙමියි කීම. ඇසූදෙය නොඇසූයෙමියි කීම. ඝාණ, ජිව්හා, කාය තුනින් ගන්නාලද්ද නොගන්නා ලද්දෙමියි කීම දත් දෙය නොදත්තෙමියි කීම යන මේ සතර අනාර්ය ව්‍යවහාරයෝයි.”

**51. දුතිය අරියවොහාර සූත්‍රය**:- 1. “මහණෙනි, මේ ආර්ය ව්‍යවහාර සතරක් වෙත්. කවර සතරක්දයත්, දැක්ක දෙය දැක්කෙමියි කීම, ඝාණ, ජිව්හා, කාය තුනින් ගන්නා ලද්ද ගත්තෙමියි කීම. දත් දෙය දත්තෙමියි කීම යන සතර ආර්ය ව්‍යවහාර යෝයි.”

**(25 වෙනි ආපත්ති වර්ගය නිමි)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 26. අභිඤ්ඤා වර්ගය.

1. **අභිඤ්ඤාපරිඤ්ඤෙය්‍ය සූත්‍රය**:- 1. ‘මහණෙනි, මේ ධර්ම සතරක් වෙත්. කවර සතරක්ද යත්. මහණෙනි, විශිෂ්ට ඥාණයෙන් පිරිසිඳ දතයුතු ධර්මයෝ ඇත්තාහ. මහණෙනි, විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රහීන කටයුතු ධර්මයෝ ඇත. මහණෙනි විශිෂ්ට ඥානයෙන් දැන වැඩියයුතු ධර්මයෝ ඇත්තාහ. මහණෙනි, විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කටයුතු ධර්මයෝ ඇත්තාහ.

2. “මහණෙනි, විශිෂ්ට ඥානයෙන් දැන, පිරිසිඳ දතයුතු ධර්මයෝ කවරේද? පඤ්චඋපාදානස්කන්ධයෝය. මහණෙනි, මේ ධර්මයෝ විශිෂ්ට ඥානයෙන් දැන පිරිසිඳ දතයුතුයයි කියත්.

3. “මහණෙනි, විශිෂ්ට ඥානයෙන් දැන කටයුතු ධර්ම කවරේද? අවිද්‍යාවද, භව තෘෂ්ණාවද යන දෙකයි. මහණෙනි, මේ ධර්මයෝ විශිෂ්ට ඥානයෙන් ප්‍රහීන කටයුතුය.

4. “මහණෙනි, කවර ධර්මයක් විශිෂ්ට ඥානයෙන් වැඩිය යුතුද? සමථයද විදර්ශනාවද යන දෙකයි. මහණෙනි මේ ධර්මයෝ විශිෂ්ට ඥානයෙන් වැඩිය යුත්තාහ.

5. “මහණෙනි, කවර ධර්මයක් විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කටයුතුද? විද්‍යාවද විමුක්තියද යන මේ ධර්මයෝ විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කටයුතුයයි කියනු ලැබේ. මහණෙනි, මේ සතර ධර්මයෝයි.”

2. **අරියපරියෙසන සූත්‍රය**:- 1. “මහණෙනි, මේ අනාර්ය සෙවීම් සතරක් වෙත්. කවර සතරක්ද යත්. මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් තමා ජරා ස්වභාවකොට ඇත්තේ ජරා ස්වභාවයම සොයයි. තමා ව්‍යාධි ස්වභාවයෙන් යුක්තවූයේම ව්‍යාධි ස්වභාවයම සොයයි. තමා මරණය ස්වභාව කොට මරණ ස්වභාවය සොයයි. තමන් කිලුටුවූයේම කිලුටුම සොයයි. මහණෙනි, මේ සතර අනාර්යපර්යෙසනයෝයි.

2. “මහණෙනි, මේ ආර්ය පර්යෙසනයෝ සතරක් වෙත්. කවර සතරක්ද යත්. මහණෙනි, මේ ලොකයෙහි ඇතැම්

කෙනෙක් තමා ජරා ස්වභාව ඇත්තේම ජරා ස්වභාවයෙහි ආදීනව දැන ජරා නැති නිරුත්තර යොගක්ෂෙමවූ නිවණ සොයයි. තමා ව්‍යාධි ස්වභාව ඇත්තේම ව්‍යාධි ස්වභාවයෙහි ආදීනව දැන ව්‍යාධි නැති නිරුත්තර යොගක්ෂෙමවූ නිවන සොයයි. තමන් මරණ ස්වභාව ඇත්තේම මරණ ස්වභාවයෙහි ආදීනව දැන අමෘතවූ නිරුත්තරවූ යොගක්ෂෙපවූ නිර්වාණය සොයයි. තමා කිලුටුවූයේම කිළුටු ධර්මයෙහි ආදීනව දැන කිලිටි නොවූ නිරුත්තර යොගක්ෂෙමය කැමතිවෙයි. මහණෙනි, මේ සතර ආර්ය පර්යෙසනයෝයි.

3. **සංගහවත්ථු සූත්‍රය**:- "මහණෙනි, මේ සංග්‍රහ වස්තු සතරක් වෙත්. කවර සතරක්ද යත්. දීම, ප්‍රියවචන, වැඩෙහි යෙදීම සමානාත්මතාව යන සතරයි. මහණෙනි, මේ සතර සංග්‍රහ වස්තූහුය."

4. **මාලුංක්‍ය පුත්ත සූත්‍රය**:- 1. "ඉක්බිති ආයුෂ්මත් මාලුංක්‍ය පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේය. එකත්පසෙක සිටි ආයුෂ්මත් මාලුංක්‍ය පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට "මම භාග්‍යවතුන් වහන්සේගේ යම් ධර්මයක් අසා හුදකලා වූයේ වෙන්වූයේ අප්‍රමාද වූයේ කෙලෙස් තවන වීර්ය ඇත්තේ නිවණ කරා යැවූ ආත්ම ඇත්තේ වාසය කරන්නෙම්නම් මට භාග්‍යවතුන් වහන්සේ සංක්ෂෙපයෙන් ධර්මය දෙශනා කෙරේවා යහපති"

2. "මාලුංක්‍ය පුත්‍රය, දහරවූවන්ට කියනුම කවරේද දිරූ වෘද්ධවූ මහළු වූ ඔබ තථාගතයන් වහන්සේගෙන් සංක්ෂෙපයෙන් අවවාදය යාච්ඥා කරන්නෙහිද?"

3. "ස්වාමීනි, මට භාග්‍යවතුන් වහන්සේ සංක්ෂේපයෙන් බණ වදාරාවා සුගතයන් වහන්සේ මට සංක්ෂෙපයෙන් බණ වදාරාවා මම භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතයාගේ අර්ථය දැනගන්නෙම් නම් යෙහෙක. ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතයට දායාද වන්නෙම් නම් ඉතා යෙහෙක.

**4.** "මාලුංක්‍ය පුත්‍රය, යම්තැනෙක්හි භික්ෂුවට තෘෂ්ණාව උපදින්නාහු උපදිත්ද තණ්හුප්පාදයෝ සතරදෙනෙකි. කවර සතරක්ද යත්.

**5.** "මාලුංක්‍ය පුත්‍රය, සිවුරු නිසා හෝ භික්ෂුවට තෘෂ්ණාව උපදින්නේ උපදී. මාලුංක්‍ය පුත්‍රය පිණ්ඩපාතය නිසා හෝ භික්ෂුවට තෘෂ්ණාව උපදින්නේ උපදී. සෙනසුන් නිසා හෝ භික්ෂුවට තෘෂ්ණාව උපදින්නේ උපදී. මෙසේ භව විභව හෙතුවෙන් හෝ මාලුංක්‍ය පුත්‍රය, භික්ෂුවට තෘෂ්ණාව උපදින්නේ උපදී. මාලුංක්‍ය පුත්‍රය මහණහට යම්තැනෙක්හි තෘෂ්ණාව උපදිමින් උපදීද. මේ සතර තෘෂ්ණා උපදින තැන්ය.

**6.** "මාලුංක්‍ය පුත්‍රය, යම්හෙයකින් භික්ෂුහට තෘෂ්ණාව ප්‍රහීනවූයේ වේද, සිඳින ලද මුල් ඇත්තේ වේද, මුල් හෝ කරටිය සිඳි තල්ගසක් මෙන් කරණ ලද්දාහුද අභාවයට යවන ලද්දාහුද මත්තෙහි නූපදින තත්වයට පමුණුවන ලද්දාහුද මාලුංක්‍ය පුත්‍රය මේ මහණතෙම තෘෂ්ණාව සින්දේය. සංයෝජනය පෙරළා දැම්මේය. මනාකොට ප්‍රහාණාභිසමයෙන් දුක් කෙළවර කළේයයි කියනු ලැබේ.

**7.** "ඉක්බිති ආයුෂ්මත් මාලුංක්‍ය පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේ විසින් මේ අවවාදයෙන් අවවාද කරණ ලද්දේ හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගියේය.

**8.** "ඉක්බිති ආයුෂ්මත් මාලුංක්‍ය පුත්‍රතෙම හුදකලා වූයේ වෙන්වූයේ අප්‍රමත්තවූයේ කෙලෙස් තවන වීර්‍ය ඇත්තේ කාය ජීවිත නිරපෙක්ෂව වාසය කරන්නේ නොබෝ කලකින්ම කුලපුත්‍රයෝ යමක් සඳහා වහාම ගිහිගෙන් නික්ම අනගාරික සංඛ්‍යාත ශාසනයෙහි පැවිදි වෙත්ද, බ්‍රහ්මචර්යය අවසන් කොට ඇති නිරුත්තර ඒ අර්හත්වය තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරයි.

**9.** "උත්පත්තිය ක්ෂයවිය. බඹසර වැස නිමවන ලදී. කටයුතු කරණ ලදී. මින්මතු අන් යමක් නැතැයි දැනගත්තේය. ආයුෂ්මත් මාලුංක්‍ය පුත්‍රතෙම රහතන් වහන්සේලාගෙන් කෙනෙක් වූයේය."

**5. මහා කුල සූත්‍රය:-** 1. "මහණෙනි, යම්කිසි කුල කෙනෙක් භොගයන්ගෙන් මහත්වයට පැමිණියාහු බොහෝ කල් නොසිටින්නාහු වෙත්ද ඒ සියල්ල කරුණු සතරකින් හෝ මොවුන්ගෙන් හෝ එක්තරා එකකින් වේ.

2. "කවර සතරකින්ද යත්. නැතිවූදේ නොසොයත්ද දිරුයේ ප්‍රතිසංස්කරණය නොකරත්ද, ප්‍රමාණ රහිත ආහාර පාන ඇත්තේද දුශ්ශීලවූ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ අධිපතිභාවයෙහි තබත්ද මහණෙනි, යම් ඒ කුලයෝ භොගයන්හි මහත්වයට පැමිණියාහුද එය බොහෝ කල් නොපවතිත්ද, ඒ සියල්ල මේ සතර කාරණයෙන් හෝ මොවුන්ගෙන් එක් කරුණකින් හෝ වේ.

3. "මහණෙනි, යම් ඒ කුලයෝ භොගයන්ගෙන් මහත්වයට ගියාහුද බොහෝ කල් පවතිත්ද, ඒ සියල්ල කරුණු සතරකින් හෝ මොවුන්ගෙන් එක් කරුණකින් වේ.

4. "කවර සතරකින්ද යත්. නටුවාවූ වස්තුව සොයයිද දිරූදෙය ප්‍රතිසංස්කරණය කරයිද, ප්‍රමාණවත් ආහාරභොජන ඇත්තේද, සිල්වත් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් අධිපති බැව්හි තබයිද, මහණෙනි, යම් ඒ කුලයක් භොගයන්හි මහත්වයට පැමිණියාහුද බොහෝකල් පවතිත්ද, ඒ සියල්ල මේ සතරින් හෝ මොවුන්ගෙන් එක්තරා කරුණකින් හෝ වෙත්."

**6. පඨම ආජඤ්ඤොපම සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු සතරකින් යුක්තවූ රජුගේ යහපත් ආජානෙය අශ්වතෙම රජුට සුදුසුවේ. රාජ වස්තුවවේ. රජුගේ අවයවය යන සංඛ්‍යාවට යේ.

2. "කවර සතරකින්ද යත්. මහණෙනි, මේ ලොකයෙහි රජුගේ යහපත් ආජානෙය අශ්වයෙක් වර්ණයෙන් යුක්ත වේද, ශක්තියෙන් යුක්තවේද වේගයෙන් යුක්තවේද උසට සුදුසු මහතින් මහතට සුදුසු උසින් යුක්තවූයේ වේද, මහණෙනි, මේ සතර කරුණින් යුක්තවූ රජහුගේ යහපත් ආජානෙය අශ්වයා රජුට සුදුසුවේ. රාජ භොගය වේ. රජුගේ කොටසකැයි යන සංඛ්‍යාවට යයි.

3. "මහණෙනි, එසේම කරුණු සතරකින් යුක්ත මහණ තෙම පූජාවට යොග්‍යවේ. පඬුරු යවා පූජාවට යොග්‍යවේ. දන්දීමට යොග්‍යවේ, දෙඅත් නළල මත තබා වැඳීමට යොග්‍යවේ. ලොකයාගේ උතුම් පින් කෙතය.

4. "කවර සතරකින්ද යත්. මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම වර්ණයෙන් යුක්තවේද ශක්තියෙන් යුක්තවේද වේගයෙන් යුක්තවේද, උසට සුදුසු මහතින් මහතට සුදුසු උසින් යුක්තවේද,

5. "මහණෙනි, කෙසේ මහණතෙම වර්ණයෙන් යුක්තවේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම (මෙහි 516 පිටේ 37 සූත්‍රයේ 2 ඡෙදයේ 'සිල්වත් වේද' යන කොටස යෙදිය යුතුයි) ශික්ෂාපදයන් මනාකොට ගෙන හික්මෙයි. මහණෙනි, මෙසේ මහණතෙම වර්ණයෙන් යුක්තවූයේ වේ.

6. "මහණෙනි, කෙසේ මහණතෙම ශක්තියෙන් යුක්ත වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම පටන්ගන්නා ලද වීර්ය ඇත්තේ වේද අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශල ධර්මයන්ගේ ඉපදවීම පිණිස කුශල ධර්මයන්හි ශක්තියෙන් යුක්තවූයේ වේද දැඩි වීර්ය ඇත්තේ වේද බැහැර නොකරණ ලද වැඩ ඇත්තේ වේද, මහණෙනි, මෙසේ මහණ තෙම ශක්තියෙන් යුක්තවේ.

7. "මහණෙනි, කෙසේ මහණතෙම බලයෙන් යුක්ත වූයේ වේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මේ දුක යයි තත්වූ පරිද්දෙන් දනීද, මේ දුකට හේතුවයයි තත්වූ පරිද්දෙන් දනීද, මේ දුක් නැතිකිරීමයයි තත්වූ පරිද්දෙන් දනීද, මේ දුක් නැතිකිරීමට යන ප්‍රතිපදාවයයි තත්වූ පරිද්දෙන් දනීද, මහණෙනි, මෙසේ මහණතෙම බලයෙන් යුක්තවේ. මහණෙනි,

8. "කෙසේ මහණතෙම උසට සුදුසු මහතින් මහතට සුදුසු උසින් යුක්තවූයේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සිවුරු පිඬු සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබන්නේ වේද මහණෙනි, මෙසේ වනාහි මහණතෙම ආරොහපරිනාහයෙන් යුක්තවූයේ වේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**9.** (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

**7. දුතිය ආජඤ්ඤෙදාපම සූත්‍රයඃ-** 1, 2, 3 (මේ ඡේද මේ වර්ගයේ 6 සූත්‍රයේ 1, 2, 3 ඡේද මෙන් වෙත්.)

**7.** "මහණෙනි, කෙසේ මහණතෙම වේගයෙන් යුක්ත වූයේ වේද? (මෙහි මේ පණ්ණාසකයේ 13 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි) මෙසේ වනාහි මහණතෙම බලයෙන් යුක්ත වූයේ වේ.

**8.** (මේ ඡේදය මේ වර්ගයේ 6 සූත්‍රයේ 8 වෙනි ඡේදය මෙනි.)

**9.** (මේ ඡේදය මේ වර්ගයේ 6 සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

**8. චතුම බල සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ බල සතරක් වෙත්. කවර සතරක්ද යත්? වීර්ය, ස්මෘති, සමාධි, ප්‍රඥා බල යන මේ සතර බලයෝයි."

**9. අරඤ්ඤක විතක්ක සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු සතරකින් යුක්තවූ මහණතෙම වනයෙහි වානප්‍රස්ත ප්‍රාන්ත සෙනසුන් ආශ්‍රය කරන්ට නුසුදුසුය.

**2.** "කවර සතරකින්ද යත්. කාම විතර්කයෙන්ද, ව්‍යාපාද විතර්කයෙන්ද, විහිංසා විතර්කයෙන්ද, ජඩවූ කෙළතොළුවූ මෝඩයෙක් වේද,

**3.** (මෙය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

**4.** "මහණෙනි, කරුණු සතරකින් යුක්ත මහණතෙම වනයෙහි වානප්‍රස්ත ප්‍රාන්ත සෙනසුන් සෙවනය කරන්ට සුදුසු වේ.

**5.** "කවර සතරකින්ද යත්. නෛෂ්ක්‍රම්‍ය කල්පනාවෙන්ද, අවිහිංසා කල්පනාවෙන්ද අව්‍යාපාද කල්පනාවෙන්ද නො ජඩ කෙළතොළු නුවූයේද,

**6.** (මෙය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි)

**10. සාවජ්ජ කම්ම සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු සතරකින් යුක්තවූ අව්‍යක්ත අසත්පුරුෂ බාලතෙමේ සාරා දමන ලද ගුණ ඇති, නසන ලද ගුණ ඇති, තමා පරිහරණය කරයි. වරද සහිතද

වේ. නුවණැත්තන් විසින් උපවාද කරන්නේද වේ. බොහෝ අකුසල්ද රැස් කරයි.

2. "කවර සතරකින්ද යත්. වරද සහිත කාය කර්මයෙන්ද, වරද සහිත වාක් කර්මයෙන්ද, වරද සහිත මනො කර්මයෙන්ද, වරද සහිත දෘෂ්ටියෙන්ද,

3. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි)

4. "මහණෙනි, කරුණු සතරකින් යුක්තවූ ව්‍යක්ත සත්පුරුෂ පණ්ඩිතතෙම සාරා නොදමන ලද ගුණ ඇති නොනසන ලද ගුණ ඇති තමා පරිහරණය කරයි. වරද රහිතද වේ. නුවණැත්තන් විසින් උපවාද නොකරන්නේද වේ. බොහෝ කුසල්ද රැස් කරයි.

5. "කවර සතරකින්ද යත්. වරද රහිත කාය කර්මයෙන්ද වරද රහිත වාක් කර්මයෙන්ද වරද රහිත මනො කර්මයෙන්ද වරද රහිත දෘෂ්ටියෙන්ද යන මේ (මේ ඡේදය මේ වර්ගයේ 4 ඡේදය මෙනි.)

**(විසි හයවෙනි අභිඥා වර්ගය නිමි)**

---

## 27. කම්මපථ වර්ගය

1. **පාණාතිපාත සුගති දුග්ගති සූත්‍රයː-** 1. "මහණෙනි, කරුණු සතරකින් යුක්තවූයේ ගෙන එන ලද්දක් බහා තැබූයේ යම්සේද එසේ නරකයෙහි වේ.

2. කවර සතරකින්ද යත්. තමන්ද සතුන් මරන්නේ වේද. අනුන්ද සතුන් මැරීමෙහි සමාදන් කරවයිද, සතුන් මැරීමෙහිද අනුදන්නේ වේද, සතුන් මැරීමෙහි ගුණ කියයිද,

3. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

4. "මහණෙනි, කරුණු සතරකින් යුක්තවූයේ ගෙන එන ලද්දක් බහා තැබූයේ යම්සේද එසේ ස්වර්ගයෙහි වේ.

5. "කවර සතරකින්ද යත්. තමාද සතුන් නොමරාද, අනුන්ද සතුන් මැරීමෙහි සමාදන් නොකරවාද, සතුන් මැරීමෙහි නො අනුදන්නේද, සතුන් මැරීමෙහි ගුණ නොකියයිද,

**6.** (මේ ඡේදය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි)

**2. අදින්නාදාන දුගති සුගති සූත්‍රයః-** (මේ වර්ගයේ අනික් සූත්‍රවල 1, 3, 4, 6 ඡේද මේ වර්ගයේ 1 සූත්‍රයේ 1, 3, 4, 6 ඡේද මෙන් වෙත්.)

**2.** "කවර සතරකින්ද යත්. තමන්ද නුදුන් දෙය ගන්නේ වේද, අනුන්ද නුදුන් දේ ගැනීමෙහි සමාදන් කරවයිද, නුදුන් දේ ගැනීමෙහි අනුදන්නේ වේද නුදුන් දේ ගැනීමෙහි ගුණ කියයිද,

**3.** "තමන්ද නුදුන් දේ ගැනීමෙන් වෙන්වූයේ වේද අනුන්ද නුදුන් දේ ගැනීමෙන් වෙන්වීමට බණ කියයිද, නුදුන් දේ ගැනීමෙන් වෙන්වීමට අනුදන්නේ වේද,"

**3. "කාමමිච්ඡාචාර සුගති දුග්ගති සූත්‍රයః-** 2. "කාමමිච්ඡාචාරීවේද, අනුන් කාමමිච්ඡාචාරයෙහි සමාදන් කරවයිද, කාමමිච්ඡාචාරයෙහි අනුදන්නේ වේද, කාමමිච්ඡාචාරයෙහි ගුණ කියයිද,

**5.** "තමන්ද කාම මිච්ඡාචාරයෙන් වෙන්වූයේ වේද, අනුන්ද කාම මිච්ඡාචාරයෙන් වෙන්වීමෙහි සමාදන් කරවයිද, කාම මිච්ඡාචාරයෙන් වෙන්වීමෙහි අනුදන්නේ වේද, කාමමිච්ඡාචාරයෙන් වෙන්වීමෙහි ගුණ කියයිද,"

**4. මුසාවාදය සුගති දුග්ගති දූත්‍රයః-** 2. "බොරු කියන්නේ වේද, අනුන් බොරු කීමෙහි සමාදන් කරවයිද, බොරු කීමෙහි අනුදන්නේ වේද බොරු කීමෙහි ගුණ කියයිද,

**5.** "තමන්ද බොරු කීමෙන් වෙන්වූයේ වේද අනුන්ද බොරු කීමෙන් වෙන්වීමෙහි සමාදන් කරවයිද, බොරු කීමෙන් වෙන්වීමෙහි අනුදන්නේ වේද බොරු කීමෙන් වෙන්වීමෙහි ගුණ කියයිද,"

**5. පිසුනාවාච සුගති දුග්ගති සූත්‍රයః-** 2. "පිසුණු කියන්නේ වේද, අනුන් පිසුනු කීමෙහි සමාදන් කරවයිද, පිසුනු කීමෙහි අනුදන්නේ වේද, පිසුණු කීමෙහි ගුණ කියයිද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**5.** "තමන්ද පිසුණු කීමෙන් වෙන්වූයේ වේද, අනුන්ද පිසුණු කීමෙන් වෙන්වීමෙහි සමාදන් කරවයිද, පිසුණු කීමෙන් වෙන්වීමෙහි අනුදන්නේ වේද පිසුණු කීමෙන් වෙන්වීමෙහි ගුණ කියයිද,

**6. ඵරුසාවාච සුගති දුග්ගති සූත්‍රයඃ-** 2. "පරුෂ වචන කියන්නේ වේද, අනුන් ඵරුෂ වචන කීමෙහි සමාදන් කරවයිද, ඵරුෂ වචන කීමෙහි අනුදන්නේ වේද, පරුෂ වචන කීමෙහි ගුණ කියයිද,

**5.** "තමන්ද ඵරුෂ වචනයෙන් වෙන්වූයේ වේද, අනුන්ද ඵරුෂ වචනයෙන් වෙන්වීමෙහි සමාදන් කරවයිද, ඵරුෂ වචනයෙන් වෙන්වීමෙහි අනුදන්නේ වේද, ඵරුෂ වචනයෙන් වෙන්වීමෙහි ගුණ කියයිද"

**7. සම්ඵප්පලාප සුගති දුග්ගති සූත්‍රයඃ-** 2. "ප්‍රලාප දොඩන්නේ වේද, අනුන් ප්‍රලාප දෙඩවීමෙහි සමාදන් කරවයිද, ප්‍රලාප දෙඩවීමෙහි අනුදන්නේ වේද, ප්‍රලාප දෙඩවීමෙහි ගුණ කියයිද,

**5.** "තමන්ද ප්‍රලාප දෙඩවීමෙන් වෙන්වූයේ වේද අනුන්ද ප්‍රලාප දෙඩවීමෙන් වෙන්වීමෙහි සමාදන් කරවයිද, ප්‍රලාප දෙඩවීමෙන් වෙන්වීමෙහි අනුදන්නේ වේද, ප්‍රලාප දෙඩවීමෙන් වෙන්වීමෙහි ගුණ කියයිද,

**8. අභිජ්ඣාලු සුගති දුග්ගති සූත්‍රයඃ-** 2. "තණ්හා බහුල කොට ඇත්තේ වේද, අනුන් තණ්හාවෙහි සමාදන් කරවයිද, තණ්හාවෙහි අනුදන්නේ වේද, තණ්හාවෙහි ගුණ කියයිද,

**5.** "තමන්ද තණ්හාවෙන් වෙන්වූයේ වේද, අනුන්ද තණ්හාවෙන් වෙන්වීමෙහි සමාදන් කරවයිද, තණ්හාවෙන් වෙන්වීමෙහි අනුදන්නේ වේද, තණ්හාවෙන් වෙන්වීමෙහි ගුණ කියයිද,

**9. ව්‍යාපන්න චිත්ත සුගති දුග්ගති සූත්‍රයඃ-** 2. "ව්‍යාපාද සිත් ඇත්තේ වේද, අනුන් ව්‍යාපාදයෙහි සමාදන් කරවයිද, ව්‍යාපාදයෙහි අනුදන්නේ වේද, ව්‍යාපාදයෙහි ගුණ කියයිද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

5. "තමන්ද ව්‍යාපාදයෙන් වෙන්වූයේ වේද අනුන්ද ව්‍යාපාදයෙන් වෙන්වීමෙහි සමාදන් කරවයිද, ව්‍යාපාදයෙන් වෙන්වීමෙහි අනුදන්නේ වේද ව්‍යාපාදයෙන් වෙන්වීමෙහි ගුණ කියයිද,

10. **මිච්ඡාදිට්ඨික සුගති දුග්ගති සූත්‍රයː-** 2. "මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්තවූයේ වේද, අනුන් මිථ්‍යාදෘෂ්ටියෙහි සමාදන් කරවයිද, මිථ්‍යාදෘෂ්ටියෙහි අනුදන්නේ වේද, මිථ්‍යාදෘෂ්ටියෙහි ගුණ කියයිද,

5. "සම්‍යක් දෘෂ්ටික වේද, අනුන් සම්‍යක් දෘෂ්ටියෙහි සමාදන් කරවයිද, සම්‍යක් දෘෂ්ටියෙහි අනුදන්නේ වේද, සම්‍යක් දෘෂ්ටියෙහි ගුණ කියයිද, දත්තේ වේද, නුදුන් දේ ගැනීමෙන් වෙන්වීමෙහි ගුණ කියයිද,

**(විසිහත්වෙනි කර්මපථ වර්ගය නිමි.)**

---

## 28. රාග පෙයයාල වර්ගය.

1. **සතිපට්ඨාන රාග අභිඤ්ඤා සූත්‍රයː-** 1. "මහණෙනි, රාගය විශිෂ්ට ඥානයෙන් දැනීමට කරුණු සතරක් වැඩිය යුතුය.

2. "කවර සතරක්ද යත්. මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්ය ඇත්තේ, සිහි ඇත්තේ, සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ පඤ්චස්කන්ධ ලොකයෙහි තෘෂ්ණා ක්‍රොධ දෙක සංසිඳුවා, ශරීරයෙහි ශරීරය අනුව බලමින් වාසය කරයි.

3, 5, 7. (මේ ඡෙදය මේ සූත්‍රයේ 1 ඡෙද මෙනි.)

4. "වේදනාවන්හි වේදනාවන් අනුව බලමින් වාසය කරයි.

6. "සිතෙහි සිත අනුව බලමින් වාසය කරයි.

8. "ධර්මයන්හි ධර්මය අනුව බලමින් වාසය කරයි.

9. (මේ ඡෙදය මේ සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**2. සම්මප්පධාන රාග අභිඤ්ඤා සූත්‍රය:-** 1. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡේදය මෙනි)

2. "කවර සතරක්ද යත්. මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නූපන් ලාමක අකුශල ධර්මයන් නොඉපදවීම පිණිස,

3. "කැමැත්ත උපදවයි. වෑයම් කරයි වීර්ය පටන්ගනී. සිත පහදවයි. ප්‍රධන් වීර්ය කරයි.

4. "උපන් ලාමක අකුශල ධර්මයන් ප්‍රහාණ වීම පිණිස

5, 7. (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි)

6. "නූපන් කුශල ධර්මයන් ඉපදවීම පිණිස,

8. "උපන් කුශල ධර්මයන්ගේ ස්ථිතිය පිණිස, අමතක නොවීම පිණිස, වැඩීම පිණිස, විපුලත්වයට යාම පිණිස,

9. "භාවනාවෙන් පිරීම පිණිස,

10. කැමැත්ත උපදවයි. වෑයම් කරයි වීර්යය පටන්ගනී. සිත යොදවයි. ප්‍රධන් වීර්ය කරයි.

11. "මහණෙනි, රාගයාගේ විශිෂ්ට ඥානයෙන් දැනීම පිණිස මේ කරුණු සතර වැඩිය යුතුය."

**3. ඉද්ධිපාද රාග අභිඤ්ඤා සූත්‍රය:-** 1. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡේදය මෙනි)

2. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ඡන්දයෙන් හා සමාධියෙන් යුත් ප්‍රධාන සංස්කාරයන්ගෙන් යුත් ඍද්ධිපාදය වඩයි. වීර්යයෙන් හා සමාධියෙන් යුත් ප්‍රධාන සංස්කාරයන්ගෙන් යුත් ඍද්ධිපාදය වඩයි. සිතින් හා සමාධියෙන් යුත් ප්‍රධාන සංස්කාරයන්ගෙන් යුත් ඍද්ධිපාදය වඩයි. විමසීමෙන් හා සමාධියෙන් යුත් ප්‍රධාන සංස්කාරයන්ගෙන් යුත් ඍද්ධිපාද වඩයි.

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

4. "මහණෙනි, රාගයාගේම විශෙෂ ඤාණය පිණිස, ක්ෂයවීම පිණිස, විනාශය පිණිස, නොඇලීම පිණිස, නිරුද්ධිය පිණිස, අත් හැරීම පිණිස, දුරුකිරීම පිණිස, මේ ධර්ම සතර වැඩිය යුතුය."

(මෙසේ මේ වර්ගයේ ඉහත දක්වන සූත්‍ර තුන රාග අභිඤ්ඤා - රාග පරිඤ්ඤා - රාග පරික්ඛය - රාග පහාණ - රාගක්ඛය - රාගාවය - රාග විරාග - රාග නිරොධ - රාගචාග - රාග පටිනිස්සග්ග වශයෙන් ගැනීමෙන් සූත්‍ර 30 ක් වෙත්. ඒ රාග සූත්‍රවල 'රාග' වෙනුවට මෙහි පහත දක්වෙන වචන යෙදීමෙන් එක එක වචනය අනුව 30 බැගින් සාදාගත යුතුයි. සූත්‍රවලට 'රාගය' වෙනුවට යෙදිය යුතු වචන මෙසේය.

ද්වෙෂය, මොහය, ක්‍රොධය, ඊර්ෂ්‍යාව, මසුරුකම, මායාව, කෛරාටික කම, තද ගතිය, එකට එක කිරීම, මාන්නය, අතිමාන්නය, මත්වීම, ප්‍රමාදය.)

**(පස්වෙනි පණ්ණාසකය නිමි.)**

**(චතුක්ක නිපාතය නිමි.)**

---

# පඤ්චක නිපාතය.

## 1. පළමුවෙනි පණ්ණාසකය.

## 1. සෙඛබල වර්ගය.

1. **සංඛිත්ත සෙඛබල සූත්‍රය**:- 1. "මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ අනේපිඬු සිටානන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' කියා භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. 'පින්වතුන් වහන්සැයි' ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, සප්තවිධ ශෛක්ෂයන්ගේ බලයෝ මේ පසෙක් වෙත්. කවර පසෙක්ද යත්, ශ්‍රද්ධා බලය, හිරි බලය ඔත්තප්ප බලය, වීර්ය බලය, ප්‍රඥා බලය යන මේ පසයි.

3. "මහණෙනි, මේ පස වනාහි සප්තවිධ ශෛක්ෂයන්ගේ බලයෝ වෙත්.

4. "මහණෙනි, එහෙයින් මේ ශාසනයෙහි මෙසේ හික්මිය යුතුයි. ශෛක්ෂ බලයවූ ශ්‍රද්ධාබලයෙන් යුක්තවන්නෙමු. ශෛක්ෂ බලයවූ හිරිබලයෙන් යුක්තවන්නෙමු. ශෛක්ෂ බලයවූ ඔත්තප්ප බලයෙන් යුක්තවන්නෙමු. ශෛක්ෂ බලයවූ වීර්‍ය බලයෙන් යුක්ත වන්නෙමු. ශෛක්ෂ බලයවූ ප්‍රඥා බලයෙන් යුක්ත වන්නෙමු කියායි. මහණෙනි, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයයි වදාළේය."

**2. විත්ථත සෙඛබල සූත්‍රය**:- 1. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

2. "මහණෙනි, ශ්‍රද්ධාබලය කවරේදයත්, මහණෙනි මේ ශාසනයෙහි ආර්‍යශ්‍රාවකතෙම ශ්‍රද්ධාව ඇත්තේවේද, මෙහි අදහසයිද, මහණෙනි, මේ ශ්‍රද්ධා බලයයි කියනු ලැබේ.

3. "මහණෙනි, හිරිබලය නම් කවරේදයත් මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍යශ්‍රාවකතෙම පාපයට ලජ්ජා ඇත්තේ වේද, කාය දුශ්චරිතයට, වාක් දුශ්චරිතයට, මනො දුශ්චරිතයට, පිළිකුල් කෙරේද? ලාමකවූ අකුශල ධර්මයන්ට පැමිණීමට පිළිකුල් කෙරේද, මහණෙනි, මෙය හිරි බලයයි කියනු ලැබේ.

4. "මහණෙනි, ඔත්තප්පබලය නම් කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍යශ්‍රාවකතෙම පාපයට භය ඇත්තේවේද කාය දුශ්චරිතයට, වාක් දුශ්චරිතයට, මනො දුශ්චරිතයට භය වේද ලාමකවූ අකුශල ධර්මයන්ගේ පැමිණීමට භයවේද, මහණෙනි මෙය ඔත්තප්පබලයයි කියනු ලැබේ.

5. "මහණෙනි, වීර්‍යබලය නම් කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍යශ්‍රාවකතෙම අකුශල ධර්මයන් දුරු කිරීම පිණිස කුශල ධර්මයන් ඉපදවීම පිණිස පටන්ගන්නා ලද වීර්‍ය ඇත්තේ ශක්තිමත්වූයේ දෘඪවීර්‍ය ඇත්තේ කුශල ධර්මයන්හි බහා නොතබනලද බර ඇත්තේ වාසය කෙරේද මහණෙනි, මෙය වීර්‍ය බලයයි කියනු ලැබේ.

6. "මහණෙනි, ප්‍රඥා බලය නම් කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍යශ්‍රාවකතෙම පිරිසිදුවූ කෙළෙසුන් මිදීම

ඇත්තාවූ මනාකොට දුක් ක්ෂයකිරීම පිණිස පවත්නාවූ පඤ්චස්කන්ධයන්ගේ ඇතිවීමද නැතිවීමද දැනගන්ට සමර්ථවූ විදර්ශනා ප්‍රඥාවෙන් හා මාර්ග ප්‍රඥාවෙන් යුක්තවූයේ ප්‍රඥාවෙන් යුක්තවූයේවේද මහණෙනි, මෙය ප්‍රඥා බලයයි කියනු ලැබේ.

7. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

3. **දුක්ඛවිහාර සූත්‍රය**:- 1. "මහණෙනි, මේ කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම මේ ආත්මයෙහිම පීඩා සහිතව දැඩි ආයාශයෙන් යුක්තව හාත්පස දැවීමෙන් යුක්තව දුකසේ වාසය කෙරෙයි. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි දුර්ගතියද කැමැතිවිය යුතුයි.

2. "කවර පසකින්දයත්, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ශ්‍රද්ධාව නැත්තේ වේද, පවට ලජ්ජා නැත්තේවේද, පවට බිය නැත්තේ වේද, අලස වූයේ වේද, ප්‍රඥා නැත්තේ වේද යන මේ පසිනි. (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, මේ කරුණු පසකින් යුක්තවූ භික්ෂු තෙම මේ ආත්මයෙහිම දුක් රහිතවූ දැඩි ආයාශ රහිතව හාත්පස දැවීම් රහිතව සුවසේ වාසය කරයි. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සුගතියද කැමතිවිය යුතුයි.

4. "කවර පසකින්ද යත්, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ශ්‍රද්ධාව ඇත්තේවේද, පාපයට ලජ්ජා ඇත්තේවේද, පාපයට භය ඇත්තේවේද, පටන්ගන්නාලද වීර්ය ඇත්තේවේද, ප්‍රඥාව ඇත්තේවේද යන මේ පසිනි.

5. (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

4. **යථාභත නික්ඛිත්ත සූත්‍රය**:- 1 "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම ගෙණෙනලද බරක් බිම තබන ලද්දේ යම්සේද මෙසේ නරකයෙහි උපදී.

2. (මේ ඡේදය මේ වර්ගයේ 3 සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

3. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

**5. සික්ඛාපච්චක්ඛාන සූත්‍රය**:- 1 "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම ගෙණෙනලද බරක් බහා තබන ලද්දේ යම්සේද, මෙසේ ස්වර්ගයෙහි උපදී.

2. (මේ ඡේදය මේ වර්ගයේ 3 සූත්‍රයේ 4 ඡේදය මෙනි.)

3. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

**6. අකුසල සමාපත්ති සූත්‍රය**:- 1 "මහණෙනි, යම්කිසි භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ ශික්ෂාව හැරදමා ගිහිබවට පැමිණේද, ඕහට මේ ආත්මයෙහිම ගැරහියයුතු කරුණු සහිත වාද ප්‍රවෘත්ති පසක් පැමිණෙත්.

2. "කවර පසකින්දයත්, කුශල ධර්මයන්හි තොපගේ ශ්‍රද්ධාවකුත් නොවීය. කුශල ධර්මයන්හි තොපගේ ලජ්ජාවකුත් නොවීය. කුශල ධර්මයන්හි තොපගේ භයකුත් නොවීය. කුශල ධර්මයන්හි තොපගේ වීර්යයකුත් නොවීය. කුශල ධර්මයන්හි තොපගේ ප්‍රඥාවකුත් නොවීය. යන පසයි.

3. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

4. "මහණෙනි, යම්කිසි භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ දුක සහිතවද, දොම්නස සහිතවද, කඳුළු පිරුණු මුහුණු ඇත්තේ හඬමින් සම්පූර්ණකොට පිරිසිදුකොට බ්‍රහ්මචර්යාවෙහි හැසිරේද, ඔහුට මේ ආත්මයෙහිම කරුණු සහිතවූ පැසසිය යුතු කරුණු පසක් පැමිණෙත්.

5. "කවර පසක්දයත්, කුශල ධර්මයන්හි තොපගේ ශ්‍රද්ධාවද විය. කුශල ධර්මයන්හි තොපගේ ලජ්ජාවද විය. කුශල ධර්මයන්හි තොපගේ භයද විය. කුශල ධර්මයන්හි තොපගේ වීර්යයද විය. කුශල ධර්මයන්හි තොපගේ ප්‍රඥාවද විය, යන පසයි.

6. (මේ ඡේදය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි)

**7. කාමපලාලිත සූත්‍රය**:- 1. "මහණෙනි, යම්තාක් කුශල ධර්මයන්හි ශ්‍රද්ධාව එළඹ සිටියාවේද, ඒතාක් අකුශල ධර්මයට පැමිණීම නොවේ. මහණෙනි, යම් තැනෙක පටන් ශ්‍රද්ධාව අතුරුදහන්වේද, අශ්‍රද්ධාව හාත්පස වැළඳගෙන සිටීද, එකල්හි අකුශලයාගේ පැමිණීම වේ.

"මහණෙනි, යම්තාක් අකුශල ධර්මයන්හි ලජ්ජාව එළඹ සිටියාවේද ඒතාක් අකුශලයාගේ පැමිණීම නොවේ. මහණෙනි, යම් තැනෙක පටන් ලජ්ජාව අතුරුදන්වේද, ලජ්ජාව නැතිබව හාත්පසින් වැළඳගෙණ සිටීද, එකල්හි අකුශලයාගේ පැමිණීම වේ. මහණෙනි, යම්තාක් අකුශල ධර්මයන්හි පාපයට භයවීම එළඹ සිටියේවේද, ඒතාක් අකුශල ධර්මයාගේ පැමිණීම නොවේ. මහණෙනි, යම් තැනෙක පටන් පාපයට භයවීම අතුරුදන්වේද, පාපයට භය නැතිවීම හාත්පස වැළඳගෙණ සිටීද, එකල්හි අකුශල ධර්මයාගේ පැමිණීම වේ. මහණෙනි, යම්තාක් කුශල ධර්මයන්හි වීර්යය එළඹසිටියේවේද, ඒතාක් අකුශල ධර්මයාගේ පැමිණීම නොවේ. මහණෙනි, යම් තැනෙක පටන් වීර්යය අතුරුදන් වේද, කුසීත බව හාත්පසින් වැළඳගෙන සිටීද, එකල්හි අකුශල ධර්මයාගේ පැමිණීමවේ මහණෙනි, යම්තාක් කුශල ධර්මයන්හි ප්‍රඥාව එළඹ සිටියාවේද, ඒතාක් අකුශල ධර්මයාගේ පැමිණීම නොවේ.

"මහණෙනි, යම් තැනෙක පටන් ප්‍රඥාතොමෝ අතුරුදන් වේද, දුෂ්ප්‍රඥාව හාත්පසින් වැළඳගෙණ සිටීද, එකල්හි අකුශල ධර්මයාගේ පැමිණීම වේ.

**2.** "මහණෙනි, බොහෝසෙයින් සත්වයෝ කාමයන්හි ඇළුනාහු වෙත්, මහණෙනි, කුලපුත්‍රතෙමේ දෑකැත්ත හා කුඩ කද හැරදමා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේවේද, හෙතෙම ශ්‍රද්ධාවෙන් පැවිදිවූ කුලපුත්‍රයායයි කියන්ට සුදුසුය. ඊට හේතු කවරේදයත්? මහණෙනි, යෞවනයෙකු විසින් කාමයෝ ලැබිය හැක්කාහ. ඒ කාමයෝද වනාහි යම්බඳුවූවාහු හෝ එබඳු වූවාහු හෝ වෙත්. මහණෙනි, යම් හීනවූ කාමයෝ වෙත්ද, යම් මධ්‍යමවූ කාමයෝ වෙද්ද, යම් ප්‍රණීතවූ කාමයෝ වෙද්ද, ඒ සියලු කාමයෝ කාමයෝමයයි සංඛ්‍යාවට පැමිණෙත්.

**3.** "මහණෙනි, යම්සේ බාලවූ උඩුකුරුව සයනය කරන්නාවූ ළදරු (දරු)වෙක් තෙම කිරිමවගේ ප්‍රමාදයකට පැමිණ කාෂ්ටයක් හෝ, කැබලිත්තක් හෝ මුඛයෙහි දමා ගන්නේද එය කිරි මව වහා වහා මෙනෙහි කරන්නේය. වහ වහා

මෙනෙහිකොට වහ වහා පිටතට ගන්නේය. ඉදින් වහ වහා හැරගන්ට නොහැකි වන්නේ නම් වම් අතින් වහා අල්වාගෙණ දකුණතින් ඇඟිල්ල වක්කොට ලේ සහිතවද හැර ගන්නේය. ඊට හේතු කවරේද?

"මහණෙනි, කුමරුවාට වෙහෙස ඇත්තේය. මේ වෙහෙස නැතැයි නොකියමි. මහණෙනි, වැඩ කැමතිවූ හිත කැමතිවූ අනුකම්පා ඇත්තාවූ කිරිමව විසින් අනුකම්පාව නිසා මෙය කටයුතුද වේ.

4. "මහණෙනි, යම් තැනක පටන් ඒ දරුවා වැඩවිය පැමිණියේ සුදුසු ප්‍රඥාව ඇත්තේවේද, මහණෙනි, එතැන් පටන් කිරිමව ඒ දරුවා කෙරෙහි දැන් දරුවා තමා විසින් රක්නාලද්දේ ප්‍රමාද වීමට සුදුසු නොවේයයි අපේක්ෂා නැත්තීවේද, මහණෙනි, මෙපරිද්දෙන්ම යම්තාක්ම භික්ෂූහුගේ කුශල ධර්මයන්හි ශ්‍රද්ධාවෙන් කටයුතු දෙය නොකරණ ලද්දේවේද, කුශල ධර්මයන්හි පවට ලජ්ජාවෙන් කටයුතු දෙය නොකරන ලද්දේවේද, කුශල ධර්මයන්හි පවට බියෙන් කටයුතු දෙය නොකරණ ලද්දේවේද කුශල ධර්මයන්හි වීර්යයයෙන් කටයුතු දෙය නොකරණලද්දේවේද, කුශල ධර්මයන්හි ප්‍රඥාවෙන් කටයුතුදෙය නොකරණ ලද්දේවේද, මහණෙනි, ඒතාක් මේ භික්ෂුතෙම මා විසින් රැකියයුතු වේ.

5. "මහණෙනි, යම් තැනෙක පටන් භික්ෂූහුගේ කුශල ධර්මයන්හි ශ්‍රද්ධාවෙන් කටයුත්ත කරණ ලද්දේවේද, කුශල ධර්මයන්හි ලජ්ජාවෙන් කටයුත්ත කරණලද්දේවේද, කුශල ධර්මයන්හි පවට බියෙන් කටයුත්ත කරණලද්දේවේද, කුශල ධර්මයන්හි වීර්යයෙන් කටයුත්ත කරණලද්දේවේද, කුශල ධර්මයන්හි ප්‍රඥාවෙන් කටයුත්ත කරණ ලද්දේවේද, මහණෙනි, දැන් මම ඒ සෝවාන්වූ භික්ෂුව කෙරෙහි දැන් භික්ෂුතෙම තමා විසින් රක්නාලද්දේ ප්‍රමාදවීමට සුදුසු නොවේ යයි අපෙක්ෂා නැත්තේ වෙමියි" වදාළේය.

5. **සද්ධම්මවචන සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම චුතවේ. ශාසනයෙහි නොපිහිටයි. කවර

පසකින්ද යත්? මහණෙනි ශ්‍රද්ධාව නැත්තාවූ භික්ෂුතෙම චුතවෙයි. ශාසනයෙහි නොපිහිටයි. මහණෙනි, පවට ලජ්ජා නැත්තාවූ භික්ෂුතෙම චුතවෙයි. ශාසනයෙහි නොපිහිටයි. මහණෙනි, පවට භය නැත්තාවූ භික්ෂුතෙම චුතවෙයි. ශාසනයෙහි නොපිහිටයි මහණෙනි, අලසවූ භික්ෂුතෙම චුතවෙයි. ශාසනයෙහි නොපිහිටයි. මහණෙනි, දුෂ්ප්‍රාඥවූ භික්ෂුතෙම චුතවෙයි. ශාසනයෙහි නොපිහිටයි.

2. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම චුත නොවෙයි. ශාසනයෙහි පිහිටයි, කවර පසකින්දයත්? මහණෙනි, ශ්‍රද්ධාව ඇති භික්ෂුතෙම චුත නොවෙයි ශාසනයෙහි පිහිටයි. මහණෙනි, ලජ්ජා ඇති භික්ෂුතෙම චුත නොවෙයි. ශාසනයෙහි පිහිටයි. මහණෙනි, භය ඇති භික්ෂුතෙම චුත නොවෙයි. ශාසනයෙහි පිහිටයි. මහණෙනි, පටන්ගන්නාලද වීර්ය ඇති භික්ෂුතෙම චුත නොවෙයි. ශාසනයෙහි පිහිටයි. මහණෙනි ප්‍රඥාව ඇති භික්ෂුතෙම චුත නොවෙයි. ශාසනයෙහි පිහිටයි. මහණෙනි, මේ කරුණු පසින් වනාහි යුක්තවූ භික්ෂුතෙම චුත නොවෙයි. ශාසනයෙහි පිහිටායයි වදාළේය."

**9. පඨම ආගාරව සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම ගෞරව නැත්තේ පිහිට නැත්තේ චුතවෙයි. ශාසනයෙහි නොපිහිටයි.

2. "කවර පසකින්දයත්? මහණෙනි, ශ්‍රද්ධාව නැත්තාවූ භික්ෂුතෙම

3. "ගෞරව නැත්තේ පිහිට නැත්තේ චුතවෙයි, ශාසනයෙහි නො පිහිටයි.

4. "මහණෙනි, ලජ්ජා නැත්තාවූ භික්ෂුතෙම (3 ඡේදය යෙදිය යුතුයි) මහණෙනි, භය නැත්තාවූ භික්ෂුතෙම (3 ඡේදය යෙදිය යුතුයි) මහණෙනි, අලසවූ භික්ෂුතෙම (3 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, දුෂ්ප්‍රාඥවූ භික්ෂුතෙම

5. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි)

6. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම ගෞරව සහිතවූයේ ප්‍රතිෂ්ඨා සහිතවූයේ චුත නොවෙයි. ශාසනයෙහි පිහිටයි.

7. "කවර පසකින්දයත්? මහණෙනි, ශ්‍රද්ධාව ඇත්තාවූ භික්ෂුතෙම

8. ගෞරව සහිතවූයේ ප්‍රතිෂ්ඨා සහිතවූයේ චුත නොවෙයි. ශාසනයෙහි පිහිටයි.

9. "මහණෙනි, පවට ලජ්ජා ඇති භික්ෂුතෙම (මෙහි 8 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, පවට භය ඇති භික්ෂුතෙම (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.)

මහණෙනි, පටන්ගන්නාලද වීර්ය ඇති භික්ෂුතෙම (මෙහි 8 ඡේදය යෙදිය යුතුයි) මහණෙනි, ප්‍රඥා සහිතවූ භික්ෂුතෙම (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.)

10. (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.)

**10. දුතිය අගාරව සූත්‍රයඃ-** 1. මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම ගෞරව නැත්තේ පිහිට නැත්තේ මේ ශාසනයෙහි වැඩීමට හටගැනීමට මහත් බවට පැමිණෙන්ට නුසුදුසුවේ.

2. "කවර පසකින්දයත්? මහණෙනි, ශ්‍රද්ධාව නැත්තාවූ භික්ෂුතෙම

3. "ගෞරව නැත්තේ පිහිට නැත්තේ මේ ශාසනයෙහි වැඩීමට, හටගැනීමට මහත් බවට පැමිණෙන්ට නුසුදුසුවේ.

4. "මහණෙනි, ලජ්ජා නැති භික්ෂුතෙම මහණෙනි, භය නැති භික්ෂුතෙම (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, කුසීතවූ භික්ෂුතෙම (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි) මහණෙනි, දුෂ්ප්‍රාඥවූ භික්ෂුතෙම (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

5. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම

6. "ගෞරව සහිතවූයේ ප්‍රතිෂ්ඨා සහිතවූයේ මේ ශාසනයෙහි වැඩීමට හටගැණීමට මහත් බවට පැමිණීමට සුදුසුවේ.

7. "කවර පසකින්ද යත්?

8. "මහණෙනි, ශ්‍රද්ධාව ඇති භික්ෂුතෙම

9. "මහණෙනි, පවට ලජ්ජා ඇති භික්ෂුතෙම (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, පවට භය ඇති භික්ෂුතෙම (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, පටන්ගන්නාලද වීර්‍ය ඇති භික්ෂුතෙම (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, ප්‍රඥාව ඇති භික්ෂු තෙම (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි. මහණෙනි, මේ කරුණු පසින් වනාහි යුක්තවූ භික්ෂුතෙම (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි)

---

## 2. බාල වර්ගය.

11. **පඤ්ච තථාගත බල සූත්‍රය**:- 1. "මහණෙනි, මම පෙර නොඅසන ලද චතුරාර්‍ය සත්‍ය ධර්මයන්හි විශිෂ්ට ඥානයෙන් දැන කෙළවර කිරීමෙන් පරතෙරට පැමිණියේ ප්‍රතිඥා කෙළෙමි.

2. "මහණෙනි, යම් බලයකින් යුක්තවූ තථාගතතෙම ශ්‍රෙෂ්ඨවූ කාරණය ප්‍රතිඥා කෙරේද, අටපිරිස්හි අභීත නාදය පවත්වාද ශ්‍රෙෂ්ඨවූ ධර්මචක්‍රය පවත්වාද, තථාගතයන්ගේ එබඳුවූ මේ තථාගත බල පසක් වෙත්.

2. "කවර පසක්ද යත්? ශ්‍රද්ධාබලය, හිරිබලය, ඔත්තප්ප බලය, වීර්‍ය බලය, ප්‍රඥා බලය යන පසයි.

4. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

12. **කූටාගාරොපම සූත්‍රය**:- 1, 2, (මේ ඡේද 1 වර්ගයේ 1 සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

3. "මහණෙනි, මේ ශෛක්ෂ බල පස අතුරෙන් යම් මේ ප්‍රඥා බලයක් වේද, මෙය උතුම්වේ. මෙය සංග්‍රහ කිරීම ඇත්තක්වේ. මෙය ගැලපීම ඇත්තක් වේ.

4. "මහණෙනි, යම්සේ කුළුගෙයක යම් මේ කූටයක් හෙවත් මුදුනක් වේද, මෙය උතුම් වේද මෙය සංග්‍රහ කිරීම ඇත්තක් වේද, මෙය ගැලපීම ඇත්තක් වේද,

5. "මහණෙනි, මෙපරිද්දෙන්ම (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

6. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 3 ඡේදය මෙනි)

7. "මහණෙනි, එහෙයින් මේ ශාසනයෙහි මෙසේ හික්මිය යුතුයි. ශෛක්ෂ බලයවූ ශ්‍රද්ධා බලයෙන් යුක්ත වන්නෙමු.

8. "මහණෙනි, එහෙයින් මේ ශාසනයෙහි මෙසේ හික්මිය යුතුයි. ශෛක්ෂ බලයවූ හිරිබලයෙන් යුක්ත වන්නෙමු.

9. "මහණෙනි, එහෙයින් මේ ශාසනයෙහි මෙසේ හික්මිය යුතුයි. ශෛක්ෂ බලයවූ ඔත්තප්ප බලයෙන් යුක්ත වන්නෙමු.

10. "මහණෙනි, එහෙයින් මේ ශාසනයෙහි මෙසේ හික්මිය යුතුයි. ශෛක්ෂ බලයවූ වීර්ය බලයෙන් යුක්ත වන්නෙමු.

11. "මහණෙනි, එහෙයින් මේ ශාසනයෙහි මෙසේ හික්මිය යුතුයි. ශෛක්ෂ බලයවූ ප්‍රඥා බලයෙන් යුක්ත වන්නෙමු.

12. "මහණෙනි, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයයි" වදාළේය."

13. **සංඛිත්ත බල සූත්‍රය**:- 1. "මහණෙනි, මේ බල පසක් වෙත්. කවර පසක්ද යත්? ශ්‍රද්ධා බලය, වීර්යබලය, ස්මෘති බලය, සමාධි බලය, ප්‍රඥා බලය යන පසයි.

2. "මහණෙනි, මොහු වනාහි බල පසවෙත්යයි" වදාළේය.

14. **විත්ථත බල සූත්‍රය**:- 1 (මේ ඡේදය මේ පණ්ණාසකයේ 13 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. (මේ ඡේදය මේ වර්ගයේ 2 සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

3. (මේ ඡේදය 1 වර්ගයේ 2 සූත්‍රයේ 5 ඡේදය මෙනි.)

4. "මහණෙනි, ස්මෘති බලය නම් කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්යශ්‍රාවකතෙම උතුම්වූ සිහියෙන් යුත්

ප්‍රඥාවෙන් යුක්තවූයේ කළ බොහෝ කල් ඇත්තද, කී බොහෝ කල් ඇත්තද සිහි කරන්නේ නැවත නැවත සිහි කරන්නේ සිහි ඇත්තේ වේද, මහණෙනි, මෙය ස්මෘති බලයයි කියනු ලැබේ.

**5.** "මහණෙනි, සමාධි බලය නම් කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්යශ්‍රාවක තෙම කාමයන්ගෙන් වෙන්වම (මෙහි තික නිපාතයේ බ්‍රාහ්මණ වර්ගයෙහි 9 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි. අ.1ඃ පිට 305) සතරවෙනි ධ්‍යානයට පැමිණ වාසය කෙරේද, මහණෙනි, මේ සමාධිබලයයි කියනු ලැබේ.

**6.** (මේ ඡේදය 1 වර්ගයේ 2 සූත්‍රයේ 6 ඡේදය මෙනි.)

**7.** "මහණෙනි, මොහු වනාහි බල පස වෙත්යයි" වදාළේය.

**15. දට්ඨබ්බ බල සූත්‍රයඃ-** 1 "මහණෙනි, මේ බල පසක් වෙත්. කවර පසක්ද යත්? ශ්‍රද්ධා බලය, වීර්ය බලය, ස්මෘති බලය, සමාධි බලය, ප්‍රඥා බලය යන පසයි.

**2.** "මහණෙනි, ශ්‍රද්ධා බලය නම් කොතැන්හි දත යුතුද? සිව් වැදෑරුම් සෝවාන් මාර්ගාංගයන්හි මෙහි ශ්‍රද්ධා බලය දත යුතුයි. මහණෙනි, වීර්ය බලය නම් කොතැන්හී දත යුතුද? සතර සම්‍යක් ප්‍රධානයන්හි මෙහි කී වීර්ය බලය දත යුතුයි. මහණෙනි, ස්මෘති බලය කොතැන්හි දත යුතුද? සතර සති පට්ඨානයන්හි මෙහි කී ස්මෘති බලය දත යුතුයි. මහණෙනි, කොතැන්හි සමාධි බලය දතයුතුද? සතර ධ්‍යානයන්හි මෙහි කී සමාධි බලය දතයුතුයි. මහණෙනි, කොතැන්හි ප්‍රඥා බලය දතයුතුද? චතුරාර්ය සත්‍යයන්හි මෙහි කී ප්‍රඥා බලය දතයුතුයි.

**3.** (මේ ඡේදය මේ වර්ගයේ 14 සූත්‍රයේ 7 ඡේදය මෙනි)

**16. අග්ගබල සූත්‍රයඃ-** 1 (මේ ඡේදය මේ වර්ගයේ 15 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

**2, 3, 4.** (මේ ඡේද මේ වර්ගයේ 1 සූත්‍රයේ 3, 4, 5 ඡේදය මෙන් වෙත්.)

**17. අත්තහිත පටිපන්න සූත්‍රයඃ-** 1 "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම තමහට වැඩ පිණිස පිළිපන්නේ වෙයි. අනුන්ට වැඩ පිණිස නොවේ.

2. "කවර පසක්ද යත්, "මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙමේ ශීලයෙන් යුක්ත වූයේ වෙයිද, අන්‍යයා ශීල සම්පත්තියෙහි සමාදන් නොකරවාද, තෙමේ සමාධියෙන් යුක්තවේද, අන්‍යයා සමාධි සම්පත්තියෙහි සමාදන් නොකරයිද, තෙමේ ප්‍රඥාවෙන් යුක්තවූයේ වේද, අන්‍යයා ප්‍රඥා සම්පත්තියෙහි සමාදන් නොකරවාද, තෙමේ විමුක්තියෙන් යුක්තවූයේ වේද, අන්‍යයා විමුක්ති සම්පත්තියෙහි සමාදන් නොකරවාද, තෙමේ විමුක්ති ඥාණ දර්ශණයෙන් යුක්තවූයේ වේද, අන්‍යයා විමුක්ති ඥාන දර්ශණ සම්පත්තියෙහි සමාදන් නොකරවාද,

3. (මෙය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

18. **පරහිත පටිපන්න සූත්‍රයː-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම අනුන්ට වැඩ පිණිස පිළිපන්නේ වෙයි. තමහට වැඩ පිණිස නොවේ.

2. කවර පසකින්ද යත්? මහණෙනි මේ ශාසනයෙහි භික්ෂුතෙම තෙමේ සිල්වත් නොවේද, අන්‍යයා ශීල සම්පත්තියෙහි සමාදන් කරවාද, තෙමේ සමාධියෙන් යුක්ත නොවේද, අන්‍යයා සමාධි සම්පත්තියෙහි සමාදන් කරවාද, තෙමේ ප්‍රඥාවෙන් යුක්ත නොවේද, අන්‍යයා ප්‍රඥා සම්පත්තියෙහි සමාදන් කරවාද, තෙමේ විමුක්තියෙන් යුක්ත නොවේද, අන්‍යයා විමුක්ති සම්පත්තියෙහි සමාදන් කරවාද, තෙමේ විමුක්ති ඥාන දර්ශනයෙන් යුක්ත නොවේද, අන්‍යයා විමුක්ති ඥාන දර්ශන සම්පත්තියෙහි සමාදන් කරවාද,

3. (මෙය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි)

19. **නොඅත්ත පරහිත පටිපන්න සූත්‍රයː-** 1. "මහණෙනි කරුණු පහකින් යුක්තවූ භික්ෂුතෙම තමහට වැඩ පිණිස නොම පිළිපන්නේ වෙයි. අනුන් හට වැඩ පිණිසද නොවේ.

2. "කවර පසකින්ද යත්, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම තෙමේ ශීලයෙන් යුක්ත නොවේද, අන්‍යයා ශීල සම්පත්තියෙහි සමාදන් නොකරවාද, තෙමේ සමාධියෙන් යුක්ත

නොවේද, අන්‍යයා සමාධි සම්පත්තියෙහි සමාදන් නොකරවාද, තෙමේ ප්‍රඥා සම්පත්තියෙන් යුක්ත නොවේද, අන්‍යයා ප්‍රඥා සම්පත්තියෙහි සමාදන් නොකරවාද, තෙමේ විමුක්තියෙන් යුක්ත නොවේද, අන්‍යයා විමුක්ති සම්පත්තියෙහි සමාදන් නොකරවාද, තෙමේ විමුක්ති ඥාන දර්ශනයෙන් යුක්ත නොවේද, අන්‍යයා විමුක්ති ඥානදර්ශන සම්පත්තියෙහි සමාදන් නොකරවාද,

3. (මෙය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි)

**20. අත්ත පරහිත පටිපන්න සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම තමහට වැඩ පිණිසද අනුන්හට වැඩ පිණිසද පිළිපන්නේ වෙයි.

2. "කවර පසකින්ද යත්. මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම තෙමේත් සිල්වත් වේද, අනුන්ද ශීල සම්පත්තියෙහි සමාදන් කරවාද, තෙමේත් සමාධියෙන් යුක්තවේද අනුන්ද සමාධි සම්පත්තියෙහි සමාදන් කරවාද, තෙමේත් ප්‍රඥාවෙන් යුක්ත වේද, අනුන්ද ප්‍රඥා සම්පත්තියෙහි සමාදන් කරවාද, තෙමේත් අර්හත් ඵල විමුක්තියෙන් යුක්ත වේද, අනුන්ද විමුක්ති සම්පත්තියෙහි සමාදන් කරවාද, තෙමේත් විමුක්ති ඥාන දර්ශනයෙන් හෙවත් ප්‍රත්‍යවෙක්ෂා නුවණින් යුක්ත වේද, අනුන්ද විමුක්ති ඥාන දර්ශන සම්පත්තියෙහි සමාදන් කරවාද,

3. (මෙය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

**(දෙවෙනි බල වර්ගය නිමි.)**

---

## 3. පඤ්චංගික වර්ගය

**21. ආභිසමාචාර පූරණ සූත්‍රය:-** 1. "මහණෙනි, ඒකාන්තයෙන් ඒ භික්ෂුතෙම, සබ්‍රහ්මචාරීන් කෙරෙහි ගෞරව රහිතවූයේ අනාදර වූයේ සභාග පැවතුම් නැත්තේ ආභිසමාචාරික වත සම්පූර්ණ කරන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "ආභිසමාචාරික වත සම්පූර්ණ නොකොට ශෛක්ෂ ධර්මය සම්පූර්ණ කරන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. ශෛක්ෂ ධර්මය සම්පූර්ණ නොකොට සිල් සම්පූර්ණ කරන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ.

3. "සිල් සම්පූර්ණ නොකොට සම්‍යක් දෘෂ්ටිය සම්පූර්ණ කරන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ.

4. "සම්‍යක් දෘෂ්ටිය සම්පූර්ණ නොකොට සම්‍යක් සමාධිය සම්පූර්ණ කරන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ.

5. "මහණෙනි, ඒකාන්තයෙන් ඒ භික්ෂුතෙම බ්‍රහ්මචාරීන් කෙරෙහි ගෞරව සහිතවූයේ ආදර සහිතවූයේ සමාන පැවතුම් ඇත්තේ ආභිසමාචාරික වත (හෙවත් උතුම් හැසිරීම වූවන් වශයෙන් පනවන ලද සීලය) සම්පූර්ණ කරන්නේය යන මේ කාරණය විද්‍යමාන වේ.

6. "ආභිසමාචාරික වත සම්පූර්ණ කොට ශෛක්ෂ ධර්මය හෙවත් ශෛක්ෂ ප්‍රඥප්ති සීලය සම්පූර්ණ කරන්නේය, යන මේ කාරණය විද්‍යමාන වේ.

7. "ශෛක්ෂ ධර්මය සම්පූර්ණ කොට සිව් මහසිල් පුරන්නේය යන මේ කාරණය විද්‍යමාන වේ.

8. "සිව් මහසිල් පුරා සම්‍යක් දෘෂ්ටිය සම්පූර්ණ කරන්නේය යන මේ කාරණය විද්‍යමාන වේ.

9. "සම්‍යක් දෘෂ්ටිය සම්පූර්ණ කොට සම්‍යක් සමාධිය සම්පූර්ණ කරන්නේය යන මේ කාරණය විද්‍යමාන වේයයි' වදාළේය."

22. **දුතිය ආභිසමාචාර පූරණ සූත්‍රයː-** 1, 2 (මේ ඡේද මේ වර්ගයේ 1 සූත්‍රයේ 1, 2 ඡේද මෙන් වෙත්.)

3. "ශීලස්කන්ධය සම්පූර්ණ නොකොට සමාධි ස්කන්ධය සම්පූර්ණ කරන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ.

4. "සමාධිස්කන්ධය සම්පූර්ණ නොකොට ප්‍රඥා ස්කන්ධය සම්පූර්ණ කරන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**5, 6.** (මේ ඡේද මේ වර්ගයේ 1 සූත්‍රයේ 5, 6 ඡේද මෙන් වෙත්.

**7.** (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 7 ඡේදය මෙනි.)

**8.** "ශීලස්කන්ධය සම්පූර්ණකොට සමාධි ස්කන්ධය සම්පූර්ණ කරන්නේය යන මේ කාරණය විද්‍යමානවේ.

**9.** "සමාධි ස්කන්ධය සම්පූර්ණකොට ප්‍රඥාස්කන්ධය සම්පූර්ණ කරන්නේය යන මේ කාරණය විද්‍යමාන වේයයි වදාළේය."

**23. ජාතරූපක්කිලෙස සූත්‍රයඃ-** 1. "මහණෙනි, යම්බඳු කෙලෙසීම් වලින් කෙලෙසුනාවූ ස්වර්ණය මෘදු නොමවේද කර්මයට සුදුසු නොවේද, පැහැ විහිදීම ඇත්තක් නොවේද නැමෙන ස්වභාව ඇත්තක් නොවේද කර්මාන්තයට මනාකොට නොපැමිණේද,

**2.** "එබඳුවූ ස්වර්ණයාගේ මේ කෙළෙසීම් පසක් වෙත්. කවර පසක්ද යත්, යකඩය, ලෝහය, ඊයම්ය, කලු ඊයම්ය. රිදීය යන පසයි.

**3.** (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.) එබඳුවූ ස්වර්ණයාගේ මේ පස වනාහි උපෙක්ෂා වෙත්.

**4.** "මහණෙනි, යම්තැනෙක පටන් ස්වර්ණය මේ කෙළෙසීම් පසින් මිදුනේ වේද, ඒ ස්වර්ණය මෘදුවූයේද කර්මක්ෂම වූයේද, ප්‍රභාශ්වර වූයේද නැමීම ඇත්තේ මනාකොට කර්මාන්තයට පැමිණේද, යම් යම් පළඳනා විශෙෂයක් කිරීමට කැමතිවේද ඉදින් මුදුවක් පිණිසද, ඉදින් කුණ්ඩලාභරණයක් පිණිසද, ඉදින් ග්‍රීවාභරණයක් පිණිසද, ඉදින් රන් මාලයක් පිණිසද වේ නම්, ඔහුට ඒ අර්ථය සිද්ධ කෙරේද,

**5.** "මහණෙනි, මෙපරිද්දෙන්ම යම් කෙළෙසීම්වලින් කිළුටුවූ සිත නොම මෘදු වේද, කර්මක්ෂම නොවේද ප්‍රභාශ්වර වූවක් නොවේද නැමීම ඇත්තක් වේද, ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම් පිණිස මනාකොට එකඟවනු නොලැබේද, එබඳුවූ මේ චිත්තයාගේ උපක්ලේශ පසක් වෙත්.

5. "කවර පසක්ද යත්? කාමාශාවය, ක්‍රොධය, සිතෙහි හා කයෙහි අලස බවය, උඩගු බව හා කුකුස් බවය, සැකය යන පසයි.

6. (මේ ඡෙදය මේ සූත්‍රයේ 5 ඡෙදය මෙනි)

7. මහණෙනි, යම්හෙයකින් වනාහි සිත මේ කෙළෙසීම් පසෙන් මිදුනේ වේද? ඒ සිත මෘදුවූයේද කර්මක්ෂම වූයේද ප්‍රභාශ්වර වූයේද, නොබිඳින්නේද, ආශ්‍රවයන්ගේ නැසීමට මනාකොට එකඟවේද විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කටයුතුවූ යම් යම් ධර්මයෙක් විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස සිත එළවාද ඒ ඒ ධර්මයෙහිම ඒ ඒ කරුණ ඇති කල්හි ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණේ.

8. ඉදින් හෙතෙම කැමති නම් අනෙකප්‍රකාරවූ ඉර්ධි විධිය ලබන්නේය (මෙහි දීඝනිකායේ 2 සූත්‍රයේ 6, 8 ඡෙදයේ "එකෙක්ව බොහෝසේ වෙති" යන තැන සිට යෙදිය යුතුයි.)

9. "ඒ ඒ කරුණ ඇති කල්හි ඒ ඒ තන්හිම ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණේ.

10. (මෙහි දීඝනිකායේ 2 සූත්‍රයේ 70 ඡෙදයේ "දිව්‍ය කණ... යන තැන සිට යෙදිය යුතුයි) ශබ්ද දෙක අසන්නේය. ඒ ඒ කරුණ ඇති කල්හි ඒ ඒ තන්හිම ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණේ.

"ඉදින් හෙතෙම කැමතිවේනම් අන්‍ය සත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත (මෙහි දීඝනිකායේ 2 සූත්‍රයේ 72 ඡෙදයේ "තම සිතින්" යන තැන සිට යෙදිය යුතුයි) ඒ ඒ කරුණා ඇතිකල්හි ඒ ඒ තන්හිම ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණේ.

12. "ඉදින් හෙතෙම කැමතිවේ නම්, අනෙකප්‍රකාරවූ පෙරවිසූ කඳ පිළිවෙළ සිහි කරන්නේය. (මෙහි දීඝනිකායේ 2 සූත්‍රයේ 74 ඡෙදයේ "එක්ජාතියක්ද" යන තැන සිට යොදා ගත යුතුයි) මෙසේ ඒ ඒ කාරණය ඇතිකල්හි ඒ ඒ තන්හිම ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

13. "ඉදින් මෙතෙම කැමතිවේ නම් පිරිසිදුවූ මිනිසැස ඉක්ම පවත්නාවූ දිව්‍යවූ ඇසින් (මෙහි දීඝනිකායේ 2 සූත්‍රයේ 75 ඡේදයේ 'හේ නොයෙක් පෙර විසීම්' යන තැන සිට යෙදිය යුතුයි.) ඒ ඒ කාරණය ඇතිකල්හි ඒ ඒ තන්හිම ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණේ. ඉදින් මෙතෙම කැමැතිවේ නම් ආශ්‍රවයන් නැසීමෙන් (මෙහි දීඝ නිකායේ 2 සූත්‍රයේ 78 ඡේදයේ " ඥානය පිණිස හිත" යන තැන සිට යොදා ගත යුතුයි) ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරන්නේයයි ඒ ඒ කාරණය ඇතිකල්හි ඒ ඒ තන්හිම ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණේයයි" වදාළේය.

24. **හතුපනිස සූත්‍රයඃ-** 1. "මහණෙනි, සීල විපත්තියට පැමිණියාවූ දුශ්ශීලයාගේ සම්‍යක් සමාධිය කරුණු රහිතවේ. සම්‍යක් සමාධිය නැතිකල්හි සම්‍යක් සමාධියෙන් විපතට පැමිණියහුගේ තත්වූ පරිදි නුවණින් දැකීම කරුණු රහිතවේ. තත්වූ පරිදි නුවණින් දැකීම නැතිකල්හි තත්වූ පරිදි නුවණින් දැකීමෙන් විපතට පැමිණියහුගේ කලකිරීම හා නොඇල්ම කරුණු රහිතවේ. කල්කිරීම නොඇල්ම නැති කල්හි කලකිරීමෙන් හා නොඇල්මෙන් විපතට පැමිණියහුගේ ඵල විමුක්තිය හා ප්‍රත්‍යවෙක්ෂා නුවණ කරුණු රහිතවේ.

2. "මහණෙනි, යම්සේ වෘක්ෂය තෙම අතුපතරින් විපතට පැමිණියේ ඒ වෘක්ෂයාග් පතුරද සම්පූර්ණවීමට නොපැමිණේද සිවියද ඵලයද හරයද සම්පූර්ණවීමට නොපැමිණේද, මහණෙනි, මෙපරිද්දෙන්ම (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

3. "මහණෙනි, සීල සම්පන්නවූ සිල්වත්හුගේ සම්‍යක් සමාධිය හේතු සහිතවේ. සම්‍යක් සමාධිය ඇතිකල්හි සම්‍යක් සමාධියෙන් යුක්තවූවහුගේ තත්වූ පරිදි නුවණින් දැකීම හේතු සහිතවේ. තත්වූ පරිදි නුවණින් දැකීම ඇතිකල්හි තත්වූ පරිදි නුවණින් දැකීම ඇත්තහුගේ කලකිරීම හා නොඇල්ම හේතු සහිතවේ. කලකිරීම හා නොඇල්ම ඇති කල්හි කලකිරීම හා නොඇල්ම ඇත්තහුගේ ඵල විමුක්තිය හා ප්‍රත්‍යවෙක්ෂා නුවණ හේතු සහිත වේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "මහණෙනි, යම්සේ වෘක්ෂය තෙම අතුපතරින් යුක්තවූයේ ඒ වෘක්ෂයාගේ පතුරද සම්පූර්ණවීමට පැමිණෙද්ද, සිවියද ඵලයද හරයද සම්පූර්ණවීමට පැමිණේද මහණෙනි, මෙපරිද්දෙන්ම (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

**25. අනුග්ගහිත දිට්ඨි සූත්‍රය**:- 1. "මහණෙනි, කරුණු පසකින් අනුග්‍රහ කරණ ලද විදර්ශනා සම්‍යක් දෘෂ්ටි තොමෝ මාර්ග ඵල සමාධිය ඵලය කොට ඇත්තීද, මාර්ගඵල සමාධිය අනුසස්කොට ඇත්තීද මාර්ගඵල ඥානය ඵලකොට ඇත්තීද මාර්ගඵල ඥානය අනුසස් කොට ඇත්තීද වේ.

2. "කවර කරුණු පසකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි සම්‍යක් දෘෂ්ටි තොමෝ සීලයෙන් අනුග්‍රහ කරණ ලද්දී වේද, බහුශ්‍රැත භාවයෙන් අනුග්‍රහ කරණ ලද්දී වේද ධර්ම සාකච්ඡාවෙන් අනුග්‍රහ කරණ ලද්දී වේද චිත්තෛකාග්‍රතාවෙන් අනුග්‍රහ කරණ ලද්දී වේද, විදර්ශනා භාවනාවෙන් අනුග්‍රහ කරණ ලද්දීවේද,

3. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

**26. විමුත්තායතන සූත්‍රය**:- 1. "මහණෙනි, යම් කරුණෙක්හි කෙළෙස් තවන වීර්ය ඇතිව, හරණ ලද ආත්මාලය ඇතිව, අප්‍රමාදව වාසය කරණ භික්ෂූහුගේ කෙලෙසුන් කෙරෙන් නොමිදුනාවූ සිත හෝ මිදේද ක්ෂය නොවූ ආශ්‍රව හෝ ක්ෂය කිරීමට යෙද්ද, නොපැමිණියාවූ හෝ නිරුත්තරවූ යොගක්ෂෙම සංඛ්‍යාත නිවණට පැමිණේද,

2. "එබඳුවූ මේ මිදීමට කරුණු පසක් වෙත්. කවර පසක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුහට ශාස්තෘන් වහන්සේ හෝ ගුරුතන්හි සිටියාවූ සබ්‍රහ්මචාරීවූ එක්තරා තෙර නමක් හෝ චතුරාර්ය සත්‍ය ධර්මය දෙශනා කෙරේද, මහණෙනි, යම් යම්පරිද්දකින් ඒ භික්ෂුහට ශාස්තෘන් වහන්සේ හෝ ගුරුතන්හි සිටියාවූ එක්තරා සබ්‍රහ්මචාරී තෙරනමක් හෝ ධර්මය දෙශනා කෙරේද, ඒ ඒ පරිද්දෙන් ඒ භික්ෂුතෙම ඒ ධර්මයෙහි අර්ථය දන්නේද වේ. ධර්මය දන්නේද වේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "අර්ථය දන්නාවූද ධර්මය දන්නාවූද ඔහුට ප්‍රමුදිත භාවය උපදී. ප්‍රමුදිතවූවහුට ප්‍රීතිය හටගනියි. ප්‍රීති සිත් ඇත්තහුගේ කය සැහැල්ලුවේ. සැහැල්ලුවූ කය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත එකඟ වේ.

4. (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.) එබඳුවූ මේ පළමුවන විමුක්ති කාරණය වේ.

5. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට ශාස්තෘන් වහන්සේ නොම ධර්ම දෙශනා කරයි. ගුරුතන්හි සිටියාවූ එක්තරා සබ්‍රහ්මචාරී කෙනෙක් හෝ දෙශනා නොකරයි. එතකුදු වුවත් ඇසූ පරිදි පිරිවහණ ලද පරිදි, ධර්මය අනුන්ට දෙශනා කරයි.

6. "මහණෙනි, යම් යම් පරිද්දකින් භික්ෂුතෙම අසන ලද පරිදිවූ පිරිවහණලද පරිදිවූ ධර්මය විස්තරයෙන් අනුන්ට දෙශනා කෙරේද, ඒ ඒ පරිද්දෙන් ඒ භික්ෂුතෙම ඒ ධර්මයෙහි අර්ථ දන්නේද ධර්මය දන්නේද වේ.

7. (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

8. (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.) එබඳුවූ මේ දෙවන විමුක්ති කාරණය වේ.

9. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට ශාස්තෘන් වහන්සේ හෝ ගුරුතන්හි සිටියාවූ සබ්‍රහ්මචාරීවූ එක්තරා තෙරනමක් හෝ ධර්මය දෙශනා නොකෙරේද, අසන ලද පරිදි පිරිවහණ ලද පරිදි ධර්මය විස්තර වශයෙන් අනුන්ට දෙශනා නොකෙරේද යළිදු අසන ලද පරිදි පිරිවහණ ලද පරිදි ධර්මය විස්තර වශයෙන් සජ්ක්ධායනා කෙරෙයි.

10. (මේ ඡේදය මේ සූත්‍රයේ 6 ඡේදය මෙනි.)

11. (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

12. (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.) ඒ මේ තුන්වන විමුක්ති කාරණය වේ.

**13.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට ශාස්තෲන් වහන්සේ හෝ එක්තරා ගුරුතන්හි සිටියාවූ සබ්‍රහ්මචාරී කෙනෙක් හෝ ධර්මය නොම දෙශනා කෙරේද, අසන ලද පරිදි පිරිවහණ ලද පරිදි ධර්මය විස්තර වශයෙන් අනුන්ට නොම දෙශනා කෙරේද, අසන ලද පරිදි පිරිවහණ ලද පරිදි ධර්මය විස්තර වශයෙන් නොම සජ්ක්ධායනා කෙරේද, යළිත් අසන ලද පරිදි පිරිවහණ ලද පරිදි ධර්මය සිතින් අනුව කල්පනා කෙරේද, අනුව හැසිරේද, සිතින් සලකා බලයිද, මහණෙනි, යම් යම් පරිද්දකින් භික්ෂුතෙම අසන ලද පරිදි පිරිවහණ ලද පරිදි ධර්මය සිතින් කල්පනා කෙරේද අනුව හැසිරේද, සිතින් සළකා බලාද ඒ ඒ පරිද්දෙන් හෙතෙම ඒ ධර්මයෙහි අර්ථය දන්නේද ධර්මය දන්නේද වේ.

**14.** (මේ ඡෙදය මේ සූත්‍රයේ 3 ඡෙදය මෙනි.)

**15.** (මෙහි මේ සූත්‍රයේ 1 ඡෙදය යෙදිය යුතුයි.) ඒ මේ සතරවෙනි විමුක්ති කාරණය වේ.

**16.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුහට ශාස්තෲන් වහන්සේ හෝ එක්තරා ගුරුතන්හි සිටියාවූ සමාන බඹසර ඇත්තෙක් හෝ නොම ධර්මය දෙශනා කෙරේද, අසන ලද පරිදි පිරිවහණ ලද පරිදි ධර්මය විස්තර වශයෙන් අනුන්ට නොම දෙශනා කෙරේද, අසන ලද පරිදි පිරිවහණ ලද පරිදි ධර්මය විස්තර වශයෙන් නොම සජ්ක්ධායනා කෙරේද අසන ලද පරිදි පිරිවහණ ලද පරිදි ධර්මය සිතින් නොම කල්පනා කෙරේද නොම හසුරුවාද සිතින් නොම සලකා බලාද එතකුදු වුවත් මොහු විසින් එක්තරා සමාධි නිමිත්තක් මනාකොට ගන්නාලද්දේ මනාකොට මෙනෙහි කරණ ලද්දේ සිතින් මනාකොට දරණ ලද්දේ ප්‍රඥාවෙන් මනාකොට ප්‍රතිවෙධ කරණ ලද්දේවේද, මහණෙනි යම් යම් පරිද්දකින් භික්ෂුව විසින් එක්තරා සමාධි නිමිත්තක් මනාකොට ගන්නා ලද්දේ මනාකොට මෙනෙහි කරණ ලද්දේ මනාකොට සිතින් දරණ ලද්දේ, ප්‍රඥාවෙන් මනාකොට ප්‍රතිවෙධ කරණ ලද්දේ වේද, ඒ ඒ පරිද්දෙන් හෙතෙම ඒ ධර්මයෙහි අර්ථය දන්නේද ධර්මය දන්නේද වේ.

17. (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

18. (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.) එබඳුවූ මේ පස්වන විමුක්ති කාරණය වේ.

19. (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.) ඒ මේ විමුක්ති කරුණු පස වෙත්යයි" වදාළේය."

**27. අප්පමාණ සමාධි සූත්‍රය:-** 1. "මහණෙනි, ප්‍රඥාවෙන් හා සිහියෙන් යුක්තව අප්‍රමානවූ සමාධිය වඩව්. මහණෙනි, ප්‍රඥාවෙන් හා සිහියෙන් යුක්තව අප්‍රමානවූ සමාධිය වඩන්නවුන්ට ප්‍රත්‍යවෙක්ෂා නුවණ පසක් තම තමන් කෙරෙහිම උපදිත්.

2. "කවර පසක්ද යත්? මේ සමාධිය තෙම පවත්නා කාලයෙහි සැප ඇත්තේද මතු සැප විපාක ඇත්තේද වේයයි තමන් කෙරෙහිම නුවණ උපදියි. මේ සමාධිය තෙම ක්ලෙශයන්ගෙන් දුරුවූ බැවින් උතුම්ය. කාමාදී ආමිෂ රහිතයයි තමන් කෙරෙහිම නුවණ උපදියි. මේ සමාධිය තෙම බුද්ධාදී අලාමක පුරුෂයන් විසින් සෙවනය කරණ ලද්දේයයි තමන් කෙරෙහිම නුවණ උපදියි. මේ සමාධිය තෙම ශාන්තය, ප්‍රණීතය. කෙලෙස් දුරලන ලද්දවුන් විසින් ලබන ලද්දේය. සිත එකඟ කිරීම ඇති බැවින් ලබන ලද්දේය. ප්‍රයෝග සහිතව නිග්‍රහකොට වැළැක්වීම ඇත්තේ නොවේයයි තමන් කෙරෙහිම නුවණ උපදියි. ඒ මම වනාහි මේ සමාධියට සිහි ඇත්තේම පැමිණෙමියි සිහි ඇත්තේම එයින් නැගිටිමියි තමන් කෙරෙහිම නුවණ උපදියි.

3. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

**28. පඤ්චංගික සමාධි සූත්‍රය:-** 1. "මහණෙනි, ආර්යවූ අංග පසකින් යුක්තවූ සම්‍යක් සමාධිහුගේ වැඩීම දෙශනා කරන්නෙමි. එය අසව් යහපත් කොට මෙනෙහි කරව්. කියන්නෙමියි" වදාළේය. 'එසේය. ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ආර්යවූ අංග පසකින් යුක්තවූ සමාධිහුගේ භාවනා තොමෝ කවරීද,

3. "මහණෙනි. මේ ශාසනයෙහි භික්ෂුතෙම කාමයන්ගෙන් වෙන්ව, අකුශල ධර්මයන්ගෙන් වෙන්ව පළමුවන ධ්‍යානයට පැමිණ වාසය කරයි.

4. "හෙතෙම මේ ශරීරයම විවේකයෙන් හටගත්තාවූ ප්‍රීති සැපයෙන් මොනවට තෙමයි. හාත්පස තෙමයි. සම්පූර්ණ කරයි හාත්පසින් පතුරුවයි.

5. "මොහුගේ සියලුම කය පිළිබඳ කිසිවක් විවේකයෙන් හටගත්තාවූ ප්‍රීති සැපයෙන් ස්පර්ශ නොකරණ ලද්දේ නොවේ. මහණෙනි, යම්සේ දක්ෂවූ නහාපකයෙක් හෙවත් ස්නානය කරවන්නෙක් හෝ නහාපකයෙකුගේ අතවැසියෙක් හෝ ලෝතලියෙක්හි නැහැවීමට ගන්නා සුණු බහා ජලයෙන් ඉස ඉස පිඩුකරන්නේද, යම්හෙයකින් දියවර අනුව ගියාවූ දියවරින් යුක්තවූ ඇතුළත පිටත තෙත් ගතියෙන් පැතිරීම ඇති ඒ නහාන සුණුපිඩ නොමවැගිරේද, මහණෙනි, මෙපරිද්දෙන්ම,

6. (මේ ඡේදය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි)

7. "මොහු විසින් සියලුම කය පිළිබඳ කිසි තැනක් විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් ස්පර්ශ නොකරණ ලද්දේ නොවෙයි. මහණෙනි, ආර්යවූ අංග පසකින් යුක්තවූ සම්‍යක් සමාධිහුගේ මේ පළමුවන භාවනාව වේ. මහණෙනි, නැවත අනිකක්ද කියමි.

8. "භික්ෂුතෙම විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම් ඇති සිත හා එකට පහළවූ විතර්ක නැති විචාර නැති සමාධියෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති දෙවන ධ්‍යානයට පැමිණ වාසය කරයි.

9. "මොහු විසින් සියලුම කය පිළිබඳ කිසිතැනක් සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් ස්පර්ශ නොකරණ ලද්දේ නොවෙයි.

10. "මහණෙනි, යම්සේ උඩට බිඳගෙණ එන්නාවූ ජලය ඇති දියවිලක් වේද, ඒ විලට පූර්ව දිශාවෙන් දිය එන්නාවූ මගක් නොම වන්නේද, පැසුළු දිශාවෙන් දිය එන මගක්

නොවන්නේද, උතුරු දිශාවෙන් දිය එන මගක් නොවන්නේද, දකුණු දිශාවෙන් දිය එන මගක් නොවන්නේද, මේඝයද කලින් කල මනාකොට වර්ෂා ජලය ඇතුල් නොකරන්නේද, වැලිදු ඒ දිය විලම සිහිල්වූ ජලයෙන් මනාව තෙමන්නේද, හාත්පස තෙමන්නේද පුරවන්නේද හාත්පස පතුරන්නේද සියලුම මේ දියවිල පිළිබඳ කිසිතැනක් සිහිල් ජලයෙන් ස්පර්ශ නොකරණ ලද්දේ නොවන්නේද,

11. "මහණෙනි, එපරිද්දෙන්ම භික්ෂුතෙම මෙම ශරීරය සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් මනාව තෙමයි. හාත්පස තෙමයි. පුරවයි. හාත්පස පතුරයි. මොහු විසින් සියලුම කය පිළිබඳ කිසි තැනක් සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් ස්පර්ශ නොකරණ ලද්දේ නොවෙයි. මහණෙනි, ආර්යවූ අංග පසකින් යුක්තවූ සම්‍යක් සමාධිහුගේ මේ දෙවන භාවනාව වේ.

12. "නැවත අනිකක්ද කියමි. මහණෙනි, භික්ෂුතෙම ප්‍රීතිහුගේද නොඇල්මෙන් උපෙක්ෂා ඇතිව වාසය කරයි. සිහි ඇත්තේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ කයින් සැපක් විඳියි. උපෙක්ෂා ඇති සිහි ඇති සැප විහරණයකැයි යමක් ආර්යයෝ කියයිද, තුන්වන ධ්‍යානයට පැමිණ වාසය කරයි. හෙතෙම මෙම ශරීරය ප්‍රීති රහිතවූ සැපයෙන් මනාව තෙමයි. හාත්පස තෙමයි, පුරවයි. හාත්පස පතුරයි. මේ සියලුම කරජකය පිළිබඳ කිසි තැනක් ප්‍රීති රහිතවූ සැපයෙන් ස්පර්ශ නොකරණ ලද්දේ නොවෙයි.

13. "මහණෙනි, යම්සේ උපුල් විලක හෝ පියුම් විලක හෝ හෙළ පියුම් විලක හෝ ඇතැම් උපුල් හෝ පියුම් හෝ හෙළ පියුම් හෝ දියෙහි හටගත්තාහු දියෙහි වැඩුනාහු දියෙන් උඩට නොපැමිණියාහු ඇතුළත ගැලී පොෂණය වූවාහු වෙද්ද, ඔව්හු අග දක්වාද මුල දක්වාද සිහිල්වූ ජලයෙන් මනාව තෙමුනාහු හාත්පස තෙමුනාහු පිරුණාහු හාත්පස පැතුරුණාහු වෙද්ද සියලුම උපුල් පිළිබඳ හෝ පියුම් පිළිබඳ හෝ හෙළ පියුම් පිළිබඳ හෝ මොහුගේ කිසිතැනක් සිහිල්වූ ජලයෙන් ස්පර්ශ නොකරණ ලද්දේ නොවන්නේද,

14. "මහණෙනි, මෙපරිද්දෙන්ම භික්ෂුතෙම මෙම ශරීරය ප්‍රීති රහිතවූ සැපයෙන් මනාව තෙමයි, හාත්පස තෙමයි, පුරවයි, හාත්පස පතුරයි. මේ සියලුම කය පිළිබඳ කිසිවක් ප්‍රීති රහිතවූ සැපයෙන් ස්පර්ශ නොකරණ ලද්දේ නොවෙයි. මහණෙනි, ආර්යවූ අංග පසකින් යුක්තවූ සම්‍යක් සමාධිහුගේ මේ තුන්වන භාවනාව වේ.

15. "නැවත අනිකක්ද කියමි. මහණෙනි, භික්ෂුතෙම සැපය දුරුකිරීමෙන්ද, දුක දුරුකිරීමෙන්ද, සොම්නසය, දොම්නස දෙක නැතිවීමට පෙර දුක් නැති සැප නැති උපෙක්ෂා ස්මෘති දෙදෙනාගේ පිරිසිදුකම ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයි. හෙතෙම මෙම කරජකය පිරිසිදුවූ නිර්මලවූ සිතින් පැතිර හුන්නේ වෙයි. මේ සියලුම කය පිළිබඳ කිසිවක් පිරිසිදුවූ නිර්මලවූ සිතින් ස්පර්ශ නොකරණ ලද්දේ නොවෙයි. මහණෙනි, යම්සේ පුරුෂයෙක් සුදුවූ වස්ත්‍රයෙන් හිස සහිතව පොරවා හුන්නේ වන්නේද මේ සියලුම කය පිළිබඳ කිසිවක් සුදු වස්ත්‍රයෙන් ස්පර්ශ නොකරණ ලද්දේ නොවන්නේද, මහණෙනි, මෙපරිද්දෙන්ම භික්ෂුතෙම මෙම ශරීරය පිරිසිදුවූ නිර්මලවූ සිතින් පැතිරහුන්නේ වේ. මේ සියලුම කය පිළිබඳ කිසිවක් පිරිසිදුවූ නිර්මලවූ සිතින් ස්පර්ශ නොකරණ ලද්දේ නොවෙයි, මහණෙනි, ආර්යවූ අංග පසකින් යුක්තවූ සම්‍යක් සමාධිහුගේ මේ සතරවන භාවනා වේ.

16. "නැවත අනිකක්ද කියමි. මහණෙනි, භික්ෂූහුගේ ප්‍රත්‍යවෙක්ෂා ඥාන නිමිත්ත මනාව ගන්නා ලද්දේ මනාව මෙනෙහි කරණ ලද්දේ මනාව දරණ ලද්දේ නුවණින් මනාව අවබොධ කරණ ලද්දේ වේද, මහණෙනි. යම්සේ අනිකෙක් හෝ අනිකෙකු බලන්නේද සිටියේ හෝ හුන්නහු බලන්නේද හුන්නේ හෝ හොත් තැනැත්තහු බලන්නේද මහණෙනි, මෙපරිද්දෙන්ම භික්ෂූහුගේ ප්‍රත්‍යවෙක්ෂා ඥාන නිමිත්ත මනාව ගන්නා ලද්දේ මනාව මෙනෙහි කරණ ලද්දේ මනාව දරණ ලද්දේ නුවණින් මනාව ප්‍රතිවෙධ කරණ ලද්දේ වේයයි, මහණෙනි, ආර්යවූ අංග පසකින් යුක්තවූ සම්‍යක් සමාධිහුගේ මේ පස්වන භාවනාව වේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

17. "මහණෙනි, ආර්යවූ අංග පසකින් යුක්තවූ සම්‍යක් සමාධිය වනාහි මෙසේ වඩනා ලද කල්හි මෙසේ බහුල වශයෙන් කරණ ලද කල්හි යම් යම් විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කටයුතුවූ ධර්මයකට විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස සිත නමාද ඒ ඒ කරුණ ඇතිකල්හි ඒ ඒ ධර්මයෙහිම ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණේ.

18. "මහණෙනි, යම්සේ දිය සැලක් තෙම ආධාරකයෙහි තබන ලද්දේ දියෙන් පිරුණේ මුවවිට දක්වා පිරීම ඇත්තේ කවුඩන් විසින් පානය කළහැක්කේ වේද, එය බලවත් පුරුෂයෙක් තෙම යම් යම් දිශාවකින් කැමතිවන්නේද, ඒ ඒ දිශාවෙන් දියට එන්නේද?" - "ස්වාමීනි එසේය"

19. "මහණෙනි, මෙපරිද්දෙන්ම භික්ෂුතෙම ආර්යවූ අංග පසකින් යුක්තවූ සම්‍යක් සමාධිය මෙසේ වඩනා ලද කල්හි මෙසේ බහුල වශයෙන් කරණ ලද කල්හි යම් යම් විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කටයුතු ධර්මයක්හුගේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා සිත නමයි. ඒ ඒ කරුණ ඇතිකල්හි ඒ ඒ ධර්මයෙහිම ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණේ.

20. "මහණෙනි, යම්සේ සමවූ භූමිප්‍රදෙශයෙහි මියර බඳින ලද දිනේ පිරුණාවූ මුවවිට දක්වා පිරීම ඇති කවුඩන් විසින් පානය කළහැකි හතරැස් පොකුණක් වේද, එය බලවත් පුරුෂයෙක් යම් යම් තැනකින් මියර මුදන්නේද දියට පැමිණෙන්නේද?" - "ස්වාමීනි, එසේය."

21. "මහණෙනි, මෙපරිද්දෙන්ම භික්ෂුතෙම ආර්යවූ අංග පසකින් යුක්තවූ සම්‍යක් සමාධිය මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල වශයෙන් කරණ ලද කල්හි යම් යම් විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කටයුතු ධර්මයක්හුගේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා සිත නමයිද ඒ ඒ කාරණය ඇතිකල්හි ඒ ඒ ධර්මයෙහි ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණේ.

22. "මහණෙනි, යම්සේ යහපත් භූමියෙහි සතරමං සන්ධියෙක්හි සිටියාවූ සරසට තබන ලද කෙවිට ඇත්තාවූ අජානීය අශ්වයන් යොදන ලද රථයක් වේද, එයට දක්ෂවූ අස්

ඇදුරුවූ අශ්වයන් දමනය කරණ රථාචාර්යතෙම නැගී වම් අතින් රැහැන් ගෙණ දකුණු අතින් කෙවිට ගෙණ කැමති තැනකට කැමැති ගමනකට යවන්නේද, ආපසු ගමන් කරවන්නේද,

23. "මහණෙනි, මෙපරිද්දෙන්ම භික්ෂුතෙම ආර්යවූ අංග පසකින් යුක්තවූ සම්‍යක් සමාධිය මෙසේ වඩන ලද කල්හි මෙසේ බහුල වශයෙන් කරණ ලද කල්හි යම් යම් විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කටයුතු ධර්මයක්හුගේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා සිත නමයි.

24. "ඒ ඒ කාරණය ඇති කල්හි ඒ ඒ ධර්මයෙහිම ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණේ. ඉදින් හෙතෙම කැමති වේනම් අනෙක ප්‍රකාරවූ ඉර්ධි විධිය අනුභව කරන්නේය. (මෙහි දීඝනිකායේ 3 සූත්‍රයේ 70 ඡේදයේ 'ඉදිරිපත්කොට' යන වචනයේ සිට යොදාගත යුතුයි.) ඒ ඒ කාරණය ඇති කල්හි ඒ ඒ ධර්මයෙහිම ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණෙයි.

25. "හෙතෙම ඉදින් කැමතිවන්නේ නම් පිරිසිදුවූ දිව්‍යවූ ශ්‍රොත්‍ර ධාතුවෙන් (මෙහි දීඝනිකායේ 2 වෙනි සූත්‍රයේ 70 ඡේදයේ 'දිව්‍ය කණ... යන තැන සිට යෙදිය යුතුයි.) දුරවූද ලඟවූද යම් ශබ්ද කෙනෙක් ඇද්ද ඒ ශබ්ද අසන්නේ යයි ඒ ඒ කාරණය ඇතිකල්හි ඒ ඒ ධර්මයෙහිම ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණේ.

26. "ඉදින් හෙතෙම කැමතිවේනම් අන්‍ය සත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත තමන්ගේ සිතින් පිරිසිඳ දැන ගන්නෙමියි රාග සහිත සිත හෝ රාග සහිත සිතයයි දැන ගන්නෙමියි (මෙහි දීඝ නිකායේ 2 සූත්‍රයේ 72 ඡේදයේ 'රාග සහිත සිතයයි දැනගන්නෙමියි' යන තැන සිට යෙදිය යුතුයි.) කෙළෙසුන්ගෙන් නොමිදුනාවූ සිත හෝ කෙලෙසුන්ගෙන් නොමිදුනාවූ සිතයයි දැනගන්නෙමියි ඒ ඒ කාරණය ඇති කල්හි ඒ ඒ ධර්මයෙහිම ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණේ.

27. "ඉදින් හෙතෙම කැමතිවේනම් අනෙකප්‍රකාරවූ පෙර විසූ කඳ පිළිවෙළ සිහි කරන්නෙමි. එනම් (මෙහි දීඝනිකායේ 2 සූත්‍රයේ 74 ඡේදයේ "එක් ජාතියක්ද" යන තැන සිට යොදාගත

යුතුයි.) මෙසේ ආකාර සහිතවූ උදෙසීම් සහිතවූ අනෙකප්‍රකාරවූ පෙරවිසූ කඳ පිළිවෙල සිහිකරන්නෙමියි ඒ ඒ කාරණය ඇතිකල්හි ඒ ඒ ධර්මයෙහිම ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණේ.

28. "ඉදින් හෙතෙම කැමතිවේ නම් පිරිසිදුවූ මිනිසැස ඉක්මවන්නාවූ දිව්‍යවූ ඇසින් (මෙහි දීඝනිකායේ 2 සූත්‍රයේ 75 ඡෙදයේ "හේ නොයෙක් පෙරවිසීම් යන තැන සිට යෙදිය යුතුයි.) කම්වූ පරිදි මිය පරලොව ගියාවූ සතුන් දැනගන්නෙමියි ඒ ඒ කාරණය ඇතිකල්හි ඒ ඒ ධර්මයෙහිම ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණේ. ඉදින් හෙතෙම කැමතිවේනම් ආශ්‍රවයන් නැසීමෙන් ආශ්‍රව රහිතවූ චිත්ත විමුක්තියටද ප්‍රඥා විමුක්තියටද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරන්නෙමියි ඒ ඒ කාරණය ඇතිකල්හි ඒ ඒ ධර්මයෙහිම ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණේයයි" වදාළේය.

29. **චංකමනානිසංස සූත්‍රය:-** 1. "මහණෙනි, සක්මන් කිරීමෙහි මේ අනුසස් පසක් වෙත්. කවර පසක්ද යත්, දුර ගමන් යා හැකිවේ. වීර්ය කිරීමට සමර්ථ වේ. ස්වල්ප ආබාධ ඇත්තේ වේ. අනුභව කරණ ලද්ද පානය කරණ ලද්ද, කන ලද්ද, රස විඳින ලද්ද, නොකොට පැසීමට යේ. සක්මනින් ලබන ලද සමාධිය තෙම බොහෝ කල් පවත්නේ වේ. මහණෙනි, මේ පස වනාහි සක්මන් කිරීමෙහි අනුසස් වෙත් යයි" වදාළේය.

30. **නාගිත (ඉච්ඡානංගල) සූත්‍රය:-** 1. "එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසොල් දනව්වල සැරිසරණ සේක් මහත්වූ භික්ෂු සංඝයා සමග ඉච්ඡානංගල නම්වූ කොසොල් දනව් වැස්සන්ගේ බමුණු ගම යම් තැනෙක්හිද එතනට වැඩි සේක. එහි වනාහි භාග්‍යවතුන් වහන්සේ ඉච්ඡානංගල නම් බමුණුගම ඉච්ඡානංගල නම් වනලැහැබෙහි වසන සේක. 'ඉච්ඡානංගල නම් ගම්වැසි බ්‍රාහ්මණයන් හා ගෘහපතීහු ශාක්‍ය පුත්‍රවූ ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදිවූ ශ්‍රමණ භවත් ගෞතම තෙමේ වනාහි ඉච්ඡානංගල නම් බමුණු ගමට පැමිණියේ ඉච්ඡානංගල නම් ගමෙහිවූ ඉච්ඡානංගල නම් වනලැහැබෙහි වාසය කරයි.

**2.** ඒ භගවත් ගෞතමයන් වහන්සේගේ වනාහි මෙබඳු යහපත්වූ ගුණ ඝෝෂාවෙක් පැන නැංගේය. ඒ භාග්‍යවත් තෙම මේ කාරණයෙනුත් අර්හත්ය. සම්‍යක් සම්බුද්ධය, විද්‍යාචරණයන්ගෙන් යුක්තය සුගතය, ලෝකවිදූය, නිරුත්තරවූ පුරුෂයන් දමනය කිරීමෙහි සාර්ථවාහකයෙකු වැනිය, දෙව්මිනිසුන්ට ශාස්තෘය, චතුස්සත්‍ය අවබොධ කෙළේය. භාග්‍යවත්යයි හෙතෙම දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ මේ ලෝකයද මහණ බමුණන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ සත්ව ප්‍රජාවද තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කෙරෙයි. හෙතෙම මුල යහපත්වූ මැද යහපත්වූ කෙළවර යහපත්වූ අර්ථ සහිතවූ ව්‍යඤ්ජන සහිතවූ ධර්මයක් දෙශනා කරයි. සියල්ලෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කරයි. එබඳුවූ රහතන්ගේ දැක්ම යහපත් වේමයයි ඇසුවාහුමය.

**3.** ඉක්බිති ඉච්ඡානංගල වැසිවූ බ්‍රාහ්මණයන් හා ගෘහපතීහු ඒ රාත්‍රිය ඉක්ම වීමෙන් බොහෝවූ කෑ යුතු දෙය බුදිය යුතු දෙය හැරගෙණ ඉච්ඡානංගල නම් වනලැහැබ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ, දොර කොටුවෙන් පිටත්හි උස්වූ ශබ්ද මහත්වූ ශබ්ද ඇත්තාහු සිටියාහුය. එකල්හි වනාහි ආයුෂ්මත් නාගිත ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරන්නේ වෙයි,

**4.** "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නාගිත ස්ථවිරයන්ට ඇමතූ සේක. "නාගිතය, මස් විකුණන තැන කෙව්ලන් මෙන් මේ කවර නම් උස්වූ මහත්වූ ශබ්ද ඇත්තෝ වෙද්ද?"

"ස්වාමීන් වහන්ස, මේ ඉච්ඡානංගල වැසි බ්‍රාහ්මණයන් හා ගෘහපතීහු බොහෝවූ කෑ යුතු දෙය හා අනුභව කටයුතු දෙය ගෙණවුත් දොර කොටුවෙන් පිට සිටියාහු භාග්‍යවතුන් වහන්සේම උදෙසාද, භික්ෂු සංඝයා උදෙසාද වෙත්යයි."

**5.** "නාගිතය, මම යසස සමග එක්නොවෙමි. යසසද මා සමග එක්නොවේවා. නාගිතය, ඒ වනාහි මේ නෛෂ්ක්‍රම්‍ය

සැපය ප්‍රකර්ෂ විවේක සැපය ව්‍යුපසම සැපය සම්බොධි සැපය කැමති පරිදි ලබන්නේ නිදුකින් ලබන්නේ පහසුවෙන් ලබන්නේ නොවන්නේය. මම යම් නෛෂ්ක්‍රම්‍ය සුවයක් ප්‍රකර්ෂ විවේක සුවයක් සංසිඳීම් සුවයක් අවබොධකිරීම් සැපයක් කැමති පරිදි ලබන්නේ නිදුකින් ලබන්නේ පහසුවෙන් ලබන්නේ වෙම්ද, ඒ මම ඒ අපවිත්‍ර සැපය නිද්‍රා සැපයවූ ලාභ සත්කාර කීර්ති සුවය ඉවසන්නේ යයි.”

6. “ස්වාමීනි දැන් භාග්‍යවතුන් වහන්සේ ඉවසන සේක්වා! සුගතයන් වහන්සේ ඉවසන සේක්වා! ස්වාමීනි, දැන් භාග්‍යවතුන් වහන්සේට ඉවසීමට සුදුසු කාලය වේ. ස්වාමීනි, දැන් භාග්‍යවතුන් වහන්සේ යම් යම් දිශාවකින් වඩින්නේද, නියම් ගම්වැසි වූද දනව් වැසිවූද බ්‍රාහ්මණයන් හා ගෘහපතීහු ඒ දිශාවට නැවුනාහුම වන්නාහුය. ස්වාමීනි, යම්සේ මහත් පොද ඇති මේඝය වස්නා කල්හි පහත් බිමවූ පරිදි ජලයෝ පවතිත්ද, ස්වාමීනි, මෙපරිද්දෙන්ම දැන් භාග්‍යවතුන් වහන්සේ යම් යම් දිශාවකින්ම වඩින්නේද, නියම් ගම් වැසිවූද දනව් වැසිවූද බ්‍රාහ්මණයන් හා ගෘහපතීහු ඒ දිශාවට නැමුනාහුම වන්නාහුය. ඊට හේතු කවරේද යත්? ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ ශීලය හා ප්‍රඥාව එබඳුමයයි.”

7. (මේ ඡේදය මේ සූත්‍රයේ 5 ඡේදය මෙනි.)

8. “නාගිතය අනුභව කරණලද පානය කරණලද කන ලද රස විඳිනලදහුගේ යම් මලමූත්‍රයක් වේද, මේ ඔහුගේ නිෂ්පත්තිය වේ. නාගිතය, ප්‍රියවූවන්ගේ වනාහි පෙරලීමෙන් අන් පරිදි වීමෙන් තැවීමය වැළපීමය කායික දුක්ය දොම්නස්ය දැඩි ආයාසය යන මොව්හු උපදිත්. මේ ඔහුගේ නිෂ්පත්තිය වේ. නාගිතය, අශුභ කර්ම ස්ථානානුයොගයෙහි යෙදුනහුගේ වනාහි ශුභාරම්මනයෙන් පිළිකුල් බව පිහිටයි. මේ ඔහුගේ නිෂ්පත්තිය වේ. නාගිතය, සවැදෑරුම්වූ ස්පර්ශායතනයන්හි අනිත්‍ය අනුව බලමින් වාසය කරන්නහුගේ ස්පර්ශයෙහි පිළිකුල් බව පිහිටයි. මේ ඔහුගේ නිෂ්පත්තිය වේ. නාගිතය, පඤ්චොපාදානස්කන්ධයන්හි වනාහි ඇතිවීම නැතිවීම අනු

බලමින් වාසය කරන්නහුගේ දැඩිකොට අල්වා ගැණීමෙහි පිළිකුල් බව පිහිටයි. මේතෙම ඔහුගේ නිෂ්පත්තිය වේයයි" වදාළේය."

(3 වන පඤ්චංගික වර්ගය නිමි.)

---

## 4. සුමනා වර්ගය

31. සුමනා සූත්‍රයː- එක්කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඩු මහ සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසනසේක. එකල්හි වනාහි සුමනා නම් රජ කුමරී තොමෝ,

2. පන්සියයක් රථ වලින් පන්සියයක් රජකුමරියන් විසින් පිරිවරණ ලද්දී භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට සකස් කොට වැඳ එකත්පස්ව හුන්නේය.

3. එකත්පස්ව හුන්නාවූම සුමනා රාජ කුමාරිතොමෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය.

"ස්වාමීනි, මේ ශාසනයෙහි සමාන ශ්‍රද්ධා ඇත්තාවූ සමාන සිල් ඇත්තාවූ සමාන ප්‍රඥා ඇත්තාවූ දන් දෙන එකෙක දන් නොදෙන එකෙකැයි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෝ දෙදෙනෙක් වන්නාහුය. ඔව්හු ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලෝකයෙහි උපදින්නාහුය. ස්වාමීනි දෙවිවූම ඔවුන්ගේ වෙසෙසක් වන්නේද, වෙන් කිරීමක් වන්නේද?"

"සුමනාවෙනි, වන්නේයයි" භාග්‍යවතුන් වහන්සේ වදාළේය. "සුමනාවෙනි, යම් මේ දන් දෙන්නෙක් වේද, හෙතෙම මේ නොදෙන්නහු දෙවිවූයේම දිව්‍යවූ ආයුෂයෙන්ද දිව්‍යවූ ශරීර වර්ණයෙන්ද, දිව්‍යවූ සැපයෙන්ද, දිව්‍යවූ යශසින්ද, දිව්‍යවූ අධිපති බැවින්ද යන කරුණු පසින් මැඩපවත්වයි සුමනාවෙනි, යම් ඒ

දන් දෙන්නෙක් වේද, මේ දන් නොදෙන්නහු දෙව්වූයේම මේ කරුණු පසින් මැඩපවත්වයි.”

**4.** ස්වාමීනි, ඉදින් වනාහි ඔව්හු එයින් චුතවූවාහු මේ ආත්ම භාවයට පැමිණෙත් නම් මනුෂ්‍යවූම ඔවුන්ගේ වෙසෙසක් වන්නේද, වෙන් කිරීමක් වන්නේද?”

**5.** “සුමනාවෙනි, වන්නේයයි” භාග්‍යවත්තෙම වදාළේය. “සුමනාවෙනි, යම් ඒ දන් දෙන්නෙක් වේද, හෙතෙම මේ දන් නොදෙන්නහු මනුෂ්‍ය වූයේම මිනිසුන් අයත්වූ ආයුෂයෙන්ද මානුෂකවූ ශරීර වර්ණයෙන්ද, මානුෂකවූ සැපයෙන්ද, මානුෂකවූ යශසින්ද, මානුෂකවූ අධිපති භාවයෙන්ද, යන කරුණු පසින් මැඩ පවත්වයි. සුමනාවෙනි, යම් ඒ දන් දෙන්නෙක් වේද, හෙතෙම මේ දන් නොදෙන්නාහු මානුෂය වූයේම මේ කරුණු පසින් මැඩ පවත්වයි.”

**6.** “ස්වාමීනි, ඉදින් වනාහි ඒ ඔව්හු ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවෙත් නම්, ස්වාමීනි, පැවිදි වූම ඔවුන්ගේ වෙසෙසක් වන්නේද, වෙන් කිරීමක් වන්නේද?”

**7.** “සුමනාවෙනි, වන්නේයයි” භාග්‍යවත්තෙම වදාළේය. “සුමනාවෙනි, යම් ඒ දන් දෙන්නෙක් වේද, හෙතෙම මේ දන් නොදෙන්නහු පැවිදි වූයේම යාඥා කරණ ලද්දේම බොහෝවූ සිව්රු පරිභොග කරයි. යාඥා නොකරණ ලද්දේ ස්වල්පයක් පරිභොග කරයි. යාඥා කරණ ලද්දේම බොහෝවූ පිණ්ඩපාතය පරිභොග කරයි. යාඥා නොකරණ ලද්දේ ස්වල්පයක් පරිභොග කරයි. යාඥා කරන ලද්දේම බොහෝවූ සෙනසුන් පරිභොග කරයි. යාඥා නොකරණ ලද්දේ ස්වල්පයක් පරිභොග කරයි. යාඥා කරණ ලද්දේම බොහෝවූ ගිලන්පස බෙහෙත් පිරිකර පරිභොග කරයි. යාඥා නොකරණ ලද්දේ ස්වල්පයක් පරිභොග කරයි. යම් බ්‍රහ්මචාරීන් සමග වාසය කෙරේද, ඔව්හු මොහුට මනාපවූම කාය කර්මයෙන්, බොහෝ කොට මනාව හැසිරෙත්. අමනාපයෙන් මඳකොට හැසිරෙත්. මනාපවූම වාක් කර්මයෙන් බොහෝ කොට මනාව හැසිරෙත්. අමනාපයෙන් මඳකොට හැසිරෙත්. මනාපවූම මනො කර්මයෙන් බොහෝකොට මනාව

හැසිරෙත්. අමනාපයෙන් මඳ කොට හැසිරෙත්. මනාපවූම පූජාව එළවත්, අමනාපවූ ප්‍රජාව මඳකොට එළවත්. යන කරුණු පසින් මැඩ පවත්වයි. සුමනාවෙනි, යම් ඒ දන් දෙන්නෙක් වේද, හෙතෙම මේ දන් නොදෙන්නහු පැවිදි වූයේම මේ කරුණු පසින් මැඩ පවත්වයි.

8. "ස්වාමීනි, ඉදින් වනාහි ඔහු දෙදෙන රහත් බවට පැමිණෙද්ද, ස්වාමීනි, රහත් බවට පැමිණියාවූම ඔවුන්ගේ වෙනසක් වන්නේද, වෙන් කිරීම වන්නේද?"

9. "සුමනාවෙනි, මෙහි වනාහි මම මොවුන්ගේ කිසි වෙනස් කරුණක් නොකියමි. එනම්, එකෙකුගේ විමුක්තිය සමග අනිකාගේ විමුක්තිය අරබයාය."

10. "ස්වාමීනි, ආශ්චර්යයය, ස්වාමීනි අද්භූතයෙකි. ස්වාමීනි යම්බඳුවූ පුණ්‍යයෝ නම් දෙව්වූවහුටත් උපකාර වෙද්ද, මනුෂ්‍යවූවහුටත් උපකාර වෙද්ද, ස්වාමීනි, මේ දන් දෙන්ට ඉතාම සුදුසුය. පින් කරන්ට සුදුසුමයයි" කීයේය.

11. "සුමනාවෙනි, මේ කාරණය මෙසේය. සුමනාවෙනි, මේ කාරණය මෙසේය. සුමනාවෙනි, දන් දෙන්ට සුදුසුමය පින් කරන්ට සුදුසුමැයි. දෙව්වූවහුටද උපකාරයෝ පින්ය. මනුෂ්‍ය වූවහුටද උපකාරයෝ පින්ය. පැවිදි වූවහුටද උපකාරයෝ පින්යයි" වදාළේය. භාග්‍යවත් තෙම මෙය වදාළේය. සුගත තෙම මෙය වදාරා ඉන්පසු ශාස්තෲන් වහන්සේ මෙය වදාළේය.

12. (1) "යම්සේ ලෝකයෙහි අහසින් ගමන් කරන්නාවූ නිර්මලවූ චන්ද්‍රතෙම සියලු තාරකාවන් රශ්මියෙන් ඉක්මවා බබළාද,

(2) "එසේම ශීලයෙන් යුක්තවූ ශ්‍රද්ධාව ඇත්තාවූ පුරුෂ පුද්ගලතෙම ලෝකයෙහි සියලු මසුරු පුද්ගලයන් ත්‍යාගය කරණකොට ගෙණ ඉක්මවා බබළයි.

(3) "යම්සේ සිය ගණන් මුදුන් ඇති විදුලි මාළා ඇති මේඝයතෙම ගර්ජනා කරමින් පෘථිවියට මනාකොට වර්ෂා කරන්නේ ගොඩබිම හා පහත්බිම පුරවාද,

(4) "මෙසේ සෝවාන්වූ සම්‍යක් සම්බුද්ධ ශ්‍රාවකවූ පණ්ඩිතතෙම කරුණු පසකින් මසුරු පුද්ගලයා මැඩපවත්වයි.

(5) "ආයුෂයෙන්ද යශසින්ද, ශරීර වර්ණයෙන්ද, සැපයෙන්ද, හෙතෙම ඒකාන්තයෙන් සැඩ පහරින් භොගවලින් මෙන් දාන වශයෙන් පමුණුවන්නාවූ දෙව්ලොවට පමුණුවන ලද්දේ පරලොව දෙව්ලොවද සතුටුවේයයි" වදාළේය."

**32. චුන්දී සූත්‍රයඃ-** 1. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කළන්දක නිවාප නම්වූ වෙළුවනාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි චුන්දී නම් රාජ කුමාරිතොමෝ,

2. (මේ ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 2 ඡෙදය මෙනි.)

3. එකත්පස්ව හුන්නාවූම චුන්දී නම් රාජ කුමාරි තොමෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය. "ස්වාමීනි, අපගේ චුන්ද නම් රාජ කුමාරයෙක් වේ. හෙතෙම මෙසේ කීය. 'යම් මේ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ බුදුන් සරණ කොට ගියේ වේද, දහම් සරණ කොට ගියේ වේද, සංඝයා සරණ කොට ගියේ වේද, ප්‍රාණඝාතයෙන් වැළකුණේ වේද, අදත්තා දානයෙන් වැළකුණේ වේද, කාම මිත්‍ථ්‍යාචාරයෙන් වැළකුණේ වේද, මුසාවාදයෙන් වැළකුණේ වේද, මදයට හා ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානයෙන් වැළකුණේ වේද, හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතියෙහිම උපදියි. දුර්ගතියෙහි නූපදියි" යනුයි.

"ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේ විචාරමි.

4. "ස්වාමීනි, කෙබඳුවූ ශාස්තෘවරයෙකු කෙරෙහි ප්‍රසන්න වූයේ,

5. "ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතියෙහිම උපදීද, දුර්ගතියෙහි නූපදීදැයි,

"ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේ විචාරමි. ස්වාමීනි, කෙබඳුවූ ධර්මයෙක්හි වනාහි ප්‍රසන්න වූයේ (මෙහි මේ සූත්‍රයේ

5 ඡේදය යෙදිය යුතුයි.) කෙබඳු සංඝයා කෙරෙහි වනාහි ප්‍රසන්න වූයේ (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.) කෙබඳු කුශල ධර්මයන්හි සම්පූර්ණ කිරීම ඇත්තේ (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.)

**6.** "එම්බා චුන්දිය, පා නැත්තාවූ හෝ දෙපා ඇත්තාවූ හෝ සිව්පා ඇත්තාවූ හෝ බොහෝ පාද ඇත්තාවූ හෝ රූප ඇත්තාවූ හෝ රූප නැත්තාවූ හෝ සංඥා ඇත්තාවූ හෝ සංඥා නැත්තාවූ හෝ නෙවසඤ්ඤිනාසඤ්ඤිවූ හෝ යම්තාක් සත්වයෝ වෙද්ද, ඔවුන් අතුරෙන් අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ තථාගත තෙමේ උතුම්යයි කියනු ලැබේ. චුන්දිය, යම් කෙනෙක් වනාහි බුදුන් කෙරෙහි ප්‍රසන්න වූවාහුද, ඔව්හු අග්‍රවූවහු කෙරෙහි ප්‍රසන්න වූවාහුය. අග්‍රවූවහු කෙරෙහි වනාහි ප්‍රසන්න වූවන්ට අග්‍රවූ විපාකය වේ.

**7.** "චුන්දිය, සංස්කරණය කරණ ලද්දාවූ හෝ සංස්කරණය නොකරණ ලද්දාවූ හෝ යම්තාක් ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයන් අතුරෙන් යම්සේ රාගාදී මදයන්ගේ දුරුකිරීම ඇත්තාවූ, සියලු පිපාසා දුරුකිරීම ඇත්තාවූ, සියලු ආලයන්ගේ නැසීම ඇත්තාවූ වෘත්තයන්ගේ සිඳීම ඇත්තාවූ, තෘෂ්ණාවන්ගේ ක්ෂයකිරීම ඇත්තාවූ නොඇල්ම ඇත්තාවූ නිරුද්ධවීම ඇත්තාවූ නිවණක් වේද, විරාග නම්වූ ඒ නිවණ අග්‍රයයි කියනු ලැබේ. චුන්දිය, යම් කෙනෙක් වනාහි විරාග ධර්මයෙහි පැහැදුනාහුද, ඔව්හු අග්‍රවූ ධර්මයෙහි පැහැදුනාහුය. අග්‍රවූ ධර්මයෙහි වනාහි පැහැදුනවුන්ට අග්‍රවූ විපාකය වේ.

**8.** "එම්බා චුන්දිය, යම්තාක් සංඝවූවාහු හෝ ගණවූවාහු හෝ වෙද්ද, ඔවුන්ගෙන් යම් මේ පුරුෂ යුග්ම සතරක් වෙද්ද, පුරුෂ පුද්ගලයන් අට දෙනෙක් වෙද්ද, භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සංඝතෙම පූජාවට සුදුසු වේ. දුර සිට ගෙණෙන ලද පූජාවට සුදුසු වේ. දක්ෂිණාව පිළිගැණීමට සුදුසු වේ. ඇඳිලි කිරීමට සුදුසු වේ. ලෝකයාට උතුම්වූ පින් කෙත වේද, මේ තථාගතයන්ගේ ශ්‍රාවක සංඝතෙම අග්‍ර යයි කියනු ලැබේ. චුන්දිය, යම් කෙනෙක් වනාහි සංඝයා කෙරෙහි ප්‍රසන්නවූවාහුද, ඔව්හු

අග්‍ර තන්හි ප්‍රසන්න වූවාහු වෙත්. අග්‍රවූ සංඝයා කෙරෙහි ප්‍රසන්න වූවන්ට වනාහි අග්‍රවූ විපාකය වේ.

**9.** "එම්බා චුන්දිය, ආර්යයන් කැමැතිවූ යම්තාක් ශීලයෝ වෙද්ද, ඔවුන්ගෙන් නොකඩවූ නො සිදුරුවූ, නොකැළල්වූ තිත් නැත්තාවූ, දාස කමින් මිදුනාවූ, නුවණැත්තන් විසින් පසස්නා ලද්දාවූ තෘෂ්ණා දෘෂ්ටීන් පරාමර්ෂණය නොකරණ ලද්දාවූ සමාධිය පිණිස පවත්නාවූ යම් මේ ශීලයෝ වෙද්ද, මෙය අග්‍රයයි කියනු ලැබේ. චුන්දිය, යම් කෙනෙක් වනාහි ආර්යයන් කැමතිවූ ශීලයන්හි සම්පූර්ණ කිරීම ඇත්තාහු වෙද්ද, ඔව්හු අග්‍රවූ ශීලයෙහි සම්පූර්ණ කිරීම ඇත්තාහු වෙත්. අග්‍රවූ ශීලයෙහි වනාහි සම්පූර්ණ කිරීම ඇත්තවුන්ට අග්‍රවූ විපාකය වේ.

(1) "ඒකාන්තයෙන් අග්‍ර වශයෙන් පැහැදුනාවූ අග්‍රවූ ධර්මය දන්නාවූ නිරුත්තර දක්ෂිණාර්හවූ අග්‍රවූ බුදුන් කෙරෙහි පැහැදුනවුන්ටද,

(2) "විරාගයෙන් හා උපසමයෙන් යුත් සැපය ඇත්තාවූ අග්‍රවූ ධර්මයෙහි පැහැදුනවුන්ටද, උතුම් පින් කෙතක්වූ අග්‍රවූ සංඝයා කෙරෙහි පැහැදුනවුන්ටද,

(3) "අග්‍රවූවහු කෙරෙහි දානය දෙන්නවුන්ටද අග්‍රවූ පින වැඩේ. අග්‍රවූ ආයුෂයද අග්‍රවූ ශරීර වර්ණයද යශස හා කීර්තියද සැපයද බලයද ලැබේ.

(4) "අග්‍රවූවහුට දෙන්නාවූ නුවණැත්තාවූ අග්‍ර ධර්මයෙන් යුක්තවූ පුද්ගලතෙමේ දෙවිවූයේ හෝ මිනිස්වූයේ හෝ අග්‍ර බවට පැමිණියේ අතිශයින් සතුටුවේයයි වදාළේය."

**33. උග්ගහ මෙණ්ඩක නත්තු සූත්‍රය**:- 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ භද්දිය නම් නුවර ස්වයංජාත වනලැහැබෙහි වැඩවසන සේක. එකල්හි වනාහි උග්ගහ නම් මෙණ්ඩක සිටුහුගේ මුණුබුරුතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව හුන්නේය.

**2.** එකත්පස්ව හුන්නාවූම උග්ගහ නම් මෙණ්ඩක සිටුහුගේ මුණුබරුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ තමන් සතරවෙනි කොට ඇත්තේ සෙට දවස පිණිස මාගේ බත ඉවසන සේක්වායි." භාග්‍යවතුන් වහන්සේ, නිශ්ශබ්දවීමෙන් ඉවසූසේක. ඉක්බිති උග්ගහ නම් මෙණ්ඩක සිටුහුගේ මුණුබුරුතෙම භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන, හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට මනාකොට වැඳ පැදකුණු කොට ගියේය.

**3.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රාත්‍රිය ඇවෑමෙන් පෙරවරු වේලෙහි හැඳ පොරොවා පාත්‍ර සිවුරු ගෙණ උග්ගහ නම් මෙණ්ඩක සිටු මුණුබුරාගේ ගෘහය යම් තැනෙක්හිද, එතැනට පැමිණිසේක. පැමිණ පනවන ලද ආසනයෙහි වැඩහුන්සේක.

**4.** ඉක්බිති උග්ගහ නම් මෙණ්ඩක සිටු මුණුබරුතෙම භාග්‍යවතුන් වහන්සේ ප්‍රණීතවූ කෑ යුතු දෙයින්ද බුදිය යුතු දෙයින්ද සියතින් සතුටු කෙළේය. මනාකොට පැවරූයේය. ඉක්බිති උග්ගහ නම් මෙණ්ඩක මුණුබරුතෙම වැළඳුවාවූ පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇති භාග්‍යවතුන් වහන්සේට එකත්පස්ව හුන්නේය.

**5.** එකත්පස්ව හුන්නාවූම උග්ගහ නම් මෙණ්ඩක සිටු මුණුබරුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය. "ස්වාමීනි, මාගේ මේ කුමරියෝ සැමි කුල වලට යන්නාහුය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යම් හෙයකින් ඔවුන්ට බොහෝ කලක් හිත සැප පිණිස වන්නේද, එහෙයින් ඔවුන්ට අවවාද කරණ සේක්වා. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට අනුශාසනා කරණ සේක්වා."

**6.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ කුමරියන්ට මෙය වදාළේය. "කුමරියෙනි, එහෙයින් මෙහි වැඩ කැමැතිවූ හිත කැමැතිවූ අනුකම්පා ඇත්තාවූ මව්පියෝ අනුකම්පා පිණිස යම් ස්වාමියෙකුට දෙන්නාහුද, ඔහුට පළමු නැගිටින්නියෝද පසුව නිදා ගන්නියෝද, කුමක් කෙරෙම්දැයි, පිළිවිස කරන්නියෝද,

මනාප පරිදි හැසිරෙන්නියෝද, ප්‍රිය තෙපුල් කියන්නියෝද වන්නෙමුයි මෙසේ හික්මිය යුතුයි. කුමරියෙනි, මෙසේ වනාහි හික්මිය යුතුයි.

7. "කුමරියෙනි, එහෙයින් මෙහි යම් ඒ ස්වාමිහුගේ මව්ය කියා හෝ පියාය කියා හෝ මහණ බමුණෝය කියා හෝ ගරු කටයුත්තෝ වන්නාහුද, ඔවුන්ට සත්කාර කරන්නෙමු ගෞරව කරන්නෙමු. බුහුමන් කරන්නෙමු, පූජා කරන්නෙමු, ලගට පැමිණිය වුන්ටද ආසනයෙන් හා ජලයෙන් පුදන්නෙමුයි මෙසේ හික්මිය යුතුයි. කුමරියෙනි, තොප විසින් මෙසේ වනාහි හික්මිය යුතුයි.

8. "කුමරියෙනි, එහෙයින් මෙහි ස්වාමීහුගේ එළු ලොම් හෝ කපු පුළුන් හෝ යම් ඒ ඇතුළත්හිවූ කර්මාන්ත වෙද්ද, එහි අලස නොවූවාහු ඒ කර්මාන්තයෙහි උපයාවූ විමසීම් නුවණින් යුක්තවූවෝ කරන්ට සමර්ථ සංවිධාන කරන්ට සමර්ථ දක්ෂවූවෝ වන්නෙමුයි, මෙසේ හික්මිය යුතුයි. කුමරියෙනි, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයි.

9. "කුමරියෙනි, එහෙයින් මෙහි ස්වාමීහුගේ අභ්‍යන්තරවූ දාසයෝය කියා හෝ පණිවිඩකාරයෝය කියා හෝ කම්කරුවෝය කියා හෝ යම් මේ ඇතුළත ජනයාවේද, එවුන් කළ දෙයද කළ දෙය වශයෙන් දැනගන්නෙමු. නොකළ දෙයද නොකළ දෙය වශයෙන් දැනගන්නෙමුයි ගිලන් වූවන්ගේද සුවදුක් බල බලා දැනගන්නෙමුයි. කෑයුතු දෙයක්ද බුදිය යුතු දෙයක්ද මොහුට උපකාරවේද, එයින් විභාග කරන්නෙමුයි, මෙසේ හික්මිය යුතුයි.

10. කුමරියෙනි, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයි. කුමරියෙනි, එහෙයින් මෙහි ස්වාමිතෙම යම් ධනයක් හෝ ධාන්‍යයක් හෝ රජතයක් හෝ ස්වර්ණයක් හෝ ගෙණෙන්නේද, එය ආරක්ෂාවෙන් ගෝපනයෙන් සම්පාදනය කරන්නෙමු. ඔහුට ධූර්ත නොවූවෝ සොර නොවූවෝ ලොල් නොවූවෝ විනාශකාරි නොවූවෝ වන්නෙමුයි හික්මිය යුතුයි.

11. "කුමරියෙනි, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයි. කුමරියෙනි, මේ කරුණු පසින් වනාහි යුක්තවූ ස්ත්‍රිය ශරීරයාගේ

බිඳීමෙන් මරණින් මතු මනාප කායික නම් දෙවියන්ගේ සමාන බවට පැමිණේයයි වදාළේය.”

12. (1) “වීර්ය ඇති උත්සාහවත්වූ යමෙක් හැම කල්හි ඇය සතතයෙන් පෝෂණය කෙරේද, ඕතොමෝ සියලු කැමති දෙය දෙන්නාවූ පොෂණය කරන්නාවූ ස්වාමියා ඉක්මවා නොහගියි.

(2) “ඒ ස්ත්‍රිතොමෝ කැමති පරිදි හැසිරීමෙන් ස්වාමියා කෝපද නොකරන්නේය. නුවණැත්තී ස්වාමිහුගේ සියලු ගරු කටයුත්තන්ද පුදයි.

(3) “උත්සාහවත් වූවා, අලස නොවූවා සංග්‍රහ කරණලද පිරිවර ජනයන් ඇත්තී ස්වාමියාට මනාපවූවා හැසිරෙයි. රැස්කරණලද ධනයද රක්ෂාකරයි.

(4) “ස්වාමියාගේ කැමැත්ත අනුව පවත්නාවූ යම් ස්ත්‍රියක් තොමෝ මෙසේ පවතීද, ඕතොමෝ යම් තැනෙක්හි නිර්මානරතී නම් ඒ දෙවියෝ ඇද්ද, එහි උපදී යයි’ වදාළේය.”

**34. සන්දිට්ඨික දානඵල සීහසේනාපති සූත්‍රය**:- 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසල් නුවර මහ වනයෙහිවූ කූටාගාර ශාලාවෙහි වැඩවසනසේක. එකල්හි වනාහි සීහ නම් සෙනෙවිතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණ සිටියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට මනා කොට වැඳ එකත්පස්ව හුන්නේය.

2. එකත්පස හුන්නාවූම සීහ නම් සෙනෙවිතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය. “ස්වාමීනි, තමන් විසින් දැක්කහැකිවූ දාන විපාකයක් පනවන්ට හැක්කේද?

“සීහය, හැක්කේයයි” භාග්‍යවතුන් වහන්සේ වදාළේය. “සීහය, දීමෙහි ශූරවූ ස්වාමිභාවයෙහි සිට දෙන තැනැත්තේ බොහෝ දොනට ප්‍රියවූවෙක් මනවඩන්නෙක්වේ. සීහය, දීමෙහි ශූරවූ දානපති භාවයෙහි සිටි තැනැත්තේ බොහෝ දෙනාට

ප්‍රිය වූවෙක් මන වඩන්නෙක් වේය යන යමකුන්වේද, මෙයද තමන් විසින් දැක්කහැකි දානයෙහි ඵලයවේ.

3. "නැවත අනිකක්ද කියමි. සීහය, දීමෙහි ශූරවූ දානපතියා ශාන්තවූ සත් පුරුෂයෝ සේවනය කරත්. සීහය, දානයෙහි ශූරවූ දානපතියා ශාන්තවූ සත්පුරුෂයෝ සෙවනය කරත් යන යමකුත් වේද, මෙයද තමන් විසින් දැක්කහැකිවූ දානයෙහි ඵලයවේ.

4. "නැවත අනිකක්ද කියමි. සීහය, දානයෙහි ශූරවූ දානපතීහුගේ යහපත්වූ ගුණ ඝොෂාවෙක් උස්ව පැනනගියි. සීහය, දන් දීමෙහි ශූරවූ දානපතිහුගේ යහපත්වූ ගුණ ඝොෂාවෙක් උස්ව පැනනගියි යන යමකුත් වේද, මෙයද තමන් විසින් දැක්කහැකි දානයෙහි ඵලය වේ.

5. "නැවත අනිකක්ද කියමි. සීහය, දන්දීමෙහි ශූරවූ දානපතිතෙම යම් යම් පිරිසකට පැමිණේද, ඉදින් ක්ෂත්‍රිය පිරිසකට හෝ බ්‍රාහ්මණ පිරිසකට හෝ ගෘහපති පිරිසකට හෝ ශ්‍රමණ පිරිසකට හෝ නිර්භයවම නිෂ්තේජජ්ක නුවූයේම පැමිණෙයි. සීහය, දන් දීමෙහි ශූරවූ දානපතිතෙම ක්ෂත්‍රිය පිරිසකට හෝ බ්‍රාහ්මණ පිරිසකට හෝ ගෘහපති පිරිසකට හෝ ශ්‍රමණ පිරිසකට හෝ යම් යම් පිරිසකට පැමිණේද, නිර්භයවම නොමකුවූයේම පැමිණෙයි යන යමකුත්වේද මෙයද තමන් විසින් දැක්ක හැකිවූ දානයෙහි විපාකය වේ.

6. "නැවත අනිකක්ද කියමි. සීහය, දන්දීමෙහි ශූරවූ දානපතිතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇත්තාවූ ස්වර්ගලෝකයෙහි උපදියි. සීහය, දීමෙහි ශූරවූ දානපතිතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදීය යන යමකුත්වේද, මෙය පරලොව වන්නාවූ දානයෙහි විපාකය වේයයි" වදාළේය. මෙසේ වදාළ කල්හි සීහ නම් සෙනෙවිතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

7. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් තමන් විසින් දැක්කහැකිවූ යම් මේ දාන විපාක සතරක් වදාරණ ලද්දාහුද,

මම මෙහි භාග්‍යවතුන් වහන්සේගේ ඇදහීමෙන් නොපැමිණෙමියි මමද මොවුන් දනිමි.

8. "ස්වාමීනි, මම දන් දීමෙහි ශූරවූ දානපතිවූයේ බොහෝදෙනාට ප්‍රියවූවෙක්, මනාප වූවෙක් වෙමි. ස්වාමීනි, මම දන්දීමෙහි ශූරවූ දානපතියෙක් වෙමි. ශාන්තවූ සත්පුරුෂයෝ මා සේවනය කරත්. ස්වාමීනි, මම දානයෙහි ශූරවූ දානපතිවෙමි. මාගේ යහපත්වූ ගුණ ඝොෂාව උස්ව නැංගේය.' සීහ නම් සෙනෙවිතෙම දන්දීමෙහි ශූරය, දන්දීම කරන්නෙක සංඝයාට උපස්ථාන කරන්නෙක' කියායි. ස්වාමීනි, මම දන් දීමෙහි ශූරවූ දානපතිවූයෙමි. ක්ෂත්‍රිය පිරිසකට හෝ බ්‍රාහ්මණ පිරිසකට හෝ ගෘහපති පිරිසකට හෝ ශ්‍රමණ පිරිසකට හෝ යම් මේ පිරිසකට පැමිණෙම්ද, නිර්භයවම නොමකුවූයේම පැමිණෙමි.

9. (මේ ඡේදය මේ සූත්‍රයේ 7 ඡේදය මෙනි.)

10. "ස්වාමීනි, මට යමකුත් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේද, 'සීහය, දානයෙහි ශූරවූ දානපතිතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදීයයි' මම මෙය නොදනිමි. මෙහිදු මම භාග්‍යවතුන් වහන්සේගේ ඇදහීමෙන් පැමිණෙමියි" කීයේය.

11. "සීහය, මේ කාරණය මෙසේය. සීහය, මෙය මෙසේය දන් දීමෙහි ශූරවූ දානපතිතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ලෝකයෙහි උපදී යයි" වදාළේය.

12. (1) "නොමසුරුවූ, දෙන්නාවූ මනුෂ්‍යතෙම ප්‍රියයෙක් වේ. ඔහු බොහෝදෙනා සේවනය කෙරෙත්. හෙතෙම කීර්තියටද පැමිණේ, ඔහුගේ යශසද වැඩේ, නොමකුවූයේ පිරිසට පැමිණේ. විශාරදයෙක් වේ.

(2) "එහෙයින්ම නුවණැත්තෝ සැප සොයන්නාහු මසුරුමල දුරුකොට දන් දෙත්. ඔව්හු දෙව්ලොව පිහිටියාහු දෙවියන්ගේ එක්වීමට ගියාහු, බොහෝ කලක් සිත් අලවා වාසය කෙරෙත්.

(3) "කරණ ලද ආවාස ඇති හෙවත් දිව්‍ය විමාන පහළවීම් ඇතිකරණලද කුසල් ඇති සත්වයෝ මෙයින් චුතව ස්වකීය ප්‍රභාවෙන් නන්දනොද්‍යානයෙහි හැසිරෙත්. ඔව්හු එහි පස්කම් සැපයෙන් යුක්තවූවාහු පිනවත් ඇලෙත්, සතුටුවෙත්.

(4) "තාදී ගුණ ඇත්තාවූ තෘෂ්ණාදීන් අනිශ්‍රිතවූ තථාගතයන් වහන්සේගේ වචනය කොට බුදුන්ගේ ශ්‍රාවකයෝ දෙව්ලොව අභිරමනය කෙරෙත්වායයි' වදාළේය.

**35. දානානිසංස සූත්‍රයː-** 1. "මහණෙනි, මේ දානයෙහි අනුසස් පසක් වෙත්. කවර පසක්ද යත්, බොහෝදෙනාට ප්‍රිය වූවෙක් මනවඩන්නෙක් වෙයි. ශාන්තවූ සත්පුරුෂයෝ භජනය කරත්. යහපත්වූ ගුණ ඝොෂාව පැන නගියි. ගෘහස්ත ධර්මයෙන් පහනොවූයේ වෙයි හෙවත් නොකඩවූ පඤ්ච ශීලය ඇත්තේ වෙයි. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති දිව්‍යලෝකයෙහි උපදියි. මහණෙනි, මොහු වනාහි දානයෙහි අනුසස් පස වෙත්යයි' වදාළේය.

**2.** (1) "සත්පුරුෂයන්ගේ ධර්මය නොඉක්මවමින් දෙනු ලබන්නේ ප්‍රියයෙක් වෙයි. සංයමයෙන් යුක්තවූ බ්‍රහ්මචර්යා ඇත්තාවූ ශාන්තවූ සත්පුරුෂයෝ භජනය කෙරෙත්.

(2) "උන්වහන්සේලා ඔහුට සියලු දුක් දුරලන්නාවූ යම් ධර්මයක් දෙශනා කෙරෙත්ද, හෙතෙම මෙලොව ඒ ධර්මය දැන ආශ්‍රව රහිතවූයේ පිරිනිවේයයි" වදාළේය.

**36. කාලදාන සූත්‍රයː-** "මහණෙනි, මේ සුදුසු කාලයෙහි දෙන්නාවූ දාන පසක් වෙත්. කවර පසක්ද යත්, ආගන්තුකයාට දානය දේද, ගමන් යන්නාට දානය දේද, ගිලනාට දානය දේද, දුර්භික්ෂයෙහි දානය දේද, යම් ඒ අලුත් ශෂ්‍ය අලුත් ඵල වෙත්ද, ඔවුන් පළමුකොට සිල්වතුන් කෙරෙහි පිහිටුවාද (යන පසයි.) මහණෙනි, මොහු වනාහි සුදුසු කාලයෙහි දෙන දාන පස වෙත්යයි" වදාළේය.

1. "ප්‍රඥා ඇත්තාවූ ප්‍රතිග්‍රාහකයන්ගේ වචන දන්නාවූ පහවූ මසුරු මල ඇත්තෝ සුදුසු කාලයෙහි දන් දෙත්. ඍජුවූ තාදී ගුණයෙන් යුක්තවූ ආර්යයන් විෂයෙහි සුදුසු කාලයෙහි දෙන ලද්ද කාලදානය වේ.

2. "විශෙෂයෙන් ප්‍රසන්න සිත් ඇති ඔහුගේ දක්ෂිණා තොමෝ මහත් ඵල ඇත්තී වේ. යම් කෙනෙක් එහි අනුමෝදන් හෝ වෙද්ද, වතාවත් හෝ කෙරෙද්ද?

3. "එයින් දක්ෂිණා තොමෝ අඩුවූවක් නොවන්නීය. ඔව්හුද පිනට කොටස්කාරයෝ වෙත්. යමෙකු කෙරෙහි දෙන ලද්ද මහත්ඵල වේද,

"එහෙයින් නොපසුබට සිත් ඇත්තේ දන් දෙන්නේය. පින් පරලොව සත්වයන්ට පිහිට වෙත්යයි" වදාළේය.

37. **පඤ්චට්ඨාන දාන සූත්‍රයː-** "මහණෙනි භොජනය දෙන්නාවූ දායකතෙම දානය ලබන්නන්ට කරුණු පසක් දෙයි. කවර පසක්ද යත්? ආයුෂය දෙයි, ශරීර වර්ණය දෙයි, කායික චෛතසික සැපය දෙයි, ශරීර ශක්තිය දෙයි, වැටහෙන නුවණ දෙයි, ආයුෂයදී වනාහි දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ ආයුෂයට කොටස් කාරයෙක් වෙයි. වර්ණයදී, සැපයදී, බලයදී, නුවණදී, දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ නුවණට කොටස්කාරයෙක් වෙයි යන පසයි. මහණෙනි, භොජනය දෙන්නාවූ දායකතෙම දානය ලබන්නන්ට මේ කරුණු පස දේයයි" වදාළේය.

1. "ප්‍රාඥවූ දායකතෙම ආයුෂය දෙන්නේ බලය දෙන්නේ වර්ණය දෙන්නේ නුවණ දෙන්නේ වේ. සැපය දෙන්නාවූ නුවණැත්තාවූ හෙතෙම සැපයට පැමිණේ.

2. "ආයුෂයද බලයද වර්ණයද සැපයද නුවණද දී හෙතෙම යම් යම් තැනක උපදීද, ඒ ඒ තන්හි දීර්ඝායුෂ ඇත්තෙක් යශස් ඇත්තෙක් වේයයි වදාළේය."

38. **සද්ධානිශංස සූත්‍රයː-** 1. "මහණෙනි, ශ්‍රද්ධාව ඇත්තාවූ කුලපුත්‍රයා කෙරෙහි මේ අනුසස් පසක් වෙත්. කවර පසක්ද යත්? මහණෙනි, ලෝකයෙහි යම් ඒ ශාන්තවූ සත්පුරුෂයෝ

වෙද්ද, ඔව්හු ශ්‍රද්ධා ඇත්තහුටම පළමුකොට අනුකම්පා කරන්නාහු අනුග්‍රහ කරත්. එසේ ශ්‍රද්ධා නැත්තහුට නොකරත්. ශ්‍රද්ධා ඇත්තහු කරාම පැමිණෙන්නාහු පළමුකොට පැමිණෙත්. ශ්‍රද්ධා නැත්තහු කරා එසේ නොපැමිණෙත්. පිළිගන්නාහු ශ්‍රද්ධා ඇත්තහුගේම දෙය්‍ය ධර්මය පළමුකොට පිළිගණිත්. ශ්‍රද්ධා නැත්තහුගේ එසේ නොගණිත්. ශ්‍රද්ධා ඇත්තහුටම ධර්මය දෙශනා කරන්නාහු පළමුකොට දෙශනා කෙරෙත්. ශ්‍රද්ධා නැත්තහුට එසේ නොකරත්. ශ්‍රද්ධා ඇත්තේ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති දෙව්ලොව උපදියි. මහණෙනි, මොහු වනාහි ශ්‍රද්ධා ඇති කුලපුත්‍රයා කෙරෙහිවූ අනුසස් පස වෙත්.

2. "මහණෙනි, යම්සේ යහපත් භූමියෙහි සතර මං සන්ධියෙහි මහත්වූ නුග රුකෙක් හාත්පස පක්ෂීන්ට පිළිසරණවේද මහණෙනි, එපරිද්දෙන්ම ශ්‍රද්ධාව ඇත්තාවූ කුල පුත්‍ර තෙම භික්ෂුය භික්ෂුණිය, උපාසකය, උපාසිකාය යන බොහෝදෙනාට පිළිසරණ වේයයි වදාළේය.

1. "අතු හා කොළ ගෙඩි ඇත්තාවූද, කඳින් යුක්ත වූද හටගත් මුල ඇත්තාවූද ඵලයෙන් යුක්තවූ මහත්වූ වෘක්ෂය තෙම පක්ෂීන්ට පිහිට වෙයි.

2. "සිත් කළු ස්ථානයෙහිවූ ඒ රුක පක්ෂීහු සේවනය කරත්. සෙවන ප්‍රයොජනකොට ඇත්තාහු සෙවනට යෙත්. ඵලය ප්‍රයෝජනකොට ඇත්තාහු ඵල බුදින්නාහු වෙත්.

3. "එසේම ශීලයෙන් යුක්තවූ උඩගුනොවූ පැවතුම් ඇති තද ගති නැත්තාවූ සුරත භාවයෙන් යුක්තවූ සතුට ඇත්තාවූ මෘදුවූ ශ්‍රද්ධාව ඇති පුරුෂ පුද්ගලයාවූ,

4. "එබඳු මනුෂ්‍යයා ලෝකයෙහි පුණ්‍යක්ෂේත්‍රවූ පහවූ රාග ඇති පහවූ දොෂ ඇති පහවූ මොහ ඇති ආශ්‍රව රහිතවූ සත්පුරුෂයෝ සෙවනය කරත්.

5. "උන්වහන්සේලා ඔහුට සියලු දුක් දුරුකරන්නාවූ යම් ධර්මයක් දෙශනා කෙරෙද්ද, හෙතෙම මෙලොව ඒ ධර්මය දැන ආශ්‍රව රහිත වූයේ පිරිනිවේයයි වදාළේය."

**39. පඤ්චඨාන දස්සන සූත්‍රය:-** "මහණෙනි, මේ කරුණු පසක් දක්නාවූ මව්පියෝ කුලයෙහි උපදින්නාවූ පුත්‍රයා කැමති වෙත්. කවර පසක්ද? පොෂණය කරණ ලද්දේ හෝ අප පොෂණය කරන්නේය. අපගේ කටයුත්ත හෝ කරන්නේය. කුලවංශය බොහෝ කල් පවත්නේය. දායාදය පිළිපදනේය. තවද කළුරිය කළාවූ පරලොව ගියවුන්ට දානය දෙන්නේය යන පසයි. මහණෙනි, මේ කරුණු පස වනාහි දක්නාවූ මව්පියෝ කුලයෙහි උපදින්නාවූ පුත්‍රයා කැමති වෙත්යයි" වදාළේය.

1. "නුවණැත්තෝ කරුණු පසක් දකිමින් පුතෙකු කැමති වෙත්. පොෂණය කරණ ලද්දේ හෝ අප පොෂණය කරන්නේය. අපගේ කටයුත්ත හෝ කරන්නේය.

2. "කුල වංශය බොහෝ කල් පවත්නේය. දායාදය පිළිපදනේය. තවද පරලොව ගියවුන්ට දක්ෂිණාව දෙන්නේය.

3. "නුවණැත්තෝ මේ කරුණු පස දකිමින් පුත්‍රයෙකු කැමති වෙත්. එහෙයින් කෘතඥවූ කළ උපකාර දන්නාවූ ශාන්තවූ සත්පුරුෂයෝ,

4. "පෙරකළ උපකාර සිහිකරමින් මව්පියන් පොෂණය කරත්. පූර්ව උපකාර ඇත්තාවූ ඔවුන්ගේ කටයුතු ඒවූ පරිද්දෙන් කරත්.

5. "මව්පියන්ගේ අවවාදය කරන්නාවූ තමන් පොෂණය කළ මව්පියන් පොෂණය කරන්නාවූ කුලවංශය නොපිරිහෙළන්නාවූ ශ්‍රද්ධා ඇත්තාවූ ශීලයෙන් යුක්තවූ පුත්‍රතෙම පැසසිය යුතු වේයයි" වදාළේය.

**40. පඤ්චවඩ්ඪී සූත්‍රය:-** 1. "මහණෙනි, හිමවත් පර්වත රාජයා ඇසුරුකොට මහත්වූ වෘක්ෂයෝ වැඩීම් පසකින් වැඩෙත්. කවර පසකින්ද යත්? අතු හා කොළ දළු වලින් වැඩෙත්. සිවියෙන් වැඩෙත්. පතුරෙන් වැඩෙත්. ඵලයෙන් වැඩෙත්. හරයෙන් වැඩෙත්. මහණෙනි, හිමවත් පර්වතරාජයා ඇසුරුකොට මහා වෘක්ෂයෝ මේ වැඩීම් පසෙන් වැඩෙත්.

2. "මහණෙනි, මෙපරිද්දෙන්ම ශ්‍රද්ධාව ඇති කුලපතියා ඇසුරුකොට ඇතුළත් ජනතෙම වැඩීම් පසකින් වැඩෙයි.

3. "කවර පසකින්ද යත්? ශ්‍රද්ධාවෙන් වැඩෙයි, ශීලයෙන් වැඩෙයි, ශ්‍රැතයෙන් වැඩෙයි, ත්‍යාගයෙන් වැඩෙයි, ප්‍රඥාවෙන් වැඩෙයි.

3. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

1. "ගම් නැති පෙදෙසෙහිවූ මහත්වූ වනයෙහි ශෛල පර්වතයක් යම්සේ වේද්ද, එය ඇසුරුකොට ඒ වනදෙටු වෘක්ෂයෝ යම්සේ වැඩෙද්ද,

2. "එසේම මේ ලොකයෙහි ශීලයෙන් යුක්තවූ ශ්‍රද්ධාව ඇති කුලපතියා ඇසුරුකොට අඹුදරුවෝද නෑයෝද වැඩෙත්.

3. "ඇමතියෝද ඥාති සමූහයාද යන මොහුට අනුව ජීවත් වන්නාවූ යම් කෙනෙක් වෙද්ද, ඔව්හු සිල්වත්වූ මොහුගේ සීලයද ත්‍යාගයද සුචරිතයන්ද දකිමින් ඒ අනුව කටයුතු කෙරෙත්. නුවණැත්තාවූ යම්කෙනෙක් වෙද්ද, ඔව්හු,

4. "මෙලොව සුගතියට යන මාර්ගයවූ කුශල ධර්මයෙහි හැසිර දෙව්ලොව කම් සැපයෙන් කැමති වන්නාහු ප්‍රීතිවන්නාහු, සතුටුවෙත්යයි වදාළේය."

**(සතරවන සුමනා වර්ගය නිමි.)**

---

## 5. මුණ්ඩරාජ වර්ගය.

41. **භොගාදිය සූත්‍රය**:- 1. (මේ ඡේදය මේ පණ්ණාසකයේ 31 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "එකල්හි වනාහි අනේපිඬු මහ සිටුතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන්නාවූ අනේපිඬු මහ සිටුහට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය.

3. "ගෘහපතිය, මේ සම්පත් ලැබිය යුතු කරුණු පසක් වෙත්. කවර පසක්ද යත්?

4. "ගෘහපතිය, මේ ලෝකයෙහි ආර්ය ශ්‍රාවකතෙම උත්ථාන වීර්යයෙන් ලබන ලද්දාවූ බාහු බලයෙන් රැස්කරණ ලද්දාවූ දාඩිය වැගිරීම් ඇත්තාවූ දැහැමිවූ, දැහැමින් ලබන ලද්දාවූ සම්පත්වලින්

5. "තමා සුවපත් කරයි, පිණවයි, මනාකොට සුවසේ පරිහරණය කරයි. මව්පියන් සුවපත් කරයි, පිණවයි, මනාකොට සුවසේ පරිහරණය කරයි, අඹුදරුවන් හා දැසිදස් කම්කරු පුරුෂයන් සුවපත් කරයි, පිණවයි, මනාකොට සුවසේ පරිහරණය කරයි. මේ පළමුවන සම්පත් ලැබියයුතු කරුණවේ. නැවත අනිකක්ද කියමි.

6. (මේ ඡේදය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි.)

7. "මිත්‍රාමාත්‍යයන් සැපවත් කරයි, පිණවයි. මනාකොට සැපසේ පරිහරණය කරයි. මේ දෙවන සම්පත් රැස්කළ යුතු කරුණ වේ. නැවත අනිකක්ද කියමි.

8. (මේ ඡේදය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි.)

9. "ගින්නෙන් හෝ දියෙන් හෝ රජුන්ගෙන් හෝ සොරුගෙන් හෝ අප්‍රිය දායාදයන්ගෙන් හෝ යම් ඒ විපත් වෙද්ද, එබඳු විපත්වලදී සම්පත්වලින් වසාගෙණ පවතියි තමා සුවපත් කෙරෙයි. මේ තුන්වන සම්පත් ලැබියයුතු කරුණවේ. නැවත අනිකක්ද කියමි.

10. (මේ ඡේදය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි.)

11. පිදවිලි පසක් කරන්නේ වෙයි. නෑයින්ට දියයුතු පූජාවය ආගන්තුගයන්ට කටයුතු පූජාවය. පළමු පරලොව ගියවුන්ට කළයුතු පූජාවය රජුන්ට දියයුතු පූජාවය. දේවතාවන්ට දියයුතු පූජාවය යන පසයි. මේ සතරවන සම්පත් ලැබියයුතු කරුණවේ. නැවත අනිකක්ද කියමි.

12. (මේ ඡේදය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

13. "මදයෙන් හා ප්‍රමාදයෙන් වැළකුණාවූ ක්ෂාන්තිය හා සුරත භාවයෙහි ඇතුළත්වූ යම් මේ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ එකළාව තමන් දමනය කෙරෙද්ද, එකළාව තමන් සංසිඳුවද්ද, එකළාව තමන් පිරිනිවෙද්ද, එබඳුවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහි මතුමත්තෙහි සැප විපාක දෙන්නාවූ ස්වර්ගයට හිත වූ සැප විපාක ඇත්තාවූ ස්වර්ග සැපය පිණිස පවත්නාවූ දක්ෂිණාව පිහිටුවයි. මේ පස්වන සම්පත් රැස්කළයුතු කරුණ වේ. ගෘහපතිය මොහු වනාහි සම්පත් රැස්කළයුතු කරුණු පසවෙත්.

14. "ගෘහපතිය, ඉදින් මේ සම්පත් ලැබියයුතු කරුණු පස ගනිමින් පැවතුනාවූ ඒ ආර්යශ්‍රාවකයාගේ සම්පත් විනාශයට යෙද්ද, ඔහුට මෙබඳු සිතක් වෙයි. ඒකාන්තයෙන් සම්පත් ලැබියයුතු යම් කරුණු වෙද්ද, ඔවුන්ද මම ගත්තෙමි. මාගේ සම්පත්ද විනාශයට යෙත්යයි' මෙසේ මොහුට විපිළිසර නොවීමක් වන්නේය.

15. "ගාහපතිය, ඉදින් සම්පත් ලැබියයුතු මේ කරුණු පස පිළිපදින්නාවූ ඒ ආර්ය ශ්‍රාවකයාගේ සම්පත් මනාව වැඩෙද්ද, ඔහුට මෙබඳු සිතක් වෙයි. 'ඒකාන්තයෙන් සම්පත් ලැබියයුතු යම් කරුණු වෙද්ද, ඔවුන්ද මම පිළිපදිමියි මාගේ සම්පත්ද මනාව වැඩෙත්යයි මෙසේ මොහුට කරුණු දෙකින්ම විපිළිසර නොවීම වේයයි" වදාළේය.

(1) "මා විසින් සම්පත් අනුභව කරණලදහ. පොෂණය කළයුත්තෝ පොෂණය කරණලදහ. විපත්තීහු එතෙර කරණ ලදහ. මතු මත්තෙහි උතුම් විපාක ඇති දානය දෙන ලදී. තවද පිදවිලි පස කරණ ලදී.

(2) "සංයම ඇත්තාවූ බ්‍රහ්මචාරීවූ සිල්වත්හු උපස්ථාන කරණ ලදහ. නුවණැත්තේ ගිහිගෙයි වසමින් යමක් සඳහා සම්පත් කැමතිවන්නේද, මා විසින් ඒ අර්ථය ලබන ලදී. පසුව නොතැවියයුතු පරිදි කරණලදී.

(3) "මේ සිහිකරන්නාවූ සත්වතෙම පඤ්චසීලයෙහි පිහිටියාවූ මිනිසෙක් වේද, මෙලොවදීම ඔහු ප්‍රශංසා ලබත් පරලොව, දෙව්ලොවද සතුටුවේයයි" වදාළේය.

**42. සප්පුරිසත්ථ සූත්‍රය:-** 1. "මහණෙනි, කුලයෙහි උපදිනු ලබන්නාවූ සත්පුරුෂතෙම බොහෝ දෙනාට වැඩ පිණිස හිත පිණිස සැප පිණිස වේ. මව් පියන්ට වැඩ පිණිස හිත පිණිස සැප පිණිස වේ. අඹුදරුවන්ට වැඩ පිණිස හිත පිණිස සැප පිණිස වේ. දැසි දස් කම්කරු පුරුෂයන්ට වැඩ පිණිස හිත පිණිස සැප පිණිසවේ. මිත්‍රාමාත්‍යයන්ට වැඩ පිණිස හිත පිණිස සැප පිණිසවේ. ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට වැඩ පිණිස හිත පිණිස සැප පිණිස වේ.

**2.** "මහණෙනි, යම්සේ මහත්වූ වර්ෂාව සියලු සත්වයන් සම්පාදනය කරමින් බොහෝ දෙනාට වැඩ පිණිස සිත පිණිස සැප පිණිස වේද, මහණෙනි, එපරිද්දෙන්ම (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

> (1) "බොහෝ දෙනාට හිතවූයේ සම්පත් ලැබ සිටි ධර්මයෙන් රක්නාලද ඔහු දෙවතාතොමෝ රකියි. ඔහු ශ්‍රැතවූ ශීලයෙන් හා ව්‍රතයෙන් යුක්තවූ ධර්මයෙහි පිහිටියහු කීර්ති තොමෝ නොහරියි.
>
> (2) "ධර්මයෙහි පිහිටියාවූ ශීලයෙන් යුක්තවූ සත්‍ය වචන කියන්නාවූ ලජ්ජා ඇති ජම්බු නදියෙන් හටගත් රනින් කළ කාසියක් වැනිවූ ඔහුට කවරෙක් නින්දාකරන්ට සුදුසු වේද, දෙවියෝද ඔහුට ප්‍රශංසා කරත්. බ්‍රහ්මයා විසින්ද හෙතෙම ප්‍රශංසා කරණ ලද්දේයයි" වදාළේය.

**43. ඉට්ඨ ධම්ම සූත්‍රය:-** 1. (මේ ඡේදය මේ පණ්ණාසකයේ 41 සූත්‍රයේ 2 ඡේදය මෙනි)

**2.** "ගෘහපතිය, ඉෂ්ටවූ කැමතිවූ මන වඩන්නාවූ මේ ලෝකයෙහි දුර්ලභ කරුණු පසක් වෙත්. කවර පසක්ද යත්? ගෘහපතිය, ඉෂ්ටවූ කැමැතිවූ මන වඩන්නාවූ ආයුෂයතෙම ලෝකයෙහි දුර්ලභවේ. ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ශරීර වර්ණය තෙම ලෝකයෙහි දුර්ලභවේ. ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ සැපය ලෝකයෙහි දුර්ලභවේ. ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ යශස ලෝකයෙහි දුර්ලභවේ. ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ස්වර්ග සැපයෝ ලෝකයෙහි දුර්ලභ වෙත්.

**3.** "ගෘහපතිය, මොහු වනාහි ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ලෝකයෙහි දුර්ලභවූ කරුණු පස වෙත්. ගෘහපතිය, ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ලෝකයෙහි දුර්ලභවූ මේ පඤ්ච ධර්මයන්ගේ යාඥා කිරීම් හේතුවෙන් හෝ ප්‍රාර්ථනා හේතුවෙන් හෝ ලැබීම නොකියමි.

**4.** "ගෘහපතිය, ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ලෝකයෙහි දුර්ලභවූ මේ පස් වැදෑරුම්වූ කාරණයන්ගේ ආයාචනා හෙතුවෙන් හෝ ප්‍රාර්ථනා හේතුවෙන් හෝ ලැබීමක් වන්නේ නම් මේ ලෝකයෙහි කවරෙක් කුමකට හයවන්නේද? ගෘහපතිය, ආර්ය ශ්‍රාවකතෙම ආයුෂය කැමැත්තේ ආයුෂය යාඥා කරන්නන්ට හෝ ආයුෂයට සතුටු වන්ට හෝ ආයුෂයට කැමතිවන්ට හෝ නොම සුදුසුයි. ගෘහපතිය, ආයුෂය කැමතිවූ ආර්ය ශ්‍රාවකයා විසින් ආයුෂ පිණිස පවත්නාවූ කුශල ප්‍රතිපදාව පිළිපැදිය යුතුයි. ආයුෂය පිණිස පවත්නාවූ පිළිපන්නාවූ මොහුගේ කුශල ප්‍රතිපදාව වනාහි ආයුෂය ලැබීම පිණිස පවතියි. හෙතෙම දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ ආයුෂය ලබන්නේ වෙයි.

**5.** "ගෘහපතිය, ආර්ය ශ්‍රාවකතෙම වර්ණය කැමැත්තේ, වර්ණය යාඥා කරන්ට හෝ සතුටුවන්ට හෝ වර්ණයට කැමතිවන්ට හෝ නොම සුදුසුයි. ගෘහපතිය, වර්ණය කැමැත්තාවූ ආර්ය ශ්‍රාවකයා විසින් වර්ණය පිණිස පවත්නාවූ ප්‍රතිපදාව පිළිපැදිය යුතුයි. මොහු විසින් පිළිපන්නාවූ වර්ණය පිණිස පවත්නාවූ ප්‍රතිපදාව වනාහි වර්ණය ලැබීම පිණිස පවතියි. හෙතෙම දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ වර්ණය ලබන්නේ වෙයි.

**6.** "ගෘහපතිය, ආර්ය ශ්‍රාවකතෙම සැප කැමැත්තේ සැපය යාඥා කරන්ට හෝ සතුටුවන්ට හෝ සැපයට කැමතිවන්ට හෝ නොම සුදුසුයි. ගෘහපතිය, සැප කැමැත්තාවූ ආර්ය ශ්‍රාවකයා විසින් සැපය පිණිස පවත්නාවූ කුශල ප්‍රතිපදාව පිළිපැදිය යුතුයි. මොහු විසින් පිළිපන්නාවූ සැපය පිණිස පවත්නා කුශල ප්‍රතිපදාව වනාහි සැප ලැබීම පිණිස පවතියි. හෙතෙම දිව්‍ය හෝ මනුෂ්‍යවූ හෝ සැපය ලබන්නේ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

7. "ගෘහපතිය, ආර්ය ශ්‍රාවකතෙමේ මේ යශස් කැමැත්තේ යශස යාඥා කරන්ට හෝ සතුටුවන්ට හෝ යශසට කැමතිවන්ට හෝ නොම සුදුසුයි. ගෘහපතිය, යශස් කැමැත්තාවූ ආර්ය ශ්‍රාවකයා විසින් යශස් පිණිස පවත්නාවූ කුශල ප්‍රතිපදාව පිළිපැදිය යුතුයි. මොහු විසින් පිළිපන්නාවූ යශස් පිණිස පවත්නාවූ කුශල ප්‍රතිපදාව වනාහි යශස් ලැබීම පිණිස පවතියි. හෙතෙම දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ යශස ලබන්නේ වෙයි.

8. "ගෘහපතිය, ආර්ය ශ්‍රාවකතෙම ස්වර්ග සැප කැමැත්තේ ස්වර්ග සැපය යාඥා කරන්ට හෝ සතුටුවන්ට හෝ ස්වර්ග සැපය කැමැතිවන්ට හෝ නොම සුදුසුයි. ගෘහපතිය, ස්වර්ග සැප කැමැත්තාවූ ආර්ය ශ්‍රාවකයා විසින් ස්වර්ග සැපය පිණිස පවත්නාවූ කුශල ප්‍රතිපදාව පිළිපැදිය යුතුයි. මොහු විසින් පිළිපන්නාවූ ස්වර්ගය පිණිස පවත්නා කුශල ප්‍රතිපදාව වනාහි ස්වර්ග සැප ලැබීම පිණිස පවතියි. හෙතෙම ස්වර්ග සැප ලබන්නේ වේයයි" වදාළේය.

1. "ආයුෂයද ශරීර වර්ණයද යශසද කීර්තියද ස්වර්ග සැපයද උසස් කුල ඇති බවද මහත්වූ ඔබමොබ කැමති සම්පත් පතන්නහු විසින්,

(2) පුණ්‍යක්‍රියාවන්හි ප්‍රමාද නොවීම නුවණැත්තෝ පසසත්. අප්‍රමාදවූ නුවණැත්තේ මේ ආත්මයෙහිම යම් අර්ථයක් වේද, පරලොව වන්නාවූ යම් අර්ථයකුත් වේද, යන දෙලොව අර්ථයන් ලබයි. අර්ථය ලැබීමෙන් ප්‍රාඥ තෙම පණ්ඩිතයායයි කියනු ලැබේයයි" වදාළේය

44. **මනාපදායී සූත්‍රයඃ-** 1. එක්කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසල් නුවර මහ වනයෙහිවූ කූටාගාර ශාලාවෙහි වැඩ වසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු වේලෙහි හැඳ පොරවා පා සිවුරු ගෙණ විසල් නුවර වැසිවූ උග්ග නම් සිටුහුගේ ගෘහය යම් තැනෙක්හිද එතැනට පැමිණිසේක. පැමිණ, පනවන ලද අස්නෙහි වැඩහුන් සේක. ඉක්බිති විසල් නුවර වැසි උග්ග නම් සිටුතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ

භාග්‍යවතුන් වහන්සේට සකස් කොට වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන්නාවූම විසල් නුවර වැසි උග්ග නම් සිටුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය.

**2.** "ස්වාමීනි, මනාපවූ දෙයක් දෙන තැනැත්තේ මනාපවූ දෙයක් ලබයි, යන මෙය භාග්‍යවතුන් වහන්සේගේ හමුවෙහි අසන ලදී. භාග්‍යවතුන් වහන්සේගේ හමුවෙහි පිළිගන්නා ලදී.

**3.** "ස්වාමීනි. සල් මල් මෙන් සාදනලද කෑම මට මනාප වේ. මාගේ ඒ කෑම භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස පිළිගන්නා සේක්වායි" භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස එය පිළිගත්සේක. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

**4.** "ස්වාමීනි. මිහිරි ඩෙබර ඵල සහිතවූ පස්ගෝරස සහිතවූ භොජනය මට මනාපවේ, මාගේ එය භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස පිළිගන්නා සේක්වායි" භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස පිළිගත්සේක. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

**5.** "ස්වාමීනි, තෙලින් බදිනා ලද නාළියසාක නම් පලා වර්ගය මට මනාප වේ. මාගේ ඒ භොජනය භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස පිළිගන්නා සේක්වායි," භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස පිළිගත්සේක. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

**6.** "ස්වාමීනි, අහුලා දමනලද කළු ඇට ඇති නොයෙක් මාළු ඇති නොයෙක් ව්‍යඤ්ජන ඇති ඇල් සාලේ බත මට මනාප වේ. මාගේ ඒ බත භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස පිළිගන්නා සේක්වායි" භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස පිළිගත් සේක. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.

**7.** "ස්වාමීනි, කසී රට උපන් වස්ත්‍ර මට මනාප වෙත්. ස්වාමීනි, මාගේ ඒ වස්ත්‍ර භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස පිළිගන්නා සේක්වායි" භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස පිළිගත්සේක. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ස්වාමීනි, කොඳු පලස් අතුරනලද, සුදු එළු ලොම් ඇතිරි අතුරණලද, ඝන පුප් ඇතිරි අතුරණලද, කෙසෙල් මුවන්ගේ සමින් කළ උතුම් පසතුරුණු අතුරණලද, උඩුවියන් සහිතවූ දෙපස තබනලද රතු කොට්ටා ඇති පර්යංකය තෙම මට මනාප වේ. ස්වාමීනි, එතකුදුවුවත් මෙය භාග්‍යවතුන් වහන්සේට නොකැප යයි. අපිදු මෙය දනිමු.

**9.** "ස්වාමීනි, මාගේ මේ සඳුන් පුවරුව දහසකට වැඩිය වටියි. මාගේ එය භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස පිළිගන්නා සේක්වායි," භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස පිළිගත්සේක.

**10.** "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විසල් නුවර වැසි උග්ග නම් සිටුහුට මේ අනුමෝදනාවෙන් අනුමෝදන් කළ සේක.

(1) "යමෙක්තෙම ඍජුවූවන් කෙරෙහි වස්ත්‍රය ශයනාශනය තවද ආහාර පානයද නොයෙක් ප්‍රකාර ප්‍රත්‍යයන්ද කැමැත්තෙන් දේද, මනාපවූ දෙය දෙන්නාවූ හෙතෙම මනාප දෙය ලබයි.

(2) "ඒ සත්පුරුෂතෙම ත්‍යාග කරණ ලද්දාවූද, මුදන ලද්දාවූද, අපේක්ෂාවෙන් නොගන්නා ලද්දාවූද, සිතින් ක්ෂේත්‍ර බඳුවූ රහතන් දැන දුෂ්කරවූ පරිත්‍යාගය කොට මනාපවූ දෙය දෙන්නේ මනාපවූ දෙය ලබායයි" වදාළේය.

**11.** "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විසල් නුවර වැසි උග්ග නම් ගෘහපතියාට මේ අනුමෝදනාවෙන් අනුමෝදන් කොට හුනස්නෙන් නැගිට වැඩිසේක. ඉක්බිති විසල් නුවර වැසි උග්ග නම් ගෘහපතිතෙම පසු කලෙක්හි කළුරිය කෙළේය. කළුරිය කළාවූ විසල් නුවර වැසි උග්ග නම් ගෘහපතිතෙම, එක්තරා මනොමයවූ දෙව් කොටසක උපන්නේය.

**12.** "එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම්වූ අනේපිඬු මහසිටුහුගේ ආරාමයෙහි වැඩ වසනසේක. එකල්හි වනාහි උග්ගනම් දිව්‍යපුත්‍ර තෙම ප්‍රථම යාමය ඉක්මගිය රාත්‍රිය ඇති කල්හි අභිරාම ෂව්වර්ණ ඇත්තේ

සියලු ජේතවනාරාමය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට සකස්කොට වැඳ එකත්පස්ව සිටියේය. එකත්පස්ව සිටියාවූ උග්ග නම් දිව්‍ය පුත්‍රයාට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. 'උග්ගනම් දිව්‍යපුත්‍රය, කිමෙක්ද තොපගේ අදහස් පරිදි වූයේද?"

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, එසේය. මාගේ අදහස පරිදි වූයේයයි" ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උග්ග නම් දිව්‍ය පුත්‍රයාට ගාථාවලින් ධර්මදෙශනා කෙළේය.

1. "මනාපවූ දෙය දෙන තැනැත්තේ මනාපවූවක් ලබයි. අග්‍රවූ දෙය දෙන්නේ නැවත අග්‍රවූවක් ලබයි. උතුම් දෙය දෙන්නේ උතුම් දෙය ලබන්නෙක් වෙයි. ශ්‍රෙෂ්ඨවූවක් දෙන්නේ ශ්‍රෙෂ්ඨවූ තැනට පැමිණෙයි.

2. "යමෙක් අග්‍රවූ දෙය දෙන්නේ උතුම් දෙය දෙන්නේ වේද, යම් මනුෂ්‍යයෙක් ශ්‍රෙෂ්ඨවූ දෙය දෙන්නේ වේද, හෙතෙම යම් යම් තැනක උපදී නම්, ඒ ඒ තන්හි දීර්ඝායුෂ ඇත්තෙක් යශස් ඇත්තෙක් වේයයි" වදාළේය.

**45. පඤ්ච පුඤ්ඤාභිසන්ද සූත්‍රයː-** 1. "මහණෙනි, සැපයට ආහාරවූ ස්වර්ගයට හිතවූ සැප විපාක ඇත්තාවූ ස්වර්ග සැපය පිණිස පවත්නාවූ කුශලයන්ගේ රැස්කිරීම ඇත්තාවූ මේ පුඤ්ඤාභිසන්දයෝ හෙවත් පින් රැස්කිරීම් පසක් ඉෂ්ට බැව් පිණිසද කැමති බැව් පිණිසද මනාප බැව් පිණිසද හිත පිණිසද සැප පිණිසද පවතිත්.

2. "කවර පසක්ද යත්? මහණෙනි, භික්ෂුතෙම යමෙකුගේ සිවුර පරිභොග කරමින්,

3. "අප්‍රමාණවූ චිත්ත සමාධියට පැමිණ වාසය කෙරේද, ඔහුගේ (මෙහි මේ සූත්‍රයේ 1 ඡෙදය යෙදිය යුතුයි.)

4. "මහණෙනි, භික්ෂුතෙම යමෙකුගේ ආහාරය වළඳමින් (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදයද 1 ඡෙදයද යෙදිය යුතුයි) විහාරය පරිභොග කරමින් (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදයද 1 ඡෙදයද

යෙදිය යුතුයි.) ඇඳ පුටු පරිභොග කරමින් (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදයද 1 ඡේදයද යෙදිය යුතුයි.) ගිලන්පස බෙහෙත් පරිභොග කරමින් (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදයද 1 ඡේදයද යෙදිය යුතුයි)

**5.** "මහණෙනි, කුශල් රැස්කිරීමවූ මේ පින් රැස්කිරීම් පසෙන් වනාහි යුක්තවූ ආර්යශ්‍රාවකයාහට (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි) පුණ්‍යයාගේ ප්‍රමාණය කියන්ට නොහැකි වේයයි පුණ්‍යයාගේ ප්‍රමාණයක් ගන්ට නොහැකිය. වැලිදු සංඛ්‍යාවක් නැත්තාවූ ප්‍රමාණය නැත්තාවූ මහත්වූ පින් රැසක්ම වේය යන සංඛ්‍යාවට පැමිණේ. මහණෙනි, යම්සේ මහා සමුද්‍රයෙහි මෙතෙක් දිය ලාස් ගණන් වෙත්යයි කියා හෝ මෙතෙක් දිය ලාස් සිය ගණන් වෙත්යයි කියා හෝ මෙතෙක් දිය ලාස් දහස් ගණන් වෙත්යයි කියා හෝ මෙතෙක් දිය ලාස් ලක්ෂ ගණන් වෙත්යයි කියා හෝ ජලයේ ප්‍රමාණයක් ගන්ට නොහැකිවේද වැලිදු සංඛ්‍යාවක් නැත්තාවූ ප්‍රමාණයක් නැත්තාවූ මහා ජලස්කන්ධයයි කියාම සංඛ්‍යාවට පැමිණේද, මහණෙනි, එපරිද්දෙන්ම කුශල් රැස්කිරීම මේ පින් රැස්කිරීම් පසින් යුක්තවූ ආර්ය ශ්‍රාවකයාගේ (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.) යයි පුණ්‍යයාගේ ප්‍රමාණයක් කරන්ට නොහැකිවේ. වැලිදු සංඛ්‍යාවක් නැත්තාවූ ප්‍රමාණයක් නැත්තාවූ මහා පුණ්‍ය ස්කන්ධයක්යයිම යන සංඛ්‍යාවට පැමිණේයයි" වදාළේය.

**1.** "මහත් ජලය දරන්නාවූ ප්‍රමාණ රහිතවූ මහත් විලක්වූ බොහෝසේ භයජනකවූ රත්න සමූහයන්ට උත්පත්තිස්ථානවූ සාගරය කරා මනුෂ්‍ය සමූහයා විසින් සෙවනය කරණ ලද ගලාබස්නාවූ බොහෝවූ ගංගාවෝ යම්සේ එළඹෙත්ද,

**2.** "මෙසේ ආහාර දෙන්නාවූද පාන වර්ග හා වස්ත්‍ර දෙන්නාවූද සයනාසන හා හිඳගන්නා ආසන දෙන්නාවූද පණ්ඩිතවූ මනුෂ්‍යයා කරා දිය බැසයන්නාවූ ගංගාවෝ සාගරය කරා යන්නාක් මෙන් පුණ්‍යධාරාවෝ එළඹෙත්යයි" වදාළේය.

**46. පඤ්චසම්පදා සූත්‍රය**:- "මහණෙනි, මේ සම්පත් පසක් වෙත්. කවර පසක්ද යත්. ශ්‍රද්ධා සම්පත්තිය, ශීල සම්පත්තිය, ශ්‍රැතසම්පත්තිය, ත්‍යාග සම්පත්තිය, ප්‍රඥා සම්පත්තිය යන පසයි. මහණෙනි, මොහු වනාහි සම්පත් පස වෙත් යයි" වදාළේය.

**47. පඤ්ච ධන සූත්‍රය**:- 1. "මහණෙනි, මේ ධන පසක් වෙත්. කවර පසක්ද යත්? ශ්‍රද්ධා ධනය, ශීලධනය, ශ්‍රැතධනය ත්‍යාග ධනය, ප්‍රඥා ධනය යන පසයි.

**2.** "මහණෙනි, ශ්‍රද්ධා ධනය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්යශ්‍රාවක තෙම ශ්‍රද්ධා ඇත්තේ වේද, ඒ භාග්‍යවත්තෙම මේ කාරණයෙන්ද අර්හත් සම්‍යක් සම්බුද්ධය, විජ්ජාචරණ සම්පන්නය, සුගතය, ලොකවිදූය, උතුම්වූ පුරුෂයන් හික්මවීමේ රියැදුරෙක, දෙව් මිනිසුන්ට ශාස්තෘය, චතුස්සත්‍යාවබොධ කෙළේය, භාග්‍යවත්යයි තථාගතයන්ගේ බොධිය අදහාද, මහණෙනි, මෙය ශ්‍රද්ධා ධනයයි කියනු ලැබේ.

**3.** "මහණෙනි, ශීල ධනය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්යශ්‍රාවකතෙම සතුන් මැරීමෙන්, සොරකමින්, කාමයෙහි වරදවා හැසිරීමෙන්, මුසාවාදයෙන්, රහමෙර පානයෙන් වෙන් වූයේ වේද, මහණෙනි, මෙය ශීල ධනයයි කියනු ලැබේ.

**4.** "මහණෙනි, ශ්‍රැතධනය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්යශ්‍රාවක තෙම බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේ වේද, ඇසූ දේ සිහි ඇත්තේද, අසා සිතේ තැන්පත් කරන්නේද, යම් ධර්මකෙනෙක් මුල යහපත්ද, මැද යහපත්ද, අග යහපත්ද, අර්ථ සහිත ව්‍යඤ්ජන සහිත පරිපූර්ණ පිරිසිදුවූ බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කෙරේද, එබඳු ධර්මයෝ දැරූයේ වචනයෙන් පුරුදුකරන ලද්දේ ප්‍රත්‍යවෙක්ෂා කරන ලද්දේ දෘෂ්ටියෙන් මනාව ප්‍රතිවේධ කරණ ලද්දේ වේද, මහණෙනි, මෙය ශ්‍රැත ධනයයි කියනු ලැබේ.

**5.** "මහණෙනි, ත්‍යාග ධනය කවරේද, මහණෙනි, මේ ශාසනයෙහි ආර්යශ්‍රාවක තෙම මුදන ලද ත්‍යාග සිත ඇත්තේ පවිත්‍රවූ අත් ඇත්තේ පරිත්‍යාගයෙහි ඇළුනේ ඉල්ලීමට සුදුසු වූයේ දන් බෙදීමෙහි ඇළුනේ පහවූ මසුරු කළ ඇති සිතින්

යුක්තව ගිහිගෙයි වාසය කෙරේද, මහණෙනි, මෙය ත්‍යාග ධනයයි කියනු ලැබේ.

6. "මහණෙනි, ප්‍රඥා ධනය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්යශ්‍රාවක තෙම ආර්යවූ කෙලෙස් බිඳීම ඇත්තාවූ මනාකොට දුක් ක්ෂය කිරීම පිණිස පවත්නාවූ ඇතිවීම නැතිවීම දැනගන්නා පිණිස පවත්නාවූ ප්‍රඥාවෙන් යුක්තවූයේ නුවණැත්තේ වේද, මහණෙනි, මෙය ප්‍රඥා ධනයයි කියනු ලැබේ. මහණෙනි, මොහු වනාහි ධන පස වෙත්යයි වදාළේය.

1. "යමෙකුගේ ශ්‍රද්ධා තොමෝ තථාගතයන් කෙරෙහි නිශ්චලව මනාකොට පිහිටන ලද්දීද යමෙකුගේ ශීලයද යහපත්වූ ආර්යයන් කැමතිවූ ප්‍රශංසා කරණ ලද්දක් වේද,

2. "යමෙකුගේ සංඝයා කෙරෙහි ප්‍රසාදය ඇත්තේද ඍජුවූ දර්ශනය ඇත්තේද ඔහු දිළින්දෙක් නොවේයයි කියත්. ඔහුගේ ජීවිතය නොසිස්වේ.

3. "එහෙයින් ශ්‍රද්ධාවද ශීලයද ප්‍රසාදයද ධර්ම දර්ශනයද යන මෙහි නුවණැත්තේ බුදුවරයන්ගේ අනුශාසනය සිහි කරමින් යෙදෙන්නේයයි" වදාළේය.

48. **අලබ්භනීයඨාන සූත්‍රයː-** 1. "මහණෙනි, ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බ්‍රහ්මයෙකු විසින් හෝ ලෝකයෙහි කිසිවෙකු විසිනුත් නොලැබිය හැක්කාවූ මේ කරුණු පසක් වෙත් කවර පසක්ද යත්?

2. "ජරා ධර්මය නොදිරාවායි,

3. "ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බ්‍රහ්මයෙකු විසින් හෝ ලෝකයෙහි කිසිවෙකු විසිනුත් නොලැබිය හැකි කරුණක් වේ.

4. "ව්‍යාධි ධර්මය නොපෙලාවායි (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.) මරණ ධර්මය නොමියේවායි (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.) ක්ෂය ධර්මය ක්ෂය නොවේවායි

(මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) නැසෙන ධර්මය නොනසීවායි, (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

**5.** "මහණෙනි, අශ්‍රැතවත්වූ පෘථග්ජනයාගේ ජරාධර්මය දිරයි. හෙතෙම ජරා ධර්මය දිරූ කල්හි මෙසේ නොසළකයි. එකලාවූ මාගේම ජරා ධර්මය නොදිරයි. වැලිදු සත්වයන්ගේ ඊම යාම චුතවීම ඉපදීම යම්තාක් වේද, සියලු සත්වයන්ගේ ජරා ධර්මය දිරයි. මමද වනාහි ජරා ධර්මය දිරූ කල්හි ශොක කරන්නෙමි.

**6.** "වෙහෙසෙන්නෙම් නම්. වැළපෙන්නෙම් නම්, ළෙහි අත් ගසමින් හඬන්නෙම්, මුළාවට පැමිණෙම්නම් ආහාරයද මට රුචි නොවන්නේය. ශරීරයෙහිද දුර්වර්ණභාවයට බැස ගන්නේය. කර්මාන්තයෝද නොපවත්නාහුය. පසමිතුරෝද සතුටු වන්නාහුය. මිතුරෝද නොසතුටු වන්නාහුයයි,

**7.** "ජරා ධර්මය හෙතෙම දිරූ කල්හි

**8.** "ශොක කරයි. වෙහෙසෙයි, වැළපෙයි, ළෙහි අත්ගසමින් හඬයි, මුළාවට පැමිණෙයි.

**9.** "මහණෙනි, මේ අශ්‍රැතවත් පෘථග්ජන තෙම විෂ සහිතවූ ශොක නමැති හුලෙන් විදිනා ලද්දේ තමන්ම තවා යයි කියනු ලැබේ.

**10.** "නැවත අනිකක්ද කියමි. මහණෙනි, අශ්‍රැතවත්වූ පෘථග්ජනයාගේ ව්‍යාධි ධර්මය පෙළයි. හෙතෙම ව්‍යාධි ධර්මය පෙළූකල්හි මෙසේ නොසලකයි. එකළාවූ මාගේම ව්‍යාධි ධර්මය නොපෙළයි. වැලිදු සත්වයන්ගේ ඊම යාම චුතවීම ඉපදීම යම්තාක් වේද, සියලු සත්වයන්ගේ ව්‍යාධි ධර්මය පෙළයි. මමද වනාහි ව්‍යාධි ධර්මය පෙළූ කල්හි ශොක කරන්නෙමි. (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) හෙතෙම ව්‍යාධි ධර්මය පෙලූ කල්හි (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි) මරණ ධර්මය මරයි. හෙතෙම මරණ ධර්මය මියගිය කල්හි මෙසේ නොසලකයි. එකළාවූ මාගේම මරණ ධර්මය මියයයි. වැලිදු සත්වයන්ගේ ඊම යාම චුතවීම ඉපදීම යම්තාක් වේද, සියලු

සත්වයන්ගේ මරණ ධර්මය මියයයි. මමද වනාහි මියගිය කල්හි ශොක කරන්නෙමි.

(මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) හෙතෙම මරණ ධර්මය මරණ කල්හි (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.) ක්ෂය ධර්මය ක්ෂය වෙයි. හෙතෙම ක්ෂය ධර්මය ක්ෂයවූකල්හි මෙසේ නොසලකයි. එකළාවූ මාගේ ක්ෂය ධර්මය ක්ෂයවෙයි. වැලිදු සත්වයන්ගේ ඊම යාම චුතවීම ඉපදීම යම්තාක් වේද, සියලු සත්වයන්ගේ ක්ෂය ධර්මය ක්ෂය වෙයි. මමද වනාහි ක්ෂය ධර්මය ක්ෂයවූ කල්හි ශොක කරන්නෙමි. (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) හෙතෙම ක්ෂය ධර්මය ක්ෂය කරන කල්හි (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි) නැසෙන ධර්මය නසියි. හෙතෙම නැසෙන ධර්මය නට කල්හි මෙසේ නොසලකයි. එකළාවූ මාගේම නැසෙන ධර්මය නොනසියි. වැලිදු යම්තාක් සත්වයන්ගේ ඊම යාම චුතවීම ඉපදීම වේද, සියලු සත්වයන්ගේ නැසෙන ධර්මය නසියි මමද වනාහි නැසෙන ධර්මය නට කල්හි ශොක කරන්නෙම් නම් (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.)

හෙතෙම නැසෙන ධර්මය නට කල්හි (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.)

**10.** "මහණෙනි, ශ්‍රැතවත් ආර්යශ්‍රාවකයාගේද වනාහි ජරා ධර්මය දිරයි. (මෙහි මේ සූත්‍රයේ 5 දෙයේ 'හෙතෙම' කී තැන සිට යෙදිය යුතුයි.)

**11.** (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) හෙතෙම ජරා ධර්මය දිරූකල්හි

**12.** "ශොක නොකරයි, නොවෙහෙසෙයි, නොවැළපෙයි ළෙහි අත් ගසමින් නොහඬයි. මුළාවට නොපැමිණෙයි මහණෙනි, මේ ශ්‍රැතවත්වූ ආර්ය ශ්‍රාවකතෙම යමකින් විදින ලද්දාවූ අශ්‍රැතවත් පෘථග්ජනතෙම තමන්ම තවාද, එබඳුවූ විෂ සහිතවූ ශොක නමැති හුල ඇදදැම්මේය. ශොක රහිතවූ ඇද දමනලද හුල් ඇත්තාවූ ආර්ය ශ්‍රාවකතෙම තමන්ම පිරිනිවේයයි කියනු ලැබේ.

13. "නැවත අනිකක්ද කියමි. මහණෙනි, ශ්‍රැතවත්වූ ආර්යශ්‍රාවකයාගේ ව්‍යාධි ධර්මය පෙළයි. හෙතෙම ව්‍යාධි ධර්මය පෙලූ කල්හි මෙසේ නොසළකයි. එකළාවූ මාගේ ව්‍යාධි ධර්මය නොපෙළෙයි. වැළිදු සත්වයන්ගේ ඊම යාම චුතවීම ඉපදීම යම් තාක් වේද, සියලු සත්වයන්ගේ ව්‍යාධි ධර්මය පෙළයි. මමද මාගේ ව්‍යාධි ධර්මය පෙලූ කල්හි ශොක කරන්නෙම්. (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) හෙතෙම ව්‍යාධි ධර්මය පෙළූ කල්හි (මෙහි මේ සූත්‍රයේ 12 ඡේදය යෙදිය යුතුයි.)

"මරණ ධර්මය මියයයි, හෙතෙම මරණ ධර්මය මිය ගිය කල්හි මෙසේ නො සළකයි. එකළාවූ මාගේම මරණ ධර්මය නොමියයි වැළිදු සත්වයන්ගේ ඊය යාම චුතවීම ඉපදීම යම්තාක්වේද, සියලු සත්වයන්ගේ මරණ ධර්මය මියයයි මමද වනාහි මරණ ධර්මය මියගිය කල්හි ශොක කරන්නෙම්. (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) හෙතෙම මරණ ධර්මය මරණකල්හි (මෙහි මේ සූත්‍රයේ 12 ඡේදය යෙදිය යුතුයි.)

"ක්ෂයවන ධර්මය ක්ෂයවෙයි හෙතෙම ක්ෂය ධර්මය ක්ෂයවෙයි මෙසේ නොසළකයි එකළාවූ මාගේම ක්ෂය ධර්මය ක්ෂය නොවෙයි. වැළිදු සත්වයන්ගේ ඊම යාම චුතවීම ඉපදීම යම්තාක් වේද, සියලු සත්වයන්ගේ ක්ෂය ධර්මය ක්ෂයවෙයි. මමද වනාහි ක්ෂය ධර්මය ක්ෂයවූ කල්හි ශොක කරන්නෙම්. (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) හෙතෙම ක්ෂය ධර්මය ක්ෂය කරනකල්හි (මෙහි මේ සූත්‍රයේ 12 ඡේදය යෙදිය යුතුයි.)

"නැසෙන ධර්මය නසියි. හෙතෙම නැසෙන ධර්මය නැසුනු කල්හි මෙසේ සළකයි' එකළාවූ මාගේම නැසෙන ධර්මය නොනසියි. වැළිදු යම්තාක් සත්වයන්ගේ ඊම යාම චුතවීම ඉපදීම වේද, ඒ සියලු සත්වයන්ගේ නැසෙන ධර්ය නසියි. මමද වනාහි නැසෙන ධර්මය නැසුනු කල්හි ශොක කරන්නෙම්නම්, (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.)

"හෙතෙම නැසෙන ධර්මය නැසුනු කල්හි (මෙහි මේ සූත්‍රයේ 12 ඡේදය යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

14. "ශොක රහිතවූ ඇද දැමූ හුල් ඇත්තාවූ ආර්යශ්‍රාවක තෙම තමන්ම පිරිනිවේයයි කියනු ලැබේ. මොහු වනාහි ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බ්‍රහ්මයෙකු විසින් හෝ ලෝකයෙහි කිසිවෙකු විසිනුත් නොලැබිය හැකි කරුණු පසෙ වෙත්යයි' වදාළේය.

15. (1) "ශොක කිරීමෙන්ද, වැළපීමෙන්ද, ස්වල්ප වූද ප්‍රයෝජනයකුත් ලැබිය නොහැක්කේය. ශෝක කරන්නාවූ, දුකට පැමිණියාවූ මොහු දැන පසමිතුරෝ සතුටු සිත් ඇත්තෝ වෙත්.

(2) "යම් කලෙක්හි වනාහි කරුණාවන්තවූ අර්ථ විනිශ්චයෙහි දක්ෂවූ පණ්ඩිතතෙම විපත්වලදී කම්පා නොවේද, එකල්හි මොහුගේ පසමිතුරෝ විකාර නොවූ පැරණි මුහුණ දැක දැක්වූවාහු වෙත්.

3. "ගුණ කීමෙන්ද, මන්ත්‍ර පිරවීමෙන්ද, යහපත් වචනයෙන්ද, වස්තු දීමෙන්ද, කුලප්‍රවේනිය කීමෙන්ද යම් යම් පරිද්දකින් යම් යම් තැනෙක්හි ප්‍රයෝජනය ලබන්නේද, ඒ ඒ පරිද්දෙන් ඒ ඒ තන්හි උත්සාහ කරන්නේය.

(4) "ඉදින් මා විසින් ද, අනිකා විසින්ද මේ අර්ථය නොලැබිය හැක්කේ යයි දන්නේ නම්, ශොක නොකරන්නාවූ හෙතෙම මාගේ කර්මය දැඩිවේ. දැන් කුමක් කරම්දැයි, ඉවසන්නේයයි වදාළේය."

49. "පසෙනදි අලබ්භනීයඨාන සූත්‍රයː- 1. (මේ ඡෙදය මේ පණ්ණාසකයේ 31 සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

2. "එකල්හි වනාහි පසෙනදී කොසොල් රජතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ, භාග්‍යවතුන් වහන්සේට සකස්කොට වැඳ එකත්පස්ව හුන්නේය. ඉක්බිති එක්තරා පුරුෂයෙක් පසෙනදි කොසොල් රජතෙමේ යම් තැනෙක්හිද එතැනට එළඹියේය එළඹ පසෙනදී කොසොල් රජහුගේ කන ළඟ "දෙවයන්වහන්ස, මල්ලිකා දෙවීතොමෝ කළුරිය කළායයි' දැන්වූයේය.

3. "මෙසේ කීකල්හි පසේනදී කොසොල් රජතමෙ දුක් වුයේ නොසතුටුවූයේ පතිතවූ කඳ ඇත්තේ, යටිකුරුවූ මුහුණ ඇත්තේ සිතිවිලි සිතන්නේ වැටහීම් රහිතවූයේ හුන්නේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දුක්වූ නොසතුටුවූ පතිතවූ කඳ ඇති යටිකුරු මුහුණ ඇති සිතුවිලි සිතන්නාවූ වැටහීම් රහිතව පසෙනදී කොසොල් රජහු දැක, පසෙනදී කොසොල් රජහුට මෙය වදාළේය.

(මෙහි මේ පණ්ණාසකයේ 48 සූත්‍රයේ 1-4 ඡේදය යෙදිය යුතුයි. 'මහණෙනි' වෙනුවට 'මහරජ' වියයුතුයි.)

**50. මුණ්ඩරාජ සූත්‍රය**:- 1. එක්කලෙක්හි ආයුෂ්මත් නාරද ස්ථවිරතෙම පැළලුප් නුවර කුක්කුටාරාමයෙහි වාසය කරයි එකල්හි වනාහි,

2. "මුණ්ඩ නම් රජුගේ ප්‍රියවූ මනාපවූ භද්‍රා නම් දේවි තොමෝ කළුරිය කරණ ලද්දීවේ. හෙතෙම ප්‍රියවූ මනාපවූ භද්‍රා නම් දේවිය කළුරිය කළ කල්හි නොම ස්නානය කරයි. සුවඳ නොගල්වයි, ආහාර අනුභව නොකරයි, කර්මාන්තය නොයොදවයි. රෑදාවල් දෙක්හි භද්‍රා නම් දෙවියගේ ශරීරයෙහි අධික ආශාවෙන් මුසපත්වූයේ වෙයි.

3. "ඉක්බිති මුණ්ඩ නම් රජතෙම පියක නම් කොටු ගුල් රක්නහු කැඳවූයේය. "එසේ වී නම් යහලු පියකය, භද්‍රා නම් දේවියගේ ශරීරය ආයොමය තෙල් ඔරුවෙක්හි බහා අනික් අයොමය ඔරුවකින් වසව්. යම්සේ අපි භද්‍රා නම් දේවියගේ ශරීරය ඉතා බොහෝ කලක් දක්නෙම්ද, එසේය, "දේවයන් වහන්ස, එසේ යයි" කියා පියක නම් කොෂ්ටාරක්ෂකතෙම මුණ්ඩ නම් රජහට ප්‍රතිවචන දී භද්‍රා නම් දේවියගේ ශරීරය අයොමය තෙල් ඔරුවෙක්හි බහා අන්‍යවූ අයොමය ඔරුවකින් වැසුයේය.

4. "ඉක්බිති පියක නම් කෝෂ්ටාරක්ෂකයාට මෙබඳු අදහසක් විය. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

'මුණ්ඩ නම් රජතෙම යමෙකුගේ ධර්මයක් අසා ශොක නමැති හුල දුරුකරන්නේද, එබඳුවූ කවර නම් ශ්‍රමණයෙකු හෝ

බ්‍රාහ්මණයෙකු හෝ පයුරුපාසනය කරන්නේද? ඉක්බිති පියක නම් කෝෂ්ටාරක්ෂකයාට මේ අදහස විය.

5. "මේ ආයුෂ්මත් නාරද ස්ථවිරතෙම වනාහි පැළලුප් නුවර කුක්කුටාරාමයෙහි වාසය කරයි. ඒ ආයුෂ්මත් නාරද ස්ථවිරයන් වනාහි පණ්ඩිතය, ව්‍යක්තය, නුවණ ඇත්තේය. බහුශ්‍රැතය, විසිතුරු කථා ඇත්තේය. යහපත් වැටහීම් ඇත්තේය. වැඩිමහළු වූයේද, රහත් වූයේද වේයයි' මෙසේ යහපත්වූ ගුණ ඝොෂාවෙක් පැන නැංගේය.

6. මුණ්ඩ නම් රජතෙම ආයුෂ්මත් නාරද ස්ථවිරයන් පයුරුපාසනය කරන්නේ නම් ඉතා යෙහෙක. මුණ්ඩ නම් රජ තෙම ආයුෂ්මත් නාරද ස්ථවිරයන්ගේ ධර්මයක් අසා ශොක නමැති හුල දුරුකරන්නේ නම් ඉතා යෙහෙකැයි ඉක්බිති පියක නම් කෝෂ්ටාරක්ෂකතෙම මුණ්ඩ නම් රජ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, මුණ්ඩ නම් රජුට මෙය කීයේය.

7. "දේවයන්වහන්ස. (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.) ඉදින් වනාහි දේවයන් වහන්සේ ආයුෂ්මත් නාරද ස්ථවිරයන් වහන්සේ ඇසුරුකරන්නේ නම්, දෙවයන්වහන්සේ ආයුෂ්මත් නාරද ස්ථවිරයන් වහන්සේගේ ධර්මයක් අසා ශොක නමැති හුල දුරුකරන්නේ නම් ඉතා යෙයෙක' කියායි.

8. "එසේ වීනම් යහළු පියකය, ආයුෂ්මත් නාරද ස්ථවිරයන් වහන්සේට දැනුම් දෙව, කෙසේ නම් මා වැන්නෙක් රාජ්‍යයෙහි වාසය කරන්නාවූ ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු වෙත පළමු නොදන්වන ලද්දේ එළඹියයුතුයයි හඟින්නේද?'

"දේවයන් වහන්ස, එසේයයි, කියා පියක නම් කෝෂ්ටාරක්ෂකතෙම මුණ්ඩ නම් රජහට උත්තරදී ආයුෂ්මත් නාරද ස්ථවිරයන් යම් තැනෙක්හිද, එතනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් නාරද ස්ථවිරයන් වහන්සේට සකස්කොට වැඳ එකත් පස්ව හුන්නේය.

9. "එකත්පසෙක හුන්නාවුම පියක නම් කෝෂ්ටාරක්ෂකතෙම ආයුෂ්මත් නාරද ස්ථවිරයන්ට මෙය

කීයේය. "ස්වාමීනි (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි) ස්වාමීනි, ආයුෂ්මත් නාරද ස්ථවිරතෙමේ මුණ්ඩ නම් රජහට යම්සේ මුණ්ඩ නම් රජතෙම ආයුෂ්මත් නාරද ස්ථවිරයන් වහන්සේගේ ධර්මයක් අසා ශොක නමැති හුල, දුරුකරන්නේද, එසේ ධර්මයක් දේශනා කරණ සේක්වායි"

10. "පියකය, මුණ්ඩ නම් රජතෙම යමක් සඳහා කාලය හඟීද, එයට දැන් සුදුසුයයි' කීයේය. ඉක්බිති පියක නම් කොෂ්ටාරක්ෂකතෙම හුනස්නෙන් නැගිට ආයුෂ්මත් නාරද ස්ථවිරයන්ට සකස්කොට වැඳ ප්‍රදක්ෂිණාකොට මුණ්ඩ නම් රජ යම්තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ මුණ්ඩ නම් රජුට මෙය කීයේය. "දේවයන්වහන්ස, දේවයන් වහන්සේ යමකට කල් හඟීද, දැන් එයට සුදුසුයයි' ආයුෂ්මත් නාරද ස්ථවිරයන් විසින් කරණ ලද අවකාශ ඇත්තේමයයි."

"එසේ වීනම් යහලු පියකය, සොඳුරු සොඳුරු යානාවන් යොදවවයි" - "දේවයන් වහන්ස, එසේය, කියා" පියක නම් කොෂ්ටාරක්ෂක තෙම මුණ්ඩ නම් රජුට පිළිවදන් දී සොඳුරු සොඳුරු යානාවන් යොදවා මුණ්ඩ නම් රජුට මෙය කීයේය. "දේවයන්වහන්ස ඔබවහන්සේට සොඳුරු සොඳුරු යානාවෝ යොදන ලදහ. දේවයන් වහන්සේ, යමකට කල් හඟීද, එයට දැන් සුදුසුයයි"

11. "ඉක්බිති මුණ්ඩ නම් රජතෙම සොඳුරුවූ යානාවකට නැඟී සොඳුරු යානාවන් සමග කුක්කුටාරාමය යම් තැනෙක්හිද, එතැනට මහත්වූ රාජානුභාවයෙන් යුක්තව ආයුෂ්මත් නාරද ස්ථවිරයන් වහන්සේ දැකීම් පිණිස පැමිණියේය. යානයට භූමිය යම්තාක් වේද, ඒතාක් යානාවෙන් ගොස් යානාවෙන් බැස පයින් ගමන් ඇත්තේම ආරාමයට ඇතුළුවූයේය. ඉක්බිති මුණ්ඩ නම් රජතෙම ආයුෂ්මත් නාරද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් නාරද ස්ථවිරයන් වහන්සේට සකස් කොට වැඳ එකත්පස්ව හුන්නේය.

12. "එකත්පස්ව හුන්නාවූම මුණ්ඩ නම් රජුට ආයුෂ්මත් නාරද ස්ථවිරයන් වහන්සේ මෙය වදාළසේක.

13-27. (මෙහි මේ පණ්ණාසකයේ 48 සූත්‍රය යෙදිය යුතුයි. 'මහණෙනි' වෙනුවට 'මහරජ' කියා වේ.)

28. "මෙසේ වදාළ කල්හි මුණ්ඩ නම් රජතෙම ආයුෂ්මත් නාරද ස්ථවිරයන්ට මෙය කීයේය. "ස්වාමීනි, මේ ධර්ම පර්යාය තෙම කවරේද?" "මහරජ, මේ ධර්මපර්යාය තෙම ශොක නමැති හුල දුරු කරන්නේ නම් වේයයි" කීයේය. "ස්වාමීනි, ඒකාන්තයෙන් ශොක හුල දුරු කරන්නේය. ස්වාමීනි, ඒකාන්තයෙන් ශොක හුල දුරු කරන්නේය. ස්වාමීනි, මාගේ වනාහි මේ ධර්ම පර්යාය අසා ශොක නමැති හුල දුරු වූයේයයි," කීයේය.

29. "ඉක්බිති මුණ්ඩ නම් රජතෙම පියක නම් කොෂ්ටාරක්ෂකයා කැඳවීය. "එසේ වීනම් යහළු පියකය, භද්‍රා නම් දේවියගේ සිරුර දවව්, ඈට සෑයක්ද කරව්, දැන් අද පටන් අපි නහන්නෙමු. විලවුන්ද ගල්වන්නෙමු, ආහාරද අනුභව කරන්නෙමු, කර්මාන්තයෙන්ද යොදවන්නෙමුයි කීයේය."

(5 වන මුණ්ඩ රාජ වර්ගය නිමි.)

---

(පළමුවෙනි පණ්ණාසකය නිමි)

## දෙවෙනි පණ්ණාසකය.

# 6. නීවරණ වර්ගය.

1. **නීවරණ සූත්‍රයඃ-** 1. (මේ ඡේදය චතුක්ක නිපාතයේ 1 පණ්ණාසකයේ 21 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "මහණෙනි, කුශල් මග අවුරන්නාවූ සිත මැඩගෙණ හටගන්නාවූ ප්‍රඥාව දුර්වල කරන්නාවූ මේ නීවරණ පසක් වෙත්.

3. "කවර පසක්ද යත්? මහණෙනි, කාමාසාව,

4. "කුශල් මග අවරන්නාවූ සිත මැඩගෙණ හටගන්නාවූ ප්‍රඥාව දුර්වල කරන්නාවූ නීවරණය වේ.

5. "මහණෙනි, ව්‍යාපාදය, (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

6. "මහණෙනි, ථිනමිද්ධය, (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

7. "මහණෙනි, උද්ධච්ච, කුක්කුච්චය (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

8. "මහණෙනි, විචිකිච්ඡාව (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

9. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

10. "මහණෙනි, ඒ භික්ෂුතෙම ඒකාන්තයෙන් කුශල් මග අවුරන්නාවූ සිත මැඩගෙණ හටගන්නාවූ ප්‍රඥාව දුර්වල කරන්නාවූ මේ නීවරණ පස දුරු නොකොට බල නැත්තාවූ දුර්වල ප්‍රඥාවෙන් තමාගේ අර්ථය හෝ දන්නේය. අනුන්ගේ අර්ථය හෝ දන්නේය. දෙදෙනාගේ අර්ථය හෝ දන්නේය. මනුෂ්‍ය ධර්මයෙන් මත්තෙහිවූ ආර්ය භාවයට සුදුසු ඥාණ දර්ශන විශෙෂයක් ප්‍රත්‍යක්ෂ කරන්නේය, යන මේ කාරණය විද්‍යමාන නොවේ.

11. "මහණෙනි යම්සේ පර්වතයෙන් හටගන්නාවූ දුර ගමන් කරන්නාවූ වහා බැස යන්නාවූ හැරගෙණ යායුත්ත හැරගෙණ යන්නාවූ ගංගාවක් වේද,

12. "ඒ ගංගාවගේ පුරුෂයෙක් තෙම දෙපසින් ජල මාර්ග දොරටු විවෘත කරන්නේද, මහණෙනි, මෙසේ වනාහි ගඟ මැද ඒ දිය පහර වික්ෂිප්ත වූයේ විසිර ගියේ විශෙෂයෙන් ගැණීම ඇත්තේ දුර ගමන් කිරීම නොමවන්නේද, සැඩ පහර ඇත්තේ නොවන්නේද, ගෙණ යායුත්ත ගෙණ නොයන්නේද,

13. "මහණෙනි, මෙපරිද්දෙන්ම ඒ භික්ෂුතෙම ඒකාන්තයෙන් කුශල් මග අවුරන්නාවූ සිත මැඩගෙණ හටගන්නාවූ ප්‍රඥාව දුර්වල කරන්නාවූ මේ නීවරණ පස දුරු නොකොට බල නැත්තාවූ දුර්වලවූ ප්‍රඥාවෙන් තමාගේ අර්ථය හෝ දන්නේය අනිකාගේ අර්ථය හෝ දන්නේය. උභයාර්ථය හෝ දන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මනුෂ්‍ය ධර්මයෙන් මත්තෙහිවූ ආර්ය භාවයට සුදුසුවූ ඥාන දර්ශන විශෙෂයක් ප්‍රත්‍යක්ෂ කරන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. "මහණෙනි, ඒ භික්ෂුතෙම ඒකාන්තයෙන් කුශල් මග අවිරන්නාවූ සිත මැඩගෙණ හටගන්නාවූ ප්‍රඥාව දුර්වල කරන්නාවූ මේ පඤ්ච නීවරණයන් දුරුකොට බලවත්වූ ප්‍රඥාවෙන් තමාගේ අර්ථය හෝ දන්නේය. අනිකාගේ අර්ථය හෝ දන්නේය. දෙදෙනාගේ අර්ථය හෝ දන්නේය. මනුෂ්‍ය ධර්මයෙන් මත්තෙහිවූ ආර්ය භාවයට සුදුසු ඥාන දර්ශන විශෙෂයක් හෝ ප්‍රත්‍යක්ෂ කරන්නේය යන මේ කාරණය විද්‍යමාන වේ.

14. (මෙහි මේ සූත්‍රයේ 11 ඡේදය යෙදිය යුතුයි.)

15. "ඒ ගංගාවගේ දෙපස පුරුෂයෙක්තෙම ජලමාර්ග දොරටු වසන්නේද, මහණෙනි, මෙසේ වනාහි ගඟ මැද ඒ සැඩ පහර වික්ෂිප්ත නුවූයේ නොවිසුරුනේ විශෙෂයෙන් අල්වා නොගන්නා ලද්දේ දුර ගමන් කරන්නේත් වහා බස්නා දිය පහර ඇත්තේත් ගෙණ යායුත්ත ගෙණ යන්නේත් වන්නේද, මෙපරිද්දෙන්ම ඒ භික්ෂුතෙම ඒකාන්තයෙන් කුශල් මග අවුරන්නාවූ සිත මැඩගෙන හටගන්නාවූ ප්‍රඥාව දුර්වල කරන්නාවූ මේ පඤ්ච නීවරණයන් දුරුකොට බලවත්වූ ප්‍රඥාවෙන් තමාගේ අර්ථය හෝ දන්නේය. අනුන්ගේ අර්ථය හෝ දන්නේය. උභයාර්ථය හෝ දන්නේය. මනුෂ්‍ය ධර්මයෙන් මත්තෙහිවූ ආර්ය භාවය කරන්ට සමර්ථවූ ඥාන දර්ශන විශෙෂයක් හෝ ප්‍රත්‍යක්ෂ කරන්නේය. යන මේ කාරණය විද්‍යමානවේ."

2. **අකුශල රාසි සූත්‍රය**:- 1. "මහණෙනි, අකුශල රාශියයි කියනු ලබන්නේ මේ පඤ්ච නීවරණයන් මනාකොට කියනු ලබන්නෙක් කියන්නේය. මහණෙනි, යම් මේ පඤ්ච නීවරණයෝ වෙද්ද, මෙය සම්පූර්ණම අකුශල රාශිය වේ.

"කවර පසක්දයත්? කාමච්ඡන්ද නීවරණය, ව්‍යාපාද නීවරණය, ථිනමිද්ධ නීවරණය, උද්ධච්චකුක්කුච්ච නීවරණය, විචිකිච්ඡා නීවරණය යන පසයි.

3. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

3. **දුක්ඛවිහාර සූත්‍රය**:- 1. "මහණෙනි, වීර්ය කරණ භික්ෂූහුගේ අංගයෝ මේ පසක් වෙත්.

2. "කවර පසක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙම ශ්‍රද්ධාව ඇත්තේ වේද, (මෙහි පළමු වෙනි පණ්ණාසකයේ 47 සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.) අදහාද, නීරෝග වූයේ නිදුක්වූයේ ඉතා සිහිල් නුවූ ඉතා උණුසුම් නුවූ මධ්‍යමවූ වීර්ය කිරීමට සුදුසුවූ සමව පැසවීම් ඇති ග්‍රහණියෙන් හෙවත් කර්මජ තෙජො ධාතුවෙන් යුක්තවූයේ වේද, ප්‍රයෝග රහිත වූයේ මායා නැත්තේ 'වූ පරිදි' තමා ශාස්තෲන් වහන්සේ කෙරෙහි හෝ නුවණැති සබ්‍රම්සරුන් කෙරෙහි හෝ ප්‍රකාශ කරන්නේ වේද, අකුශල ධර්මයන්ගේ දුරුකිරීම පිණිසද ශක්ති ඇත්තේ දෘඪ වීර්ය ඇත්තේ කුශල ධර්මයන්හි බහා නොතබන ලද බර ඇත්තේ පටන්ගන්නා ලද වීර්ය ඇතිව වාසය කෙරේද, ආර්යවූ කෙළෙසුන් බිඳින්නාවූ මනාකොට දුක් නැති කිරීම පිණිස පවත්නාවූ ඇතිවීම නැතිවීම දැනගන්නා පිණිස පවත්නාවූ නුවණින් යුක්තවූයේ ප්‍රඥාව ඇත්තේ වේද, යන පසයි.

3. (මෙය මේ සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

4. **පමානාසමය සූත්‍රය**:- 1. "මහණෙනි, වීර්ය කිරීමට නුසුදුසු මේ කාල පසක් වෙත්.

2. "කවර පසක්ද යත්, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ජරාවෙන් මඩනා ලද්දේ දිරූයේ වේද, මහණෙනි, වීර්ය කිරීමට මේ පළමුවන නුසුදුසු කාලය වේ. නැවත අනිකක්ද කියමි. මහණෙනි, භික්ෂුතෙම හටගත් ව්‍යාධි ඇත්තේ ව්‍යාධියෙන් පෙළුනේ වේද, මහණෙනි, මේ වීර්ය කිරීමට දෙවෙනි නුසුදුසු කාලය වේ. නැවත අනිකක්ද කියමි. මහණෙනි, දුර්ලභ ශෂ්‍ය ඇති දුර්ලභවූ ආහාර ඇති දුර්භික්ෂයක් වේද, සිඟා හැසිරීමෙන් ලද දෙයින් යැපෙන්ට පහසු නොවේද, මහණෙනි, මේ තුන්වන වීර්ය කිරීමට නුසුදුසු කාලයවේ. නැවත අනිකක්ද කියමි. වනයෙහි කැළඹීම් ඇති භයක් වේද, රථවලට නැංගාවූ දනව් වැස්සෝ ඔබ මොබ යෙද්ද, මහණෙනි, මේ සතරවන වීර්ය

කිරීමට නුසුදුසු කාලය වේ. නැවත අනිකක්ද කියමි. මහණෙනි, සංඝතෙම බිඳුනේ වේද, මහණෙනි, සංඝයා බිඳුනු කල්හි වනාහි ඔවුනොවුන්ට ආක්‍රොෂ කරන්නාහුද වෙත්. ඔවුනොවුන්ට පරිභව කරන්නාහුද වෙත්. ඔවුනොවුන් හාත්පස දුරු කරන්නාහුද වෙත්. ඔවුනොවුන් හැර දමන්නාහුද වෙත්. එහි ප්‍රසන්න නොවූවෝද නොපහදිත්. ප්‍රසන්නවූද සමහරුන්ගේ අන් පරිදිවීම වේ. මහණෙනි, මේ පස්වන වීර්ය කිරීමට නුසුදුසු කාලය වේ.

3. (මෙය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

4. "මහණෙනි, වීර්ය කිරීමට මේ සුදුසු කාල පසක් වෙත්.

5. "කවර පසක්ද යත්! මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම යෞවනවූයේ බාලවූයේ කළු හිස කෙස් ඇත්තේ සොඳුරුවූ යෞවනවූ ප්‍රථම වයසින් යුක්තවූයේ, තරුණ වූයේ වේද, මහණෙනි, මේ පළමුවන වීර්ය කිරීමට සුදුසු කාලයවේ. නැවතද අනිකක් කියමි. මහණෙනි, භික්ෂුතෙම නිදුක්වූයේ ඉතා සිහිල් නොවූ ඉතා උෂ්ණ නොවූ මධ්‍යමවූ වීර්ය කිරීමට සුදුසුවූ සමව පැසවීම ඇත්තාවූ ග්‍රහණියෙන් හෙවත් කර්මජ තෙජො ධාතුවෙන් යුක්තවූයේ නීරෝග වේද, මහණෙනි, මේ දෙවන වීර්ය කිරීමට සුදුසු කාලය වේ. නැවත අනිකක්ද කියමි. මහණෙනි, යහපත් ශෂ්‍ය ඇති සුලභ ආහාර ඇති සිගා හැසිරීමෙන් ලද දෙයින් යැපෙන්ට පහසුවූ සුභික්ෂයක් වේද, මහණෙනි, මේ තුන්වන වීර්ය කිරීමට කිරීම සුදුසු කාලයවේ. නැවත අනිකක්ද කියමි. මහණෙනි, මිනිස්සු සමගිවූවාහු සතුටු වන්නාහු විවාද නොකරන්නාහු කිරි හා දිය මෙන් එක්වූවාහු ඔවුනොවුන් ප්‍රියවූ ඇස් වලින් බලන්නාහු වාසය කෙරෙද්ද, මහණෙනි, මේ සතරවන වීර්ය කිරීමට සුදුසු කාලය වේ. නැවත අනිකක්ද කියමි. මහණෙනි, සංඝතෙම සමගි වූයේ සතුටු වන්නේ විවාද නොකරන්නේ එකට උදෙසීම් ඇත්තේ පහසුවෙන් වාසය කෙරේද, මහණෙනි සංඝයා වනාහි සමගි කල්හි ඔවුනොවුන්ට නොම ආක්‍රොශ කෙරෙත්. ඔවුනොවුන්ට පරිභව නොකෙරෙත්. ඔවුනොවුන් හාත්පසින් දුරු නොකෙරෙත්. ඔවුනොවුන් හැර දමන්නාහු නොවෙත්. එහි ප්‍රසන්න නොවූවාහුද

පහදිත්. ප්‍රසන්න වූවන්ගේද බහුල භාවය වේ. මහණෙනි, මේ පස්වන වීර්ය කිරීමට සුදුසු කාලය වේ.

**5. සාමන්තපාස සූත්‍රයඃ-** 1. (මෙය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

**2.** "එකල්හි වනාහි සැවැත්නුවර මව හා පුත්‍රවූ භික්ෂුවක්ද භික්ෂුණියක්ද යන දෙදෙනෙක් වස්වැසීමට පැමිණියාහුය. ඔව්හු ඔවුනොවුන් නිතර දකිනු කැමතිවූවාහුය. මවද පුත්‍රයා නිතර දකිනු කැමැත්තී විය. පුත්‍රතෙමේද මව නිතර දකිනු කැමැත්තේ විය. ඔවුන්ගේ නිතර දැකීමෙන් සංසර්ගය වූයේය. සංසර්ගය ඇති කල්හි විශ්වාසය වූයේය. විශ්වාසය ඇති කල්හි බැසගැණීම වූයේය. බැසගත් සිත් ඇත්තාවූ ඔව්හු ශික්ෂාව හැර නොදමා දුර්වල බව ප්‍රකාශ නොකොට මෛථුන ධර්ම ප්‍රතිසේවනය කළාහුය.

**3.** "එකල්හි බොහෝවූ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට එළඹියාහුය. එළඹ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව උන්නාහුය. එකත්පස්ව හුන්නාවූම ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළාහුය.

"ස්වාමීනි (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

**4.** "මහණෙනි, කිමෙක්ද? ඒ හිස් පුරුෂතෙම මව පුතු කෙරෙහි නොඇලෙයි. පුතා හෝ මව කෙරෙහි නොඇලේයයි හඟීද?

**5.** "මහණෙනි, යමක් මෙසේ ඇළුම් කරන්නේද, මෙසේ කැමති වන්නේද, මෙසේ මත් කරන්නේද, මෙසේ බැඳ ගන්නේද, මෙසේ මුසපත් කරන්නේද උතුම්වූ නිවණ ලැබීමට මෙසේ අනතුරු කරන්නේද,

**6.** "එබඳුවූ අන් එක රූපයකුදු මම සර්වඥතාඥානයෙන් නොදකිමි. මහණෙනි, එනම් ස්ත්‍රී රූපයයි, මහණෙනි, ස්ත්‍රී රූපයෙහි,

**7.** "සත්වයෝ ඇළුනාහු, ගැටුනාහු, ගිජුවූවාහු, මුසපත් වූවාහු, ඇතුළත් වූවාහු වෙද්ද,

8. "ඔව්හු බොහෝ ස්ත්‍රී රූපයාගේ වසඟයට ගියාහු ශෝක කරත්.

9. "මහණෙනි, මම අන් එක ශබ්දයකුත් සර්වඥතා ඥානයෙන් නොදකිමි. මහණෙනි, එනම් ස්ත්‍රී ශබ්දයයි. මහණෙනි ස්ත්‍රී ශබ්දයෙහි, ඔව්හු බොහෝ ස්ත්‍රී ශබ්දයාගේ වසඟයට ගියාහු ශෝක කරත්.

"එක ගන්ධයකුත් මම සර්වඥතාඥානයෙන් නොදකිමි. මහණෙනි, එනම් ස්ත්‍රී ගන්ධයයි. මහණෙනි, ස්ත්‍රී ගන්ධයෙහි, ඔව්හු බොහෝ ස්ත්‍රී ගන්ධයාගේ වසඟයට ගියාහු ශෝක කරත්.

"එක රසයකුත් මම සර්වඥතාඥානයෙන් නොදකිමි. මහණෙනි, එනම් ස්ත්‍රී රසයයි. මහණෙනි, ස්ත්‍රී රසයෙහි ඔව්හු බොහෝ ස්ත්‍රී රසයාගේ වසඟයට ගියාහු ශෝක කරත්.

"එක ස්පර්ශයකුත් මම සර්වඥතාඥානයෙන් නොදකිමි. මහණෙනි, එනම් ස්ත්‍රී ස්පර්ශයයි, මහණෙනි, ස්ත්‍රී ස්පර්ශයෙහි ඔව්හු බොහෝ ස්ත්‍රී ස්පර්ශයාගේ වසඟයට ගියාහු ශෝක කරත්.

10. (මේ ඡේදය මේ සූත්‍රයේ 5 ඡේදය මෙනි.)

11. "මහණෙනි, එනම් ස්ත්‍රීන් පිළිබඳ ස්පර්ශය මහණෙනි, ස්ත්‍රීන් පිළිබඳ ස්පර්ශ කළ යුත්තෙහි (මෙහි 7 ඡේදය යෙදිය යුතුයි.) ඒ ස්ත්‍රීන්ගේ ස්පර්ශ කළ යුත්තට වසඟ වූවාහු බොහෝ කලක් ශෝක කෙරෙත්.

12. "මහණෙනි, ස්ත්‍රී තොමෝ යන්නීද, පුරුෂයාගේ සිත හාත්පස මැඩගෙණ සිටියි. සිටියාද, හුන්නීද ශයනය කරන්නීද සිනාසෙන්නීද, කථා කරන්නීද, ගායනා කරන්නීද, හඬන්නීද, ඉදිමුණු තැනැත්තීද මළ තැනැත්තීද පුරුෂයාගේ සිත හාත්පස මැඩගෙණ සිටියි. මහණෙනි, මනාකොට කියන්නේ 'මාරයාගේ හාත්පස මළපුඩුවයයි' යමකුත් කියන්නේද, ස්ත්‍රියම මාරයාගේ හාත්පස මළපුඩුවයයි මනාකොට කියන්නෙක් එය කියන්නේයයි" වදාළේය.

1. "කඩුගත් අත් ඇත්තෙකු සමගද කථා කරන්නේය. අමනුෂ්‍යයෙකු සමගද කථාකරන්නේය. යමෙකු විසින් දෂ්ට

කරණ ලද්දේ ජීවත් නොවේද? එබඳු සර්පයෙකුටද ලංවන්නේය.

2. "එකළාවූයේ එකළාවූ මාගමක් (ස්ත්‍රියක්) සමග නොම කථාකරන්නේය. ඔව්හු මුළා සිහි ඇත්තහු බැලීමෙන්ද සිනාවෙන්ද බැඳගනිත්.

3. "තවද නපුරුකොට හැඳීමෙන්ද, මිහිරි කථාවෙන්ද බැඳගණිත්. ඉදිමුනාවූද මළාවූද මේ ජනතෙම ලංවීමට නුසුදුසු වේ.

4. "සිත්කළුවූ රූපය, ශබ්දය, ගන්ධය, රසය, ස්පර්ශය යන මේ පස්කම් ගුණයෝම ස්ත්‍රී රූපයෙහි දක්නා ලැබෙත්.

5. "කාම තෘෂ්ණා නමැති සැඩපහරින් ගසාගෙණ යන්නාවූ කාමයන් පිරිසිඳ නොදන්නාවූ ඔවුන්ගේ කාලය ගතිය සංසාරයෙහි පෙරටුකරණ ලද්දාහු වෙත්.

6. "යම් කෙනෙකුන් කාමයන් පිරිසිඳ දැන කොයිනුත් බියක් නැත්තාහු හැසිරෙද්ද, යම්කෙනෙක් ආශ්‍රවයන් නැසීමට පැමිණියාහුද, ඔව්හු ඒකාන්තයෙන් ලොකයෙහි පරතෙරට ගියාහු හෙවත් නිවණට පැමිණියාහු වෙත්යයි" වදාළේය.

**6. උපජ්ක්ධායුපසංකමන සූත්‍රයඃ-** 1. ඉක්බිති එක්තරා භික්ෂුවක්තෙම ස්වකීය උපාධ්‍යායයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, ස්වකීය උපධ්‍යායයන් වහන්සේට මෙය සැළකෙළේය.

2. "ස්වාමීනි, දැන් මාගේ ශරීරය හටගත් බර බැව් ඇත්තේද, දිශාවන්ද මට නොවැටහෙත්, ධර්මයෝද මට නොවැටහෙත්. ථිනමිද්ධ නීවරණයද මාගේ සිත මැඩගෙණ සිටියි, නො ඇළුනේද, බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙමි. මට ධර්මයන්හි සැකයද ඇත්තේයයි"

3. "එකල්හි ඒ භික්ෂුතෙම ඒ සද්ධිවිහාරික භික්ෂුව කැඳවාගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව

හුන්නේය. එකත්පස්ව හුන්නාවූම ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය.

4. "ස්වාමීනි, මේ භික්ෂුතෙම මෙසේ කීයේය. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

5. "මහණෙනි, මෙසේ වනාහි මෙය වේ. ඉන්ද්‍රියයන්හි නොරක්නාලද දොරටු ඇත්තාවූ, භොජනයෙහි පමණ නොදන්නාවූ නිදිවර්ජිත කිරීමෙහි නොයෙදෙන්නාවූ කුශල ධර්මයන් නොබලන්නාවූ පූර්ව රාත්‍රි අපර රාත්‍රි දෙක්හි සත්තිස් බොධිපාක්ෂික ධර්මයන්ගේ භාවනාවෙහි යෙදීමෙන් යුක්ත නොව වාසය කරන්නහුගේ,

6. "කය හටගත් බරබව ඇත්තේදවේ. දිශාවෝද ඔහුට නොවැටහෙත් ධර්මයෝද ඔහුට නොවැටහෙත් ථීනමිද්ධ නීවරණයද, මොහුගේ සිත මැඩගෙණ සිටියි. නොඇළුනේද, බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙයි. මොහුට ධර්මයන්හි සැකදවේ.

7. "මහණ එහෙයින් මේ ශාසනයෙහි තොප විසින් මෙසේ හික්මිය යුතුයි. ඉන්ද්‍රියයන්හි රක්නාලද දොරටු ඇත්තෙක් වන්නෙමි. භෝජනයෙහි පමණ දන්නෙක්ව නිදිවර්ජිත කිරීමෙහි යෙදුනෙක්ව කුශල ධර්මයන් බලන්නෙක්ව පූර්ව රාත්‍රි, අපර රාත්‍රි දෙක්හි බොධිපාක්ෂික ධර්ම භාවනාවෙහි යෙදීමෙන් යුක්තව වාසය කරන්නෙමියි, මහණ, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයයි" වදාළේය.

8. (මෙහි 26 වර්ගයේ 4 සූත්‍රයේ 7, 8, 9, ඡේද යෙදිය යුතුයි. "මාලුංක්‍ය පුත්‍රතෙම" වෙනුවට "භික්ෂුතෙම" යයි යොදාගත යුතුයි.)

9. "ඉක්බිති ඒ භික්ෂුතෙම රහත්බවට පැමිණියේ ස්වකීය උපාධ්‍යායතෙම යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, ස්වකීය උපාධ්‍යායයන් වහන්සේට මෙය සැළකෙළේය.

10. "ස්වාමීනි, දැන් මාගේ ශරීරය හටගත් බර බැව් ඇත්තේ නොවේමය. දිශාවෝද මට වැටහෙත්, පැමිණ සිටිත්. ධර්මයෝද මට වැටහෙත්. ථීනමිද්ධ නීවරණයද මාගේ සිත මැඩගෙන

නොසිටියි. ඇළුනේද බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙමි. මට ධර්මයන්හි සැකයක්ද නැත්තේයයි,

11. (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

12. "ස්වාමීනි, මේ භික්ෂුතෙම මෙසේ කීය."

13. "මහණ, මෙසේ වනාහි එය වේ. ඉන්ද්‍රියයන්හි රක්නාලද දොරටු ඇති භොජනයෙහි පමණ දන්නාවූ නිදි දුරුකිරීමෙහි යෙදුනාවූ කුශල ධර්මයන් බලන්නාවූ පූර්ව රාත්‍රි අපර රාත්‍රි දෙක්හි බොධිපාක්ෂික ධර්ම භාවනාවෙහි යෙදීමෙන් යුක්තව වාසය කරන්නහුගේ ශරීරයතෙම හටගත් බරබැව් ඇත්තේය. යන යමක් නොවේද දිශාවෝද මොහුට වැටහෙත්. ධර්මයෝද මොහුට වැටහෙත්. ථිනමිද්ධ නීවරණයද මොහුගේ සිත මැඩගෙණ නොසිටියි. ඇළුනේද බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙයි. මොහුට ධර්මයන්හි සැකයක්ද නොවෙයි.

14. (මේ ඡේදය මේ සූත්‍රයේ 7 ඡේදය මෙනි.)

7. **අභිණ්හපච්චවෙක්ඛන සූත්‍රයඃ-** 1. "මහණෙනි, ස්ත්‍රිය විසින් හෝ පුරුෂයා විසින් හෝ ගෘහස්ථයා විසින් හෝ ප්‍රව්‍රජිතයා විසින් හෝ නිතර සිහිකටයුතුවූ මේ කරුණු පසක් වෙත්.

2. "කවර පසක්දයත්, ජරාව ස්වභාවකොට ඇත්තේ වෙමි. ජරාව

3. "නොඉක්මවූයේයයි ස්ත්‍රිය විසින් හෝ පුරුෂයා විසින් හෝ ගෘහස්ථයා විසින් හෝ ප්‍රව්‍රජිතයා විසින් හෝ නිතර සිහිකටයුතුයි.

4. "ව්‍යාධිය ස්වභාවකොට ඇත්තේ වෙමි. ව්‍යාධිය (මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) මරණය ස්වභාවකොට ඇත්තේ වෙමි. මරණය (මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

5. "මාගේ සියලු ප්‍රිය මනාපවූවන් කෙරෙන් නොයෙක් ස්වභාව ඇත්තේ (මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

6. "කර්මය ස්වකීයකොට ඇත්තේවෙමි. කර්මය දායාද කොට ඇත්තේ වෙමියි, කර්මය උත්පත්ති කාරණකොට

ඇත්තේවෙමියි, කර්මය නෑකොට ඇත්තේ වෙමියි, කර්මය පිළිසරණකොට ඇත්තේ වෙමියි, යහපත්වූ හෝ ලාමකවූ හෝ යම් කර්මයක් කරන්නෙම්ද, එයට උරුමක්කාරයෙක් වන්නෙමියි ස්ත්‍රිය විසින් හෝ පුරුෂයා විසින් හෝ ගෘහස්ථයා විසින් හෝ ප්‍රව්‍රජිතයා විසින් හෝ නිතර සිහිකටයුතුයි.

7. "මහණෙනි, කවර කරුණක් නිසා ජරාව ස්වභාව කොට ඇත්තේ වෙමියි, ජරාව නොඉක්මවූයේයයි,

8. "ස්ත්‍රිය විසින් හෝ පුරුෂයා විසින් හෝ ගෘහස්ථයා විසින් හෝ ප්‍රව්‍රජිතයා විසින් හෝ නිතර සිහිකටයුතුද?

9. "මහණෙනි, යම් මදයකින් මත්වූවාහු කයින් දුශ්චරිත කෙරෙද්ද, වචනයෙන් දුශ්චරිත කෙරෙද්ද, සිතින් දුශ්චරිත කෙරෙද්ද, සත්වයන්ගේ යෞවන බැව්හි එබඳු යෞවන මදයෙක් ඇත්තේය.

10. "ඒ කරුණ නිතර සිහිකරන්නාවූ ඔහුගේ යෞවනයෙහි යම් යෞවන මදයක් වේද, එය සියලු ආකාරයෙන් හෝ ප්‍රහීණ වේ. හීන වූවක්හු වේ. මහණෙනි, මේ කරුණ නිසා ජරාව ස්වභාවකොට ඇත්තේ වෙමි. ජරාව නොඉක්ම වූයේයයි,

11. "ස්ත්‍රිය විසින් හෝ පුරුෂයා විසින් හෝ ගෘහස්ථයා විසින් හෝ ප්‍රව්‍රජිතයා විසින් හෝ නිතර සිහිකටයුතුයි.

12. "මහණෙනි, කිනම් කරුණක් නිසා ව්‍යාධිය ස්වභාව කොට ඇත්තේ වෙමියි, ව්‍යාධිය නො ඉක්මවූයේයයි (මෙහි 8 ඡෙදය යෙදිය යුතුයි.)

13. "මහණෙනි, යම්බඳුවූ මදයකින් මත්වූවාහු කයින් දුසිරිත හැසිරෙද්ද, වචනයෙන් දුසිරිත හැසිරෙද්ද, සිතින් දුසිරිත හැසිරෙද්ද, සත්වයන්ගේ නිරෝගභාවයෙහි එබඳුවූ ආරෝග්‍ය මදයෙක් ඇත්තේය. ඒ කරුණ නිතර සිහිකරන්නාවූ ඔහුගේ නිරෝග භාවයෙහි යම් ආරෝග්‍ය මදයක් වේද, හෙතෙම සියලු ආකාරයෙන් ප්‍රහීණ හෝ වේ, තුනී වූවක් හෝ වේ. "මහණෙනි, මේ ප්‍රයෝජනය සළකා ව්‍යාධිය ස්වභාවකොට ඇත්තේ වෙමි. ව්‍යාධිය නොඉක්මවූයේයයි (මෙහි මේ සූත්‍රයේ 10 ඡෙදය යෙදිය යුතුයි.)

12. "මහණෙනි, කිනම් කරුණක් සඳහා මරණය ස්වභාවකොට ඇත්තේ වෙමියි, මරණය නො ඉක්මවූයේයයි

(මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

13. "මහණෙනි, යම් මත්වීමකින් මත්වූවාහු, කයින් දුසිරිත හැසිරෙද්ද, සිතින් දුසිරිත හැසිරෙද්ද, වචනයෙන් දුසිරිත හැසිරෙද්ද, සත්වයන්ගේ ජීවත්වීමෙහි එබඳු ජීවිත මදයෙක් ඇත්තේය. ඒ කරුණ නිතර සිහිකරන්නාවූ ඔහුගේ ජීවිතයෙහි යම් ජීවිත මදයක් වේද, හෙතෙම සියලු ආකාරයෙන් හෝ ප්‍රහීණ වේ. තුනීවූවක් හෝ වේ. මහණෙනි, මේ කරුණ නිසා මරණය ස්වභාවකොට ඇත්තේ වෙමි. මරණය නොඉක්මවූයේයයි (මෙහි මේ සූත්‍රයේ 10 ඡේදය යෙදිය යුතුයි.)

14. "මහණෙනි, කිනම් කරුණක් නිසා මාගේ සියලු ප්‍රිය මනාපයන් කෙරෙන් නොයෙක් ස්වභාව ඇත්තේ වෙන්වීම වේයයි (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.)

"මහණෙනි, යම්බඳු ඇල්මකින් ඇළුනාහු කයින් දුසිරිත හැසිරෙද්ද, වචනයෙන් දුසිරිත හැසිරෙද්ද, සිතින් දුසිරිත හැසිරෙද්ද, සත්වයන්ගේ ප්‍රිය වූවන් කෙරෙහි කාමාශාවෙන් ඇල්මක් ඇත්තේය. ඒ කාරණය නිතර සිහි කරන්නාවූ ඔහුගේ ප්‍රිය වූවන් කෙරෙහි යම් ඡන්දයෙන් ඇල්මක් වේද, හෙතෙම සියලු ආකාරයෙන් හෝ ප්‍රහීණ වේ. තුනීවූවක් හෝ වේ. මහණෙනි, මේ කරුණ නිසා මාගේ සියලු ප්‍රිය මනාපයන් කෙරෙන් නොයෙක් ස්වභාව ඇත්තේ වෙන්වීම වේයයි (මෙහි මේ සූත්‍රයේ 10 ඡේදය යොදාගත යුතුයි.)

15. "මහණෙනි, කිනම් කරුණක් නිසා කර්මය ස්වකීය කොට ඇත්තේ වෙමියි, කර්මය දායාදකොට ඇත්තේ වෙමියි, කර්මය උත්පත්ති කාරණකොට ඇත්තේ වෙමියි, කර්මය නෑකොට ඇත්තේ වෙමියි, කර්මය පිළිසරණකොට ඇත්තේ වෙමියි, යහපත් වූ හෝ ලාමක වූ හෝ යම් කර්මයක් කරන්නෙම්ද, එයට උරුම ඇත්තෙක් වන්නෙමියි, (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.)

"මහණෙනි, සත්වයන්ගේ කාය දුශ්චරිතයද, වාක් දුශ්චරිතයද, මනො දුශ්චරිතයද ඇත්තේය. ඒ කරුණ නිතර සිහි කරන්නාවූ ඔහුගේ සියලු ආකාරයෙන් හෝ එය ප්‍රහීණ වේ. තුනීවීම හෝ වේ. මහණෙනි, මේ කරුණ නිසා කර්මය ස්වකීයකොට ඇත්තේ කර්මය දායාදකොට ඇත්තේ, කර්මය උත්පත්ති කාරණාකොට ඇත්තේ කර්මය නෑයන්කොට ඇත්තේ, කර්මය පිළිසරණකොට ඇත්තේ වෙමි. යහපත්වූ හෝ ලාමකවූ හෝ යම් කර්මයක් කරන්නෙම්ද, එයට උරුම ඇත්තෙක් වන්නෙමියි, (මෙහි මේ සූත්‍රයේ 10 ඡෙදය යෙදිය යුතුයි.)

"මහණෙනි, ඒ මේ ආර්යශ්‍රාවකතෙමේ වනාහි මෙසේ සළකයි.

"එකළාවූ මම ම ජරාව ස්වභාවකොට ඇත්තේ ජරාව ආගමනය නොඉක්මවූයේ නොවෙමි. වැලිදු යම්තාක් සත්වයන්ගේ ගමනය, චුතිය, උත්පත්තිය වේද, ඒතාක් සියලු සත්වයෝ ජරාව ස්වභාවකොට ඇත්තාහු ජරාව නොඉක්ම වූවාහුයයි,

**16.** "ඒ කරුණ නිතර සිහි කරන්නාවූ, ඔහුට ලෝකොත්තර මාර්ගය හටගනියි. හෙතෙම ඒ මාර්ගය සෙවනය කරයි, භාවනා කරයි, බහුල වශයෙන් කරයි. ඒ මාර්ගය සේවනය කරන්නාවූ, වඩන්නාවූ, බහුල කරන්නාවූ ඔහුගේ සංයෝජනයෝ ප්‍රහීනවෙත්. සප්තවිධ අනුශය ධර්මයෝ කෙළවර වූවාහු වෙත්.

**17.** "එකළාවූ මම ම ව්‍යාධිය ස්වභාවකොට ඇත්තේ ව්‍යාධිය නොඉක්මවූයේ නොවෙමි. වැළිදු යම්තාක් සත්වයන්ගේ ආගමනය, ගමනය, චුතවීම, ඉපදීමවේද, ඒතාක් සියලු සත්වයෝ ව්‍යාධිය ස්වභාවකොට ඇත්තාහු ව්‍යාධිය නොඉක්ම වූවාහුයයි,

**18.** (මේ ඡෙදය මේ සූත්‍රයේ 16 ඡෙදය මෙනි.)

**19.** "එකලාවූ මම ම මරණය ස්වභාවකොට ඇත්තේ මරණය නොඉක්මවූයේ නොවෙමි, වැළිදු යම්තාක් සත්වයන්ගේ ආගමනය, ගමනය, චුතිය උත්පත්තිය වේද, ඒතාක් සියලු සත්වයෝ මරණය ස්වභාවකොට ඇත්තාහු, මරණය නොඉක්මවූවාහු යයි,

20. (මේ ඡේදය මේ සූත්‍රයේ 16 ඡේදය මෙනි.)

21. "එකළාවූ මාගේම සියලුම ප්‍රියවූ මනාප වූවන්ගෙන් නොයෙක් ස්වභාව ඇත්තේ වෙන්වීම නොවේ. වැළිදු යම්තාක් සත්වයන්ගේ ආගමනය, ගමනය, චුතිය, උත්පත්තිය වේද, ඒතාක් සියලු සත්වයෝ ප්‍රියවූ මනාප වූවන්ගෙන් වෙනස් ස්වභාව ඇත්තෝ වෙන්වීම ඇත්තාහුයයි

22. (මේ ඡේදය මේ සූත්‍රයේ 16 ඡේදය මෙනි.)

23. "එකළාවූ මම ම කර්මය ස්වකීයකොට ඇත්තේ කර්මය දායාදකොට ඇත්තේ, කර්මය යෝනිකොට ඇත්තේ කර්මය බන්ධුකොට ඇත්තේ, කර්මය පිළිසරණකොට ඇත්තේ නොවෙමියි, යහපත්වූ හෝ ලාමකවූ හෝ කර්මයක් කරන්නෙම්ද, එයට උරුම ඇත්තෙක් නොවන්නෙමි. වැළිදු යම්තාක් සත්වයන්ගේ ආගමනය, ගමනය, චුතිය, උත්පත්තියවේද, ඒතාක් සියලු සත්වයෝ කර්මය ස්වකීයකොට ඇත්තාහු, කර්මය උරුමකොට ඇත්තාහු, කර්මය උත්පත්ති කාරණකොට ඇත්තාහු කර්මය නෑයන්කොට ඇත්තාහු, කර්මය පිළිසරණකොට ඇත්තාහු වෙත්. යහපත්වූ හෝ ලාමකවූ හෝ යම් කර්මයක් කරන්නාහුද, එයට උරුම ඇත්තෝ වන්නාහුයයි,

24. (මේ ඡේදය මේ සූත්‍රයේ 16 ඡේදය මෙනි.)

25. (1) "ව්‍යාධිවූ ස්වභාවකොට ඇත්තාවූ, ජරාව ස්වභාවකොට ඇත්තාවූ තවද මරණය ස්වභාවකොට ඇත්තාවූ පෘථග්ජනයෝ ධර්මයෝ යම්සේ වූවාහුද, එසේ ඇත්තාහුම පිළිකුල් කෙරෙත්.

(2) "මෙබඳු ස්වභාව ඇත්තාවූ සත්වයන් කෙරෙහි මමද මෙය පිළිකුල් කරන්නෙම් නම් මෙසේ වාසය කරන්නාවූ මට මෙය සුදුසු නොවන්නේය.

(3) "ඒ මම මෙසේ වාසය කරන්නෙමි. ක්ලේශ රහිතවූ ධර්මය දැන නිරෝග භාවයෙහිද, යෞවනභාවයෙහිද, ජීවත් වීමෙහිද යම් මද කෙනෙක් වෙද්ද,

(4) "ප්‍රව්‍රජ්‍යාව නිර්භය වශයෙන් දැක ඒ සියලු මදයන් මැඩපවත්වමි. නිවණ දක්නාවූ ඒමට උත්සාහයෙක් වූයේය.

(5) "මේ කාලයෙහි කාමයන් සේවනය කරන්ට මම සුදුස්සෙක් නොවෙමි. මාර්ග බ්‍රහ්මචර්යාව පිහිටකොට ඇත්තේ ප්‍රව්‍රජ්‍යාවෙන් නොනවතින්නෙක් වන්නෙමියි" වදාළේය.

8. **ලිච්ඡවිකුමාර සූත්‍රය**:- 1. "එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසල් නුවර මහවනයෙහි වූ කූටාගාර ශාලාවෙහි වැඩවසනසේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු වෙලෙහි හැඳ පෙරවා පා සිවුරු ගෙන විසල් නුවරට පිඬු පිණිස පිවිසිසේක. විසල් නුවර පිඬු පිණිස හැසිර පසුබත් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුණේ මහ වනයට ඇතුල්ව,

2. "එක්තරා රුක් මුලෙක්හි දිවා විහරණයෙන් වැඩහුන්සේක. එකල්හි වනාහි බොහෝවූ ලිච්ඡවි කුමාරයෝ ඊයෙන් සාදනලද දුනු ගෙණ සුනඛ සමූහයා විසින් පිරිවරණ ලද්දාහු මහ වනයෙහි ඔබ මොබ සක්මන් කරන්නාහු, ඔබමොබ හැසිරෙන්නාහු, එක්තරා රුක් මුලෙක්හි දිවාවිහරණයෙන් වැඩ හුන්නාහු භාග්‍යවතුන් වහන්සේ දුටුවාහුය. දැක ඊ වලින් සරසන ලද දුනු බහා තබා සුනඛ සමූහයා එක් පැත්තකට යවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ නිශ්ශබ්ද වූවාහු, නිශ්ශබ්ද වූහ. (ඇඳිලි බැන්දාහු භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කරත්.)

3. "එකල්හි වනාහි මහානාම නම් ලිච්ඡවිතෙම මහ වනයෙහි පා ගමනින් ඔබමොබ සක්මන් කරන්නේ ඔබමොබ හැසිරෙන්නේ නිශ්ශබ්දවූ, ඇඳිලි බැන්දාවූ භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කරන්නාවූ, ඒ ලිච්ඡවි කුමාරයන් දුටුවේය. දැක භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පස්ව උන්නාවූම මහානාම නම් ලිච්ඡවි තෙම ප්‍රීති වාක්‍ය පැවැත්වූයේය. "වජ්ජීහු වැඩෙන්නාහුය, වජ්ජීහු වැඩෙන්නාහු ය"යි.

**4.** "මහානාමය, කුමකට වනාහි නුඹ 'වජ්ජීහු වැඩෙන්නාහුය, වජ්ජීහු වැඩෙන්නාහුය'යි මෙසේ කියන්නෙහිද?"

"ස්වාමීනි, මේ ලිච්ඡවි කුමරුවෝ චණ්ඩයෝය, ඵරුෂයෝය. උඩගු වූවෝය. යම් ඒ කුලයන්හි යැපිය යුතු වූවන් යවනු ලබත්ද, උක්ය කියා හෝ ඩෙබරය කියා හෝ කැවුම්ය කියා හෝ අග්ගලාය කියා හෝ සක්ඛලිකාය කියා හෝ ඒවා උදුරාගෙණ කත්. කුල ස්ත්‍රීන්ගේද, කුල කුමරියන්ගේද පස්සෙන් ගොස් පයින් ගසත්. දැන් ඒ මොව්හු නිශ්ශබ්ද වූහ. නිශ්ශබ්ද වූවාහු, ඇඳිලි බැන්දාහු, භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කරත්."

**5.** "මහානාමය, යම්කිසි කුල පුත්‍රයෙකුගේ ධර්ම පසක් විද්‍යමාන වේද්ද, ඉදින් මස්තකයෙහි අභිෂෙක කරණලද ක්ෂත්‍රියවූ රජෙකුගේ හෝ, ඉදින් පියා විසින් දෙනලද රට අනුභව කරන්නෙකුගේ හෝ ඉදින් සේනාවට අධිපතිවූ සෙනෙවියෙකුගේ හෝ ඉදින් ගමට අධිපති ගම් දෙටුවෙකුගේ හෝ ඉදින් සමූහයාට අධිපති ගම් ප්‍රධානියෙකුගේ හෝ යි. යම් කෙනෙක් හෝ කුලයන්හි වෙන් වෙන්ව අධිපති බව කරවද්ද, වැඩීමට කැමතිවිය යුත්තීය. පිරිහීම නොකැමැති විය යුතුයි. කවර පසක්ද යත්?

**6.** "මහානාමය, මේ ලෝකයෙහි කුලපුත්‍රතෙමේ බාහු බලයෙන් රැස් කරණලද ඩහදිය වැගිරීම් ඇති ධාර්මිකවූ දැහැමින් ලබන ලද්දාවූ නැගී සිට උත්සාහයෙන් ලබනලද සම්පත් වලින්,

**7.** "මව්පියන්ට, සත්කාර කෙරේද,

**8.** ගරු කෙරේද, බුහුමන් කෙරේද, පුදාද, සත්කාර කරණ ලද ගරු කරණ ලද බුහුමන් කරණලද පුදනලද,

**9.** "මව්පියෝ, ඔහුට යහපත් සිතින් 'බොහෝ කල් ජීවත් වෙව, දීර්ඝායුෂයක් රක්ෂා කරවයිද අනුග්‍රහ කෙරෙත්. මහානාමය, මව්පියන්ගේ අනුග්‍රහය ඇත්තාවූ කුලපුත්‍රයාගේ වැඩීමම කැමැති වියයුතුයි, පිරිහීම නොකැමැති වියයුතුයි.

**10.** "නැවත අනිකක්ද කියමි (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) අඹුදරුවන් හා දැසිදස් කම්කරු පුරුෂයන්ට සත්කාර කෙරේද, (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.)

අඹුදරු දැසි දස් කම්කරු පුරුෂයෝ, ඔහුට යහපත්වූ සිතින් "බොහෝ කලක් ජීවත් වෙව, දීර්ඝායුෂයක් පාලනය කරවයි,' අනුග්‍රහ කරත්, මහානාමය, අඹුදරු දැසිදස් කම්කරු පුරුෂයන් විසින් අනුකම්පා කරණලද කුලපුත්‍රයාගේ වැඩීමට කැමති වියයුතුයි. පිරිහීම නොකැමැති විය යුතුයි.

11. (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) තමන්ගේ කුඹුරු කර්මාන්ත වලට අනතුරු ඉඩම් හිමියන්ට සත්කාර කෙරේද (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.) තමන්ගේ කුඹුරු කර්මාන්තයට සමීප ඉඩම් මනින විකුණන හිමියෝ ඔහුට යහපත් සිතින් 'බොහෝ කලක් ජීවත් වෙව, දීර්ඝායුෂය පාලනය කරවයි, අනුග්‍රහ කරවත්. මහානාමය, තමන්ගේ කුඹුරු කර්මාන්තයන්ට සමීප ඉඩම් මනින විකුණන්නවුන් විසින් අනුකම්පා කරණලද කුලපුත්‍රයාගේ වැඩීමම කැමතිවිය යුතුයි. පිරිහීම නොකැමැති වියයුතුයි.

12. "නැවතද අනිකක් කියමි. (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) යම් ඒ පූජා පිළිගන්නාවූ දෙවි කෙනෙක් වෙද්ද, ඔවුන්ට සත්කාර කෙරේද (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි) පූජා පිළිගන්නාවූ දෙවියෝ යහපත් සිතින් "බොහෝ කලක් ජීවත් වෙව, දීර්ඝායුෂය පාලනය කරවයි" ඔහුට අනුග්‍රහ කෙරෙත්. මහානාමය, දෙවතාවන් විසින් අනුග්‍රහ කරණලද කුලපුත්‍රයාගේ වැඩීමම කැමති විය යුතුයි. පිරිහීම නොකැමැති වියයුතුයි.

13. "නැවත අනිකක්ද කියමි. (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට සත්කාර කෙරේද, (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.) පුදන ලද ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඔහුට යහපත් සිතින් 'බොහෝ කලක් ජීවත් වෙව, දීර්ඝායුෂය පාලනය කරවයි,' අනුග්‍රහ කෙරෙත් මහනාමය, ශ්‍රමණ බ්‍රාහ්මණයන් විසින් අනුකම්පා කරණ ලද්දාවූ කුලපුත්‍රයාගේ වැඩීමම කැමතිවිය යුතුයි. පිරිහීම නොකැමති වියයුතුයයි.

14. (මේ ඡේදය මේ සූත්‍රයේ 5 ඡේදය මෙනි.)

**15.** (1) "හැම කල්හි මව්පියන්ගේ කටයුතු කරන්නාවූ අඹුදරුවන්ට හිතවූ කුලපුත්‍රතෙම ඇතුළත ජනයාටද මොහුට අනුව ජීවත් වන්නාවූ යම් කෙනෙක් වෙත් නම් ඔවුන්ටද වැඩ පිණිස පිළිපදියි.

(2) "වචන දන්නාවූ සිල්වත්වූ හෙතෙම පෙර පරලොව ගියාවූ නෑයන්ටද මෙලොව ජීවත් වන්නවුන්ටද යන දෙගොල්ලන්ටම වැඩ පිණිස පිළිපන්නේ වෙයි.

(3) "දැහැමින් ගිහිගෙයි වාසයකරන්නාවූ පණ්ඩිත තෙම ශ්‍රමණ බ්‍රාහ්මණයන්ටද දෙවතාවන්ටද සතුට උපදවන්නේ වෙයි.

(4) "හෙතෙම යහපත කොට පිදිය යුත්තෙක් පැසසිය යුත්තෙක් වේ. මෙලොවදීම ඔහුට ප්‍රශංසා කරත්. පරලොව ස්වර්ගයෙහිද සතුටු වේයයි" වදාළේය.

**9. බුඩ්ඪ පබ්බජිත සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ මහලුව පැවිදිවූ තැනැත්තේ දුර්ලභවේ. කවර පසකින්ද යත්.

**2.** "මහණෙනි, සියුම් කාරණා දන්නාවූ වෘද්ධ ප්‍රව්‍රජිත තෙම දුර්ලභවේ. ශ්‍රමණ කල්පයෙන් යුක්තවූයේ දුර්ලභවේ. බොහෝ ඇසූවිරූ තැන් ඇත්තේ දුර්ලභවේ. ධර්මකථික වූයේ දුර්ලභවේ. විනයධර වූයේ දුර්ලභවේ.

**3.** (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි)

**10. දුතිය බුඩ්ඪ පබ්බජිත සූත්‍රය:-** 1, 3. (මේ සූත්‍රයේ 1, 3 ඡේද මේ වර්ගයේ 9 සූත්‍රයේ 1 ඡේදය මෙන් වෙත්.)

**2.** "මහණෙනි, කීකරුවූ මහලුව පැවිදිවූ තැනැත්තේ දුර්ලභ වේ. මනාකොට ගන්නාලද ගැණීම් ඇත්තේ දුර්ලභ වේ. පැදකුණු කිරීමෙන් අවවාද ගන්නේ දුර්ලභ වේ. ධර්මකථික වූයේ දුර්ලභවේ. විනයධර වූයේ දුර්ලභ වේ.

**(6. නීවරණ වර්ගය නිමි.)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# 7. සඤ්ඤා වර්ගය.

11. **පඤ්ච සඤ්ඤා සූත්‍රයː-** 1. "මහණෙනි, වඩනාලද බහුල වශයෙන් කරණ ලද මේ සංඥා පස මහත් ඵල ඇත්තාහු මහත් අනුසස් ඇත්තාහු නිවණට ප්‍රතිෂ්ඨා වූවාහු නිවන් කෙළවර කොට ඇත්තාහු වෙත්.

2. "කවර පසක්ද යත්, අශුභ සංඥාවය, මරණ සංඥාවය, ආදීනව සංඥාවය, ආහාරයෙහි ප්‍රතිකූල සංඥාවය, සියලු ලෝකයෙහි අනභිරත සංඥාවය යන පසයි.

3. (මේ ඡෙදය මේ සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

12. **දුතිය පඤ්ච සඤ්ඤා සූත්‍රයː-** 1-3 (මේ ඡෙද මේ වර්ගයේ 1 සූත්‍රයේ 1, 3, ඡෙද මෙන් වෙත්) කවර පසක්ද යත්, අනිත්‍ය සංඥාය, අනාත්ම සංඥාය, මරණ සංඥාය, ආහාරයෙහි පිළිකුල් සංඥාය, සියලු ලෝකයෙහි නොඇලීම් සංඥාය යන පසයි."

13. **අරියවුද්ධි සූත්‍රයː-** 1. "මහණෙනි, වැඩීම් පසකින් වැඩෙන්නාවූ ආර්ය ශ්‍රාවකතෙම ආර්යවූ වැඩීමෙන් වැඩෙයි. කය පිළිබඳ සාරය ගන්නේද උතුම් දෙය ගන්නේද වේ.

2. "කවර පසකින්ද යත්, ශ්‍රද්ධාවෙන් වැඩේද, ශීලයෙන් වැඩේද, ශ්‍රැතයෙන් වැඩේද, ත්‍යාගයෙන් වැඩේද, ප්‍රඥාවෙන් වැඩේද යන පසිනි.

3. (මේ ඡෙදය මේ සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

4. "මේ ලෝකයෙහි යම් ආර්ය ශ්‍රාවකයෙක් ශ්‍රද්ධාවෙන් හා ශීලයෙන්ද, ප්‍රඥාවෙන් හා ත්‍යාගය ශ්‍රැතය යන මෙයින් වැඩේද, එබඳුවූ විචක්ෂණවූ ඒ සත්පුරුෂ තෙම මෙලොවම ආත්මයාගේ උභය සාරය ගණියි" වදාළේය.

14. **දුතිය අරියවුද්ධි සූත්‍රයː-** 1. "මහණෙනි, වැඩීම් පසකින් වැඩෙන්නාවූ ආර්ය ශ්‍රාවිකාතොමෝ ආර්යවූ කය පිළිබඳ සාරය ගන්නීද උතුම් ප්‍රයෝජනය ගන්නීද වේ.

2. කවර පසකින්ද යත්, ශ්‍රද්ධාවෙන් වැඩේද, ශීලයෙන් වැඩේද, ශ්‍රැතයෙන් වැඩේද, ත්‍යාගයෙන් වැඩේද, ප්‍රඥාවෙන් වැඩේද, (මේ ඡෙදය මේ වර්ගයේ 13 සූත්‍රයේ 2 ඡෙදය මෙනි.)

3. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

4. "මේ ලෝකයෙහි යම් ආර්ය ශ්‍රාවිකාවක් ශ්‍රද්ධාවෙන් හා ශීලයෙන්ද ප්‍රඥාවෙන් හා ත්‍යාගයෙන්ද ශ්‍රැතයෙන්ද වැඩේද, ඒ එබඳු සිල්වත් උපාසිකාතොමෝ මෙලොවම ආත්මයාගේ උභය සාරය ගනීයයි" වදාළේය.

15. "**අලංසාකච්ඡා සූත්‍රය**:- 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම බ්‍රහ්මචාරීන්ගේ සාකච්ඡාවට සුදුසු වෙයි.

2. "කවර පසකින්ද යත්. මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම තෙමේත් සීලයෙන් යුක්තවූයේ වේද, ශීලසම්පත්තිය පිළිබඳ කථාවෙන් ආවාවූ ප්‍රශ්නය විසඳන්නේත් වේද, තෙමේත් සමාධියෙන් යුක්තවූයේ වේද, සමාධි සම්පත්තිය පිළිබඳ කථාවෙන් ආවාවූ ප්‍රශ්නය විසඳන්නේත් වේද, තෙමේත් ප්‍රඥාවෙන් යුක්තවූයේ වේද ප්‍රඥා සම්පත්තිය පිළිබඳ කථාවෙන් ආවාවූ ප්‍රශ්නය විසඳන්නේත් වේද, තෙමේත් විමුක්තියෙන් යුක්තවූයේත් වේද, විමුක්ති සම්පත්තිය පිළිබඳ කථාවෙන් ආවාවූ ප්‍රශ්නය විසඳන්නේත් වේද, තෙමේත් විමුක්ති ඥාන දර්ශනයෙන් යුක්තවූයේ වේද, විමුක්ති ඥාන දර්ශනය පිළිබඳ කථාවෙන් ආවාවූ ප්‍රශ්නය විසඳන්නේත් වේද, යන පසිනි.

3. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි)

16. **අලංසාජීව සූත්‍රය**:- 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම බ්‍රහ්මචාරීන්ගේ සමාන දිවිපැවැත්මට සුදුසු වූයේ වෙයි.

2. (මේ ඡේදය මේ පණ්ණාසකයේ 15 සූත්‍රයේ 2 ඡේදය මෙනි)

3. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

17. **උස්සොළ්හි පඤ්චම සූත්‍රය**:- 1. "මහණෙනි, යම්කිසි භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ පඤ්ච ධර්මයන් වඩාද, පඤ්ච ධර්මයන් බහුල කෙරේද, ඔහුට ඵල දෙක අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුයි. මේ ආත්මයෙහි රහත්වීම හෝ උපාදිශෙෂය ඇතිකල්හි අනාගාමි වීම හෝ වේ.

2. "කවර පසක්ද යත්. මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ඡන්දය හේතුකොට ඇති සමාධියෙන් හා ප්‍රධාන සංස්කාරයෙන් යුක්තවූ ඍද්ධිපාදය වඩාද, වීර්ය හෙතුකොට ඇති සමාධිය හා ප්‍රධාන සංස්කාරයෙන් යුක්තවූ ඍද්ධිපාද වඩාද, චිත්තය හේතුකොට ඇති සමාධිය හා ප්‍රධාන සංස්කාරයෙන් යුක්තවූ ඍද්ධි පාදය වඩාද, විමංසාව හෙතුකොට ඇති සමාධිය ප්‍රධාන සංස්කාරය යන මෙයින් යුක්තවූ ඍද්ධිපාදය වඩාද, අධික මාත්‍ර වීර්යයම පස්වෙනිකොට ඇත්තේ වේද, යන පසයි.

3. (මේ ඡෙදය මේ සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

18. **දුතිය උස්සොළ්හි පඤ්චම සූත්‍රයː-** 1. "මහණෙනි, මම සම්බොධියෙන් පූර්වයෙහිම බුදුබවට නොපැමිණියේ බොධිසත්ව වූයේම පඤ්ච ධර්මයක් වැඩුයෙමි. පඤ්ච ධර්මයක් බහුල වශයෙන් කෙළෙමි. කවර පඤ්ච ධර්මයක්ද යත්?

2. "ඡන්දය හෙතුකොට ඇති සමාධිය ප්‍රධාන සංස්කාරය යන මෙයින් යුක්තව ඍද්ධිපාදය වැඩුයෙමි.

3. "වීර්ය (මෙහි 2 ඡෙදය යෙදිය යුතුයි) චිත්තය හෙතුකොට ඇති සමාධිය (මෙහි 2 ඡෙදය යෙදිය යුතුයි.) විමංසාව අධික මාත්‍ර උත්සාහය පස්වෙනිකොට ඇත්තේ වීමි.

4. "මහණෙනි, ඒ මම වනාහි මේ අධික මාත්‍ර උත්සාහය පස්වෙනි කොට ඇති ධර්මයන් වැඩූ බැවින් බහුල වශයෙන් කළ බැවින් යම් විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කටයුතු ධර්මයක්හුගේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස සිත නැමුයෙම්ද ඒ ඒ කාරණය ඇති කල්හි ඒ ඒ ධර්මයෙහිම ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණියෙමි. අනෙක ප්‍රකාරවූ ඉර්ධි විධිය අනුභව කරන්නෙමියි (මෙහි අංගුත්තර නිකායේ තික නිපාතයේ දුතිය පණ්ණාසකයේ 10 සූත්‍රයේ 12 ඡෙදය යෙදිය යුතුයි.) ඒ ඒ කරුණ ඇති කල්හි ඒ ඒ ධර්මයෙහිම ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණියෙමි. ඉදින් ඒ මම ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධියට හා අර්හත්ඵල ප්‍රඥාවට මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන

ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරන්නෙමියි කැමතිවීම්ද, ඒ ඒ කරුණ ඇති කල්හි ඒ ඒ ධර්මයෙහිම ප්‍රත්‍යක්ෂයෙන් සුදුසු බවට පැමිණියෙමියි වදාළේය.”

**19. එකන්තනිබ්බිදා සූත්‍රයඃ-** 1. “මහණෙනි, මේ ධර්ම පසක් වඩන ලද්දාහු බහුල වශයෙන් කරණ ලද්දාහු ඒකාන්තයෙන් කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරුද්ධවීම පිණිස සංසිඳීම පිණිස විශිෂ්ට ඥානය පිණිස සම්බොධිය පිණිස නිර්වාණය පිණිස පවතිත්.

2. “කවර පසක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම කයෙහි අශුභය අනුව බලමින් වාසය කෙරේද, ආහාරයෙහි පිළිකුල් සංඥා ඇත්තේ සියලු ලෝකයෙහි නොඇලීම් සංඥා ඇත්තේ, සියලු සංස්කාරයන්හි අනිත්‍යය අනුව බලමින් වාසය කෙරේද, මොහුගේ මරණ සංඥාව වනාහි තමන් කෙරෙහි මනාව එළඹ සිටියාවේද යන පසයි.

3. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

**20. ආසවක්ඛය සංවත්තන සූත්‍රයඃ-** 1. “මහණෙනි, මේ ධර්ම පසක් වඩනා ලද්දාහු බහුල වශයෙන් කරණ ලද්දාහු ආශ්‍රවයන් නැසීම පිණිස පවතිත්.

2. (මේ ඡේදය මේ පණ්ණාසකයේ 19 සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

3. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

---

## 8. යොධාජීව වර්ගය.

**21. පඨම චෙතො විමුක්ති ඵල සූත්‍රයඃ-** 1. “මහණෙනි, මේ ධර්ම පසක් වඩනා ලද්දාහු බහුල වශයෙන් කරණ ලද්දාහු අර්හත්ඵල සමාධිය විපාකකොට ඇත්තාහුද අර්හත්ඵල සමාධිය අනුසස් කොට ඇත්තාහුද අර්හත්ඵල ප්‍රඥාව විපාක කොට ඇත්තාහුද අර්හත්ඵල ප්‍රඥාව අනුසස් කොට ඇත්තා හුද වෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**2.** (මේ ඡේදය මේ පණ්ණාසකයේ 19 සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

**3.** "මහණෙනි, මේ ධර්ම පස වනාහි වඩන ලද්දාහු බහුල වශයෙන් කරණ ලද්දාහු චිත්ත විමුක්තිය ඵලය කොට ඇත්තාහුද චිත්ත විමුක්ති ඵලය අනුසස් කොට ඇත්තාහුද වෙත්. ප්‍රඥා විමුක්තිය ඵල කොට ඇත්තාහුද ප්‍රඥා විමුක්ති ඵලය අනුසස් කොට ඇත්තාහුද වෙත්.

**4.** "මහණෙනි, යම් කලෙක වනාහි භික්ෂුතෙම චිත්ත විමුක්ත වූයේත් ප්‍රඥා විමුක්ත වූයේත් වේද, මහණෙනි, මේ භික්ෂුතෙම හරින ලද අවිද්‍යා නමැති අගුළු ඇත්තේයයිද, නසන ලද සංසාර නමැති දිය අගල ඇත්තේයයිද, සිඳිනා ලද තෘෂ්ණා නමැති ඉන්ද්‍රඛීල ඇත්තේයයිද, නීවරණ නමැති අගුළු හරින ලද්දේයයිද ආර්යවූ ජනිතවූ මාන ධජ ඇත්තේ බහාතබන ලද ස්කන්ධාදී බර ඇත්තේ සංසාරයෙන් වෙන් වූයේයයි ද කියනු ලැබේ.

**5.** "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම ඔසවන ලද අගුල ඇත්තේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුහුගේ අවිද්‍යා තොමෝ ප්‍රහීණවූවා,

**6.** "සිඳින ලද මුල් ඇත්තී අග සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දී නැවත අභාවය කරණ ලද්දී මත්තෙහි නූපදිනා ස්වභාව ඇත්තීවේද,

**7.** "මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම එසවන ලද අගුල ඇත්තේ වෙයි.

**8.** "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම නසන ලද දිය අගල ඇත්තේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂූහුගේ නැවත භවය ඇතිකරන්නාවූ ජාති සංසාරය ප්‍රහීණ වේද, (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම නසන ලද දිය අගල ඇත්තේ වෙයි.

**9.** "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම ඇද දමන ලද ඉන්ද්‍රඛීල ඇත්තේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂූහුගේ

තෘෂ්ණාව ප්‍රහීණ වූවා (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම ඇද දමන ලද ඉන්ද්‍රඛීල ඇත්තේ වේ.

10. "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම අගුළු රහිත වේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂූහුගේ ඕරම්භාගීය සංයෝජන පස ප්‍රහීණ වූවාහු (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම අගුළු රහිතවූයේ වේද,

11. "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම හෙලන ලද ධජ ඇත්තාවූ බහා තබන ලද බර ඇත්තාවූ සසරින් වෙන්වූ ආර්යයෙක් වේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂූහුගේ වෙමි යන මානය ප්‍රහීණවූයේ (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම හෙලන ලද ධජ ඇති බහා තබන ලද බර ඇති සසරින් වෙන්වූ ආර්යයෙක් වේයයි" වදාළේය.

**22. දුතිය චෙතො විමුක්තිඵල සූත්‍රයඃ-** 1 (මේ ඡේදය මේ පණ්ණාසකයේ 21 සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

2. "කවර පසක්ද යත්? අනිත්‍ය සංඥාවය, අනිත්‍යයෙහි දුක්ඛ සංඥාවද, දුකෙහි අනාත්ම සංඥාවද, ප්‍රහාණ සංඥාවද විරාග සංඥාවද (නිරොධ සංඥාවද) යන පසයි.

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

4-10. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 4-10 ඡේදය මෙන් වෙත්.)

**23. පඨම ධම්ම විහාරී සූත්‍රයඃ-** 1. "ඉක්බිති එක්තරා භික්ෂුවක්තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන්නාවූම ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය. "ස්වාමීනි, 'දැහැමි' විහරණ ඇත්තේය, දැහැමි විහරණ ඇත්තේයයි' කියනු ලැබේ. ස්වාමීනි, කොපමණකින් වනාහි භික්ෂුතෙම දැහැමි විහරණ ඇත්තේවේද?"

2. "මහණ, මේ ශාසනයෙහි භික්ෂුතෙම සූත්‍රය ගෙය්‍යය වෙය්‍යාකරණය ගාථාය උදානය ඉතිවුත්තකය ජාතකය, අද්භූත ධර්මය වේදල්ලය යන ධර්මය හදාරයිද,

3. "හෙතෙම ඒ ධර්මය හැදෑරීමෙන් දවස ඉක්මවාද විවේකය දුරු කෙරේද, තමන් කෙරෙහි සිත එකඟ කිරීමෙහි නොයෙදේද, මහණ, මේ භික්ෂුතෙම පර්යාප්තිය බහුල කොට ඇත්තේය. ධර්ම විහරණ ඇත්තේ නොවේයයි කියනු ලැබේ.

4. "මහණ, නැවත අනිකක්ද කියමි. භික්ෂුතෙම අසන ලද පරිදි පිරිවහණ ලද පරිදි ධර්මය විස්තර වශයෙන් අනුන්ට දෙශනා කෙරේද,

5. "හෙතෙම ඒ ධර්මය හැඟවීමෙන් දවස ඉක්මවාද, විවේකය හිස් කෙරේද, තමන් කෙරෙහි සිත සංසිඳවීමෙහි නොයෙදේද, මහණ, මේ භික්ෂුතෙම සැඟවීම් බහුල කොට ඇත්තේය. දැහැමි විහරණ ඇත්තේ නොවේයයි කියනු ලැබේ.

6. "මහණ, නැවත අනිකක්ද කියමි. භික්ෂුතෙම අසන ලද පරිදි පිරිවහණ ලද පරිදි ධර්මය විස්තර වශයෙන් හැදෑරීම කෙරේද,

7. "හෙතෙම ඒ හැදෑරීමෙන් දවස ඉක්මවාද, විවේකය සිස් කෙරේද, තමන් කෙරෙහි සිත සංසිඳවීමෙහි නොයෙදේද, මහණ, මේ භික්ෂුතෙම හැදෑරුම් බහුල කොට ඇත්තේය. දැහැමි විහරණ ඇත්තේ නොවේයයි කියනු ලැබේ.

8. "මහණ, නැවත අනිකක්ද කියමි. භික්ෂුතෙම අසන ලද පරිදි පිරිවහණ ලද පරිදි ධර්මය සිතින් අනුව කල්පනා කෙරේද, අනුව හසුරුවාද, සිතින් සලකා බලාද,

9. "හෙතෙම ඒ ධර්ම විතර්කවලින් දවස ඉක්මවාද, විවේකය සිස් කෙරේද, තමන් කෙරෙහිවූ සිත සංසිඳුවීමෙහි නොයෙදේද, මහණ මේ භික්ෂුතෙම විතර්ක බහුල කොට ඇත්තේ දැහැමි විහරණ ඇත්තේ නොවේයයි කියනු ලැබේ.

10. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

11. "හෙතෙම ඒ ධර්මය පිරිවැහීමෙන් දවස නොඉක්මවාද, විවේකය සිස් නොකෙරේද, තමන් කෙරෙහිවූ සිත් සංසිඳවීමෙහි යෙදේද, මහණ මෙසේ වනාහි භික්ෂු තෙම දැහැමි විහරණ ඇත්තේ වේ.

12. "මහණ, මෙසේ වනාහි පර්යාප්ති බහුල කොට ඇත්තේ, මා විසින් දෙශනා කරණ ලදී. සඤ්ඤත්ති බහුල කොට ඇත්තේ මා විසින් දෙශනා කරණ ලදී. සජ්ක්ධාය බහුල කොට ඇත්තේ දෙශනා කරණලදී. විතර්ක බහුලකොට ඇත්තේ දෙශනා කරණ ලදී. දැහැමි විහරණ ඇත්තේ දෙශනා කරණ ලදී.

13. "මහණ, යමක් වනාහි වැඩ කැමතිවූ අනුකම්පා ඇත්තාවූ ශාස්තෘහු විසින් ශ්‍රාවකයන්ට අනුකම්පා පිණිස කටයුතුද, මා විසින් තොපට එය කරණ ලදී. මහණ, මේ රුක් මුල් ඇත්තාහ. මේ හිස් ගෙවල් ඇත්තාහ. මහණ, ධ්‍යාන කරව්, ප්‍රමාද නොවව් පසුව විපිළිසර ඇත්තෝ නොවව්, මෙය තොපට අපගේ අනුශාසනාවයයි" වදාළේය.

**24. දුතිය ධම්ම විහාරි සූත්‍රයඃ-** 1-2. (මේ ඡෙද මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 1, 2, ඡෙද මෙන් වෙත්)

3. මත්තෙහිද ඒ ධර්මයාගේ ප්‍රඥාවෙන් අර්ථය නොදනීද, මහණ මේ භික්ෂුතෙම පර්යාප්ති බහුල කොට ඇත්තේය. දැහැමි විහරණ ඇත්තේ නොවේයයි කියනු ලැබේ.

4. (මේ ඡෙදය මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 4 ඡෙදය මෙනි.)

5. "මත්තෙහිද, ඒ ධර්මයාගේ ප්‍රඥාවෙන් අර්ථය නොදනීද, මහණ, මේ භික්ෂුතෙම හැඟවීම් බහුල කොට ඇත්තේය. දැහැමි විහරණ ඇත්තේ නොවේයි කියනු ලැබේ.

6. (මේ ඡෙදය මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 6 ඡෙදය මෙනි.)

7. "මත්තෙහිද ඒ ධර්මයාගේ ප්‍රඥාවෙන් අර්ථය නොදනීද, මහණ මේ භික්ෂුතෙම හැදෑරුම් බහුල කොට ඇත්තේය. දැහැමි විහරණ ඇත්තේ නොවේයයි කියනු ලැබේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

8. (මේ ඡේදය මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 8 ඡේදය මෙනි.)

9. "මත්තෙහිද ඒ ධර්මයාගේ ප්‍රඥාවෙන් අර්ථය නොදනීද, මහණ මේ භික්ෂුතෙම විතර්ක බහුල කොට ඇත්තේය. දැහැමි විහරණ ඇත්තේ නොවේයයි කියනු ලැබේ.

10. (මේ ඡේදය මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 10 ඡේදය මෙනි.)

11. "මත්තෙහිද ඒ ධර්මයාගේ ප්‍රඥාවෙන් අර්ථය දැනගනීද, මහණ, මෙසේ වනාහි භික්ෂුතෙම දැහැමි විහරණ ඇත්තේ වේ.

12-13. (මේ ඡේද මේ පණ්ණාසකයේ 23 සූත්‍රයේ 12 13 ඡේද මෙන් වෙත්)

**25. පඨම යොධාජීව සූත්‍රයː-** 1. "මහණෙනි, මේ යුද්ධ භටයෝ පස් දෙනෙක් ඇත්තාහු ලෝකයෙහි විද්‍යමාන වෙත්. කවර පස් දෙනෙක්ද යත්?

2. මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් යුද්ධ භටයෙක් තෙම රජස්කන්ධයම යුද්ධ භූමියෙන් නැංගාවූ ධූලි රාශියම දැක පසු බසියිද,

3. "විශෙෂයෙන් පසු බසියිද කෙලින් නොසිටියිද, යුද්ධ භූමියට බැස ගන්ට නොහැකිවේද, මහණෙනි, මෙබඳුවූ ඇතැම් යුද්ධ භටයෙක් වේ.

4. "මහණෙනි, මේ පළමුවෙනි යෝධාජීවතෙම ඇත්තේ ලෝකයෙහි විද්‍යමානවේ.

5. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මේ ලෝකයෙහි ඇතැම් යෝධාජීවයෙක් රජස්කන්ධය ඉවසාද, එතකුදු වුවත් ධජාග්‍රයම දැක පසු බසියිද, (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි) "මහණෙනි, මේ දෙවෙනි යුද්ධයෙන් ජීවත්වීම ඇත්තේ ලෝකයෙහි විද්‍යමානවේ.

6. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මේ ලෝකයෙහි ඇතැම් යෝධාජීවයෙක් රජස්කන්ධයද ඉවසයි ධජාග්‍රයද ඉවසයි. එතකුදු වුවත් උස්වූද මහත්වූද ශබ්දයම අසා පසුබසියි. (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මේ තුන්වන යෝධාජීවතෙම ඇත්තේ ලෝකයෙහි විද්‍යමානවේ.

7. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මේ ලෝකයෙහි ඇතැම් යෝධාජීවයෙක්තෙම රජස් සමූහය ඉවසාද ධජාග්‍රය ඉවසාද, උසස්වූ ඝෝෂාව ඉවසාද, එතකුදු වුවත් පැමිණියාවූ ප්‍රහාරයෙහි නැසේද, විනාශයට පැමිණේද මහණෙනි, මෙබඳුවූද මේ ලෝකයෙහි ඇතැම් යුද්ධභටයෙක් වේ. මහණෙනි, මේ සතරවන යෝධාජීවතෙම ඇත්තේ ලෝකයෙහි විද්‍යමාන වේ.

8. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මේ ලෝකයෙහි ඇතැම් යෝධාජීවයෙක්තෙම රජස්කන්ධය ඉවසාද, ධජාග්‍රය ඉවසාද, උසස්වූ ඝෝෂාව ඉවසාද, පැමිණි ප්‍රහාරය ඉවසාද,

9. "හෙතෙම ඒ යුද්ධය ජයගෙණ දිනන ලද යුද්ධ ඇත්තේ ඒ යුද්ධ භූමියෙහිම අධිපතිව වාසය කෙරේද, මහණෙනි මෙබඳුවූද මේ ලෝකයෙහි ඇතැම් යෝධාජීවයෙක් වේ. මහණෙනි, මේ පස්වන යෝධාජීවතෙම ඇත්තේ ලෝකයෙහි විද්‍යමානවේ. මහණෙනි, මේ යෝධාජීවයෝ පස් දෙන වනාහි ඇත්තාහු ලෝකයෙහි විද්‍යමාන වෙත්. මහණෙනි, මෙපරිද්දෙන්ම යෝධාජීවයන්ට බඳු උපමා ඇති පුද්ගලයෝ පස් දෙනෙක් ඇත්තාහු භික්ෂූන් අතර විද්‍යමාන වෙත්. කවර පස් දෙනෙක්ද යත්, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම, රජස්කන්ධයම දැක,

10. "පසුබසීද, ගැලේද, ස්ථිරව නොසිටීද, බ්‍රහ්මචර්යාව රකින්ට නොහැකිවේද, ශික්ෂාවගේ දුර්වල භාවය ප්‍රකාශ කොට ශික්ෂාව හැර දමා ගිහි බවට පෙරලේද, මෝහට රජස්කන්ධය නම් කුමක්ද?

11. "මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම අසවල් නම් ගමෙහි හෝ නියම් ගමෙහි හෝ ස්ත්‍රියක් හෝ කුමරියක් හෝ

විශිෂ්ට රූ ඇත්තී, දැකුම් කටයුත්තී, ප්‍රසාද එලවන්නී, උතුම්වූ වර්ණ සෞන්දර්යයෙන් යුක්ත වූවායයි අසාද,

"හෙතෙම එය අසා (මෙහි මේ සූත්‍රයේ 10 ඡේදය යෙදිය යුතුයි.)

මොහුට රජස්කන්ධය වේ. මහණෙනි, යම්සේ ඒ යෝධාජීවතෙම රජස්කන්ධය දැක පසුබසීද, (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

"මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තහුයයි කියමි. මහණෙනි, මේ ශාසනයෙහි මෙබඳුවූ ඇතැම් පුද්ගලයෙක් වේ. මහණෙනි, මේ පළමුවෙනි යෝධාජීවයෙකුට බඳු උපමා ඇති පුද්ගලයෙක් ඇත්තේ භික්ෂූන් අතර විද්‍යමානවේ.

13. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුතෙම රජස් සමූහය ඉවසාද, එතකුදු වුවත් ධජාග්‍රයම දැක (මෙහි මේ සූත්‍රයේ 10 ඡේදය යෙදිය යුතුයි.) මොහුට ධජාග්‍රය නම් කවරක් වේද, (මෙහි මේ සූත්‍රයේ 11 ඡේදය යෙදිය යුතුයි.) නොම අසාද එතකුදු වුවත් විශිෂ්ට රූ ඇත්තාවූ දැකුම් කටයුතුවූ ප්‍රසාද එලවන්නාවූ උතුම්වූ වර්ණ සෞන්දර්යයෙන් යුක්තවූ ස්ත්‍රියක් හෝ කුමරියක් හෝ තෙමේ දකීද, හෙතෙම ඇය දැක (මෙහි මේ සූත්‍රයේ 10 ඡේදය යෙදිය යුතුයි.)

"මෙය මොහුට ධජාග්‍රය නම් වේ. මහණෙනි, යම් සේ ඒ යොධාජීවතෙම රජස්කන්ධය ඉවසාද, එතකුදු වුවත් ධජාග්‍රයම දැක (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි) මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තහුයයි කියමි මහණෙනි, මෙබඳුවද මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක්වේ. මහණෙනි, මේ දෙවන යෝධාජීවයාට බඳු උපමා ඇති පුද්ගලතෙම ඇත්තේ භික්ෂූන් අතර විද්‍යමානවේ.

14. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුතෙම රජස්කන්ධය ඉවසාද, ධජාග්‍රය ඉවසාද, එතකුදු වුවත් උසස්වූ ඝෝෂාවම අසා (මෙහි මේ සූත්‍රයේ 10 ඡේදය යෙදිය යුතුයි.) මොහුට කුමක් නම් උසස්වූ ඝොෂාව වේද, මහණෙනි, මේ

ශාසනයෙහි වනයට ගියාවූ හෝ රුක් මුලකට ගියාවූ හෝ හිස් ගෙයකට ගියාවූ හෝ භික්ෂුවක් වෙත ස්ත්‍රියක් තොමෝ එළඹ සිනාසේද, කථා කෙරේද, මහත්කොට සිනාසේද, කථාවෙන් කලකිරවාද, හෙතෙම ස්ත්‍රිය විසින් සිනාසෙනු ලබන්නේ කථා කරනු ලබන්නේ මහත්කොට සිනාසෙනු ලබන්නේ කලකිරවනු ලබන්නේ (මෙහි මේ සූත්‍රයේ 10 ඡෙදය යෙදිය යුතුයි.) මෙය මොහුට උසස් ඝෝෂාව නම් වේ. මහණෙනි, යම්සේ ඒ යොධාජීවතෙම රජස්කන්ධය ඉවසාද, ධජාග්‍රය ඉවසාද එතකුදුවුවත් උසස්වූ ඝොෂාවම අසා (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.)

"මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තහුයයි කියමි. මහණෙනි, මෙබඳුවූද මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් වෙයි. මහණෙනි, මේ තුන්වන යෝධාජීවයාට බඳු උපමා ඇති පුද්ගලයෙක් ඇත්තේ භික්ෂූන් අතර විද්‍යමාන වේ.

**15.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුතෙම රජස්කන්ධය ඉවසයි. ධජාග්‍රය ඉවසයි. උසස් ඝෝෂාව ඉවසයි. එතකුදු වුවත් පැමිණි ප්‍රහාරය ඇතිකල්හි නැසේද, විපතට පැමිණේද මොහුට කුමක් නම් සම්ප්‍රහාරය වේද,

**16.** "මහණෙනි, මේ ශාසනයෙහි වනයට ගියාවූ හෝ රුක්මුලකට ගියාවූ හෝ හිස් ගෙයකට ගියාවූ හෝ භික්ෂුවක් වෙත ස්ත්‍රියක්තොම පැමිණ ලංව හෝ හිඳීද, එක්ව හෝ නිදයිද වැතිරගෙණ හිඳීද, හෙතෙම ස්ත්‍රිය විසින් ලංව හිඳිනු ලබන්නේ එක්ව නිදනු ලබන්නේ, වැතිරගෙණ වාසය කරනු ලබන්නේ,

**17.** "ශික්ෂාව හැර නොදමා දුර්වල බව ප්‍රකාශ නොකොට මෛථුන ධර්ම ප්‍රතිසේවනය කෙරේද, මෙය මොහුට සම්ප්‍රහාරය නම් වේ. (මේ ඡෙදය මේ සූත්‍රයේ 6 ඡෙදයේ "විනාශයට පැමිණේද" යන කොටස දක්වා යෙදිය යුතුයි.)

"මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තහුයයි කියමි. මහණෙනි, මෙබඳුවූද, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් වේ. මහණෙනි, මේ සතරවන යෝධාජීවයාට බඳු උපමා ඇති පුද්ගලයෙක් ඇත්තේ භික්ෂූන් අතර විද්‍යමාන වේ.

18. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුතෙම (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදයේ "රජස්කන්ධය" සිට "වාසය කෙරේද" දක්වා යොදාගත යුතුයි.)

"කුමක් නම් මොහුට සංග්‍රාම විජයවේද, (මෙහි මේ සූත්‍රයේ 16 ඡේදය යෙදිය යුතුයි.) වෙළුම් හැර මුදාගෙණ යම් තැනෙක්හි කැමතිපරිදි බැහැරවයේද, හෙතෙම අරණ්‍යය, වෘක්ෂමූලය, පර්වතය, කඳුරැලිය, පර්වත ගුහාය, සොහොනය, වනයෙහිවූ ආශ්‍රමය, අභ්‍යවකාශය, පිදුරුබිස්සය යන විවේකවූ සයනාශනයක් භජනය කෙරේද,

19. "හෙතෙම වනයට ගියේ හෝ රුක්මුලකට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ ඍජුකොට කය පිහිටුවා සිහිය ඉදිරි පත්කොට එළවා පළඟ බැඳගෙණ හිඳීද, හෙතෙම ලොකයෙහි විෂම ලොභය දුරුකොට පහවූ විෂම ලොභ ඇති සිතින් යුක්තව වාසය කෙරේද, විෂම ලෝභයෙන් සිත පිරිසිදු කෙරේද, ව්‍යාපාදයෙන්වූ චිත්තප්‍රදූෂ්‍යය දුරුකොට පහවූ ව්‍යාපාද සිත් ඇත්තේ සියලු සතුන් කෙරෙහි සිතානුකම්පා ඇතිව වාසය කෙරේද, ව්‍යාපාද ප්‍රදොෂයෙන් සිත පිරිසිදු කෙරේද, සිතෙහි හා කයෙහි අලස බව දුරුකොට පහවූ ථීන මිද්ධය ඇත්තේ ආලොක සංඥා ඇත්තේ, සිහි ඇත්තේ මනා දැනුම් ඇත්තේ වාසය කෙරේද, සිතෙහි හා කයෙහි අලස බැවින් සිත පිරිසිදු කෙරේද, උඩඟුබව හා කුකුස්බව දුරු කොට උඩඟු නොවූයේ තමා කෙරෙහි සන්සුන් සිත් ඇත්තේ වාසය කෙරේද, උද්ධච්ච කුක්කුච්චයෙන් සිත පිරිසිදු කෙරේද, සැකය දුරුකොට පහවූ සැක ඇත්තේ කුශල ධර්මයන්හි කෙසේ කෙසේදැයි යන සැකය නැත්තේ වාසය කෙරේද, විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කෙරේද, හෙතෙම සිත කෙළෙසන්නාවූ, ප්‍රඥාව දුර්වල කරන්නාවූ මේ නීවරණ පස දුරුකොට (මෙහි තික නිපාතයේ දුතිය පණ්ණාසකයේ 1 වර්ගයේ 8 සූත්‍රයේ ඡේද 3 iii "මේ ශාසනයෙහි" සිට 11 ඡේදයේ "යමක් මත්තට නැතැයි දනී" දක්වා යෙදිය යුතුයි.)

(මෙහි දුතිය පණ්ණාසකයේ 8 සූත්‍රයේ 3 (iv) ඡේදය යෙදිය යුතුයි. 1 අ. 1ඃ පිට 302.) ආශ්‍රවයන්ගේ නැසීම දැන, (මෙහි 3 පණ්ණාසකයේ 2 සූත්‍රයේ 7 ඡේදය යෙදිය යුතුයි.)

"මෙය මොහුට සංග්‍රාම විජය නම් වේ. මහණෙනි යම්සේ ඒ යොධාජීවතෙම රජස්කන්ධය ඉවසාද, ධජාග්‍රය ඉවසාද, උසස්වූ ඝෝෂාව ඉවසාද, සම්ප්‍රහාරය ඉවසාද, හෙතෙම ඒ යුද්ධය ජයගෙන දිනන ලද සංග්‍රාම ඇත්තේ ඒ යුද්ධභූමියෙහිම අධිපතිව වාසය කෙරේද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තහුයයි කියමි. මහණෙනි, මෙබඳුවූද, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් වෙයි.

"මහණෙනි, මේ පස්වෙනි යෝධාජීවයාට බඳු උපමා ඇති පුද්ගලයෙක් ඇත්තේ භික්ෂූන් අතර විද්‍යමාන වේ. මහණෙනි, (මේ ඡේදය මේ සූත්‍රයේ 9 ඡේදයේ 'මෙපරිද්දෙන් යොධාජීවයන්ට බඳු' යන තැන සිට යෙදිය යුතුයි.)

**26. දුතිය යොධාජීව සූත්‍රයඃ-** (මේ ඡේදය මේ පණ්ණාසකයේ 25 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

**2.** "මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් යුද්ධයෙන් ජීවත් වන්නෙක් කඩුව හා පලිහ ගෙණ දුනු හා හියවුරු බැඳගෙණ පැමිණ සිටියාවූ යුද්ධයට බැසගණියි. හෙතෙම ඒ යුද්ධයෙහි උත්සාහ කරයි, ව්‍යායාම කරයි.

**3.** "උත්සාහ කරන්නාවූ ව්‍යායාම කරන්නාවූ ඔහු සතුරෝ නසත්. අල්වාගණිත්, මහණෙනි, මේ ලෝකයෙහි මෙබඳු ඇතැම් යුද්ධභටයෙක් වේ. මහණෙනි, මේ පළමුවන යුද්ධයෙන් ජීවත්වීම ඇත්තෙක් ලොකයෙහි විද්‍යමාන වේ.

**4.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

"උත්සාහ කරන්නාවූ ව්‍යායාම කරන්නාවූ ඔහුට අන්‍යයෝ විදිත්.

**5.** "ඔහු ස්වකීය කඳවුරට ගෙණ යත්. ගෙණ ගොස් නෑයන්ට පමුණුවත්.

6. "හෙතෙම නෑයන් විසින් ගෙණ යනු ලබන්නේ නෑයන් වෙතට නොපැමිණම අතරමග කළුරිය කරයි.

7. "මහණෙනි, මෙබඳුවූද, මේ ලොකයෙහි ඇතැම් යොධාජීවයෙක් වේ. මහණෙනි, මේ දෙවන යොධාජීව තෙම ඇත්තේ ලොකයෙහි විද්‍යමාන වේ. "මහණෙනි, නැවත අනිකක්ද කියමි (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි) උත්සාහ කරන්නාවූ ව්‍යායාම කරන්නාවූ ඔහුට අන්‍යයෝ විදිත්. (මෙහි මේ සූත්‍රයේ 5 ඡෙදය යෙදිය යුතුයි.)

8. "ඔහුට නෑයෝ උපස්ථාන කරත්, පිළිදැගුම් කරත්. හෙතෙම නෑයන් විසින් උවැටැන් කරණු ලබන්නේ පිළිදැගුම් කරනු ලබන්නේ ඒ ආබාධයෙන්ම කළුරිය කරයි. මහණෙනි, මේ තුන්වෙනි යුද්ධභටතෙම ඇත්තේ ලොකයෙහි විද්‍යමාන වෙත්.

9. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි) උත්සාහකරන්නාවූ ව්‍යායාම කරන්නාවූ ඔහුට අන්‍යයෝ විදිත් (මෙහි මේ සූත්‍රයේ 5 ඡෙදය යෙදිය යුතුයි.)

10. "ඔහුට නෑයෝ උපස්ථාන කරත්. පිළිදැගුම් කරත්. හෙතෙම නෑයන් විසින් උවැටැන් කරණු ලබන්නේ පිළිදැගුම් කරණු ලබන්නේ ඒ ආබාධයෙන් නැඟී සිටියි.

11. "මහණෙනි, මෙබඳුවූද මේ ලොකයෙහි ඇතැම් යුද්ධ භටයෙක්වේ. මහණෙනි, මේ සතරවෙනි යුද්ධ භටතෙම ඇත්තේ ලෝකයෙහි විද්‍යමානවේ. මහණෙනි, නැවත අනිකක්ද කියමි. (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

12. (මෙහි මේ වර්ගයේ 25 සූත්‍රයේ 9 ඡෙදය යෙදිය යුතුයි.)

13. "මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම එක්තරා ගමක් හෝ නියම්ගමක් හෝ ඇසුරුකොට වාසය කරයි. හෙතෙම පෙරවරු වේලෙහි හැඳ පොරවා පාත්‍ර සිව්රු ගෙණ එම ගමට හෝ නියම්ගමට හෝ නොරක්නාලද කයින් යුක්තවම, නොරක්නාලද වචනයෙන් යුක්තව, නොරක්නා ලද සිතින්

යුක්තව, නොඑළඹ සිටි සිහියෙන් යුක්තව, සංවර නොවූ ඉන්ද්‍රියයන්ගෙන් යුක්තව, පිඬු පිණිස පිවිසෙයි. හෙතෙම එහි නපුරුකොට හඳනාලද හෝ නපුරුකොට පොරෝනාලද හෝ ස්ත්‍රියක් දකියි. ඇයගේ නපුරුකොට හඳනාලද හෝ නපුරුකොට පොරෝනාලද හෝ ඒ ස්ත්‍රිය දැක රාගය තෙම සිත පෙළයි.

14. "හෙතෙම රාගයෙන් පෙළනලද සිතින් ශික්ෂාව නොහැර දුර්වල බව ප්‍රකාශ නොකොට මෛථුන ධර්ම ප්‍රතිසෙවනය කරයි.

15. ("මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

16. "උත්සාහ කරන්නාවූ ව්‍යායාම කරන්නාවූ ඔහු අන්‍යයෝ නසද්ද, අල්වාගනිද්ද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි. මහණෙනි, මේ ශාසනයෙහි මෙබඳුවූ ඇතැම් පුද්ගලයෙක් වේ. මහණෙනි, මේ පළමුවන යෝධාජීවයාට බඳු උපමා ඇති පුද්ගලතෙම ඇත්තේ භික්ෂූන් අතර විද්‍යමාන වේ.

17. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. (මෙහි මේ සූත්‍රයේ 13 ඡේදය යෙදිය යුතුයි)

18. "නපුරුකොට හඳනාලද හෝ නපුරුකොට පොරෝනාලද හෝ ඒ ස්ත්‍රිය දැක ඔහුගේ රාගයතෙම සිත පෙළයි. හෙතෙම රාගයෙන් මඩනාලද සිතින්, කයින්ද දවයි, සිතින්ද දවයි.

"ඔහුට මෙබඳු සිතක් වෙයි. 'මම ආරාමයට ගොස් භික්ෂූන්ට 'ඇවැත්නි, මම රාගය අනුව ගියේ වෙමියි, රාගයෙන් පෙළුනේ වෙමියි, බ්‍රහ්මචර්යාව රකින්ට නොහැකිවෙමි. ශික්ෂාවගේ දුර්වල භාවය ප්‍රකාශකොට ශික්ෂාව හැරදමා ගිහි බවට පෙරලෙන්නෙමියි සැළකරන්නෙම් නම් ඉතා යෙහෙක කියායි.

"හෙතෙම ආරාමයට යන්නේ, ආරාමයට නො පැමිණම අතරමගදී ශික්ෂාවගේ දුර්වලබව ප්‍රකාශකොට ශික්ෂාව හැරදමා ගිහිබවට පෙරලෙයි.

19. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

20. (මෙහි මේ සූත්‍රයේ 5, 6 ඡේදය යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**21.** "මහණෙනි, මම මේ පුද්ගලයා එබඳුයයි කියමි. මහණෙනි, මෙබඳු වූද මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් වේ. මහණෙනි, මේ දෙවන යොධාජීවයෙකුට බඳු උපමා ඇති පුද්ගලතෙම ඇත්තේ භික්ෂූන් අතර විද්‍යමානවේ.

**22.** (මේ ඡේදය මේ සූත්‍රයේ 13 ඡේදය මෙනි.)

**23.** "හෙතෙම, රාගයෙන් පෙළන ලද සිතින් කයින්ද දවයි. සිතින්ද දවයි (මෙහි මේ සූත්‍රයේ 19 ඡේදය යෙදිය යුතුයි.)

**24.** "හෙතෙම ආරාමයට ගොස් භික්ෂූන්ට සැළ කරයි. 'ඇවැත්නි මම රාගය අනුව ගියේ රාගයෙන් පෙළුනේ වෙමි. බ්‍රහ්මචර්යාව රකින්ට නොහැක්කේ වෙමි. ශික්ෂාවගේ දුර්වල භාවය ප්‍රකාශ කොට ශික්ෂාව හැර දමා ගිහි බවට පෙරළෙන්නෙමියි" ඔහුට බ්‍රහ්මචාරීහු අවවාද කරත්. අනුශාසනා කරත්.

**25.** "ඇවැත්නි, ස්වල්ප ආශ්වාද ඇත්තාවූ කාමයෝ බොහෝ දුක් ඇත්තාහුය. බොහෝ දැඩි ආයාස ඇත්තාහු යයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදහ. 'ඇටසැකිල්ලකට බඳු උපමා ඇත්තාවූ කාමයෝ බොහෝ දුක් ඇත්තාහුය. බොහෝ දැඩි ආයාස ඇත්තාහුයයි' භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දාහුය. මෙහි ආදීනව බොහෝ වේ. මස් පිඩකට බඳු උපමා ඇත්තාවූ කාමයෝ බොහෝ දුක් ඇත්තාහුය බොහෝ දැඩි ආයාස ඇත්තාහුයයි' භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දාහුය. මෙහි ආදීනව බොහෝ වේ. 'තණ සුලකට බඳු උපමා ඇත්තාවූ කාමයෝ බොහෝ දුක් ඇත්තාහ. බොහෝ දැඩි ආයාස ඇත්තාහුයයි' භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දාහ. මෙහි ආදීනවය බොහෝ වේ. 'ගිනි අඟුරු වලකට බඳු උපමා ඇත්තාවූ කාමයෝ බොහෝ දුක් ඇත්තාහ. බොහෝවූ දැඩි ආයාස ඇත්තාහුයයි' භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දාහ. මෙහි ආදීනවය බොහෝ වේ. 'සිහිනයකට බඳු උපමා ඇත්තාවූ කාමයෝ බොහෝ දුක් ඇත්තාහ. බොහෝවූ දැඩි ආයාස ඇත්තාහුයයි' භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ

ලද්දාහ. මෙහි ආදීනවය බොහෝ වේ. ඉල්වාගන්න ලද්දකට බඳු උපමා ඇති කාමයෝ බොහෝ දුක් ඇත්තාහ බොහෝවූ දැඩි ආයාස ඇත්තාහුයයි' භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දාහුයි. මෙහි ආදීනවය බොහෝ වේ. 'රුක් පලයට බඳු උපමා ඇති කාමයෝ බොහෝ දුක් ඇත්තාහ. බොහෝ උපායාස ඇත්තාහුයයි' භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දාහුය. මෙහි ආදීනවය බොහෝ වේ. 'කඩුව හා මස් ලොඹුවකට බඳු උපමා ඇති කාමයෝ බොහෝ දුක් ඇත්තාහ. බොහෝ උපායාස ඇත්තාහුයයි' භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දාහ. මෙහි ආදීනවය බොහෝ වේ. 'අඩයටි හා හුලට බඳු උපමා ඇති කාමයෝ බොහෝ දුක් ඇත්තාහ. බොහෝ උපායාස ඇත්තාහුයයි' භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙහි ආදීනවය බොහෝ වේ. 'සර්පයෙකුගේ හිසට බඳු උපමා ඇති කාමයෝ බොහෝ දුක් ඇත්තාහ. බොහෝ උපායාස ඇත්තාහුයයි' භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දාහ. මෙහි ආදීනවය බොහෝ වේයයි ආයුෂ්මත්තෙමේ බ්‍රහ්මචර්යාවට සිත අලවාවා, ආයුෂ්මත්තෙමේ ශික්ෂාවගේ දුර්වල භාවය ප්‍රකාශ කොට ශික්ෂාව හැර දමා ගිහි බවට නොපෙරලේවායි. හෙතෙම සබ්‍රම්සරුන් විසින් මෙසේ අවවාද කරණු ලබන්නේ මෙසේ අනුශාසනා කරණු ලබන්නේ මෙසේ කියයි.

**26.** "ඇවැත්නි, කිමකුත්, මඳ ආස්වාද ඇත්තාවූ කාමයෝ බොහෝ දුක් ඇත්තාහ. බොහෝ උත්සාහ ඇත්තාහුයයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දාහුද, මෙහි ආදීනවය බොහෝ වේද වැලිදු මම බ්‍රහ්මචර්යාව රකින්ට නොහැකිවෙමි. ශික්ෂාවගේ දුර්වල බව ප්‍රකාශ කොට ශික්ෂාව හැර දමා ගිහි බවට පෙරලෙන්නෙමියි හෙතෙම ශික්ෂාවගේ දුර්වල බව ප්‍රකාශ කොට ශික්ෂාව හැර දමා ගිහි බවට පෙරළේ.

**27.** (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) උත්සාහ කරන්නාවූ ව්‍යායාම කරන්නාවූ ඔහුට අන්‍යයෝ විදිද්ද, ඔහු බැහැරට ගෙණ යද්ද, ගෙණ ගොස් නෑයන් වෙත පමුණුවද්ද, (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි)

**28.** (මෙහි මේ සූත්‍රයේ 13 ඡේදය යෙදිය යුතුයි.) නොමනාව හඳින ලද්දාවූ හෝ නොමනාව පොරවන ලද්දාවූ හෝ ඒ ස්ත්‍රිය දැක ඔහුගේ රාගයතෙම සිත පෙළයි.

**29.** "හෙතෙම රාගයෙන් පෙළන සිතින් කයින් දවාමය, සිතිවිල්ලෙන් දවාමය. (මෙහි මේ සූත්‍රයේ 19 ඡේදය යෙදිය යුතුයි) හෙතෙම ආරාමයට ගොස් ඇවැත්නි, මම රාගය අනුව ගියේ රාගයෙන් පෙළුනේ වෙමි. බ්‍රහ්මචර්යාව රකින්ට නොහැක්කෙමි. ශික්ෂාවගේ දුර්වල භාවය ප්‍රකාශ කොට ශික්ෂාව හැර දමා ගිහි බවට පෙරලෙන්නෙමි' භික්ෂූන්ට සැළ කරයි.

**30.** ඔහුට සබ්‍රහ්මචාරීහු අවවාද කරත්. අනුශාසනා කරත්. (මෙහි මේ සූත්‍රයේ 25 ඡේදය යෙදිය යුතුයි.)

**31.** "ඇවැත්නි, උත්සාහ කරන්නෙමි. ඇවැත්නි, මහණකම දරන්නෙමි. ඇවැත්නි, සිත් අලවන්නෙමි ඇවැත්නි දැන් මම ශික්ෂාවගේ දුර්වල භාවය ප්‍රකාශ කොට ශික්ෂාව හැර දමා ගිහි බවට නොපෙරලෙන්නෙමියි,' (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

**32.** "උත්සාහ කරන්නාවූ ව්‍යායාම කරන්නාවූ ඔහුට අන්‍යයෝ විදිද්ද, (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.)

**33.** "මහණෙනි, මම මේ පුද්ගලයා මෙබඳු උපමා ඇත්තහු යයි කියමි. මහණෙනි, මෙබඳුවූද මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් වේ. මහණෙනි, මේ සතරවන යෝධාජීවයෙකුට බඳු උපමා ඇති පුද්ගලයෙක් ඇත්තේ භික්ෂූන් අතර විද්‍යමාන වේ.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුතෙම එක්තරා ගමක් හෝ නියම් ගමක් හෝ ඇසුරුකොට වාසය කරයි. හෙතෙම පෙරවරු වේලෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙණ එම ගමට හෝ නියම්ගමට හෝ රක්නාලද කය ඇතිව, රක්නාලද වචනය ඇතිව, රක්නාලද සිත් ඇතිව, එළඹ සිටි සිහි ඇතිව, සංවර කරණලද ඉන්ද්‍රියන් ඇතිව, පිඬු පිණිස පිවිසෙයි. හෙතෙම ඇසින් රූපයක් දැක,

34. "නිමිති වශයෙන් ගන්නේ නොවෙයි. කුඩා ලකුණු වශයෙන් ගන්නේ නොවෙයි.

35. "යමක් හේතුකොට ගෙණ මේ චක්ෂුරින්ද්‍රිය,

36. "සංවර රහිතව වාසය කරන්නාහුට විෂම ලෝභය දොම්නසය යන ලාමකවූ අකුශල ධර්මයෝ අනුව වහනය වන්නාහුද, එය සංවර කිරීම පිණිස පිළිපදියි.

37. චක්ෂුරින්ද්‍රිය රකියි. චක්ෂුරින්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි.

38. "කණින් ශබ්දයක් අසා (මෙහි මේ සූත්‍රයේ 34 ඡේදය යෙදිය යුතුයි.) යමක් හේතුකොට ගෙණ මේ සෝතේන්ද්‍රිය (මෙහි මේ සූත්‍රයේ 36 ඡේදය යෙදිය යුතුයි.) සොතේන්ද්‍රිය රකියි. සෝතේන්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි. නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට (මෙහි මේ සූත්‍රයේ 34 ඡේදය යෙදිය යුතුයි.) යමක් හේතුකොට ගෙණ මේ ඝානේන්ද්‍රිය (මෙහි මේ සූත්‍රයේ 36 ඡේදය යෙදිය යුතුයි.) ඝානෙන්ද්‍රිය රකියි. ඝානෙන්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි. දිවෙන් රසයක් විඳ (මෙහි මේ සූත්‍රයේ 34 ඡේදය යෙදිය යුතුයි.) යමක් හේතුකොට ගෙණ මේ ජිව්හා ඉන්ද්‍රිය (මෙහි මේ සූත්‍රයේ 36 ඡේදය යෙදිය යුතුයි.) ජිව්හා ඉන්ද්‍රිය රකියි. ජිව්හා ඉන්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි. කයින් ස්පර්ශ කළයුත්තක් ස්පර්ශ කොට (මෙහි මේ සූත්‍රයේ 34 ඡේදය යෙදිය යුතුයි.) යමක් හේතුකොට ගෙණ මේ කායේන්ද්‍රිය (මෙහි මේ සූත්‍රයේ 36 ඡේදය යෙදිය යුතුයි) කායෙන්ද්‍රිය රකියි. කායෙන්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි. සිතින් ධර්මයක් දැන (මෙහි මේ සූත්‍රයේ 34 ඡේදය යෙදිය යුතුයි.) යමක් හේතුකොට ගෙණ මේ මනින්ද්‍රිය (මෙහි මේ සූත්‍රයේ 36 ඡේදය යෙදිය යුතුයි.) මනින්ද්‍රිය රකියි. මනින්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි.

39. "හෙතෙම පසුබත් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුණේ අරණ්‍යය, රුක් මුලය, පර්වතය, කඳුරැලිය, පර්වත ගුහාවය, සොහොනය, දුරවූ වන සෙනසුනය අභ්‍යවකාශය, පිදුරුබිස්සය යන විවේකවූ ශයනාසනයක් භාජන කරයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

(මේ පණ්ණාසකයේ 25 සූත්‍රයේ 119 ඡේදය යෙදිය යුතුයි.

(මෙහි මේ සූත්‍රයේ 2 ඡේදයේ 'බැසගනියි' දක්වා යෙදිය යුතුයි)

"හෙතෙම ඒ යුද්ධය ජය ගෙණ දිනන ලද යුද ඇත්තේ එම යුද්ධ භූමියෙහි අධිපතිව වාසය කෙරේද, මහණෙනි, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තහු යයි කියමි. මහණෙනි, මෙබඳුවූද මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් වේ. මහණෙනි, මේ පස්වන යෝධාජීවයෙකුට බඳු උපමා ඇති පුද්ගලයෙක් ඇත්තේ භික්ෂූන් අතර විද්‍යමාන වේ. මහණෙනි, මේ යෝධාජීවයාට බඳු උපමා ඇති පුද්ගලයෝ පස්දෙන වනාහි ඇත්තාහු භික්ෂූන් අතර විද්‍යමාන වෙත්යයි" වදාළේය.

**27. පඨම අනාගත භය සූත්‍රය:-** 1. "මහණෙනි, මේ මතු පැමිණෙන්නාවූ භය පසක් දක්නාවූ වනයෙහි වාසය කරණ භික්ෂුව විසින්,

2. "නොපැමිණියහුගේ පැමිණීම පිණිස, නොලබන ලද්දහුගේ ලැබීම පිණිස, ප්‍රත්‍යක්ෂ නොකරණ ලද්දහුගේ ප්‍රත්‍යක්ෂකිරීම පිණිස, අප්‍රමාදව කෙලෙස් තවන වීර්ය ඇතිව හරණලද ආත්මාලය ඇතිව වාසය කරන්නට සුදුසුමැයි.

3. "කවර පසක්ද යත්. මහණෙනි, මේ ශාසනයෙහි වනයෙහි වසන්නාවූ භික්ෂුතෙම මෙසේ සළකයි. 'මම වනාහි මෙකල්හි හුදකලාවම වනයෙහි වාසය කරමි. හුදකලාවම වනයෙහි වසන්නාවූ මා සර්පයෙක් හෝ දෂ්ට කරන්නේ නම් ගෝනුස්සෙක් හෝ මා දෂ්ට කරන්නේ නම් සතපදියෙක් හෝ මා දෂ්ට කරන්නේ නම් ඒ හේතුවෙන් මාගේ කාලක්‍රියාව වන්නේ නම්, හෙතෙම මට අන්තරායක් වන්නේය. එබැවින් මම නොපැමිණියහුගේ පැමිණීම පිණිස නොලබන ලද්දහුගේ ලැබීම පිණිස ප්‍රත්‍යක්ෂ නොකරණ ලද්දහුගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස, වීර්ය පටන් ගනිමි.

4. "මහණෙනි, මේ පළමුවන මතු පැමිණෙන්නාවූ භය දක්නාවූ වනයෙහි වාසය කරණ භික්ෂුව විසින් (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

**5.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. වනයෙහි වසන්නාවූ භික්ෂුතෙම මෙසේ සළකයි. මම වනාහි දැන් තනිව වනයෙහි වාසය කරමි. තනිවම වනයෙහි වාසය කරන්නාවූ මම වනාහි පැකිල හෝ වැටෙන්නෙම් නම් මා විසින් අනුභව කරණලද ආහාරය හෝ විරුද්ධ වන්නේ නම් පිත හෝ කිපෙන්නේ නම්, මාගේ සෙම හෝ කිපෙන්නේ නම්, මාගේ ශස්ත්‍රක වාත හෝ කිපෙන්නාහු නම්, ඒ හේතුවෙන් හෝ කාලක්‍රියාව වන්නේ නම්, හෙතෙම මට අන්තරායෙක් වන්නේය. එබැවින් මම (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදයේ 'ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස' දක්වා යෙදිය යුතුයි.) වීර්ය හෝ පටන්ගනියි. මහණෙනි, මේ දෙවන පැමිණෙන්නාවූ භය දක්නාවූ වනයෙහි වසන භික්ෂුව විසින් (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

**6.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. වනයෙහි වාසය කරණ භික්ෂුතෙම මෙසේ සලකයි. 'මම වනාහි දැන් හුදකලාව වනයෙහි වසමි. හුදකලාව වනයෙහි වසන්නාවූ මම වනාහි සිංහයෙකු සමග හෝ ව්‍යාඝ්‍රයෙකු සමග හෝ දිවියෙකු සමග හෝ වළහෙකු සමග හෝ කලු හිස් වළසෙකු සමග හෝ වල් මෘගයන් සමග හෝ එක්වන්නෙම් නම්, ඔව්හු මා ජීවිතයෙන් තොර කරන්නාහු නම්, ඒ හේතුවෙන් මාගේ කාලක්‍රියාව වන්නේ නම් හෙතෙම මට අන්තරායක් වන්නේය, එබැවින් මම නොපැමිණියහුගේ පැමිණීම පිණිස නොලබන ලද්දහුගේ ලැබීම පිණිස ප්‍රත්‍යක්ෂ නොකරණ ලද්දහුගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වීර්ය පටන් ගනිමි. මහණෙනි, මේ තුන්වන පැමිණෙන්නාවූ භය දක්නාවූ වනයෙහි වසන භික්ෂුව විසින් (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

**7.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. වනයෙහි වසන භික්ෂුතෙම මෙසේ සලකයි. 'මම වනාහි දැන් හුදකලාව වනයෙහි වසමි. හුදකලාව වනයෙහි වසන්නාවූ මම වනාහි කරණලද සොරකම් ඇත්තාවූ හෝ නොකරණ ලද සොරකම් ඇත්තාවූ හෝ මිනිසුන් සමග එක්වන්නෙම් නම්, ඔව්හු මා ජීවිතයෙන් තොර කරන්නාහු නම්, ඒ හේතුවෙන් මාගේ කාලක්‍රියාව වන්නේ

නම්, හෙතෙම මට අන්තරායෙක් වන්නේය. එබැවින් මම (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදයේ 'ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස' දක්වා යෙදිය යුතුයි.) වීර්ය පටන් ගතිමි. මහණෙනි, මේ සතරවන අනාගත භය දක්නාවූ වනවාසී භික්ෂුව විසින් (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

**8.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. වනවාසී භික්ෂුතෙම මෙසේ සළකයි. මම වනාහි දැන් හුදකලාව වනයෙහි වසමි. වනයෙහි වනාහි චණ්ඩවූ අමනුෂ්‍යයෝ ඇත්තාහ. ඔව්හු මා ජීවිතයෙන් තොර කරන්නාහු නම් එයින් මාගේ කාලක්‍රියාව වන්නේ නම් හෙතෙම මට අන්තරායෙක් වන්නේය. එබැවින් මම නොපැමිණියහුගේ පැමිණීම පිණිස නොලබන ලද්දහුගේ ලැබීම පිණිස ප්‍රත්‍යක්ෂ නොකරණ ලද්දාහුගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වීර්යය පටන් ගතිමි. මහණෙනි, මේ පස්වන අනාගත භය දක්නාවූ වනවාසී භික්ෂුව විසින් (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි.)

**9.** (මෙහි මේ සූත්‍රයේ 1, 2 ඡෙදය යෙදිය යුතුයි.)

**28. දුතිය අනාගත භය සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ මතු පැමිණෙන්නාවූ භය පසක් දක්නාවූ භික්ෂුහු විසින් නොපැමිණියහුගේ පැමිණීම පිණිස නොලබන ලද්දාහුගේ ලැබීම පිණිස ප්‍රත්‍යක්ෂ නොකරණ ලද්දහුගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස අප්‍රමාදව, කෙළෙස් තවන වීර්ය ඇතිව, හරණ ලද ආත්මාලය ඇතිව, වාසය කරන්ට සුදුසුමයැ,

**2.** "කවර පසක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙම මෙසේ සලකයි 'මම වනාහි දැන් තරුණවූයේ යෞවන වූයේ බාලවූයේ කළු හිසකෙස් ඇත්තේ සොඳුරුවූ යෞවනවූ පළමුවයසින් යුක්තවූයේ වෙමි. යම්කලෙක මේ ශරීරය ජරාව ස්පර්ශ කෙරේද, එබඳු කාලයක් වේ. ජීර්ණවූ ජරාවෙන් මඩනා ලද්දහු විසින් වනාහි බුදුවරයින්ගේ අනුශාසනාව මෙනෙහි කරන්ට පහසු නොවේ. වනයෙහි ඉතා දුරවූ වනසෙනසුන් සේවනය කරන්ට පහසු නොවෙත්. ඒ ඉෂ්ටනොවූ නොකැමැතිවූ අමනාපවූ ධර්මයතෙම ඉදිරියෙහි මට පැමිණේ.

3. "එබැවින් මම පළමුකොටම නොපැමිණියහුගේ පැමිණීම පිණිස නොලබන ලද්දහුගේ ලැබීම පිණිස ප්‍රත්‍යක්ෂ නොකරණ ලද්දහුගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වීර්ය පටන් ගණිමි.

4. "යම් ධර්මයකින් යුක්තවූ මම ජරාවට ගියේද, පහසු පරිදි වාසය කරන්නෙම්දැයි මහණෙනි, මේ පළමුවන

5. "අනාගත භය දක්නාවූ භික්ෂුව විසින් නොපැමිණියහුගේ පැමිණීම පිණිස නොලබන ලද්දහුගේ ලැබීම පිණිස ප්‍රත්‍යක්ෂ නොකරණ ලද්දහුගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස අප්‍රමාදව, කෙලෙස් තවන වීර්ය ඇතිව, හරණ ලද ආත්මාලය ඇතිව, වාසය කරන්ට සුදුසුමය.

6. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුතෙම මෙසේ සලකයි. මම වනාහි දැන් ස්වල්පවූ ආබාධ ඇත්තේ ස්වල්පවූ රෝග ඇත්තේ, ඉතා සිහිල් නොවූ ඉතා උණුසුම් නොවූ මධ්‍යමවූ වීර්යයකිරීමට සුදුසුවූ සමවූ පැසවීම ඇති ග්‍රහණියෙන් යුක්තවූයේ වෙමි. යම් කලෙක මේ ශරීරය ව්‍යාධිය ස්පර්ශ කෙරේද එබඳු කාලයක් වේ.

හටගත් රෝග ඇත්තාවූ හටගත් ව්‍යාධි ඇත්තාවූ ව්‍යාධියෙන් මඩනාලද්දහු විසින් බුදුවරයින්ගේ අනුශාසනාව මෙනෙහි කරන්ට පහසු නොවේ. වනයෙහි වනගතවූ ඉතා දුරවන සෙනසුන් සෙවනය කරන්ට නොහැකිවෙත්. ඉදිරියෙහි මට ඉෂ්ට නොවූ නොකැමැතිවූ අමනාපවූ මේ ධර්මය තෙම පැමිණෙයි. (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) යම් ධර්මයකින් යුක්තවූ මම හටගත් ව්‍යාධි ඇත්තේද, පහසු පරිදි වාසය කරන්නෙම්දැයි මහණෙනි, මේ දෙවෙනි (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.)

7. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුතෙම මෙසේ සලකයි. දැන් වනාහි සුලභ භික්ෂා ඇත්තේය. මනාශෂ්‍ය ඇත්තේ සුලභවූ ආහාර ඇත්තේය. සිඟාලද දෙයින් යැපෙන්ට පහසුය. යම් කලෙක දුර්ලභවූ භික්ෂාව අයහපත්වූ ශෂ්‍යය දුර්ලභවූ ආහාරය වේද, සිඟාලද දෙයින් යැපෙන්ට නොහැකිවේද එබඳු

කාලයෙක් වේ. දුර්භික්ෂ කාලයෙහි වනාහි මනුෂ්‍යයෝ යම්තැනෙක්හි සුභික්ෂද එතැන්හි ගමන් කෙරෙත්. එහි එකතුව වාසය කිරීම වේ. ගැවසීගත් වාසය වේ. එකතුව වාසය කිරීම ඇත්තාවූ ගැවසීගත් වාසය කිරීම ඇතිකල්හි වනාහි බුදුවරුන්ගේ අනුශාසනය මෙනෙහි කරන්ට පහසු නොවේ. වනයෙහි වානප්‍රස්ත නම් ඉතා දුර වනසෙනසුන් සේවනය කරන්ට නොහැකිවෙත්. ඉදිරියෙහි මට අනිෂ්ටවූ කැමති නොවන්නාවූ අමනාපවූ ඒ ධර්මය තෙම පැමිණේ. (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) යම් ධර්මයකින් යුක්තවූ මම දුර්භික්ෂ කාලයෙහිද පහසුවෙන් වාසය කරන්නෙම්දැයි, මහණෙනි, මේ තුන්වන (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි)

**8.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුතෙම මෙසේ සලකයි. දැන් වනාහි මිනිස්සු සමගි වූවාහු සතුටු වන්නාහු විවාද නොකරන්නාහු කිරි හා දිය මෙන් එක්වූවාහු ඔවුනොවුන් ප්‍රිය ඇස්වලින් බලන්නාහු වාසය කරත්. යම් කලක අටවිංතාපනම් භයක් වේද, රථවලට නැංගාවූ දනව් වැස්සෝ ඔබ මොබ යෙද්ද, එබඳු සමයෙක්වේ. භයක් ඇති කල්හි වනාහි මිනිස්සු යම්තැනෙක නිර්භයද එතැනට පැමිණෙත්. එහි සමූහයා එක්ව වාසය කිරීම වේ. ගැවසීගත් වාසයවේ. සමූහයා එක්ව වාසයකිරීම ඇති කල්හි ගැවසීගත් වාසයකිරීම ඇතිකල්හි වනාහි බුදුවරුන්ගේ අනුශාසනය මෙනෙහිකරන්ට පහසුනොවේ. වනයෙහි වානප්‍රස්ත නම් දුරවූ වනසෙනසුන් සේවනය කරන්ට නොහැකි වෙත්. ඉදිරියෙහි මට අනිෂ්ටවූ නොකැමැතිවූ අමනාපවූ ඒ ධර්මයතෙම පැමිණේ (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) යම් ධර්මයකින් යුක්තවූ මම භය පැමිණි කල්හිද පහසුවෙන් වාසය කරන්නෙම්දැයි මහණෙනි, මේ සතරවන (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.)

**9.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුතෙම මෙසේ සලකයි. මෙකල්හි සංඝතෙම සමගිවූයේ සතුටුවනු ලබන්නේ විවාද නොකරනු ලබන්නේ එක්ව උදෙසීම් ඇත්තේ පහසු පරිදි වාසය කරයි. යම් කලෙක සංඝයා බිඳේද එබඳු කාලයක්වේ.

සංඝයා බිඳුනු කල්හි වනාහි බුදුවරයින්ගේ අනුශාසනාව මෙනෙහි කරන්ට පහසු නොවේ. වනයෙහි වානප්‍රස්තනම් දුරවූ සෙනසුන් සේවනය කරන්ට පහසු නොවෙත් ඉදිරියෙහි මට අනිෂ්ටවූ නොකැමැතිවූ අමනාපවූ ඒ ධර්මය තෙම පැමිණේ (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි) යම් ධර්මයකින් යුක්තවූ මම සංඝයා භෙදවූ කල්හි පහසු පරිදි වාසය කරන්නෙම්දැයි මහණෙනි, මේ පස්වෙනි (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.)

**10.** (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

**29. තතිය අනාගත භය සූත්‍රයː-** 1. "මහණෙනි, මේ අනාගත භය පසක් දැන් නූපන්නාහු මත්තෙහි නූපදින්නාහ. ඒ භය පස තොප විසින් දැනගත යුතු වෙත්. දැනගෙණද ඔවුන්ගේ දුරුකිරීම් පිණිස උත්සාහ කටයුතුයි.

**2.** "කවර පසක්ද යත්?

**3.** "මහණෙනි, මතුකාලයෙහි නොවඩන ලද කය ඇත්තාවූ නොවඩන ලද සිල් ඇත්තාවූ, නොවඩන ලද සිත ඇත්තාවූ, නොවඩන ලද ප්‍රඥාව ඇත්තාවූ භික්ෂූහු වන්නාහුය.

**4.** "නොවඩන ලද කය ඇත්තාවූම නොවඩන ලද සිල් ඇත්තාවූම නොවඩන ලද සිත් ඇත්තාවූම නොවඩන ලද ප්‍රඥාව ඇත්තාවූම,

**5.** "ඒ භික්ෂූහු අන්‍යයන් උපසම්පදා කරන්නාහුය. ඔවුන් අධිශීලයෙහිද අධිචිත්තයෙහිද අධිප්‍රඥාවෙහිද හික්මවන්ට නොහැකි වන්නාහුය.

**6.** "ඔව්හුද (මෙහි මේ සූත්‍රයේ 3 දෙය යෙදිය යුතුයි) වන්නාහුය. (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි)

**7.** (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි)

(මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) වන්නාහුය.

**8.** "මහණෙනි, මෙසේ වනාහි ධර්මය දූෂ්‍ය කිරීමෙන් විනය දූෂ්‍ය කිරීමවේ. විනය දූෂ්‍ය කිරීමෙන් ධර්මය දූෂ්‍ය කිරීමවේ.

**9.** "මහණෙනි, මේ පළමුවන අනාගත භය මෙකල්හි නූපන්නේ මත්තෙහි උපදින්නේය. එය තොප විසින් දත යුතුයි. දැනගෙණද එය දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි.

**10.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

**11.** (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

(මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි)

**12.** (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

**13.** (මේ ඡේදය මේ සූත්‍රයේ 8 ඡේදය මෙනි)

**14.** "මහණෙනි, මේ දෙවන අනාගත භය දැන් නූපන්නේ මත්තෙහි උපදින්නේය. එය තොප විසින් දැනගත යුතුයි. දැනගෙණද එය දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි.

**15.** (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

**16.** (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි) අභිධර්ම කථාව තුෂ්ටි බහුලකොට ඇති කථාව කියන්නාහු ලාමකවූ ධර්මයට බැසගන්නාහු දැනනොගන්නාහුය. (මෙහි මේ සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මේ තුන්වන අනාගත භය මෙකල්හි නූපන්නේ මත්තෙහි උපදින්නේය. එය තොප විසින් දැනගත යුතුයි. දැනගෙණද එය දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි.

**17.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) ඔව්හු නොවඩන ලද කය ඇත්තාහුම නොවඩන ලද සිල් ඇත්තාහුම නොවඩන ලද සිත් ඇත්තාහුම යම් ඒ සූත්‍රාන්තයෝ තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලද්දාහු ගැඹුරුවූවාහු ගැඹුරු අර්ථ ඇත්තාහු ලොකොත්තර වූවාහු ශූන්‍යතාවෙන් යුක්තවූවාහු වෙද්ද,

**18.** "ඒ සූත්‍රයන් කියනු ලබන කල්හි අසන්ට නොකැමැති වෙත්. ඇසීමට කන් නොඑලවන්නාහ. දැනගැණීමට සිත නොපිහිටු වන්නාහ. ඒ ධර්මයන් උගත යුතුය. පිරිවැහිය යුතුයයි

නොසිතන්නාහ. යම් ඒ සූත්‍රාන්ත වනාහි කවීන් විසින් කරණ ලද්දාහු කවීන්ට හිත වූවාහු විසිතුරු අක්ෂර ඇත්තාහු විසිතුරු ව්‍යඤ්ජන ඇත්තාහු ශාසනයෙන් පිටත්හිවූ ශ්‍රාවකයන් විසින් කියන ලද්දාහු වෙද්ද, ඒ සූත්‍රාන්තයන් කියනු ලබන කල්හි අසන්ට කැමැති වෙත්. ඇසීමට කන් එලවත්. දැනගැණීමට සිත පිහිටුවත්. ඒ ධර්මයන්ද උගත යුතුය. පිරිවැහිය යුතුයයි සිතන්නාහ. මහණෙනි, මෙසේ වනාහි ධර්ම දූෂ්‍යයෙන් විනය දූෂ්‍යය වේ. විනය දූෂ්‍යයෙන් ධර්ම දූෂ්‍යය වේ. මහණෙනි මේ සතරවන අනාගත භය මෙකල්හි නූපන්නේ මතු උපදින්නේය. එය තොප විසින් දැනගත යුතුයි. දැනගෙණද එය දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි.

**19.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. (මෙහි මේ සූත්‍රයේ 3, 4 ඡෙද යෙදිය යුතුයි.)

"ස්ථවිර භික්ෂූහු ප්‍රත්‍යය බහුලකොට ඇත්තාහු, ශාසනය ලිහිල්කොට ගත්තාහු, පඤ්චනීවරණයන්ට බැසගැන්මෙහි පූර්වංගම වූවාහු, ප්‍රකර්ෂ විවේකයෙහි බහා තබනලද ධුර ඇත්තාහු වන්නාහුය.

**20.** (මෙහි මේ පණ්ණාසකයේ 27 සූත්‍රයේ 2 ඡෙදයේ "ප්‍රත්‍යක්ෂකිරීම පිණිස" දක්වා යෙදිය යුතුයි.) වීර්යාරම්භ නොකරන්නාහුය.

**21.** "ඔවුන්ගේ පශ්චිම ජනතාව දෘෂ්ටානුගතියට පැමිණෙන්නේය. ඒ ජනතාවද ප්‍රත්‍ය බහුලකොට ඇත්තී සස්න ලිහිල්කොට ගන්නාලද්දී නීවරණයන්ට බැසගැන්මෙහි පෙරටුව ගමන් කරන්නී ප්‍රකර්ෂ විවේකයෙහි බහා තබනලද ධුර ඇත්තී වන්නීය. (මෙහි මේ පණ්ණාසකයේ 27 සූත්‍රයේ 2 ඡෙදයේ "ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස" දක්වා යෙදිය යුතුයි.)

"මහණෙනි, මෙසේ වනාහි ධර්ම සන්දූෂ්‍යයෙන්, විනය සන්දූෂ්‍යයවේ. විනය සන්දූෂ්‍යයෙන්, ධර්ම සන්දූෂ්‍යය වේ. මහණෙනි මේ පස්වන අනාගත භය මෙකල්හි නූපන්නේ මතු උපදින්නේය.

22. "එය තොප විසින් දැනගත යුතුයි. දැනගෙණද එය දුරු කිරීම පිණිස උත්සාහ කටයුතුයි. (මෙහි මේ සූත්‍රයේ 1 ඡේදය යෙදිය යුතුයි.)

**30. චතුත්ථ අනාගතභය සූත්‍රය:-** 1. "මහණෙනි, මේ අනාගත භය පසක් දැන් නූපන්නාහු මතු උපදින්නාහුය ඒ භය තොප විසින් දැනගතයුතුයි. දැනගෙණද ඔවුන් දුරුකිරීම පිණිස උත්සාහ කටයුතුයි.

2. "කවර පසක්දයත්? මහණෙනි, මතු කාලයෙහි සිවුරෙහි සුන්දරත්වය කැමැත්තාවූ භික්ෂූහු වන්නාහ. ඔව්හු සිවුරෙහි සුන්දරත්වය කැමැත්තාහුම පංසුකූලිකබව හිස් කරන්නාහුය. වනයෙහි වානප්‍රස්ත නම් දුරවූ ශයනාසනයන් හිස්කරන්නාහුය. ගම් නියම්ගම් රාජධානිවල එකතුව වාසය කරන්නාහුය. සිවුරු හේතුකොටගෙනද අනෙකප්‍රකාරවූ නුසුදුසු සෙවීමට පැමිණෙන්නාහුය. මහණෙනි, මේ පළමුවන,

3. "අනාගත භය දැන් නො පැමිණියේ මතු පැමිණෙන්නේය. එය තොප විසින් දැනගතයුතු දැනගෙණද එය දුරුකිරීම පිණිස උත්සාහකටයුතුයි. මහණෙනි, නැවත අනිකක්ද කියමි.

4. "මතු කාලයෙහි පිණ්ඩපාතයෙහි සුන්දරත්වය කැමැත්තාවූ භික්ෂූහු වන්නාහුය. ඔව්හු පිණ්ඩපාතයෙහි සුන්දරත්වය කැමැත්තාහුම පිණ්ඩපාතික බව හිස්කරන්නාහුය. වනයෙහි වානප්‍රස්ත නම් දුරවූ ශයනාසනයන් හිස්කරන්නාහුය. ගම් නියම්ගම් රාජධානිවල එකතුව ජීව්හාග්‍රයෙන් උතුම් රසයන් සොයමින් වාසය කරන්නාහුය. පිණ්ඩපාතය හෙතුකොටගෙනද අනෙකප්‍රකාරවූ නුසුදුසු සෙවීමට පැමිණෙන්නාහුය. මහණෙනි, මේ දෙවන (මේ සූත්‍රයේ 3 දෙය යෙදිය යුතුයි.)

5. මතු කාලයෙහි ශයනාසනයෙහි සුන්දරත්වය කැමැත්තාවූ භික්ෂූහු වන්නාහ. ඔව්හු ශයනාසනයෙහි සුන්දරත්වය කැමැත්තාහුම රුක්ඛමූලිකබව හිස් කරන්නාහුය. වනයෙහි වානප්‍රස්ත නම් දුර සෙනසුන් හිස්කරන්නාහුය. ගම් නියම්ගම්

රාජධානිවල එකතුව වාසයකරන්නාහුය. ශයනාසන හේතුකොටගෙණද අනෙකප්‍රකාරවූ නුසුදුසු සෙවීමට පැමිණෙන්නාහුය. මහණෙනි, මේ තුන්වන (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.)

**6.** "මතු කාලයෙහි භික්ෂූහු, භික්ෂුණිය ශික්ෂමානාය සාමණෙර යන මොවුන් හා එකතුව වාසය කරන්නාහුය. මහණෙනි, භික්ෂුණිය, ශික්ෂමානාය, සාමණෙර යන මොවුන් හා එක්ව වාසය කිරීම ඇති කල්හි වනාහි මෙය කැමතිවිය යුතුයි. නො ඇළුනාහු හෝ බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්නාහුය. එක්තරා ඉතා කිට්ටු ඇවතකට හෝ පැමිණෙන්නාහුය. ශික්ෂාව හෝ හැරදමා ගිහි බවට පැමිණෙන්නාහුය. මහණෙනි, මේ සතරවන (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.)

**7.** "මතු කාලයෙහි භික්ෂූහු වන්නාහුය ආරාමිකයන්ය. සමනුද්දෙශය යන මොවුන් හා එක්වූවාහු වාසය කරන්නාහුය. මහණෙනි, ආරාමිකයන්ය, සමනුද්දෙශය යන මොවුන් හා එක්ව වාසය කිරීම ඇතිකල්හි වනාහි මෙය කැමති විය යුතුයි. අනෙකප්‍රකාරවූ රැස්කොටතබා පරිභොග කිරීමෙහි යෙදුනාහු වාසය කෙරෙත්. පොළොවෙහිද නිල්තණ ඇති තැනද මහත් වූද, නිමිත්ත කරන්නාහුය. මහණෙනි, මේ පස්වන (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.)

**8.** (මේ ඡෙදය මේ සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

---

## 9. ථෙර වර්ගය

**31. රජනීය සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ස්ථවිර භික්ෂුතෙම බ්‍රහ්මචාරීන්ට අප්‍රියයෙක්ද, අමනාපවූවෙක්ද, ගරු නොකටයුත්තෙක්ද, බුහුමන් නොකටයුත්තෙක්ද වේ.

**2.** "කවර පසකින්ද යත්, ඇළුම් කටයුතු අරමුණෙහි ඇලේද, දූෂ්‍ය කටයුත්තෙහි දූෂ්‍යවේද, මුළා වියයුත්තෙහි මුළා වේද, කිපිය යුත්තෙහි කිපේද, මත් විය යුත්තෙහි මත් වේද යන මේ

පසිනි.

3. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

4. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ස්ථවිර භික්ෂු තෙම බ්‍රහ්මචාරීන්ට ප්‍රියවූවෙක්ද, මනාපවූවෙක්ද, ගරු කටයුත්තෙක්ද, බුහුමන් කටයුත්තෙක්ද වේ.

5. "කවර පසකින්දයත්? ඇළුම් කටයුතු අරමුණෙහි නොඇලේද, දූෂ්‍ය කටයුත්තෙහි දූෂ්‍ය නොවේද, මුළාවිය යුත්තෙහි මුළානොවේද කිපිය යුත්තෙහි නොකිපේද, මත්විය යුත්තෙහි මත්නොවේද, යන පසිනි.

6. (මේ ඡේදය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි.)

32. **අවීතරාග සූත්‍රය**:- 1. (මේ වර්ගයේ 5 සූත්‍රය දක්වා සූත්‍රවල 1, 3, 4, 6 ඡේද මේ වර්ගයේ 1 සූත්‍රයේ 1, 3, 4, 6 ඡේදය මෙන් වෙත්)

2. "කවර පසකින්දයත්? පහනොවූ රාග ඇත්තේවේද, පහනොවූ ද්වෙෂ ඇත්තේවේද, පහනොවූ මොහ ඇත්තේ වේද, ගුණමකුවූයේවේද, යුගග්‍රාහ ඇත්තේවේද යන පසිනි.

5. "කවර පසකින්දයත්, පහවූ රාග ඇත්තේවේද, පහවූ ද්වෙෂ ඇත්තේවේද, පහවූ මොහ ඇත්තේවේද, ගුණමකු වූයේ නොවේද, යුගග්‍රාහ ඇත්තේ නොවේද, යන පසිනි.

33. **කුහකත්ථෙර සූත්‍රය**:- 2. "කවර පසකින්ද යත්, කුහණ වස්තු තුනෙන් යුක්තවූයෙක් වේද ලාභය පිණිස කරණ කථාවෙන් යුක්තවූයෙක් වේද, නිමිති කරන්නෙක් වේද, පණිවිඩකීමෙහි යුක්තවූවෙක් වේද, ලාභයෙන් ලාභය සෙවීමෙහි යුක්තවූවෙක් වේද, යන පසිනි.

5. කවර පසෙකින්ද යත්. කුහකකම් වලින් යුක්ත නොවේද, ලාභය සඳහා කථාකරන්නෙක් නොවේද, නිමිති කරන්නෙක් නොවේද, පණිවිඩපනත් කරන්නෙක් නොවේද, ලාභයෙන් ලාභය සෙවීම ඇත්තෙක් නොවේද යන පසිනි.

34. **අස්සද්ධත්ථෙර සූත්‍රය**:- 2. "කවර පසකින්ද යත්, ශ්‍රද්ධාව නැත්තේවේද, පවට ලජ්ජා නැත්තේවේද, පවට භය

නැත්තේවේද, අලසවූයේ වේද, ප්‍රඥා නැත්තේවේද, යන පසිනි.

5. "කවර පසකින්දයත්? ශ්‍රද්ධාව ඇත්තේවේද, පවට ලජ්ජා ඇත්තේවේද, පවට භය ඇත්තේවේද, පටන්ගන්නා ලද වීර්යය ඇත්තේවේද, යන පසිනි.

**35. අක්ඛමත්ථෙර සූත්‍රයඃ-** 2. "කවර පසකින්දයත්? රූපයන් නොඉවසන්නේ වේද, ශබ්දයන් නොඉවසන්නේවේද, ගන්ධයන් නොඉවසන්නේ වේද, රසයන් නොඉවසන්නේවේද, ස්පර්ශ කළ යුත්තන් නොඉවසන්නේ වේද, යන පසිනි.

5. "කවර පසකින්දයත්? රූපයන් ඉවසන්නේවේද, ශබ්දයන් ඉවසන්නේවේද, ගන්ධයන් ඉවසන්නේවේද, රසයන් ඉවසන්නේ වේද, ස්පර්ශ කළයුත්තන් ඉවසන්නේ වේද, යන පසිනි.

**36. පටිසම්භිදාප්පත්ත සූත්‍රයඃ-** 1. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 4 ඡේදය මෙනි.)

2. "කවර පසකින්දයත්? අර්ථ ප්‍රතිසම්භිදාවට පැමිණියේ වේද, ධර්ම ප්‍රතිසම්භිදාවට පැමිණියේවේද, නිරුක්ති ප්‍රතිසම්භිදාවට පැමිණියේවේද, ප්‍රතිභාණ ප්‍රතිසම්භිදාවට පැමිණියේවේද, යම් ඒ සබ්‍රම්සරුන්ගේ කුදුමහත් පිළිවිස කටයුතු වෙද්ද, එහි දක්ෂයෙක් අලස නුවූවෙක් වේද, එහි උපායවූ විමසන නුවණින් යුක්තවූයේ කරන්ට සුදුස්සෙක් සංවිධාන කරන්ට සුදුස්සෙක්වේද, යන මේ පසිනි.

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 6 ඡේදය මෙනි.)

**37. සීලවන්තත්ථෙර සූත්‍රයඃ-** 1. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 4 ඡේදය මෙනි.)

2. "කවර පසකින්ද යත්. සිල්වත් වූයේ ප්‍රාතිමොක්ෂ සංවරයෙන් යුක්තවූයේ වේද,

3. "ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූයේ ස්වල්ප තරම් වරදවල භය දක්නා ති ඇතුව වාසය කෙරේද,

4. "ශික්ෂාපදයන්හි සමාදන්ව හික්මේද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

5. "බහුශ්‍රැතවූයේ ඇසූදෙය දරන්නේ අසනලද්දවුන්ගේ රැස් කිරීම ඇත්තේවේද,

6. "මුල යහපත්වූ මැද යහපත්වූ, කෙළවර යහපත්වූ අර්ථ සහිතවූ, ව්‍යඤ්ජන සහිතවූ යම් ඒ ධර්මයෝ සියල්ලෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කරද්ද, එබඳු ධර්මයෝ මොහු විසින් බොහෝකොට අසන ලද්දාහු සිතින් දරණ ලද්දාහු වචනයෙන් පුරුදු කරණ ලද්දාහු සිතින් සළකා බලන ලද්දාහු, දෘෂ්ටියෙන් නොව අවබොධ කරණ ලද්දාහු වෙද්ද,

7. "යහපත් වචන ඇත්තේ යහපත් කථා කිරීම ඇත්තේ වේද, මනොඥවූ, කෙලතොලු නුවූ අර්ථය හැඟවීම ඇත්තාවූ පුරවැසි වචනයෙන් යුක්තවූයේ වේද, කුශල් සිත සම්බන්ධවූ මේ ආත්මයෙහි සැප විහරණ ඇත්තාවූ චතුර්විධ ධ්‍යානයන්ගේ කැමති පරිදි ලැබීම ඇත්තෙක් නිදුකින් ලැබීම ඇත්තෙක් පහසුවෙන් ලැබීම ඇත්තෙක්වේද, ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ චිත්තවිමුක්තියටද ප්‍රඥා විමුක්තියටද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කෙරේද යන පසිනි.

8. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 6 ඡේදය මෙනි.)

38. **අහිතපටිපන්න සූත්‍රය:-** 1 "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ස්ථවිර භික්ෂුතෙම බොහෝ දෙනාට අහිත පිණිස, බොහෝදෙනාට නොසැප පිණිස, බොහෝදෙනාට අවැඩ පිණිස, දෙව්මිනිසුන්ට අහිත පිණිස, දුක් පිණිස පිළිපන්නේ වේ.

2. "කවර පසකින්ද යත්? ස්ථවිරතෙම බොහෝ කල් දන්නේ පැවිදිවූ බොහෝ කල් ඇත්තේ වේද,

3. "ප්‍රකටවූයේ යස පිරිවර ඇත්තේ ගෘහස්ත ප්‍රව්‍රජිතයන්ගෙන් බොහෝ දෙනා පිරිවරකොට ඇත්තේද,

4. "චීවරය, පිණ්ඩපාතය, ශයනාසනය, ගිලන්පස, බෙහෙත් පිරිකර යන මොවුන් සම්බන්ධ ලැබීම ඇත්තෙක් වේද,

5, 6. (මේ ඡේද මේ පණ්ණාසකයේ 37 සූත්‍රයේ 5, 6 ඡේද

මෙන් වෙත්.)

7. "පෙරලුනාවූ දැකුම් ඇති මිථ්‍යාදෘෂ්ටිකයෙක් වේද හෙතෙම බොහෝදෙනා සද්ධර්මයෙන් නැගිටුවා, අසද්ධර්මයෙහි පිහිටුවාද ස්ථවිර භික්ෂුතෙම චිරකල් දන්නේ පැවිදිවූ බොහෝ කල් ඇත්තේයයිද මොහුගේ දෘෂ්ටානුගතියට පැමිණෙත්. ප්‍රකටවූ ස්ථවිර භික්ෂුතෙම යශස් ඇත්තේ ගෘහස්ථ ප්‍රව්‍රජිතයන්ගෙන් බොහෝදෙනා පිරිවරකොට ඇත්තේයයිද මොහුගේ දෘෂ්ටානු ගතියට පැමිණෙත්. ස්ථවිර භික්ෂුතෙම චීවරය පිණ්ඩපාතය ශයනාසනය ගිලන්පස බෙහෙත් පිරිකර යන මොවුන් සම්බන්ධව ලැබීම ඇත්තේ යයිද මොහුගේ දෘෂ්ටානුගතියට පැමිණෙත්. ස්ථවිර භික්ෂු තෙම බහුශ්‍රැතවූයේ ඇසූ දෙය දරන්නේ අසන ලද්දවුන්ගේ රැස්කිරීම ඇත්තේයයිද මොහුගේ දෘෂ්ටානුගතියට පැමිණෙත් යන මේ පසිනි.

8. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

9. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ස්ථවිර භික්ෂු තෙම බොහෝදෙනාට හිත පිණිස බොහෝදෙනාට සැප පිණිස බොහෝදෙනාට වැඩ පිණිස, දෙව් මිනිසුන්ට හිත පිණිස සැප පිණිස පිළිපන්නේ වේ.

10. "කවර පසකින්ද යත්? ස්ථවිරතෙම චිරරාත්‍රඥ වූයේ පැවිදිවූ බොහෝ කල් ඇත්තේ වේද, ප්‍රකටවූයේ යශස් ඇත්තේ ගෘහස්ත ප්‍රව්‍රජිතයන්ගෙන් බොහෝදෙනා පිරිවර කොට ඇත්තේ වේද, චීවරය පිණ්ඩපාතය ශයනාසනය ගිලන්පස බෙහෙත් පිරිකර යන මොවුන් සම්බන්ධව ලැබීම් ඇත්තේ වේද, (මෙහි මේ පණ්ණාසකයේ 37 සූත්‍රයේ 5, 6 ඡේද යෙදිය යුතුයි.)

නොපෙරළුනාවූ දැකුම් ඇති සම්‍යක් දෘෂ්ටි ඇත්තෙක් වේද, හෙතෙම බොහෝදෙන අසද්ධර්මයෙන් නගාසිටුවා සද්ධර්මයෙහි පිහිටුවයි. ස්ථවිර භික්ෂුතෙම චිරරාත්‍රඥ වූයේ පැවිදිවූ බොහෝ කල් ඇත්තේයයිද මොහුගේ දෘෂ්ටානුගතියට පැමිණෙත්. ප්‍රකටවූ ස්ථවිර භික්ෂුතෙම යශස් ඇත්තේ ගෘහස්ත

ප්‍රව්‍රජිතයන්ගෙන් බොහෝදෙනෙක් පිරිවරකොට ඇත්තේයයිද මොහුගේ දෘෂ්ටානුගතියට පැමිණෙත්. ස්ථවිර භික්ෂුතෙම (මේ සූත්‍රයේ 7 ඡෙදයේ "චීවර' යන තැන සිට 'මොවුන් සම්බන්ධව' යන තැන දක්වා යොදන්න.) ලාභ ඇත්තේයයිද, බහුශ්‍රැතවූයේ ඇසූ දෙය දරන්නේ අසන ලද්දවුන්ගේ රැස්කිරීම ඇත්තේයයිද මොහුගේ දෘෂ්ටානුගතියට පැමිණෙත් යන පසිනි.

11. (මේ ඡෙදය මේ සූත්‍රයේ 9 ඡෙදය මෙනි)

**39. පඨම සෙඛභික්ඛු සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ ධර්ම පස ශෛක්ෂ භික්ෂුහුගේ පිරිහීම පිණිස පවතිත්.

2. "කවර පසක්ද යත්, නවකර්මාන්තයන්හි ඇළුනු බවය. කථා බස් කිරීමෙහි ඇළුනු බවය, නිදාගැණීමෙහි ඇළුනු බවය, සමූහයා සමග එක්වීමෙහි ඇළුණු බවය. මිදුනු පරිදි සිත ප්‍රත්‍යවේක්ෂා නොකිරීමය යන මේ පසයි.

3. (මේ ඡෙදය මේ සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

4. "මහණෙනි, මේ කරුණු පසක් ශෛක්ෂ භික්ෂුහුගේ නොපිරිහීම පිණිස පවතිත්.

5. "කවර පසක්ද යත්? කර්මාන්තයන්හි නොඇළුනු බවය, කථාබස් කිරීමෙහි ඇළුනු නැති බවය, නිදා ගැන්මෙහි ඇල්ම නැති බවය. සමූහයා හා එක්ව වාසයකිරීමෙහි ඇළුනු නැති බවය. මිදුනාවූ පරිදි සිත ප්‍රත්‍යවේක්ෂා කිරීමය යන මේ පසයි.

6. (මේ ඡෙදය මේ සූත්‍රයේ 4 ඡෙදය මෙනි.)

**40. දුතිය සෙඛභික්ඛු සූත්‍රයඃ-** 1 (මේ ඡෙදය මේ පණ්ණාසකයේ 39 සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

2. "කවර පසක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි ශෛක්ෂ භික්ෂුතෙම බොහෝ කෘත්‍ය ඇත්තේ බොහෝ කටයුතු ඇත්තේ පිළිවිස කරණ කටයුතුවල දක්ෂයෙක් වේද, විවේකය හිස් කෙරේද, තමා පිළිබඳ සමාධි කර්මස්ථානයෙහි නොයෙදේද, මහණෙනි, මේ පළමුවන ධර්මය තෙම,

3. "ශෛක්ෂ භික්ෂූහුගේ පිරිහීම පිණිස පවතියි. මහණෙනි, නැවත අනිකක්ද කියමි.

4. "ශෛක්ෂ භික්ෂුතෙම ස්වල්ප තරම්වූ කර්මයකින් දවස ඉක්මවාද විවේකය හිස් කෙරේද, තමා පිළිබඳ සමාධි කර්මස්ථානහි නොයෙදේද, මහණෙනි, මේ දෙවෙනි කාරණය තෙම (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

5. "ශෛක්ෂ භික්ෂුතෙම ගෘහස්ත ප්‍රව්‍රජිතයන් හා එක්වූයේ නුසුදුසුවූ ගිහියන් හා එක්වීම ඇතිව වාසයකෙරේද, විවේකය හිස් කෙරේද, තමන් පිළිබඳ සමාධි කර්මස්ථානයෙහි නොයෙදේද, මහණෙනි, මේ තුන්වන කාරණය තෙම (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

6. "ශෛක්ෂ භික්ෂුතෙම ඉතා කලින් ගමට පිවිසේද ඉතා දවල් පෙරලා ඒද විවේකය හිස් කෙරේද, තමන් පිළිබඳ සමාධි කර්මස්ථානයෙහි නොයෙදේද, මහණෙනි, මේ සතර වන කාරණය තෙම (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

7. "ශෛක්ෂ භික්ෂුතෙම අතිශයින්ම කෙලෙස් ලියන්නාවූ සමථ විදර්ශනාවන්ට හිතවූ යම් මේ කථාවක් වේද, එනම් අල්පෙච්ඡතා පිළිබඳ කථාවය, සන්තුෂ්ටිය පිළිබඳ කථාවය, ප්‍රකර්ෂ විවේකය පිළිබඳ කථාවය, සංසර්ග නොවීම පිළිබඳ කථාවය, වීර්යාරම්භය පිළිබඳ කථාවය, ශීලය පිළිබඳ කථාවය, සමාධිය පිළිබඳ කථාවය, ප්‍රඥාව පිළිබඳ කථාවය, විමුක්තිය පිළිබඳ කථාවය, විමුක්ති ඥානදර්ශන පිළිබඳ කථාවය යන මොහුයි. මෙබඳු කථාව පිළිබඳව කැමති පරිදි ලැබීම ඇත්තෙක් නොවේද, දුකසේ ලැබීම ඇත්තෙක් වේද, අපහසුවෙන් ලැබීම ඇත්තෙක් වේද, විවේකය හිස් කෙරේද, තමන් පිළිබඳ සමාධි කර්මස්ථානයෙහි නොයෙදේද, මහණෙනි, මේ පස්වන කාරණයතෙම ශෛක්ෂ භික්ෂූහුගේ පිරිහීම පිණිස පවතියි.

8-9. (මේ ඡේද මේ පණ්ණාසකයේ 39 සූත්‍රයේ 1-4 ඡේද මෙන් වෙත්.)

10. "කවර පසක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි

ශෛක්ෂ භික්ෂු තෙම බොහෝ කෘත්‍ය ඇත්තෙක් නොවේද, බොහෝ කටයුතු ඇත්තෙක් පිළිවිස කරණ කටයුතුවල දක්ෂයෙක් නොවේද, විවේකය හිස් නොකෙරේද, තමන් පිළිබඳ සමාධි කර්මස්ථානයෙහි යෙදේද, මහණෙනි, මේ පළමු වෙනි කාරණය

11. "ශෛක්ෂ භික්ෂුහුගේ නොපිරිහීම පිණිස පවති. "මහණෙනි, නැවත අනිකක්ද කියමි

12. "ශෛක්ෂ භික්ෂුතෙම ස්වල්ප තරම්වූ කර්මයකින් දවස නොඉක්මවාද, විවේකය හිස් නොකෙරේද, තමන් පිළිබඳ සමාධි කර්මස්ථානයෙහි යෙදේද, මහණෙනි, මේ දෙවන කාරණය (මෙහි මේ සූත්‍රයේ 11 ඡේදය යෙදිය යුතුයි.)

13. "ශෛක්ෂ භික්ෂුතෙම ගෘහස්ත ප්‍රව්‍රජිතයන් හා නුසුදුසු ගිහි සංසර්ගයෙන් නොගැවසුනේ වාසය කෙරේද විවේකය හිස් නොකෙරේද, තමන් පිළිබඳ සමාධි කර්මස්ථානයෙහි යෙදේද, මහණෙනි, මේ තුන්වන කාරණය (මෙහි මේ සූත්‍රයේ 11 ඡේදය යෙදිය යුතුයි.)

14. "ශෛක්ෂ භික්ෂුතෙම ඉතා කලින් ගමට නොපිවිසේද, ඉතා දහවල් පෙරලා නොයේද, විවේකය හිස් නොකෙරේද, තමන් පිළිබඳ සමාධිකර්මස්ථානයෙහි යෙදේද මහණෙනි, මේ සතරවන කාරණය, (මෙහි මේ සූත්‍රයේ 11 ඡේදය යෙදිය යුතුයි.)

15. "ශෛක්ෂ භික්ෂුතෙම අතිශයින් කෙලෙස් ලියන්නාවූ චිත්ත විවරණ නම් සමථවිදර්ශනාවන්ට හිතවූ යම් මේ කථාවක් වේද, එනම් අල්පෙච්ඡ බව පිළිබඳ කථාය, සතුටු බව පිළිබඳ කථාය, ප්‍රකර්ෂ විවේකය පිළිබඳ කථාය, සංසර්ග නොවීම පිළිබඳ කථාය. වීර්යාරම්භය පිළිබඳ කථාය, සීල කථාය, සමාධි කථාය, ප්‍රඥා කථාය, විමුක්ති කථාය, විමුක්ති ඥානදර්ශන කථාය යන මෙබඳු කථාවගේ කැමති පරිදි ලැබීම ඇත්තෙක් නිදුකින් ලැබීම ඇත්තෙක් බහුලව ලැබීම ඇත්තෙක් වේද, විවේකය හිස් නොකෙරේද, තමන් පිළිබඳ සමාධි කර්මස්ථානයෙහි යෙදේද, මහණෙනි, මේ පස්වන කාරණය ශෛක්ෂ භික්ෂුහුගේ

නොපිරිහීම පිණිස පවතියි.

**16.** (මේ ඡේදය මේ පණ්ණාසකයේ 39 සූත්‍රයේ 4 ඡේදය මෙනි)

---

## 10 කකුධ වර්ගය.

**41. පඨම පඤ්ච සම්පදා සූත්‍රය:-** 1. "මහණෙනි, මේ සම්පත් පසක් වෙත්. කවර පසක්ද යත්? ශ්‍රද්ධා සම්පත්තිය, ශීල සම්පත්තිය, ශ්‍රැත සම්පත්තිය, ත්‍යාග සම්පත්තිය, ප්‍රඥා සම්පත්තිය යන පසයි. මහණෙනි, මොහු වනාහි සම්පත් පස වෙත්යයි" වදාළේය.

**42. දුතිය පඤ්ච සම්පදා සූත්‍රය:-** "මහණෙනි, මේ සම්පත් පසක් වෙත්. කවර පසක්ද යත්? ශීල සම්පත්තිය, සමාධි සම්පත්තිය, ප්‍රඥා සම්පත්තිය, විමුක්ති සම්පත්තිය, විමුක්ති ඥාන දර්ශන සම්පත්තිය යන පසයි. මහණෙනි, මොහු වනාහි සම්පත් පස වෙත්යයි" වදාළේය.

**43. අඤ්ඤාව්‍යාකරණ සූත්‍රය:-** "මහණෙනි, මේ රහත් බැව් ප්‍රකාශ කිරීම් පසක් වෙත්. කවර පසක්ද යත්? නුවණ මඳ බැවින් මුළා බැවින් අර්හත්වය ප්‍රකාශ කරයි. ලාමක ආසා ඇත්තේ ආශාව ස්වභාවකොට ඇත්තේ අර්හත්වය ප්‍රකාශ කරයි. උමතු බැවින් සිත් පෙරලීමෙන් රහත්බව ප්‍රකාශ කරයි. අධිකවූ මානයෙන් රහත්බව ප්‍රකාශ කරයි. මනාකොටම රහත් බව ප්‍රකාශ කරයි යන පසයි. මහණෙනි, මොහු වනාහි රහත් බැව් ප්‍රකාශ කිරීම් පස වෙත්යයි" වදාළේය.

**44. ඵාසු විහාර සූත්‍රය:-** "මහණෙනි, මේ පහසු විහරණ පසක් වෙත්. කවර පසක්ද යත්? (මෙහි අංගුත්තර නිකායේ තිකනිපාතයේ 6 වර්ගයේ 8 සූත්‍රයේ 3 (iii) ඡේදයේ "මේ ශාසනයෙහි" කී තැන සිට යොදාගත යුතුයි) ආශ්‍රවයන් නැසීමෙන් ආශ්‍රව රහිතවූ චිත්ත විමුක්තියටද ප්‍රඥා විමුක්තියටද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන

ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරයි යන මේ පසයි. මහණෙනි, මොහු වනාහි පහසු විහරණ පස වෙත්යයි වදාළේය."

**45. අකුප්පපටිවිජ්ඣාන සූත්‍රයः**- 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම නොබෝ කලකින්ම අර්හත්වය ප්‍රතිවේධ කරයි.

**2.** "කවර පසකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම අර්ථ ප්‍රතිසම්භිදාවට පැමිණියේ වේද, ධර්ම ප්‍රතිසම්භිදාවට පැමිණියේ වේද, නිරුක්ති ප්‍රතිසම්භිදාවට පැමිණියේ වේද, ප්‍රතිභාණ ප්‍රතිසම්භිදාවට පැමිණියේ වේද, මිදුනු පරිදි සිත ප්‍රත්‍යවෙක්ෂා කෙරේද යන පසිනි.

**3.** (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි)

**46. සුතසන්නිචය සූත්‍රයः**- 1 "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම ආනාපාන සතිය සේවනය කරන්නේ නොබෝ කලකින්ම අර්හත්වය ප්‍රතිවේධ කරයි.

**2.** "කවර පසකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම මද සමාරම්භ ඇත්තේ, ස්වල්ප කටයුතු ඇත්තේ පොෂ්‍ය කිරීමට පහසුවූයේ ජීවිත සම්භාරයන්හි මනා සන්තොෂ ඇත්තේ වේද, මඳ ආහාර ඇත්තේ, අනෝදරික භාවයෙහි යෙදුනේ වේද, ස්වල්පවූ නිද්‍රා ඇත්තේ නිදිවර්ජිත කිරීමෙහි යෙදුනේ වේද,

**3.** (මෙහි මේ පණ්ණාසකයේ 37 සූත්‍රයේ 5, 6 ඡේද යෙදිය යුතුයි.)

**4.** (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

**47. දසකථාලාභි සූත්‍රයः**- 1-4 (මේ ඡේද මේ පණ්ණාසකයේ 46 සූත්‍රයේ 1, 4 ඡේද මෙන් වෙත්.)

**2.** (මේ ඡේදය මේ පණ්ණාසකයේ 46 සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

**3.** "භික්ෂුතෙම අතිශයින් (මේ වර්ගයේ 40 සූත්‍රයේ 15 ඡේදය යෙදිය යුතුයි.) මිදුනු පරිදි සිත ප්‍රත්‍යවේක්ෂා කෙරේද යන පසිනි.

**48. පන්තසේනාසනික සූත්‍රය:-** 1 "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම ආනාපානසතිය බහුල වශයෙන් කරන්නේ නොබෝ කලකින්ම අර්හත්වය ප්‍රතිවේධ කෙරේ.

2. (මේ ඡේදය මේ පණ්ණාසකයේ 46 සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

3. "ආරණ්‍යයක වූයේ ඉතා දුර වනසෙනසුන් ඇත්තේ වේද මිදුනු පරිදි සිත ප්‍රත්‍යවෙක්ෂා කෙරේද, යන පසිනි. මහණෙනි,

4. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

**49. සීහොපම තථාගත සූත්‍රය:-** 1. (මෙහි චතුක්ක නිපාතයේ 4 වර්ගයේ 33 සූත්‍රයේ 1 ඡේදයේ 'සිංහනාද කරයි යන තැන දක්වා යොදා ගත යුතුයි) තුන් වරක් සිංහනාද පවත්වා ගොදුරු පිණිස බැහැර යයි. හෙතෙම ඉදින් ඇතෙකුටද පහර දේනම් සකස් කොටම පහර දෙයි. නොසකස්කොට පහර නොදෙයි. ඉදින් මීමෙකුටද පහර දේනම් සකස්කොටම පහරදෙයි. නොසකස්කොට පහර නොදෙයි. ගවයෙකුටද පහර දේනම් සකස්කොටම පහරදෙයි. නොසකස්කොට පහර නොදෙයි. ඉදින් දිවියෙකුටද පහරදේනම් ඒ සකස්කොටම පහර දෙයි. නොසකස්කොට පහර නොදෙයි. ඉදින් කුඩාවූද සතුන්ට පහර දේනම් යටත්පිරිසෙයින් සාවුන්ට බළලුන්ටද සකස්කොටම පහරදෙයි, නොසකස්කොට පහර නොදෙයි. ඊට හේතු කවරේද?

2. "මාගේ යොග්‍ය පථය හෙවත් කරණ ලද උපක්‍රමය නොනසීවායි මහණෙනි, සිංහයායයි කියා අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේට මේ නමකි. මහණෙනි, තථාගත තෙම පිරිසට යම් ධර්මයක් වනාහි දෙශනා කෙරේද, මෙය මොහුගේ සිංහ නාදය නම් වේ. මහණෙනි, ඉදින් භික්ෂූන්ටද,

3. "තථාගත තෙම ධර්මය දෙශනා කෙරේනම් සකස් කොටම තථාගත තෙම ධර්මය දෙශනා කෙරේ. නොසකස් කොට දෙශනා නොකෙරෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "මහණෙනි, ඉදින් භික්ෂුණීන්ටද, (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) ඉදින් උපාසකවරුන්ටද (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, ඉදින් උපාසිකාවන්ටද (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි ඉදින් පෘථග්ජනයන්ටද තථාගත තෙම ධර්මය දෙශනා කෙරේනම් යටත්පිරිසෙයින් අන්නභාර නෙසාදයන්ටද තණ කපනවුන්ට හා ලිහිණිවැද්දන්ටද (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) ඊට හේතු කවරේද? මහණෙනි තථාගත තෙම ධර්මය ගරු කරන්නෙක් ධර්මය කෙරෙහි ගෞරව ඇත්තෙක් වේයයි" වදාළේය.

**50. කකුධ කොලියපුත්ත සූත්‍රය:-** 1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර ඝෝෂිතාරාමයෙහි වැඩ වසනසේක. එකල්හි වනාහි ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේගේ උපස්ථායකයෙක්වූ කකුධ නම් කොලිය පුත්‍රතෙම නොබෝ කල්හි කළුරිය කරණ ලද්දේ,

2. "එක්තරා මනොමය දිව්‍ය කොටසක උපන්නේ වේ. ඔහුගේ මෙබඳු ආත්මභාව ප්‍රතිලාභයක්වේ. යම්සේ නම් මගධ දෙශයෙහිවූ ග්‍රාම ක්ෂෙත්‍ර දෙකක් හෝ තුනක් හෝ වෙද්ද, එමෙනි. හෙතෙම ඒ ආත්මභාව ප්‍රතිලාභයෙන් තමන් නොපෙළයි. අනිකෙකුටද නොපෙළයි.

3. "ඉක්බිති කකුධ නම් දිව්‍යපුත්‍රතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට වැඳ එකත්පස්ව සිටියේය. එකත්පස්ව සිටියාවූම කකුධ නම් දිව්‍යපුත්‍රතෙම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට මෙය සැළකෙළේය.

4. "ස්වාමීනි, දෙවදත්ත ස්ථවිරයන්ට මෙබඳු කැමැත්තක් උපන්නේය. 'මම භික්ෂුසංඝයා පරිහරණය කරන්නෙමි' ස්වාමීනි, සිත පහළවීම සමගම දෙවදත්තතෙම ඒ ඍර්ධියෙන් පිරිහුනේයයි" කකුධ නම් දිව්‍යපුත්‍රතෙම මෙය සැළකෙළේය.

5. "මෙය සැළකොට ආයුෂ්මත් මහා මොග්ගල්ලාන

ස්ථවිරයන්ට වැඳ ප්‍රදක්ෂිණාකොට එතැන්හිම අන්තර්ධාන වූයේය. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන්නාවූම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය.

**6.** "ස්වාමීනි, මාගේ උපස්ථායකයෙක්වූ කකුධ නම් කොළිය පුත්‍රතෙම ලඟදී කළුරිය කෙළේය. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

**7.** "ස්වාමීනි, ඉක්බිති කකුධ නම් දෙවපුත්‍රතෙම මා යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, මට වැඳ එකත්පස්ව සිටියේය. ස්වාමීනි, එකත්පස්ව සිටියාවූම කකුධ නම් දිව්‍යපුත්‍රතෙම මට මෙය සැළකෙළේය.

(මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.) මෙය සැළකොට මට වැඳ ප්‍රදක්ෂිණාකොට එතැන්හිම අන්තර්ධාන වූයේය."

**8.** "මොග්ගල්ලානයෙනි, කිමෙක්ද? තොප විසින් කකුධ නම් දෙවපුත්‍රතෙම සිතින් සිත පිරිසිඳ දැනගන්නා ලද්දේද? කකුධ නම් දෙවපුත්‍රතෙම යම් කිසිවක් කියාද, ඒ සියල්ල එසේමවේද, නොහොත් අන්පරිද්දකින් වේද්ද?"

"ස්වාමීනි, මා විසින් කකුධ නම් දෙවපුත්‍රතෙම සිතින් සිත පිරිසිඳ දැනගන්නා ලද්දේය. කකුධ නම් දෙවපුත්‍රතෙම යම් කිසිවක් කියාද, ඒ සියල්ල එසේම වේ. නොහොත් අන් පරිද්දකින් නොවේය.

"මොග්ගල්ලානය, මේ වචනය ආරක්ෂා කරව, දැන් ඒ හිස් පුරුෂතෙම තෙමේම තමා පහළකරන්නේයයි වදාළේය.

**9.** "මොග්ගල්ලායනයෙනි, මේ ශාස්තෘවරු පස්දෙනෙක් ඇත්තාහු ලොකයෙහි විද්‍යමාන වෙත්

**10.** "කවර පස්දෙනෙක්දයත්?

11. "මොග්ගල්ලානය, මේ ලොකයෙහි ඇතැම් ශාස්තෲවරයෙක් පිරිසිදු නොවූ සිල් ඇත්තේම පිරිසුදු වූ සිල් ඇත්තේ වෙමියි, ප්‍රතිඥා කෙරෙයි. මාගේ ශීලය පිරිසිදුය නිර්මලය නොකිලිටුය කියායි. ශ්‍රාවකයෝ ඔහු මෙසේ දනිත්. මේ පින්වත් ශාස්තෘ තෙම වනාහි අපිරිසිදු සිල් ඇත්තේම පිරිසිදු සිල් ඇත්තේ වෙමියි ප්‍රතිඥා කරයි. 'මාගේ ශීලය පිරිසිදුය. නිර්මලය, නො කිළුටුය' කියායි.

12. "අපිදු වනාහි ගිහීන්ට සැළකරන්නෙමු නම් මොහුට මනාපයක් නොවන්නේය. යමක් වනාහි මොහුට අමනාපද කෙසේ නම් අපි එයින් කියන්නෙමුද, චීවරය පිණ්ඩපාතය, ශයනාසනය, ගිලන්පස, බෙහෙත් පිරිකර යන මෙයින් බුහුමන් කෙරේමය යමක් මෙතෙම කරන්නේද, මෙතෙමේම එයින් ප්‍රකට වන්නේය.

13. "මොග්ගල්ලානය, මෙබඳුවූ ශාස්තෲවූ වනාහි ශ්‍රාවකයෝ ශීලයෙන් රක්ෂා කරත්. මෙබඳු ශාස්තෘ තෙමේද ශ්‍රාවකයන් විසින් ශීලයෙන් රක්ෂා කිරීම ප්‍රාර්ථනා කරයි.

14. "මොග්ගල්ලානය, නැවත අනිකක්ද කියමි. මේ ලෝකයෙහි ඇතැම් ශාස්තෲවරයෙක් අපිරිසිදුවූ ජීවිකාව ඇත්තේම පිරිසිදුවූ ජීවිකාව ඇත්තේ වෙමියි ප්‍රතිඥා කෙරෙයි. මාගේ ජීවිකාව පිරිසිදුය, නිර්මලය, නොකිලිටුය කියායි. ඔහු ශ්‍රාවකයෝ මෙසේ දනිත්. මේ පින්වත් ශාස්තෲතෙම වනාහි අපිරිසිදුවූ ජීවිකාව ඇත්තේම වෙමි. පිරිසිදුවූ ජීවිකාව ඇත්තේ වෙමියි ප්‍රතිඥා කරයි. මාගේ ජීවිකාව පිරිසිදුය, නිර්මලය, නොකිළුටුය' කියායි. (මෙහි මේ සූත්‍රයේ 12 ඡේදය යෙදිය යුතුයි.)

15. "මොග්ගල්ලානය, මෙබඳුවූ ශාස්තෲවූ වනාහි ශ්‍රාවකයෝ ජීවිකාවෙන් රක්ෂා කරත්. මෙබඳුවූ ශාස්තෘ තෙමේද වනාහි ශ්‍රාවකයන් විසින් ජීවිකාවෙන් රක්ෂාකිරීම බලාපොරොත්තු වෙයි.

16. "මොග්ගල්ලානය, නැවත අනිකක්ද කියමි. මේ ලෝකයෙහි ඇතැම් ශාස්තෲවරයෙක් අපිරිසිදුවූ ධර්ම දෙශනා ඇත්තේම, පිරිසිදුවූ ධර්මදෙශනා ඇත්තේ වෙමියි ප්‍රතිඥා කරයි. 'මාගේ ධර්ම දෙශනාව පිරිසිදුය, නිර්මලය, නොකිළුටුය' කියායි.

ඔහු ශ්‍රාවකයෝ මෙසේ දනිත්. මේ පින්වත් ශාස්තෘ තෙමේ වනාහි අපිරිසිදුවූ ධර්මදෙශනා ඇත්තේම පිරිසිදුවූ ධර්ම දෙශනා ඇත්තේ වෙමියි ප්‍රතිඥා කරයි. 'මාගේ ධර්ම දේශනාව පිරිසිදුය. නිර්මලය, නොකිළුටුය' කියායි. (මෙහි මේ සූත්‍රයේ 12 ඡේදය යෙදිය යුතුයි.)

**17.** "මොග්ගල්ලානය, මෙබඳු ශාස්තෘහු වනාහි ශ්‍රාවකයෝ ධර්ම දෙශනාවෙන් රක්ෂාකරත්. මෙබඳු ශාස්තෘ තෙමේද වනාහි ශ්‍රාවකයන් විසින් ධර්මදෙශනාවෙන් රක්ෂා කිරීම බලාපොරොත්තු වෙයි.

**18.** "මොග්ගල්ලානය, නැවත අනිකක්ද කියමි. මේ ලොකයෙහි ඇතැම් ශාස්තෘවරයෙක් අපිරිසිදුවූ ප්‍රකාශ කිරීම් ඇත්තේ වෙමියි ප්‍රතිඥාකෙරෙයි 'මාගේ ප්‍රකාශකිරීම පිරිසිදුය නිර්මලය, නොකිලුටුය' කියායි ඔහු ශ්‍රාවකයෝ මෙසේ දනිත්. මේ පින්වත් ශාස්තෘතෙමේ අපිරිසුදු ප්‍රකාශ ඇත්තේම පිරිසිදුවූ ප්‍රකාශ ඇත්තේ වෙමියි ප්‍රතිඥා කෙරෙයි. 'මාගේ ප්‍රකාශය පිරිසිදුය, නිර්මලය, නොකිලුටුය' කියායි. (මෙහි මේ සූත්‍රයේ 12 ඡෙදය යෙදිය යුතුයි.)

**19.** "මොග්ගල්ලානය, මෙබඳු ශාස්තෘහු වනාහි ශ්‍රාවකයෝ ප්‍රකාශ කිරීමෙන් රක්ෂා කරත්. මෙබඳුවූ ශාස්තෘ තෙමේද ශ්‍රාවකයන් විසින් ප්‍රකාශ කිරීමෙන් රක්ෂා කිරීම බලාපොරොත්තු වෙයි.

**20.** "මොග්ගල්ලානය, නැවත අනිකක්ද කියමි. මේ ලෝකයෙහි ඇතැම් ශාස්තෘවරයෙක් අපිරිසිදුවූ නුවණින් දැකීම් ඇත්තේම පිරිසිදුවූ නුවණින් දැකීම ඇත්තේ වෙමියි ප්‍රතිඥා කෙරෙයි. 'මාගේ නුවණින් දැකීම පිරිසිදුය. නිර්මලය, නොකිළුටුය' කියායි. ඔහු ශ්‍රාවකයෝ මෙසේ දනිත්. මේ පින්වත් ශාස්තෘ තෙමේ අපිරිසිදුවූ නුවණින් දැකුම් ඇත්තේම, පිරිසිදුවූ නුවණින් දැකුම් ඇත්තේ වෙමියි ප්‍රතිඥා කෙරෙයි' මාගේ නුවණින් දැක්ම පිරිසිදුය, නිර්මලය, නොකිළුටුය කියායි. (මෙහි මේ සූත්‍රයේ 12 ඡෙදය යෙදිය යුතුයි)

21. "මොග්ගල්ලානය, මෙබඳු ශාස්තෘහු වනාහි ශ්‍රාවකයෝ ඥාන දර්ශනයෙන් රක්ෂා කරත්. මෙබඳු ශාස්තෘ තෙමේද ශ්‍රාවකයන් විසින් ඥාන දර්ශනයෙන් රක්ෂා කිරීම බලාපොරොත්තු වෙයි.

22. (මේ ඡේදය මේ සූත්‍රයේ 9 ඡේදය මෙනි.)

23. "මොග්ගල්ලානය, මම වනාහි පිරිසිදුවූ සිල් ඇත්තේම පිරිසිදුවූ සිල් ඇත්තේ වෙමියි ප්‍රතිඥා කරමි. මාගේ ශීලය පිරිසුදුය, නිර්මලය, නොකිළුටුයයි මා ශ්‍රාවකයෝ ශීලයෙන් නොම රක්ෂා කෙරෙත්. මම ශ්‍රාවකයන් විසින් ශීලයෙන් රක්ෂා කිරීම නොම බලාපොරොත්තු වෙමි. පිරිසිදුවූ ජීවිකාව ඇත්තේම පිරිසිදුවූ ජීවිකාව ඇත්තේ වෙමියි ප්‍රතිඥා කරමි. මාගේ ජීවිකාව පිරිසිදුය, නිර්මලය, නොකිළුටුයයි මා ශ්‍රාවකයෝ ජීවිකාවෙන් නොම රක්ෂා කෙරෙත්. මමද ශ්‍රාවකයන් විසින් ජීවිකාවෙන් රක්ෂා කිරීම බලාපොරොත්තු නොවෙමි. පිරිසිදුවූ ධර්මදෙශනා ඇත්තේම පිරිසිදුවූ ධර්ම දෙශනා ඇත්තේ වෙමියි ප්‍රතිඥා කරමි. මාගේ ධර්ම දේශනාව පිරිසිදුය, නිර්මලය, නොකිළුටුයයි මා ශ්‍රාවකයෝ ධර්ම දෙශනාවෙන් නොම රක්ෂා කෙරෙත්. මමද ශ්‍රාවකයන් විසින් ධර්ම දෙශනාවෙන් රක්ෂා කිරීම බලාපොරොත්තු නොවෙමි. පිරිසිදුවූ ප්‍රකාශ ඇත්තේම පිරිසිදුවූ ප්‍රකාශ ඇත්තේ වෙමියි ප්‍රතිඥා කෙරෙමි. මාගේ ප්‍රකාශය පිරිසිදුය, නිර්මලය, නොකිළුටුයයි මා ශ්‍රාවකයෝ ප්‍රකාශ කිරීමෙන් නොම රක්ෂා කෙරෙත්, මමද ශ්‍රාවකයන් විසින් ප්‍රකාශ කිරීමෙන් රක්ෂා කිරීම බලාපොරොත්තු නොවෙමි. පිරිසිදුවූ ඥාන දර්ශනය ඇත්තේම පිරිසිදුවූ ඥාන දර්ශනය ඇත්තේ වෙමියි ප්‍රතිඥා කරමි. මාගේ ඥානදර්ශනය පිරිසිදුය. නිර්මලය, නොකිලුටුයයි, මා ශ්‍රාවකයෝ ඥානදර්ශනයෙන් නොම ආරක්ෂා කෙරෙත්. මමද ශ්‍රාවකයන් විසින් ඥාන දර්ශනයෙන් රක්ෂා කිරීම බලාපොරොත්තු නොවෙමියි" වදාළේය.

**(දෙවෙනි පණ්ණාසකය නිමි.)**

## තුන්වෙනි පණ්ණාසකය.

## 11. ඵාසු විහාර වර්ගය.

1. **වෙසාරජ්ජකරන ධම්ම සූත්‍රය:-** 1. "මහණෙනි, ශෛක්ෂයන්ගේ විශාරද භාවය ඇතිකරන්නාවූ මේ ධර්ම පසක් වෙත්.

2. "කවර පසක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු තෙම ශ්‍රද්ධාව ඇත්තේ වේද, සිල් ඇත්තේ වේද, බහුශ්‍රැත වේද, පටන්ගන්නා ලද වීර්ය ඇත්තේවේද, ප්‍රඥා ඇත්තේ වේද, මහණෙනි, ශ්‍රද්ධා නැත්තහුට වනාහි යම් දොම්නසක් වේද, ශ්‍රද්ධා ඇත්තහුට ඒ දොම්නස නොවෙයි.

3. "එහෙයින් මේ ධර්මයතෙම ශෛක්ෂයන්ගේ විශාරද භාවය ඇති කරන්නේ වෙයි.

4. "මහණෙනි, දුශ්ශීලයා හට යම් දොම්නසක් වේද, සිල්වත්හට ඒ දොම්නස් නොවෙයි. (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

5. "මහණෙනි, අල්ප ශ්‍රැතයාහට යම් දොම්නසක් වේද, බහුශ්‍රැතයාහට ඒ දොම්නස නොවේ. (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

6. "මහණෙනි, කුශීතයාහට යම් දොම්නසක් වේද, පටන් ගන්නා ලද වීර්ය ඇත්තාහට ඒ දොම්නස නොවේ. (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

7. "මහණෙනි, දුෂ්ප්‍රාඥයාහට යම් දොම්නසක් වේද, ප්‍රඥා ඇත්තහුට ඒ දොම්නස නොවේ. (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

8. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. **උස්සංකිත සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම ක්ෂීණාශ්‍රව වූයේද, ලාමක භික්ෂු යයි උසස් කොට සැක කරණ ලද්දේ හාත්පස සැක කරණ ලද්දේ වේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "කවර පසකින්ද යත්, මහණෙනි මේ ශාසනයෙහි භික්ෂුතෙම වෙශ්‍යාවන් හුන් තැන ගොදුරු කොට ඇත්තේ වේද, වැන්දඹු ස්ත්‍රීන් හුන් තැන් ගොදුරු කොට ඇත්තේ වේද, මහලු කුමරියන් හුන් තැන් ගොදුරු කොට ඇත්තේ හෝ වේද, නපුංසකයන් වසන තැන් ගොදුරු කොට ඇත්තේ හෝ වේද භික්ෂුණීන් වසන තැන් ගොදුරු කොට ඇත්තේ හෝ වේද යන පසිනි.

3. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි)

3. **මහාචොර සූත්‍රයඃ-** 1. "මහණෙනි, අංග පසකින් යුක්තවූ මහ සොරතෙම උමංද සිදියි, පැහැරීමද කරයි. එක් ගෙයක් පැහැර ගැණීමද කරයි. උවදුරු මං පැහැරීමෙහිද සිටියි.

2. "කවර පසකින්ද යත්, මහණෙනි, මේ ලෝකයෙහි මහා සොරතෙම,

3. "විසම ස්ථාන ඇසුරු කෙළේද, සැඟවෙන තැන් ඇසුරු කෙළේද, බලවතුන් ඇසුරු කෙළේද, සම්පත් දෙන්නේද, එකළාව හැසිරෙන්නේද වේ.

4. "මහණෙනි, කෙසේනම් මහ සොරතෙම විෂම තැන් ඇසුරු කෙළේවේද, මහණෙනි, මේ ලෝකයෙහි මහ සොරතෙම ගං හෝ වලින් යා නොහැකි තැන හෝ පර්වතයෙන් විෂම තැන හෝ ඇසුරු කෙළේවේද මහණෙනි, මෙසේ වනාහි මහ සොරතෙම විෂම තැන් ඇසුරු කෙළේවේ.

5. "මහණෙනි, කෙසේ නම් මහ සොරතෙම ගහණයන් ඇසුරු කෙළේවේද, මහණෙනි, මේ ලෝකයෙහි මහ සොරතෙම තණකොළ ලැහැබක් ගස් ලැහැබක් හෝ ගැඹුරුවූ වන ලැහැබක් හෝ ඇසුරු කෙළේවේද, මහණෙනි, මෙසේ වනාහි මහ සොරතෙම සැඟවෙන තැන් ඇසුරු කෙළේ වේ.

6. "මහණෙනි, කෙසේනම් මහ සොරතෙම බලවතුන් ඇසුරු කෙළේවේද? මහණෙනි, මේ ලෝකයෙහි මහ සොරතෙම,

"රජහු හෝ රජ මහ ඇමැතියකු හෝ ඇසුරු කෙළේවේද, ඔහුට මෙබඳු සිතක් වෙයි. 'ඉදින් මට කිසිවෙක් කිසිවක් කියන්නේ නම් මේ මාගේ රජහුගේ රජමහ ඇමතිවරු හෝ වසාගෙණ අර්ථය කියන්නාහුයයි' ඉදින් ඔහුට කිසිවෙක් කිසිවක් කීයේ නම් ඔහුගේ ඒ රජවරු හෝ රජමහ ඇමතිවරු හෝ වසාගෙණ අර්ථය කියත්.

7. "මහණෙනි, මෙසේ වනාහි මහ සොරතෙම බලවතුන් ඇසුරු කෙළේවේ.

"මහණෙනි, කෙසේ නම් මහ සොරතෙම සම්පත් දෙන්නේවේද, මහණෙනි, මේ ලෝකයෙහි මහ සොරතෙම ආඪ්‍යවූයේ මහත් ධනය ඇත්තේ, මහත් සම්පත් ඇත්තේ වේද, ඔහුට මෙබඳු සිතක් වෙයි.

"ඉදින් මට කිසිවෙක් කිසිවක් කියන්නේ නම් මෙයින් සම්පත්වලින් පිළිසඳර කරන්නෙමියි ඉදින් ඔහුට කිසිවෙක් කිසිවක් කීයේ නම්, එයින් සම්පත් දීමෙන් පිළිසඳර කරයි. මහණෙනි, මෙසේ වනාහි මහසොරතෙම සම්පත් දෙන්නේවේ.

8. "මහණෙනි, කෙසේනම් මහ සොරතෙම එකලාව හැසිරෙන්නේ වේද, මහණෙනි, මේ ලෝකයෙහි මහ සොරතෙම හුදකලාව අනුන් සතු බඩු ගැණීම් කරන්නේ වෙයි. ඊට හෙතු කවරේද? 'මාගේ රහස් මන්ත්‍රණයෝ පිටත්හි සම්භෙදයට නොපැමිණෙත්වායි' මහණෙනි, මෙසේ වනාහි මහ සොරතෙම එකළාව හැසිරෙන්නේ වේ.

9. (මේ ඡෙදය මේ සූත්‍රයේ 1 ඡෙදය මෙනි)

10. "මහණෙනි, මෙපරිද්දෙන්ම කරුණු පසකින් යුක්තවූ පව්ටු භික්ෂුතෙම සාරා දමනලද ගුණ ඇති නසනලද ආත්මය පරිහරණය කරයි. වරද සහිත වූයේද නුවණැත්තන්ගේ උපවාද සහිත වූයේද වෙයි. බොහෝවූ පව්ද රැස් කරයි.

11. "කවර පසකින්ද යත්, මහණෙනි, මේ ශාසනයෙහි පව්ටු භික්ෂුතෙම (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.)

12. "මහණෙනි, කෙසේනම් පවිටු භික්ෂුතෙම විෂම තැන් ඇසුරු කෙළේවේද, මහණෙනි, මේ ශාසනයෙහි පවිටු භික්ෂුතෙම විෂම වූ කාය කර්මයෙන් යුක්තවූයේ වේද, විෂම වූ වාක් කර්මයෙන් යුක්තවූයේ වේද, විෂමවූ මනො කර්මයෙන් යුක්තවූයේ වේද, මහණෙනි, මෙසේ වනාහි පවිටු භික්ෂුතෙම විෂම තැන් ඇසුරු කෙළේවේ.

13. "මහණෙනි, කෙසේ නම් පවිටු භික්ෂුතෙම සැඟවෙන තැන් ඇසුරු කෙළේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි පවිටු භික්ෂුතෙම මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේද, දෙකෙළවර ගැණීම ඇති දෘෂ්ටියෙන් යුක්තවූයේ වේද, මහණෙනි, මෙසේ වනාහි පවිටු භික්ෂුතෙම ගහණයන් ඇසුරු කෙළේ වෙයි.

14. "මහණෙනි, කෙසේනම් පවිටු භික්ෂුතෙම බලවතුන් ඇසුරු කෙළේවේද, මහණෙනි, මේ ශාසනයෙහි පවිටු භික්ෂු තෙම (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි) මහණෙනි, මෙසේ වනාහි පවිටු භික්ෂුතෙම බලවතුන් ඇසුරු කෙළේවේ.

15. "මහණෙනි, කෙසේනම් පවිටු භික්ෂුතෙම සම්පත් දෙන්නේ වේද, මහණෙනි, මේ ශායනයෙහි පවිටු භික්ෂුතෙම චීවරය පිණ්ඩපාතය ශයනාසනය ගිලන්පස බෙහෙත් පිරිකර යන මොවුන්ගේ ලැබීම ඇත්තේ වේද, ඔහුට මෙබඳු සිතක් වේ. 'ඉදින් මට කිසිවෙක් කිසිවක් කියන්නේ නම් මෙයින් ලාභයෙන් පිළිසඳර කරන්නෙමියි, ඉදින් ඔහුට කිසිවෙක් කීයේ නම් එයින් ලාභයෙන් පිළිසඳර කරයි. මහණෙනි, මෙසේ වනාහි පවිටු භික්ෂුතෙම සම්පත් දෙන්නේ වේ.

16. "මහණෙනි, කෙසේනම් පවිටු භික්ෂුතෙම එකලාව හැසිරෙන්නේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි පවිටු භික්ෂු තෙම හුදකළාව ප්‍රත්‍යන්ත දනව්වල වාසය කරයි. හෙතෙම එහි කුලයන්ට එළඹෙන්නේ ලාභය ලබයි. මහණෙනි, මෙසේ වනාහි පවිටු භික්ෂුතෙම එකලාව හැසිරෙන්නේ වේ.

17. (මේ ඡේදය මේ සූත්‍රයේ 11 ඡේදය මෙනි.)

4. **සමණසුඛුමාල සූත්‍රයː-** 1. "මහණෙනි, කරුණු පසකින්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යුක්තවූ භික්ෂුතෙම ශ්‍රමණයන් අතරෙහි ශ්‍රමණ සුඛුමාලවේ. කවර පසකින්දයත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම

2. "යාඥාකරණ ලද්දේම බොහෝකොට සිවුරු පරිභොග කෙරේද, යාඥා නොකරණලද්දේ ස්වල්පකොට පරිභොග කෙරේද, යාඥා කරණලද්දේම බොහෝකොට පිණ්ඩපාතය පරිභොගකෙරේද, යාඥා නොකරණලද්දේ මදකොට පරිභොග කෙරේද, යාඥා කරණ ලද්දේම බොහෝකොට සෙනසුන් පරිභොග කෙරේද, යාඥා නොකරණ ලද්දේ මදකොට පරිභොග කෙරේද, යාඥා කරණ ලද්දේම බොහෝකොට ගිලන්පස බෙහෙත් පිරිකර පරිභොග කෙරේද, යාඥා නොකරණලද්දේ මදකොට පරිභොග කෙරේද, යම් බ්‍රහ්මචාරීන් සමග වනාහි වාසය කෙරේද, ඔහුට මනාපවූම කාය කර්මයෙන් බොහෝ කොට හැසිරෙත්, අමනාපයෙන් මදකොට හැසිරෙත්, මනාපවූම වාක් කර්මයෙන් බොහෝකොට හැසිරෙත් අමනාපයෙන් මදකොට හැසිරෙත්. මනාපවූම මනො කර්මයෙන් බොහෝ කොට හැසිරෙත්, අමනාපයෙන් මදකොට හැසිරෙත්, මනාපවූම පූජා බහුලකොට එළවත්. අමනාපය මදකොට එලවත්. පිතෙන් හටගත්තාවූ හෝ සෙමින් හටගත්තාවූ හෝ වාතයෙන් හටගත්තාවූ හෝ සන්නිපාතයෙන් හටගත්තාවූ ඍතු පෙරලීමෙන් හටගත්තාවූ හෝ විෂම හැසිරීමෙන් හටගත්තාවූ හෝ උපක්‍රමයෙන් හටගත්තාවූ හෝ කර්ම විපාකයෙන් හටගත්තාවූ හෝ යම් ඒ වේදනාවෝ වෙද්ද, ඒ වේදනාවෝ බොහෝ කොටම නූපදිත්. ස්වල්ප ආබාධ ඇත්තේවේද, කුසල් සිතින් හටගත්තාවූ,

3. "මේ ආත්මයෙහි සැප විහරණ ඇත්තාවූ සතර ධ්‍යානයන්ගේ කැමති පරිදි ලැබීම ඇත්තේ නිදුකින් ලැබිම ඇත්තේ, බහුලව ලැබීම ඇත්තේවේද,

4. "ආශ්‍රවයන් නැසීමෙන් ආශ්‍රව රහිතවූ චිත්ත විමුක්තියටද ප්‍රඥාවිමුක්තියටද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කෙරේද, යන පසිනි.

5. "මහණෙනි, මේ කරුණු පසින් වනාහි යුක්තවූ භික්ෂු තෙම ශ්‍රමණයන් අතර ශ්‍රමණ සුඛුමාලවේ. මහණෙනි, ඒ

යමෙකුට වනාහි මනාකොට කියන්නේ ශ්‍රමණයන් අතර ශ්‍රමණ සුඛුමාලයයි කියන්නේද, මහණෙනි, ඒ මටම මනාකොට කියන්නේ ශ්‍රමණයන් අතර ශ්‍රමණ සුඛුමාලයයි කියන්නේය.

**6.** "මහණෙනි, මම වනාහි (මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.) 7 (මේ ඡේදය මේ සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

**5. ඵාසුවිහාර සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ ඵාසුවිහරණ පසක්වෙත්. 2 කවර පසක්දයත්? "මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂූහුගේ බ්‍රහ්මචාරීන් කෙරෙහි ඉදිරියෙහිද, රහසද, මෛත්‍රී සිතින් පවත්වනලද කායකර්මය පිහිටුවන ලද්දේවේද මෛත්‍රී සිතින් පවත්වනලද වාක්කර්මය පිහිටුවන ලද්දේවේද මෛත්‍රී සිතින් පවත්වනලද මනොකර්මය සබ්‍රම්සරුන් කෙරෙහි ඉදිරියෙහිද රහසද, පිහිටුවන ලද්දේවේද, නොකඩවූ සිදුරු නොවූ කබර සහිත නොවූ තිත් සහිත නොවූ දාසකමින් මිදුනාවූ නුවණැත්තන් විසින් පසස්නා ලද්දාවූ තෘෂ්ණා දෘෂ්ටීන් පරාමර්ශනය නොකරණ ලද්දාවූ සමාධි පිණිස පවත්නාවූ යම් ඒ ශීලයෝ වෙද්ද, එබඳු ශීලයන්ගෙන් බ්‍රහ්මචාරීන් හා ඉදිරියෙහිද, රහසද ශීලයෙන් සමාන බවට පැමිණියේ වාසය කෙරෙයිද, ආර්යවූ නෛර්යානිකවූ යම් මේ දෘෂ්ටියක් තොමෝ ඒ කරන්නහුගේ මනාව දුක් නැතිකිරීම පිණිස පවතීද එබඳු දෘෂ්ටියෙන් බ්‍රහ්මචාරීන් හා ඉදිරියෙහිද, රහසද දෘෂ්ටිහුගේ සමාන බවට පැමිණියේ වාසය කෙරේද යන පසයි.

**3.** (මේ ඡේදය මේ වර්ගයේ 1 ඡේදය මෙනි.)

**6. සංඝ ඵාසුවිහරණ සූත්‍රයඃ-** 1 'එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර ඝෝසිතාරාමයෙහි වැඩවසනසේක. එකල්හි වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පස්ව හුන්නේය. එකත්පස්ව හුන්නාවූම, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය.

**2.** "ස්වාමිනි, කොපමණකින් වනාහි භික්ෂුතෙම සංඝයා අතර වාසය කරන්නේ පහසුවෙන් වාසය කරන්නේද?"

3. "ආනන්දය, යම් හෙයකින් භික්ෂුතෙම තෙමේත් ශීලයෙන් යුක්තවූයේ අන්‍යයාත් අධිශීලයෙහි නො පවත්වන්නේ හෙවත් ශීලයෙන් ගර්හා නොකරන්නේවේද,

4. "ආනන්දය, මෙපමණකින්ද භික්ෂුතෙම සංඝයා අතර වාසය කරන්නේ පහසුවෙන් වාසය කරන්නේයයි වදාළේය.

5. "ස්වාමීනි, යම්සේ භික්ෂුතෙම සංඝයා අතර පහසුවෙන් වාසය කරන්නේද, එබඳු අන් ප්‍රකාරයකුත් වන්නේද?" "ආනන්දය, වන්නේය. (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.)

6. "තමන්ගේ කටයුතු නොකටයුතු බලන්නේවේද, අනුන්ගේ කටයුතු නොකටයුතු නොබලන්නේවේද, (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.)

7. (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.)

8. ආනන්දය, යම් හෙයකින් භික්ෂුතෙම තෙමේද ශීලයෙන් යුක්තවූයේ අනිකා අධිශීලයෙහි නොපවත්වන්නේ වේද, තමන්ගේ කටයුතු නොකටයුතු බලන්නේ අනුන්ගේ කටයුතු නොබලන්නේත් වේද, අප්‍රකට වූයේත් වේද, ඒ අප්‍රකට භාවයෙන් තැතිගැන්මට නොපැමිණේද, මේ පමණකින්ද,

9. "භික්ෂුතෙම සංඝයා අතර වාසයකරන්නේ පහසුවෙන් වාසය කරන්නේයයි,

10. (මේ ඡේදය මේ සූත්‍රයේ 5 ඡේදය මෙනි.)

11. මේ ඡේදය මේ සූත්‍රයේ 8 ඡේදය මෙනි.)

12. "අධිචිත්තයෙහි හටගන්නාවූ මේ ආත්මයෙහි සැප විහරණ ඇත්තාවූ සතර ධ්‍යානයන්ගේද කැමැති පරිදි ලැබීම ඇත්තේ නිදුකින් ලැබීම ඇත්තේ බහුලව ලැබීම ඇත්තේවේද, (මෙහි මේ සූත්‍රයේ 4, 5, ඡේද යෙදිය යුතුයි.)

13. (මෙහි මේ සූත්‍රයේ 11, 12, 4 ඡේද යෙදිය යුතුයි.) (මෙහි මේ වර්ගයේ 4 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

14. "ආනන්දය, මම මේ පහසු විහරණයෙන් ඉතා උතුම් වූ හෝ ඉතා ප්‍රණීතවූ හෝ අනික් පහසු විහරණයෙක් නැතැයි කියමියි" වදාළේය.

(7, 8 සූත්‍රවල 1, 3 ඡේද මේ සූත්‍රයේ 1, 3 ඡේද මෙන් වෙත්.)

**7. ආහුණෙය්‍ය සූත්‍රය:-** 2. "මහණෙනි, ධර්ම පසකින් යුක්තවූ භික්ෂුතෙම පූජාවට සුදුසුය. දුර සිට ගෙනෙනලද පූජාවට සුදුසුය. දක්ෂිණාවට සුදුසුය. අත් හිසට තබා වැඳීමට සුදුසුය. ලෝකයාගේ උතුම් පින් කෙතය.

4. "කවර පසකින්දයත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ශීලයෙන් යුක්තවූයේවේද, සමාධියෙන් යුක්තවූයේ වේද, ප්‍රඥාවෙන් යුක්තවූයේවේද, විමුක්තියෙන් යුක්තවූයේ වේද, විමුක්ති ඥානදර්ශනයෙන් යුක්තවූයේ වේද යන පසිනි.

**8. අසෙඛසීල සූත්‍රය:-** 2. "කවර පසකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම අශෛක්ෂවූ ශීල ස්කන්ධයෙන් යුක්තවූයේ වේද, අශෛක්ෂවූ සමාධි ස්කන්ධයෙන් යුක්තවූයේ වේද, අශෛක්ෂවූ ප්‍රඥාවෙන් යුක්තවූයේ වේද, අශෛක්ෂවූ විමුක්ති ස්කන්ධයෙන් යුක්තවූයේ වේද, අශෛක්ෂවූ විමුක්ති ඥානදර්ශන ස්කන්ධයෙන් යුත්තවූයේ වේද යන පසිනි.

**9. චාතුද්දිස භික්ඛු සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම සතරදිග නොවළහනලද හැසුරුම් ඇත්තේ වෙයි.

2. "කවර පසකින්දයත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම සිල්වත් වේද, ප්‍රාතිමොක්ෂ සංවරශීලයෙන් සංවර වූයේ ආචාරයෙන් හා ගෞරවයෙන් යුක්තවූයේ වාසය කෙරේද, ස්වල්ප තරම් වරදවල භය දක්නා ස්වභාව ඇතිවූයේ ශික්ෂාපදයන්හි සමාදන්ව හික්මේද, බහුශ්‍රැතවූයේ ඇසූදෙය දරන්නේ අසනලද්දවුන්ගේ රැස්කිරීම් ඇත්තේවේද, මුල යහපත්වූ මැද යහපත්වූ කෙළවර යහපත්වූ අර්ථ සහිතවූ ව්‍යඤ්ජන සහිතවූ

යම් ඒ ධර්මයෝ සියල්ලෙන් සම්පූර්ණවූ, පිරිසිදුවූ බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කෙරෙද්ද, එබඳුවූ ධර්මයෝ මොහු විසින් බොහෝකොට අසනලද්දාහු, දරණ ලද්දාහු වචනයෙන් පුරුදුකරණ ලද්දාහු, සිතින් සළකන ලද්දාහු, දෘෂ්ටියෙන් මනාව ප්‍රතිවේධ කරණ ලද්දාහු වෙද්ද,

3. "ලද පරිදි චීවරය, පිණ්ඩපාතය, සයනාසනය, ගිලන්පස, බෙහෙත් පිරිකරය යන මෙයින් සතුටුවූයේ වේද, අධිචිත්තයෙහි හටගත්තාවූ (මෙහි මේ වර්ගයේ 4 සූත්‍රයේ 3, 4 ඡේද යෙදිය යුතුයි.)

4. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

10. **අරඤ්ඤසේනාසන සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම වනයෙහි වානප්‍රස්ථ නම් ඉතා දුර සෙනසුන් සේවනය කරන්ට සුදුසුවේ.

2. (මේ ඡේදය මේ වර්ගයේ 9 සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

3. පටන්ගන්නා ලද වීර්යයෙන් යුක්තව වාසය කෙරේද, ශක්ති ඇත්තේ දැඩිවීර්ය ඇත්තේ කුශල ධර්මයන්හි බහා නොතබනලද ධූර ඇත්තේවේද, අධිචිත්තයෙහි හටගත්තාවූ මේ ආත්මයෙහි සැප විහරණ ඇත්තාවූ සතර ධ්‍යානයන්ගේ කැමති පරිදි ලැබීම ඇත්තේ, නිදුකින් ලැබිම ඇත්තේ, බහුලව ලැබීම ඇත්තේවේද, ආශ්‍රවයන් නැසීමෙන් ආශ්‍රව රහිතවූ චිත්ත විමුක්තියටද, ප්‍රඥා විමුක්තියටද, මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කෙරේද යන පසිනි.

4. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

---

## 12. අන්ධක වින්ද වර්ගය.

(මේ වර්ගයේ 11, 13, 15 සූත්‍රවල 3 ඡේදය 1 ඡේදය මෙන්ද 6 ඡේදය 4 ඡේදය මෙන්ද වෙත්.)

**11. කුලුපග සමණ සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ කුලයට එළඹෙන්නාවූ භික්ෂුතෙම කුලයන්හි අප්‍රියවූවෙක්ද අමනාපවූවෙක්ද ගෞරව නැත්තෙක්ද බුහුමන් නැත්තෙක්ද වේ. 2 "කවර පසකින්ද යත්? තමා හා සන්ථව නැත්තවුන් කෙරෙහි විශ්වාස ඇත්තේ වේද, අධිපති නොවූයේම අධිපතියෙකු මෙන් කටයුතු ඇත්තේද, වෙන්වූ කුල ගැළපීම පිණිස එළඹීම් ඇත්තේ වේද, කණ ලඟ කරණ කථා ඇත්තේ වේද, අධිකකොට ඉල්ලීම් ඇත්තේවේද යන පසිනි. 4 "මහණෙනි කරුණු පසකින් යුක්තවූ කුළුපග භික්ෂුතෙම කුලයන්හි ප්‍රියවූවෙක්ද මනාපවුවෙක්ද ගෞරව ඇත්තෙක්ද බුහුමන් කරන්නෙක්ද වේ. 5 "කවර පසකින්ද යත්? තමන් හා සන්ථව නැත්තවුන් කෙරෙහි විශ්වාස නැත්තේ වේද, අධිපති නොව අධිපතියෙකු මෙන් කරණ කටයුතු නැත්තේ වේද, වෙන්වූ කුලගැළපීම පිණිස එළඹීම ඇත්තේ නොවේද, කණ ලඟ කරණ කථා ඇත්තේ නොවේද, අධිකවූ ඉල්වීම් ඇත්තේ නොවේද යන මේ පසිනි."

**12. පච්ඡා සමණ සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ පසුව යන ශ්‍රමණතෙම ගතයුතු නොවේ.

2. "කවර පසකින්ද යත්? ඉතා දුර හෝ ඉතා ලඟ හෝ යේද පාත්‍රයෙහි ඇතුළත් දෙය නොගණීද ඇවතට ලංව කියනු ලබන්නහු නොවළකාද, කියනු ලබන්නහුට අතරතුර කථාව හෙළාද ජඩවූ කෙළතොලුවූ දුෂ්ප්‍රාඥයෙක් වේදයන පසිනි.

4. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ පසුව යන ශ්‍රමණතෙම ගතයුතු වේ. 5. "කවර පසකින්ද යත්? ඉතා දුර නොයාද ඉතා ලඟ නොයාද, පාත්‍රයෙහි ඇතුළත් දෙය ගණීද, ඇවතට ලංව කියනු ලබන්නහු වළකාද කියනු ලබන්නහුට අතරතුර කථාව නොහෙළාද, ජඩනොවූ කෙළ තොලු නොවූ ප්‍රඥා ඇත්තෙක් වේද යන පසිනි.

**13. අභබ්බ සමාධි සූත්‍රය:-** 1 "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම සම්‍යක් සමාධියට පැමිණ වාසය කරන්ට නුසුදුසුවේ. 2 "කවර පසකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි

භික්ෂුතෙම රූපාරම්මනයන් නොඉවසන්නේ වේද, ශබ්දාරම්මණයන් නොඉවසන්නේවේද, ගන්ධාරම්මණයන් නොඉවසන්නේ වේද, රසාරම්මණයන් නොඉවසන්නේ වේද, ඵොට්ඨබ්බාරම්මණයන් නොඉවසන්නේ වේද යන පසිනි.

4. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම සම්‍යක් සමාධියට පැමිණ වාසය කරන්ට සුදුසු වේ. 5 කවර පසකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම රූපාරම්මණයන් ඉවසන්නේ වේද, ශබ්දාරම්මණයන් ඉවසන්නේ වේද, ගන්ධාරම්මණයන් ඉවසන්නේ වේද, රසාරම්මණයන් ඉවසන්නේ වේද, පොට්ඨබ්බාරම්මණයන් ඉවසන්නේ වේද යන පසිනි."

**14. අන්ධක වින්ද සූත්‍රයඃ-** 1. "එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මගධ රට අන්ධක වින්ද නම් වනයෙහි වැඩ වසනසේක. එකල්හි වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන්නාවූම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. 2 "ආනන්දය, යම් ඒ භික්ෂූහු නවකවූවාහු පැවිදිවූ නොබෝකල් ඇත්තාහු මේ ශාසනයට අලුත පැමිණියාහු වෙද්ද ආනන්දය, ඒ භික්ෂූහු තොප විසින් ධර්මපසෙක්හි සමාදන් කරවිය යුත්තාහ. ඇතුළත් කරවිය යුත්තාහ. පිහිටුවිය යුත්තාහ. 3 "කවර පසෙක්හිදයත්? 'ඇවැත්නි, එව්, තොපි සිල්වත් එව්. ප්‍රාතිමොක්ෂ සංවර ශීලයෙන් සංවරවූවාහු ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තව වාසය කරව්. ස්වල්ප තරම් වරදවල භය දක්නාසුළු වූවාහු ශික්ෂා පදයන්හි සමාදන්ව හික්මවේයයි මෙසේ ප්‍රාතිමොක්ෂ සංවර ශීලයෙහි සමාදන් කරවිය යුත්තාහ. ඇතුළත් කරවිය යුත්තාහ, පිහිටුවිය යුත්තාහ. 'ඇවැත්නි, එව්, තෙපි ඉන්ද්‍රියයන් රක්නාලද දොරටු ඇත්තාහු දොරටු රක්නා සිහියෙන් යුක්තවූවාහු, නුවණින් යුත් සිහි ඇත්තාහු රක්නා ලද සිත් ඇතිව සිහියෙන් රක්නා ලද සිතින් යුක්තවූවාහු වාසය කරව් යයි' මෙසේ ඉන්ද්‍රිය සංවර ශීලයෙහි සමාදන් කරවිය යුත්තාහ. ඇතුළත් කරවිය යුත්තාහ.

පිහිටුවිය යුත්තාහ. 'ඇවැත්නි, එව්, තෙපි මඳ කථා ඇත්තාහු කථා කෙළවර කරන්නාහුවව් යයි, මෙසේ කථා කෙළවරෙහි සමාදන් කරවිය යුත්තාහ. ඇතුළත් කරවිය යුත්තාහ. 'පිහිටුවිය යුත්තාහ. ඇවැත්නි, එව්, තෙපි ආරණ්‍යයක එව්. ආරණ්‍යයෙහි වානප්‍රස්ථ නම් ඉතා දුරවූ සෙනසුන් සේවනය කරවියයි' මෙසේ කයින් වෙන්ව වාසය කිරීමෙහි සමාදන් කරවිය යුත්තාහ. ඇතුළත් කරවිය යුත්තාහ. පිහිටුවිය යුත්තාහ. "ඇවැත්නි, එව්, තෙපි සම්‍යක් දෘෂ්ටි ඇත්තේ යහපත් දැකීමෙන් යුක්තවූවෝ වව්යයි මෙසේ සම්‍යක් දර්ශනයෙහි සමාදන් කරවිය යුත්තාහ. ඇතුළත් කර විය යුත්තාහ, පිහිටුවිය යුත්තාහ යන කරුණු පසෙහිය. 4 (මේ ඡෙදය මේ සූත්‍රයේ 2 ඡෙදය මෙනි.)

**15. මච්ඡරිනී සූත්‍රය:-** 1 "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුණී තොමෝ ගෙනෙන ලද බරක් බහාතබන ලද්දී යම්සේද එමෙන් නරකයෙහි උපදී 2 කවර පසකින්ද යත්? ආවාසයන්හි මසුරුකම් ඇත්තීවේද, කුලයන්හි මසුරු කම් ඇත්තීවේද, ලාභයන්හි මසුරුකම් ඇත්තීවේද, ගුණ වර්ණනායෙහි මසුරුකම් ඇත්තීවේද, ධර්මයෙහි මසුරුකම් ඇත්තීවේද යන පසිනි 4 "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුණී තොමෝ ගෙනෙනලද බරක් බහාතබන ලද්දී යම්සේද එමෙන් ස්වර්ගයෙහි උපදී. 5 "කවර පසකින්ද යත්? ආවාසයන්හි මසුරුකම් ඇත්තී නොවේද, කුලයන්හි මසුරුකම් ඇත්තී නොවේද, ලාභයන්හි මසුරුකම් ඇත්තී නොවේද, ගුණ කීමෙහි මසුරුකම් ඇත්තී නොවේද, ධර්මයෙහි මසුරුකම් ඇත්තී නොවේද යන පසිනි.

**16. වණ්ණ භණන සූත්‍රය:-** (මේ වර්ගයේ ඉතුරු සූත්‍රවල 1, 3, 4, 6 ඡෙද මේ වර්ගයේ 15 සූත්‍රයේ 1, 3, 4, 6 ඡෙද මෙන් වෙත්)

**2.** "කවර පසකින්ද යත්? නොදැන නොසොයා අගුණ කියයුත්තහුගේ ගුණ කියාද, නොදැන නොසොයා ගුණ කිය යුත්තහුගේ අගුණ කියාද, නොදැන නොසොයා නොපැහැදිය යුතු තැන පැහැදීම පහළ කෙරේද නොදැන නොසොයා පැහැදිය යුතු තැන නොපැහැදීම පහළ කෙරේද, ශ්‍රද්ධාවෙන්

දුන් දෙය අගය අඩු කෙරේද යන පසිනි. 5. "කවර පසකින්ද යත්? දැන සොයා අගුණ කියයුත්තාහුගේ අගුණ කියාද, දැන සොයා ගුණ කියයුත්තහුගේ ගුණ කියාද, දැන සොයා නොපැහැදියයුතු තැන නොපැහැදීම පහළ කෙරේද, දැන සොයා පැහැදිය යුතුතැන පැහැදීම පහළ කෙරේද, ශ්‍රද්ධාවෙන් දුන් දෙය අගය අඩු බවට නොපමුණුවාද යන පසිනි."

17. **ඉස්සුකිනී සූත්‍රය**:- 2. "කවර පසකින්දයත්? නොදැන නොසොයා අගුණ කියයුත්තහුගේ ගුණ කියාද නොදැන නොසොයා ගුණ කියයුත්තහුගේ අගුණ කියාද ඊර්ෂ්‍යා ඇත්තීවේද, මසුරුකම් ඇත්තීවේද, ශ්‍රද්ධාවෙන් දුන්දෙය අගය හෙළාද යන පසිනි. 5. "කවර පසකින්ද යත්? දැන සොයා අගුණ කියයුත්තහුගේ අගුණ කියාද, දැන සොයා ගුණ කියයුත්තහුගේ ගුණ කියාද, ඊර්ෂ්‍යා නැත්තී වේද, මසුරුකම් නැත්තී වේද, ශ්‍රද්ධාවෙන් දුන් දෙය අගය නොහෙළාද යන පසිනි."

18. **මිච්ඡා දිට්ඨිකා සූත්‍රය**:- 2 "කවර පසකින්ද යත්? නොදැන නොසොයා අගුණ කිය යුත්තහුගේ ගුණ කියාද, නොදැන නොසොයා ගුණ කියයුත්තහුගේ අගුණ කියාද, මිථ්‍යාදෘෂ්ටි ඇත්තීද, මිථ්‍යා සංකල්පනා ඇත්තීත්වේද ශ්‍රද්ධාවෙන් දුන් දෙය අගේ හෙළාද 5 "කවර පසකින්ද යත්? දැන සොයා අගුණ කියයුත්තහුගේ අගුණ කියාද දැන සොයා ගුණ කියයුත්තහුගේ ගුණ කියාද, සම්‍යක් දෘෂ්ටි ඇත්තීද, සම්‍යක් සංකල්පනා ඇත්තීත් වේද, ශ්‍රද්ධාවෙන් දුන් දෙය අගය නොහෙළාද යන පසිනි."

19. **මිච්ඡා වාචා සූත්‍රය**:- 2. "කවර පසකින්ද යත්? නොදැන නොසොයා අගුණ කියයුත්තහුගේ ගුණ කියාද, නොදැන නොසොයා ගුණ කියයුත්තහුගේ අගුණ කියාද, මිථ්‍යා වචන ඇත්තීද, මිථ්‍යා කර්මාන්ත ඇත්තීත් වේද, ශ්‍රද්ධාවෙන් දුන්දෙය අගය හෙළාද, යන පසිනි 5 "කවර පසකින්ද යත්? දැන සොයා අගුණ කියයුත්තහුගේ අගුණ කියාද, දැන සොයා ගුණ කියයුත්තහුගේ ගුණ කියාද, සම්‍යක් වචන ඇත්තීද, සම්‍යක් කර්මාන්ත ඇත්තීත් වේද, ශ්‍රද්ධාවෙන් දුන් දෙය අගය

නොහෙළාද යන පසිනි.”

**20. මිච්ඡා වායාම සූත්‍රයඃ-** 2. “කවර පසකින්ද යත්? නොදැන නොසොයා අගුණ කියයුත්තහුගේ ගුණ කියාද, නොදැන නොසොයා ගුණකියයුත්තහුගේ අගුණකියාද, මිථ්‍යා ව්‍යායාම ඇත්තීද මිථ්‍යා ස්මෘති ඇත්තීත්වේද ශ්‍රද්ධාවෙන් දුන් දෙය අගය හෙළාද යන පසිනි 5 “කවර පසකින්ද යත්? දැන සොයා අගුණ කියයුත්තහුගේ අගුණ කියාද දැන සොයා ගුණ කියයුත්තහුගේ ගුණ කියාද, සම්‍යක් ව්‍යායාම ඇත්තීද, යහපත් සිහිය ඇත්තීත් වේද, ශ්‍රද්ධාවෙන් දුන් දෙය අගය නොහෙළාද යන පසිනි.”

---

## 13. ගිලාන වර්ගය.

**21. ගිලානසාලා සූත්‍රයඃ-** 1. “එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසල් නුවර මහවන වෙහෙරෙහි කූටාගාර ශාලාවෙහි වැඩවසන සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි ඵලසමවතින් නැගී සිටි සේක් ගිලන්හල යම් තැනෙක්හිද එතැනට පැමිණිසේක. භාග්‍යවතුන් වහන්සේ එක්තරා දුර්වලවූ ගිලන් භික්ෂුවක් දුටුසේක්මය. දැක පනවන ලද අසුනෙහි වැඩ උන්සේක. වැඩහිඳ වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක.

2. “මහණෙනි, යම්කිසි දුර්වල ගිලනක්හු කරුණු පසක් නොහරිද්ද, ඔහුට මෙය කැමතිවිය යුතුය. නොබෝකලකින්ම ආශ්‍රවයන් නැසීමෙන් ආශ්‍රව රහිතවූ චිත්ත විමුක්තියටද ප්‍රඥා විමුක්තියටද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරන්නේය. 3 “කවර පසක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම කයෙහි අශුභ අරමුණු අනුව බලමින් වාසය කෙරේද, ආහාරයෙහි පිළිකුල් සංඥා ඇත්තේවේද, සියලු ලෝකයෙහි නොඇලුනු සංඥා ඇත්තේද සියලු සංස්කාරයන්හි අනිත්‍ය අනුව බලමින් වාසයකෙරේද, මොහුගේ මරණ සංඥාව වනාහි තමන් කෙරෙහි

මනාව එළඹ සිටියාවේද යන පසයි. 4 (මේ ඡෙදය මේ සූත්‍රයේ 2 ඡෙදය මෙනි)

**5.** "මහණෙනි, යම්කිසි භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ කරුණු පසක් වඩාද, කරුණු පසක් බහුලව කෙරේද, ඔහුට ඵල දෙක අතුරෙන් එක්තරා ඵලයක් කැමතිවිය යුතුයි. මේ ආත්මයෙහිම රහත් බව හෝ උපාදානයන්ගේ ශෙෂවීම ඇති කල්හි අනාගාමි බව හෝ යනුයි. 6. "කවර පසක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂූහුගේ ධර්මයන්ගේ ඇතිවීම නැතිවීම පිණිස පවත්නා ප්‍රඥාව පිණිසවූ සිහිය තමන් කෙරෙහිම එළඹ සිටියාවේද, කයෙහි අසුබ අරමුණු අනුව බලමින් වාසයකෙරේද, ආහාරයෙහි පිළිකුල් සංඥා ඇත්තේවේද, සියලු ලෝකයෙහි නොඇලුනු සංඥා ඇත්තේ වේද, සියලු සංස්කාරයන්හි අනිත්‍යය අනුව බලමින් වාසය කෙරේද යන පසයි. 7 (මේ ඡෙදය මේ සූත්‍රයේ 5 ඡෙදය මෙනි.)

**22. අජ්ඣත්ත සති සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ගිලාන තෙම උපස්ථාන කරන්ට නොහැකිවේ.

**2.** 'කවර පසකින්ද යත්? අහිතවූ කටයුතු කරන්නේ වේද, හිතවූ කටයුත්තෙහි පමණ නොදනීද, බෙහෙත් ප්‍රතිශෙවනය කරන්නේ නොවේද, වැඩ කැමතිවූ ගිලන් උපස්ථායකයාට තත්වූ පරිදි ආබාධය ප්‍රකාශකරන්නේ නොවේද ඉදිරියට ගමන් කරන්නාවූ හෝ ආබාධය ඉදිරියට ගමන් කෙරේයයි පසුබස්නාවූ ආබාධය හෝ පසුබසීයයි, සිටියාවූ හෝ ආබාධය සිටියේයයිද කියායි. උපන්නාවූ හෝ ශරීරයෙහි හටගත්තාවූ දුක්වූ තියුණුවූ රළුවූ කටුකවූ නොසැපවූ අමනාපවූ ප්‍රාණය හැර ගන්නාවූ වේදනාවන් නොඉවසන ස්වභාව ඇත්තේ වේද යන පසිනි. 3 (මේ ඡෙදය මේ සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

**4.** "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ගිලානතෙම උපස්ථාන කිරීමට පහසුවේ. 5 "කවර පසකින්ද යත්? හිතවූ කටයුතු කරන්නේ වේද, හිතවූ කටයුත්තෙහි පමණ දනීද, බෙහෙත සේවනය කරන්නේද වැඩ කැමතිවූ

ගිලානොපස්ථායකයාට තත්වූ පරිදි ආබාධය ප්‍රකාශ කරන්නේ වේද, ඉදිරියට ගමන් කරන්නාවූ හෝ ආබාධය ඉදිරියට ගමන් කෙරේයයි ද පසුබස්නාවූ හෝ ආබාධය පසුබසීයයිද සිටියාවූ හෝ ආබාධය සිටියේයයිද කියායි. උපන්නාවූ ශරීරයෙහි හටගත්තාවූ දුක්වූ තියුණුවූ රළුවූ කටුකවූ නොසැපවූ අමනාපවූ ප්‍රාණය හැර ගන්නාවූ වේදනාවන් ඉවසන ස්වභාව ඇත්තේ වේද යන පසිනි. 6 (මේ ඡෙදය මේ සූත්‍රයේ 4 ඡෙදය මෙනි.)

23. **දුරුපට්ඨිය ගිලාන සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ගිලානෝපස්ථායකතෙම ගිලනාට උපස්ථාන කරනට සුදුසු නොවේ. 2. "කවර පසකින්ද යත්? බෙහෙත නියම කරන්නට ශක්ති ඇත්තේ නොවේද, හිතවූ දෙය අහිතවූ දෙය නොදනීද, අහිතවූ දෙය එළවාද, හිතවූ දෙය බැහැර කෙරේද ආමිෂය බලාපොරොත්තුවන්නේ ගිලනාට උපස්ථාන කෙරේද, මෛත්‍රි සිත් ඇත්තේ නොකෙරේද, මළ හෝ මුත්‍ර හෝ වමණය හෝ කෙළ හෝ බැහැර කරන්ට පිළිකුල් ඇත්තේ වේද, ගිලනා කලින් කල දැහැමි කථාවෙන් කරුණු දක්වන්ට සමාදන් කරවන්ට තෙද ගන්වන්ට සතුටු කරවන්ට ශක්තිය ඇත්තේ නොවේද, යන පසිනි. 3. (මේ ඡෙදය මේ සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

24. **ගිලානුපට්ඨාන සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ ගිලානොපස්ථායකතෙම ගිළනාට උපස්ථාන කරන්ට සුදුසු වේ. 2. "කවර පසකින්ද යත්. බෙහෙත නියම කරන්ට ශක්ති ඇත්තේ වේද, හිතවූ දෙය අහිතවූ දෙය දනීද, අහිතවූ දෙය බැහැර කෙරේද, හිතවූ දෙය එළවාද මෛත්‍රී සිත් ඇත්තේ ගිලනාට උපස්ථාන කෙරේද, ආමිෂය බලාපොරොත්තුව නොකෙරේද, මළ හෝ මුත්‍ර හෝ වමණය හෝ කෙළ හෝ බැහැර කරන්ට පිළිකුල් ඇත්තේ වේද, කලින් කල ගිලනා දැහැමි කථාවෙන් කරුණු දක්වන්ට සමාදන් කරවන්ට තෙදගන්වන්ට සතුටු කරන්ට සමර්ථ වේද, යන පසිනි. 3. (මේ ඡෙදය මේ සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

**25. පඨම අනායුස්ස ධම්ම සූත්‍රය:-** 1. "මහණෙනි, ආයුෂට හිත නොවූ මේ කරුණු පසක් වෙත්. 2. "කවර පසක්ද, අහිතවූ කටයුතු කරන්නේ වේද, හිතවූ කටයුත්තෙහි පමණ නොදනීද නොපැසවූ කල්හි භෝජන ඇත්තේ වේද, නොකල්හි හැසිරීම ඇත්තේ වේද, බඹසර නැත්තේ වේද, යන පසයි. 3 (මේ ඡේදය 1 ඡේදය මෙනි) 4 "මහණෙනි ආයුෂට හිතවූ මේ කරුණු පසක්වෙත් 5 "කවර පසක්ද යත්. හිතවූ කටයුතු කරන්නේවේද හිතවූ කටයුත්තෙහි පමණ දනීද, මුහුකුරා ගියාවූ භෝග ඇත්තේ වේද, සුදුසු කල්හි හැසිරීම ඇත්තේ වේද, බ්‍රහ්මචර්යාව ඇත්තේ වේද යන පසයි. 6. (මේ ඡේදය 4 ඡේදය මෙනි.)

**26. දුතිය අනායුස්ස ධම්ම සූත්‍රය:-** 1, 3. (මේ ඡේදය මේ වර්ගයේ 25 සූත්‍රයේ 1, 3 ඡේද මෙනි) 2. "කවර පසක්ද යත් අහිතවූ කටයුතු ඇත්තේ වේද, හිතවූ කටයුත්තෙහි පමණ නොදනීද නොපැසවූ කල්හි වැළඳීම ඇත්තේ වේද, දුශ්ශීල වේද පව්ටු මිතුරන් ඇත්තේ වේද යන පසයි. 4, 6 (මේ ඡේද මේ වර්ගයේ 25 සූත්‍රයේ 4, 6 ඡේද මෙන් වෙත්)

**5.** "කවර පසක්ද යත්, හිතවූ කටයුතු ඇත්තේ වේද හිතවූ කටයුත්තෙහි පමණ දනීද, ආහාරය පැසවූ කල්හි වැළඳීම ඇත්තේ වේද, සිල්වත් වේද, යහපත් මිතුරන් ඇත්තේ වේද යන පසයි."

**27. සංඝපකාසන සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම සංඝයාගෙන් වෙන්ව, තනිව වාසය කරන්ට සුදුසු නොවේ. 2. "කවර පසකින්ද යත්. මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ලැබුනු පරිදි සිවුරෙන් සතුටුවූයේ නොවේද ලැබුනු පරිදි පිණ්ඩාපතයෙන් සතුටු වූයේ නොවේද, ලැබුනු පරිදි ශයනාශනයෙන් සතුටු වූයේ නොවේද, ලැබුනු පරිදි ගිලන්පස බෙහෙත් පිරිකරෙන් සතුටුවූයේ නොවේද කාමය පිළිබඳ සංකල්පනා බහුල කොට ඇත්තේ වාසය කෙරේද, යන පසිනි. 3. (මේ ඡේදය 1 ඡේදය මෙනි) 4. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම සංඝයාගෙන් වෙන්ව තනිව වාසය

කරන්ට සුදුසුය. 5. "කවර පසකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ලැබුණු පරිදි සිවුරෙන් සතුටු වූයේද, ලැබුණු පරිදි පිණ්ඩපාතයෙන් සතුටු වූයේ වේද, ලැබුණු පරිදි ශයනාශනයෙන් සතුටු වූයේ වේද, ලැබුණු පරිදි ගිලන්පස බෙහෙත් පිරිකරින් සතුටු වූයේ වේද, නෛෂ්කාම්‍ය සංකල්පනා බහුල කොට ඇත්තේ වාසය කෙරේද යන පසිනි. 6. (මේ ඡේදය 4 ඡේදය මෙනි.)

**28. සමණ දුක්ඛ සූත්‍රය:-** 1. "මහණෙනි, මේ ශ්‍රමණයන්ගේ දුක් පසක් වෙත්. 2. "කවර පසක්ද යත්? මහණෙනි මේ ශාසනයෙහි භික්ෂුතෙම ලැබුණු පරිදි සිව්රෙන් නොසතුටු වූයේ වේද, ලැබුණු පරිදි පිණ්ඩපාතයෙන් නොසතුටු වූයේවේද, ලැබුණු පරිදි ශයනාසනයෙන් නොසතුටු වූයේ වේද, ලැබුණු පරිදි ගිලන්පස බෙහෙත් පිරිකරෙන් නොසතුටු වූයේ වේද, නොඇලුනේ බ්‍රහ්මචර්යයේ හැසිරේද, යන පසයි. 3. (මේ ඡේදය 1 වෙනි ඡේදය මෙනි) 4. "මහණෙනි, මේ ශ්‍රමණයන්ගේ සැප පසක් වෙත්. 5. "කවර පසක්ද යත්. මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ලැබුණු පරිදි සිවුරෙන් සතුටු වූයේ වේද, ලැබුණු පරිදි පිණ්ඩපාතයෙන් සතුටු වූයේ වේද, ලැබුණු පරිදි ශයනාසනයෙන් සතුටු වූයේ වේද, ලැබුණු පරිදි ගිලන්පස බෙහෙත් පිරිකරින් සතුටු වූයේ වේද, ඇළුනේ බ්‍රහ්මචර්යාවෙහි හැසිරේද යන පසයි. 6. (මේ ඡේදය 4 ඡේදය මෙනි.)

**29. පරිකුප්ප සූත්‍රය:-** 1. "මහණෙනි, අපායට යන්නාවූ නිරයට පැමිණෙන්නාවූ කිපෙන ස්වභාව ඇත්තාවූ, පිළියම් නොකට හැක්කාවූ මේ පස් දෙනෙක් වෙත් 2. "කවර පස්දෙනෙක්ද යත්? මව දිවියෙන් තොර කරණ ලද්දේවේද, පියා දිවියෙන් තොර කරණ ලද්දේවේද රහතන් වහන්සේ දිවියෙන් තොර කරණ ලද්දේවේද, දුෂ්ටවූ සිතින් තථාගතයන්ගේ ලේ උපදවන ලද්දේවේද, සංඝතෙම භෙද කරණ ලද්දේවේද, යන පස්දෙනායි 3. (මේ ඡේදය 1 ඡේදය මෙනි)

**30. පඤ්ච ව්‍යසන සූත්‍රය:-** 1. "මහණෙනි මේ විපත් පසක්

වෙත් කවර පසක්ද යත්, නෑයන් පිළිබඳ විපතය, සම්පත් පිළිබඳ විපතය, රෝග පිළිබඳ විපතය, ශීලය පිළිබඳ විපතය දෘෂ්ටිය පිළිබඳ විපතය යන පසයි. මහණෙනි, සත්වයෝ නෑයන් පිළිබඳ විපතය, හේතුකොට ගෙණ හෝ සම්පත් පිළිබඳ විපතය හේතුකොට ගෙණ හෝ රෝග පිළිබඳ විපතය හේතුකොට ගෙණ හෝ 2. "ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැප නැත්තාවූ දුකට පිහිටවූ විවසව පතිත වන්නාවූ නරකයෙහි නූපදිත්. 3. " මහණෙනි, සත්වයෝ ශීලය පිළිබඳ විපත හේතුකොටගෙණ හෝ දෘෂ්ටිය පිළිබඳ විපත හේතුකොට ගෙණ හෝ (මෙහි මේ සූත්‍රයේ 2 ඡෙදය යෙදිය යුතුයි) මහණෙනි, මොහු වනාහි විපත් පස වෙත්. 4. "මහණෙනි, මේ සම්පත් පසක් වෙත්. කවර පසක්ද යත්, ඥාති සම්පත්තිය, භෝග සම්පත්තිය, ආරොග්‍ය සම්පත්තිය, ශීල සම්පත්තිය, දෘෂ්ටි සම්පත්තිය යන පසයි. මහණෙනි, සත්වයෝ ඤාති සම්පත්තිය හේතුකොට ගෙණ හෝ භෝග සම්පත්තිය හේතුකොට ගෙණ හෝ ආරෝග්‍ය සම්පත්තිය හේතුකොට ගෙණ හෝ 5. "ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති පස්කම් සැපයෙන් අග්‍රවූ දිව්‍ය ලෝකයෙහි නූපදිත්.

**6.** "මහණෙනි, සත්වයෝ ශීල සම්පත්තිය හේතුකොට ගෙණ හෝ දෘෂ්ටි සම්පත්තිය හේතුකොට ගෙණ හෝ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති පස්කම් සැපයෙන් අග්‍රවූ දිව්‍ය ලෝකයෙහි උපදිත්, මහණෙනි, මොහු වනාහි සම්පත් පස වෙත්යයි වදාළේය."

---

## 14. රාජ වර්ගය.

(31, 32. සූත්‍රවල 3, ඡෙදය 1 ඡෙදය මෙන්ද 6, ඡෙදය 4, ඡෙදය මෙන්ද වෙත්.

**31. චක්කවත්තන සූත්‍රය:-** 1. "මහණෙනි, අංග පසකින් යුක්තවූ සක්විති රජතෙම දැහැමින්ම අණසක පවත්වයි. ඒ

අණසක මනුෂ්‍යවූ සතුරු වූ කිසියම් ප්‍රාණියෙකු විසින් නොපැවැත්විය හැකිවේ.

2. (i) "කවර පසකින්ද යත්, මහණෙනි, මේ ලෝකයෙහි සක්විති රජතෙම (ii) අර්ථය දන්නේත් වේද, ධර්මය දන්නේත් වේද, පමණ දන්නේත් වේද, කල් දන්නේත් වේද, පිරිස් දන්නේත් වේද, යන පසිනි.

4. (i) "මහණෙනි, මෙපරිද්දෙන්ම පඤ්ච ධර්මයකින් යුක්තවූ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතතෙම දැහැමින්ම නිරුත්තරවූ ධර්මචක්‍රය පවත්වයි (ii) ඒ ධර්ම චක්‍රය ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බ්‍රහ්මයෙකු විසින් හෝ ලෝකයෙහි කිසිවෙකු විසිනුත් නොපැවැත්විය හැකිවේ.

5. "කවර පසකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතතෙම (මෙහි 2 (ii) ඡෙදයමෙනි)

32. **චක්කානුවත්තන සූත්‍රය**:- 1. "මහණෙනි, අංග පසකින් යුක්තවූ සක්විති රජහුගේ වැඩිමහළු පුත්‍රතෙමේ පියා විසින් පවත්වන ලද අණසක දැහැමින්ම අනුව පවත්වයි. ඒ අණසක කිසියම් මනුෂ්‍යවූ සතුරුවූ ප්‍රාණියෙකු විසින් නොපැවැත්විය හැක්කේ වෙයි. 2. "කවර පසකින්ද යත්? මහණෙනි, මේ ලෝකයෙහි සක්විති රජහුගේ වැඩිමහළු පුත්‍ර තෙම (මෙහි මේ වර්ගයේ 31 සූත්‍රයේ 2 (ii) ඡෙදය යෙදිය යුතුයි)

4. "මහණෙනි, මෙපරිද්දෙන්ම කරුණු පසකින් යුක්ත වූ ශාරිපුත්‍රතෙමේ වනාහි තථාගතයන් විසින් පවත්වන ලද නිරුත්තරවූ ධර්ම චක්‍රය මනාකොටම අනුව පවත්වයි. (මෙහි මේ වර්ගයේ 31 සූත්‍රයේ 4 (ii) යෙදිය යුතුයි) 5. "කවර පසකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි ශාරිපුත්‍ර තෙම (මෙහි මේ වර්ගයේ 31 සූත්‍රයේ 2 (ii) යෙදිය යුතුයි)

33. **අරාජක චක්ක සූත්‍රය**:- 1. "මහණෙනි, ධාර්මිකවූ

ධර්මරාජන්වූ යම් සක්විති රජෙකුත් වේද, හෙතෙමේද රජෙක් නැත්තාවූ අණසක නොපවත්වායයි" වදාළේය. 2. "මෙසේ වදාළ කල්හි එක්තරා භික්ෂුවක්තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය. "ස්වාමීනි, ධාර්මිකවූ ධර්මරාජන්වූ සක්විති රජහට කවරෙක් නම් රජ වේද?" 3. "මහණ, ධර්මයයි" භාග්‍යවතුන් වහන්සේ වදාළේය. මහණ, මේ ලෝකයෙහි ධාර්මිකවූ ධර්මරාජන්වූ සක්විති රජතෙම 4. "ධර්මයම නිසා ධර්මයට සත්කාර කරන්නේ, ධර්මයට ගෞරව කරන්නේ, ධර්මයට පුදන්නේ, ධර්මය ධ්වජකොට ඇත්තේ, ධර්මය කෙහෙළි කොට ඇත්තේ, ධර්මය අධිපති කොට ඇත්තේ, 5. "ඇතුළත ජනයා කෙරෙහි ධාර්මිකවූ ආරක්ෂා වරණ ගෝපනය මොනවට විධාන කරයි 6. "මහණ, නැවත අනිකක්ද කියමි. (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.) ධාර්මිකවූ ධර්මරාජන්වූ ආරක්ෂා වරණ ගොපනය, 7. "ක්ෂත්‍රියන් කෙරෙහිද අනුව යෙදුනවුන් කෙරෙහිද, බල සෙනග කෙරෙහිද බමුණු ගැහැවියන් කෙරෙහිද නියම් ගම් දනව් වැස්සන් කෙරෙහිද, මහණ බමුණන් කෙරෙහිද, මෘග පක්ෂීන් කෙරෙහිද මනාකොට විධාන කරයි.

8. "මහණ මේ ධාර්මිකවූ ධර්මරාජන්වූ සක්විති රජ තෙමේ වනාහි (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.) "ධාර්මිකවූ රක්ෂාවරණ ගෝපනය ඇතුළත ජනයා කෙරෙහි සංවිධානයකොට ධාර්මිකවූ රක්ෂාවරණ ගෝපනය (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.) දැහැමින් අණසක පවත්වයි.

9. "ඒ අණසක කිසියම් මනුෂ්‍යවූ පසමිතුරුවූ ප්‍රාණියෙකු විසින් නො පැවැත්විය හැකිවේ. 10. "මහණ, මෙපරිද්දෙන්ම අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ධාර්මිකවූ ධර්ම රාජන්වූ තථාගත තෙමේ වනාහි (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.) ධාර්මිකවූ රක්ෂාවරණ ගෝපනය භික්ෂූන් කෙරෙහි සංවිධාන කරයි.

11. "මෙබඳුවූ කාය කර්මය සේවනය කටයුතුය. මේ බඳුවූ

කාය කර්මය සේවනය නොකටයුතුය. මෙබඳුවූ වාක්කර්මය සේවනය කටයුතුය. මෙබඳුවූ වාක්කර්මය සේවනය නොකටයුතුය. මෙබඳුවූ මනො කර්මය සේවනය කටයුතුය. මෙබඳුවූ මනො කර්මය සේවනය නොකටයුතුය. මෙබඳුවූ ජීවිකාව සේවනය කටයුතුය. මෙබඳුවූ ජීවිකාව සේවනය නො කටයුතුය. මෙබඳුවූ ගම නියම්ගම සේවනය කටයුතුය. මෙබඳුවූ ගම නියම්ගම සේවනය නො කටයුතුයයි.

12. "මහණ නැවත අනිකක්ද කියම් අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ධාර්මිකවූ ධර්මරාජන්වූ තථාගත තෙම (මෙහි මේ සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.) ධාර්මිකවූ රක්ෂාවරණ ගෝපනය. 13. "භික්ෂූන් කෙරෙහිද, භික්ෂුණීන් කෙරෙහිද, උපාසකයන් කෙරෙහිද, උපාසිකාවන් කෙරෙහිද සංවිධාන කරයි. 14. (මේ ඡේදය මේ සූත්‍රයේ 11 ඡේදය මෙනි)

15. "මහණ ඒ මේ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ධාර්මික වූ ධර්මරාජන්වූ තථාගතතෙම (මෙහි 4 ඡේදය යෙදිය යුතුයි.) ධාර්මිකවූ රක්ෂාවරණ ගොපනය (මෙහි මේ සූත්‍රයේ 13 ඡේදය යෙදිය යුතුයි.) ධර්මයෙන්ම නිරුත්තරවූ ධර්මචක්‍රය පවත්වයි. (මෙහි මේ වර්ගයේ 31 සූත්‍රයේ 4 (ii) ඡේදය යෙදිය යුතුයි.)

34. **සකවිජිත සූත්‍රය:-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ මස්තකයෙහි අභිෂෙකකළාවූ ක්ෂත්‍රිය රජතෙම යම් යම් දිශාවක වාසය කෙරේද, ස්වකීයවූ විජිතයෙහිම වාසය කෙරෙයි. 2. "කවර පසකින්දයත්, මහණෙනි, මේ ලෝකයෙහි මස්තකයෙහි අභිෂෙක කරණ ද්දාවූ ක්ෂත්‍රිය රජතෙම, 3. 'මව් පසින්ද, පිය පසින්ද, යන දෙපසින් මනාව උපන්නේවේද, පිරිසිදු පිළිසිඳ ගැණීම් ඇත්තේද, සත්වෙනි පියමුතු පරම්පරාව දක්වා බැහැර නොකරණලද්දේ ජාතිවාදයෙන් නින්දා නොකරණලද්දේ වේද, 4. "ආඪ්‍යවූයේ මහත් ධන ඇත්තේ මහත් සම්පත් ඇත්තේ සම්පූර්ණවූ භාණ්ඩාගාර කොටුගුල් ඇත්තේවේද, බලවත්වූයේ වනාහි කීකරුවූ අවවාදය අනුව කරන්නාවූ සිව්රඟ සෙනඟින් යුක්ත වූයේවේද, මොහුට වනාහි පණ්ඩිතවූ ව්‍යක්තවූ නුවණ

ඇත්තා වූ පසුගියාවූද, පැමිණෙන්නාවූද, පවත්නාවූද, කාලයන් පිළිබඳවූ කරුණු සිතන්ට සමර්ථවූ පුත්‍රයෙක් වේද, ඔහුගේ මේ ධර්ම සතර යශස මුහුකුරුවත්, හෙතෙම මේ පස්වෙනි ධර්මයෙන් යුක්තවූයේ යම් යම් දිශාවෙක්හි වාසය කෙරේද, ස්වකීයවූ විජිතයෙහිම වාසය කෙරෙයි, 5. "ඊට හේතු කවරේදයත්, මහණෙනි, ගන්නාලද විජය ඇත්තවුන්ට මෙය මෙසේම වේ. මහණෙනි, මෙපරිද්දෙන්ම කරුණු පසකින් යුත්තවූ භික්ෂුතෙම යම් යම් දිශාවෙක්හි වාසය කෙරේද, කෙළෙසුන්ගෙන් මිදුනාවූ සිත් ඇතිව වාසය කෙරෙයි. කවර පසකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම,

**6.** "සිල්වත්වූයේවේද, ප්‍රාතිමොක්ෂ සංවර ශීලයෙන් යුක්තවූයේ වේද, ආචාරයෙන් හා ගෝචරයෙන් යුක්තව වාසය කෙරේද, ස්වල්ප තරම් වරදවල භය දක්නාසුළුවූයේ ශික්ෂා පදයන්හි සමාදන්ව හික්මේද, 7. "මස්තකයෙහි අභිෂෙක කරණ ලද්දාවූ ජාති සම්පන්නවූ ක්ෂත්‍රිය රජමෙනි.

**8.** "බහුශ්‍රැතවූයේ ඇසූදෙය දරන්නේ. අසන ලද්දාවුන් ගේ රැස්කිරීම ඇත්තේවේද, යම් ඒ ධර්මයෝ මුල යහපත් වූවාහු, මැද යහපත්වූවාහු, කෙළවර යහපත්වූවාහු අර්ථ සහිත වූවාහු ව්‍යඤ්ජන සහිතවූවාහු සිල්ලෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කෙරෙද්ද, එබඳුවූ ධර්මයෝ මොහු විසින් බොහෝකොට අසනලද්දාහු, දරණ ලද්දාහු, වචනයෙන් පුරුදු කරණ ලද්දාහු සිතින් සලකනලද්දාහු දෘෂ්ටියෙන් මනාව ප්‍රතිවේධ කරණලද්දාහු වෙද්ද,

**9.** "ආඪ්‍යවූ මහත් ධන ඇත්තාවූ මහත් සම්පත් ඇත්තාවූ පිරිපුන් ගබඩා කොටුගුල් ඇත්තාවූ මස්තකයෙහි අභිෂෙක කරණ ලද්දාවූ ක්ෂත්‍රිය රජමෙනි, 10. "පටන්ගන්නාලද වීර්ය ඇත්තේ අකුශල ධර්මයන් දුරුකිරීම පිණිසද, කුශල ධර්මයන් වැඩීම පිණිසද, ශක්ති ඇත්තේ දැඩි උත්සාහ ඇත්තේ කුශල ධර්මයන්හි බහා නොතබනලද බර ඇතිව වාසය කෙරේද, 11. "බලයෙන් යුක්තවූ මස්තකයෙහි අභිෂෙක කරණ ලද්දාවූ ක්ෂත්‍රිය රජ මෙනි.

12. ප්‍රඥා ඇත්තේ ආර්‍යවූ කෙළෙස් බිඳින්නාවූ මනා කොට දුක් නැතිකිරීම පිණිස පවත්නාවූ ඇතිවීම, නැතිවීම දැනගන්නා ප්‍රඥාවෙන් යුක්තවේද, 13. "මස්තකයෙහි අභිෂෙක කරණ ලද්දාවූ පුත්‍රයෙකු ඇත්තාවූ ක්ෂත්‍රිය රජමෙනි. "ඔහුගේ මේ ධර්ම සතර විමුක්තිය මුහුකුරුවත්, හෙතෙම මේ විමුක්තිය පස්වෙනිකොට ඇති ධර්මයෙන් යුක්තවූයේ යම් යම් දිශාවෙක්හි වාසය කෙරේද, කෙළෙසුන් ගෙන් මිදුනු සිත් ඇතිව වාසය කෙරෙයි. ඊට හේතු කවරේද යත්, මහණෙනි, කෙළෙසුන්ගෙන් මිදුනාවූ සිත් ඇත්තවුන්ට මෙය මෙසේම වේයයි" වදාළේය.

35. **රජ්ජපත්ථනා සූත්‍රය**:- 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ මස්තකයෙහි අභිෂෙක කරණලද ක්ෂත්‍රිය රජහුගේ වැඩිමහළු පුත්‍රතෙම රාජ්‍යය ප්‍රාර්ථනා කරයි. 2. "කවර පසකින්දයත්? මහණෙනි, මේ ලෝකයෙහි මස්තකයෙහි අභිෂෙක කරණලද්දාවූ ක්ෂත්‍රිය රජහුගේ වැඩිමහළු පුත්‍රතෙම, 3. (මේ ඡෙදය මේ වර්ගයේ 34 සූත්‍රයේ 3 ඡෙදයමෙනි) 4. "විශිෂ්ට රූ ඇත්තේ, දැකුම් කටයුතු වූයේ ප්‍රසාද එලවන්නේ උතුම්වූ වර්ණ සෞන්දර්යයෙන් යුක්තවේද, 5. "මව්පියන්ට ප්‍රියයෙක් මනාපයෙක්වේද, නියම්ගම් දනව් වැස්සාට ප්‍රියයෙක් මනාපයෙක් වේද, 6. "මස්තකයෙහි අභිෂෙක කරණ ලද ක්ෂත්‍රිය රජුන්ගේ යම් ඒ ඉගෙණිය යුතු කරුණු වෙද්ද. හස්තිශිල්පයෙහි හෝ අශ්ව ශිල්පයෙහි හෝ රථ ශිල්පයෙහි හෝ දුනුශිල්පයෙහි හෝ කඩු ශිල්පයෙහි හෝ එහි හික්මුනේ සමර්ථවේද, 7. "ඔහුට මෙබඳු සිතක්වෙයි, මම වනාහි (මෙහි මේ වර්ගයේ 34 සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.) කුමක් හෙයින් මම රාජ්‍යය ප්‍රාර්ථනා නොකරන්නෙම්ද? මම වනාහි (මෙහි මේ සූත්‍රයේ 4 ඡෙදය යෙදිය යුතුයි.) කුමක් හෙයින් මම රාජ්‍යය ප්‍රාර්ථනා නොකරන්නෙම්ද? මව්පියන්ට ප්‍රියවූවෙක්ද, මන වඩන්නෙක්ද වෙමි. කුමක් හෙයින් මම රාජ්‍යය ප්‍රාර්ථනා නොකරන්නමේද? මම වනාහි නියම්ගම් දනව් වැස්සාට ප්‍රිය වූවෙක්. මනවඩන්නෙක් වෙමි. කුමක් හෙයින් මම රාජ්‍යය ප්‍රාර්ථනා නොකරන්නෙම්ද? මම වනාහි (මෙහි මේ සූත්‍රයේ 6 ඡෙදය

යෙදිය යුතුයි) කුමක් හෙයින් මම රාජ්‍යය ප්‍රාර්ථනා නොකරන්නෙම්ද?' යන පසිනි. 8. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.) මහණෙනි, මෙපරිද්දෙන්ම ධර්ම පසකින් යුක්තවූ භික්ෂුතෙම ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම ප්‍රාර්ථනා කරයි. කවර පසකින්දයත්? 9. "මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ශ්‍රද්ධා ඇත්තේවේද, තථාගතයන්ගේ බොධිය (මෙහි 1 පණ්ණාසකයේ 47 සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

**10.** "ස්වල්ප ආබාධ ඇත්තේ ස්වල්පවූ රෝග ඇත්තේ ඉතා සිහිල් නුවූ ඉතා උෂ්ණනොවූ මධ්‍යමවූ වීර්යකිරීමට සුදුසුවූ සමව ආහාරපැසවීම ඇත්තාවූ ගින්නෙන් යුක්තවේද,

**11.** "කෛරාටික නොවූයේ මායා නැත්තේ තත්වූපරිදි කරුණු ශාස්තෘහු කෙරෙහි හෝ නුවණැත්තාවූ බ්‍රහ්මචාරීන් කෙරෙහි හෝ ප්‍රකාශ කරන්නෙක් වේද,

**12.** (මෙහි මේ වර්ගයේ 34 සූත්‍රයෝ 9 ඡේදය යෙදිය යුතුයි)

**13.** (මෙහි මේ වර්ගයේ 34 සූත්‍රයේ 11 ඡේදය යෙදිය යුතුයි.)

**14.** "ඔහුට මෙබඳු සිතක්වේ. මම වනාහි ශ්‍රද්ධා ඇත්තේ වෙමි. (මෙහි 1 පණ්ණාසකයේ 47 සූත්‍රයේ 2 ඡේදය යොදනු) අදහමි. කුමක්හෙයින් මම ආශ්‍රවයන්ගේ ක්ෂයකිරීම ප්‍රාර්ථනා නොකරන්නෙම්ද, (මෙහි මේ සූත්‍රයේ 10 ඡේදය යෙදිය යුතුයි.) කුමක් හෙයින් මම ආශ්‍රවයන්ගේ ක්ෂයකිරීම ප්‍රාර්ථනා නොකරන්නෙම්ද? මම වනාහි කෛරාටික නුවූයේ මායා නැත්තේ තත්වූ පරිදි කරුණු ශාස්තෘහු කෙරෙහි හෝ නුවණැත්තාවූ සබ්‍රම්සරහු කෙරෙහි හෝ ප්‍රකාශ කරන්නේ වෙමි. කුමක් හෙයින් මම ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම ප්‍රාර්ථනා නොකරන්නෙම්ද? මම වනාහි (මෙහි මේ වර්ගයේ 34 සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.) කුමක් හෙයින් මම ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම ප්‍රාර්ථනා නොකරන්නෙම්ද, මම වනාහි (මෙහි මේ වර්ගයේ 34 සූත්‍රයේ 11 ඡේදය යෙදිය යුතුයි.) කුමක් හෙයින් මම ආශ්‍රවයන්ගේ ක්ෂයකිරීම ප්‍රාර්ථනා නොකරන්නෙම් දැයි යන පසිනි. (මෙහි මේ 34 සූත්‍රයේ 8 (ii) ඡේදය යෙදිය යුතුයි.)

**36. ඔපරජ්ජපත්ථනා සූත්‍රය**:- 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ මස්තකයෙහි අභිෂෙක කරණලද ක්ෂත්‍රිය රජහුගේ වැඩිමහළු පුත්‍රතෙම යුවරජ බව පතයි. 2, 5, (මේ ඡේද මේ වර්ගයේ 35 සූත්‍රයේ 2, 5 ඡේද මෙනි.)

**6.** "බල සෙනගට ප්‍රියවූවෙක් මන වඩන්නෙක් වේද, පණ්ඩිතවූයේ ව්‍යක්තවූයේ නුවණැත්තේ ඉකුත්වූ පැමිණෙන්නාවූ පවත්නාවූ අර්ථයන් සිතන්ට සමර්ථවේද, 7. "ඔහුට මෙබඳු සිතක් වෙයි. මම වනාහි (මෙහි මේ වර්ගයේ 34 සූත්‍රයේ 3 ඡේදය මෙනි) කුමක් හෙයින් මම යුවරජ බැව් නොපතන්නෙම්ද? වනාහි (මෙහි මේ වර්ගයේ 35 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.) කුමක් හෙයින් මම යුව රජ බැව් නොපතන්නෙම්ද, මම වනාහි මව් පියන්ට ප්‍රියවූවෙක් මනවඩන්නෙක් වෙමි. කුමක්හෙයින් මම යුවරජ බැව් නොපතන්නෙම්ද? මම වනාහි බල සෙනඟට ප්‍රියවූවෙක් මන වඩන්නෙක් වෙමි. කුමක් හෙයින් මම යුවරජ බැව් නොපතන්නෙම්ද? මම වනාහි පණ්ඩිතවූයේ ව්‍යක්තවූයේ නුවණැත්තේ ඉකුත්වූ පැමිණෙන්නාවූ පවත්නාවූ අර්ථයන් සිතන්ට සමර්ථවෙමි. කුමක් හෙයින් මම යුවරජ බැව් නොපතන්නෙම් දැයි යන පසිනි. 8 (i) මහණෙනි, මේ කරුණු පසින් යුක්තවූ මස්තකයෙහි අභිෂෙක කරණ ලද ක්ෂත්‍රිය රජහුගේ වැඩිමහළු පුත්‍රතෙම යුවරජ බැව් පතයි. (ii) මහණෙනි, මෙපරිද්දෙන්ම ධර්ම පසකින් යුක්තවූ භික්ෂුතෙම ආශ්‍රවයන් නැසීම් පතයි. 9. (මෙහි මේ වර්ගයේ 34 සූත්‍රයේ 4, 6 ඡේද යෙදිය යුතුයි.) 10. සතර සතිපට්ඨානයන්හි නොව පිහිටුවන ලද සිත් ඇත්තේ වේද, මෙහි මේ වර්ගයේ 34 සූත්‍රයේ 8 ඡේදය හා 10 ඡේදය යෙදිය යුතුයි.) ඔහුට මෙබඳු සිතක් වෙයි. මම වනාහි (මෙහි 9 සූත්‍රයේ 4 ඡේදය යෙදිය යුතුයි.) 11 කුමක් හෙයින් මම ආශ්‍රවයන් නැසීම නොපතන්නෙම්ද? මම වනාහි (මෙහි මේ වර්ගයේ 34 සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) 12. 'කුමක් හෙයින් මම ආශ්‍රවයන් නැසීම නොපතන්නෙම්ද? මම වනාහි (මෙහි මේ වර්ගයේ 34 සූත්‍රයේ 8 ඡේදය යෙදිය යුතුයි.)

කුමක් හෙයින් මම ආශ්‍රවයන් නැසීම නොපතන්නෙම්ද, මම වනාහි (මේ ඡේදය මේ වර්ගයේ 34 සූත්‍රයේ 10 ඡේදය මෙනි.) කුමක් හෙයින් මම ආශ්‍රවයන් නැසීම නොපතන්නෙම්දැයි යන පසිනි. (මෙහි 8 (ii) යෙදිය යුතුයි.)

**37. අප්පසුපන සූත්‍රය**:- 1. "මහණෙනි, මොහු පස්දෙනෙක් රාත්‍රියෙහි ස්වල්පකොට නිදත්. බොහෝකොට නොනිදත්.

2. (i) 'කවර පස්දෙනෙක්ද යත්? මහණෙනි, පුරුෂයන් කෙරෙහි අදහස් ඇති ස්ත්‍රීතොමෝ (ii) රාත්‍රියෙහි ස්වල්පකොට නිදයි. බොහෝකොට නොනිදයි. මහණෙනි, ස්ත්‍රීන් කෙරෙහි අදහස් ඇති පුරුෂතෙම (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, ගැණීමෙහි අදහස් ඇති චෞරතෙම (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, රජයෙහි කටයුතුවල යෙදුනාවූ රජතෙම (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) මහණෙනි, විසංයෝගයෙහි හෙවත් නිවණෙහි අදහස් ඇත්තාවූ භික්ෂුතෙම (මෙහි 2 (ii) යෙදිය යුතුයි.) 3. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

**38. භත්තාදක නාද සූත්‍රය**:- 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ රජහුගේ හස්තිතෙම බත් අනුභව කරන්නෙක්ද අවකාශය පතුරුවන්නෙක්ද ලඩ හෙළන්නෙක්ද සළාක ගන්නෙක්ද වේ. රජහුගේ හස්තියාය කියාම සංඛ්‍යාවට පැමිණේ 2. "කවර පසකින්ද යත්? මහණෙනි, මේ ලෝකයෙහි රජහුගේ හස්තිතෙම 3. "රූපයන් නොඉවසන්නේ වේද ශබ්දයන් නොඉවසන්නේ වේද, ගන්ධයන් නොඉවසන්නේ වේද, රසයන් නොඉවසන්නේ වේද, ස්පර්ශ කළයුත්ත නොඉවසන්නේ වේද යන පසිනි. 4 (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.) 5. "මහණෙනි, මෙපරිද්දෙන්ම කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම බත් අනුභව කරන්නෙක්ද අවකාශය පතුරුවන්නෙක්ද, පුටුව මඩින්නෙක්ද, සළාක කන්නෙක්ද වේ, භික්ෂුය කියාම සංඛ්‍යාවට පැමිණේ. 6 "කවරපසකින්දයත්? මහණෙනි, මේශාසනයෙහි භික්ෂුතෙම (මෙහි මේ සූත්‍රයේ 3 ඡේදය යෙදිය යුතුයි.) 7 (මෙහි මේ සූත්‍රයේ

5 ඡේදය මෙනි.)

**39. අක්ඛම නාග සූත්‍රයඃ-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ රජහුගේ හස්තිතෙම රජුන්ට සුදුසු නොවෙයි. රජුන් විසින් පරිභොග කටයුතු නොවෙයි. රජහුගේ අවයවයක්ය කියාම සංඛ්‍යාවට නොපැමිණේ 2-3 (මේ ඡේද මේ වර්ගයේ 38 සූත්‍රයේ 2, 3 ඡේද මෙන් වෙත්) 4. "මහණෙනි, කෙසේ නම් රජහුගේ හස්තිතෙම රූපයන් නොඉවසන්නේ වේද? 5. "මහණෙනි, මෙහි රජහුගේ හස්තිතෙම යුද්ධයට පැමිණියේ හස්ති සේනාව හෝ දැක අශ්වසේනාව හෝ දැක රථ සේනාව හෝ දැක පාබල සේනාව හෝ දැක, 6. පසුබසියිද, විශෙෂයෙන් ගැලෙයිද, ස්ථිරව නොසිටියිද, යුද්ධයට බැසගන්ට නොහැකිවේද, 7. "මහණෙනි, මෙසේ වනාහි රජහුගේ හස්තිතෙම රූපයන් නොඉවසන්නේවේ. මහණෙනි, කෙසේනම් රජහුගේ හස්තිතෙම ශබ්දයන් නොඉවසන්නේ වේද 8. "මහණෙනි, මෙහි රජහුගේ හස්තිතෙම යුද්ධයට පැමිණියේ ඇතුන්ගේ ශබ්දයක් හෝ අසා අසුන්ගේ ශබ්දයක් හෝ අසා රථයන්ගේ ශබ්දයක් හෝ අසා පාබල සේනාවගේ ශබ්දයක් හෝ අසා බෙර පනාබෙර සක් සින්නය නාදයක් හෝ අසා, 9. (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදීම යුතුයි.) මහණෙනි, මෙසේ වනාහි රජහුගේ හස්ති තෙම ශබ්දයන් නොඉවසන්නේ වේ. මහණෙනි, කෙසේ නම් රජහුගේ හස්ති තෙම ගන්ධයන් නොඉවසන්නේ වේද, 10. "මහණෙනි, මෙහි රජහුගේ හස්ති තෙම යුද්ධයට පැමිණියේ මනාව උපන්නාවූ යුද්ධභූමියෙහි හැසිරෙන්නාවූ යම් ඒ රජහුගේ හස්තීහු වෙද්ද, ඔවුන්ගේ මල මුත්‍ර ගඳ ආඝ්‍රාණය කොට (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙසේ වනාහි රජහුගේ හස්තිතෙම ගන්ධයන් නොඉවසන්නේ වෙයි. මහණෙනි, කෙසේනම් රජහුගේ හස්ති තෙම රසයන් නොඉවසන්නේ වේද 11. "මහණෙනි, මෙහි රජහුගේ හස්ති තෙම යුද්ධයට පැමිණියේ එක්දිනකවූ තණ දිය දීමකින් හෝ බුහුමන් නොලද්දේ දෙකකින් හෝ තුනකින් හෝ සතරකින් හෝ පහකින් හෝ තණ දිය දීම් වලින් බුහුමන් නොලද්දේ, (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) 12. "මහණෙනි, මෙසේ වනාහි රජහුගේ හස්තිතෙම

රසයන් නොඉවසන්නේ වෙයි මහණෙනි, කෙසේ නම් රජහුගේ හස්ති තෙම ස්පර්ශ කළ යුත්තන් නොඉවසන්නේ වේද? 13. "මහණෙනි, මෙහි රජහුගේ හස්තිතෙම යුද්ධයට පැමිණියේ එක් ඊසැර විදීමකින් විදින ලද්දේ හෝ දෙකකින් හෝ තුනකින් හෝ සතරකින් හෝ පසකින් හෝ ඊසැර විදුම් වලින් විදින ලද්දේ, 14. (මෙහි මේ සූත්‍රයේ 6 ඡේදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙසේ වනාහි රජහුගේ හස්තිතෙම ස්පර්ශ කළ යුත්තන් නො ඉවසන්නේ වෙයි. 15. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි)

16. "මහණෙනි, මෙපරිද්දෙන්ම අංග පසකින් යුක්තවූ භික්ෂුතෙම පූජාවට සුදුසු නොවෙයි. දුර සිට ගෙණෙන ලද සත්කාරයට සුදුසු නොවෙයි. දක්ෂිණාවට සුදුසු නොවෙයි ඇඳිලිකිරීමට සුදුසු නොවෙයි. ලෝකයාගේ උතුම් පින්කෙත නොවෙයි 17. (මෙහි මේ වර්ගයේ 38 සූත්‍රයේ 2, 3 ඡේද යෙදිය යුතුයි.)

18. "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම රූපයන් නොඉවසන්නේ වේද? මහණෙනි, මෙහි භික්ෂුතෙම ඇසින් රූපය දැක ඇළුම් කටයුතු රූපයෙහි ඇලේද, (ii) අරමුනෙහි සිත පිහිටුවන්ට නොහැකිවේද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම (ii) රූපයන් නොඉවසන්නේවේ. මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම ශබ්දයන් නොඉවසන්නේ වේද, මහණෙනි, මෙහි භික්ෂුතෙම කණින් ශබ්දය අසා, ඇලුම් කටයුතු ශබ්දයෙහි ඇලේද, (මෙහි මේ ඡේදයේ ii යෙදිය යුතුයි.) ශබ්දයන් නොඉවසන්නේ වේ. මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම ගන්ධන් නොඉවසන්නේ වේද, මහණෙනි, මෙහි භික්ෂුතෙම නාසයෙන් ගන්ධය ආඝ්‍රාණයකොට ඇලුම් කටයුතු ගන්ධයෙහි ඇලේද, (මෙහි මේ ඡේදයේ ii යෙදිය යුතුයි.) ගන්ධයන් නොඉවසන්නේ වේ. මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම රසයන් නොඉවසන්නේ වේද, මහණෙනි, මෙහි භික්ෂුතෙම දිවෙන් රසය විඳ ඇලුම් කටයුතු රසයෙහි ඇලේද, (මෙහි මේ ඡේදයේ ii යෙදිය යුතුයි.) රසයන් නොඉවසන්නේ වෙයි. මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම ස්පර්ශ කළ යුත්තන් නොඉවසන්නේ

වේද? මහණෙනි මෙහි භික්ෂුතෙම කයින් ස්පර්ශ කළයුත්ත ස්පර්ශ කොට ඇලුම් කටයුතුවූ ස්පර්ශ කළ යුත්තෙහි ඇලේද, (මෙහි මේ ඡෙදයේ ii යෙදිය යුතුයි) ස්පර්ශ කළයුත්තන් නොඉවසන්නේ වේ.

19. (මෙය 16 ඡෙදය මෙනි)

**20.** "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ රජහුගේ හස්තිතෙම රජුන්ට සුදුසුවේ. රජුන් විසින් පරිභොග කටයුතුවේ. රජහුගේ අවයවයක කියාම සංඛ්‍යාවට පැමිණේ.

**21.** "කවර පසකින්ද යත්? මහණෙනි, මෙහි රජහුගේ හස්තිතෙම (ii) රූපයන් ඉවසන්නේ වේද, ශබ්දයන් ඉවසන්නේ වේද, ගන්ධයන් ඉවසන්නේ වේද, රසයන් ඉවසන්නේ වේද, ස්පර්ශ කළයුත්තන් ඉවසන්නේ වේද යන පසිනි.

**22.** "මහණෙනි, කෙසේ නම් රජහුගේ හස්තිතෙම රූපයන් ඉවසන්නේ වේද, (මෙහි මේ සූත්‍රයේ 5 ඡෙදය යෙදිය යුතුයි.) නොපසුබසීද, විශෙෂයෙන් නොගැලෙයිද, ස්ථිරව සිටියිද, යුද්ධයට බැසගන්ට හැකිවේද, මහණෙනි, මෙසේ වනාහි රජහුගේ හස්තිතෙම රූපයන් ඉවසන්නේ වේ. මහණෙනි, කෙසේ නම් රජහුගේ හස්ති තෙම ශබ්දයන් ඉවසන්නේ වේද? (මේ ඡෙදය මේ සූත්‍රයේ 8 ඡෙදය මෙනි) (මෙහි මේ සූත්‍රයේ 21 ඡෙදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙසේ වනාහි රජහුගේ හස්තිතෙම ශබ්දයන් ඉවසන්නේ වෙයි. "මහණෙනි, කෙසේ නම් රජහුගේ හස්තිතෙම ගන්ධයන් ඉවසන්නේ වේද, (මෙහි මේ සූත්‍රයේ 10 ඡෙදය 1 ඡෙදය ද යෙදිය යුතුයි) මහණෙනි, මෙසේ වනාහි රජහුගේ හස්තිතෙම ගන්ධයන් ඉවසන්නේ වේ. "මහණෙනි, කෙසේ නම් රජහුගේ හස්තිතෙම රසයන් ඉවසන්නේ වේද, (මෙහි මේ සූත්‍රයේ 11, 21 ඡෙදය යෙදිය යුතුයි.) මහණෙනි, මෙසේ වනාහි රජහුගේ හස්තිතෙම රසයන් ඉවසන්නේ වෙයි. මහණෙනි කෙසේ නම් රජහුගේ හස්තිතෙම ස්පර්ශ කළ යුත්තන් ඉවසන්නේ වේද, (මෙහි මේ සූත්‍රයේ 13, 21 ඡෙද යෙදිය යුතුයි) මහණෙනි, මෙසේ වනාහි රජහුගේ හස්ති තෙම ස්පර්ශ කළ යුත්තන් ඉවසන්නේ වේ. (මේ ඡෙදය

මේ සූත්‍රයේ 24 ඡෙදය මෙනි.)

**23.** "මහණෙනි, මෙපරිද්දෙන්ම (මෙහි මේ පණ්ණාසකයේ 7 සූත්‍රයේ 1 ඡෙදය යෙදිය යුතුයි.)

**24.** "කවර පසකින්ද යත්? මහණෙනි, මෙහි භික්ෂු තෙම (මෙය මේ සූත්‍රයේ 21 (ii) ඡෙදය මෙනි)

**25.** "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම රූප ඉවසන්නේ වේද මහණෙනි, මෙහි භික්ෂු තෙම ඇසින් රූපය දැක ඇළුම් කටයුතුවූ රූපයෙහි නොඇලේද, (ii) මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම (iii) රූප ඉවසන්නේ වේ, මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම ශබ්ද ඉවසන්නේවේද, මහණෙනි, මෙහි භික්ෂුතෙම කණින් ශබ්දය අසා ඇළුම් කටයුතුවූ ශබ්දයෙහි නොඇලේද, (මෙහි ii ඡෙදය යෙදිය යුතුයි) ශබ්ද ඉවසන්නේවේ. මහණෙනි, කෙසේනම් භික්ෂුතෙම ගඳ ඉවසන්නේ වේද, මහණෙනි, මෙහි භික්ෂුතෙම නාසයෙන් ගඳ ආඝ්‍රාණයකොට ඇළුම් කටයුතු ගඳෙහි නොඇලේද, (මෙහි ii ඡෙදය යෙදිය යුතුයි.) ගඳ ඉවසන්නේ වේ. මහණෙනි, කෙසේනම් භික්ෂුතෙම රස ඉවසන්නේවේද, මහණෙනි මෙහි භික්ෂුතෙම දිවෙන් රසය විඳ ඇළුම් කටයුතු රසයෙහි නොඇලේද, (මෙහි ii ඡෙදය යෙදිය යුතුයි.) රස ඉවසන්නේ වේ. "මහණෙනි, කෙසේනම් භික්ෂුතෙම ස්පර්ශ කළයුත්ත ඉවසන්නේවේද, මහණෙනි, මෙහි භික්ෂුතෙම කයින් ස්පර්ශ කළ යුත්ත ස්පර්ශකොට ඇළුම් කටයුතුවූ ස්පර්ශ කළ යුත්තෙහි නොඇලේද, (මෙහි ii ඡෙදය යෙදිය යුතුයි) ස්පර්ශ කළයුත්ත ඉවසන්නේ වේ. (මේ ඡෙදය මේ සූත්‍රයේ 23 ඡෙදය මෙනි.)

**40. සොතාරනාග සූත්‍රයඃ-** 1. "මහණෙනි, අංග පසකින් යුක්තවූ රජහුගේ හස්තිතෙම රජුන්ට සුදුසු වේ. රජුන් විසින් පරිභොග කටයුතු වේ. රජහුගේ අංගයකැයි සංඛ්‍යාවට පැමිණේ. 'කවර පසකින්ද යත්, මහණෙනි, මෙහි රජහුගේ හස්තිතෙම 2. "අසන්නේදවේ. නසන්නේද, රකින්නේද, ඉවසන්නේද, යන්නේද වේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "මහණෙනි, කෙසේ නම් රජහුගේ හස්තිතෙම අසන්නේ වේද? මෙහි රජුගේ හස්තිතෙම ඇතුන් හික්මවන සාරථියා යම් ඒ කටයුත්තක් කරවාද, ඉදින් කළ විරූ දෙයක් හෝ ඉදින් කළ විරූ දෙයක් හෝ එය කරුණු වශයෙන් සළකා මෙනෙහිකොට සියල්ල සිතින් එකතුකොට බහාතබන ලද කන් ඇත්තේ අසාද, මහණෙනි, මෙසේ වනාහි රජහුගේ හස්තිතෙම අසන්නේ වේ. මහණෙනි, කෙසේනම් රජහුගේ හස්තිතෙම නසන්නේවේද? මහණෙනි, මෙහි රජහුගේ හස්තිතෙම යුද්ධයට පැමිණියේ ඇතුද නසයි. ඇතරුවාද නසයි. අසුද නසයි. අසරුවාද නසයි. රියද නසයි. රියෙහි වූවාහුද නසයි. පාබල සෙනඟද නසයි. මහණෙනි. මෙසේ වනාහි රජහුගේ හස්තිතෙම නසන්නේ වේ. මහණෙනි, කෙසේනම් රජහුගේ හස්තිතෙම රකින්නේ වේද? මහණෙනි, මෙහි රජහුගේ හස්ති තෙම යුද්ධයට පැමිණියේ ඉදිරි කය රකියිද, පැසුළු කය රකියිද, ඉදිරි පා රකියිද, පැසුළු පා රකියිද, හිස රකියිද, කන් රකියිද, දළ රකියිද, සොඬ රකියිද, වලිගය රකියිද, ඇත්රුවා රකියිද මහණෙනි, මෙසේ වනාහි රජහුගේ හස්ති තෙම රකින්නේවේ. මහණෙනි කෙසේනම් රජහුගේ හස්තිතෙම ඉවසන්නේ වේද මහණෙනි, මෙහි රජහුගේ ඇත්තෙම අඩයටි පහරවල්ද, කඩු පහරවල්ද, ඊ පහරවල්ද, පොරෝ පහරවල්ද, බෙර පනාබෙර සක් සින්නම් නාදයන් ඉවසන්නේ වේද, මහණෙනි මෙසේ වනාහි රජහුගේ හස්තිතෙම ඉවසන්නේවේ. මහණෙනි කෙසේ නම් රජහුගේ හස්තිතෙම යන්නේ වේද, මහණෙනි, මෙහි රජහුගේ හස්තිතෙම ඇතුන් හික්මවන සාරථියා යම් මේ දිශාවකට යවාද, ඉදින් පෙර ගිය දිශාවකට හෝ ඉදින් පෙර නොගිය දිශාවකට හෝ ඒ දිශාවට වහාම යන්නේ වේද, මහණෙනි, මෙසේ වනාහි රජහුගේ හස්තිතෙම යන්නේ වේ. 4. (මේ ඡෙදය මේ සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

5. (මේ ඡෙදය මේ වර්ගයේ 39 සූත්‍රයේ 23 ඡෙදය මෙනි)

6. "කවර පසකින්ද යත්? මහණෙනි, මෙහි භික්ෂුතෙම අසන්නේද, (මෙහි මේ වර්ගයේ 39 සූත්‍රයේ 24 ඡෙදය යෙදිය යුතුයි.)

7. මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම අසන්නේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණලද ධර්ම විනය දෙශනා කරණු ලබන කල්හි අර්ථවත් කොට මෙනෙහි කොට සියල්ල සිතින් රැස්කොට බහා තබනලද කන් ඇත්තෝ ධර්මය අසාද මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම අසන්නේවේ 8. "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම නසන්නේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම උපන්නාවූ කාම විතර්කය, 9. "නොඉවසාද, දුරු කෙරේද, බැහැර කෙරේද, කෙළවර කෙරේද, නැවත අභාවයට පමුණුවාද, 10. උපන්නාවූ ව්‍යාපාද විතර්කය (මෙහි මේ සූත්‍රයේ 9 ඡෙදය යෙදිය යුතුයි) උපන්නාවූ විහිංසා විතර්කය (මෙහි මේ සූත්‍රයේ 9 ඡෙදය යෙදිය යුතුයි.) උපනූපන් ලාමකවූ අකුශල ධර්මයන් (මෙහි මේ සූත්‍රයේ 9 ඡෙදය යෙදිය යුතුයි) මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම නසන්නේ වේ. 11 "මහණෙනි කෙසේ නම් භික්ෂුතෙම රකින්නේවේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම ඇසින් රූපය දැක (ii) නිමිති වශයෙන් ගන්නේ නොවේද, කුඩා ලකුනු වශයෙන් ගන්නේ නොවේද, යමක් හේතුකොටගෙන (iii) මේ චක්ෂුරින්ද්‍රියෙහි, 12. "සංවර නැතිව වාසය කරන්නහුට විෂම ලෝභය දොම්නස්ය යන ලාමකවූ අකුශල ධර්මයෝ අනුව වැහෙන්නාහුද, ඔහුගේ සංවරය පිණිස පිළිපදීද,

13. "චක්ෂුරින්ද්‍රිය රකීද, චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණේද, 14. "කණින් ශබ්ද අසා (මෙහි 11 (ii) යෙදිය යුතුයි.) මේ ශ්‍රෝත්‍රේන්ද්‍රියයෙහි (මෙහි මේ සූත්‍රයේ 16 ඡෙදය යෙදිය යුතුයි.) ශ්‍රෝත්‍රේන්ද්‍රිය රකීද, ශ්‍රෝත්‍රේන්ද්‍රියයෙහි සංවරයට පැමිණේද, නාසයෙන් ගන්ධය ආඝ්‍රාණය කොට (මෙහි 11 (ii) යෙදිය යුතුයි.) මේඝාණේන්ද්‍රියයෙහි (මෙහි මේ සූත්‍රයේ 16 ඡෙදය යෙදිය යුතුයි) ඝාණේන්ද්‍රිය රකීද, ඝාණේන්ද්‍රියයෙහි සංවරයට පැමිණේද, දිවෙන් රසය විඳ (මෙහි 11 (ii) යෙදිය යුතුයි.) මේ ජිව්හා ඉන්ද්‍රියයෙහි (මෙහි මේ සූත්‍රයේ 16 ඡෙදය යෙදිය යුතුයි.) ජිව්හාඉන්ද්‍රිය රකීද, ජිව්හා ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේද, කයින් ස්පර්ශ කළයුත්ත ස්පර්ශ කොට (මෙහි 11

(ii) යෙදිය යුතුයි.) මේ කායේන්ද්‍රියෙහි (මෙහි මේ සූත්‍රයේ 16 ඡේදය යෙදිය යුතුයි) කායේන්ද්‍රිය රකීද, කායේන්ද්‍රියයෙහි සංවරයට පැමිණේද, සිතින් ධර්මය දැන (මෙහි 11 (ii) යෙදිය යුතුයි.) මේ මනින්ද්‍රිය (මෙහි මේ සූත්‍රයේ 16 ඡේදය යෙදිය යුතුයි) මනින්ද්‍රිය රකීද, මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයිද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම රකින්නේවේ. 15. " මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම ඉවසන්නේ වේද? මහණෙනි මේ ශාසනයෙහි භික්ෂූතෙම ශීතය ඉවසන්නේ වේද, උෂ්ණය සාදුක, පිපාසය ඉවසන්නේ වේද, ඩැහැලේ බොන මැස්සෝය, මදුරුවෝය, සුළඟය, අව්වය, සර්පය, යන මොවුන්ගේ ස්පර්ශයන් ඉවසන්නේ වේද, නපුරුකොට කියන ලද නපුරුසේ පැමිණියාවූ වචන පථයන් ඉවසන්නේ වේද, උපන්නාවූ ශරීරයෙහි හටගත්තාවූ දුක්වූ තියුණුවූ රළුවූ කටුකවූ අමිහිරිවූ අමනාපවූ ප්‍රාණය හැරගන්නාවූ වේදනාවන් ඉවසන ස්වභාව ඇත්තේ වේද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂු තෙම ඉවසන්නේවේ. මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම යන්නේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම යම් ඒ දිශාවක් තොමෝ මේ දීර්ඝාවූ කාලයකින් නොගිය විරිද, එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම ඇත්තාවූ සියලු කෙලෙසුන්ගේ දුරලීම ඇත්තාවූ තෘෂ්ණාවගේ ක්ෂය කිරීම ඇත්තාවූ විරාගවූ නිරොධවූ නිර්වාණයයි ඒ දිශාවට වහාම යන්නේ වේද, මහණෙනි, මෙසේ වනාහි භික්ෂුතෙම යන්නේ වේ. 16. (මේ ඡේදය මේ වර්ගයේ 39 සූත්‍රයේ 33 ඡේදය මෙනි.)

---

## 15 තිකණ්ටකී වර්ගය

41. දත්වා අවජානන සූත්‍රයː- 1. "මහණෙනි, මේ පුද්ගලයෝ පස්දෙනෙක් ඇත්තාහු ලෝකයෙහි විද්‍යමාන වෙත්.

2. "කවර පස් දෙනෙක්ද යත්? දානය කොට අවමන් කෙරෙයි. එක්ව විසීමෙන් අවමන් කරයි. ගැණීමෙහි දොරටු ඇත්තේ වේ. ලොල්වූයේ වෙයි. මද නුවණ ඇත්තේ අතිශයින්

මුළාවූයේ වෙයි යන මොහුය.

3. "මහණෙනි, කෙසේනම් පුද්ගලතෙම දානය දී අවමන් කෙරේද? මහණෙනි, මේ ලෝකයෙහි පුද්ගලතෙම පුද්ගලයෙකුට සිවුරු, පිණ්ඩපාත, ශයනාසන, ගිලන්පස, බෙහෙත් පිරිකර දේද, ඔහුට මෙබඳු සිතක් වේ. 'මම දෙමි. මෙතෙමේ පිළිගනීයයි' ඔහුට දානයදී අවමන් කෙරෙයි. මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම දානය දී අවමන් කෙරෙයි. මහණෙනි, කෙසේනම් පුද්ගලතෙම එක්ව විසීමෙන් අවමන් කෙරේද? මහණෙනි, මෙහි පුද්ගලතෙම පුද්ගලයෙකු සමග අවුරුදු දෙකක් හෝ තුනක් හෝ වාසය කරයිද, ඔහුට එක්ව විසීමෙන් අවමන් කරයිද, මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම එක්ව විසීමෙන් අවමන් කරයි. "මහණෙනි, කෙසේනම් පුද්ගලතෙම ගැණීමෙහි දොරටු ඇත්තේ වේද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක්තෙම අනිකාගේ ගුණයක් හෝ අගුණයක් හෝ කියනු ලබන කල්හී එය වහාම අදහන්නේ වේද, මහණෙනි, මෙසේ වනාහි පුද්ගල තෙම ගැණීමෙහි දොරටු ඇත්තේ වේ. මහණෙනි, කෙසේනම් පුද්ගලතෙම ලොල්වූයේ වේද, මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම මඳවූ ශ්‍රද්ධා ඇත්තේ මඳවූ භක්ති ඇත්තේ මඳවූ ප්‍රේම ඇත්තේ මඳවූ ප්‍රසාද ඇත්තේ වේද, මහණෙනි, මෙසේ වනාහී පුද්ගලතෙම ලොල්වූයේ වෙයි. මහණෙනි, කෙසේනම් පුද්ගලතෙම මඳ නුවණ ඇත්තේ ඉතා මුළාවූයේ වේද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක්තෙම කුශලා කුශල ධර්මයක් නොදනීද? සාවද්‍ය අනවද්‍ය ධර්මයන් නොදනීද, හීන ප්‍රණීත ධර්මයන් නොදනීද, තෘෂ්ණා ශුක්ල සප්‍රතිභාග ධර්මයන් නොදනීද, මහණෙනි, මෙසේ වනාහි පුද්ගලතෙම මඳ නුවණ ඇත්තේ ඉතා මුළාවූයේ වේ. 8. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

**42. විප්පටිසාරී සූත්‍රයඃ-** 1. මහණෙනි, මේ පුද්ගලයෝ පස්දෙනෙක් ඇත්තාහු. ලෝකයෙහි විද්‍යමාන වෙත්. 2. "කවර පස්දෙනෙක්ද යත්? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම ඇවැත්ද මඩියි. ඒ හේතුවෙන් විපිළිසර

ඇත්තේද වේ. 3. "යම් තැනක මොහුගේ ඒ උපන් ලාමකවූ අකුශල ධර්මයෝ නිරවශෙෂව නිරුද්ධ වෙද්ද, ඒ අර්හත් සමාධියද, අර්හත් ඵල ඥානයද නොදනී 4. "මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් වනාහි ඇවැත් මඩීද, විපිළිසර ඇත්තේනොවේද, (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදියයුතුයි.) මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් වනාහි ඇවැත් නොමඩීද, විපිළිසර ඇත්තේවේද, (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.) මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් ඇවැත් නොමඩියිද විපිළිසර ඇත්තේ නොවේද, (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.) මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් ඇවැත් නොමඩීද, විපිළිසර ඇත්තේ නොවෙයිද, 5. "යම් තැනෙක්හි මොහුගේ ඒ උපන් ලාමකවූ අකුශල ධර්මයෝ නිරවශෙෂව නිරුද්ධ වෙද්ද, ඒ අර්හත් මාර්ග සමාධියද, අර්හත්ඵල ඥානයද තත්වූ පරිද්දෙන් දනියි. (යන පස්දෙනයි.) 6. "මහණෙනි, එහි යම් මේ පුද්ගලයෙක් තෙම ඇවැත් මඩීද, ඒ හේතුවෙන් විපිළිසර ඇත්තේ වේද, (මෙහි මේ සූත්‍රයේ 3 ඡෙදය යෙදිය යුතුයි.)

7. "හෙතෙම මෙසේ කියයුතු වන්නේය. (ii) 'ආයුෂ්මත්හුගේ වනාහි ඇවැත් මැඩීමෙන් හටගත්තාවූ ආශ්‍රවයෝ විද්‍යමානවෙත්. (iii) විපිළිසර වීමෙන් හටගත්තාවූ ආශ්‍රවයෝ බොහෝසෙයින් වැඩෙත්. ආයුෂ්මත්තෙමේ ඇවැත් මැඩීමෙන් හටගත්තාවූ ආශ්‍රවයන් හැර විපිළිසර වීමෙන් හටගත්තාවූ ආශ්‍රවයන් දුරලා විදර්ශනා සිතද එය හා යෙදුනු ප්‍රඥාවද වඩන සේක්වා, ඒකාන්තයෙන් යහපති. මෙසේ ආයුෂ්මත් තෙමේ මේ පස්වන පුද්ගලයා හා සම සමවූවෙක් වන්නේයයි.

8. "මහණෙනි, එහි යම් මේ පුද්ගලයෙක්තෙම ඇවැත් මඩීද, විපිළිසර ඇත්තේ නොවේද, (මෙහි මේ සූත්‍රයේ 5 ඡෙදය යෙදිය යුතුයි.)

9. "හෙතෙම මෙසේ කියයුතු වන්නේය. (මෙහි 7 (ii) යෙදිය යුතුයි. විපිළිසරයෙන් හටගත් ආශ්‍රවයෝ බොහෝ සෙයින්

නොවැඩෙත්. ආයුෂ්මත් තෙමේ ඇවැත් මැඩීමෙන් හටගත් ආශ්‍රවයන් හැර විදර්ශනා සිතද ප්‍රඥාවද වඩාවා ඉතා මැනවි මෙසේ ආයුෂ්මත් තෙමේ මේ පස්වන පුද්ගලයා හා සම සම වූවෙක් වන්නේයයි' 10. 'මහණෙනි, එහි යම් මේ පුද්ගලයෙක්තෙම ඇවැත් නොමඩීද, විපිළිසර ඇත්තේ වේද, (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.)

11. "හෙතෙම මෙසේ කියයුතු වන්නේය. (ii) 'ආයුෂ්මත්' හුගේ වනාහි ඇවැත් මැඩීමෙන් හටගත්තාවූ ආශ්‍රවයෝ විද්‍යමාන නොවෙත් (iii) විපිළිසරයෙන් හටගත්තාවූ ආශ්‍රවයෝ බොහෝ සෙයින් වැඩෙත්. ආයුෂ්මත් තෙමේ විපිළිසරයෙන් හටගත් ආශ්‍රවයන් දුරු කොට විදර්ශනා සිතද ඒ හා යෙදුන ප්‍රඥාවද වඩාවා ඉතා යහපති. මෙසේ ආයුෂ්මත් තෙමේ මේ පස්වන පුද්ගලයා හා සම සමවූවෙක් වන්නේයයි. 12. "මහණෙනි, එහි යම් මේ පුද්ගලයෙක් තෙම ඇවැත් නොමඩීද, විපිළිසර ඇත්තේ නොවේද, (මෙහි මේ සූත්‍රයේ 5 ඡේදය යෙදිය යුතුයි.)

13. "හෙතෙම මෙසේ කියයුතු වන්නේය. 'ආයුෂ්මත්හු (මෙහි 11 (ii) යෙදිය යුතුයි) විපිළිසරයෙන් හටගත් ආශ්‍රවයෝ බොහෝසෙයින් නොවැඩෙත්. ආයුෂ්මත් තෙමේ විදර්ශනා සිතද ඒ හා යෙදුනු ප්‍රඥාවද වඩාවා ඉතා යහපති. මෙසේ ආයුෂ්මත් තෙමේ මේ පස්වන පුද්ගලයා හා සම සමවූවෙක් වන්නේයයි 14. "මහණෙනි, මෙසේ වනාහි මේ පුද්ගලයන් සතරදෙනා මේ පස්වන පුද්ගලයා විසින් මෙසේ අවවාද කරණු ලබන්නාහු මෙසේ අනුශාසනා කරණු ලබන්නාහු පිළිවෙළින් ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමට පැමිණෙත්යයි" වදාළේය.

43. **සාරන්දද සූත්‍රය:-** 1. "එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසල්නුවර මහවන වෙහෙරෙහිවූ කූටාගාර ශාලාවෙහි වැඩවසනසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු වේලෙහි හැද පොරවා පාත්‍ර සිවුරු ගෙණ විසල් නුවරට පිඩු පිණිස පිවිසිසේක. එකල්හි වනාහි සාරන්දද නම් චෛත්‍යස්ථානයෙහි එක්ව හුන්නාවූ රැස්වූ පන්සියයක් පමණ ලිච්ඡවීන්ගේ මේ අතුරු කථාව පහළවිය.

2. "රත්න පසක්හුගේ පහළවීම ලෝකයෙහි දුර්ලභවේ. කවර පසක්හුගේදයත්, හස්ති රත්නයාගේ පහළවීම ලෝකයෙහි දුර්ලභවේ. අශ්වරත්නයාගේ පහළවීම ලෝකයෙහි දුර්ලභවේ. මාණික්‍යරත්නයාගේ පහළවීම ලෝකයෙහි දුර්ලභවේ. ස්ත්‍රීරත්නයාගේ පහළවීම ලෝකයෙහි දුර්ලභවේ ගෘහපති රත්නයාගේ පහළවීම ලෝකයෙහි දුර්ලභ වේ. මේ පඤ්චවිධ රත්නයන්ගේ පහළවීම ලෝකයෙහි දුර්ලභවේයයි"

3. "ඉක්බිති ඒ ලිච්ඡවීහු මාර්ගයෙහි පුරුෂයෙකු තැබුවාහුය. 'එම්බා පුරුෂය, යම්සේ නුඹ වඩින්නාවූ භාග්‍යවතුන් වහන්සේ දන්නෙහිද, එකල්හි අපට සැළකරවයි' ඒ පුරුෂතෙම වඩින්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුරදීම දුටුයේය. දැක ඒ ලිච්ඡවීහු යම් තැනෙක්හිද, එතැනට එළඹියේය. එළඹ ඒ ලිච්ඡවීන්ට මෙය කීයේය. 'පින්වත්නි, ඒ මේ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ වඩිනාසේක. එයට දැන් කල් දනිව් යයි' 4. "ඉක්බිති ඒ ලිච්ඡවීහු භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණුනාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව සිටියාහුය. එකත්පස්ව සිටියාවූ ඒ ලිච්ඡවීහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළාහුය. "ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ සාරන්දද නම් චෛත්‍යය යම් තැනෙක්හිද, අනුකම්පා පිණිස එතැනට පැමිණෙනසේක් නම් මැනවයි" භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද වීමෙන් ඉවසූ සේක. 5. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සාරන්දද නම් චෛත්‍යය යම් තැනෙක්හිද එතැනට පැමිණිසේක. පැමිණ පනවනලද අස්නෙහි වැඩහුන්සේක. වැඩහිඳ වනාහි භාග්‍යවතුන් වහන්සේ ඒ ලිච්ඡවීන්ට මෙය වදාළසේක. "ලිච්ඡවීනි, දැන් කිනම් කථාවකින් යුක්තව හුන්නහුද, කිනම් අතුරුකථාවක් තොප විසින් අඩාල කරණලද්දීද?"

6. "ස්වාමීනි, මෙහි එක්ව උන්නාවූ, රැස්ව හුන්නාවූ අපගේ මේ අතුරු කථාව පහළවිය. (මෙහි මේ සූත්‍රයේ 2 ඡේදය යෙදිය යුතුයි.)

7. "කාමයන්හි අදහස් ඇති ලිච්ඡවීවූ තොපගේ

ඒකාන්තයෙන් කාමයම අරභයා අතුරු කථාව පහළවීය. ලිච්ඡවීනි, රත්න පසක්හුගේ පහළවීම ලෝකයෙහි දුර්ලභවේ. කවර පසක්හුගේද යත්, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ තථාගතයන්ගේ පහළවිම ලෝකයෙහි දුර්ලභවේ. තථාගතයන් වහන්සේ විසින් දේශනාකරණලද ධර්මවිනය දෙශනා කරන්නාවූ පුද්ගලතෙම ලෝකයෙහි දුර්ලභවේ. තථාගතයන් විසින් වදාරණලද ධර්ම විනය දේශනා කලකල්හි දැනගන්නා පුද්ගලතෙම ලෝකයෙහි දුර්ලභවේ. තථාගතයන් විසින් වදාරණලද ධර්ම විනය දෙසූකල්හි දැනගෙන ධර්මානුධර්ම ප්‍රතිපදාවට පිළිපන් පුද්ගලතෙම ලෝකයෙහි දුර්ලභවේ. කෘතඥවූ ලිච්ඡවීනි, මේ පඤ්චවිධ රත්නයන්ගේ පහළවීම ලෝකයෙහි දුර්ලභ වේයයි" වදාළේය.

44. **තිකණ්ටකීවන සූත්‍රය**:- 1. "එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සාකෙත නම් නුවර තිකණ්ටකී නම් වනයෙහි වැඩවසනසේක. එහි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට 'මහණෙනි' කියා ඇමතුසේක. 'ස්වාමීන්වහන්සැයි' ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. 2. "මහණෙනි, භික්ෂුතෙම කලින් කල නොපිළිකුල් අරමුණෙහි පිළිකුල් සංඥා ඇත්තේ වාසය කරන්නේ නම් මැනවි. මහණෙනි, භික්ෂුතෙම කලින්කල පිළිකුල් අරමුණෙහිද නොපිළිකුල් සංඥා ඇතිව වාසය කරන්නේ නම් මැනවි. මහණෙනි, භික්ෂුතෙම කලින්කල නොපිළිකුල් අරමුණෙහිද පිළිකුල් අරමුණෙහිද, පිළිකුල් සංඥා ඇතිව වාසය කරන්නේ නම් මැනවි. මහණෙනි, භික්ෂුතෙම කලින් කල පිළිකුල් අරමුණෙහිද, නොපිළිකුල් අරමුණෙහිද, නොපිළිකුල් සංඥා ඇතිව වාසය කරන්නේ නම් මැනවි. මහණෙනි, භික්ෂු තෙම කලින් කල නොපිළිකුල්වූද, පිළිකුල්වූද, ඒ අරමුණු දෙක දුරුකොට මැදහත්ව සිහි ඇතිව මනා දැනුම් ඇතිව වාසය කරන්නේ නම් මැනවි.

3. "මහණෙනි, භික්ෂුතෙම කෙසේ නම් කරුණක් නිසා

නොපිළිකුල් අරමුණෙහි පිළිකුල් සංඥා ඇතිව වාසය කරන්නේද? 'මට ඇළුම් කටයුතු ධර්මයන්හි රාගය නූපදිවායි' මහණෙනි භික්ෂුතෙම මේ කරුණ නිසා නොපිළිකුල් අරමුණෙහි පිළිකුල් සංඥා ඇතිව වාසය කරන්නේය. 4. "මහණෙනි, කෙසේ නම් භික්ෂුතෙම කරුණක් නිසා පිළිකුල් අරමුණෙහි නොපිළිකුල් සංඥා ඇතිව වාසය කරන්නේද? 'මට ද්වෙෂ කටයුතු ධර්මයන්හි ද්වෙෂ නූපදීවායි' මහණෙනි, භික්ෂුතෙම මේ කරුණු නිසා පිළිකුල් අරමුණෙහි නොපිළිකුල් සංඥා ඇතිව වාසය කරන්නේය. 5. "මහණෙනි, භික්ෂුතෙම කෙසේ නම් කරුණක් නිසා නොපිළිකුල් අරමුණෙහිද, පිළිකුල් අරමුණෙහිද පිළිකුල් සංඥා ඇතිව වාසය කරන්නේද? 'මට ඇළුම් කටයුතුවූ ධර්මයන්හි රාගය නූපදීවා, මට ද්වෙෂ කටයුතුවූ ධර්මයන්හි ද්වෙෂය නූපදීවායි' මහණෙනි, භික්ෂුතෙම මේ කරුණ නිසා නොපිළිකුල් අරමුණෙහිද, පිළිකුල් අරමුණෙහිද, පිළිකුල් සංඥා ඇතිව වාසය කරන්නේය. 6. "මහණෙනි, භික්ෂුතෙම කෙසේනම් කරුණක් නිසා නොපිළිකුල් අරමුණෙහිද පිළිකුල් අරමුණෙහිද නොපිළිකුල් සංඥා ඇතිව වාසය කරන්නෙහිද? මට ද්වෙෂ කටයුතුවූ ධර්මයන්හි ද්වෙෂය නූපදීවා, මට ඇළුම් කටයුතුවූ ධර්මයන්හි රාගය නූපදීවායි,' මහණෙනි, භික්ෂුතෙම මේ කරුණ නිසා පිළිකුල් අරමුණෙහිද, නොපිළිකුල් අරමුණෙහිද, නොපිළිකුල් සංඥා ඇතිව වාසය කරන්නේය. 7. "මහණෙනි, භික්ෂුතෙම කෙසේ නම් කරුණක් නිසා නොපිළිකුල්වූද, පිළිකුල්වූද, ඒ අරමුණු දෙක දුරුකොට මැදහත්ව, සිහි ඇතිව, නුවණැතිව වාසය කරන්නේද, 'මට කිසි අරමුණෙක්හි, කිසිතැනෙක්හි සුළුතරම්වූද, ඇළුම් කටයුතු ධර්මයන්හි රාගය නූපදීවා, මට කිසි අරමුණෙක්හි කිසි තැනෙකත් සුළු තරම්වුද, ද්වෙෂ කටයුතු ධර්මයන්හි ද්වෙෂ නූපදීවා, මට කිසි අරමුණක, කිසි තැනකත් ස්වල්ප තරම්වූද, මුළාවියයුතු ධර්මයන්හි මුළාවෙක් නූපදීවායි.'

8. "මහණෙනි, භික්ෂුතෙම මේ කරුණ නිසා නොපිළිකුල්වූද, පිළිකුල්වූද ඒ අරමුණු දෙක දුරුකොට මැදහත්ව සිහි ඇතිව, නුවණැතිව වාසය කරන්නේයයි" වදාළේය.

**45. නිරයනික්ඛිත සූත්‍රයː-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ පුද්ගලතෙම ගෙණෙනලද බරක් බහාතබන ලද්දේ යම්සේද මෙසේ නරකයෙහි උපදී. 2. (මෙය මේ පණ්ණාසකයේ 45 සූත්‍රයේ 2 ඡේදය මෙනි) 3. (මේ ඡේදය මේ සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

4. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූයේ යම්සේ ගෙනෙනලද බරක්, බහාතබන ලද්දේ, මෙසේ දෙව්ලොව උපදී 5. (මෙය මේ පණ්ණාසකයේ 45 සූත්‍රයේ 5 ඡේදය මෙනි) 6. (මේ ඡේදය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි.)

4. **භික්ඛුමිත්ත සූත්‍රයː-** 1. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂු මිත්‍රතෙම සේවනය නොකටයුතු වේ. 2. "කවර පසකින්ද යත්? කර්මාන්තය කරවාද අධිකරණය ගණීද, ප්‍රධාන භික්ෂූන් කෙරෙහි ප්‍රතිවිරුද්ධවූයේ වේද, දික්වූ හැසිරීමෙන් අවස්ථාවට නුසුදුසුවූ හැසිරීමෙහි යෙදී වාසය කෙරේද, කලින් කල දැහැමි කථාවෙන් කරුණු දක්වන්ට සමාදන් කරවන්ට තෙද ගන්වන්ට සතුටුකරන්ට සමර්ථ නොවේද, යන පසිනි. 3 (මේ ඡේදය මේ වර්ගයේ 1 ඡේදය මෙනි). 4. "මහණෙනි, කරුණු පසකින් යුක්තවූ භික්ෂුතෙම සේවනය කටයුතු වේ.

5. "කවර පසකින්දයත්? කර්මාන්ත නොකරවාද, අධිකරණය නොගනීද, ප්‍රධාන භික්ෂූන් කෙරෙහි ප්‍රතිවිරුද්ධ වූවෙක් නොවේද, දික්වූ හැසිරීමෙහි අවස්ථාවට නුසුදුසුවූ හැසිරීමෙහි යෙදී වාසය නොකෙරේද, කලින්කල දැහැමි කථාවෙන් කරුණු දක්වන්ට, සමාදන් කරවන්ට, තෙද ගන්වන්ට, සතුටු කරන්ට සමර්ථයෙක් වේද, යන පසිනි. 6. (මේ ඡේදය මේ සූත්‍රයේ 4 ඡේදය මෙනි.)

**47. අසප්පුරිසදාන සූත්‍රයː-** 1. "මහණෙනි, මේ අසත්පුරුෂදාන පසක් වෙත්. කවර පසක්දයත්? සකස් නොකොට දානය දේද, සිතින් ආදර නොකොට දේද, සියතින් නොදේද, දමා ගසනු කැමැත්තෙක්මෙන් දේද, බලාපොරොත්තු රහිතව දේද, යන පසයි. මහණෙනි, මොහුවනාහි අසත්පුරුෂදානපස වෙත්. 2. "මහණෙනි, මේ සත්පුරුෂ දාන

පසක්වෙත්. කවර පසක් දයත්? සකස් කොට දානය දේද, සිතින් ආදරකොටදේද, සියතින් දේද, නොදමා ගසනලද්දක් මෙන් දේද, බලාපොරොත්තු සහිතව දේද, (යන පසයි.) මහණෙනි, මේ පස වනාහි සත්පුරුෂ දාන වෙත්යයි වදාළේය."

48. **සප්පුරිසදාන සූත්‍රයඃ-** 1. "මහණෙනි, මේ සත්පුරුෂ දාන පසක් වෙත්. 2. "කවර පසක්දත්? ශ්‍රද්ධාවෙන් දානය දේද, සකස් කොට දානය දේද, සුදුසු කාලයෙහි දානය දේද, මුදනලද ත්‍යාග සිත් ඇත්තේ දානය දේද, තමාද, අනුන්ද නොපෙලා දානය දේද, (යන පසයි. 3. "මහණෙනි, ශ්‍රද්ධාවෙන් වනාහි දානයදී (ii) යම් යම් තැනෙක්හි ඒ දානයාගේ විපාකය උපදීද. (ඒ ඒ තන්හි) ආඪ්‍ය වූයේද, මහත් ධන ඇත්තේද, මහත් සම්පත් ඇත්තේදවේ (iii) විශිෂ්ට රූ ඇත්තේ දැකුම්කලු වූයේ ප්‍රසාද එළවන්නේ උතුම්වූ වර්ණ සෞන්දර්යයෙන් යුක්ත වූයේදවේ. 4. "මහණෙනි, සකස් කොට දානයදී (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) මොහුගේ පුත්‍රයෝ කියා හෝ භාර්යාව කියා හෝ දාසයෝය කියා හෝ පනිවිඩකාරයෝය කියා හෝ කම්කරුවෝය කියා හෝ ඒ යම් කෙනෙකුන් වෙද්ද, ඔව්හුද කියන ලද්ද අසන්ට කැමති වෙත්. කණ එළවා තබත් දැනගැනීමට සිත එළවා තබත් 4. "මහණෙනි, සුදුසු කාලයෙහි වනාහි දානයදී (මෙහි 3 (ii) යෙදිය යුතුයි.) මොහුට සුදුසු කල්හි පැමිණියාවූ සම්පත්ද බොහෝ වෙත්.

6. "මහණෙනි, මුදනලද සිත් ඇතිව වනාහි දානයදී මෙහි 3 (ii) යෙදිය යුතුයි) මහත්වූද පස්කම් ගුණයන්හි පරිභොග කිරීමට සිත නැමෙයි.

7. "මහණෙනි, තමන්ද අනුන්ද නොපෙලා වනාහි දානය දී (මෙහි 3 (ii) යෙදිය යුතුයි) මොහුගේ සම්පත්වලට ගින්නෙන් හෝ දියෙන් හෝ රජුන්ගෙන් හෝ සොරුන්ගෙන් හෝ අප්‍රිය දායාදයන්ගෙන් හෝ කොයිනුත් වැනසීමක්ද නොපැමිණේ, මහණෙනි, මොහු වනාහි සත්පුරුෂදාන පස වෙත්යයි' වදාළේය.

(49, 50 සූත්‍රවල 3, 6 ඡෙද ඒ ඒ සූත්‍රවල 1, 4 ඡෙදමෙන් වෙත්)

**49. පඨම සමය විමුත්ත සූත්‍රයː-** 1. "මහණෙනි, ලෞකික වශයෙන් මිදුනු සිත් ඇති භික්ෂූහුගේ පිරිහීම පිණිස මේ කරුණු පසක් පවතිත්. 2. "කවර පසක්දයත්? කර්මාන්තයෙහි ඇළුණු බවය, කථාබස් කිරීමෙහි ඇළුනු බවය, නිද්‍රාවෙහි ඇළුනු බවය, සමූහයා හා එක්වීමෙහි ඇළුනු බවය, මිදුනු පරිදි සිත නොසැළකීමය යන පසයි. 4. "මහණෙනි, මේ කරුණු පස ලෞකික වශයෙන් කෙළෙසුන්ගෙන් මිදුනු සිත් ඇති භික්ෂූහුගේ නොපිරිහීම පිණිස පවතිත්. 5. "කවර පසක්ද යත්? කර්මාන්තයන්හි නොඇලෙන බවය, කථාබස් කිරීමෙහි නොඇලෙන බවය, නිද්‍රාවෙහි නොඇලෙන බවය, සමූහයා හා එක්වීමෙහි නොඇලෙන බවය, මිදුනු පරිදි සිත සොයා බැලීමය යන පසයි."

**50. දුතිය සම විමුත්ති සූත්‍රයː-** 1. "මහණෙනි, මේ කරුණු පස ලෞකික වශයෙන් කෙළෙසුන්ගෙන් මිදුනු සිත් ඇති භික්ෂූහුගේ පිරිහීම පිණිස පවතිත්. 2. "කවර පසක්ද යත්? කර්මාන්තයන්හි ඇලෙන බවය, කථාබස්හි ඇලෙන බවය නිද්‍රාවෙහි ඇලෙන බවය, ඉන්ද්‍රියයන්හි නොරක්නා ලද දොරටු ඇති බවය, භෝජනයෙහි පමණ නොදන්නා බවය යන පසයි. 4. "මහණෙනි, මේ කරුණු පස ලෞකික වශයෙන් කෙලෙසුන්ගෙන් මිදුනු සිත් ඇති භික්ෂූහුගේ නොපිරිහීම පිණිස පවතිත්. 5. 'කවර පසක්ද යත්? කර්මාන්තයන්හි නොඇලෙන බවය, කථාබස්හි නොඇලෙන බවය, නිද්‍රාවෙහි නොඇලෙන බවය, ඉන්ද්‍රියයන්හි රක්නා ලද දොරටු ඇති බවය, භෝජනයෙහි පමණ දන්නා බවය යන පසයි.

**(තුන්වෙනි පණ්ණාසකය නිමි.)**

---